පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# මජ්ඣිම නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ සුනන්දාරාම මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්ම භාරතීශ්වර ධර්මකීර්ති ශ්‍රී පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද අමරපුර නිකායේ අධිකරණ නායක මහාස්ථවිරයන් වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න ෆේරුකාන මහතා

පටුන



# මජ්ඣිම නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1959
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**මජ්ඣිම නිකාය 1**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
ගොඩගේ පොත් මැඳුර

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

පටුන

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.



# පටුන


| | පිටුව |
|---|---|
| 01 මූලපරියාය සූත්‍රය | 01 |
| 02 සබ්බාසව සූත්‍රය | 58 |
| 03 ධම්ම දායාද සූත්‍රය | 67 |
| 04 භයභෙරව සූත්‍රය | 77 |
| 05 අනංගණ සූත්‍රය | 90 |
| 06 ආකංඛෙය්‍ය සූත්‍රය | 106 |
| 07 වත්ථ සූත්‍රය | 112 |
| 08 සල්ලෙඛ සූත්‍රය | 120 |
| 09 සම්මාදිට්ඨි සූත්‍රය | 135 |
| 10 සතිපට්ඨාන සූත්‍රය | 156 |
| 11 චූල සීහනාද සූත්‍රය | 183 |
| 12 මහා සීහනාද සූත්‍රය | 191 |
| 13 මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය | 222 |
| 14 චූල දුක්ඛක්ඛන්ධ සූත්‍රය | 233 |
| 15 අනුමාන සූත්‍රය | 243 |
| 16 චෙතොඛිල සූත්‍රය | 261 |
| 17 වනපත්ථ සූත්‍රය | 272 |
| 18 මධුපිණ්ඩික සූත්‍රය | 287 |
| 19 ද්වේධා විතක්ක සූත්‍රය | 304 |
| 20 විතක්ක සණ්ඨාන සූත්‍රය | 314 |
| 21 කකචූපම සූත්‍රය | 320 |
| 22 අලගද්දූපම සූත්‍රය | 333 |
| 23 වම්මික සූත්‍රය | 360 |
| 24 රථ විනීත සූත්‍රය | 365 |
| 25 නිවාප සූත්‍රය | 375 |
| 26 අරියපරියෙසන සූත්‍රය | 394 |
| 27 චූලහත්ථිපදොම සූත්‍රය | 420 |
| 28 මහා හත්ථි පදොපම සූත්‍රය | 437 |
| 29 මහාසාරොපම සූත්‍රය | 457 |


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිඟාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ හතරවෙනිවූ මේ පොතට මජ්ඣිම නිකායෙන් සූත්‍ර විසිනවයක් පිළිවෙළට අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මජ්ඣිම නිකාය එක සඟියකි. සඟියේ සූත්‍ර මධ්‍යම ප්‍රමාණවූ බැවින් ඊට මජ්ඣිම නිකාය යන නාමය යෙදේ. එහි ඇති සූත්‍ර එකසිය පනස් දෙක මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරි පණ්ණාසකයයි පණ්ණාසක තුනකට බෙදා තිබේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, තමන්ට වැඩි සනීපයක්ද නැතුව සිටින නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයඝීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඝීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද ගුණපාල වීරසේකර මහත්මයාද ආධාර කළෝය.

ශොධ්‍යපත්‍ර බැලීමාදියෙන් උපකාර කළ අමරදාස පියසිරි මහත්මයාටද, සෝමා සේනානායක මහත්මියටද, ආයඝීවතී පෙරේරා මහත්මියටද අපේ අවංක ස්තුතිය පිරිනමමු. මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

18-4-59,
474, ගාලුපාර,
කොල්ලුපිටිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# මජ්ඣිම නිකාය

## මූලපණ්ණාසක (මුල් සූත්‍ර පණස.)

### 1. මූල පරියාස සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසනලදී හෙවත් මාගේ ඇසීම මෙසේය. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ 'උක්කට්ඨා' නම් නුවර සමීපයෙහිවූ 'සුභග' නම් වනයෙහි සල් රුකක් මුල වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන්ට කථාකළෝය. 'ස්වාමීන් වහන්ස'යි ඒ භික්ෂූහු උන්වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළාහුය.

"මහණෙනි, සියලු ත්‍රෛභූමක (කාම රූප අරූප) ධර්මයන්ට මුල් වූ කරුණු ප්‍රකාශ වන්නාවූ දෙශනාවක් තොපට දෙශනා කරමි. එය අසව්, හොඳින් සිත්හි දරාගනිව්, කියන්නෙමියි වදාළසේක. 'එසේය, ස්වාමීන් වහන්ස'යි උත්තර දුන් ඒ භික්ෂූන්ට මේ සූත්‍රය දෙශනා කළාහුය.

2 "මහණෙනි, මේ ලොකයෙහි බුද්ධාදී උත්තමයන් නුවණැසින් නුදුටුවාවූ, උතුම් ධර්මයෙහි දක්ෂ නොවූ, උතුම් ධර්මයෙහි හික්මීමක් නැත්තාවූ, බුද්ධාදී සත්පුරුෂයන් නුවණින් නුදුටුවාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මීමක් නැත්තාවූ දැන උගත්කමක් නැති පෘථග්ජන තෙමේසතර වැදෑරුම් පඨවිධාතුව[1] පඨවිධාතුව වශයෙන් (තණ්හා දිට්ඨි මාන වශයෙන්) හඟියි. පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් හැඳින, පඨවිධාතුව නිත්‍ය ආත්මයයි හඟියි. නිත්‍ය

1 ලක්ෂණ පඨවි, සසම්භාර පඨවි, ආරම්මණ පඨවි, සම්මුති පඨවි

ආත්මය පඨවිධාතුවෙහි පිහිටියේයයි හඟියි. පඨවිධාතුවෙන් පිටත නිත්‍ය ආත්මය පිහිටියේයයි හඟියි. පඨවිධාතුව මගේ ආත්මයයි හඟියි. පඨවිධාතුව මගේ නිත්‍ය ආත්මයයි ආසාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ වෙන් වශයෙන් බෙදා නොදැන්මයයි කියමි.

"සතර වැදෑරුම් අපොධාතුව[1] ආපොධාතුව වශයෙන් හඟියි. ආපොධාතුව ආපොධාතුව වශයෙන් හැඳින ආපො ධාතුව නිත්‍ය ආත්මයයි හඟියි. නිත්‍ය ආත්මය ආපොධාතුවෙහි පිහිටියේයයි හඟියි. නිත්‍ය ආත්මය ආපොධාතුවෙන් පිටත ආපොධාතුව ආශ්‍රයකොට ඇත්තේයයි හඟියි. ආපොධාතුව 'මගේයයි' හඟියි. ආපොධාතුව ඇසුරු කළ ආත්මයට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"සතර වැදෑරුම් තෙජොධාතුව[2] තෙජොධාතුව වශයෙන් හඟියි. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් හැඳින තෙජො ධාතුව නිත්‍ය ආත්මයයි හඟියි. නිත්‍ය ආත්මය තෙජොධාතුවෙහි පිහිටියේයයි හඟියි. තෙජොධාතුවෙන් පිටත එය ආශ්‍රය කොට නිත්‍ය ආත්මය පිහිටියේයයි හඟියි. තෙජොධාතුව මගේ යයි හඟියි. තෙජොධාතුවට ආශාවෙන් සතුටු වෙයි; ඊට හෙතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"සතර වැදෑරුම් වායොධාතුව[3] වායොධාතුව වශයෙන් හඟියි, වායොධාතුව වායොධාතුව වශයෙන් හැඳින වායොධාතුව නිත්‍ය ආත්මයයි හඟියි. නිත්‍ය ආත්මය වායොධාතුවෙහි පිහිටියේයයි හඟියි. වායොධාතුවෙන් පිටත එය ආශ්‍රය කොට නිත්‍ය ආත්මය පිහිටියේයයි හඟියි. වායොධාතුව මගේ යයි හඟියි. වායොධාතුවට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

---

1 ලක්ඛණ ආපො, සසම්භාර ආපො, ආරම්මණ ආපො, සම්මුති ආපො.

2 ලක්ඛණ තෙජො, සසම්භාර තෙජො, ආරම්මණ තෙජො, සම්මුති තෙජො.

3 ලක්ඛණවායො, සසම්භාර වායො, ආරම්මණ වායො, සම්මුති වායො.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "භූතයන් (චාතුර්මහාරාජික දෙව්ලොවින් පහත සත්වයන්) භූතයන් වශයෙන් හඟියි. භූතයන් භූතයන් වශයෙන් ඇඳින භූතයන් නිත්‍ය ආත්මයයි හඟියි. භූතයන් තුළ නිත්‍ය ආත්මයක් ඇතැයි හඟියි. භූතයන්ගෙන් පිටත ආත්මය ඇතැයි හඟියි. භූතයන් මාගේ යයි හඟියි. භූතයන්ට ආසාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැනීමයයි කියමි.

"දෙවියන් (මාර දෙව් ලොවින් පහත දෙවියන්) දෙවියන් වශයෙන් හඟියි. දෙවියන්, දෙවියන් වශයෙන් ඇඳින, දෙවියන් ආත්මයයි හඟියි. දෙවියන් තුළ ආත්මය ඇතැයි හඟියි. දෙවියන් කෙරෙන් පිටත දෙවියන් ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. දෙවියන් ගැන සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැනීමයයි කියමි.

"මාරයා මාරයා වශයෙන් හඟියි. මාරයා මාරයා වශයෙන් ඇඳින මාරයා ආත්මයයි හඟියි. මාරයා කෙරෙහි ආත්මය ඇතැයි හඟියි. මාරයාගෙන් පිටත ආත්මය ඇතැයි හඟියි. මාරයා මගේයයි හඟියි. මාර ආත්මයට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

4 "බ්‍රහ්මයා (ප්‍රථමධ්‍යානතලයෙහි බ්‍රහ්මයන්) බ්‍රහ්මයා වශයෙන් හඟියි. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් හැඳින බ්‍රහ්මයා, ආත්මය වශයෙන් හඟියි බ්‍රහ්මයා කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. බ්‍රහ්මයාගෙන් පිටත බ්‍රහ්මයා ඇසුරුකොට ආත්මය ඇත්තේයයි හඟියි. බ්‍රහ්මයා 'මාගේ' යයි හඟියි බ්‍රහ්මයාට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැනීමයයි කියමි.

"ආභස්සර දෙවියන් (ද්විතීයධ්‍යානතල වැසි බ්‍රහ්මයන්) ආභස්සර දෙවියන් වශයෙන් හඟියි. ආභස්සර දෙවියන් ආභස්සර දෙවියන් වශයෙන් හැඳින ආභස්සර දෙවියන් ආත්මය වශයෙන් හඟියි. ආභස්සර දෙවියන් කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. ආභස්සර දෙවියන්ගෙන් පිටත ඔවුන්

ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. ආභස්සර දෙවියන් 'මාගේ' යයි හඟියි. ආභස්සර දෙවියන් ගැන ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට නොදැනීමයයි කියමි.

"සුභකිණ්හදෙවියන්, (තෘතීයධ්‍යානතල වැසි බ්‍රහ්මයන්) සුභකිණ්හදෙවියන් වශයෙන් හඟියි. සුභකිණ්හදෙවියන්, සුභකිණ්හදෙවියන් වශයෙන් හැඳින සුභකිණ්හදෙවියන් ආත්මය වශයෙන් හඟියි. සුභකිණ්හදෙවියන් කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත ඔවුන් ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. සුභකිණ්හ දෙවියන් 'මාගේ' යයි හඟියි. සුභකිණ්හ දෙවියන්ට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැනීමයයි කියමි.

"වෙහප්ඵල නම්වූ දෙවියන් (චතුර්ථධ්‍යාන තල වැසි බ්‍රහ්මයන්) වෙහප්ඵල දෙවියන් වශයෙන් හඟියි, වෙහප්ඵල දෙවියන් වෙහප්ඵලදෙවියන් වශයෙන් හැඳින වෙහප්ඵල දෙවියන් නිත්‍ය ආත්මයයි හඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙහි නිත්‍යආත්මය ඇතැයි හඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. වෙහප්ඵල දෙවියන් 'මගේ යයි' හඟියි. වෙහප්ඵල දෙවියන් ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැනීමයයි කියමි.

"අභිභූ නම් අසංඥ තලවැසි බ්‍රහ්මයා, අසංඥතල වැසි බ්‍රහ්මයා වශයෙන් හඟියි. අසංඥ තලවැසි බ්‍රහ්මයා, අසංඥ තලවැසි බ්‍රහ්මයා වශයෙන් හැඳින, අසංඥ තලවැසි බ්‍රහ්මයා නිත්‍ය ආත්මයයි හඟියි. අසංඥ තලවැසි බ්‍රහ්මයා කෙරෙහි නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. අසංඥ තල වැසි බ්‍රහ්මයාගෙන් පිටත ඔහු ඇසුරුකොට නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. අසංඥ තලවැසි බ්‍රහ්මයා 'මාගේ යයි' හඟියි. අසංඥතලවැසි බ්‍රහ්මයාට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"ආකාසානඤ්චායතන තල වැසි දෙවියන් ආකාසානඤ්චායතන වැසි දෙවියන් වශයෙන් හඟියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් හැඳින ආකාසානඤ්චායතන වැසි දෙවියන් නිත්‍ය ආත්මයයි හඟියි. ආකාසානඤ්චායතන වැසි දෙවියන් කෙරෙහි නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. ආකාසානඤ්චායතන වැසි දෙවියන් කෙරෙන් පිටත්හි ඔවුන් ඇසුරුකොට නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. ආකාසානඤ්චායතන වැසි දෙවියන් 'මාගේ යයි' හඟියි. ආකාසානඤ්චායතන වැසි දෙවියන්ට ආශාවෙන් සතුටු වෙයි. ඊට හෙතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්ම යයි කියමි.

"විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් වශයෙන් හඟියි. විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් වශයෙන් හැඳින විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් නිත්‍ය ආත්මයයි හඟියි. විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් කෙරෙහි නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරු කොට නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන් 'මගේයයි' හඟියි. විඤ්ඤාණඤ්චායතන වැසි දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඹුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් වශයෙන් හඟියි. ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් වශයෙන් හැඳින, ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් නිත්‍ය ආත්මයයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් කෙරෙහි නිත්‍ය ආත්මයක් ඇතැයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන් 'මාගේයයි' හඟියි. ආකිඤ්චඤ්ඤායතන වැසි දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් වශයෙන් හඟියි. නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් වශයෙන් හැඟින, නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් නිත්‍ය ආත්මයයි හඟියි. නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් කෙරෙහි නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරු කොට නිත්‍ය ආත්මය ඇතැයි හඟියි. නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන් 'මාගේයයි' හඟියි. නෙවසංඥානාසංඥායතන වැසි දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

5 "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් හඟියි. දිට්ඨය දිට්ඨය වශයෙන් ඇඟින දිට්ඨය ආත්මය වශයෙන් හඟියි. දිට්ඨය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. දිට්ඨයෙන් පිටත දිට්ඨය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි දිට්ඨය 'මගේ'යයි හඟියි. දිට්ඨය ආත්මය වශයෙන් සිතා සතුටුවෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් හඟියි. සුතය සුතය වශයෙන් ඇඟින සුතය ආත්මය වශයෙන් හඟියි. සුතය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. සුතයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. සුතය 'මගේ' යයි හඟියි. සුතය ආත්මය වශයෙන් සිතා ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන තුන) මුතය වශයෙන් හඟියි. මුතය මුතය වශයෙන් හැඟින මුතය ආත්මය වශයෙන් හඟියි. මුතය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. මුතයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි, මුතය මාගේ යයි හඟියි. මුතය ආත්මය වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන් කොට බෙදා නොදැන්මයයි කියමි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් හඟියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් ඇඳින විඤ්ඤාතය ආත්මය වශයෙන් හඟියි. විඤ්ඤාතය කෙරෙහි ආත්මය වශයෙන් හඟියි. විඤ්ඤාතය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි විඤ්ඤාතය 'මාගේ'යයි හඟියි. විඤ්ඤාතය ආත්මය වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්ම යයි කියමි.

6 "සමාන ස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය (නාම ධර්ම සමූහය) සමාන ස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය වශයෙන් හඟියි සමාන ස්වභාවවූ අරූපස්කන්ධය සමාන ස්වභාවවූ අරූපස්කන්ධය වශයෙන් හැඳින සමාන ස්වභාවවූ අරූපස්කන්ධය ආත්මය වශයෙන් හඟියි, සමාන ස්වභාවවූ අරූපස්කන්ධය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. සමාන ස්වභාවවූ අරූපස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය 'මගේ' යයි හඟියි. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය ආත්මය වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන් කොට බෙදා නොදැන්ම යයි කියමි.

"වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් හඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය ආත්මය වශයෙන් හඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය ඇතැයි හඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය 'මගේ'යයි හඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය ආත්මය වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදා නොදැන්මයයි කියමි.

"(රූපාරූප ධර්ම) සියල්ල සියල්ල වශයෙන් හඟී. සියල්ල සියල්ල වශයෙන් හැඳින, සියල්ල ආත්ම වශයෙන් හඟී. සියල්ල

කෙරෙහි ආත්මය පිහිටියේයයි හඟී. සියල්ලෙන් පිටත සියල්ල ඇසුරුකොට ආත්මය ඇතැයි හඟී. සියල්ල 'මගේ'යයි හඟී. සියල්ල ආත්මය වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන් කොට බෙදා නොදැන්මයයි කියමි.

"නිර්වාණය (ඇතැම් දෘෂ්ටිකයන් නිවනයයි කියන ආත්මය පඤ්චකාමයෙන් යුක්ත කිරීම) නිර්වාණය වශයෙන් හඟී. නිර්වාණය නිර්වාණ වශයෙන් ඇඳින නිර්වාණය ආත්මය වශයෙන් හඟී. නිර්වාණය කෙරෙහි ආත්මය පිහිටියේ යයි හඟී. නිර්වාණයෙන් පිටත එය ඇසුරු කොට ආත්මය ඇතැයි හඟී. නිර්වාණය 'මගේ'යයි හඟියි. නිර්වාණය ආත්මයයි වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඔහුගේ ධර්ම වෙන්කොට බෙදානොදැන්මයයි කියමි.

පෘථග්ජනයන්ගේ වශයෙන් දෙශනා කරනලද ප්‍රථම භූමි පරිච්ඡේදයයි.

7 'මහණෙනි, ශෛක්ෂවූ (ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නාවූ) අර්හත්ඵලයට නොපැමිණියාවූ අර්හත්ඵලය පතන්නාවූ යම් ඒ භික්ෂුවක් තෙම වාසය කෙරේද ඒ පුද්ගලතෙමේ සතර වැදෑරුම් පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන පෘථිවිධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) හඟී. පෘථිවිධාතුව ආශ්‍රයකොට තමා පිහිටියේයයි (තණ්හා මාන දෙකින්) හඟී. පෘථිවිධාතුවෙන් පිටත තමා ඇතැයි (තණ්හා මානවශයෙන්) හඟී. පෘථිවිධාතුව මාගේයයි (තණ්හා මාන වශයෙන්) සිතයි. පෘථිවිධාතුවට ආශාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ පිරිසිඳ නොදැනීම යයි කියමි.

"ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන ආපොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) හඟී. ආපොධාතුව ආශ්‍රය කොට තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) හඟී. ආපොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි තණ්හා මාන වශයෙන්) හඟී. මේ ආපොධාතුව මාගේ යයි (තණ්හා මාන

වශයෙන්) හඟියි. ආපොධාතුවට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ පිරිසිඳ නොදැනීමයයි කියමි.

"තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන තෙජොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) හඟියි. තෙජොධාතුව ආශ්‍රයකොට තමා පිහිටියේයයි (තණ්හාමාන වශයෙන්) හඟියි. මේ තෙජොධාතුව මාගේයයි හඟියි. තෙජොධාතුවට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"වායොධාතුව වායොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. වායොධාතුව වායොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන වායොධාතුව තමා වශයෙන් හඟියි. වායොධාතුව ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. වායොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි හඟියි. වායොධාතුව මාගේයයි හඟියි. වායොධාතුවට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

8 "භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දැන භූතයන් තමා වශයෙන් හඟියි. භූතයන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. භූතයන්ගෙන් වෙන්ව තමා ඇතැයි හඟියි. මේ භූතයන් මාගේයයි හඟියි. භූතයන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීම යයි කියමි.

"දෙවියන් දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දනියි. දෙවියන් දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දැන දෙවියන් තමා වශයෙන් හඟියි. දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේ යයි හඟියි. දෙවියන්ගෙන් පිටත්හි තමා ඇතැයි හඟියි. දෙවියන් මාගේයයි හඟියි. දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දැන මාරයා තමා වශයෙන්

හඟියි. මාරයා ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. මාරයාගෙන් වෙන්ව තමා ඇතැයි හඟියි. මාරයා මාගේ යයි හඟියි. මාරයාට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

9 "බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දැන බ්‍රහ්මයා තමා වශයෙන් හඟියි. බ්‍රහ්මයා ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. බ්‍රහ්මයාගෙන් පිටත්හි තමා ඇතැයි හඟියි. මේ බ්‍රහ්මයා මාගේයයි හඟියි. බ්‍රහ්මයාට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආභස්සරදෙවියන් තමා වශයෙන් හඟියි. ආභස්සර දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. ආභස්සරදෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. ආභස්සරදෙවියන් මාගේයයි හඟියි. ආභස්සරදෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන සුභකිණ්හ දෙවියන් තමා වශයෙන් හඟියි. සුභකිණ්හ දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. සුභකිණ්හ දෙවියන් මාගේයයි හඟියි. සුභකිණ්හ දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන වෙහප්ඵල දෙවියන් තමා වශයෙන් හඟියි. වෙහප්ඵල දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. වෙහප්ඵල දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හඟියි. වෙහප්ඵල දෙවියන් මාගේයයි හඟියි. වෙහප්ඵල දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දැන අභිභූබ්‍රහ්මයා තමා වශයෙන් හඟියි. අභිභූබ්‍රහ්මයා ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. අභිභූබ්‍රහ්මයාගෙන් පිටත තමා ඇතැයි හඟියි. අභිභූබ්‍රහ්මයා මාගේයයි සිතයි. අභිභූබ්‍රහ්මයාට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආකාසානඤ්චායතන දෙවියන් තමා වශයෙන් හඟියි. ආකාසානඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි හඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. ආකාසානඤ්චායතන දෙවියන් මාගේයයි හඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමා වශයෙන් හඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් මාගේයයි හඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ

නුවණින් දැන ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමා වශයෙන් හඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් මාගේයයි හඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් තමා වශයෙන් හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් මාගේයයි සිතයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

10 "දිට්ඨය (රූපායතන) දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දනියි. දිට්ඨය දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දැන දිට්ඨය තමා වශයෙන් හඟියි. දිට්ඨය ආශ්‍රය කොට තමා පිහිටි යේයයි හඟියි. දිට්ඨයෙන් පිටත්හි තමා ඇතැයි හඟියි. දිට්ඨය මාගේයයි හඟියි. දිට්ඨයට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් විශෙෂ නුවණින් දනියි. සුතය සුතය වශයෙන් විශෙෂ නුවණින් දැන සුතය තමා වශයෙන් හඟියි. සුතය ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. සුතයයෙන් පිටත සුතය ඇසුරුකොට තමා ඇතැයි හඟියි. සුතය මාගේයයි හඟියි. සුතය සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"මුතය (ගන්ධ රස ස්පර්ශය යන තුන) මුතය වශයෙන් විශෙෂ නුවණින් හඟියි. මුතය, මුතය වශයෙන් හැඳින මුතය තමා

වශයෙන් හඟියි. මුතය කෙරෙහි තමා පිහිටියේයයි හඟියි. මුතයෙන් පිටත මුතය ඇසුරුකොට තමා ඇතැයි හඟියි. මුතය මාගේයයි හඟියි. මුතය තමා වශයෙන් සිතා සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් විශෙෂ නුවණින් දනියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් විශෙෂ නුවණින් දැන විඤ්ඤානය තමා වශයෙන් හඟියි. විඤ්ඤාතය ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. විඤ්ඤාතය පිටත එය ඇසුරුකොට තමා ඇතැයි හඟියි. විඤ්ඤාතය මාගේයයි හඟියි. විඤ්ඤාතයට සතුටු වෙයි. ඊට හේතුව කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

11 "එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය වශයෙන් විශෙෂ නුවණින් දනියි. එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය වශයෙන් විශෙෂ නුවණින් දැන එකස්වභාවයවූ අරූපය තමා වශයෙන් හඟියි. එකස්වභාවයවූ අරූපය ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. එකසවභාවයවූ අරූපයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි හඟියි. එකස්වභාවයවූ අරූපය මාගේයයි හඟියි. එකස්වභාවයවූ අරූපයට සතුටුවෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ ගැනීමයයි කියමි.

"වෙන් වෙන් ස්වභාවවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් හඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවය වශයෙන් විශෙෂ නුවණින් දැන වෙන් වෙන් ස්වභාවය වූ පඤ්චස්කන්ධය තමා වශයෙන් හඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි හඟියි. වෙන් වෙන් ස්වභාවය වූ පංචස්කන්ධය මාගේයයි හඟියි. වෙන් වෙන් ස්වභාවය වූ පංචස්කන්ධයට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"(රූපාරූප) සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දනියි. සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දැන සියල්ල තමා වශයෙන් හඟියි. සියල්ල ආශ්‍රය කොට තමා පිහිටියේයයි හඟියි. සියල්ලෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි හඟියි. සියල්ල මගේයයි හඟියි. සියල්ලට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

"පරම දෘෂ්ටධර්ම නිර්වාණය (පංචකාම සැප විඳීම) නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දනියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දැන පරමදෘෂ්ට ධර්ම නිර්වාණය තමා වශයෙන් හඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය ආශ්‍රයකොට තමා පිහිටියේයයි හඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි හඟියි. මේ පරමදෘෂ්ටධර්ම නිර්වාණය මගේයයි හඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයට සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඒ ශෛක්ෂ පුද්ගලයාගේ නොපිරිසිඳ දැනීමයයි කියමි.

ශෛක්ෂ පුද්ගලයන්ගේ වශයෙන් දෙශනාකරනලද දෙවෙනි භූමිපරිච්ඡේදයයි.

12 "මහණෙනි, කෙලෙසුන් කෙරෙන් දුරුවූ ක්ලෙශයන් ක්ෂය කලාවූ වැස නිමවනලද බ්‍රහ්මචර්යාව ඇති කටයුතු අවසන් කළාවූ කෙලෙස් බර බහා තබන ලද්දාවූ අර්හත්ඵලයට පැමිණියාවූ භව සංයෝජන (සසර බැඳුම්) ක්ෂයකළාවූ සසරින් මිදුනාවූ යම් ඒ (රහත්) භික්ෂුකෙනෙක් වෙද්ද හෙතෙමේද සතරවැදෑරුම් වූ පඨවිධාතුව වශයෙන් දනියි. පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් දැන පඨවිධාතුව තමායයි නොහඟියි. පඨවිධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. පඨවිධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. පඨවිධාතුව ඇසුරුකොට ඉන් පිටත තමා ඇතැයි නොහඟියි. පඨවිධාතුව 'මගේ'යයි නොහඟියි. පඨවිධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ රහතුන්වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සතරවැදෑරුම් ආපොධාතුව, ආපොධාතුව වශයෙන් දනියි. ආපොධාතුව ආපොධාතුව වශයෙන් දැන ආපොධාතුව තමායයි

නොහඟියි. ආපොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආපොධාතුව ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. ආපොධාතුව 'මගේ'යයි නොහඟියි. ආපොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සතරවැදෑරුම් තෙජො ධාතුව, තෙජොධාතුව වශයෙන් දැන තෙජොධාතුව තමායයි නොහඟියි. තෙජොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. තෙජොධාතුව ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. තෙජොධාතුව 'මගේ'යයි නොහඟියි. තෙජොධාතුව ඇසුරුකොට ඉන් පිටත තමා ඇතැයි නොහඟියි. තෙජොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සතරවැදෑරුම් වායොධාතුව, වායොධාතුව වශයෙන් දනියි. වායොධාතුව වායොධාතුව වශයෙන් දැන වායොධාතුව තමායයි නොහඟියි. වායොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වායොධාතුව ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. වායොධාතුව ඇසුරු කොට ඉන් පිටත තමා ඇතැයි නොහඟියි. වායොධාතු 'මගේ'යයි නොහඟියි. වායොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"භූතයන් භූතයන් වශයෙන් දනියි. භූතයන් භූතයන් වශයෙන් දැන භූතයන් තමායයි නොහඟියි. භූතයන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. භූතයන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. භූතයන් මගේයයි නොහඟියි. භූතයන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"දෙවියන් දෙවියන් වශයෙන් දනියි. දෙවියන් දෙවියන් වශයෙන් දැන දෙවියන් තමායයි නොහඟියි. දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. දෙවියන් මාගේයයි නොහඟියි. දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මාරයා මාරයා වශයෙන් දනියි. මාරයා මාරයා වශයෙන් දැන මාරයා තමායයි නොහඟියි. මාරයා කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. මාරයා ආශ්‍රය කොට තමා ඇතැයිනොහඟියි. මාරයා මාගේයයි නොහඟියි. මාරයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

14 "බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් දනියි බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් දැන බ්‍රහ්මයා තමායයි නොහඟියි. බ්‍රහ්මයා කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. බ්‍රහ්මයා ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. බ්‍රහ්මයා මාගේයයි නොහඟියි. බ්‍රහ්මයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් දනියි. ආභස්සර දෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් දැන ආභස්සර දෙවියන් තමායයි නොහඟියි. ආභස්සරදෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආභස්සරදෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආභස්සරදෙවියන් මාගේයයි නොහඟියි. ආභස්සර දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන්වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් දනියි. සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් දැන සුභකිණ්හ දෙවියන් තමායයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් මාගේයයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ රහතුන්වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් දනියි. වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් දැන වෙහප්ඵල දෙවියන් තමායයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්

ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් මාගේයයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"අභිභූ දෙවියන් අභිභූ දෙවියන් වශයෙන් දනියි. අභිභූ දෙවියන් අභිභූ දෙවියන් වශයෙන් දැන අභිභූ දෙවියන් තමායයි නොහඟියි. අභිභූ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. අභිභූ දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. අභිභූ දෙවියන් මාගේයයි නොහඟියි. අභිභූ දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් දනියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් දැන ආකාසානඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හෙතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් දනියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් දැන විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් දනියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් දැන ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් මාගේයයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් සතුට නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් දනියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් දැන නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් මාගේයයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

15. "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් දනියි. දිට්ඨය දිට්ඨය වශයෙන් දැන දිට්ඨය තමායයි නොහඟියි. දිට්ඨය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. දිට්ඨය ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. දිට්ඨයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් දනියි. සුතය සුතය වශයෙන් දැන සුතය තමායයි නොහඟියි. සුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුතය ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. සුතයට සතුටු නොවෙයි සුතය මගේ යයි නොහඟියි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන ආයතන තුන) මුතය වශයෙන් දනියි. මුතය මුතය වශයෙන් දැන මුතය තමා වශයෙන් නොහඟියි. මුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. මුතය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. මුතයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් දනියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් දැන විඤ්ඤාතය තමායයි නොහඟියි. විඤ්ඤාතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාතයට සතුටු නොවේ. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

16. "ඒකස්වභාවය ඇති අරූපධර්ම එකස්වභාවය ඇති අරූපධර්ම වශයෙන් දනියි. එකස්වභාවය ඇති අරූපධර්ම එකස්වභාවය ඇති අරූපධර්ම වශයෙන් දැන එකස්වභාවය ඇති අරූපධර්ම තමායයි නොහඟියි. එකස්වභාවය ඇති අරූපධර්ම කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. එකස්වභාවය ඇති අරූපධර්ම ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. එකස්වභාවය ඇති අරූපධර්මයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් දනියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් දැන වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය තමායයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය 'මගේ' යයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"සියල්ල සියල්ල වශයෙන් දනියි. සියල්ල සියල්ල වශයෙන් දැන සියල්ල තමායයි නොහඟියි. සියල්ල කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සියල්ල ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. සියල්ල 'මගේ' යයි නොහඟියි. සියල්ලට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

"පරමදෘෂ්ටධර්ම නිර්වාණය (පඤ්චකාම සැප විඳීම) පරම දෘෂ්ටධර්මනිර්වාණය වශයෙන් දනියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් දැන පරමදෘෂ්ටධර්ම නිර්වාණය තමායයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය මගේ යයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රහතුන් වහන්සේගේ පිරිසිඳ දැනීමයයි කියමි.

ක්ෂීණාශ්‍රව (රහතුන්ගේ) වශයෙන් දෙශනාකරනලද ප්‍රථම නයක්‍රමයෙහි තුන්වැනි භූමි පරිච්ඡේදයයි.

17. "මහණෙනි, කෙලෙසුන් කෙරෙන් දුරුවූ කෙලෙසුන් නැති කළාවූ වැස නිමවනලද බ්‍රහ්මචරියාව ඇති, කටයුතු අවසන් කළාවූ කෙලෙස් බර බහා තබන ලද්දාවූ අර්හත්ඵලයට පැමිණියාවූ භව සංයෝජන (සසර බැඳුම්) නැතිකළාවූ සසරින් මිදුනාවූ යම් ඒ (රහත්) භික්ෂු කෙනෙක් වේද, හෙතෙමේද, පඨවි ධාතුව පඨවි ධාතුව වශයෙන් දනියි. පඨවි ධාතුව පඨවි ධාතුව වශයෙන් දැන පඨවි ධාතුව තමායයි නොහඟියි. පඨවි ධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. පඨවි ධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. පඨවි ධාතුව මගේ යයි නොහඟියි. පඨවි ධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ (රහත්) භික්ෂුව රාගය නැතිකිරීමෙන් වීතරාගවූ බැවිනි.

"ආපොධාතුව ආපොධාතුව වසයෙන් දනියි. ආපොධාතුව ආපොධාතුව වශයෙන් දැන ආපොධාතුව තමායයි නොහඟියි. ආපොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි.

ආපොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආපොධාතුව ඇසුරුකොට ඉන්පිටත තමා ඇතැයි නොහඟියි. ආපොධාතුව 'මගේ' යයි නොහඟියි. ආපොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ (රහත්) භික්ෂුව රාගය නැතිකිරීමෙන් වීතරාගවූ බැවිනි.

"තෙජොධාතුව; තෙජොධාතුව වශයෙන් දනියි. තෙජොධාතුව තෙජො ධාතුව වශයෙන් දැන තෙජොධාතුව තමායයි නොහඟියි. තෙජොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. තෙජොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟී. තෙජොධාතුව ඇසුරුකොට ඉන් පිටත තමා ඇතැයි නොහඟී. තෙජො ධාතුව 'මගේ' යයි නොහඟී. තෙජො ධාතුවට සතුටු නොවෙයි. ඊට හේතුව කවරේද? (රහත්) භික්ෂුව රාගය නැතිකිරීමෙන් වීතරාගවූ බැවිනි.

"වායොධාතුව, වායොධාතුව වශයෙන් දනියි. වායොධාතුව වායොධාතුව වශයෙන් දැන වායොධාතුව තමායයි නොහඟී. වායොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟී. වායොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟී. වායොධාතුව ආශ්‍රයකොට ඉන් පිටත තමා ඇතැයි නොහඟී. වායොධාතුව මාගේ යයි නොහඟී. වායොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ඒ (රහත්) භික්ෂුව රාගය නැතිකිරීමෙන් වීතරාගවූ බැවිනි.

18 "භූතයන් (චාතුර්මහාරාජික දෙව්ලොවින් පහත සත්වයන්) භූතයන් වශයෙන් දනියි. භූතයන් භූතයන් වශයෙන් ඇඳින භූතයන් තමායයි නොහඟියි. භූතයන් තුළ තමා ඇතැයි නොහඟියි. භූතයන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. භූතයන් 'මගේ' යයි නොහඟියි. භූතයන්ට ආසාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගතවූ බැවිනි.

"දෙවියන් (මාර දෙව් ලොවින් පහත දෙවියන්) දෙවියන් වශයෙන් දනියි. දෙවියන්, දෙවියන් වශයෙන් ඇඳින, දෙවියන් තමායයි නොහඟී. දෙවියන් තුළ තමා ඇතැයි නොහඟී. දෙවියන් කෙරෙන් පිටත දෙවියන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟී. දෙවියන් 'මගේ' යයි නොහඟී. දෙවියන් ගැන සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි,

"මාරයා මාරයා වශයෙන් දනියි. මාරයා මාරයා වශයෙන් ඇඳින මාරයා තමායයි නොහඟී. මාරයා කෙරෙහි තමා ඇතැයි නොහඟියි. මාරයාගෙන් පිටත තමා ඇතැයි නොහඟී. මාරයා 'මගේ' යයි නොහඟියි. මාරයාට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

19 "බ්‍රහ්මයා (ප්‍රථමධ්‍යානතලයෙහි බ්‍රහ්මයෙන්) බ්‍රහ්මයා වශයෙන් දනියි. බ්‍රහ්මයා, බ්‍රහ්මයා වශයෙන් හැඳින බ්‍රහ්මයා තමා වශයෙන් නොහඟියි. බ්‍රහ්මයා කෙරෙහි තමා පිහිටියේ යයි නොහඟී. බ්‍රහ්මයාගෙන් පිටත බ්‍රහ්මයා ඇසුරුකොට තමා ඇත්තේයයි නොහඟී. බ්‍රහ්මයා 'මගේ' යයි නොහඟී. බ්‍රහ්මයාට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීචරාගවූ බැවිනි.

"ආභස්සර දෙවියන් (ද්විතීයධ්‍යානතල වැසි බ්‍රහ්මයන්) ආභස්සර දෙවියන් වශයෙන් දනියි. ආභස්සර දෙවියන් ආභස්සර දෙවියන් වශයෙන් හැඳින ආභස්සර දෙවියන් තමා වශයෙන් නොහඟී. ආභස්සර දෙවියන් දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආභස්සර දෙවියන්ගෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. ආස්සර දෙවියන් 'මගේ'යයි නොහඟියි. ආභස්සර දෙවියන් ගැන ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"සුභකිණ්හදෙවියන්, (තෘතීයධ්‍යානතල වැසි බ්‍රහ්මයන්) සුභකිණ්හ දෙවියන් වශයෙන් දනියි. සුභකිණ්හ දෙවියන්, සුභකිණ්හ දෙවියන් වශයෙන් හැඳින සුභකිණ්හ දෙවියන් තමා වශයෙන් නොහඟියි. සුභකිණ්හ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් 'මගේ' යයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"වෙහප්ඵල නම්වූ දෙවියන් (චතුර්ථධ්‍යාන තල වැසි බ්‍රහ්මයන්) වෙහප්ඵල දෙවියන් වශයෙන් දනියි. වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් හැඳින වෙහප්ඵල දෙවියන් තමායයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් 'මගේයයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්ට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"අභිභූ නම් (අසංඥතල වැසි) බ්‍රහ්මයා, (අසංඥතල වැසි) බ්‍රහ්මයා වශයෙන් දනියි. අභිභූ බ්‍රහ්මයා, අභිභූ බ්‍රහ්මයා වශයෙන් හැඳින, අභිභූ බ්‍රහ්මයා තමායයි නොහඟියි. අභිභූ බ්‍රහ්මයා කෙරෙහි තමා ඇතැයි නොහඟියි අභිභූ බ්‍රහ්මයාගෙන් පිටත ඔහු ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. අභිභූ බ්‍රහ්මයා 'මගේ'යයි නොහඟියි. අභිභූ බ්‍රමයාට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"ආකාසානඤ්චායතන තල වැසි දෙවියන් ආකාසානඤ්චායතන වැසි දෙවියන් වශයෙන් දනියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් හැඳින ආකාසානඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙන් පිටත්හි ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් 'මගේ' යයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් දනියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් හැඳින විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි

නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් 'මගේ' යයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් දනියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් හැඳින, ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුර කොට තමා ඇතැයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් 'මාගේ'යයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් වශයෙන් දනියි. නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් වශයෙන් හැඳින නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් තමායයි නොහඟියි. නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟියි. නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරු කොට තමා ඇතැයි නොහඟියි. නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන් 'මාගේ'යයි නොහඟියි. නෙවසඤ්ඤානාසංඥායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතුව කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

20. "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් දනියි. දිට්ඨය දිට්ඨය වශයෙන් ඇඳින දිට්ඨය තමා වශයෙන් නොහඟියි. දිට්ඨය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. දිට්ඨයෙන් පිටත දිට්ඨය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. දිට්ඨය 'මගේ'යයි නොහඟියි. දිට්ඨය තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් දනියි. සුතය සුතය වශයෙන් ඇඳින සුතය තමා වශයෙන් නොහඟියි. සුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. සුතය 'මගේ' යයි නොහඟියි. සුතය ආත්මය වශයෙන් සිතා ආශානේ සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන තුන) මුතය වශයෙන් දනියි. මුතය මුතය වශයෙන් හැඳින් මුතය තමා වශයෙන් නොහඟියි. මුතය කෙරෙහි ආත්මය පිහිටියේයයි නොහඟියි. මුතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. මුතය 'මාගේ'යයි නොහඟියි. මුතය ආත්මය වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් දනියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් ඇඳින විඤ්ඤාතය තමා වශයෙන් නොහඟියි. විඤ්ඤාතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාතය 'මගේ'යයි නොහඟියි. විඤ්ඤාතය තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

21 "සමානස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය (නාම ධර්ම සමූහය) සමානස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය වශයෙන් දනියි. සමානස්වභාවවූ අරූපස්කන්ධය සමානස්වභාවවූ අරූපස්කන්ධය වශයෙන් ඇඳින සමානස්වභාවවූ අරූපස්කන්ධය තමා වශයෙන් නොහඟියි. සමානස්වභාවවූ අරූපස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සමානස්වභාවවූ අරූපස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. සමානස්වභාවවූ අරූපස්කන්ධය 'මගේ'යයි නොහඟියි. සමානස්වභාවවූ අරූපස්කන්ධය තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් දනියි. වෙන් වෙන් ස්වභාවවූ

පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් ඇඳින වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් නොහඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය 'මගේ'යයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

" (රූපාරූප ධර්ම) සියල්ල සියල්ල වශයෙන් වශයෙන් දනියි. සියල්ල සියල්ල වශයෙන් හැඳින සියල්ල තමා වශයෙන් නොහඟියි. සියල්ල කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සියල්ලෙන් පිටත සියල්ල ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. සියල්ල 'මගේ'යයි නොහඟියි. සියල්ල තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

"නිර්වාණය (ඇතැම් දෘෂ්ටිකයන් නිවනයයි කියන තමා පඤ්චකාමයෙන් යුක්ත කිරීම) නිර්වාණය වශයෙන් දනියි. නිර්වාණය නිර්වාණය වශයෙන් ඇඳින නිර්වාණය තමා වශයෙන් නොහඟියි. නිර්වාණය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. නිර්වාණයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි නොහඟියි. නිර්වාණය 'මගේ' යයි නොහඟියි. නිර්වාණය තමා වශයෙන් සිතා සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? රාගය පහකළ හෙයින් වීතරාගවූ බැවිනි.

රහතුන්ගේ වසයෙන් දෙනා කරනලද දෙවැනි ක්‍රම කථාවෙහි සතරවැනි භූමි පරිච්ඡේදයයි.

22 "මහණෙනි, කෙලෙසුන් කෙරෙන් දුරුවූ කෙලෙසුන් නැතිකළාවූ වැස නිමවන ලද බ්‍රහ්මචරියාව ඇති කටයුතු අවසන් කළාවූ කෙලෙස් බර බහා තබනලද්දාවූ අර්හත් ඵලයට පැමිණියාවූ භව සංයොජන (සසර බැඳුම්) නැති කළාවූ සසරින්

මිදුනාවූ යම් ඒ (රහත්) භික්ෂු කෙනෙක් වේද හෙතෙමේද සතර වැදෑරුම් පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශේෂ නුවණින් දැන පෘථිවිධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. පෘථිවිධාතුව ආශ්‍රය කොට තමා පිහිටියේයයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. පෘථිවිධාතුවෙන් පිටත තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. පෘථිවිධාතුව මාගේයයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. පෘථිවිධාතුවට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

"ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි, ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන ආපොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. ආපොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. ආපොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි (තණ්හා මාන වශයෙන් නොහඟියි. ආපොධාතුව මාගේයයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. ආපොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

"තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශේෂ නුවණින් දැන තෙජොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟියි. තෙජොධාතුව ආශ්‍රය කොට තමා පිහිටියේයයි (තණ්හා මාන වශයෙන් නොහඟියි. තෙජොධාතුව මාගේයයි නොහඟියි. තෙජොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

"වායොධාතුව වායොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දනියි. වායොධාතුව වායොධාතුව වශයෙන් විශේෂ නුවණින් දැන වායොධාතුව තමා වශයෙන් නොහඟියි. වායොධාතුව ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. වායොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි නොහඟියි. වායොධාතුව මාගේයයි

නොහඟියි. වායොධාතුවට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

23 "භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දනියි භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දැන භූතයන් තමා වශයෙන් නොහඟියි. භූතයන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟියි. භූතයන්ගෙන් වෙන්ව තමා ඇතැයි නොහඟියි. භූතයන් 'මාගේ' යයි නොහඟියි. භූතයන්ට සතුට නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"දෙවියන් දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. දෙවියන් දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන දෙවියන් තමා වශයෙන් නොහඟියි. දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. දෙවියන්ගෙන් පිටත්හි තමා ඇතැයි නොහඟියි. දෙවියන් මාගේයයි නොහඟියි. දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දැන මාරයා තමා වශයෙන් නොහඟියි. මාරයා ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟියි. මාරයාගෙන් වෙන්ව තමා ඇතැයි නොහඟියි. මාරයා මාගේයයි නොහඟියි. මාරයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

24 "බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දැන බ්‍රහ්මයා තමා වශයෙන් නොහඟියි. බ්‍රහ්මයා ආශ්‍රය කොට තමාපිහිටයේයයි නොහඟියි. බ්‍රහ්මයාගෙන් පිටත්හි තමා ඇතැයි නොහඟියි. බ්‍රහ්මයා මාගේ යයි නොහඟියි. බ්‍රහ්මයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශේෂ නුවණින් දැන ආභස්සරදෙවියන් තමා වශයෙන් නොහඟියි. ආභස්සරදෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොහඟියි. ආභස්සරදෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. ආභස්සරදෙවියන් 'මාගේ' යයි නොහඟියි. ආභස්සරදෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන සුභකිණ්හ දෙවියන් තමා වශයෙන් නොහඟියි. සුභකිණ්හ දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් 'මාගේ'යයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දැන වෙහප්ඵල දෙවියන් තමා වශයෙන් නොහඟියි. වෙහප්ඵල දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් 'මාගේ' යයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දනියි. අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශේෂ නුවණින් දැන අභිභූබ්‍රහ්මයා තමා වශයෙන් නොහඟියි. අභිභූ බ්‍රහ්මයා ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. අභිභූ බ්‍රහ්මයාගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. අභිභූ බ්‍රහ්මයා 'මාගේ' යයි නොහඟියි. අභිභූබ්‍රහ්මයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආකාසානඤ්චායතන දෙවියන් තමා වශයෙන්

නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

"විඤ්ඤානඤ්චායතන දෙවියන් විඤ්ඤානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. විඤ්ඤානඤ්චායතන දෙවියන් විඤ්ඤානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන විඤ්ඤානඤ්චායතන දෙවියන් තමා වශයෙන් නොහඟියි. විඤ්ඤානඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤානඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. විඤ්ඤානඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟියි. විඤ්ඤානඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දනියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමා වශයෙන් නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් පිටත තමා ඇතැයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් මාගේයයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දනියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දැන නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් තමා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වශයෙන් නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් මාගේයයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

25 "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දනියි. දිට්ඨය දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දැන දිට්ඨය තමා වශයෙන් නොහඟියි. දිට්ඨය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. දිට්ඨයෙන් පිටත්හි තමා ඇතැයි නොහඟියි. දිට්ඨය මාගේයයි නොහඟියි. දිට්ඨයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් විශෙෂ නුවණින් දනියි. සුතය සුතය වශයෙන් විශෙෂ නුවණින් දැන සුතය තමා වශයෙන් නොහඟියි. සුතය ආශ්‍රයකොට තමා පිහිටියේ යයි නොහඟියි. සුතයෙන් පිටත සුතය අසුරුකොට තමා ඇතැයි නොහඟියි. මේ සුතය 'මාගේ'යයි නොහඟියි. සුතයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන තුන) මුතය වශයෙන් විශේෂ නුවණින් හඟියි. මුතය, මුතය වශයෙන් හැඳින මුතය තමා වශයෙන් නොහඟියි. මුතය කෙරෙහි තමා පිහිටියේ යයි නොහඟියි. මුතයෙන් පිටත මුතය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. මුතය 'මාගේ'යයි නොහඟියි. මුතයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් විශෙෂ නුවණින් දනියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් විශේෂ නුවණින් දැන විඤ්ඤාතය තමා වශයෙන් නොහඟියි. විඤ්ඤාතය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි.

විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාතය 'මාගේ'යයි නොහඟියි. විඤ්ඤාතයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

26 "එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය වශයෙන් විශේෂ නුවණින් දනියි. එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය වශයෙන් විශේෂ නුවණින් දැන එකස්වභාවයවූ අරූපය තමා වශයෙන් නොහඟියි. එකස්වභාවයවූ අරූපය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. එකස්වභාවයවූ අරූපයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. එකස්වභාවයවූ අරූපය 'මාගේ'යයි නොහඟියි. එකස්වභාවයවූ අරූපයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් හඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයෙන් විශෙෂ නුවණින් දැන වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය තමා වශයෙන් නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය මාගේයයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"(රූපාරූප) සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දනියි. සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දැන සියල්ල තමා වශයෙන් නොහඟියි. සියල්ල ආශ්‍රයකොට තමා පිහිටියේ යයි නොහඟියි. සියල්ලෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. සියල්ල මගේයයි නොහඟියි. සියල්ලට සතුටු

නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැතිකිරීමෙන් වීතදොසවූ බැවිනි.

"පරමදෘෂ්ටධර්ම නිර්වාණය (පඤ්චකාම සැප විඳීම) පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දනියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දැන පරමදෘෂ්ටධර්ම නිර්වාණය තමා වශයෙන් නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය මගේයයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? ද්වේෂය නැති කිරීමෙන් වීතදොසවූ බැවිනි.

රහතුන්ගේ වශයෙන් දෙශනා කරනලද තුන්වෙනි ක්‍රම කථාවෙහි පස්වෙනි භූමි පරිච්ඡේදයයි.

27. "මහණෙනි, කෙලෙසුන්කෙරෙන් දුරුවූ කෙලෙසුන් නැතිකළාවූ, වැස නිමවනලද ආර්ය මාර්ග ඇති, කටයුතු අවසන්කළාවූ කෙලෙස්බර බහාතබනලද්දාවූ, අර්හත්ඵලයට පැමිණියාවූ භව සංයොජන (සසර බැඳුම්) නැති කළාවූ සසරින් මිදුනාවූ යම් ඒ (රහත්) භික්ෂු කෙනෙක් වේද හෙතෙමේද සතර වැදෑරුම් පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් හඟියි. පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් හැඳින, පඨවිධාතුව තමායයි (තණ්හා දිට්ඨි මාන වශයෙන්) නොහඟියි. තමා පඨවිධාතුවෙහි පිහිටියේයයි නොහඟියි. පඨවිධාතුවෙන් පිටත එය ඇසුරුකොට තමා පිහිටියේයයි නොහඟියි. පඨවිධාතුව 'මගේ'යයි නොහඟියි. පඨවිධාතුවට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"සතර වැදෑරුම් ආපොධාතුව ආපොධාතුව වශයෙන් හඟියි. ආපොධාතුව ආපොධාතුව වශයෙන් හැඳින ආපොධාතුව තමායයි නොහඟියි. තමා ආපොධාතුවෙහි පිහිටියේ යයි නොහඟියි. තමා ආපොධාතුවෙන් පිටත ආපොධාතුව ආශ්‍රයකොට ඇත්තේයයි නොහඟියි. ආපොධාතුව 'මගේ'යයි

නොහඟියි. ආපොධාතුවට ආශාවෙන් සතුටුනොවෙයි. ඊටහේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"සතර වැදෑරුම් තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් හඟියි. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් හැඳින තෙජොධාතුව තමායයි නොහඟියි. තමා තෙජොධාතුවෙහි පිහිටියේයයි නොහඟියි. තෙජොධාතුවෙන් පිටත එය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟියි. තෙජොධාතුව 'මගේ'යයි නොහඟියි. තෙජොධාතුවට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හෙතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීනේ වීතමොහවූ බැවිනි.

"සතර වැදෑරුම් වායොධාතුව වායොධාතුව වශයෙන් හඟියි. වායොධාතුව වායොධාතුව වශයෙන් හැඳින වායොධාතුව තමායයි නොහඟියි. තමා වායොධාතුවෙහි පිහිටියේයයි නොහඟියි. වායොධාතුවෙන් පිටත එය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. වායොධාතුව 'මාගේ'යයි නොහඟියි. වායොධාතුවට ආශාවෙන් සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

28. "භූතයන් භූතයන් වශයෙන් දනියි. භූතයන් භූතයන් වශයෙන් දැන භූතයන් තමායයි නොහඟියි. භූතයන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. භූතයන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. භූතයන් 'මාගේ'යයි නොහඟියි. භූතයන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"දෙවියන් දෙවියන් වයෙන් දනියි. දෙවියන් දෙවියන් වශයෙන් දැන දෙවියන් තමායයි නොහඟියි. දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. දෙවියන් 'මාගේ'යයි නොහඟියි. දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"මාරයා මාරයා වශයෙන් දනියි. මාරයා මාරයා වශයෙන් දැන මාරයා තමායයි නොහඟියි මාරයා කෙරෙි තමා පිහිටියේ

යයි නොහඟියි. මාරයා ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. මාරයා 'මාගේ'යයි නොහඟියි. මාරයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

29. "බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් දනියි. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් දැන බ්‍රහ්මයා තමායයි නොහඟියි බ්‍රහ්මයා කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. බ්‍රහ්මයා ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. බ්‍රහ්මයා 'මාගේ'යයි නොහඟියි. බ්‍රහ්මයාට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"ආභස්සර දෙවියන් ආභස්සර දෙවියන් වශයෙන් දනියි. ආභස්සර දෙවියන් ආභස්සර දෙවියන් වශයෙන් දැන ආභස්සර දෙවියන් තමායයි නොහඟියි. ආභස්සර දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආභස්සර දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආභස්සර දෙවියන් 'මාගේ'යයි නොහඟියි. ආභස්සර දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් දනියි. සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් දැන සුභකිණ්හ දෙවියන් තමායයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. සුභකිණ්හ දෙවියන් 'මාගේ'යයි නොහඟියි. සුභකිණ්හ දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් දනියි වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් දැන වෙහප්ඵල දෙවියන් තමායයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි. වෙහප්ඵල දෙවියන් 'මාගේ'යයි නොහඟියි. වෙහප්ඵල දෙවියන්ට සතුටු නොවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"අභිභූ දෙවියන් අභිභූ දෙවියන් වශයෙන් දනියි. අභිභූ දෙවියන් අභිභූ දෙවියන් වශයෙන් දැන අභිභූ දෙවියන් තමායයි නොහඟියි. අභිභූ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. අභිභූ දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. අභිභූ දෙවියන් 'මාගේ'යයි නොහඟියි. අභිභූ දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් දනියි. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් දැන ආකාසානඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟියි. ආකාසානඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් දනියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් දැන විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමායයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන් 'මාගේ'යයි නොහඟියි. විඤ්ඤාණඤ්චායතන දෙවියන්ට සතුටු නොවෙයි ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් දනියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් දැන ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් 'මාගේ'යයි නොහඟියි. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් දනියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් දැන නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් 'මාගේ'යයි නොහඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

30. "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් දනියි. දිට්ඨය දිට්ඨය වශයෙන් දැන දිට්ඨය තමායයි නොහඟියි. දිට්ඨය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. දිට්ඨය ආශ්‍රය කොට තමා ඇතැයි නොහඟියි දිට්ඨය 'මාගේ'යයි නොහඟියි. දිට්ඨයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාය) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් දනියි. සුතය සුතය වශයෙන් දැන සුතය තමායයි නොහඟියි. සුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සුතය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. සුතය 'මාගේ'යයි නොහඟියි. සුතයට සතුටු

නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන ආයතන තුන) මුතය වශයෙන් දනියි. මුතය මුතය වශයෙන් දැන මුතය තමා වශයෙන් නොහඟියි. මුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. මුතය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. මුතය 'මාගේ'යයි නොහඟියි මුතයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් දනියි. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් දැන විඤ්ඤාතය තමා යයි නොහඟියි. විඤ්ඤාතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟියි. විඤ්ඤාතය 'මාගේ'යයි නොහඟියි. විඤ්ඤාතයට සතුටු නොවෙයි, ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

31. "එකස්වභාවය ඇති අරූප ධර්ම එකස්වභාවය ඇති අරූප ධර්ම වශයෙන් දනියි. එකස්වභාවය ඇති අරූප ධර්ම එකස්වභාවය ඇති අරූප ධර්ම වශයෙන් දැන එකස්වභාවය ඇති අරූප ධර්ම තමායයි නොහඟියි. එකස්වභාවය ඇති රූප ධර්ම කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. එකස්වභාවය ඇති අරූප ධර්ම ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. එකස්වභාවය ඇති අරූප ධර්ම 'මගේ'යයි නොහඟියි. එකස්වභාවය ඇති අරූප ධර්මයට සතුටු නොවෙයි ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් දනියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය වශයෙන් දැන වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය තමායයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. වෙන්

වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධය 'මගේ'යයි නොහඟියි. වෙන් වෙන් ස්වභාවයවූ පඤ්චස්කන්ධයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

"සියල්ල සියල්ල වශයෙන් දනියි. සියල්ල සියල්ල වශයෙන් දැන සියල්ල තමායයි නොහඟියි. සියල්ල කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. සියල්ල ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. සියල්ල 'මගේ' යයි නොහඟියි. සියල්ලට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැති කිරීමෙන් වීතමොහවූ බැවිනි.

"පරමදෘෂ්ටධර්ම නිර්වාණය (පඤ්චකාම සැප විඳීම) පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් දනියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් දැන පරමදෘෂ්ටධර්ම නිර්වාණය තමායයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණය 'මගේ'යයි නොහඟියි. පරමදෘෂ්ටධර්ම නිර්වාණයට සතුටු නොවෙයි. ඊට හේතු කවරේද? මොහය (මුළාව) නැතිකිරීමෙන් වීතමොහවූ බැවිනි.

රහතුන්ගේ වශයෙන් දෙශනා කරනලද සතරවෙනි ක්‍රම කථාවෙහි සයවෙනි භූමි පරිච්ඡේදයයි.

32. "මහණෙනි, කෙලෙසුන් නැසුවාවූ, සියල්ල තමාම හොඳින් අවබොධකළාවූ තථාගතයන් වහන්සේද සතරවැදෑරුම් පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. පෘථිවිධාතුව පෘථිවිධාතුව වශයෙන් විශේෂ නුවණින් දැන පෘථිවිධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. පෘථිවිධාතුව ආශ්‍රයකොට තමා පිහිටියේයයි (තණ්හාමාන වශයෙන්) නොහඟින්නාහ. පෘථිවිධාතුවෙන් පිටත තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. පෘථිවිධාතුව 'මාගේ'යයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ.

පෘථිවිධාතුවට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන ආපොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. ආපොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. ආපොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. ආපොධාතුව 'මාගේ'යයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. ආපොධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන තෙජොධාතුව තමායයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. තෙජොධාතුව ආශ්‍රය කොට තමා පිහිටියේයයි (තණ්හා මාන වශයෙන්) නොහඟින්නාහ. තෙජොධාතුව මාගේයයි නොහඟින්නාහ. තෙජොධාතුවට සතුට නොවන්නාහ. ඊට හේතුව කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"වායොධාතුව වායොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. වායොධාතුව වායොධාතුව වශයෙන විශෙෂ නුවණින් දැන වායොධාතුව තමා වශයෙන් නොහඟින්නාහ. වායොධාතුව ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. වායොධාතුවෙන් පිටත්හි තමා ඇතැයි නොහඟින්නාහ. වායොධාතුව 'මාගේ'යයි නොහඟින්නාහ. වායොධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

33. "භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. භූතයන් භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දැන භූතයන් තමා වශයෙන් නොහඟින්නාහ. භූතයන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. භූතයන්ගෙන් වෙන්ව තමා ඇතැයි

නොහඟින්නාහ. භූතයන් 'මාගේ'යයි නොහඟින්නාහ. භූතයන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"දෙවියන් දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. දෙවියන් දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දැන දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. දෙවියන්ගෙන් පිටත්හි තමා ඇතැයි නොහඟින්නාහ. දෙවියන් 'මාගේ' යයි නොහඟින්නාහ. දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දැන මාරයා තමා වශයෙන් නොහඟින්නාහ. මාරයා ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. මාරයාගෙන් වෙන්ව තමා ඇතැයි නොහඟින්නාහ. මාරයා 'මාගේ' යයි නොහඟින්නාහ. මාරයාට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

34. "බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දැන බ්‍රහ්මයා තමා වශයෙන් නොහඟින්නාහ. බ්‍රහ්මයා ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. බ්‍රහ්මයාගෙන් පිටත්හි තමා ඇතැයි නොහඟින්නාහ. බ්‍රහ්මයා 'මාගේ'යයි නොහඟින්නාහ. බ්‍රහ්මයාට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආභස්සරදෙවියන් ආභස්සරදෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආභස්සරදෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. ආභස්සරදෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. ආභස්සරදෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. ආභස්සරදෙවියන් 'මාගේ'යයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොහඟින්නාහ. ආභස්සරදෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සුභකිණ්හ දෙවියන් සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන සුභකිණ්හ දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දන්නාහ වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන වෙහප්ඵල දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. අභිභූබ්‍රහ්මයා අභිභූබ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දැන අභිභූබ්‍රහ්මයා තමා වශයෙන් නොහඟින්නාහ. අභිභූබ්‍රහ්මයා ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. අභිභූබ්‍රහ්මයාගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. අභිභූබ්‍රහ්මයා 'මාගේ'යයි නොහඟින්නාහ. අභිභූබ්‍රහ්මයාට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ.

ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආකාසානඤ්චායතන දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ විඤ්ඤාණඤ්චායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් මාගේයයි නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දැන නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන්ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

36. "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. දිට්ඨය දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දැන දිට්ඨය තමා වශයෙන් නොහඟින්නාහ. දිට්ඨය ආශ්‍රය කොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. දිට්ඨයෙන් පිටත්හි තමා ඇතැයි නොහඟින්නාහ. දිට්ඨය 'මගේ'යයි නොහඟින්නාහ. දිට්ඨයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සුතය සුතය වශයෙන් විශේෂ නුවණින් දැන සුතය තමා වශයෙන් නොහඟින්නාහ. සුතය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. සුතයෙන් පිටත සුතය ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. සුතය 'මාගේ' යයි නොහඟින්නාහ. සුතයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන තුන) මුතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. මුතය, මුතය වශයෙන් දැන මුතය තමා වශයෙන් නොහඟින්නාහ. මුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. මුතයෙන් පිටත මුතය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. මුතය 'මාගේ'යයි නොහඟින්නාහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මුතයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

“විඤ්ඤාතය (ධර්මායතනය) විඤ්ඤාතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. විඤ්ඤාතය විඤ්ඤාතය වශයෙන් විශෙෂ නුවණින් දැන විඤ්ඤාතය තමා වශයෙන් නොහඟින්නාහ. විඤ්ඤාතය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. විඤ්ඤාතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. විඤ්ඤාතය ‘මාගේ’යයි නොහඟින්නාහ. විඤ්ඤාතයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

36. “එක ස්වභාවයවූ අරූපය එක ස්වභාවයවූ අරූපය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. එක ස්වභාවයවූ අරූපය එක ස්වභාවයවූ අරූපය වශයෙන් විශෙෂ නුවණින් දැන එක ස්වභාවයවූ අරූපය තමා වශයෙන් නොහඟින්නාහ. එක ස්වභාවයවූ අරූපය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. එක ස්වභාවයවූ අරූපයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. එක ස්වභාවයවූ අරූපය ‘මාගේ’ යයි නොහඟින්නාහ. එක ස්වභාවයවූ අරූපයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

“සමාන ස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය (නාම ධර්ම සමූහය) සමාන ස්වභාව ඇත්තාවූ අරූපස්කන්ධය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය සමාන ස්වභාවවූ අරූපස්කන්ධය වශයෙන් දැන සමාන ස්වභාවවූ අරූපස්කන්ධය තමා වශයෙන් නොහඟින්නාහ. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. සමාන ස්වභාවවූ අරූපස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය ‘මාගේ’යයි නොහඟින්නාහ. සමාන ස්වභාවවූ අරූපස්කන්ධය තමා වශයෙන් සිතා සතුටු

නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් ඇඳින වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පඤ්චස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය 'මාගේ' යයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"(රූපාරූප ධර්ම) සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සියල්ල සියල්ල වශයෙන් හැඳින, සියල්ල තමා වශයෙන් නොහඟින්නාහ. සියල්ල කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. සියල්ලෙන් පිටත සියල්ල ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. සියල්ල 'මාගේ'යයි නොහඟින්නාහ, සියල්ල තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

"නිර්වාණය (ඇතැම් දෘෂ්ටිකයන් නිවනයයි කියන තමා පඤ්චකාමයෙන් යුක්ත කිරීම)නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. නිර්වාණය නිර්වාණය වශයෙන් ඇඳින නිර්වාණය තමා වශයෙන් නොහඟින්නාහ. නිර්වාණය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. නිර්වාණයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. නිර්වාණය 'මගේ' යයි නොහඟින්නාහ. නිර්වාණය තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තථාගතයන් වහන්සේගේ යහපත් දැනීමයයි කියමි.

ශාස්තෘන් වහන්සේගේ වශයෙන් දෙශනා කරනලද පළමුවැනි ක්‍රම කථාවෙහි සත්වැනි භූමි පරිච්ඡේදයයි.

37. "මහණෙනි, කෙලෙසුන් නැසුවාවූ සියල්ල තමාම හොඳින් අවබොධකළාවූ තථාගතයන් වහන්සේද පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. පඨවිධාතුව පඨවිධාතුව වශයෙන් විශෙෂ නුවණින් දැන පඨවිධාතුව තමා වශයෙන් නොහඟින්නාහ. පඨවිධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. පඨවිධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟින්නාහ. පඨවිධාතුව 'මාගේ'යයි නොහඟින්නාහ. පඨවිධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධකළසේක්ද, එහෙයින්යයි කියමි.

"ආපොධාතුව ආපොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආපොධාතුව ආපොධාතුව වශයෙන් දැන ආපොධාතුව තමායයි නොහඟින්නාහ. ආපොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. ආපොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟින්නාහ. ආපොධාතුව ඇසුරු කොට ඉන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. ආපොධාතුව 'මාගේ'යයි නොහඟින්නාහ. ආපොධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල්කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන් දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින් යයි කියමි.

"තෙජොධාතුව, තෙජොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. තෙජොධාතුව තෙජොධාතුව වශයෙන් දැන

තෙජොධාතුව තමායයි නොහඟින්නාහ. තෙජොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. තෙජොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟින්නාහ. තෙජොධාතුව ඇසුරු කොට ඉන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. තෙජොධාතුව 'මගේ'යයි නොහඟින්නාහ. තෙජො ධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේදැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන් උතුම්වූ සම්‍යක් සම්බොධය අවබොධ කළසේක්ද එහෙයින්යයි කියමි.

"වායොධාතුව, වායොධාතුව වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. වායොධාතුව වායොධාතුව වශයෙන් දැන වායොධාතුව තමා යයි නොහඟින්නාහ වායොධාතුව කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. වායොධාතුව ආශ්‍රයකොට තමා ඇතැයි නොහඟින්නාහ. වායොධාතුව ආශ්‍රයකොට ඉන්පිටත තමා ඇතැයි නොහඟින්නාහ. වායොධාතුව 'මාගේ' යයි නොහඟින්නාහ. වායොධාතුවට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හේතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණයවේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන් ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක්සම්බොධිය අවබොධ කළසේක්ද එහෙයින්යයි කියමි.

38 "භූතයන් (චාතුර්මහාරාජික දෙව් ලොවින් පහත සත්වයන්) භූතයන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. භූතයන් භූතයන් වශයෙන් ඇඳින භූතයන් තමායයි නොහඟින්නාහ. භූතයන් තුළ තමා ඇතැයි නොහඟින්නාහ. භූතයන් ගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. භූතයන් 'මාගේ'යයි නොහඟින්නාහ. භූතයන්ට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද?

තණ්හාව දුකට මුල් කාරණයයි. දැන කර්ම භවය හේතු කොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීනේ ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන් උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින් යයි කියමි.

"දෙවියන් (මාරදෙව්ලොවින් පහත දෙවියන්) දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. දෙවියන්, දෙවියන් වශයෙන් ඇඳින, දෙවියන් තමායයි නොහඟින්නාහ. දෙවියන් තමා තුළ ඇතැයි නොහඟින්නාහ. දෙවියන් කෙරෙන් පිටත දෙවියන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. දෙවියන් 'මගේ'යයි නොහඟින්නාහ. දෙවියන් ගැන සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්ම භවය හේතුකොට ගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණ වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින් යයි කියමි.

"මාරයා මාරයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. මාරයා මාරයා වශයෙන් ඇඳින මාරයා තමායයි නොහඟින්නාහ. මාරයා කෙරෙහි තමා ඇතැයි නොහඟින්නාහ. මාරයාගෙන් පිටත තමා ඇතැයි නොහඟින්නාහ. මාරයා 'මගේ'යයි නොහඟින්නාහ. මාරයාට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්ම භවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන් ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද එහෙයින්යයි කියමි.

39. "බ්‍රහ්මයා (ප්‍රථමධ්‍යානතලයෙහි බ්‍රහ්මයන්) බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. බ්‍රහ්මයා බ්‍රහ්මයා වශයෙන් හැඳින බ්‍රහ්මයා තමා වශයෙන් නොහඟින්නාහ. බ්‍රහ්මයා කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. බ්‍රහ්මයාගෙන් පිටත බ්‍රහ්මයා ඇසුරුකොට තමා ඇත්තේයයි නොහඟින්නාහ බ්‍රහ්මයා 'මගේ'යයි නොහඟින්නාහ. බ්‍රහ්මයාට ආශාවෙන් සතුටු නොවන්නාහ ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොට ගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද එහෙයින්යයි කියමි.

"ආභස්සර දෙවියන් (ද්විතීයධ්‍යාන තල වැසි බ්‍රහ්මයන්) ආභස්සර දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආභස්සර දෙවියන් ආභස්සර දෙවියන් වශයෙන් හැඳින ආභස්සර දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. ආභස්සර දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. ආභස්සර දෙවියන්ගෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. ආභස්සර දෙවියන් 'මාගේ'යයි නොහඟින්නාහ. ආභස්සර දෙවියන් ගැන ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්ම භවය හේතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින්යයි කියමි.

"සුභකිණ්හදෙවියන්, (තෘතීයධ්‍යානතල වැසි බ්‍රහ්මයන්) සුභකිණ්හ දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සුභකිණ්හ දෙවියන්, සුභකිණ්හ දෙවියන් වශයෙන් හැඳින

සුභකිණ්හ දෙවියන් තමා වශයෙන් නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන් කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන්ගෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන් 'මගේ'යයි නොහඟින්නාහ. සුභකිණ්හ දෙවියන්ට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධකළ සේක්ද, එහෙයින් යයි කියමි.

"වෙහප්ඵල නම්වූ දෙවියන් (චතුර්ථධ්‍යාන තල වැසි බ්‍රහ්මයන්) වෙහප්ඵල දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. වෙහප්ඵල දෙවියන් වෙහප්ඵල දෙවියන් වශයෙන් හැඳින වෙහප්ඵල දෙවියන් තමායයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන් 'මගේ'යයි නොහඟින්නාහ. වෙහප්ඵල දෙවියන්ට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන් දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"අභිභූ නම් (අසංඥතල වැසි) බ්‍රහ්මයා, (අසංඥතල වැසි) බ්‍රහ්මයා වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. අභිභූ බ්‍රහ්මයා, අභිභූ බ්‍රහ්මයා වශයෙන් හැඳින, අභිභූ බ්‍රහ්මයා තමායයි නොහඟින්නාහ. අභිභූ බ්‍රහ්මයා කෙරෙහි තමා ඇතැයි

නොහඟින්නාහ. අභිභූ බ්‍රහ්මයාගෙන් පිටත ඔහු ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. අභිභූ බ්‍රහ්මයා 'මගේ' යයි නොහඟින්නාහ. අභිභූ බ්‍රහ්මයාට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන් අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"ආකාසානඤ්චායතනතල වැසි දෙවියන් ආකාසානඤ්චායතනතල වැසි දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් ආකාසානඤ්චායතන දෙවියන් වශයෙන් හැඟින, ආකාසානඤ්චායතන දෙවියන් තමායයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් කෙරෙන් පිටත්හි ඔවුන් අසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන් 'මගේ' යයි නොහඟින්නාහ. ආකාසානඤ්චායතන දෙවියන්ට ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් වශයෙන් හැඟින විඤ්ඤාණඤ්චායතන දෙවියන් තමායයි නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙහි තමා

ඇතැයි නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. විඤ්ඤාණඤ්චායතන දෙවියන් ‘මගේ’ යයි නොහඟින්නාහ විඤ්ඤාණඤ්චායතන දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල්කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

“ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ආකිඤ්චඤ්ඤායතන දෙවියන් වශයෙන් හැඳින, ආකිඤ්චඤ්ඤායතන දෙවියන් තමායයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. ආකිඤ්චඤ්ඤායතන දෙවියන් ‘මාගේ’ යයි නොහඟින්නාහ ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හේතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන් උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින්යයි කියමි.

“නෙවසංඥානාසංඥායතන දෙවියන් නෙවසංඥානාසංඥානයතන දෙවියන් වශයෙන් විශේෂ නුවණින් දන්නාහ. නෙවසංඥානාසංඥායතන දෙවියන් නෙවසංඥානාසංඥායතන දෙවියන් වශයෙන් හැඳින,

නෙවසංඥානාසංඥායතන දෙවියන් තමායයි නොහඟින්නාහ. නෙවසංඥානාසංඥායතන දෙවියන් කෙරෙහි තමා ඇතැයි නොහඟින්නාහ. නෙවසංඥානාසංඥායතන දෙවියන් කෙරෙන් පිටත ඔවුන් ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. නෙවසංඥානාසංඥායතන දෙවියන් 'මාගේ' යයි නොහඟින්නාහ. නෙවසංඥානාසංඥායතන දෙවියන්ට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හේතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින්යයි කියමි,

**40.** "දිට්ඨය (රූපායතනය) දිට්ඨය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. දිට්ඨය දිට්ඨය වශයෙන් ඇඟින දිට්ඨය තමා වශයෙන් නොහඟින්නාහ. දිට්ඨය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. දිට්ඨයෙන් පිටත දිට්ඨය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. දිට්ඨය 'මාගේ' යයි නොහඟින්නාහ. දිට්ඨය තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තියවේයයිද උපන්සත්වයා හට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධ කිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන් උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින්යයි කියමි.

"සුතය (ශබ්දායතනය) සුතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සුතය සුතය වශයෙන් ඇඟින සුතය තමා වශයෙන් නොහඟින්නාහ. සුතයකෙරෙහි තමා පිහිටියේ යයි නොහඟින්නාහ. සුතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. සුතය 'මාගේ' යයි නොහඟින්නාහ. සුතය

ආත්මය වශයෙන් සිතා ආශාවෙන් සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොට ගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්ද, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන් දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක්ද, එහෙයින්යයි කියමි.

"මුතය (ගන්ධ රස ස්පර්ශ යන තුන) මුතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. මුතය මුතය වශයෙන් හැඳින මුතය තමා වශයෙන් නොහඟින්නාහ. මුතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. මුතයෙන් පිටත එය ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. මුතය 'මාගේ' යයි නොහඟින්නාහ. මුතය තමාවශයෙන් සිතා සතුටු නොවන්නාහ ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන් අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධකළ සේක්ද, එහෙයින්යයි කියමි.

"විඥ්ඥාතය (ධර්මායතනය) විඥ්ඥාතය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. විඥ්ඥාතය විඥ්ඥාතය වශයෙන් ඇඳින විඥ්ඥාතය තමා වශයෙන් නොහඟින්නාහ විඥ්ඥාතය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. විඥ්ඥාතයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. විඥ්ඥාතය 'මාගේ' යයි නොහඟින්නාහ. විඥ්ඥාතය තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත්සේක්ද, මහණෙනි,

තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැති කිරීමෙන්, ආලය හැරීමෙන් නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක්සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින් යයි කියමි.

41. "එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. එකස්වභාවයවූ අරූපය එකස්වභාවයවූ අරූපය, වශයෙන් විශෙෂ නුවණින් දැන එකස්වභාවයවූ අරූපය තමා වශයෙන් නොහඟින්නාහ එකස්වභාවයවූ අරූපය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. එකස්වභාවයවූ අරූපයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. එකස්වභාවයවූ අරූපය 'මාගේ' යයි නොහඟින්නාහ. එකස්වභාවයවූ අරූපයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක්සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය වශයෙන් ඇඳින වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය කෙරෙහි තමා පිහිටියේයයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය 'මගේ' යයි නොහඟින්නාහ. වෙන් වෙන් ස්වභාවවූ පංචස්කන්ධය තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව

(මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"(රූපාරූප ධර්ම) සියල්ල සියල්ල වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. සියල්ල සියලු වශයෙන් හැඳින, සියල්ල තමා වශයෙන් නොහඟින්නාහ. සියල්ල කෙරෙහි තමා පිහිටියේ යයි නොහඟින්නාහ. සියල්ලෙන් පිටත සියල්ල ඇසුරු කොට තමා ඇතැයි නොහඟින්නාහ. සියල්ල 'මගේ' යයි නොහඟින්නාහ. සියල්ල තමා වශයෙන් සිතා සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයිද මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

"පරම දෘෂ්ටධර්ම නිර්වාණය (පඤ්චකාම සැප විඳීම) පරම දෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දන්නාහ. පරම දෘෂ්ටධර්ම නිර්වාණය පරමදෘෂ්ටධර්ම නිර්වාණය වශයෙන් විශෙෂ නුවණින් දැන පරම දෘෂ්ටධර්ම නිර්වාණය තමා වශයෙන් නොහඟින්නාහ. පරමදෘෂ්ටධර්ම නිර්වාණය ආශ්‍රයකොට තමා පිහිටියේයයි නොහඟින්නාහ. පරමදෘෂ්ටධර්ම නිර්වාණයෙන් පිටත එය ඇසුරුකොට තමා ඇතැයි නොහඟින්නාහ. පරම දෘෂ්ටධර්ම නිර්වාණය මගේ යයි නොහඟින්නාහ. පරමදෘෂ්ටධර්ම නිර්වාණයට සතුටු නොවන්නාහ. ඊට හේතු කවරේද? තණ්හාව දුකට මුල් කාරණයයි දැන කර්මභවය හෙතුකොටගෙන උත්පත්තිය වේයයිද උපන් සත්වයාහට ජරාව (මහලුවීම) මරණය වේයයි මෙසේ දැනගත් සේක්ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සියලු ආකාරයෙන් තණ්හාව

නැතිකිරීමෙන්, ආලය හැරීමෙන්, නිරුද්ධකිරීමෙන්, අත්හැරීමෙන්, දුරලීමෙන්, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, එහෙයින්යයි කියමි.

ශාස්තෲන් වහන්සේ විසින් දෙශනා කරනලද දෙවෙනි ක්‍රම කථාවෙහි අටවෙනි භූමි පරිච්ඡේදයයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. (මානයෙන් මත්ව සිටි) ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු නොවූහ.

(පළමුවැනි මූලපරියාය සූත්‍රය නිමි.)

---

## සබ්බාසව සූත්‍රය

1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවනයේ අනේපිඬු මහසිටුහු විසින් කරවනලද ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි" කියා භික්ෂූන්ට කථාකළහ. ඒ භික්ෂූහු "ස්වාමීනි" කියා උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය දේශනා කළහ.

2. "සියලු කාමාදී ආශ්‍රවයන් (කෙලෙස්) වැළැක්වීම පිළිබඳ ධර්මය දේශනා කරන්නෙමි. එය අසව්, සිත්හි ධාරණය කර ගනිව්, කියන්නෙමි"යි වදාළහ.

"එසේය ස්වාමීනි,' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළහ. මහණෙනි, මම දන්නහුගේ දක්නහුගේ කාමාදී කෙලෙස් නැතිකිරීම කියමි. නොදන්නහුගේ නොදක්නහුගේ (කෙලෙස් නැතිකිරීම) නොකියමි.

3. "මහණෙනි, කුමක් දන්නහුගේ කුමක් දක්නහුගේ ආශ්‍රවයන් නැතිවීම වේද? නුවණින් මෙනෙහිකිරීමත් නුනුවණින් මෙනෙහි

කිරීමත් යන දෙකය. මහණෙනි, නුනුවණින් සිතන්නාවූ පුද්ගලයාට නූපන්නාවූ ආශ්‍රවයෝද උපදිත්. උපන්නාවූ ආශ්‍රවයෝද වැඩෙත්. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නහුට නූපන්නාවූ ආශ්‍රවයෝද නූපදිත්. උපන්නාවූ ආශ්‍රවයෝද දුරුවෙත්.

මහණෙනි, සෝවාන් මාර්ගයෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. සතිසංවරයෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. ඥාණසංවරයෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. ඉවසීමෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. ශීලසංවරයෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. වීර්ය සංවරයෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ. සකෘදාගාමි අනාගාමි අර්හත් යන මාර්ග තුනෙන් පහකළ යුතුවූ කෙලෙස් ඇත්තාහ.

4. "මහණෙනි, සෝවාන් මගින් පහකළයුතු වූ කෙලෙස් නම් කවරහුද? මහණෙනි, මේ ලොකයෙහි බුද්ධාදී ආර්යයන් නුවණැසින් නුදුටුවාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ බුද්ධාදී සත්පුරුෂයන් නුවණැසින් නුදුටුවාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ ඇසූ පිරූ තැන් නැත්තාවූ (නූගත්) පෘථග්ජන පුද්ගල තෙමේ මෙනෙහි කළයුතු කරුණු නොදනියි. මෙනෙහි නොකොට යුතුවූ කරුණු නොදනියි. මෙනෙහි කටයුතුවූ කරුණු නොදන්නාවූ මෙනෙහි නොකටයුතු කරුණු නොදන්නාවූ හෙතෙමේ යම් ධර්මයන් මෙනෙහි නොකට යුත්තාහුද ඒ ධර්මයන් මෙනෙහි කරයි. මේ ධර්මයන් මෙනෙහි කළයුත්තාහුද ඒ ධර්මයෙන් මෙනෙහි නොකරයි. මහණෙනි, මෙනෙහි නොකළයුතුවූ යම් ධර්මයන් මෙනෙහි කෙරේද, ඒ ධර්මයෝ කවරහුද? මහණෙනි, යම් ධර්මයන් මෙනෙහි කරන්නාවූ යමෙකුට නූපන්නාවූද, කාමාශ්‍රවය (කාම ආශාව) උපදී ද, උපන්නාවූ කාමාශ්‍රවය (කාම ආශාව) වැඩේද නූපන්නාවූ භවාශ්‍රය (භව කෙරෙහි ආශාව) උපදියිද උපන්නාවූද, භවාශ්‍රවය වැඩෙයිද නූපන්නාවූ අවිද්‍යාශ්‍රවය (මුළාව) උපදීද උපන්නාවූද අවිද්‍යාශ්‍රවය වැඩේද මේ ධර්මයෝ (ඒ පෘථග්ජනයා විසින්) මෙනෙහි කරන්නාවූ මෙනෙහි නොකළ යුතු ධර්මයෝයි,

**5.** "මහණෙනි, මෙනෙහි නොකරන්නාවූ මෙනෙහි කළ යුතු ධර්මයෝ කවරහුද? මහණෙනි, යම් ධර්මයන් මෙනෙහි කරන්නා වූ යමෙකුට නූපන්නාවූද කාමාශ්‍රවය නූපදීද, උපන්නාවූ කාමාශ්‍රවය පහවේද නූපන්නාවූ භවාශ්‍රවය නූපදීද උපන්නාවූ භවාශ්‍රවය පහවේද නූපන්නාවූ අවිද්‍යාශ්‍රවය නූපදීද, උපන්නාවූ අවිද්‍යාශ්‍රවය පහවේද, මේ ධර්මයෝ මෙනෙහි නොකරන්නාවූ මෙනෙහි කළයුතු ධර්මයෝය.

මෙනෙහි නොකළයුතු ධර්මයන් මෙනෙහි කරන්නාවූද මෙනෙහි කළයුතු ධර්මයන් මෙනෙහි නොකරන්නාවූද ඔහුට නූපන්නාවූද ආශ්‍රවයෝ උපදිත්. උපන්නාවූද ආශ්‍රවයෝ වැඩෙත්. ඒ අන්ධබාල පෘථග්ජනතෙම මෙසේද නුනුවණින් මෙනෙහි කරයි. මම අතීත කාලයෙහි උත්පත්ති වශයෙන් කිසිවෙක් වූයෙම්ද? කිසිවෙක් නුවූයෙම්ද? අතීත කාලයෙහි මම ක්‍ෂත්‍රියාදීන් අතුරෙන් කවරෙක් වූයෙම්ද? අතීත කාලයෙහි කෙබඳු සටහන් ඇත්තෙක් වූයෙම්ද? මම අතීත කාලයෙහි ක්ෂත්‍රියාදී වශයෙන් කවරෙක්ව සිට බ්‍රාහ්මණාදී කවරෙක් වූයෙම්ද? මම අනාගත කාලයෙහි කිසිවෙක් වන්නෙම්ද? අනාගත කාලයෙහි කිසිවෙක් නොවන්නෙම්ද? අනාගත කාලයෙහි ක්ෂත්‍රියාදී වශයෙන් කවරෙක් වන්නෙම්ද? අනාගත කාලයෙහි කෙබඳු සටහන් ඇත්තෙක් වන්නෙම්ද? මම මතු කල්හි බ්‍රාහ්මණාදී කවරෙක්ව වෛශ්‍යාදී කවරෙක් වන්නෙම්ද ඉපදීමෙහි පටන් මරණය දක්වා ඇති මේ කාලයෙහිද තමා කෙරෙහි එසේද මෙසේදැයි සැක ඇත්තේ වෙයි. කෙසේදයත්? මම යන කිසිවෙක් ඇත්තේද, මම යන කිසිවෙක් නැත්තේද, ක්ෂත්‍රියාදීන් අතුරෙන් කවරෙක් වෙම්ද? කිනම් සටහනක් ඇත්තෙක් වෙම්ද? මේ සත්ව තෙමේ කොතැනින් ආයේද? හෙතෙම කොහි යන්නෙක් වන්නේද? යනුවෙනි. මෙසේ නුනුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට සය ආකාර දෘෂ්ටීන් අතුරෙන් එක්තරා දෘෂ්ටියක් උපදියි.

1. "සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ආත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටිය හෝ උපදියි. සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ආත්මය සිඳේය, යන උච්ඡේදදෘෂ්ටිය හෝ උපදියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සංඥාස්කන්ධය ප්‍රධාන කොට ඇති ස්කන්ධයන් ආත්මයයි ගෙන සංඥා ස්කන්ධය නමැති ආත්මය කරණකොට ගෙන ඉතිරි ස්කන්ධ නමැති ආත්මය දනිමියයි කියා හෝ සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ගනිමින් දෘෂ්ටිය උපදියි. සංඥාව ආත්මය කොට ඉතිරි ස්කන්ධ ආත්මය වශයෙන් නොගෙන සංඥාව නම්වූ ආත්මය විසින් ආත්මය නොවන ඉතිරි ස්කන්ධ දනිමැයි කියා හෝ සත්‍ය වශයෙන් දැඩි වශයෙන් ගනිමින් දෘෂ්ටිය උපදියි සංඥාවෙන් අන්‍ය ස්කන්ධයන් අනාත්මය වශයෙන් ගෙන ආත්මය නොවන වේදනාදී ස්කන්ධයන් කරණ කොටගෙන ආත්මය වන සංඥාස්කන්ධය දනිමැයි හෝ සත්‍ය වශයෙන් දැඩිවශයෙන් ගනිමින් දෘෂ්ටිය උපදියි. නැතහොත් ඕහට මෙබඳු දෘෂ්ටියක් හෝ වෙයි. කථාකරන්නාවූ සැප දුක් විඳින්නාවූ යම් මේ ආත්මයක් ඒ ඒ ජාතියෙහි කළ කුශල අකුශල කර්මයන්ගේ විපාකය විඳියිද, මාගේ ඒ මේ ආත්මය තෙම නිත්‍යය, ස්ථිරය, හැමදාම පවතියි. නොපෙරළෙන ස්වභාව ඇත්තේය. හැමදා පවතින දෙයක් මෙන් සදාකාලික යයි සම්මතවූ චන්ද්‍ර සූර්යාදීන් මෙන් එසේම සිටින්නේයයි කියායි.

"මහණෙනි, මෙය දෘෂ්ටියයිද දෘෂ්ටිලැහැබයයිද දෘෂ්ටි කාන්තාරයයිද, දෘෂ්ටිහුලයයිද, දෘෂ්ටිකම්පනයයිද, දෘෂ්ටි සංයොජනයයිද කියනු ලැබේ. මහණෙනි, දෘෂ්ටි නමැති බැඳුමෙන් යුක්තවූ ඇසූ පිරූතැන් නැත්තාවූ (නූගත්) පෘථග්ජන තෙම උත්පත්තියෙන්ද ජරාවෙන් හා මරණයෙන්ද ශොක කිරීමෙන්ද වැළපීමෙන්ද ශාරීරික දුකින්ද මානසික දුකින්ද දැඩි වෙහෙසින්ද යන සියලු සංසාරදුකින් නොමිදේ යයි කියමි.

7. "මහණෙනි, බුද්ධාදී ආර්යයන් දුටුවාවූ ආර්යධර්මයෙහි දක්ෂවූ ආර්යධර්මයෙහි මනාව හික්මුණාවූ බුද්ධාදී සත්පුරුෂයන් දුටුවාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි මනාව හික්මුණාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවක තෙම මෙනෙහිකළයුතු ධර්මයන් දනියි. මෙනෙහි නොකළයුතු ධර්මයන් දනියි. මෙනෙහි කළයුතු ධර්මයන් දන්නාවූ මෙනෙහි නොකළයුතු ධර්මයන් දන්නාවූ ඒ ආර්ය පුද්ගල තෙම මෙනෙහි

නොකළයුතු ධර්ම මෙනෙහි නොකරයි. මෙනෙහි කළයුතු ධර්ම මෙනෙහි කරයි. මහණෙනි, මෙනෙහි නොකළයුතු ධර්ම කවරහුද? මහණෙනි, යම් ධර්මයක් මෙනෙහි නොකරන්නහුට නූපන් කාමාශ්‍රවය උපදීද, උපන් කාමාශ්‍රවය වැඩේද, නූපන් භවාශ්‍රවය උපදීද, උපන් භවාශ්‍රවය වැඩේද නූපන් අවිද්‍යාශ්‍රවය උපදීද, උපන් අවිද්‍යාශ්‍රවය වැඩේද, එබඳු ධර්ම මෙනෙහි නොකළ යුත්තාහුය.

8. "මහණෙනි, මෙනෙහි කළයුතු ධර්ම කවරහුද? මහණෙනි, යම් ධර්මයක් මෙනෙහි කරන්නහුට නූපන් කාමාශ්‍රවය නූපදීද, උපන් කාමාශ්‍රවය නැතිවේද, නූපන් භවාශ්‍රවය නූපදීද, උපන් භවාශ්‍රවය නැතිවේද, නූපන් අවිද්‍යාශ්‍රවය නූපදීද, උපන් අවිද්‍යාශ්‍රවය නැතිවේද, මෙබඳු ධර්ම මෙනෙහි කළයුත්තාහුය. මෙනෙහි නොකළයුතු ධර්ම මෙනෙහි නොකරන, මෙනෙහි කළයුතු ධර්ම මෙනෙහි කරන ඕහට නූපන් ආශ්‍රවයෝ නූපදීත්, උපන් ආශ්‍රවයෝ නැති වෙත්. හෙතෙම මේ දුකයයි නුවණින් කල්පනා කරයි, මේ දුක් ඉපදීමට හේතුවයයි නුවණින් කල්පනා කරයි. මේ දුක් නැතිකිරීමයයි නුවණින් කල්පනාකරයි. මේ දුක් නැති කිරීමේ මාර්ගයයි නුවණින් කල්පනා කරයි. මෙසේ මෙනෙහි කරන්නාවූ ඕහට දිට්ඨිසංයොජන (විසිආකාර ආත්මදෘෂ්ටිය) ද විචිකිච්ඡා සංයෝජනය (සැකය) සීලබ්බත පරාමාස සංයෝජනයද, මේ ශාසනයෙන් පිටත සිල් හා වත් සෙවීමද යන සංයෝජන (කෙලෙස් බැමි) තුන නැති වෙත්.

"මහණෙනි, මේ ආශ්‍රවයෝ පළමුකොට නිවන්දැකීම් වන සෝවාන් මාර්ගයෙන් නැතිකළ යුත්තාහුයයි කියනු ලැබෙත්.

9. "මහණෙනි, සතිසංවරයෙන් නැතිකළයුතු කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නුවණින් සලකා බලා ඇස පිළිබඳ සංවරයෙන් යුක්තවූයේ වාසයකරයිද මහණෙනි, ඇස සංවර කර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිතවූ යම් කෙලෙස් උපදිත්ද, ඇස සංවර කරගෙන වාසය කරන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්. නුවණින් සලකා බලා කණ සංවර

කරගෙන වාසය කරයිද, කණ සංවර කර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිතවූ යම් කෙලෙස් උපදිත්ද, කණ සංවර කරගෙන වාසය කරන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්. නුවණින් සලකා බලා නාසය සංවර කරගෙන වාසයකරයිද, නාසය සංවරකර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිතවූ යම් කෙලෙස් උපදිද්ද, නාසය සංවර කරගෙන වාසය කරන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්. නුවණින් සලකා බලා දිව සංවර කරගෙන වාසය කරයිද දිව සංවර කර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිත යම් කෙලෙස් උපදිද්ද, දිව සංවර කර ගෙන වසන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළනොවෙත්. නුවණින් සලකා බලා ශරීරය සංවර කරගෙන වාසයකරයිද ශරීරය සංවර කර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිත යම් කෙලෙස් උපදිද්ද, ශරීරය සංවර කරගෙන වසන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්. නුවණින් සලකා බලා සිත සංවර කරගෙන වාසය කරයිද සිත සංවර කර නොගෙන වාසය කරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිත යම් කෙලෙස් උපදිද්ද, සිත සංවර කරගෙන වසන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්. මහණෙනි, මේ ආශ්‍රවයන් සිහිය නමැති සංවරයෙන් නැති කළ යුත්තාහුයයි කියනු ලැබේ.

10. "මහණෙනි, සිව්පස සේවනයෙන් පහකළ යුතු කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නුවණින් සලකා ශීත නැසීම පිණිස, උෂ්ණය නැසීම පිණිස, මැසි, මදුරු, සුළං, වැසි, සර්ප ආදී ස්පර්ශ නැති කිරීම පිණිස ලජ්ජා උපදවන ශරීර අවයව වසාගැනීම පිණිස, පමණක් සිවුරු සේවනය කරයිද, නුවණින් සලකා බලා ක්‍රීඩා පිණිස නොව, මද වැඩීම පිණිස නොව, සැරසීම පිණිස නොව, අලංකාර පිණිස නොව, මේ ශරීරයාගේ පැවැත්ම පිණිස, යැපීම පිණිස, බඩගිනි වෙහෙස සංසිඳවනු පිණිස, ශාසන මාර්ග බ්‍රහ්ම චර්යාව රැකීමට අනුබල පිණිස, මේ වැළඳීමෙන් පැරණි බඩගිනි වෙදනාව නසන්නෙමි.

(අධිකභොජනයෙන් හටගන්නා) අලුත් වේදනාද නූපදවන්නෙමි. මාගේ ශරීර පැවත්මද වන්නේය. සැප විහරණයද වන්නේයයි සලකා ආහාර වළඳයිද ශීත නැසීම පිණිස, උෂ්ණය නැසීම පිණිස, මැසි, මදුරු, සුළං, අව්, සර්ප ආදී ස්පර්ශ නැසීම පිණිස, ඍතු පීඩා නැති කිරීම පිණිස, විවේකයෙහි ඇලෙනු පිණිස, සේවනය කරමියි නුවණින් සලකා සේනාසන සේවනය කරයිද, උපන්නාවූ නොයෙක් රොග වේදනා නැසීම පිණිස රොගාබාධයන් නැතිව සිටීම පිණිස සේවනය කරමියි, නුවණින් සලකා ගිලන්පස බෙහෙත් ආදිය සේවනය කරයිද,

"මහණෙනි නුවණින් සලකා සිව්පසය සේවනය නො කිරීම නිසා පහළවන, වෙහෙස දැවිල්ල සහිත කෙලෙස් වෙත් නම් නුවණින් සලකා සිව්පසය සේවනය කිරීමෙන් ඔහුට ඒ කෙලෙස් පහළ නොවෙත්. මහණෙනි, මේ කෙලෙස් නුවණින් සලකා සිව්පසය සේවනය කිරීමෙන් පහකළ යුත්තාහුයයි කියනු ලැබෙත්.

11. "මහණෙනි, අධිවාසනයෙන් (ඉවසීමෙන්) නැතිකළ යුතු කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නුවණින් සලකා බලා ශීතල ඉවසන්නේ වෙයි, උෂ්ණය, බඩගින්න හා පිපාසය, මැසි, මදුරු, හුළං, අව්ව, සර්ප ආදී ස්පර්ශ ඉවසන්නේ වෙයි. නපුරුකොට කියනලද, නපුරුලෙස පැමිණි වචන ඉවසන්නේ වෙයි. හටගත් දුක්වූ, තියුණුවූ, කෘෘරවූ, කටුකවූ, සතුටක් නූපදවන්නාවූ, අමනාපවූ, දිවි පැහැරගැනීමට තරම්වූ ශරීර වෙදනාවන් ඉවසන්නේ වෙයි. මහණෙනි, නොඉවසන්නහුට වෙහෙස හා දැවිල්ල ඇති කෙලෙස් උපදින්නාහු නම් මෙසේ ඉවසන්නහුට ඒ කෙලෙස් පහළ නොවෙත්. මහණෙනි, මේ කෙලෙස් ඉවසීමෙන් නැති කළ යුත්තාහු යයි කියනු ලැබෙත්.

12. "මහණෙනි දුරලීමෙන් නැතිකළ යුතු කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් සලකා නපුරු ඇතුන් දුරු කරයි. වල් අසුන් දුරුකරයි. සැර ගොනුන් දුරුකරයි. නපුරු බල්ලන් දුරුකරයි. සර්පයින්ද උල් කටු පිහිටි තැන්ද

හාත්පසින් කඩා ගිය ඉවුරුද එක් පසකින් කඩාගිය ප්‍රපාතද ඉඳුල්දිය ගැප්මල ආදිය දමන ස්ථානද එබඳු කුනුමඩ ගලා බස්නා තැන්ද දුරුකරයි. යම්බඳු නුසුදුසු සෙනාසනවල හුන්නාවූද අගොචරස්ථානයන්හි හැසිරෙන්නාවූද ලාමකවූ මිත්‍රප්‍රතිරූපක අමිත්‍රයන් සේවනය කරන්නාවූද භික්ෂුව නුවණැත්තාවූ එකට මහණකම් කරන්නාවූ භික්ෂූහු පවිටු මහණකු කොට සලකන්නාහුද එබඳු අයුතු තැන් හා එබඳු අගොචර ස්ථානද, එබඳු පවිටු මිතුරන්ද නුවණින් සලකා බලා දුරු කරයි. මහණෙනි, එබඳු දේ දුරු නොකරන්නහුට වෙහෙස හා දැවිලි සහිත යම් කෙලෙස් උපදිත්ද, එබඳු දේ දුරුකරන්නහුට ඒ කෙලෙස් පහළ නොවෙත්. මහණෙනි, මේ කෙලෙස් දුරු කිරීමෙන් නැතිකළ යුත්තාහු යයි කියනු ලැබෙත්.

13. "මහණෙනි, විනොදනයෙන් (දොෂ සැලකීම් සහිත වීර්යයෙන් දුරලීමෙන්) නැතිකළ යුතුවූ කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් සලකා උපන්නාවූ කාම කල්පනාව නොඉවසයිද, දුරුකරයිද, බැහැර කරයිද, විනාශකරයිද, අභාවයට පමුණුවයිද, උපන්නාවූ ව්‍යාපාද (නැසීමේ) කල්පනාව නොඉවසයිද, දුරුකරයිද, බැහැර කරයිද, විනාශ කරයිද, අභාවයට පමුණුවයිද, උපන්නාවූ විහිංසා (හිංසා කිරීමේ) කල්පනාව නොඉවසයිද, දුරුකරයිද, බැහැර කරයිද විනාශ කරයිද, අභාවයට පමුණුවයිද, උපන්නාවූ ලාමක අකුසල ධර්ම නොඉවසයිද, දුරුකරයිද, බැහැර කරයිද, විනාශ කරයිද, අභාවයට පමුණුවයිද, යම්හෙයකින් ඒ කල්පනා දුරලීම නොකරන්නහුට වෙහෙස හා දැවිල්ල සහිත යම් කෙලෙස් උපදිත්ද, ඒ කල්පනා දුරලන්නහුට වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළනොවෙත්. මහණෙනි, මේ කෙලෙස් දුරලීමෙන් නැති කළ යුත්තාහයි කියනු ලැබෙත්.

14. මහණෙනි, භාවනාවෙන් නැතිකළ යුතුවූ කෙලෙස් කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් සලකා විවෙකය ඇසුරු කළාවූ විරාගය (නොඇල්ම) ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ, නිවණට පමුණුවන්නාවූ ස්මෘතිසම්බොධ්‍යඞගය (සම්බොධියට අංගවූ සිහිය) වඩයි.

"නුවණින් සලකා, විවෙකය ඇසුරුකළාවූ, විරාගය (නොඇල්ම) ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවණට පමුණුවන්නාවූ ධර්මවිචය සම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ නුවණ) වඩයි.

"නුවණින් සලකා, විවෙකය ඇසුරු කළාවූ, විරාගය (නොඇල්ම) ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවණට පමුණුවන්නාවූ වීර්ය සම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ වීර්ය) වඩයි.

"නුවණින් සලකා, විවෙකය ඇසුරු කළාවූ, විරාගය (නොඇල්ම) ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවණට පමුණුවන්නාවූ ප්‍රීති සම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ ප්‍රීතිය) වඩයි.

"නුවණින් සලකා, විවෙකය ඇසුරු කළාවූ, විරාගය (නොඇල්ම) ඇසුරු කළාවූ, නිවණට පමුණුවන්නාවූ පස්සද්ධි සම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙක) වඩයි.

"නුවණින් සලකා විවේකය ඇසුරු කළාවූ විරාගය (නොඇල්ම) ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවණට පමුණුවන්නාවූ සමාධිසම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ සමාධිය) වඩයි.

"නුවණින් සලකා, විවේකය ඇසුරුකළාවූ විරාගය (නොඇල්ම) ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවණට පමුණුවන්නාවූ උපෙක්ෂා සම්බොධ්‍යංගය (සම්බොධියට අංගවූ උපෙක්ෂාව) වඩයි. භාවනා නොකරන්නහුට වෙහෙස දැවිල්ල සහිත යම් කෙලෙස් උපදිත්ද, භාවනාකරන්නහුට ඒ වෙහෙස හා දැවිල්ල සහිත කෙලෙස් පහළ නොවෙත්.

15. "මහණෙනි, යම්කලෙක පටන් මහණහුගේ සෝවාන් මාර්ගයෙන් නැති කළ යුතු කෙලෙස් සෝවාන් මාර්ගයෙන් නැති වූවාහු වෙත්ද, සංවරයෙන් නැති කළ යුතු කෙලෙස් සංවරයෙන් නැතිවූවාහු වෙත්ද, සේවනයෙන් නැති කළ යුතු

කෙලෙස් සේවනයෙන් නැතිවූවාහු වෙත්ද, ඉවසීමෙන් නැති කළ යුතු කෙලෙස් ඉවසීමෙන් නැතිවූවාහු වෙත්ද, දුරු කිරීමෙන් නැති කළ යුතු කෙලෙස් දුරුකිරීමෙන් නැතිවූවාහු වෙත්ද දුරලීමෙන් නැති කළ යුතු කෙලෙස් දුරලීමෙන් නැති වූවාහු වෙත්ද, භාවනාවෙන් නැති කළ යුතු කෙලෙස් භාවනාවෙන් නැති වූවාහු වෙත්ද, මහණෙනි, මේ මහණතෙම සියලු කෙලෙස් වැළැක්වීමෙන් යුක්තවූයේ වාසය කෙරේයයිද තෘෂ්ණාව මුල් සින්දේයයිද, සංයෝජන නැති කෙළේයයිද මානය නැති කිරීමෙන් සියලු සංසාර දුක කෙළවර කෙළේ යයි"ද කියනු ලැබේ. මේ ධර්මදෙශනාව භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් අනුමෝදන් වූවෝය.

(දෙවෙනිවූ සබ්බාසව සූත්‍රය නිමි.)

---

## 3. ධම්ම දායාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනාථපිණ්ඩික සිටුහු විසින් කරවනලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි,' කියා භික්ෂූන්ට කථා කළහ. ඒ භික්ෂූහු 'ස්වාමීනි,' කියා උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය දේශනා කළහ.

2. "මහණෙනි, මාගේ ධර්මය දායාදකොට ඇත්තෝ (පිළිගන්නෝ) වව්. ආමිසය (සිව්පසය) දායාදකොට ඇත්තෝ (පිළිගන්නෝ) නොවව්. කෙසේ නම් මාගේ ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට ඇත්තෝ වන්නාහුද, ආමිසය (සිව්පසය) දායාද කොට ඇත්තෝ නොවන්නාහුදැයි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත. මහණෙනි, තොපත් මාගේ ආමිසය ගරුකොට පිළිගන්නෝ වන්නහුද? ධර්මය ගරුකොට නොපිළිගන්නෝ වන්නහුද, 'ශාස්තෘ ශ්‍රාවකයෝ ආමිස ගරුකව වාසය කරති.

ධර්ම ගරුකව වාසය නොකරති'යි තොපද ඒ කාරණයෙන් ගැරහිය යුත්තෝ වන්නාහුය. 'ශාස්තෘ ශ්‍රාවකයෝ ආමිසය දායාදකොටගෙන ධර්මය දායාද කොට නොගෙන වාසය කරත්ය'යි මමත් ගැරහිය යුත්තෙක් වන්නෙමි. මහණෙනි, තොපිත් මාගේ ධර්මය දායාදකොට ඇත්තාහු ආමිසය දායාදකොට නැත්තාහු වන්නහු නම් 'ශාස්තෘ ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට ඇත්තාහු වාසය කරත්, ආමිසය දායාදකොට නැත්තාහු වාසය කරත්ය'යි තෙපිත් ගැරහිය යුත්තෝ නොවන්නහුය. 'ශාස්තෘ ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට වාසය කරති, ආමිසය ගරුකොට වාසය නොකරති'යි මමත් එයින් ගැරහිය යුත්තෙක් නොවන්නෙමි. මහණෙනි, එහෙයින් ධර්මය දායාදකොට ඇත්තෝ වව්, ආමිසය දායාදකොට ඇත්තෝ නොවව්. කෙසේ නම් මාගේ ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට ඇත්තෝ වන්නාහුද, ආමිසය දායාදකොට ඇත්තෝ නොවන්නාහුදැයි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත.

3. "මහණෙනි, මම වැළඳුයෙමි, ඇති පමණ වළඳා ආහාරය ප්‍රතික්ෂේප කෙළෙමි. භොජනයෙන් සම්පූර්ණ වූයෙමි. වළඳා අවසන් කෙළෙමි. බඩගින්න නිවීයාමෙන් සුවපත් වූයෙමි. ප්‍රයෝජන ඇතිතාක් ආහාර ගත්තේ වෙමි. මහණෙනි, ඉතිරිව ඉවත දැමිය යුතුවූ පිණ්ඩපාතය (ආහාරය) ඇත්තේය.

"එකල්හි බඩගින්නෙන් ඇතිවූ දුර්වලකමින් පෙළෙන්නාවූ භික්ෂූන් දෙනමක් එන්නාහුය. මම ඔවුන්ට මෙසේ කියන්නෙමි. 'මහණෙනි, මම වනාහි වැළඳුයේ වෙමි. ඇති පමණ වැළඳුයෙමි. භොජනයෙන් සම්පූර්ණ වූයේ වෙමි. වළඳා අවසන් කෙළෙමි සුවපත් වූයෙමි. ප්‍රයෝජන ඇතිතාක් ආහාර ගත්තෙමි. ඉතිරිවූ ඉවත දැමිය යුතුවූ මේ ආහාරයද ඇත. ඉදින් කැමැත්තහු නම් වළඳව්. ඉදින් තෙපි නොවළඳන්නහු නම් මම දැන් එය තණකොළ නැති බිමක හෝ දමන්නෙමි. (බත් ආදිය දැමීමෙන් නැසෙන) කුඩාසතුන් නැති දියෙහි හෝ පාකොට හරින්නෙමි.' (කියායි.)

"ඔවුන් දෙදෙනා අතුරෙන් එක් භික්ෂුවක්හට මෙබඳු සිතක් ඇතිවෙයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි වැළඳුයේ වෙයි.

පවාරණය කළේ, ආහාරයෙන් සම්පූර්ණ වූයේ, වළඳා අවසන් කළේ, සුඛිත වූයේ, ප්‍රයෝජන ඇතිතාක් ආහාර ගත්තේ වෙයි. ඉතිරිවූ ඉවත දැමිය යුතුවූ මේ ආහාරයද ඇත්තේය. ඉදින් අපි නොවළඳන්නෙමු නම් භාග්‍යවතුන් වහන්සේ එය තණකොළ නැති බිමක හෝ දමන්නාහ. කුඩා සතුන් නැති ජලයක හෝ පාකොට හරින්නාහ. "මහණෙනි, ධර්මය දායාදකොට ඇත්තෝ වව්. ආමිසය දායාදකොට ඇත්තෝ නොවව්ය"යි භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන ලදී. මේ පිණ්ඩපාතයද එක් ආමිසයකි. 'මම මේ ආහාරය නොවළඳා මේ බඩගිනි දුබලකමින් යුක්තව මෙසේ මේ රෑ දාවල ඉක්මවන්නෙම් නම් ඉතා යෙහෙකැ'යි කියායි. ඒ භික්ෂුතෙම ඒ ආහාරය අනුභව නොකොට ඒ බඩගිනි දුකින්ම ඒ රෑ දාවල ඉක්මවන්නේය, නැවත දෙවන මහණට මෙබඳු සිතක් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි වැළඳුයේ වෙයි. පවාරණය කළේ, ආහාරයෙන් සම්පූර්ණ වූයේ, වළඳා අවසන් කළේ, සුඛිත වූයේ, ප්‍රයෝජන ඇතිතාක් ආහාර ගත්තේ වෙයි. ඉතිරිවූ ඉවත දැමිය යුතු මේ ආහාරයද වෙයි. ඉදින් අපි නොවළඳන්නෙමු නම් භාග්‍යවතුන් වහන්සේ එය තණකොළ නැති බිමක හෝ දමන්නාහ, කුඩා සතුන් නැති ජලයක හෝ පාකොට හරින්නාහ. මම මේ ආහාරය වළඳා බඩගිනි දුර්වලකම දුරුකොට මෙසේ මේ රෑ දාවල ඉක්මවන්නෙම් නම් යහපතැයි කියායි.

"මහණෙනි, ඒ දෙවන භික්ෂුව ඒ ආහාරය වළඳා බඩගිනි දුබල බව දුරුකොට 'මෙසේ රෑ දාවල ඉක්මවන්නේවී නමුත් අර පළමු භික්ෂුවම මා විසින් අතිශයින් පිදියයුත්තේද, අතිශයින් පැසසිය යුත්තේද වෙයි.'

"ඊට හේතු කවරේද? මහණෙනි, ඒ ආහාරය නොගැනීම ඒ භික්ෂුහට බොහෝ කාලයක් මුළුල්ලෙහි ස්වල්ප ආශා ඇති බව පිණිසද, ලද දෙයකින් සතුටුවීම පිණිසද, පහසුවෙන් කෙලෙසුන් කපා හැරීම පිණිසද, පහසුවෙන් පොෂ්‍යකළහැකි බව පිණිසද, වීර්ය පටන්ගැන්ම පිණිසද පවත්නේය.

"මහණෙනි, එහෙයින් මාගේ ධර්මය දායාදකොට ඇත්තෝ වව්, ආමිසය දායාදකොට ඇත්තෝ නොවව්. කෙසේනම් මාගේ

ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට ඇත්තෝ වන්නාහුද? ආමිසය දායාදකොට ඇත්තෝ නොවන්නහුදැයි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. මෙය වදාරා සුගතයන්වහන්සේ හුනස්නෙන් නැගිට විහාරයට වැඩියහ.

**4.** එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් 'ඇවැත්නි,මහණෙනි,' කියා භික්ෂූන්ට කථාකළහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි,' කියා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය දේශනා කළහ.

"ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ විවේකයෙහි වාසය කරද්දී ශ්‍රාවකයෝ කොපමණකින් (කරුණු කීයකින්) විවේකයෙහි හික්මෙත්ද? ශාස්තෘන්වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ කොපමණකින් විවේකයෙහි නොහික්මෙත්ද?"

"ආයුෂ්මතුනි, අපි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් මේ වදාළ ධර්මයෙහි අර්ථය දැනගන්නට දුර සිටද එන්නෙමු. මේ ධර්මයෙහි අර්ථය ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේටම අයත්වීම යහපත්ය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරාගන්නාහුයයි" කීහ.

"ඇවැත්නි, එසේ වීනම් අසව, මනාකොට මෙනෙහි කරව් කියන්නෙමි" ඒ භික්ෂූහු 'එසේය ඇවැත්නි' කියා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ දේශනා කළහ.

**5.** "ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ කෙතෙක් කරුණකින් විවේකයෙහි නොහික්මෙත්ද, ඇවැත්නි, මේ ශාසනයෙහි ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේ විවේකව වාසය කරද්දී විවේකයෙහි නොහික්මෙත්ද, ශාස්තෘන් වහන්සේ යම් ධර්මයන්ගේ නැතිකිරීම දේශනාකළේද ඒ ධර්මයන් නැති නොකරත්ද, චීවරාදිය බහුලකොට ඇත්තෝ

වෙත්ද, සර්වඥශාසනය ලිහිල්කොට ගන්නෝ වෙත්ද, නීවරණයන්හි ඇලී වාසය කරත්ද, උතුම් විවේකයෙහි (නිර්වාණයෙහි) බහා තුබූ වීර්ය ඇත්තාහු වෙත්ද, ඇවැත්නි, ඒ භික්ෂූන් අතුරෙහි වැඩිසිටි (ස්ථවිර) භික්ෂූහු කරුණු තුනකින් ගැරහිය යුතු වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසයකරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි නොහික්මෙති යන මේ පළමුවෙනි කාරණයෙන් ස්ථවිර භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ යම් ධර්මයක් දුරුකළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් දුරු නොකරතියි යන මේ දෙවෙනි කාරණයෙන් ස්ථවිර භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. චීවර ආදිය බහුලකොට ඇත්තෝය, සර්වඥ ශාසනය ලිහිල්කොට ගන්නෝය. නීවරණයන්හි ඇලී වාසය කරන්නෝය, විවේකයෙහි බහා තැබූ වීර්ය ඇත්තාහුය යන මේ තුන්වෙනි කරුණෙන් ස්ථවිර භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙති ඇවැත්නි, ස්ථවිර භික්ෂූහු වනාහි මේ කරුණු තුනෙන් ගැරහිය යුත්තෝ වෙත්.

**6.** "ඇවැත්නි, ඒ භික්ෂූන් අතුරෙහි මධ්‍යම භික්ෂූහු කරුණු තුනකින් ගැරහිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි නොහික්මෙති යන මේ පළමුවෙනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ශාස්තෘන්වහන්සේ යම් ධර්මයන් දුරු කළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් දුරු නොකරතියි යන මේ දෙවෙනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. චීවරාදිය බහුලකොට ඇත්තෝය. සර්වඥශාසනය ලිහිල්කොට සලකන්නෝය, නීවරණයන්හි ඇලී වාසය කරන්නෝය, විවේකයෙහි බහා තැබූ වීර්ය ඇත්තෝය යන මේ තුන්වෙනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ඇවැත්නි, මධ්‍යම භික්ෂූහු වනාහි මේ කරුණු තුනින් ගැරහිය යුත්තෝ වෙත්.

**7.** "ඇවැත්නි, ඒ භික්ෂූන් අතුරෙහි නවක (අලුත පැවිදිවූ) භික්ෂූහු කරුණු තුනකින් ගැරහිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි

නොහික්මෙති යන මේ පළමුවෙනි කාරණයෙන් නවක භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ශාස්තෘන්වහන්සේ යම් ධර්මයක් දුරුකළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් දුරු නොකරතියි යන මේ දෙවෙනි කාරණයෙන් නවක භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. චීවරාදිය බහුලකොට ඇත්තෝය, සර්වඥ ශාසනය ලිහිල්කොට සලකන්නෝය, නීවරණයන්හි ඇලී වාසය කරන්නෝය. විවේකයෙහි බහා තැබූ වීර්ය ඇත්තෝය යන මේ තුන්වෙනි කාරණයෙන් නවක භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ඇවැත්නි, නවක භික්ෂූහු වනාහි මේ කරුණු තුනින් ගැරහිය යුත්තෝ වෙත්.

"ඇවැත්නි, මෙපමණකින් වනාහි ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි නොහික්මෙති.

8. "ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ කොපමණකින් විවේකයෙහි හික්මෙද්ද? ඇවැත්නි, මේ ශාසනයෙහි ශාස්තෘන්වහන්සේ විවේකයෙන් වාසයකරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි හික්මෙත් ද ශාස්තෘන් වහන්සේ යම් ධර්මයන් දුරුකළ යුතුයයි වදාළේ නම්, ඒ ධර්ම දුරුකරත්ද, චීවරාදිය බහුලකොට නැත්තෝ වෙත්ද, ශාසනය ලිහිල්කොට නොගන්නෝ වෙත්ද, නීවරණයන්හි ඇලී වාසය නොකරන්නෝ වෙත්ද, විවේකය පෙරටුකොට ගන්නෝ වෙද්ද,

9. "ඇවැත්නි, ඒ භික්ෂූන් අතුරෙහි ස්ථවිර භික්ෂූහු කරුණු තුනකින් පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි හික්මෙති. යන මේ පළමුවෙනි කාරණයෙන් ස්ථවිර භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ යම් ධර්මයන් නැතිකළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් නැතිකරත් යන මේ දෙවෙනි කාරණයෙන් ස්ථවිර භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. චීවර ආදිය බහුලකොට නැත්තෝය, ශාසනය ලිහිල් කොට නොගන්නෝය, නීවරණයන්හි ගැලී වාසය නොකරන්නෝය, විවේකයෙහි පෙරටුව යන්නෝය යන මේ තුන්වෙනි

කාරණයෙන් ස්ථවිර භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ඇවැත්නි, ස්ථවිර භික්ෂූහු වනාහි මේ කරුණු තුනින් පැසසිය යුත්තෝ වෙත්.

10. "ඇවැත්නි, ඒ භික්ෂූන් අතරෙහි මධ්‍යම භික්ෂූහු කරුණු තුනකින් පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙන් හික්මෙත් යන මේ පළමුවැනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ යම් ධර්මයන් නැතිකළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් නැති කරත් යන මේ දෙවෙනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. චීවර ආදිය බහුලකොට නැත්තෝය, ශාසනය ලිහිල්කොට නොගන්නෝය, නීවරණයන්හි ගැලී වාසය නොකරන්නෝය, විවේකයෙහි පෙරටුව යන්නෝය යන මේ තුන්වැනි කාරණයෙන් මධ්‍යම භික්ෂූහු වනාහි මේ කරුණු තුනින් පැසසිය යුත්තෝ වෙත්.

11. "ඇවැත්නි, ඒ භික්ෂූන් අතරෙහි නවක භික්ෂූහු කරුණු තුනකින් පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ විවේකයෙන් වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙන් හික්මෙත් යන මේ පළමුවැනි කාරණයෙන් නවක භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ශාස්තෘන් වහන්සේ යම් ධර්මයන් නැති කළ යුතුයයි වදාළේ නම් ඒ ධර්මයන් නැති කරත් යන මේ දෙවැනි කාරණයෙන් නවක භික්ෂූහු පැසසිය යුත්තෝවෙත්. චීවර ආදිය බහුලකොට නැත්තෝය. ශාසනය ලිහිල්කොට නොගන්නෝය. නීවරණයන්හි ගැලී වාසය නොකරන්නෝය යන මේ තුන්වැනි කාරණයෙන් නවක භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ඇවැත්නි, නවක භික්ෂූහු වනාහි මේ කරුණු තුනින් පැසසිය යුත්තෝ වෙත්.

12. "ඇවැත්නි, ඒ දුරුකළයුතු ධර්මයන් අතුරෙහි ලොභයද ලාමකය, ද්වෙෂයද ලාමකය, ලොභය, නැතිකිරීම පිණිසද ද්වෙෂය නැතිකිරීම පිණිසද නුවණැස ඇති කරන්නාවූ සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ

චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ, සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

13. "ඇවැත්නි, ක්‍රොධය ලාමකය, බද්ධවෛරයද ලාමකය, ක්‍රොධය නැතිකිරීම පිණිසද බද්ධවෛරය නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇති කරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ, සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

14. "ඇවැත්නි, ගුණමකු බවද ලාමකය, පලාසය (ගුණ නැතිව සිටිමින් ගුණවතුන් හා සමානකොට සිතීම) ද ලාමකය. ගුණමකු බව නැතිකිරීම පිණිසද පලාසය (ගුණ නැතිව සිටිමින් ගුණවතුන් හා සමානකොට සිතීම) නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇති කරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි

පටුන



කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටයි. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

15. "ඇවැත්නි, ඊර්ෂ්‍යාවද ලාමකය, මසුරු බවද ලාමකය ඊර්ෂ්‍යාව නැතිකිරීම පිණිසද, මසුරු බව නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ, සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

16. "ඇවැත්නි, මායාව (කළ පව් වැසීම) ද ලාමකය, සඨබව (නැති ගුණ පහළ කිරීම) ද ලාමකය, මායාව නැති කිරීම පිණිසද සඨබව නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ චතුරාර්ය සත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ,

චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

17. "ඇවැත්නි, දැඩි බව (හිත ඉදිමීම) ද ලාමකය, කරනුත්තරියකරණය (එකට එක කිරීම) ද ලාමකය, දැඩිබව නැතිකිරීම පිණිසද, කරනුත්තරියකරණය නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇතිකරන්නාවූ රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

18. "ඇවැත්නි, මානයද ලාමකය, අධික මානයද ලාමකය. මානය නැතිකිරීම පිණිසද, අධිකමානය නැතිකිරීම පිණිසද, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදීන් සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ, සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව ඇත. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාවය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අටය. ඇවැත්නි, නුවණැස ඇතිකරන්නාවූ, සත්‍ය දැනීම ඇතිකරන්නාවූ, රාගාදිය සංසිඳීම පිණිස පවත්නාවූ, චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ සත්‍ය අවබොධය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාව මේය.

19. "ඇවැත්නි, මදය (මත්වීම) ද ලාමකය, ප්‍රමාදය (කාමසැපෙහි ගැලීම) ද ලාමකය. මදය නැතිකිරීම පිණිසද

ප්‍රමාදය නැතිකිරීම පිණිසද නුවණැස ඇතිකරන්නාවූ සත්‍ය දැනීම ඇතිකරන්නාවූ රාගාදීන්ගේ සංසිඳීම පිණිස පවත්නාවූ චතුරාර්යසත්‍යය දැනීම පිණිස පවත්නාවූ, සත්‍යය අවබොධය පිණිස පවත්නාවූ, නිර්වාණය පිණිස පවත්නාවූ ඒ මධ්‍යම ප්‍රතිපදාව කවරේද? යහපත් දැකීමය, යහපත් කල්පනාවය, යහපත් වචනය, යහපත් කර්මාන්තය, යහපත් ජීවිකාවය, යහපත් උත්සාහය, යහපත් සිහියය, යහපත් සමාධියය යන මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමය. ඇවැත්නි, මේ මධ්‍යම ප්‍රතිපදාව නුවණැස ඇතිකිරීම පිණිසද, සත්‍යය දැනීම පිණිසද, රාගාදීන්ගේ සංසිඳීම පිණිසද, චතුරාර්යසත්‍යය දැනීම පිණිසද, සත්‍ය අවබොධය පිණිසද නිර්වාණය පිණිසද පවත්නේය"යි වදාළ සේක.

ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය වදාළහ, ඒ භික්ෂූහු ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

(තුන්වෙනිවූ ධර්මදායාද සූත්‍රය නිමි)

---

## 4 භයභෙරව සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජෙතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති.

එකල්හි ජානුස්සොණි නම් බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාමවූ ජානුස්සොණි බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කෙළේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, යම් යම් කුලපුත්‍රයෝ භවත් ගෞතමයින් උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි

පැවිදි වූවාහුද ඔවුන්ට පින්වතුන් වහන්සේම නායකය. පින්වතුන් වහන්සේම ඔවුන්ට බොහෝ උපකාර ඇත්තෙක. පින්වතුන් වහන්සේම ඔවුන් සමාදන් කරවන්නාහ. ඒ ජන සමූහතෙම භවත් ගෞතමයින්ගේ දෘෂ්ටානුගතියට (දැකීම අනුගමනය කිරීම) පැමිණේයයි" කියායි. "බ්‍රාහ්මණය, ඒ කරුණ එසේමය. බ්‍රාහ්මණය, යම් ඒ කුලපුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහුද? ඔවුන්ට මමම නායකවෙමි මමම බොහෝ උපකාර ඇත්තේ වෙමි. මමම ඔවුන් සමාදන් කරවන්නෙමි. ඒ ජන සමූහතෙමේ මගේම දෘෂ්ටානුගතියට පැමිණෙන්නේය."

3. "භවත් ගෞතමයෙනි, ආරණ්‍ය සේනාසනයද වනයෙහි දුර පිහිටි සේනාසනද වනයෙහි ඉතාම දුර පිහිටි සේනාසනද ලැබීම දුෂ්කරය. හෙවත් එහි වාසය නොඉවසිය හැකිය. විවේකය දුෂ්කරය. තනිව විසීමේ සිත් ඇලවීම දුෂ්කරය. වනයෝ තුමූ සමාධිය නොලබන්නාවූ භික්ෂූහුගේ සිත පැහැර ගන්නාක් මෙන් වෙති. බ්‍රාහ්මණය, ඒ එසේමය. බ්‍රා්මණය, ඒ එසේමය. බ්‍රාහ්මණය, ආරණ්‍ය සේනාසනයද, වනයෙහි දුර පිහිටි සේනාසනයද, වනයෙහි ඉතාම දුර පිහිටි සේනාසනයද ලැබීම දුෂ්කරය. හෙවත් එහි වාසය නොඉවසිය හැකිය. විවේකය දුෂ්කරය, තනිව විසීමේ සිත් ඇලවීම දුෂ්කරය, වනයෝ තුමූ සමාධිය නොලබන්නාවූ භික්ෂූහුගේ සිත පැහැර ගන්නාක් මෙන් වෙති. බ්‍රාහ්මණය, බුදුවන්නට පෙර බොධිසත්ව කාලයේදී මටද මේ කල්පනාව ඇතිවිය. (එනම්) අරණ්‍ය සේනාසනද, වනයෙහි දුර පිහිටි සේනාසනද, වනයෙහි ඉතාම දුර පිහිටි සේනාසනද ලබන්ට දුෂ්කරය, හෙවත් එහි වාසය නොඉවසිය හැකිය, විවේකය දුෂ්කරය, තනිව විසීමේ සිත් ඇලවීම දුෂ්කරය, වනයෝ තුමූ සමාධිය නොලබන්නාවූ භික්ෂූහුගේ සිත පැහැරගන්නාක් මෙන් වෙති යනුයි.

4. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. අපිරිසිදු ක්‍රියා ඇති යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසන හා ඉතා දුර පිහිටි

සේනාසනද සේවනය කරත්ද? ඒ පින්වත් මහණ බමුණෝ අපිරිසිදු ක්‍රියා නමැති ස්වකීය දොෂ හෙතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි අපිරිසිදු ක්‍රියා ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම පිරිසිදු ක්‍රියා ඇත්තෙමි. යම් ආර්ය කෙනෙක් පිරිසිදු ක්‍රියා ඇත්තාහු වන සේනාසන සේවනය කරත් ද ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ පිරිසිදු ක්‍රියා ඇති බව තමා කෙරෙහි දකින මම බොහෝසෙයින් වනවාසය පිණිස නිර්භය බවට පැමිණියෙමි.

**5.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. අපිරිසිදු වචන ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද දුර පිහිටි සේනාසනද සේවනය කරත්ද, ඒ පින්වත් මහණ බමුණෝ අපිරිසිදු වචන නමැති ස්වකීය දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි අපිරිසිදු වචන ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම පිරිසිදු වචන ඇත්තේ වෙමි. යම් ආර්ය කෙනෙක් පිරිසිදු වචන ඇත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරත්ද ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. මේ පිරිසිදු වචන ඇති බව තමා කෙරෙහි දකින මම බොහෝසෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**6.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. අපිරිසිදු සිතිවිලි ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරත්ද, ඒ පින්වත් මහණ බමුණෝ අපිරිසිදු සිතිවිලි නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි අපිරිසිදු සිතිවිලි ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම පිරිසිදු වචන ඇත්තේ වෙමි. යම් ආර්ය කෙනෙක් පිරිසිදු සිතිවිලි ඇත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක්වෙමි. බ්‍රාහ්මණය, මේ පිරිසිදු සිතිවිලි ඇති බව තමා කෙරෙහි දක්නා මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**7.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. අපිරිසිදු ජීවිකා ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ආරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද දුර පිහිටි සේනාසනද සේවනය කරත්ද, ඒ පින්වත් මහණ බමුණෝ අපිරිසිදු ජීවිකා නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි අපිරිසිදු ජීවිකා ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම පිරිසිදු ජීවිකා ඇත්තේ වෙමි. යම් ආර්‍ය කෙනෙක් පිරිසිදු ජීවිකා ඇත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ පිරිසිදු ජීවිකා ඇති බව තමා කෙරෙහි දක්නා මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**8.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. අධික ලොභ ඇත්තාවූ, කාමයන්හි තියුණු රාග ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද ඒ පින්වත් මහණ බමුණෝ අධික ලොභ නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි අධික ලොභ ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම අධික ලොභ නැත්තේ වෙමි. යම් ආර්‍ය කෙනෙක් අධික ලොභ නැත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ අධික ලොභ නැතිකම තමා කෙරෙහි දක්නා මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**9.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. ස්වභාව ගතියෙන් වෙනස්වී දුෂ්ට ස්වභාවයට පැමිණි සිත් ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද, ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ ක්‍රොධ සිත නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි ක්‍රොධ සිත් ඇතිව වනසේනාසන සේවනය නොකරමි. මම ක්‍රොධ සිත් නැත්තේ වෙමි. යම් ආර්‍ය කෙනෙක් මෛත්‍රී සිත්

ඇත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ මෛත්‍රී සිත් ඇතිබව තමා කෙරෙහි දක්නා මම බොහෝ සෙයින් වන වාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**10.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. ථීන මිද්ධයෙන් (හිතේ ගිලන්කමින් හා චෛතසිකයන්ගේ ගිලන්කමින්) මඩනා ලද්දාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ ථීනමිද්ධ නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි ථීනමිද්ධ ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම ථීනමිද්ධ නැත්තේ වෙමි. යම් ආර්ය කෙනෙක් ථීනමිද්ධ නැත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ ථීනමිද්ධ නැතිකම තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**11.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. විසිර ගියාවූ නොසන්සුන් සිත් ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද, වනයෙහි ළඟ පිහිටි සේනාසනද, ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ නොසංසිඳුනු සිත නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි නොසංසිඳුනු සිත් ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම සංසිඳුනු සිත් ඇත්තේ වෙමි. යම් ආර්ය කෙනෙක් සංසිඳුනු ඇත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ සංසිඳුනු සිත් ඇති බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**12.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. සැක කරන්නාවූ නිශ්චයක් නැත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ

බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ සැක නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි සැක සහිත සිත් ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම දුරුකළාවූ සැක ඇත්තේ වෙමි. යම් ආර්ය කෙනෙක් සැක නැත්තාහු අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ සැකය දුරුකළ බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

13. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇති විය. තමන් උසස් කොට සිතන්නාවූ, අනුන් පහත් කරන්නාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද, වනයෙහි ළඟ පිහිටි සේනාසනද, ඉතා දුර පිහිටි සේනාසනද, සේවනය කරත්ද, ඒ පින්වත් මහණ බමුණෝ තමා උසස් කොට සිතීම නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි තමා උසස් කොට සහිත සිත් ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම මම තමා උසස් කොට සිතීම් දුරුකළේ වෙමි. යම් ආර්ය කෙනෙක් තමා උසස් කොට සිතීම දුරුකළාවූ අරණ්‍ය සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ තමා උසස්කොට සිතීම දුරුකළ බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියේ වෙමි.

14. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. තැති ගන්නාවූ, භයවන ස්වභාව ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද, වනයෙහි ළඟ පිහිටි සේනාසනද, ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ ලොමු දැහැගැනුම හා බියසුලු බව නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි ලොමු දැහැගැනුම් ඇතිව වනසේනාසන සේවනය

නොකරමි. මම ලොමු දැහැගැනුම දුරු කළේ වෙමි. යම් ඒ ආර්ය කෙනෙක් ලොමු දැහැගැනුම බිය සුලු බව දුරු කළාවූ අරණ්‍ය සේනාසන සේවනය කරත් ද ඔවුන් අතරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ ලොමු දැහැගැනුම හා බියසුලු බව දුරු කිරීම තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියේ වෙමි.

**15.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. ලාභ සත්කාර හා කීර්තිය පතන්නාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා කැමති වීම නමැති තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි ලාභ සත්කාර කීර්ති ප්‍රංසා කැමතිව වන සේනාසන සේවනය නොකරමි. මම අල්පෙච්ඡ (සුලු දෙයින් සතුටුවන) බව ඇත්තේ වෙමි. යම් ඒ ආර්යකෙනෙක් අල්පෙච්ඡවූවාහු අරණ්‍ය සේනාසන සේවනය කරත්ද, ඔවුන් අතරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ අල්පෙච්ඡ බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වන වාසය පිණිස භය නැතිබවට පැමිණියේ වෙමි.

**16.** "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. කම්මැලිවූ වීර්ය නැත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද, වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද ඒ පින්වත් මහණ බමුණෝ සේනාසනද සේවනය කරයිද ඒ පින්වත් මහණ බමුණෝ කම්මැලි බව හා වීර්ය නැති බව යන තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි කම්මැලි බව හා වීර්ය නැති බව ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම පටන්ගත් වීර්යය ඇත්තේ වෙමි. යම් ඒ ආර්ය කෙනෙක් පටන්ගත් වීර්ය ඇත්තේ වන සේනාසන සේවනය කරද්ද ඔවුන් කෙරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ පටන්ගත් වීර්යය ඇති බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝසෙයින් වන වාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. මුළාවූ සිහිඇත්තාවූ, හොඳ නුවණනැත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද, ඉතා දුර පිහිටි සේනාසනයද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ සිහි මුළා බව හා හොඳ නුවණ නැති බව යන තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු වන සේනාසන සේවනය නොකරමි. මම එළඹ සිටි සිහි ඇත්තේ වෙමි. යම් ඒ ආර්ය කෙනෙක් එළඹ සිටි සිහි ඇත්තේ වන සේනාසන සේවනය කරද්ද, ඔවුන් අතුරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ එළඹ සිටි සිහි ඇති බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝසෙයින් වන වාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

18. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. එකඟ සිතක් නැත්තාවූ, නොයෙක් අරමුණෙහි දුවන සිත් ඇත්තාවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරයිද, ඒ පින්වත් මහණ බමුණෝ එකඟ සිත් නැති බව නොයෙක් අරමුණෙහි දුවන සිත් ඇති බව යන තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි එකඟවූ සිත් නැතිව නොයෙක් අරමුණෙහි දුවන සිත් ඇතිව වන සේනාසන සේවනය නොකරමි. මම එකඟවූ සිත් ඇත්තේ වෙමි. යම් ඒ ආර්ය කෙනෙක් එකඟවූ සිත් ඇත්තේ වන සේනාසන සේවනය කරද්ද ඔවුන් අතරෙන් මම එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ එකඟවූ සිත් ඇති බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වන වාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

19. "බ්‍රාහ්මණය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. නුවණ නැත්තාවූ කෙලතොලුවූ යම් ඒ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අරණ්‍ය සේනාසනද වනයෙහි ළඟ පිහිටි සේනාසනද ඉතා දුර පිහිටි සේනාසනද සේවනය කරද්ද ඒ පින්වත් මහණ බමුණෝ නුවණ නැති බව හා කෙලෙතොලු බව යන තමන්ගේ දොෂ හේතුවෙන් භයානක අරමුණු දකිති. මම වනාහි නුවණ

නැති බව හා කෙලතොලු බව ඇතිව වනසේනාසන සේවනය නොකරමි. මම නුවණින් යුක්ත වූයේ වෙමි. යම් ඒ ආර්ය කෙනෙක් නුවණින් යුක්ත වූයේ වන සේනාසන සේවනය කරද්ද මම ඔවුන් අතරෙන් එක්තරා කෙනෙක් වෙමි. බ්‍රාහ්මණය, මේ නුවණින් යුක්ත බව තමා කෙරෙහි දක්නාවූ මම බොහෝ සෙයින් වනවාසය පිණිස භය නැති බවට පැමිණියෙමි.

**(සොළොස් වැදෑරුම් ක්‍රමය නිමි.)**

**20.** "බ්‍රාහ්මණය, ඒ මට මෙබඳු සිතක් ඇති විය. පක්ෂයෙහි ප්‍රසිද්ධවූ තුදුස්වකය, පසළොස්වකය, අටවකය, යන යම් ඒ රාත්‍රීහු වෙත්ද, එබඳු රාත්‍රීන්හි බිහිසුණු වූ රෝමොද්ගමනය කරන්නාවූ යම්බඳු පිදිය යුතු ආරාම වෙත්ද, පිදිය යුතු වනයෝ වෙත්ද, පිදිය යුතු වෘක්ෂයෝ වෙත්ද, එබඳුවූ සෙනසුන්හි මම වාසය කරන්නෙම් නම් ඒ භයානක අරමුණ දකින්නෙම් නම් ඉතා යෙහෙකැයි කියායි.

"බ්‍රාහ්මණය ඒ මම ඉන් මෑත කලෙක ප්‍රසිද්ධවූ තුදුස්වකය පසළොස්වකය, අටවකය, යන මේ ඒ රාත්‍රීහු වෙත්ද එබඳු රාත්‍රීන්හි භය ජනකවූ, රෝමොද්ගමනය කරන්නාවූ යම් ඒ පිදිය යුතු ආරාම වෙත්ද, පිදිය යුතු වනයෝ වෙත්ද, පිදිය යුතු වෘක්ෂයෝ වෙත්ද, එබඳුවූ සෙනසුන්හි වාසය කරමි.

"බ්‍රාහ්මණය, එහි වාසය කරන්නාවූ මා සමීපයට මෘගයෙක් හෝ එයි. මොණරෙක් හෝ වියලි දඬු ගස්වලින් හෙලයි. වාතය හෝ වියළි කොළ හෙලයි. මේ එන්නේ එකාන්තයෙන් ඒ භයානක අරමුණයයි මට කල්පනා විය.

**21.** "බ්‍රාහ්මණය, ඒ මට මේ සිත ඇතිවිය. කිමෙක්දෝ මම භය කැමති වෙමින් වාසය කෙරේ ද, යම් යම් ඉරියව්වකින් සිටියාවූ මා වෙතට ඒ භයානක අරමුණ ඒ ද ඒ ඒ ඉරියව්වෙන් සිටියේ ම ඒ භයානක අරමුණ දුරුකරන්නෙමි. කියායි.

"බ්‍රාහ්මණය, සක්මන්කරන්නාවූ මා වෙතට ඒ භයානක අරමුණ ඒ ද බ්‍රාහ්මණය, ඒ මම සක්මන් කරමින්ම ඒ බිහිසුණු අරමුණ දුරුකරන තෙක් නොසිටිමි, නොහිඳිමි, නොනිදමි.

"බ්‍රාහ්මණය, සිටියාවූ ඒ මා වෙතට ඒ බිහිසුණු අරමුණ ඒ ද බ්‍රාහ්මණය, ඒ මම සිටිමින්ම ඒ භයානක අරමුණ දුරු කරන තෙක් සක්මන් නොකරමි, නොහිඳිමි, නොනිදමි.

"බ්‍රාහ්මණය හුන්නාවූ මා වෙතට ඒ භයානක අරමුණ ඒද බ්‍රාහ්මණය, ඒ මම හුන්නේම ඒ බිහිසුණු අරමුණ දුරු කරන තෙක් නොසිටිමි, සක්මන් නොකරමි, නොනිදමි.

"බ්‍රාහ්මණය, නිදන්නාවූ මා වෙතට ඒ භයානක අරමුණ ඒද? බ්‍රාහ්මණය, ඒ මම නිදාගෙන ඒ භයානක අරමුණ දුරු කරන තෙක් නොහිඳිමි, නොසිටිමි, සක්මන් නොකරමි.

"බ්‍රාහ්මණය, රාත්‍රි කාලයම දවල් කාලයයි හඟින්නාවූද දවල් කාලයම රාත්‍රි කාලයහි හඟින්නාවූද ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුය, බ්‍රාහ්මණය, මම මෙය ඔවුන්ගේ සම්මෝහි විහරණය (මුළාවී වාසය කිරීම) යි කියමි.

"බ්‍රාහ්මණය, මම වනාහි රාත්‍රියම රාත්‍රියයයි දනිමි, දහවල දහවල්යයි දනිමි. බ්‍රාහ්මණය, මුළා නොවන ස්වභාව ඇති සත්වයෙක් තෙම බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, වැඩ පිණිස, හිත පිණිස, දෙව් මිනිසුන්ට සැප පිණිස ලොකයෙහි උපන්නේයයි යම් ඒ කෙනෙකු උදෙසා මනාකොට කියන්නෙක් කියාද ඒ මා උදෙසා කියාමැයි. මා විසින් නොහැකිළෙන්නාවූ වීර්ය පටන් ගන්නා ලද්දේ විය. නුමුළාවූ සිහිය එළඹ සිටියාය. ශරීරය සංසිඳී ගියේය. එහෙයින්ම සැහැල්ලුවිය. සිත සමාධියෙහි මනාව පිහිටියේ විය. එහෙයින්ම එකඟ විය.

**22.** "බ්‍රාහ්මණය, ඒ මම කාමයෙන් වෙන්වම සියලු අකුසලයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. විතර්ක විචාර දෙදෙනාගේ සන්සිඳීමෙන් හිතේ පැහැදීම ඇත්තාවූ, හිතේ එකඟ බව ඇත්තාවූ විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති දෙවෙනිවූ ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. ප්‍රීතිය ඉක්මවීමෙන්

උපේක්ෂා ඇත්තේ වාසය කෙළෙමි. සිහියෙන් යුක්තවූයේ කයින් සැපය වින්දෙමි. යමක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්ත වූයේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. සැපය නැති කිරීමෙන් දුක නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බව ඇති සතරවැනි ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි, පිරිසිදු හෙයින්ම දීප්තිමත් වූ කල්හි, අංගන (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, පහවූ උවදුරු ඇති කල්හි මෘදුවූ කල්හි, කාර්යයට සුදුසුව සිටි කල්හි චංචල නොවී සිටි කල්හි පෙර විසූ කඳ පිළිවෙල දැනීම පිණිස සිත නැමුයෙමි. ඒ මම නොයෙක් ආකාරවූ පූර්වනිවාසය (පෙර උපන් ජාති) සිහිකරමි. එනම් එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශ වන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසුවල් තැන උපන්නෙමි, එහි මෙනම් ඇත්තේ වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි, මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැප දුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍ය භවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නන් වැදෑරුම්වූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි.

"බ්‍රාහ්මණය, මා විසින් රාත්‍රියේ පළමුවෙනි යාමයෙහි මේ පළමුවන විද්‍යාව (පෙර විසූතැන් දන්නා නුවණ) ලබන ලදී, එය වසන අවිද්‍යාව නසනලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස්

තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකු යම්සේ සිද්‍ධවිය යුතු නම් එසේ විය.”

### (පූර්ව නිවාස කථා නිමි)

23. “ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, පිරිසිදු හෙයින්ම දීප්තිමත්වූ කල්හි, අංගණ (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කාර්යයට සුදුසුව සිටි කල්හි, චංචල නොවී සිටිකල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දැකීම පිණිස සිත නැමීමි. ඒ මම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද ප්‍රණීතවූද මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මියගියාවූ සත්වයන් දකිමි.

“ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස් කීවාහු මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු මිථ්‍යාදෘෂ්ටි ක්‍රියාඅනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්ත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු මනො සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්යයන්ට දොස් නොකීවාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය, (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ගලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමක වූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද අයහපත් ගති නැත්තාවූද කර්මය පරිදි මියගියාවූ සත්වයන් දනිමි.

“බ්‍රාහ්මණය, මා විසින් රාත්‍රියෙහි මැදයමෙහි මේ දෙවන විද්‍යාව (චුතවීම් ඉපදීම් දක්නා නුවණ) ලබනලදී. එය වසන අවිද්‍යාව නසනලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන

ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය.

**24.** "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි ආශ්‍රව ක්ෂයකර ඥානය (කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත නැමුයෙමි. ඒ මම මෙය දුකයයි තතුසේ දත්තෙමි මේ දුක් ඉපදීමට හේතුවයැයි සතුසේ දත්තෙමි මේ දුක් නැති කිරීමයැයි තතුසේ දත්තෙමි. මේ දුක නැතිකිරීමේ මාර්ගයයැයි තතුසේ දත්තෙමි. මොහු ආශ්‍රවයෝ (කාම ආදී කෙලෙස්) යයි තතුසේ දැන ගතිමි. මේ ආශ්‍රවයන්ගේ හටගැන්මයයි තතුසේ දැනගතිමි. මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමයයි තතුසේ දැනගත්තෙමි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ සිත කාමාශ්‍රවයෙන්ද මිදුනේය. භවාශ්‍රවයෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයෙන්ද මිදුනේය. මිදුන කල්හි මිදුනේයයි දැනීම පහළවිය. උත්පත්තිය කෙළවර විය.

"මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මේ අර්හත්වය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දත්තෙමි.

"බ්‍රාහ්මණය, රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි මේ තුන්වෙනි විද්‍යාව (ආශ්‍රව ක්ෂයකර ඥාන නම්වූ අර්හත් මාර්ගය) මා විසින් ලබන ලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය"

(කෙලෙස් නැසීමේ කථා නිමි.)

**25.** "බ්‍රාහ්මණය, ඔබට කිසි විටෙක මෙබඳු අදහසක් විය හැක්කේය. අද දක්වාත් ශ්‍රමණ ගෞතම තෙම පහනොවූ රාග ඇත්තේය, පහ නොවූ ද්වේෂ ඇත්තේය, පහනොවූ මොහ ඇත්තේය, එහෙයින් ආරණ්‍ය සේනාසනයන්ද වනයේ සමීප සෙනසුන්ද වනයේ ඉතා ඈත පිහිටි සෙනසුන්ද, සේවනය කෙරේයයි කියායි.

"බ්‍රාහ්මණය, එය එසේ නොසැළකිය යුතුය. බ්‍රාහ්මණය මම වනාහි කරුණු දෙකක් සලකා ආරණ්‍ය සෙනාසනද වනයේ සමීප සෙනාසනද වනයේ ඉතා ඈත පිහිටි සෙනාසනද සෙවනය කරමි. තමන්ගේ මෙකල සැප විහරණය සලකමින් හා අනාගත ජන සමූහයාට අනුකම්පා පිණිසද යන කරුණු දෙකයි.

**26.** "භවත්ගෞතමයින් විසින් මේ අනාගත ජනසමූහයා අර්හත්වූ සම්‍යක් සම්බුදු කෙනෙකුන් විසින් යම්සේ කළ යුතු නම් එසේම අනුකම්පා කරන ලද්දේ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දෙශනාව ඉතා යහපත භවත් ගෞතමයාණෙනි, ඉතා යහපත භවත් ගෞතමයාණෙනි, යම්සේ යටිකුරු කළ බඳුනක් උඩුකුරු කරන්නේද, තණකොළ ආදියෙන් වැසුනක් විවෘත කරන්නේද මංමුළා වූවෙකුට මග කියන්නේද ගණඳුරෙහි ඇස් ඇත්තාහු රූපයන් දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද එපරිද්දෙන්ම භවත් ගෞතමයන් විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරන ලදී. ඒ ධර්මය ශ්‍රවණය කළාවූ මම භවත් ගෞතමයින් වහන්සේ සරණ යමි. ධර්මයද සංඝයාද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණගියාවූ උපාසකයෙකු කොට මා සලකනසේක්වා.

(හතර වෙනිවූ භය භෙරව සූත්‍රය නිමි.)

---

## 5. අනංගණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනාථ පිණ්ඩික සිටුහු විසින් කරන ලද ජෙතවන විහාරයෙහි වාසය කරති. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනි,' කියා භික්ෂූන්ට කථා කළහ. 'ඇවැත්නි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ සූත්‍රය වදාළහ.

2. "ඇවැත්නි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහුය. කවර සතරදෙනෙක්ද යත්? ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම අංගණ (තියුණු කෙලෙස්) සහිතවූයේම තමා තුළ තියුණුවූ කෙලෙස් ඇතැයි තතුසේ නොදනියි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම කෙලෙස් සහිතවූයේම තමා තුළ කෙලෙස් ඇතැයි තතුසේ දනියි. ඇවැත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම කෙලෙස් රහිතවූයේම තමා තුළ කෙලෙස් නැතැයි තතුසේ දනියි.

3. "ඇවැත්නි, ඒ පුද්ගලයන් අතුරෙහි යම් පුද්ගලයෙක් තෙම කෙලෙස් සහිතවූයේම තමා තුළ කෙලෙස් ඇතැයි තතුසේ නොදනියිද මේතෙම මේ කෙලෙස් සහිත පුද්ගලයන් දෙදෙන අතුරෙන් පහත් පුරුෂයා යයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ඒ පුද්ගලයෙක් තෙම කෙලෙස් සහිතවූයේම තමා තුළ කෙලෙස් ඇතැයි තතුසේ දනියිද, මෙතෙම කෙලෙස් සහිතවූම මේ පුද්ගලයන් දෙදෙන අතුරෙන් ශ්‍රෙෂ්ඨ පුරුෂයායයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ඒ පුද්ගලයෙක්තෙම කෙලෙස් රහිත වූයේම තමා තුළ කෙලෙස් නැතියි තතුසේ නොදනියිද මෙතෙම කෙලෙස් රහිතවූ මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් පහත් පුරුෂයායයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ඒ පුද්ගලයෙක් තෙම කෙලෙස් රහිත වූයේම තමා තුළ කෙලෙස් නැතැයි තතුසේ දනියිද මෙතෙම කෙලෙස් රහිතවූ මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් ශ්‍රෙෂ්ඨ පුරුෂයායයි කියනු ලැබේ." මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය ප්‍රකාශ කළහ.

4. "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කෙලෙස් සහිතවූම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් එකෙක් පහත් පුද්ගලයායයි කියනු ලැබේ. එකෙක් ශ්‍රෙෂ්ඨ පුද්ගලයායයි කියනු ලැබේ. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද? කෙලෙස් රහිතවූ මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් එකෙක් පහත් පුද්ගලයා යයි කියනු ලැබේ. එකෙක් ශ්‍රෙෂ්ඨ පුද්ගලයායයි කියනු ලැබේ. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?"

**5.** "ඇවැත්නි, ඔවුන් අතුරෙහි යම් ඒ පුද්ගලයෙක්තෙම කෙලෙස් සහිත වූයේම තමා තුළ කෙලෙස් ඇත්තේයයි තතුසේ නොදනීද ඔහු ගැන මෙසේ කැමැතිවිය යුතුයි. ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකර නොගනියි, වෑයම් නොකරයි, වීර්ය නොකරයි. හෙතෙම රාග සහිතවූයේ ද්වේෂ සහිතවූයේ මොහ සහිතවූයේ කෙලෙස් සහිතවූයේ කිළුටු සිත් ඇත්තේ කලුරිය කරන්නේය.

"ඇවැත්නි, සල්පිලින් හෝ රන්කරු කුලයකින් හෝ ගෙනෙනලද දූවිල්ලෙන් හා මලකඩින් ගැවසුනාවූ රන් තලියක් වේද එය හිමියෝ පරිභොග නොකරත්නම් පිරිසිදු නොකරත්නම් ධූලි සහිත තැන්හි දමත් නම් ඒ රන් තලිය ටික කලකින් අතිශයින් කිළුටුවී මල සහිත නොවන්නීද? එසේය ආයුෂ්මත්නි, ඒ රන්තලිය කල්යාමෙන් කිළුටු වූවා මල සහිත වන්නීය. ඇවැත්නි, කෙලෙස් සහිතවූයේම තමා තුළ කෙලෙස් ඇත්තේයයි තතුසේ නොදනීද ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුයි. ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකර නොගනියි. වෑයම් නොකරයි, හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මොහ සහිත වූයේ කෙලෙස් සහිත වූයේ කිළුටු සිත් ඇත්තේ කලුරිය කරන්නේය.

**6.** "ඇවැත්නි, ඒ පුද්ගලයන් අතුරෙහි යම් පුද්ගලයෙක් තෙම කෙලෙස් සහිත වූයේම තමා තුළ කෙලෙස් ඇතැයි තතුසේ දනියිද ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුය. ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකර ගනියි. වීර්යකරයි. හෙතෙම රාග රහිත වූයේ ද්වේෂ සහිත වූයේ මොහ රහිත වූයේ කෙලෙස් රහිතවූයේ නොකිලිටි සිත් ඇත්තේ කාලක්‍රියා කරයි. ඇවැත්නි, සල්පිලකින් හෝ රන්කරු කුලයකින් හෝ ගෙනෙන ලද දූවිල්ලෙන් හා මළකඩින් ගැවසුණාවූ රන් තලියක් එය හිමියෝ පරිභෝග කරත් නම්, පිරිසිදු කරත් නම් ධූලි සහිත තන්හි නොදමත් නම් ඒ ලොහතලිය ටිකකලකින් අතිශයින් පිරිසිදුවී ඔප වැටෙන්නේ නොවේද?" "එසේය. ආයුෂ්මතුනි,'' "ඇවැත්නි, එපරිද්දෙන්ම යම් ඒ පුද්ගලයෙක්

කෙලෙස් සහිත වූයේම තමා තුළ කෙලෙස් ඇතැයි දනීද, ඔහු සම්බන්ධයෙන් මෙය කැමැතිවිය යුතුය. ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකරගනියි, වෑයම් කරයි. වීර්ය කරයි, හෙතෙම රාග රහිතවූයේ ද්වේෂ රහිතවූයේ මොහ රහිතවූයේ කෙලෙස් රහිතවූයේ නොකිලිටි සිත් ඇත්තේ කාලක්‍රියාකරයි.

7. "ඇවැත්නි, ඒ පුද්ගලයන් අතරෙහි යම් පුද්ගලයෙක් කෙලෙස් රහිතවූයේම තමා තුළ කෙලෙස් නැතැයි තතුසේ නොදනීද, ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුය. හෙතෙම ශුභ අරමුණු මෙනෙහිකරයි, ශුභ අරමුණු මෙනෙහි කිරීමෙන් රාගය ඔහුගේ කුසල්සිත විනාශ කරයි. හෙතෙම රාග සහිතවූයේ, ද්වේෂ සහිත වූයේ මොහ සහිත වූයේ කාලක්‍රියා කරයි. ඇවැත්නි, සල්පිලින් හෝ රන්කරු කුලයකින් හෝ ගෙනෙන ලද දූවිල්ලෙන් හා මලකඩින් ගැවසුනාවූ රන් තලියක් එය හිමියෝ පරිභොග නොකරත්නම් පිරිසිදු නොකරත්නම් ධූලි සහිත තන්හි දමත්නම් ඒ රන්තලිය ටික කලකින් අතිශයින් කිළුටුවී මල බැඳුනේ නොවන්නේද 'එසේය, ආයුෂ්මතුනි, වන්නේය.' 'එපරිද්දෙන්ම යම් ඒ පුද්ගලයෙක්තෙම කෙලෙස් රහිත වූයේම තමා තුළ කෙලෙස් නැත්තේයයි තතුසේ නොදනීද ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුයි. ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකර නොගනියි. වෑයම් නොකරයි. වීර්ය නොකරයි. හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මොහ සහිත වූයේ කෙලෙස් සහිත වූයේ කිළුටු සිත් ඇත්තේ කළුරිය කරන්නේය.

8. "ඇවැත්නි, ඔවුන් අතරෙහි යම් ඒ පුද්ගලයෙක් කෙලෙස් රහිත වූයේ තමා තුළ කෙලෙස් නැතැයි තතුසේ දනීද, ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුය. ශුභ අරමුණ මෙනෙහි නොකරයි. ශුභ අරමුණ මෙනෙහි නොකිරීමෙන් රාගය ඔහුගේ කුසල් සිත විනාශ නොකරයි, හෙතෙම රාග රහිත වූයේ, ද්වේෂ රහිත වූයේ මොහ රහිත වූයේ කෙලෙස් රහිත වූයේ නොකිලිටි සිත් ඇත්තේ කාලක්‍රියාකරයි. ඇවැත්නි, සල්පිලකින් හෝ

රන්කරු කුලයකින් හෝ ගෙනෙන ලද දූවිල්ලෙන් හා මලකඩින් ගැවසුණාවූ රන්තලියක් එය හිමියෝ පරිභොග කරත්නම්, පිරිසුදු කරත් නම් ධූලි සහිත තන්හි නොදමත් නම් ඒ රන්තලිය ටිකකලකින් අතිශයින් පිරිසුදුවී ඔප වැටෙන්නේ නොවේද? 'එසේය ආයුෂ්මතුනි, වන්නේය.' ඇවැත්නි, එපරිද්දෙන් යම් ඒ පුද්ගලයෙක් කෙලෙස් රහිත වූයේම තමා තුළ කෙලෙස් නැතැයි දනීද ඔහු සම්බන්ධයෙන් මෙය කැමතිවිය යුතුය, ඔහු ඒ කෙලෙස් නැතිකිරීම පිණිස කැමැත්තක් ඇතිකර ගනියි, වෑයම් කරයි, වීර්ය කරයි. හෙතෙම රාග රහිතවූයේ ද්වේෂ රහිත වූයේ මොහ රහිත වූයේ කෙලෙස් රහිතවූයේ නොකිලිටි සිත් ඇත්තේ කාලක්‍රියා කරයි.

"මොග්ගල්ලාන, කෙලෙස් සහිතවූම මේ පුද්ගලයන් දෙදෙනා අතරෙන් එකෙක් හීනපුද්ගලයායයි කියනු ලැබේද, එකෙක් ශ්‍රෙෂ්ඨ පුද්ගලයායයි කියනු ලැබේද, මේ වනාහි ඊට හේතුවයි, ඊට ප්‍රත්‍යයයි. මොග්ගල්ලාන, කෙලෙස් රහිතවූම මේ පුද්ගලයන් දෙදෙනා අතරින් එකෙක් හීන පුද්ගලයායයි කියනු ලැබේද, එකෙක් ශ්‍රෙෂ්ඨ පුද්ගලයායයි කියනු ලැබේද, මේ වනාහි ඊට හේතුවය ඊට ප්‍රත්‍යයය.

"ඇවැත්නි, අංගණය අංගණයයි කියනු ලැබේ ඇවැත්නි, මේ අංගණය යනු කුමකට නමක්ද? ඇවැත්නි අංගණය යනු කැමැතිසේ හැසිරීමයයි කියනලද ලාමක වූ අකුසල ධර්මයන්ට නමකි.

**9.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. මම ඇවතට පැමිණියෙමි. මා ඇවතට පැමිණි බව භික්ෂූහු නොදන්නාහු නම් හොඳය (කියාය). යම්හෙයකින් භික්ෂූහු ඒ භික්ෂුව ඇවැතට පැමිණියේයයි දන්නාහු නම් භික්ෂූහු මා ඇවැතට පැමිණියේ යයි දනිත්යයි ඒ භික්ෂුව කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඇවැත්නි, ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**10.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. මම ඇවතට පැමිණියේ වෙමි.

භික්ෂූහු මට රහසිගතව චොදනා කරන්නාහුනම් සඟමැද චොදනා නොකරන්නාහු නම් හොඳය (කියාය) යම්හෙයකින් භික්ෂූහු ඒ භික්ෂුවට සඟමැද චෝදනා කරත්ද, රහසිගතව චෝදනා නොකරද්ද, භික්ෂූහු මට සඟමැද චෝදනා කරති. රහසිගතව චෝදනා නොකරතියි හෙතෙම කෝපයට පත් වෙයි. නොසතුටුවූයේ වෙයි, ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නම්.

11. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. මම ඇවතට පැමිණියේ වෙමි. සමාන පුද්ගලයෙක් මට චොදනා කරන්නේනම්, මා අසන පුද්ගලයෙක් චොදනා නොකරන්නේ නම් හොඳය (කියාය.) යම් හෙයකින් ඒ භික්ෂුවට අසමාන පුද්ගලයෙක් චොදනා කරයිද, සමාන පුද්ගලයෙක් චොදනා නොකරයිද, සමාන පුද්ගලයෙක් නොව අසමාන පුද්ගලයෙක් මට චොදනා කරයි. කියා හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කොපය හා නොසතුට යන දෙකම අංගණ නම්.

12. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ශාස්තෲන් වහන්සේ මගෙන්ම අස අසා භික්ෂූන්ට ධර්මදෙශනා කරන්නේ නම් ශාස්තෲන් වහන්සේ අන්‍ය භික්ෂුවකගෙන් අස අසා භික්ෂූන්ට ධර්ම දෙශනා නොකරන්නේ නම් හොඳය (කියාය) ඇවැත්නි, යම් හේතුවකින් ශාස්තෲන්වහන්සේ අන්‍ය භික්ෂුවකගෙන් අස අසා ධර්ම දෙශනා කරත්ද, ශාස්තෲන්වහන්සේ ඒ භික්ෂුවගෙන් අස අසා ධර්මදෙශනා නොකරත්ද, ශාස්තෲන්වහන්සේ අන්‍ය භික්ෂුවකගෙන් අස අසා ධර්මදේශනා කරන්නාහ, ශාස්තෲන්වහන්සේ මගෙන් අස අසා ධර්ම දේනා නොකරන්නාහයි හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටුවූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නම්.

13. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. භික්ෂූහු මා ම පෙරටු කොට පෙරටුකොට බත් පිණිස ගමට පිවිසෙන්නාහු නම්, අන්‍ය

භික්ෂුවක් පෙරටුකොට පෙරටුකොට බත් පිණිස ගමට නොපිවිසෙන්නාහු නම් හොඳය කියාය. ඇවැත්නි, යම් හේතුවකින් භික්ෂූහු අන්‍ය භික්ෂුවක් පෙරටුකොට පෙරටුකොට බත් පිණිස ගමට පිවිසෙත්ද භික්ෂූහු ඒ භික්ෂුව පෙරටුකොට පෙරටුකොට බත් පිණිස ගමට නොපිවිසෙත්ද, භික්ෂූහු අන්‍ය භික්ෂුවක් පෙරටුකොට පෙරටුකොට බත් පිණිස ගමට පිවිසෙති භික්ෂූහු මා පෙරටුකොට පෙරටුකොට බත් පිණිස ගමට නොපිවිසෙත්යයි හෙතෙම කෝපයට පත්වෙයි, නොසතුටුවූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**14.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. මම ම දන් ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දිය බඳුන, ප්‍රධාන භොජනය ලබන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් දන් ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දියබඳුන, ප්‍රධාන භොජනය නොලබන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් දන්ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දිය බඳුන, ප්‍රධාන භොජනය ලබයිද, මේ භික්ෂුව දන් ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දිය බඳුන, ප්‍රධාන භොජනය නොලබයිද අන්‍ය භික්ෂුවක් දන් ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දිය බඳුන ප්‍රධාන භොජනය ලබයි, මම දන්ශාලාවෙහිදී මුල් ආසනය, පළමුවෙනි දිය බඳුන, ප්‍රධාන භොජනය නොලබමියි. හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**15.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. මම ම දන් ශාලාවෙහිදී වළඳ අවසානයේ අනුමෝදනාව කරන්නෙම් නම් අන්‍ය භික්ෂුවක් දන් ශාලාවේදී වළඳ අවසානයේ අනුමෝදනාව නොකරන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් දන්ශාලාවෙහිදී වළඳ අවසානයේ අනුමෝදනාව කරයිද, මේ භික්ෂුව දන් ශාලාවෙහිදී වළඳ අවසානයේ අනුමෝදනා කරන්ට නොලබයිද, අන්‍ය භික්ෂුවක් දන් ශාලාවෙහිදී වළඳ අවසානයේ

අනුමෝදනාව කරයි. මම දන් ශාලාවෙහි වළඳ අවසානයේ අනුමෝදනාව කරන්ට නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි, අසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**16.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ආරාමයෙහි රැස්වූ භික්ෂූන්ට මම ම ධර්මදේශනා කරන්නෙම් නම් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂූන්ට ධර්ම දේශනා නොකරන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂූන්ට ධර්ම දේශනා කරයිද, මේ භික්ෂුව ආරාමයෙහි රැස්වූ භික්ෂූන්හට ධර්ම දේශනා කරන්නට නොලබයිද, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂූන්හට ධර්ම දේශනා කරයි, මම ආරාමයෙහි රැස්වූ භික්ෂූන්හට ධර්ම දේශනා කරන්නට නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි, නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**17.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට මම ම ධර්මදේශනා කරන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට ධර්ම දේශනා නොකරන්නේ නම් හොඳය (කියාය) ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට ධර්ම දේශනා කරයිද, මේ භික්ෂුව ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට ධර්ම දේශනා කරන්නට නොලබයිද, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට ධර්ම දේශනා කරයි, මම ආරාමයෙහි රැස්වූ භික්ෂුණීන්හට ධර්ම දේශනා කරන්නට නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි, නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**18.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ආරාමයෙහි රැස්වූ උපාසකයන්හට මම ම ධර්මදේශනා කරන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසකයන්හට ධර්ම දේශනා නොකරන්නේ

නම් හොඳය (කියාය) ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසකයන්ට ධර්ම දේශනා කරයිද, මේ භික්ෂුව ආරාමයෙහි රැස්වූ උපාසකයන්හට ධර්ම දේශනා කරන්නට නොලබයිද, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසකයන්හට ධර්ම දේශනා කරයි, මම ආරාමයෙහි රැස්වූ උපාසකයන්හට ධර්ම දේශනා කරන්නට නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි, නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**19.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ආරාමයෙහි රැස්වූ උපාසිකාවන්හට මම ම ධර්මදේශනා කරන්නෙම් නම් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසිකාවන් හට ධර්ම දේශනා නොකරන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසිකාවන්හට ධර්ම දේශනා කරයිද, මේ භික්ෂුව ආරාමයෙහි රැස්වූ උපාසිකාවන්හට ධර්ම දේශනා කරන්නට නොලබයිද, අන්‍ය භික්ෂුවක් ආරාමයෙහි රැස්වූ උපාසිකාවන්හට ධර්ම දේශනා කරයි, මම ආරාමයෙහි රැස්වූ උපාසිකාවන්හට ධර්ම දේශනා කරන්නට නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි, නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**20.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කල්පනාවක් ඇතිවිය හැකිය. භික්ෂූහු මටම සත්කාර කරන්නාහු නම්, ගරුකරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුදන්නාහු නම් භික්ෂූහු අන්‍ය භික්ෂුවකට සත්කාර නොකරන්නාහු නම්, ගරු නොකරන්නාහු නම්, බුහුමන් නොකරන්නාහු නම් නොපුදන්නාහු නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් භික්ෂූහු අන්‍ය භික්ෂුවකට සත්කාර කරත්ද, ගරු කරත්ද බුහුමන් කරත්ද, පුදත්ද, මේ භික්ෂුවට සත්කාර නොකරත්ද, ගරු නොකරත්ද, බුහුමන් නොකරත්ද නොපුදත්ද, භික්ෂූහු අන්‍ය භික්ෂුවකට සත්කාර කරති. ගරුකරති, බුහුමන් කරති, පුදති, භික්ෂූහු මට සත්කාර නොකරති, ගරු නොකරති, බුහුමන්

නොකරති, නොපුදතියි හෙතෙම කෝපයට පත් වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යනදෙකම අංගණ නමි.

21. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කල්පනාවක් ඇතිවිය හැකිය. භික්ෂුණීහු මටම සත්කාර කරන්නාහු නම්, ගරුකරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුදන්නාහු නම්, භික්ෂුණීහු අන්‍ය භික්ෂුවකට සත්කාර නොකරන්නාහු නම්, ගරු නොකරන්නාහු නම්, බුහුමන් නොකරන්නාහු නම් නොපුදන්නාහු නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් භික්ෂුණීහු අන්‍ය භික්ෂුවකට සත්කාර කරත්ද, ගරු කරත්ද බුහුමන් කරත්ද, පුදත්ද, මේ භික්ෂුවට සත්කාර නොකරත්ද, ගරු නොකරත්ද, බුහුමන් නොකරත්ද නොපුදත්ද, භික්ෂුණීහු අන්‍ය භික්ෂුවකට සත්කාර කරති. ගරුකරති, බුහුමන් කරති, පුදති, භික්ෂුණීහු මට සත්කාර නොකරති, ගරු නොකරති, බුහුමන් නොකරති, නොපුදතියි හෙතෙම කෝපයට පත් වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යනදෙකම අංගණ නමි.

22. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කල්පනාවක් ඇතිවිය හැකිය, උපාසකවරු මටම සත්කාර කරන්නාහු නම්, ගරුකරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුදන්නාහු නම්, උපාසකවරු අන්‍ය භික්ෂුවකට සත්කාර නොකරන්නාහු නම්, ගරු නොකරන්නාහු නම්, බුහුමන් නොකරන්නාහු නම්, නොපුදන්නාහු නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් උපාසකවරු අන්‍ය භික්ෂුවකට සත්කාර කරත්ද, ගරු කරත්ද බුහුමන් කරත්ද, පුදත්ද, මේ භික්ෂුවට සත්කාර නොකරත්ද, ගරු නොකරත්ද, බුහුමන් නොකරත්ද නොපුදත්ද, උපාසකවරු අන්‍ය භික්ෂුවකට සත්කාර කරති. ගරුකරති, බුහුමන් කරති, පුදති, උපාසකවරු මට සත්කාර නොකරති, ගරු නොකරති, බුහුමන් නොකරති, නොපුදතියි හෙතෙම කෝපයට පත් වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යනදෙකම අංගණ නමි.

23. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කල්පනාවක් ඇතිවිය හැකිය. උපාසිකාවරු මටම සත්කාර

කරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුදන්නාහු නම්, උපාසිකාවරු අන්‍ය භික්ෂුවකට සත්කාර නොකරන්නාහු නම්, ගරු නොකරන්නාහු නම්, බුහුමන් නොකරන්නාහු නම් නොපුදන්නාහු නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් උපාසිකාවරු අන්‍ය භික්ෂුවකට සත්කාර කරත්ද, ගරු කරත්ද බුහුමන් කරත්ද, පුදත්ද, යම් භික්ෂුවට සත්කාර නොකරත්ද, ගරු නොකරත්ද, බුහුමන් නොකරත්ද, නොපුදත්ද, උපාසිකාවරු අන්‍ය භික්ෂුවකට සත්කාර කරති, ගරුකරති, බුහුමන් කරති, පුදති, උපාසිකාවරු මට සත්කාර නොකරති, ගරු නොකරති, බුහුමන් නොකරති, නොපුදතියි හෙතෙම කෝපයට පත් වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යනදෙකම අංගණ නමි.

**24.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ප්‍රණීත (ඉතා හොඳ) සිවුරු මම ම ලබන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සිවුරු නොලබන්නේ නම් හොඳය (කියාය) ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සිවුරු ලබයි නම් මේ භික්ෂුව ප්‍රණීත සිවුරු නොලබයි නම් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සිවුරු ලබයි. මම ප්‍රණීත සිවුරු නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**25.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ප්‍රණීත (ඉතා හොඳ) පිණ්ඩපාතය මම ම ලබන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ප්‍රණීත පිණ්ඩපාතය නොලබන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත පිණ්ඩපාතය ලබයි නම් මේ භික්ෂුව ප්‍රණීත පිණ්ඩපාතය නොලබයි නම් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත පිණ්ඩපාතය ලබයි, මම ප්‍රණීත පිණ්ඩපාතය නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

**26.** "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ප්‍රණීත (ඉතා හොඳ) සෙනසුන

මම ම ලබන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සෙනසුන නොලබන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සෙනසුන ලබයි නම් මේ භික්ෂුව ප්‍රණීත සෙනසුන නොලබයි නම් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත සෙනසුන ලබයි. මම ප්‍රණීත සෙනසුන නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

27. "ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු කැමැත්තක් ඇතිවිය හැකිය. ප්‍රණීත (ඉතා හොඳ) ගිලන්පස බෙහෙත් පිරිකර මම ම ලබන්නෙම් නම්, අන්‍ය භික්ෂුවක් ප්‍රණීත ගිලන්පස බෙහෙත් පිරිකර නොලබන්නේ නම් හොඳය (කියාය). ඇවැත්නි, යම් හේතුවකින් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත ගිලන්පස බෙහෙත් පිරිකර ලබයි නම් මේ භික්ෂුව ප්‍රණීත ගිලන්පස බෙහෙත් පිරිකර නොලබයි නම් අන්‍ය භික්ෂුවක් ප්‍රණීත ගිලන්පස බෙහෙත් පිරිකර ලබයි. මම ප්‍රණීත ගිලන්පස බෙහෙත් පිරිකර නොලබමියි හෙතෙම කෝපයට පත්වෙයි. නොසතුටු වූයේ වෙයි. ඒ කෝපය හා නොසතුට යන දෙකම අංගණ නමි.

28. "ඇවැත්නි, අංගණ යනුකැමැත්ත පරිදි පවත්නාවූ මේ ලාමකවූ අකුසලයන්ට නමකි, ඇවැත්නි, යම්කිසි භික්ෂුවකගේ කැමැත්ත පරිදි පවත්නාවූ ලාමකවූ මේ අකුශලයෝ පහනොකළාහු දක්නා ලැබෙත්ද ඇතැයි අසනු ලැබෙත්ද, ඔහු ආරණ්‍යයක සිටියත්, වනයෙහි දුර සෙනසුන්හි විසූවත්, පිණ්ඩපාතිකාංග ඇතිවුවත්, ගෙපිළිවෙළින් පිඬුසිඟීම් ඇති වූවත් පාංශුකූලිකාංග ඇතිවුවත් රළුවූ සිවුරුදරන්නෙකුවුවත් එකට මහණදම් පුරණ සබ්‍රම්සරහු ඔහුට සත්කාර නොකරත් ගරු නොකරත් බුහුමන් නොකරත්, නොපුදත්. ඊට හේතු කවරේද? ඒ ආයුෂ්මතුන්ගේ ලාමකවූ කැමැත්තසේ පවත්නාවූ මේ අකුශලයෝ පහ නොකළාහු දක්නා ලබන්නාහුද වෙත්. අසනු ලබන්නාහුද වෙත්. ඇවැත්නි, සල්පිලින් හෝ රන් කරු කුලයෙන් හෝ ගෙණෙනලද පිරිසිදුවූ බබලන්නාවූ රන්තලියක් වේද ඒ

රන්තලිය හිමියෝ සර්ප කුණක් හෝ බලු කුණක් හෝ මිනිස් කුණක් හෝ එහි දමා තවත් රන් තලයකින් වසා වෙළඳ පළට ගෙනයන්නාහුය. ජනයා එය දැක මෙසේ කියන්නේය. පින්වත්නි, ඉතා වටිනා වස්තුවක් මෙන් මේ ගෙනයන්නේ කුමක්ද? මෙසේ කියා ඔවුන් නවත්වා භාජනය හැර බලන්නාහ. දැකීමත් සමගම අමනාපය ඇති වෙයි. පිළිකුලක් ඇති වෙයි. කෑත බව වැටහෙයි බඩගින්න ඇත්ත වුන්ටද එය කනු කැමති බවක් ඇති නොවේ. බඩ පිරෙන තෙක් කා සිටියවුන් ගැන කියනු කිම?

**29.** "එසේම ඇවැත්නි, යම්කිසි භික්ෂුවකගේ කැමැත්තසේ පවත්නාවූ මේ ලාමක අකුශල ධර්මයෝ පහනොකළාහු දක්නා ලැබෙද්ද, අසනු ලැබෙද්ද, ඒ භික්ෂුව කිසිසේත් අරණ්‍යයෙහි වාසය කරන්නේ වී නමුත් දුර සේනාසනයන්හි වසන නමුත් පිණ්ඩපාතිකාංග ඇති නමුත් ගෙපිළිවෙළින් පිඬුසිගන්නෙකුවූ නමුත් පාංසුකූල සිවුරු දරන්නෙකුවූ නමුත් රළු සිවුරු දරන්නෙකුවූ නමුත් ඔහුට සබ්‍රහ්මචාරී භික්ෂූහු සත්කාර නොකරත්, ගරු නොකරත්, බුහුමන් නොකරත්, නුපුදත්, ඊට හේතු කවරේද? ඒ ආයුෂ්මතුන් වහන්සේගේ කැමැත්ත සේ පවත්නාවූ පහනොකළාවූ ලාමක අකුසල ධර්මයෝ දක්නාහුද ලැබෙත්. අසන ලද්දාහුද වෙත්. "ඇවැත්නි, යම්කිසි භික්ෂුවක් විසින් කැමැත්ත පරිදි පවත්නාවූ මේ ලාමක අකුශල ධර්මයෝ පහකරන ලද්දාහු දක්නා ලැබෙද්ද අසනු ලැබෙද්ද ඒ භික්ෂුව ගමෙහි වාසය කළත් ආරාධනා පිළිගත්තත් ගෙහිමියන් දෙන සිවුරු පිළිගත්තත් එකට මහණ දම් පුරණ සබ්‍රම්සරහු ඔහුට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඊට හේතු කවරේද යත්? ඒ ආයුෂ්මතුන්ගේ ඒ කැමැත්ත පරිදි වන්නාවූ ලාමක අකුසල ධර්ම පහ කරන ලද්දාහු දකිනුද ලැබෙත්, අසනුද ලැබෙත්.

**31.** "ඇවැත්නි, සල්පිළින් හෝ රන්කරු කුලයෙන් හෝ ගෙනෙන ලද පිරිසිදුවූ බබලන්නාවූ රන් තලියක් වේද එය හිමියෝ කළු සහල් තෝරා ඉවත් කළ ඇල්හාලේ බත නොයෙක්

සූප හා නොයෙක් ව්‍යංජනවලින් පුරවා අනිත් රන් තලියකින් වසා වෙළඳපළට ගෙනයන්නාහුය. ජනයා එය දැක මෙසේ කියන්නේය. පින්වත්නි, ඉතා වටිනා වස්තුවක් මෙන් මේ ගෙනයන්නේ කුමක්ද? මෙසේ කියා ඔවුන් නවත්වා භාජනය හැර බලන්නාහ. දැකීමත් සමගම මනාප බව ඇති වෙයි. නොපිළිකුල් බව ඇති වෙයි, කැත නැති බව වැටහෙයි. බඩ පිරෙන තෙක් කා සිටියවුන්හටද කෑමට ආශාව උපදී. බඩගින්නේ සිටියවුන්හට කියනු කිම?

"ඇවැත්නි, එපරිද්දෙන්ම යම් කිසි භික්ෂුවක් විසින් කැමැත්ත පරිදි පවත්නාවූ මේ ලාමකවූ අකුසලයෝ පහකළාහු දක්නා ලැබෙත්ද, අසනු ලැබෙත්ද, ඔහු ගමෙහි වාසය කළත් ආරාධනා පිළිගත්තත් ගෙහිමියන් දෙන සිවුරු පිළිගත්තත් එකට මහණ දම් පුරණ සබ්‍රම්සරහු ඔහුට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඊට හේතු කවරේද? ඒ ආයුෂ්මතුන් විසින් කැමැත්තසේ පවත්නාවූ ලාමකවූ අකුශල ධර්මයන් පහ කළ බව දකිනුද ලබන හෙයිනි, අසනුද ලැබෙන හෙයිනි" මෙසේ කී කල්හි ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීහ.

31. "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, මට උපමාවක් වැටහේ යයි" (කියාය). "ඇවැත්නි මොග්ගල්ලානයෙනි එය ගෙනහැර දක්වනු මැනවැයි" කීය. "ඇවැත්නි, එක්කලෙක මම රජගහ නුවරට අයත් සූබ්බජ නම් නුවර වාසය කෙළෙමි. එකල්හි මම පෙරවරු කාලයෙහි හැඳපෙරව පාත්‍ර සිවුරු ගෙන රජගහ නුවරට පිඬු පිණිස ගියෙමි. එකල්හි සමිති නම් වූ රියකරු පුත්‍ර තෙම රථයකට නිම්වළලල්ලක් හසියි. පැරණි රියකරු පුත්‍රයෙක් වූ පණ්ඩු පුත්‍ර නම් වූ ආජීවක තෙම ඔහු වෙත පැමිණ සිටියේය.

"ඇවැත්නි, එහිදී පැරණි රියකරු පුත්‍රවූ පණ්ඩුපුත්‍ර නම් ආජීවකයාහට මෙබඳු කල්පනාවක් ඇති විය, 'මේ සමිති නම් රියකරුපුත්‍ර තෙම මේ නිම් වළල්ලෙහි මේ නැමුනු තැනද මේ ඇදයද මේ නරක තැන්ද සසින්නේ නම් ඉතා යෙහෙක. එසේ වුවොත් මේ නිම්වළල්ල පහවූ දොස් ඇතිව, පිරිසිදුව හරෙහි

පිහිටියා වන්නේය.' (කියාය) ඇවැත්නි, පැරණි රියකරු පුත්‍රවූ පණ්ඩු පුත්‍ර නම් ආජීවකයා යම් යම් අන්දමින් කල්පනා කළේද, සමිති නම් රියකරු පුත්‍ර තෙම ඒ නිම්වළල්ලෙහි ඒ නැමුණු තැනද ඒ ඒ ඇදයද ඒ ඒ දොෂයද සසියි. ඇවැත්නි පරණ රියකරු පුත්‍රවූ පණ්ඩු නම් ආජීවක තෙම සතුටට පත්ව ඔබ සිතින් මගේ සිත දැනගෙන මෙන් සසින්නෙහියයි,' සතුටු වචන පහළ කළේය.

32. "ඇවැත්නි, එපරිද්දෙන්ම ශ්‍රද්ධාවක් නැත්තාවූ ශ්‍රද්ධාවක් නැතිව ජීවිකාව පිණිස ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාවූ කයිරාටික වූ රැවටිලි කාරවූ පුරුදු කළ කයිරාටික කම් ඇති සිත් විසිර ගියාවූ ඇතුළත සාරයක් නැත්තාවූ හිස් මාන ඇති චපලවූ, ක්‍රෑර වචන කියන සංවර නොවූ වචන ඇති ඉන්ද්‍රියයන් සංවර නොකළ භොජනයෙහි පමණ නොදන්නාවූ නිදිවැරීමෙහි නොයෙදුනාවූ ශ්‍රමණ ධර්මයෙහි බලාපොරොත්තු නැත්තාවූ ශික්ෂාවෙහි තියුණු ගෞරව නැත්තාවූ සිවුරු ආදිය බොහෝ ඇත්තාවූ සස්න ලිහිල් කොට ගන්නාවූ නීවරණයන්හි පෙරටුව යන්නාවූ විවේකයෙහි වීර්ය නැත්තාවූ මැලිවූ පහවූ වීර්ය ඇති මුළාවූ සිහි ඇති හොඳ නුවණ නැත්තාවූ එකඟවූ සිත් නැති නොයෙක් අරමුණෙහි දුවන සිත් ඇති ප්‍රඥාව නැත්තාවූ කෙළතොළුවූ යම් ඒ භික්ෂූහු වෙත්ද? ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ධර්ම දේශනාවෙන් තමාගේ සිතින් ඔවුන්ගේ සිත් දැනගෙන සසින්නාක් වැනියයි කීය.

33. "ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ කයිරාටික නුවූ රැවටිලි නැත්තාවූ පුරුදු කළ කයිරාටිකම් නැති විසිරනොගිය සිත් ඇති හිස් මාන නැත්තාවූ චපල නුවූ ක්‍රෑර වචන නැත්තාවූ සංවර වචන ඇත්තාවූ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරවල් ඇති භොජනයෙහි පමණ දන්නාවූ නිදිවැරීමෙහි යෙදුන ශ්‍රමණ ධර්මයෙහි බලාපොරොත්තු ඇති ශික්ෂාවෙහි අධික ගෞරව ඇති සිවුරු ආදිය බොහෝ කොට නැත්තාවූ සස්න ලිහිල්කොට නොගන්නාවූ නීවරණයන්හි පෙරටුව නොයන්නාවූ විවේකයෙහි පෙරටුවයන්නාවූ පටන්ගන්නාලද වීර්ය ඇත්තාවූ කාය ජීවිතයෙහි බලාපොරොත්තු නැති හොඳ

සිහිකල්පනාව ඇති හොඳ ප්‍රඥා ඇති එකඟසිත් ඇති නුවණැත්තාවූ, කෙළතොළු නොවූ යම් ඒ කුලපුත්‍රයෝ වෙත්ද, ඔවුහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ මේ ධර්ම ක්‍රමය අසා වචනයෙන් හා සිතින් බොන්නාක් මෙනැයි හඟිමි. අනුභව කරන්නාක් මෙනැයි හඟිමි. පින්වත, සබ්‍රම්සරුන් අකුසලයෙන් නගා කුසලයෙහි පිහිටුවීම ඉතා හොඳය.

34. "ඇවැත්නි, සැරසීමට කැමතිවූ තරුණවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ වතුර නෑයේ උපුල් මල්දමක් හෝ දෑසමන් මල් දමක් හෝ යොහොඹු මල්දමක් හෝ ලැබ යම්සේ දෑතින් පිළිගෙන උතුම් අඞ්ගයවූ හිසෙහි පැළඳ ගනීද, එපරිද්දෙන්ම ඇවැත්නි, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ කයිරාටික නුවූ රැවටිලි නැත්තාවූ පුරුදු කළ කයිරාටිකකම් නැති විසිරගිය සිත් නැත්තාවූ හිස්වූ මාන නැත්තාවූ චපල නුවූ ක්‍රෑර වචන නැත්තාවූ සංවර වචන ඇත්තාවූ ඉන්ද්‍රියයන්හි වසනලද දොරවල් ඇති භොජනයෙහි පමණ දන්නාවූ නිදිවැරීමෙහි යෙදුනු ශ්‍රමණ ධර්මයෙහි බලාපොරොත්තු ඇති ශික්ෂාවෙහි අධික ගෞරව ඇති සිවුරු ආදිය බොහෝ කොට නැත්තාවූ සස්න ලිහිල්කොට නොගන්නාවූ නීවරණයන්හි පෙරටුව නොයන්නාවූ විවේකයෙහි පෙරටුව යන්නාවූ පටන්ගන්නාලද වීර්ය ඇත්තාවූ කාය ජීවිතයෙහි බලාපොරොත්තු නැති, හොඳ සිහිකල්පනාව ඇති හොඳ ප්‍රඥා ඇති එකඟ සිත් ඇති නුවණැත්තාවූ කෙළතොළු නොවූ, යම් ඒ කුලපුත්‍රයෝ වෙත්ද, ඔව්හු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ මේ ධර්ම ක්‍රමය අසා වචනයෙන් හා සිතින් බොන්නාක් මෙනි. අනුභව කරන්නාක් මෙනි. පින්වතුන් වහන්සේ සබ්‍රහ්මචාරී භික්ෂූන් අකුශලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවයි, එය ඉතා යහපත්ය." මෙසේ මේ මහානාගයෝ (කෙලෙස් නැති ශ්‍රෙෂ්ඨයෝ) දෙදෙන ඔවුනොවුන්ගේ යහපත් වචන සතුටින් අනුමෝදන් වූවාහුය.

(පස්වෙනිවූ අනංගණ සූත්‍රය නිමි)

---

පටුන



## 6 ආකඞ්ඛෙය්‍ය සූත්‍රය

1. "මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනාථ පිණ්ඩික සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන්ට කථාකළහ. "ස්වාමීන් වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

2. "මහණෙනි, සීලයෙන් යුක්තව වාසයකරව්. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තව වාසය කරව්. ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කරව්. ඉතා සුලුවූද වරදට භයවන ගති ඇතිව වාසය කරව්. ශික්ෂාපද සමාදන්ව ඊට අනුව හික්මෙව්.

"මහණෙනි මහණ තෙම සමාන බඹසර ඇත්තවුන්ට ප්‍රිය වූවෙක් මනාපවූවෙක් ගරු කළයුත්තෙක් සැලකිය යුත්තෙක් වන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගන්නෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු පාලු (විවේක ස්ථානයක හිඳ භාවනා කරන්නා සූන්‍යාගාරවඩන්නා යයි කියනු ලැබේ.) විය යුතුය.

3. "මහණෙනි, මහණ තෙම සිවුරු, ආහාර, ගිලන්පස, බෙහෙත් පිරිකර, ලබන්නෙක් වෙමියි ඉදින් කැමති වන්නේ නම්, ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

"මහණෙනි, මහණ තෙම යම් කෙනෙකුන්ගේ සිවුරු, ආහාර, සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර මම වළඳම් නම් ඔවුන්ගේ ඒ දානමය පින්කම් මහත්ඵල වේවායි, මහත් ආනිශංස වේවායි ඉදින්කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය, තමාගේ හිත සමථයෙහි පිහිටුවා

ගත්තෙකු බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්තව වූවෙකු සූන්‍යාගාර වඩන්නෙකු වියයුතුය.

4. "මහණෙනි, මහණතෙම පරලොව ගියාවූ මාගේ යම් නෑ සහ ලේ නෑ කෙනෙක් වෙත්ද ඔවුහු සතුටු සිතින් මා සිහිකරන්නාහ. ඔවුන්ගේ ඒ සිහිකිරීම මහත්ඵල වේවායි මහානිශංස වේවායි ඉදින් කැමැති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්තවූවෙකු සූන්‍යාගාර වඩන්නෙකු වියයුතුය.

5. "මහණෙනි, මහණතෙම කුසල ධර්මයන්හි නොඇලීමද (කම්සැපෙහි) ඇල්මද ඉවසන්නෙක් (මැඩපවත්වන්නෙක්) වන්නෙමි. ඒ කුශල ධර්මයන්හි නොඇලීමද යම්සේ මා නොමඩින්නේද එසේ උපන් කුසල ධර්මයන්හි නොඇල්ම මැඩ මැඩ වාසය කරමියි. ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු වියයුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

6. "මහණෙනි, මහණ තෙම භයානක අරමුණු ඉවසන්නෙමි. සිත තැතිගැන්ම හා භයානක අරමුණු මා මැඩනොපවත්නේද එසේ උපන් භයජනක අරමුණු මැඩ මැඩ වාසය කරන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්තවූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

7. "මහණෙනි, මහණතෙම පිරිසිදු සිතෙහි හටගත්තාවූ මේ ආත්මයෙහි සැප වාස ඇත්තාවූ රූපාවචර ධ්‍යාන හතර කැමතිසේ ලබන්නෙක්, පහසුවෙන් ලබන්නෙක්, අමාරුවක් නැතිව ලබන්නෙක් වන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන

ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු වියයුතුය.

8. "මහණෙනි, මහණතෙම සංසිඳුනාවූ විරුද්ධ ධර්මයන් කෙරෙන් මිදුණාවූ රූපාවචර ධ්‍යානය ඉක්ම සිටි හෙයින් රූප රහිතවූ යම් ඒ අරූප ධ්‍යානයෝ වෙත්ද ඔවුන් නාම කයින් ස්පර්ශකොට වාසය කරන්නෙමියි ඉදින් කැමැති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

9. "මහණෙනි, මහණතෙම සංයොජන (කෙලෙස් බැම්) තුන නැතිකිරීමෙන් දුගතියක නොහෙලන ස්වභාව ඇති, නිවන් මගට නියමවූ, සම්බොධිය පිහිටකොට ඇති සොවාන් කෙනෙක් වෙමියි ඉදින් කැමැති වෙන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණකරන්නෙකු වියයුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු වියයුතුය.

10. "මහණෙනි, මහණ තෙම තුන් සංයොජනයන්හි නැති කිරීමෙන් රාග ද්වේෂ මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමි වන්නෙමි. එක් වරක්ම මේ මනුෂ්‍ය ලොකයට අවුත් දුක් කෙළවර කරන්නෙමියි ඉදින් කැමැති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු වියයුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

මහණෙනි, මහණ තෙම ඔරම්භාගිය (කාමලොකය සේවනය කරන්නාවූ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, ව්‍යාපාද යන) සංයොජන පස නැතිකිරීමෙන් ඔපපාතික වී ඒ බ්‍රහ්ම ලොකයෙන් පෙරළා නොඑන ස්වභාව ඇතිව එහිදීම පිරිනිවන් පාන්නෙක් වෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත

සමථයෙහි පිහිටුවා ගත්තෙකු බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්තවූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

11. "මහණෙනි, මහණතෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වමි. එකෙක්ව බොහෝසේ වෙමි. බොහෝසේව එකෙක් වෙමි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින්යමි. දියෙහිමෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යමි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගාමි, පිරිමදිමි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වමියි, ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකුවිය යුතුය, තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්ත වූවෙකු සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

12. "මහණෙනි, මහණතෙම පිරිසිදුවූ, මිනිස් කණ ඉක්ම පැවැත්තාවූ දිව කණින් දිව්‍යමයවූද මනුෂ්‍යමය වූද දුරවූද සමීපයෙහිවූද ශබ්ද අසන්නෙමියි ඉදින් කැමතිවන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය, තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්තවූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

13. මහණෙනි, මහණ තෙම අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තම සිතින් පිරිසිඳ දන්නෙමි. රාග සහිත සිත රාග සහිත සිතයයි දන්නෙමි. රාගය පහවූ සිත රාගයෙන් පහවූ සිතයයි දනිමි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයි දනිමි. ද්වේෂය පහවූ සිත ද්වේෂයෙන් තොරවූ සිතයයි දනිමි. මොහො සහිත සිත මොහ සහිත සිතයයි දනිමි. මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනිමි. හැකුලුණු සිත හැකුලුණු සිතයයි දනිමි. විසිරුණු සිත විසුරුණු සිතයයි දනිමි. මහත් බවට ගිය සිත මහත්බවට ගිය සිතයයි දනිමි මහත් බවට නොගිය

සිත මහත් බවට නොගිය සිතයයි දනිමි. කාම සහිත සිත, කාමසහිත සිත යයි දනිමි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනිමි. සමාධි ගතවූ සිත සමාධිගත සිතයයි දනිමි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිත යයි දනිමි. (ක්ලේශයෙන්) මිදුනු සිත මිදුනු සිතයයි දනිමි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනිමියි ඉදින් කැමති වන්නේනම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු වියයුතුය. තමාගේ සිත සමථහි පිහිටුවා ගත්තෙකු බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**14.** "මහණෙනි, මහණ තෙම නන්වැදෑරුම්වූ පෙර විසූ තැන් සිහිකරන්නෙමි. හේ කෙසේදයත්, එක්ජාතියක් ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාතිසියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති ලක්ෂ ගණන්ද අසවල් තැන වූයෙමි මෙබඳු නම් ඇත්තේ, මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ, මෙබඳු සැප දුක් විඳින්නේ මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේවීමි. ඒ මම එයින් චුතවූයෙමි අසුවල් තැන උපනිමි. එහිද මෙබඳු නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි, මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුතවූයෙමි මෙහි උපන්නෙමි. මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව නානාප්‍රකාරවූ පෙර විසූ ආත්ම සිහිකරමියි ඉදින් කැමතිවන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**15.** "මහණෙනි, මහණතෙම පිරිසිදුවූ මිනිසත් බව ඉක්මෙව්වාවූ දිව ඇසින් බලන්නෙමි, චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කම්වූ පරිදි මිය පරලොව යන්නාවූද සත්වයන් දැනගන්නෙමි. මේ පින්වත් සත්වයෝ එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාග් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස් කියන්නාහු, මිසදිටුවූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහු මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ දුකට පැමිණෙන හෙයින් දුග්ගති නම්වූ විවසව (හිස යටිකුරු) වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු වචනයෙන් කරන සුචරිතයෙන් යුක්තවුවාහු, සිතින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු ආර්යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක් දෘෂ්ටි සමාදන් වූවාහු ශරීර භෙදයෙන්, මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ, පිරිසිදු දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත්ගති ඇත්තාවූද කම්වූ පරිදි පරලොව යන සත්වයන් දැනගන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවාගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

'මහණෙනි, මහණතෙම ආශාව (කෙලෙස්) නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියත් ප්‍රඥා විමුක්තියත් මේ ජාතියේදීම විසිතුරු නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණකරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු විදර්ශනාවෙන් යුක්තවූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

"මහණෙනි, ශීලයෙන් යුක්තව වාසයකරව්, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තව වාසය කරව්, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කරව්, ඉතා සුලුවූද වරදට භයවන ගතියෙන් වාසය කරව්, ශික්ෂාපද සමාදන්ව ඊට අනුව හික්මෙව් යැයි යමක් (මුලදී) කියන ලදද එය මේ සඳහා කියනලදී."

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළහ. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

(හයවෙනිවූ ආකඞ්ඛෙය්‍ය සූත්‍රය නිමි.)

---

## 7. වත්ථ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනාථපිණ්ඩික සිටුහු විසින් කරවනලද ජෙතවන නම්විහාරයෙහි වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට කථාකළහ. 'ස්වාමීනි'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. "මහණෙනි, යම්සේ කිලුටුවූ මලබැඳුණාවූ වස්ත්‍රයක් වේද ඒ වස්ත්‍රය රෙදි සායම් කරන්නෙක් නිල්පාට කිරීම පිණිස හෝ රන්වන් පාට කිරීම පිණිස හෝ ලේපාට කිරීම පිණිස හෝ මදටියපාට කිරීම පිණිස හෝ යම් යම් සායමක් පොවන්නේද, එය නරකපාට ඇත්තක්ම වන්නේය. අපිරිසිදුපාට ඇත්තක්ම වන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, වස්ත්‍රය අපිරිසිදුවූ බැවිනි. මහණෙනි, එපරිද්දෙන්ම සිත කිලුටුවූ කල්හි දුර්ගතිය කැමතිවිය යුතුයි.

"මහණෙනි, යම්සේ පිරිසිදුව බබලන්නාවූ වස්ත්‍රයක් වේද ඒ වස්ත්‍රය රෙදි සායම් කරන්නෙක් නිල්පාට කිරීම පිණිස හෝ රන්වන් පාට කිරීම පිණිස හෝ ලේපාට කිරීම පිණිස හෝ මදටියපාට කිරීම පිණිස හෝ යම් යම් සායමක් පොවන්නේද එය හොඳපාට ඇත්තක්ම වන්නේය. පිරිසිදු පාට ඇත්තක්ම වන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, වස්ත්‍රය පිරිසිදුවූ බැවිනි. මහණෙනි, එපරිද්දෙන්ම සිත නොකිලිටිවූ කල්හි සුගතිය කැමති විය යුතුයි.

3. "මහණෙනි, සිත කෙලෙසන්නාවූ පාපධර්මයෝ කවරහුද? අභිධ්‍යාව නම්වූ විෂමලොභය (අනුන්ගේ දේ මට ඇත්නම් හොඳයයි ආශා කරන දැඩි ලොභය) හිත කෙලෙසන්නකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ව්‍යාපාදය (අනුන් නසනු කැමැත්ත) හිත කෙලෙසන්නකි. ක්‍රොධය (තරහ) සිත කෙලෙසන්නකි. උපනාහය (බැඳගත් වයිරය) හිත කෙලෙසන්නකි. මක්ඛය (අනුන්ගේ ගුණමැකීම) හිත කෙලෙසන්නකි. පලාසය (නීචව සිටිමින් උසස් පුද්ගලයන් හා තමා සමාන සිතීම) හිත කෙලෙසන්නකි. ඊර්ෂ්‍යාව (අන්‍යයන්ගේ සම්පත් නොඉවසීම) හිත කෙලෙසන්නකි. මසුරුකම (තමාගේ ඇති සම්පත් සැඟවීම) හිත කෙලෙසන්නකි. මායාව (රැවටිල්ල) හිත කෙලෙසන්නකි. සඨබව (කෛරාටිකකම) හිත කෙලෙසන්නකි. ථම්භය (මානයෙන් ඉදිමුණු ගතිය) හිත කෙලෙසන්නකි. සාරම්භය (එකට එක කිරීම) හිත කෙලෙසන්නකි. මානය (ජාති ආදිය නිසා ඇතිවූ උඩඟු හැඟීම) හිත කෙලෙසන්නකි. අභිමානය (අධික මානය) හිත කෙලෙසන්නකි. මදය (ජාති ආදියෙන් මත්වීම) හිත කෙලෙසන්නකි. ප්‍රමාදය (පස්කම් සැපෙහි ඇලීම) හිත කෙලෙසන්නකි.

4. "මහණෙනි, ඒ මහණතෙම අභිධ්‍යාව නම්වූ විෂම ලොභය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන අභිධ්‍යාව නම්වූ විෂමලොභය දුරු කරයි. ව්‍යාපාදය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන, හිත කෙලෙසන ව්‍යාපාදය දුරු කරයි. ක්‍රොධය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන ක්‍රොධය දුරු කරයි. උපනාහය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන උපනාහය දුරුකරයි. මකු ගුණය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන මකු ගුණය දුරු කරයි. පලාසය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන පලාසය දුරු කරයි. ඊර්ෂ්‍යාව හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන ඊර්ෂ්‍යාව දුරු කරයි. මසුරුකම හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන මසුරුකම දුරු කරයි. රැවටිල්ල හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන මායාව දුරුකරයි. කයිරාටික බව හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන කයිරාටික බව දුරු කරයි. හිතේ තදගතිය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන සිතෙහි තදගතිය දුරුකරයි. එකට එක කිරීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන සාරම්භය දුරු කරයි. මානය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන මානය දුරුකරයි. අභිමානය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන අභිමානය දුරුකරයි. ප්‍රමාදය හිත කෙලෙසන්නකැයි මෙසේ දැන හිත කෙලෙසන ප්‍රමාදය දුරුකරයි.

**5.** "මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් අභිධ්‍යා නම්වූ විෂම ලොභය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන අභිධ්‍යා විෂම ලොභය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් ව්‍යාපාදය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන ව්‍යාපාදය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් ක්‍රොධය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන ක්‍රොධය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් උපනාහය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන උපනාහය නැති කරන ලද්දේ වෙයිද?

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් මකු බව හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන මකු බව නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් පලාසය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන පලාසය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් ඊර්ෂ්‍යාව හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන ඊර්ෂ්‍යාව නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් මසුරු බව හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන මසුරු බව නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් රැවටිල්ල හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන රැවටිල්ල නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් කයිරාටිකකම හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන කයිරාටිකකම නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් තද බව හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන තද බව නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් එකටඑක කිරීම හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන එකටඑක කිරීම නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් මානය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන මානය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් අභිමානය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන අභිමානය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් මදය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන මදය නැති කරන ලද්දේ වෙයිද,

"මහණෙනි, යම් කලෙක පටන් භික්ෂුව විසින් ප්‍රමාදය හිත කෙලෙසන්නකැයි දැන හිත කෙලෙසන ප්‍රමාදය නැති කරන ලද්දේ වෙයිද,

"හෙතෙම බුදුන් කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූයේ වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන්ද අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන් යුක්තය, සුගතය, ලොකය දන්නා සේක. අනුත්තරය, චණ්ඩපුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙක්

වැනිය, දෙව් මිනිසුන්ට අනුශාසනා කරන්නාය, බුද්ධය, භාග්‍යවත්ය කියායි.

"ධර්මයෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූයේ වෙයි, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරනලදී. මෙලොව ලැබෙන ඵල ඇත්තේය. කල් නොයවා දෙන විපාක ඇත්තේය. අවුත් බලවයැයි කියා දැක්වීමට සුදුසුය. තමන් තුළ ඉපදවීමට සුදුසුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුතුය කියායි.

"සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ ඍජුව පිළිපන්නේය. න්‍යායයට (නිර්වාණයට) අනුව පිළිපන්නේය. සාමීචි කර්මයට සුදුසුසේ පිළිපන්නේය. දුර සිට ගෙනැවිත් දෙන සිව්පසය ලැබීමට සුදුසුය. දුර සිට ආ ඥාති මිත්‍රාදීන්ට පිළියෙලකළ ආගන්තුක සත්කාරය ලැබීමට සුදුසුය. දොහොත් මුදුනේ තබා වැඳීමට සුදුසුය. ලොවට උතුම්වූ පින් කෙතය කියායි.

**6.** "යම් තැනෙක පටන් භික්ෂුව විසින් කෙලෙස් දුරු කරන ලද්දේද, වමාරණ ලද්දේද, මුදන ලද්දේද නැති කරන ලද්දේද, (එතැන් පටන්) හෙතෙම බුදුන් කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවෙමියි ඵලය දැකීමෙන් උපදනා සතුටද ලබයි හෙතුව දැකීමෙන් උපදනා සතුටද ලබයි. ධර්මයෙන් යුත් සතුටක් ලබයි, සතුටු වූවහුට ප්‍රීතිය උපදියි. සතුටු සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි, සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි, සැපය ඇත්තහුගේ හිත එකඟ වෙයි. ධර්මය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වෙමියි ඵලය දක්නා සතුට ලබයි. හෙතුව දක්නා සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ සතුට ලබයි, සතුටු වූවහුට ප්‍රීතිය උපදියි, සතුටු සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි, සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි, සැපය ඇත්තහුගේ හිත එකඟ වෙයි. සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වෙමියි ඵලය දක්නා සතුට ලබයි, හෙතුව දක්නා සතුට

ලබයි. ධර්මයෙන් යුක්තවූ සතුට ලබයි, සතුටු වූවහුට ප්‍රීතිය උපදියි, සතුටු සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි, සැපය ඇත්තහුගේ හිත එකඟවෙයි.

7. "යම් තැනක පටන් ඒ භික්ෂුව මා විසින් කෙලෙස් දුරුකරන ලදැයි, වමාරණ ලදැයි, නැතිකරන ලදැයි එලය දක්නා සතුටද හෙතුව දක්නා සතුටද ලබයිද ධර්මයෙන් යුත් සතුට ලබයිද, සතුටු වූවහුට ප්‍රීතිය උපදියිද, සතුටු සිත් ඇත්තහුගේ කය සංසිඳෙයිද, සංසිඳුණු කය ඇත්තේ හිතින් සැප විඳියිද, සැප ඇත්තහුගේ සිත එකඟවෙයිද, මහණෙනි, මෙබඳු සීල ඇති මෙබඳු සමාධි ඇති, මෙබඳු ප්‍රඥා ඇති ඒ (අනාගාමි) භික්ෂුව කළු හාල් ඇට අස්කළ ඇල්හාලේ බත නොයෙක් සූප ඇතිව නොයෙක් ව්‍යඤ්ජන ඇතිව අනුභව කෙරේද ඔහුට එය අන්තරාය පිණිස නොවෙයි. මහණෙනි, කිලුටුවූ මළ රැඳුනාවූ වස්ත්‍රය පිරිසිදුවූ ජලය ලැබ යම්සේ පිරිසිදු වෙයිද, බබලන්නේ වෙයිද, කෝවයෙහි දමන ලද රන් රිදී යම්සේ පිරිසිදු වෙයිද, බබලන්නේ වෙයිද මහණෙනි, එපරිද්දෙන්ම මෙබඳු සිල් ඇති මෙබඳු සමාධි ඇති, මෙබඳු ප්‍රඥා ඇති ඒ (අනාගාමි) භික්ෂුව කළුහාල් ඇට අස්කළ ඇල්හාලේ බත නොයෙක් සූප ඇතිව නොයෙක් ව්‍යඤ්ජන ඇතිව අනුභව කෙරේද ඕහට එය අන්තරාය පිණිස නොවෙයි. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස යන සියලු තන්හි පැතුරුණාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ ව්‍යාපාද රහිතවූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරයි.

"කරුණා සහගතවූ සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි පැතුරුණාවූ, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ ව්‍යාපාද රහිතවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"මුදිතා සහගතවූ සිතින්, එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද, එසේම උඩ යට සරස යන සියලු තන්හි පැතුරුණාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ ව්‍යාපාද රහිතවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"උපෙක්ෂා සහගතවූ සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස යන සියලු තන්හි පැතුරුණාවූ, සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ ව්‍යාපාද රහිතවූ උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි. ඒ අනාගාමි පුද්ගලතෙම මේ දුක්ඛ ආර්යසත්‍යය ඇත, ලාමකවූ සමුදය සත්‍යය ඇත, ප්‍රණීතවූ මාර්ගසත්‍යය ඇත. මේ බ්‍රහ්ම විහාර ධ්‍යාන සංඥාවට වඩා උතුම් නිර්වාණය ඇතැයි දනියි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රවයෙන් ද මිදෙයි, භවාශ්‍රවයෙන් ද මිදෙයි, අවිද්‍යාශ්‍රවයෙන් ද මිදෙයි. මිදුන කල්හි මිදුනේයයි දැනීම වෙයි. උත්පත්තිය කෙළවර විය මග බඹසර වැස නිමවන ලදී. සතරමාර්ගයෙහි කටයුතු කරනලදී. මේ ආත්මය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දනී. මහණෙනි මේ මහණතෙම අභ්‍යන්තර නෑමෙන් නෑයේයයි කියනු ලැබේ."

8. මේ අවස්ථාවේ සුන්දරික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම බුදුන් සමීපයෙහි හුන්නේ වෙයි. එකල්හි සුන්දරික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "භවත් ගෞතම තෙම බාහුකා නම් ගඟට නාන්ට යන්නේද?" (කියාය.)

"බ්‍රාහ්මණය, බාහුකා නම් ගංගාවෙන් කවර ප්‍රයෝජනද? බාහුකා නදිය කුමක් කරයිද?" "භවත් ගෞතමයෙනි, බාහුකා ගඟ විසුද්ධිය ගෙන දෙන්නකැයි ලෝවැස්සන් අතර සම්මතය. භවත් ගෞතමයෙනි, බොහෝ දෙනා බාහුකා ගංගාව පින් තොටකැයි සලකන්නාහුය. බොහෝදෙනා තමන් කළ පව් බාහුකා නදියෙහි පාකර හරිති" යයි (කීයේය.)

**9.** එකල්හි භාග්‍යවතුන් වහන්සේ සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයාහට මේ ගාථා වදාළහ.

"බාහුකා නම් ගඟටද අධිකක්ක නම් තොටටද ගයා නම් තොටුපලටද සුන්දරිකා නම් ගඟටද සරස්වතී නම් ගඟටද ප්‍රයාග නම් තොටටද බාහුමතී නම් ගඟටද,

"නිතර බැස නාන්නාවූ අපිරිසිදු කර්ම ඇති පුද්ගලයා පිරිසිදු නොවෙයි. සුන්දරිකා ගඟ කුමක් කරයිද? ප්‍රයාග තීර්ථය කුමක් කරයිද? බාහුකා නදිය කුමක් කරයිද? ප්‍රාණඝාතාදී පව්කරන කෲර ක්‍රියාකරන මිනිසා ශුද්ධ නොකරයි.

"පිරිසිදු වුවහුට හැමදාම නෑමට (සුදුසු) උතුරුපල් නැකත වෙයි. පිරිසිදු වුවහුට හැමදාම පෝය දිනය වෙයි. පිරිසිදු ක්‍රියා ඇති ශුද්ධ පුද්ගලයාහට හැමදාම වත් පිරෙයි.

"බ්‍රාහ්මණය, මේ ශාසනයෙහිම ස්නානය කරව, සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී කරව, ඉදින් බොරු නොකියන්නෙහිද, ඉදින් සතුන් නොමරන්නෙහිද,

"ඉදින් නුදුන් දෙය නොගත්තෙහිද, ශ්‍රද්ධා ඇත්තේ වෙහිද, මසුරු නොවූයේ වෙහිද, ගයාවට ගොස් කුමක් කරන්නෙහිද? තොපගේ ළිඳත් ගයාවකි, (ශුද්ධවූ පුද්ගලයාට ළිඳත් ගයාවත් යන දෙකෙහි වෙනසක් නැත.)"

**10.** මෙසේ කීකල්හි සුන්දරික භාරද්වාජ බමුණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන්වහන්ස, (මේ ධර්මය) ඉතා යහපත. භවත් ගෞතමයන්වහන්ස, යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, වසා තබන ලද්දක් වැසුම් හැර දක්වන්නේ හෝ යම්සේද, මං මුළා වූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, කළුවරෙහි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කරන ලද්දේය. භවත් ගෞතමයන් වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද, සරණ

යම්. මම භවත් ගෞතමයන් වහන්සේ වෙත මහණකම ලබන්නෙම්, උපසම්පදාව ලබන්නෙම්.” සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණතෙම බුදුන් වෙත පැවිද්ද ලැබුවේය. උපසම්පදාව ලැබුවේය. ආයුෂ්මත් භාරද්වාජ තෙමේ වනාහි උපසම්පදාවී නොබෝකල් ඇත්තේ හුදකලා වූයේ වෙන් වූයේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව, කයෙහි හා ජීවිතයෙහි ආශා රහිතව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද ඒ උතුම්වූ මාර්ග බ්‍රහ්මචරියාව කෙළවරකොට ඇති අර්හත්ඵලය මේ ආත්මයෙහි තමාම දැක ඊට පැමිණ වාසය කළේය. උත්පත්තිය කෙළවර විය. මාර්ග බ්‍රහ්මචරියාව වැස නිමවනලදී. සතර මාර්ගයෙන් කටයුතු දෑ කරන ලදී. මේ ආත්මය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය. ආයුෂ්මත් භාරද්වාජයන් වහන්සේ රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක්ද වූහ.

(හත්වෙනිවූ වත්ථ සූත්‍රය නිමි.)

---

## 8. සල්ලේඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනාථ පිණ්ඩික සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සුවයෙන් නැගීසිටියේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට පැමිණියහ, පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2. “ස්වාමීනි, ආත්මවාදයෙන් යුක්තවූද, ලොකවාදයෙන් යුක්තවූද නොයෙක් ආකාරවූ යම් ඒ මිථ්‍යාදෘෂ්ටීහු (වැරදි දැකීම්) ලොකයෙහි උපදිත්ද ස්වාමීනි, පළමුකොටම (විදර්ශනා

මිශ්‍රභාවනා) මෙනෙහි කරන්නාවූ මහණහට ඒ දෘෂ්ටීන්ගේ නැතිකිරීම වෙයිද? ඒ දෘෂ්ටීන්ගේ දුරලීම් වෙයිද? 'චුන්දය, ආත්මවාදයෙන් යුක්තවූද ලොකවාදයෙන් යුක්තවූද නොයෙක් ආකාරවූ යම් ඒ මිථ්‍යාදෘෂ්ටීහු ලොකයෙහි උපදිත්ද යම් පඤ්චස්කන්ධයක මේ දෘෂ්ටිහු උපදිත්ද, යම් පඤ්චස්කන්ධයක සයනය කරද්ද යම් පඤ්චස්කන්ධයක ද්වාර ඉක්මවීම් වශයෙන් හැසිරෙද්ද, ඒ මේ පඤ්චස්කන්ධය මාගේ නොවෙයි. මේ පඤ්චස්කන්ධය මම නොවෙමි, මේ පඤ්චස්කන්ධය මාගේ ආත්මය නොවෙයි, කියා මෙසේ මෙය තතුසේ යහපත් නුවණින් දක්නහුට මෙසේ මේ දෘෂ්ටීන්ගේ නැති කිරීම වෙයි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුරලීම වෙයි."

3. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හෙතුවකින් ශාසනයෙහි ඇතැම් මහණෙක් කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද ඕහට සල්ලේඛයෙන් (කෙලෙස් කැපීමෙන්) යුක්තව වාසයකරමි යන මෙබඳු සිතක් වන්නේය. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්යශාසනයෙහි (ශාසනයෙහි) සල්ලේඛයෝයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි මෙලොව සැප වාසයෝයයි කියනු ලැබෙත්.

4. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අභ්‍යන්තරය පැහැදීම ඇති, හිතේ එකඟබව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද ඕහට මෙසේ සිතක් වන්නේය. සල්ලේඛයෙන් වාසය කරමි (කියායි) චුන්දය, මොහු ආර්ය ශාසනයෙහි සල්ලේඛයෝයයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි මෙලොව සැප වාසයෝයයි කියනු ලැබෙත්.

5. "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මෙහි ඇතැම් මහණෙක් ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද සිහියෙන් යුක්තවූයේ නුවණින් යුක්තවූයේ

ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්යයෝ යම් ඒ තෘතීය ධ්‍යානයක් උපෙක්ෂා ඇති සිහි ඇති සැප විහරණ ඇත්තේයයි කියත්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද, ඕහට මෙසේ සිතක් වන්නේය, සල්ලේඛයෙන් වාසය කරමි (කියායි) චුන්දය, මොහු ආර්යශාසනයෙහි සල්ලේඛයෝයයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි මෙලොව සැප වාසයෝයි කියනු ලැබෙත්.

**6.** "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මෙහි ඇතැම් මහණෙක් සැපය දුරුකිරීමෙන්ද දුක දුරුකිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපේක්ෂා ස්මෘති පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද, ඕහට මෙසේ සිතක් වන්නේය. සල්ලේඛයෙන් වාසයකරමි (කියායි) චුන්දය, මොහු ආර්ය ශාසනයෙහි සල්ලේඛයෝයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි මෙලොව සැප වාසයෝයි කියනු ලැබෙත්.

**7.** "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මෙහි යම්කිසි මහණෙක් සියලු අයුරින් රූපසංඥාව ඉක්මවීමෙන් ප්‍රතිඝ (ගැටීම්) සංඥාව නැතිකිරීමෙන් නානත්ත (විවිධ) සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්ත යයි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ඕහට මෙසේ සිතක් වන්නේය. සල්ලේඛයෙන් වාසය කරමියි (කියායි) මොහු ආර්ය ශාසනයෙහි සල්ලෙඛයෝයයි කියනු නොලැබෙත්. ආර්ය ශාසනයෙහිදී මොහු ශාන්ත විහරණයෝ යයි කියනු ලැබෙත්.

**8.** "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මෙහි යම්කිසි මහණෙක් සියලු අයුරින් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ඕහට මෙසේ සිතක් වන්නේය. සල්ලෙඛයෙන් වාසය කරමියි (කියායි) මොහු ආර්යශාසනයෙහි සල්ලෙඛයෝයි කියනු නොලැබෙත්. ආර්ය ශාසනයෙහිදී මොහු ශාන්ත විහරණයෝයයි කියනු ලැබෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මෙහි යම්කිසි මහණෙක් සියලු අයුරින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ඔහට මෙසේ සිතක් වන්නේය. සල්ලෙඛයෙන් වාසය කරමි (කියායි) චුන්දය, මොහු ආර්ය ශාසනයෙහි සල්ලෙඛයෝයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි ශාන්ත විහරණයෝයයි කියනු ලැබෙත්.

**10.** "චුන්දය, මේ කාරණයෙක් ඇත්තේය. යම් හේතුවකින් මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් සියලු අයුරෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරන්නේද ඔහට මෙසේ සිතක් වන්නේය සල්ලෙඛයෙන් වාසය කරමියි (කියායි) මොහු ආර්ය ශාසනයෙහි සල්ලෙඛයෝයි කියනු නොලැබෙත්. ආර්ය ශාසනයෙහිදී මොහු ශාන්ත විහරණයෝයයි කියනු ලැබෙත්.

**11.** "චුන්දය, මේ ශාසනයෙහි වනාහි තොප විසින් සල්ලෙඛය (කෙලෙස් කැපීම) කටයුතුයි. අන්‍යයෝ සත්ත්ව හිංසා කරන්නෝ වන්නාහ. අපි වනාහි මෙහි හිංසා නොකරන්නෝ වන්නෙමුයයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ ප්‍රාණඝාත කරන්නෝ වන්නාහ. අපි මෙහි ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ නුදුන් දෙය ගන්නෝ වන්නාහුය. අපි නුදුන් දෙය ගැනීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි.

**12.** "අන්‍යයෝ මෛථුන ධර්ම සංඛ්‍යාත ලාමක හැසිරීම් ඇත්තෝ වන්නාහුය. අපි ඒ ලාමක හැසිරීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ බොරු කියන්නෝ වන්නාහුය. අපි බොරු කීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ කේලාම් කියන්නෝ වන්නාහුය. අපි කේලාම් කීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ ඵරුෂ වචන කියන්නෝ වන්නාහුය. අපි ඵරුෂ වචන කීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ හිස් වචන කියන්නෝ වන්නාහුය. අපි හිස් වචන කීමෙන් වැළකුණෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අන්‍යයෝ අධික ලොභ ඇත්තෝ වන්නාහුය. අපි අධික ලොභ නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ව්‍යාපාද (නසනු කැමති) සිත් ඇත්තෝ වන්නාහුය. අපි අව්‍යාපාද (නසනු නොකැමති) සිත් ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුයි. අන්‍යයෝ වැරදි දැකීම් ඇත්තෝ වන්නාහුය. අපි හරි දැකීම් ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි කල්පනා ඇත්තෝ වන්නාහුය. අපි හරි කල්පනා ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි වචන ඇත්තෝ වන්නාහුය. අපි හරි වචන ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි කර්මාන්ත ඇත්තෝ වන්නාහුය. අපි හරි කර්මාන්ත ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි දිවිපෙවෙත ඇත්තෝ වන්නාහුය. අපි හරි දිවිපෙවෙත ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි උත්සාහ ඇත්තෝ වන්නාහුය. අපි හරි උත්සාහ ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි සිහි ඇත්තෝ වන්නාහුය. අපි හරි සිහිය ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි සමාධි ඇත්තෝ වන්නාහුය. අපි හරි සමාධි ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි නුවණ ඇත්තෝ වන්නාහුය. අපි හරි නුවණ ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ වැරදි මිදීම් ඇත්තාහු වන්නාහුය. අපි හරි මිදීම් ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ථිනමිද්ධයෙන් (චිත්ත චෛතසිකයන්ගේ මැලිකමින්) මඩනා ලද්දේ වන්නාහුය. අපි පහවූ ථිනමිද්ධ ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ නොසන්සුන් වූවෝ වෙත්. අපි සන්සුන් වූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ විචිකිච්ඡාවෙන් (සැකයෙන්) යුක්තවූවෝ වන්නාහුය. අපි දුරු කළ විචිකිච්ඡා ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ක්‍රොධකරන්නෝ වන්නාහුය. අපි ක්‍රොධ රහිත වූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ බද්ධවෛර ඇත්තෝ වන්නාහුය. අපි බද්ධවෛර නැත්තාහු වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ගුණමකුකම ඇත්තෝ වන්නාහුය. අපි ගුණමකුකම නැත්තෝ

වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ පලාස (පහත්ව සිටිමින් උසස් පුද්ගලයන් හා තමන් සමකර සිතීම) ඇත්තෝ වන්නාහුය අපි පලාස හෙවත් යුගග්‍රාහ නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ඊර්ෂ්‍යා ඇත්තෝ වන්නාහුය. අපි ඊර්ෂ්‍යා නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ මසුරු ගති ඇත්තෝ වන්නාහුය. අපි මසුරු ගති නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ කෛරාටික වන්නාහුය. අපි කෛරාටික නුවූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ රැවටිලි ඇත්තාහු වන්නහුය. අපි රැවටිලි නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ තද වූවෝ වන්නාහුය. අපි තද නුවූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ අධිකමාන ඇත්තෝ වන්නාහුය. අපි අධික මාන නැත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ අකීකරුවූවෝ වන්නාහුය. අපි කීකරුවූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ පවිටු මිතුරන් ඇත්තෝ වන්නාහුය. අපි යහපත් මිතුරන් ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ප්‍රමාද වූවෝ වන්නාහුය. අපි ප්‍රමාදවූවෝ නොවන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ශ්‍රද්ධා නැත්තෝ වන්නාහුය. අපි ශ්‍රද්ධා ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ලජ්ජා නැත්තෝ වන්නාහුය. අපි ලජ්ජා ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ පාපයෙහි භය නැත්තෝ වන්නාහුය. අපි පාපයෙහි භය ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ඇසූ පිරූ තැන් නැත්තෝ වන්නාහුය. අපි ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ කුසීත වන්නාහුය. අපි පටන්ගන්නාලද වීර්ය ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය.

13. "අන්‍යයෝ මුළා සිහි ඇත්තෝ වන්නාහුය. අපි එළඹ සිටි සිහි ඇත්තෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ ප්‍රඥා නැත්තෝ වන්නාහුය. අපි ප්‍රඥාවෙන් සම්පූර්ණ වූවෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය. අන්‍යයෝ තමන්ගේම දෘෂ්ටිය ගෙන සිටින්නාහු එය තදින් අල්ලාගෙන සිටින්නාහු එයින් වෙන්කිරීම දුෂ්කර වූවාහු වන්නාහුය. අපි තමන්ගේම දෘෂ්ටිය

ගෙන නොසිටින්නාහු දෘෂ්ටිය තදින් අල්ලාගෙන නොසිටින්නාහු එම දෘෂ්ටියෙන් පහසුවෙන් දුරු කළ හැක්කාහු වන්නෙමුයි සල්ලෙඛ කටයුතුය.

**14.** චුන්දය, කුශල ධර්මයන්හි හිතක් ඇතිකර ගැනීම පවා බොහෝ උපකාර ඇත්තේයයි මම කියමි. කයින් වචනයෙන් කරණු ලබන කල්හි කියනුම කවරේද, චුන්දය එහෙයින් අන්‍යයෝ සත්ත්ව හිංසා කරන්නෝ වන්නාහුය. අපි මෙහි හිංසා නොකරන්නෝ වන්නෙමුයයි සිත ඉපදවිය යුතුයි. අන්‍යයෝ ප්‍රාණඝාත කරන්නෝ වන්නාහුය. අපි ප්‍රාණඝාතයෙන් වැළකුනෝ වන්නෙමුයයි සිත ඉපදවිය යුතුයි. අන්‍යයෝ නුදුන්දෙය ගන්නෝ වන්නාහුය. අපි නුදුන් දෙය ගැනීමෙන් වැළකුණෝ වන්නෙමුයි සිත ඉපදවිය යුතුයි. අන්‍යයෝ මෛථුනධර්ම සංඛ්‍යාත ලාමක හැසිරීම් ඇත්තෝ වන්නාහුය. අපි බ්‍රහ්මචාරී වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ බොරු කියන්නෝ වන්නාහුය. අපි බොරු කීමෙන් වැළකුනෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ කේළාම් කියන්නෝ වන්නාහුය. අපි කේළාම් කීමෙන් වැළකුනෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ ඵරුෂ වචන කියන්නෝ වන්නාහුය. අපි ඵරුෂ වචනයෙන් වැළකුනෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ හිස් වචන කියන්නෝ වන්නාහුය. අපි හිස්වචන කීමෙන් වැළකුනෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි.

"අන්‍යයෝ අධික ලොභය ඇත්තෝවන්නාහුය. අපි අධික ලොභ නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ව්‍යාපාද (නසනුකැමති) සිත් ඇත්තෝ වන්නාහුය. අපි අව්‍යාපාද (නසනු නොකැමති) සිත් ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ වැරදි දැකීම් ඇත්තෝ වන්නාහුය. අපි හරි දැකීම් ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුයි. අන්‍යයෝ වැරදි කල්පනා ඇත්තෝ වන්නාහුය. අපි හරි කල්පනා ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවි යුතුය. අන්‍යයෝ වැරදි වචන ඇත්තෝ වන්නාහුය. අපි හරි වචන ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ වැරදි කර්මාන්ත ඇත්තෝ වන්නාහුය. අපි හරි කර්මාන්ත ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය.

අන්‍යයෝ වැරදි ජීවිකා ඇත්තෝ වන්නාහුය. අපි හරි ජීවිකා ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ වැරදි ව්‍යායාම ඇත්තෝ වන්නාහුය. අපි හරිව්‍යායාම් ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ වැරදි සිහි ඇත්තෝ වන්නාහුය. අපි හරි සිහිය ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ වැරදි සමාධි ඇත්තෝ වන්නාහුය. අපි හරි සමාධි ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවි යුතුය. අන්‍යයෝ වැරදිනුවණ ඇත්තෝ වන්නාහුය. අපි හරි නුවණ ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ වැරදි විමුක්ති ඇත්තෝ වන්නාහුය. අපි හරි විමුක්ති ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය, අන්‍යයෝ ථිනමිද්ධයෙන් වඩනා ලද්දෝ වන්නාහුය. අපි පහවූ ථිනමිද්ධ ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ නොසන්සුන් වූවෝ වෙත්. අපි සන්සුන් වූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ විචිකිච්ඡාවෙන් (සැකයෙන්) යුක්ත වූවෝ වන්නාහුය. අපි බැහැර කළ විචිකිච්ඡා ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ක්‍රොධ කරන්නෝ වන්නාහුය. අපි ක්‍රොධ රහිතවූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ බද්ධවෛර ඇත්තෝ වන්නාහුය. අපි බද්ධ වෛර නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ මකුගතිය ඇත්තෝ වන්නාහුය අපි මකු ගතිය නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ පලාස (පහත්ව සිටිමින් උසස් පුද්ගලයන් හා තමන් සමකර සිතීම) ඇත්තෝ වන්නාහුය. අපි පලාස හෙවත් යුගග්‍රාහ නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ඊර්ෂ්‍යා ඇත්තෝ වන්නාහුය. අපි ඊර්ෂ්‍යා නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ මසුරු ගති ඇත්තෝ වන්නාහුය. අපි මසුරු ගති නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ කෛරාටික වන්නාහුය. අපි කෛරාටික නුවූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ රැවටිලි ඇත්තාහු වන්නාහුය. අපි රැවටිලි නැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ තදවූවෝ වන්නාහුය. අපි තදනුවූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ අධික මාන ඇත්තෝ වන්නාහුය. අපි

මානනැත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ අකීකරුවූවෝ වන්නාහුය. අපි කීකරුවූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ පවිටු මිතුරන් ඇත්තෝ වන්නාහුය. අපි යහපත් මිතුරන් ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ප්‍රමාද වූවෝ වන්නාහුය. අපි ප්‍රමාද වූවෝ නොවන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ශ්‍රද්ධා නැත්තෝ වන්නාහුය. අපි ශ්‍රද්ධා ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ලජ්ජානැත්තෝ වන්නාහුය. අපි ලජ්ජා ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ පාපයෙහි භය නැත්තෝ වන්නාහුය. අපි පාපයෙහි භය ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවියයුතුය. අන්‍යයෝ ඇසූ පිරූ තැන් නැත්තෝ වන්නාහුය. අපි ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ කුසීත වන්නාහුය. අපි පටන් ගන්නාලද වීර්‍ය ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ මුළාවූ සිහි ඇත්තෝ වන්නාහුය. අපි එළඹ සිටි සිහි ඇත්තෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ ප්‍රඥා නැත්තෝ වන්නාහුය. අපි ප්‍රඥාවෙන් සම්පූර්ණ වූවෝ වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය. අන්‍යයෝ තමන්ගේම දෘෂ්ටිය ගෙන සිටින්නාහු එය තදින් අල්ලාගෙන සිටින්නාහු එයින් වෙන් කිරීම දුෂ්කර වූවාහු වන්නාහුය. අපි තමන්ගේම දෘෂ්ටිය ගෙන නොසිටින්නාහු දෘෂ්ටිය තදින් අල්ලාගෙන නොසිටින්නාහු එම දෘෂ්ටිය පහසුවෙන් දුරුකළ හැක්කාහු වන්නෙමුයි සිත් ඉපදවිය යුතුය.

**15.** "චුන්දය, විෂම මාර්ගයක් දුරලීමට අන්‍යවූ සම මාර්ගයක් ඇත්තේ යම්සේද චුන්දය, විෂමවූ තොටුපලක් දුරලීමට අන්‍යවූ සමවූ තොටක් ඇත්තේ යම්සේද, චුන්දය, එපරිද්දෙන්ම හිංසා කරන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස අවිහිංසාව ඇත්තේය. ප්‍රාණඝාත කරන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස ප්‍රාණඝාතයෙන් වෙන්වීම ඇත්තේය. නොදුන් දෙය පැහැර ගන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස නොදුන් දෙය ගැනීමෙන් වැළකීම ඇත්තේය. අබ්‍රහ්මචාරී පුද්ගලයාට එය දුරලීම පිණිස බ්‍රහ්මචරියාව ඇත්තේය. බොරු කියන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස මුසාවාදයෙන් වැළකීම ඇත්තේය. කේළාම්

කියන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස කේළාම් කීමෙන් වැළකීම ඇත්තේය. ඵරුෂ වචන කියන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස ඵරුෂ වචනයෙන් වෙන්වීම ඇත්තේය. හිස් වචන කියන්නාවූ පුද්ගලයාට එය දුරලීම පිණිස හිස් වචන කීමෙන් වෙන්වීම ඇත්තේය. විෂම ලෝභ බහුලවූ පුද්ගලයාට එයදුරලීම පිණිස විෂමලොභ රහිත බව ඇත්තේය ව්‍යාපාද (නසනු කැමති) සිත් ඇති පුද්ගලයාට එය දුරලීම පිණිස ව්‍යාපාද රහිත බව වෙයි. වැරදි දෘෂ්ටි ඇති පුද්ගලයාට එය දුරලීමට හරි දෘෂ්ටිය ඇත්තේය. වැරදි කල්පනා ඇති පුද්ගලයාට එය දුරලීමට හරි කල්පනාව ඇත්තේය. වැරදි වචන ඇති පුද්ගලයාට එය දුරලීම පිණිස හරි වචන ඇත්තේය. වැරදි කර්මාන්ත ඇති පුද්ගලයාට එය දුරලීමට හරි කර්මාන්තය ඇත්තේය. වැරදි ජීවිකා ඇති පුද්ගලයාට එය දුරලීමට හරි ජීවිකාව ඇත්තේය. වැරදි ව්‍යායාම ඇති පුද්ගලයාට එය දුරලීමට හරි ව්‍යායාමය ඇත්තේය. වැරදි සිහිය ඇති පුද්ගලයාට එය දුරලීමට හරි සිහිය ඇත්තේය. වැරදි සමාධි ඇති පුද්ගලයාට එය දුරලීමට හරි සමාධිය ඇත්තේය. වැරදි ඥාණ ඇති පුද්ගලයාට එය දුරලීම පිණිස හරි ඥාණය ඇත්තේය. වැරදි විමුක්ති ඇති පුද්ගලයාට එය දුරලීම පිණිස හරි විමුක්තිය ඇත්තේය. ථිනමිද්ධයෙන් වෙළුණු පුද්ගලයා එය දුරලීම පිණිස ථිනමිද්ධ නැති බව ඇත්තේය. නොසංසුන්වූ පුද්ගලයාට එය දුරලීමට සන්සුන් බව ඇත්තේය. විචිකිච්ඡා ඇති පුද්ගලයාට එය දුරලීම පිණිස විචිකිච්ඡා නැති බව ඇත්තේය. ක්‍රොධ ඇති පුද්ගලයාට එය දුරලීමට අක්‍රොධය වෙයි. බද්ධවෛර ඇති පුද්ගලයාට එය දුරලීමට බද්ධවෛර රහිත බව ඇත්තේය. මකු ගුණ ඇති පුද්ගලයාට එය දුරලීමට මකු ගුණ නැති බව ඇත්තේය. යුගග්‍රාහ (උතුමන් හා තමා සමයයි සැලකීම) ඇති පුද්ගලයාට එය දුරලීමට යුගග්‍රාහ රහිත බව ඇත්තේය. ඊර්ෂ්‍යා ඇති පුද්ගලයාට එය දුරලීමට ඊර්ෂ්‍යා රහිත බව ඇත්තේය. මසුරුකම ඇති පුද්ගලයාට එය දුරලීමට නොමසුරු බව ඇත්තේය. කයිරාටිකවූ පුද්ගලයාට එය දුරලීමට කයිරාටික නොවන බවඇත්තේය. රැවටිලි ඇති පුද්ගලයාට එය දුරලීමට රැවටිලි නැති බව ඇත්තේය. තද ගතිය ඇති පුද්ගලයාට

එය දුරලීමට තද ගති රහිත බව ඇත්තේය. අධිකමාන ඇති පුද්ගලයාට එය දුරලීමට අධික මාන නැති බව ඇත්තේය, අකීකරු පුද්ගලයාට එය දුරලීම පිණිස කීකරු බව ඇත්තේය.

**16.** "පවිටු මිතුරන් ඇති පුද්ගලයාට එය දුරලීමට යහපත් මිතුරන් ඇති බව ඇත්තේය. ප්‍රමාදවූ පුද්ගලයාට එය දුරලීමට අප්‍රමාදය ඇත්තේය. ශ්‍රද්ධා නැති පුද්ගලයාට එය දුරලීමට ශ්‍රද්ධා ඇත්තේය. ලජ්ජානැති පුද්ගලයාට එය දුරලීමට ලජ්ජාව ඇත්තේය. භය නැති පුද්ගලයාට එය දුරලීමට පාපයෙහි භය ඇත්තේය. ඇසූ පිරූ තැන් නැති පුද්ගලයාට එය දුරලීම පිණිස ඇසූ පිරූ තැන් ඇති බව ඇත්තේය. කුසීත පුද්ගලයාට එය දුරලීමට නොපසුබට වීර්යය ඇත්තේය. මුළාවූ සිහි ඇති පුද්ගලයාට එය දුරලීමට එළඹ සිටි සිහි ඇති බව ඇත්තේය. ප්‍රඥා නැති පුද්ගලයාට එය දුරලීමට ප්‍රඥාසම්පත්තිය ඇත්තේය. තමන්ගේම දෘෂ්ටිය ගෙන සිටින්නාවූ එම දෘෂ්ටියම තදින් අල්ලාගෙන සිටින්නාවූ එයින් වෙන් කිරීම දුෂ්කරවූ පුද්ගලයාට එය දුරලීම පිණිස තමන්ගේම දෘෂ්ටිය නොගන්නා බව එම දෘෂ්ටියම තදින් අල්ලාගෙන නොසිටින බව එයින් වෙන්කිරීම පහසු බව ඇත්තේය.

**17.** "චුන්දය, යම්සේ යම්කිසි අකුසල ධර්මකෙනෙක් වෙත් නම් ඒ සියල්ල අපාය ආදී පහත් තැනට පමුණු වන්නාහු වෙත්ද, එසේම යම්කිසි කුසල ධර්මකෙනෙක් වෙත් නම් ඒ සියල්ල උසස් බවට පමුණුවන්නාහු වෙත්ද, චුන්දය. එපරිද්දෙන්ම විහිංසාව ඇති පුද්ගලයාට උසස් බව පිණිස අවිහිංසාව ඇත්තේය. ප්‍රාණඝාත කරන පුද්ගලයාට උසස් බව පිණිස ප්‍රාණඝාතයෙන් වෙන්වීම ඇත්තේය.

"නොදුන් දෙය පැහැරගන්නාවූ පුද්ගලයාට උසස් බව පිණිස නොදුන් දෙය ගැනීමෙන් වැළකීම ඇත්තේය. අබ්‍රහ්මචාරී පුද්ගලයාට උසස් බව පිණිස බ්‍රහ්මචරියාව ඇත්තේය. බොරු කියන්නාවූ පුද්ගලයාට උසස් බව පිණිස මුසාවාදයෙන් වැළැක්ම ඇත්තේය. කේළාම් කියන්නාවූ පුද්ගලයාට උසස් බව පිණිස කේළාම් කීමෙන් වැළැක්ම ඇත්තේය. එරුෂවචන කියන්නාවූ

පුද්ගලයාට උසස්බව පිණිස එරුෂ වචනයෙන් වෙන්වීම ඇත්තේය. හිස්වචන කියන්නාවූ පුද්ගලයාට උසස් බව පිණිස හිස් වචන කීමෙන් වෙන්වීම ඇත්තේය. විෂම ලොභ බහුලවූ පුද්ගලයාට උසස් බව පිණිස විෂම ලොභ රහිත බව ඇත්තේය. ව්‍යාපාද සිත් ඇති පුද්ගලයාට උසස් බව පිණිස ව්‍යාපාද රහිත බව වෙයි. වැරදි දෘෂ්ටි ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි දෘෂ්ටිය ඇත්තේය. වැරදි කල්පනා ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි කල්පනාව ඇත්තේය. වැරදි වචන ඇති පුද්ගලයාට උසස්බව පිණිස හරි වචන ඇත්තේය. වැරදි කර්මාන්ත ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි කර්මාන්තය ඇත්තේය. වැරදි දිවි පැවැත්ම ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි දිවි පැවැත්ම ඇත්තේය. වැරදි ව්‍යායාම ඇති පුද්ගලයාට උසස්බව පිණිස හරි ව්‍යායාමය ඇත්තේය. වැරදි සිහිය ඇති පුද්ගලයාට උසස්බව පිණිස හරි සිහිය ඇත්තේය. වැරදි සමාධි ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි සමාධිය ඇත්තේය. වැරදි ඤාණ ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි ඤාණය ඇත්තේය. වැරදි විමුක්ති ඇති පුද්ගලයාට උසස් බව පිණිස හරි විමුක්තිය ඇත්තේය. ථිනමිද්ධයෙන් යුත් පුද්ගලයාට උසස් බව පිණිස ථිනමිද්ධ නැති බව ඇත්තේය. නොසන්සුන් පුද්ගලයාට උසස් බව පිණිස සන්සුන්බව ඇත්තේය. විචිකිච්ඡා ඇති පුද්ගලයාට උසස් බව පිණිස විචිකිච්ඡා නැති බව ඇත්තේය. ක්‍රොධ ඇති පුද්ගලයාට උසස් බව පිණිස ක්‍රොධය නැති බව වෙයි. බද්ධවෛර ඇති පුද්ගලයාට උසස් බව පිණිස බද්ධවෛර රහිත බව ඇත්තේය. මකු ගුණ ඇති පුද්ගලයාට උසස්බව පිණිස මකු ගුණ නැති බව ඇත්තේය. යුගග්‍රාහ (උතුමන් හා තමා සමයයි සැලකීම) ඇති පුද්ගලයාට උසස් බව පිණිස යුගග්‍රාහ රහිත බව ඇත්තේය. ඊර්ෂ්‍යා ඇති පුද්ගලයාට උසස් බව පිණිස ඊර්ෂ්‍යා රහිත බව ඇත්තේය. මසුරුකම ඇති පුද්ගලයාට උසස් බව පිණිස නොමසුරු බව ඇත්තේය.

18. "කයිරාටිකවූ පුද්ගලයාට උසස් බව පිණිස කයිරාටික නොවන බව ඇත්තේය. රැවටිලි ඇති පුද්ගලයාට උසස් බව පිණිස රැවටිලි නැති බව ඇත්තේය. තදගතිය ඇති පුද්ගලයාට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උසස් බව පිණිස තද ගති රහිත බව ඇත්තේය. අධික මාන ඇති පුද්ගලයාට උසස් බව පිණිස අධික මාන නැති බව ඇත්තේය. අකීකරු පුද්ගලයාට උසස් බව පිණිස කීකරුකම ඇත්තේය.

පවිටු මිතුරන් ඇති පුරුෂයාට උසස් බව පිණිස යහපත් මිතුරන් ඇතිබව ඇත්තේය. ප්‍රමාදවූ පුද්ගලයාට උසස් බව පිණිස අප්‍රමාදය ඇත්තේය. ශ්‍රද්ධා නැති පුද්ගලයාට උසස් බව පිණිස ශ්‍රද්ධාව ඇත්තේය. ලජ්ජා නැති පුද්ගලයාට උසස් බව පිණිස ලජ්ජාව ඇත්තේය. භය නැති පුද්ගලයාට උසස් බව පිණිස පාපයෙහි භය ඇත්තේය ඇසූ පිරූ තැන් නැති පුද්ගලයාට උසස් බව පිණිස ඇසූ පිරූ තැන් ඇති බව ඇත්තේය. කුසීත පුද්ගලයාට එය දුරලීමට වීර්‍ය පටන්ගැනීම ඇත්තේය. මුළා සිහි ඇති පුද්ගලයාට උසස් බව පිණිස එළඹ සිටි සිහි ඇති බව ඇත්තේය. ප්‍රඥා නැති පුද්ගලයාට උසස් බව පිණිස ප්‍රඥා සම්පත්තිය ඇත්තේය. තමන්ගේම දෘෂ්ටිය ගෙන සිටින්නාවූ එම දෘෂ්ටියම තදින් අල්ලාගෙන සිටින්නාවූ එයින් වෙන් කිරීම දුෂ්කරවූ පුද්ගලයාට උසස් බව පිණිස තමන්ගේම දෘෂ්ටිය නොගන්නා බව එම දෘෂ්ටියම තදින් අල්ලාගෙන නොසිටින බව එයින් වෙන් කිරීම පහසුබව ඇත්තේය.

**19.** "චුන්දය, පුද්ගලතෙමේ ඒකාන්තයෙන් තමා ගැඹුරු මඩෙහි එරුණෙක්ව ගැඹුරු මඩෙහි එරුණාවූ අනිකෙකු ගොඩගන්නේය. යන මේ කාරණය සිදු නොවන්නකි චුන්දය, පුද්ගල තෙමේ ඒකාන්තයෙන් තමා ගැඹුරු මඩෙහි නො එරුණේ ගැඹුරු මඩෙහි එරුණ අන්‍යයකු ගොඩගන්නේය. යන මේ කාරණය සිදුවන්නකි. චුන්දය, පුද්ගලතෙමේ තමා නොදැමුනේ නොහික්මුනේ කෙලෙස් නැති නොකළේ අන්‍යයා දමනය කරන්නේය. හික්මවන්නේය. කෙලෙස් රහිත කරන්නේය යන මේ කාරණය සිදු නොවන්නකි. චුන්දය, පුද්ගල තෙමේ තමා දැමුනේ හික්මුනේ කෙලෙස් නැසුනේ අන්‍යයා දමනය කරන්නේය. හික්මවන්නේය. කෙලෙස් රහිත කරවන්නේය යන මේ කරුණ සිදුවන්කි. චුන්දය, එපරිද්දෙන්ම විහිංසාව ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස අවිහිංසාව ඇත්තේය.

ප්‍රාණඝාත කරන පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ප්‍රාණඝාත නොකිරීම ඇත්තේය. නුදුන් දෙය ගන්නා පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස නුදුන් දෙය ගැනීමෙන් වෙන්වීම ඇත්තේය. අබ්‍රහ්මචාරී පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස බ්‍රහ්මචර්යාව ඇත්තේය. බොරු කියන පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස බොරු කීමෙන් වැළකීම ඇත්තේය. කේලාම් කියන පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස කේළාම් කීමෙන් වෙන්වීම ඇත්තේය. ඵරුෂ වචන කියන පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ඵරුෂ වචනයෙන් වෙන්වීම ඇත්තේය හිස්වචන කියන පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හිස් වචනයෙන් වෙන්වීම ඇත්තේය. අධික ලොභ ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස අධික ලොභ නැති බව ඇත්තේය.

**20.** "ව්‍යාපාද සිත් ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස අව්‍යාපාදය ඇත්තේය. වැරදි දැකීම් ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරිදැකීම් ඇත්තේය. වැරදි කල්පනා ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි කල්පනාව ඇත්තේය. වැරදි වචන ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි වචනය ඇත්තේය. වැරදි කර්මාන්ත ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි කර්මාන්තය ඇත්තේය. වැරදි ජීවිකා ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි ජීවිකාව ඇත්තේය. වැරදි ව්‍යායාම ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි ව්‍යායාමය ඇත්තේය. වැරදි සිහි ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි සිහිය ඇත්තේය. වැරදි සමාධි ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි සමාධිය ඇත්තේය. වැරදි නුවණ ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි නුවණ ඇත්තේය. වැරදි විමුක්ති ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස හරි විමුක්තිය ඇත්තේය. ථීනමිද්ධයෙන් යට කරණලද පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ථීනමිද්ධ නැති බව ඇත්තේය. නොසන්සුන් පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස සන්සුන් බව ඇත්තේය.

"විචිකිච්ඡා ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස විචිකිච්ඡා නැති බව ඇත්තේය. ක්‍රොධයෙන්, යුත් පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ක්‍රොධ නොකරන බව ඇත්තේය.

"බද්ධවෛර ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස බද්ධ වෛර නැති බව ඇත්තේය. මකු ගුණ ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස මකුගුණ රහිත බව ඇත්තේය. යුගග්‍රාහ ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස යුගග්‍රාහ රහිත බව ඇත්තේය. ඊර්ෂ්‍යා ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ඊර්ෂ්‍යා රහිත බව ඇත්තේය. මසුරුකම ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස මසුරු නොවන බව ඇත්තේය. කයිරාටික පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස කයිරාටික නොවන බව ඇත්තේය. රැවටිලි ඇති පුද්ගලයාට කෙලෙස් නිවීමට නොරැවටිල්ල ඇත්තේය. තද ගති ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස තද ගති නැතිබව ඇත්තේය. අධිකමාන ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස අධිකමාන නැති බව ඇත්තේය. අකීකරු පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස කීකරු බව ඇත්තේය. පාප මිත්‍රයන් ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස යහපත් මිතුරන් ඇති බව ඇත්තේය. ප්‍රමාදවූ පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස අප්‍රමාදය ඇත්තේය. ශ්‍රද්ධා නැති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ශ්‍රද්ධාව ඇත්තේය. ලජ්ජා නැති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ලජ්ජාව ඇත්තේය.

21. "පාපයෙහි භය නැත්තාවූ පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස පාපයෙහි භය ඇත්තේය. ඇසූපිරූ තැන් නැති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ඇත්තේය. කුසීත පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස වීර්ය පටන් ගැනීම ඇත්තේය. මුළා සිහි ඇති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස එළඹ සිටි සිහි ඇති බව ඇත්තේය. ප්‍රඥා නැති පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස ප්‍රඥා සම්පත්තිය ඇත්තේය. තමන්ගේම දෘෂ්ටිය ගෙන සිටින්නාවූ එම දෘෂ්ටියම තදින් අල්ලාගෙන සිටින්නාවූ එයින් වෙන් කිරීම දුෂ්කරවූ පුද්ගලයාට කෙලෙස් නිවීම පිණිස, තමන්ගේ දෘෂ්ටියම නොගන්නාවූ එය තදින් අල්ලානොගන්නාවූ සුවසේ දුරලිය හැකි දෘෂ්ටි ඇති බව එයින් වෙන්කිරීම පහසු බව ඇත්තේය.

22. "චුන්දය, මෙසේ මා විසින් සල්ලෙඛපරියාය (කෙලෙස් කපාදමන ක්‍රමය) දෙශනා කරන ලදී. පරික්කමණ පරියාය

(කෙලෙස් ඉවත් කරන ක්‍රමය) දෙශනා කරන ලදී. උපරිභාව පරියාය (උසස් බවට යාමේ ක්‍රමය) දෙශනා කරන ලදී. පරිනිර්වාණ පරියාය (කෙලෙස් නිවීමේ ක්‍රමය) දෙශනා කරන ලදී.

"චුන්දය, ශ්‍රාවකයන්ට හිතෛෂීවූ අනුකම්පා කරන්නාවූ ශාස්තෘන්වහන්සේ විසින් අනුකම්පා සිතින් යම් කටයුතුද මා විසින් එය තොපට කරනලදී. චුන්දය, මේ වෘක්ෂමූල සෙනාසන ඇත්තාහ. සූන්‍යාගාර ඇත්තාහ, චුන්දය, ධ්‍යාන වඩව් පමා නොවව්, පසුව විපිළිසර නොවව්. මේ තොපට අපගේ අනුශාසනාවයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇති ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේයි.

පද සතළිස් සතරක් වදාරණ ලදී. සන්ධි පසකින් යුක්තව
දෙසන ලදී. ගැඹුරුවූ සාගරය වැනිවූ මේ සූත්‍රාන්තය
සල්ලෙඛ නම් වන්නේය.

(අට වෙනිවූ සල්ලෙඛ සූත්‍රය නිමි)

---

## 9. සම්මා දිට්ඨි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර සමීපයෙහිඅනාථපිණ්ඩික සිටුහුවිසින් කරවන ලද ජෙතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, කියා භික්ෂූන්ට කථා කළහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි කියා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළේය.

2. "ඇවැත්නි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක්දෘෂ්ටිය (හරිදැකීම) යයිකියනු ලැබේ. ඇවැත්නි, ආර්යශ්‍රාවකතෙම කොපමණකින්

සම්‍යක්දෘෂ්ටි ඇත්තේවේද? දෘෂ්ටිය ඍජු බවට පැමිණියාවේද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ ධර්මයට (නිර්වාණධර්මයට) පැමිණියේ වේද? ඇවැත්නි, අපි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් මේ කීමෙහි අර්ථය දැනගන්නට දුරසිටත් එන්නෙමු. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේටම මේ කීමෙහි අර්ථය ප්‍රකාශ කිරීම අයත්වේවා, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් අසා භික්ෂූහු දැනගන්නාහුය. 'ඇවැත්නි, එසේවී නම් අසව් හොඳින් හිතේ තබාගනිව් කියන්නෙමි' 'එසේය ඇවැත්නි, 'කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ.

3. "ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම අකුසලයත් දනීද අකුසලමූලයත් දනීද කුසලයත් දනීද කුසල මූලයත් දනීද ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට ගියා වෙයි ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, අකුසලය කවරේද? අකුසලමූලය කවරේද? කුසලය කවරේද? කුසලමූලය කවරේද? ඇවැත්නි, ප්‍රාණ ඝාතය අකුසල්ය, සොරකම් කිරීම අකුසල්ය, කාමයන්හි වරදවා හැරීම අකුසල්ය, බොරුකීම අකුසල්ය, කේලාම් කීම් අකුසල්ය, ඵරුෂවචන කීම අකුසල්ය, නිෂ්ඵල කථාකීම අකුසල්ය, අධික ලොභය අකුසල්ය, බලවත් ක්‍රොධය අකුසල්ය, වැරදි දෘෂ්ටිය අකුසල්ය, ඇවැත්නි, මේ අකුසලයයි කියනු ලැබේ.

"ඇවැත්නි, අකුසලමූලය කවරේද? ලොභය අකුසල් මූලයි, ද්වේෂය අකුසල්මූලයි, මොහය අකුසල්මූලයි, ඇවැත්නි, මේ අකුසල් මුල්යයි කියනු ලැබේ.

"ඇවැත්නි, කුසලය කවරේද? ප්‍රාණඝාතයෙන් වැළැක්ම කුසල්ය, සොරකම් කිරීමෙන් වැළැක්ම කුසල්ය, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැක්ම කුසල්ය, බොරු කීමෙන් වෙන්වීම කුසල්ය, කේළාම් කීමෙන් වෙන්වීම කුසල්ය, ඵරුෂ වචනයෙන්

වෙන්වීම කුසල්ය, හිස් වචනයෙන් වෙන්වීම කුසල්ය අධික ලොභය නැතිබව කුසල්ය, ව්‍යාපාද නැති බව කුසල්ය, නිවැරදි දැකීම කුසල්ය. ඇවැත්නි, මේ කුසලයයි කියනු ලැබේ.

4. "ඇවැත්නි, කුසල් මුල් කවරේද? අලොභය කුසල් මුලයි, අද්වේෂය කුසල් මුලයි, අමොහය කුසල් මුලයි. ඇවැත්නි, මේ කුසල මුල්යයි කියනු ලැබේ.

"ඇවැත්නි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකතෙම මෙසේ අකුසලය දනීද, අකුසල්මුල් දනීද, කුසලය දනීද, කුසල්මුල් දනීද හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමි යන දැකීම හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ජාතියෙහිදීම දුක් කෙළවර කරන්නන් වෙයි.

"ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවාහුය.

5. "ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

"ඇවැත්නි, ඇත්තේය, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම ආහාරය දනීද, ආහාරයාගේ හේතුව දනීද, ආහාරයාගේ නැතිකිරීම දනීද, ආහාර නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි, ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි

නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

**6.** "ඇවැත්නි, ආහාරය කවරේද? ආහාරයාගේ හෙතුව කවරේද? ආහාරයාගේ නැතිකිරීම කවරේද? ආහාර නැති කිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසද, සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසද පවත්නාවූ ආහාර සතරක් වෙත්. කවර සතරක්ද යත්? සනවූද සියුම් වූද කබලිංකාර ආහාරය (කන බොන ආහාරය) ද, දෙවෙනිවූ ස්පර්ශ ආහාරය (විඳීමට හෙතු වන්නාවූ සිතත් අරමුණත් ගැටීම) ද, තුන්වැනිවූ මනොසංචෙතනා ආහාරය (උත්පත්තියට හේතුවන කර්මය) ද, සතරවැනිවූ විඤ්ඤාණ ආහාරය (නාම රූපයන්ගේ පැවැත්මට හෙතුවූ විඤ්ඤාණය) ද යන සතරය.

"තෘෂ්ණාවගේ හටගැන්ම නිසා ආහාරයෙන් හටගැන්ම වේ. තෘෂ්ණාව නැතිකිරීමෙන් ආහාරයාගේ නැතිකිරීම වෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ආහාර නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරැදි වචනය, නිවරැදි කර්මාන්තය, නිවැරැදි ක්‍රියාව, නිවැරැදි ව්‍යායාමය, නිවැරැදි සිහිය, නිවැරැදි සමාධිය යන මේයි. ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ ආහාරය දනීද, මෙසේ ආහාරයාගේ හෙතුව දනීද, මෙසේ ආහාර නැතිකිරීම දනීද, මෙසේ ආහාර නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ගඥාන විද්‍යාව උපදවාමේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ (වචනය) සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවාහුය.

7. "ඇවැත්නි, යම්ක්‍රමයකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට ආයේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද? ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම දුක දනීද, දුක ඉපදීමට හේතුව දනීද, දුක නැති කිරීම දනීද, දුක නැතිකිරීමට යන මාර්ගය දනීද, මෙපමණකින්ද ඇවැත්නි, ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, දුක කවරේද? දුක් හට ගැන්මට හේතුව කවරේද? දුක නැති කිරීම කවරේද? දුක් නැති කිරීමට යන ප්‍රතිපදාව කවරේද යත්? ඉපදීමද දුකය, දිරීමද දුකය, මරණයද දුකය, ශොකය, වැළපීමය, ශාරීරික දුකය, මානසික දුකය, දැඩි වෙහෙසය යන මොහුද දුකය. කැමතිවන යමක් නොලැබේනම් ඒ ද දුකය. කොටින්ම උපාදානස්කන්ධ පහම දුකය. ඇවැත්නි, මේ දුකයයි කියනු ලැබේ.

8. "ඇවැත්නි, දුක්හටගැන්මට හේතුව කවරේද, නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ බලවත් තෘෂ්ණාව හා එක්ව පවත්නාවූ ඒ ඒ තැන අලෙන්නාවූ යම් මේ තෘෂ්ණාවක්වේද, එනම් කාම තෘෂ්ණාවය (වස්තුකාම ආශාව) භව තෘෂ්ණාව (ශාස්වත දෘෂ්ටිය හා යෙදුණු ආශාව) විභව තෘෂ්ණාව (උච්ඡේද දෘෂ්ටිය හා යෙදුණු ආශාව) යන මොහුය. ඇවැත්නි, මේ දුක් හටගැන්මට හේතුවයයි කියනු ලැබේ. ඇවැත්නි, දුක් නැති කිරීම කවරේද? ඒ තෘෂ්ණාවගේම ඉතිරි නොකොට නැත්කිරීමක් වේද, දුරලීමක්, මිදීමක්, ආලය නොකිරීමක් වේද, ඇවැත්නි, මේ දුක නැතිකිරීමයයි කියනු ලැබේ.

9. "ඇවැත්නි, දුක් නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය

යන මොහුයි. ඇවැත්නි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ දුක දනීද, මෙසේ දුක් ඉපදීමට හේතුව දනීද, මෙසේ දුක් නැතිකිරීම දනීද, මෙසේ දුක් නැතිකිරීමට මාර්ගය දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ද්වේෂය දුරුකොට මම වෙමි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරු කොට අර්හත් මාර්ගඥාන විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේද වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියාද වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළාහුය.

**10.** "ඇවැත්නි, ආර්ය ශ්‍රාවකතෙම යම්සේ සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ අනික් ක්‍රමයක් ඇත්තේද? ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, ආර්ය ශ්‍රාවකතෙම යම් තැනක පටන් ජරා මරණ දෙක දනීද, ජරා මරණයන්ගේ හෙතුව දනීද ජරා මරණයන්ගේ නැති කිරීම දනීද ජරා මරණයන් නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

**11.** "ඇවැත්නි, ජරාමරණය කවරේද? ජරාමරණයට හෙතුව කවරේද? ජරාමරණ නැතිකිරීම කවරේද? ජරාමරණ නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? ඒ ඒ සත්ත්ව වර්ගයෙහි ඒ ඒ සත්ත්වයන්ගේ යම් (දිරීමක්) දිරායන බවක් වේද, දත් ආදිය කැඩීයාමක් වේද, ඉසකේ ආදිය පැසීමක් වේද, රැලිවැටුන සම් ඇති බවක් වේද, ආයුෂයාගේ පිරිහීමක් වේද, ඇස් ආදී

ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද ඇවැත්නී, මේ ජරාවයයි කියනු ලැබේ. ඇවැත්නි, මරණය කවරේද ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව වර්ගයෙන් යම් චුතවීමක් වේද, චුතවන බවක් වේද, ශරීරයාගේ බිඳීමක් වේද, අතුරුදහන් වීමක් වේද මරණයක් වේද කාලක්‍රියාවක් වේද, පංචස්කන්ධයන්ගේ බිඳීමක් වේද, ශරීරය බැහැර දැමීමක් වේද, ඇවැත්නි, මේ මරණයයි කියනු ලැබේ. ඇවැත්නි, මේ ජරාවද මේ මරණයද යන දෙක ජරා මරණයයි කියනු ලැබේ. ජාතිය (ඉපදීම) ඇතිවීමෙන් ජරා මරණයන්ගේ ඇතිවීම වෙයි. ජාතිය නැතිකිරීමෙන් ජරා මරණයන්ගේ නැතිවීම වෙයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයම ජරා මරණයන් නැති කිරීමට යන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

**12.** "ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ ජරාව හා මරණය දනීද, මෙසේ ජරා මරණයන්ගේ හටගැන්ම දනීද, මෙසේ ජරා මරණයන්ගේ නැතිකිරීම දනීද, මෙසේ ජරා මරණ නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ද්වේෂය දුරු කොට මම වෙමි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ගඥාන විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටිවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියාවෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට ආයේ වෙයි.

"ඇවැත්නි, ඉතා මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියාවෙයිද ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ

(නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

13. "ඇවැත්නි, ඇත්තේය. යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම ජාතිය (ඉපදීම) දනීද, ඉපදීමට හෙතුව දනීද, ඉපදීම නැතිකිරීම දනීද, ඉපදීම නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, ජාතිය කවරේද, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙහි යම් ඉපදීමක් වේද, මනාකොට ඉපදීමක් වේද, මව් කුසට පැමිණීමක් වේද, ප්‍රකටව ඉපදීමක් වේද, ස්කන්ධයන්ගේ පහළවීමක් වේද, ආයතනයන්ගේ ලැබීමක්වේද, ඇවැත්නි, මේ ජාතියයි කියනු ලැබේ. කර්මභවය හේතු කොටගෙන ජාතිය ඇතිවේ. කර්මභවය නැති කිරීමෙන් ජාතිය නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ජාතිය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම්. නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් අවස්ථාවක පටන් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ ජාතිය දනීද, මෙසේ ජාතියට හෙතුව දනීද, මෙසේ ජාතිය නැතිකිරීම දනීද, මෙසේ ජාතිය නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව

ආයුෂ්මත් ශරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේවෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

14. "ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම කර්මභවය දනීද, කර්මභවය ඇතිවීමට හේතුව දනීද, කර්මභවය නැතිකිරීම දනීද, කර්මභවය නැති කිරීමට යන මාර්ගය දනීද, ඇවැත්නි, මෙපමණකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, භවය කවරේද, භවය ඇතිවීමට හේතුව කවරේද, භවය නැතිකිරීම කවරේද? භවය නැතිකිරීමට යන මාර්ගය කවරේද, ඇවැත්නි, භවයෝ (කර්මභව උත්පත්ති භව) මේ තුනක් වෙත්. කාමභවය, රූප භවය, අරූප භවය (යන තුනයි) උපාදානයන් (තෘෂ්ණාවෙන් දැඩි ලෙස ගැනීම) හෙතුකොටගෙන භවයන්ගේ හටගැන්ම වේ. උපාදාන නැතිකිරීම භවයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය භවය නැතිකිරීම් මාර්ගය වේ. ඒ කවරේද යත්? නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය. නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ භවය දනීද, මෙසේ භවයාගේ හටගැන්ම දනීද, මෙසේ භවය නැතිකිරීම දනීද, භවය නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරු කොට, මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරු කොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට

පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**15.** "ඇවැත්නි, ඇත්තේය, ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම උපාදානය (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩිකොට අල්ලාගැනීම) දනීද, උපාදාන හේතුව දනීද උපාදාන නැති කිරීම දනීද, උපාදාන නැති කිරීමට යන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, උපාදානය කවරේද? උපාදානයන්ගේ හටගැන්ම කවරේද? උපාදානයන්ගේ නැතිකිරීම කවරේද? උපාදානයන් නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ උපාදාන සතරක් වෙත්. කාම උපාදානය, (ආශාවෙන් දැඩිකොට අල්ලා ගැනීම) දිට්ඨි උපාදානය (දෘෂ්ටියෙන් දැඩි කොට අල්ලා ගැනීම) අත්තවාද උපාදානය (ආත්මයක් ඇතැයි තරයේ ගැනීම) සීලබ්බත උපාදානය (ශාසනයෙන් පිටත ශීලව්‍රත තරයේ ගැනීම) යන සතරයි.

තෘෂ්ණාව හේතු කොටගෙන උපාදානයන්ගේ හටගැන්ම වේ. තෘෂ්ණාව නැතිකිරීමෙන් උපාදාන නැති කිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම උපාදාන නැති කිරීමට යන මාර්ගයයි එනම්: නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම උපාදානය දනීද උපාදාන හටගැන්ම දනීද, උපාදාන නැති කිරීම දනීද උපාදානයන් නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා, මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**16.** "ඇවැත්නි, ඇත්තේය. යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම තණ්හාව දනීද, තණ්හාව ඉපදීමට හේතුව දනීද තණ්හාව නැති කිරීම දනීද, තණ්හාව නැති කිරීමට යන මාර්ගය දනීද ඇවැත්නි, මෙපමණකින්ද, ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටිය ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, තණ්හාව කවරේද? තණ්හාව හටගැන්මට හේතුව කවරේද, තණ්හාව නැති කිරීම කවරේද? තණ්හාව නැති කිරීමට යන මාර්ගය කවරේද?

"ඇවැත්නි, මේ තණ්හාව කොටස් සයක් වෙත්. රූප තණ්හාවය, සද්ද තණ්හාවය, ගන්ධ තණ්හාවය, රස තණ්හාවය, ඵොට්ඨබ්බ තණ්හාවය, ධම්ම තණ්හාවය (යන සයයි)

වෙදනාවගේ හටගැන්මෙන් තණ්හාවගේ හටගැන්මවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැති කිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම තණ්හාව නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම්, නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ තණ්හාව දනීද, මෙසේ තණ්හාව හටගැන්ම දනීද, මෙසේ තණ්හාව නැතිකිරීම දනීද, මෙසේ තණ්හාව නැති කිරීමට යන ප්‍රතිපදාව දනීද හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරු කොට, ක්‍රොධය දුරුකොට, මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි, ඇවැත්නි මෙපමණකින්ද, ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේමේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

17. "ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම වේදනාවත් දනීද, වේදනා හටගැන්මත් දනීද, වේදනා නැතිකිරීමත් දනීද, වේදනා නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවත් දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, වෙදනාව කවරේද? වෙදනාවගේ හටගැන්ම කවරේද? වෙදනාව නැතිකිරීම කවරේද? වෙදනාව නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ වෙදනා කොටස් සයක් වෙත්. ඇස හා ගැටීමෙන් හටගන්නා වේදනාවය, කණ හා ගැටීමෙන් හටගන්නා වේදනාවය, නාසය හා ගැටීමෙන් හටගන්නා වේදනාවය, දිව හා ගැටීමෙන් හටගන්නා වේදනාවය, ශරීරය හා ගැටීමෙන් හටගන්නා වේදනාවය, හිත හා ගැටීමෙන් හටගන්නා වේදනාවය (යන සයය) ස්පර්ශය (අරමුණු ගැටීම) හෙතුකොටගෙන වේදනාව හටගැන්ම වේ. ස්පර්ශය නැතිකිරීමෙන් වෙදනා නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම වෙදනා නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම්: නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ වේදනාව දනීද, මෙසේ වේදනාවගේ හටගැන්ම දනීද, මෙසේ වේදනා නැතිකිරීම දනීද, මෙසේ වේදනා නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනිද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය.

"ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ

(නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද? ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනකපටන් ආර්ය ශ්‍රාවකතෙම ස්පර්ශයත් දනීද, ස්පර්ශයාගේ හටගැන්මත් දනීද, ස්පර්ශය නැතිකිරීමත් දනීද, ස්පර්ශය නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාවත් දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි. (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

18. "ඇවැත්නි, ස්පර්ශය කවරේද? ස්පර්ශයාගේ හටගැන්ම කවරේද? ස්පර්ශය නැතිකිරීම කවරේද? ස්පර්ශය නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ ස්පර්ශ කොටස් සයක් වෙත්. ඇස හා ස්පර්ශය, කණ හා ස්පර්ශය, නාසය හා ස්පර්ශය, දිව හා ස්පර්ශය, ශරීරය හා ස්පර්ශය, හිත හා ස්පර්ශය යන සයයි. ආයතන (ඇස ආදී ඉන්ද්‍රිය හය) හටගැන්මෙන් ස්පර්ශයන්ගේ හටගැන්ම වේ. ආයතන හය නැතිකිරීමෙන් ස්පර්ශයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ස්පර්ශය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවය. එනම්. නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ ස්පර්ශය දනීද, මෙසේ ස්පර්ශය හටගැන්ම දනීද, ස්පර්ශය නැති කිරීම දනීද, ස්පර්ශය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට මම වෙමි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියාවෙයි ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

19. "ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය ශ්‍රාවකතෙම ආයතන දනීද, ආයතනයන්ගේ හටගැන්ම දනීද, ආයතන නැතිකිරීම දනීද, ආයතන නැති කිරීමට යන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි මෙපමණකින්ද ආර්‍ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, සය ආයතනය කවරේද? සය ආයතනයන්ගේ හටගැන්ම කවරේද? සය ආයතනයන්ගේ නැතිකිරීම කවරේද? සය ආයතනයන් නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ ආයතන සයක් වෙත්. චක්ඛු ආයතනය සොත ආයතනය, ඝාණ ආයතනය, ජිව්හා ආයතනය, කාය ආයතනය, මනො ආයතනය (යන හයයි.) නාමරූපයන්ගේ (රූප, වෙදනා සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පහේ) හටගැන්මෙන් සය ආයතනයන්ගේ හටගැන්ම වේ. නාමරූපයන් නැතිකිරීමෙන් සය ආයතනයන්ගේ නැති කිරීම වේ මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයම සය ආයතනය නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම්: නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය ශ්‍රාවකතෙම මෙසේ සය ආයතන දනීද, මෙසේ සය ආයතනයන්ගේ හටගැන්ම දනීද, මෙසේ සය ආයතනයන්ගේ නැතිකිරීම දනීද, මෙසේ සය ආයතන නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙතෙම

සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්යෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, 'ඉතා මැනවැයි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**20.** "ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම නාම රූප දෙක දනීද, නාම රූප හටගැන්ම දනීද, නාම රූපයන් නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි නාමරූප කවරේද? නාමරූපයන්ගේ හට ගැන්ම කවරේද? නාමරූපයන්ගේ නැතිකිරීම කවරේද? නාමරූපයන් නැතිකිරීමේ ප්‍රතිපදාව කවරේද? වේදනා (විඳීම) ය, සංඥා (හැඟීමය) ය, චෙතනා (මෙහෙයීම) ය, ස්පර්ශ (ගැටීම) ය, මනසිකාර (මෙනෙහිකිරීම) ය යන මේ ධර්ම ඇවැත්නි, නාමයයි කියනු ලැබේ.

"මහා භූත රූප හතර (පස් දිය ගිනි සුළං) ද ඒ සතර මහා භූතයන් නිසා පවත්නාවූ උපාදාය රූපද යන මෙය ඇවැත්නි, රූපයයි කියනු ලැබේ. මෙසේ මේ නාමයද මේ රූපයද ඇවැත්නි,

නාමරූපයයි කියනු ලැබේ. ප්‍රතිසන්ධිවිඥානයාගේ (පිළිසිඳ ගැනීම පිළිබඳ විඤ්ඤාණය) හටගැන්මෙන් නාමරූපයන්ගේ හටගැන්ම වේ. විඥානය නැතිකිරීමෙන් නාමරූපයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම නාමරූපයන් නැතිකිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ නාමරූපයන් දනීද, මෙසේ නාමරූපයන්ගේ හටගැන්ම දනීද මෙසේ නාමරූපයන්ගේ නැතිකිරීම දනීද මෙසේ නාමරූපයන් නැතිකිරිමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්ව ප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

"ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවැයි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය.

"ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල් වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**21.** "ඇවැත්නි, ඇත්තේය, ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම විඤ්ඤාණය දනීද, විඤ්ඤාණයාගේ හටගැන්ම දනීද, විඤ්ඤාණයාගේ නැතිකිරීම දනීද, විඥානය නැති කිරීමට යන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි, මෙපමණකින්ද

ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, විඤ්ඤාණය කවරේද? විඤ්ඤාණයාගේ හටගැන්ම කවරේද? විඤ්ඤාණය නැතිකිරීම කවරේද? විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි මේ විඤ්ඤාණ කොටස් සයක් වෙත්. චක්ඛුවිඤ්ඤාණය, සොතවිඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, ජිව්හාවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය, මනො විඤ්ඤාණය. (යන සයයි) සංස්කාරයන්ගේ හටගැන්මෙන් විඤ්ඤාණයන්ගේ හටගැන්ම වේ. සංස්කාරයන්ගේ නැති කිරීමෙන් විඤ්ඤාණයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ විඤ්ඤාණය දනීද, විඤ්ඤාණයාගේ හටගැන්ම දනීද, විඤ්ඤාණය නැතිකිරීම දනීද, විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද හෙතෙම සර්ව ප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරු කොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. අවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි

ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**22.** "ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම සංස්කාරයන් (කුසලා කුසල කර්ම) දනීද, සංස්කාරයන්ගේ හටගැන්ම දනීද, සංස්කාරයන්ගේ නැතිකිරීම දනීද, සංස්කාරයන් නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, සංස්කාර කවරේද? සංස්කාරයන්ගේ හටගැන්ම කවරේද? සංස්කාරයන්ගේ නැතිකිරීම කවරේද? සංස්කාරන් නැතිකිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ සංස්කාරයෝ තිදෙනෙක් වෙත්. කාය සංඛාරය (කයින් කරන කර්ම) වචී සංඛාරය (වචනයෙන් කරන කර්ම) මනො සංඛාරය (සිතින් කරන කර්ම) යන තුනයි. අවිද්‍යාවගේ හටගැන්මෙන් සංස්කාරයන්ගේ හටගැන්ම වේ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාරයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම සංස්කාරයන් නැතිකිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ සංස්කාරයන් දනීද මෙසේ සංස්කාරයන් හටගැන්ම දනීද මෙසේ සංස්කාරයන්ගේ නැතිකිරීම දනීද මෙසේ සංස්කාරයන් නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

"ඇවැත්නි, මෙපමණකින්ද, ආර්ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහිනොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

23. "ඇවැත්නි, ඇත්තේය ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම අවිද්‍යාවත් දනීද, අවිද්‍යාව නැති කිරීමත් දනීද, අවිද්‍යාව නැති කිරිමේ ප්‍රතිපදාවත් දනීද, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි. නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, අවිද්‍යාව කවරේද? අවිද්‍යාවට හේතුව කවරේද? අවිද්‍යාව නැති කිරීම කවරේද? අවිද්‍යාව නැති කිරීමේ ප්‍රතිපදාව කවරේද?

"ඇවැත්නි, දුක පිළිබඳ යම් නොදැන්මක් වේද, දුක හටගැනීමට හේතුව පිළිබඳ යම් නොදැන්මක් වේද, දුක නැතිකිරීම පිළිබඳ යම් නොදැන්මක් වේද, දුක නැතිකිරීමේ ප්‍රතිපදාව පිළිබඳ යම් නොදැන්මක් වේද ඇවැත්නි, මේ නොදැන්ම අවිද්‍යාවයයි කියනු ලැබේ. ආශ්‍රවයන් (බොහෝ කල් සිට පැවත එන කෙලෙස්) හෙතුකොටගෙන අවිද්‍යාවගේ හටගැන්ම වේ. ආශ්‍රවයන් නැති කිරීමෙන් අවිද්‍යාව නැති වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම අවිද්‍යාව නැති කිරීමේ ප්‍රතිපදාවයි එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි

වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ අවිද්‍යාව දනීද, මෙසේ අවිද්‍යාවට හේතුව දනීද, මෙසේ අවිද්‍යාව නැතිකිරීම දනීද, මෙසේ අවිද්‍යාව නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයි ධර්මයෙහි නොසෙල් වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවැයි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය.

ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය සෘජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ නිර්වාණ ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**24.** "ඇවැත්නි, ඇත්තේය, ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවක තෙම ආශ්‍රවයන් (බොහෝ කල් සිට පැවත එන කෙලෙස්) දනීද, ආශ්‍රවයන්ට හේතුවත් දනීද, ආශ්‍රවයන්ගේ නැතිකිරීමත් දනීද, ආශ්‍රවයන් නැතිකිරීමේ ප්‍රතිපදාවත් දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

"ඇවැත්නි, ආශ්‍රවයෝ කවරහුද? ආශ්‍රවයන්ට හෙතුව කවරේද? ආශ්‍රවයන් නැතිකිරීම කවරේද? ආශ්‍රවයන් නැති කරන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ ආශ්‍රව තුනක් වෙත්. කාමාශ්‍රවය (කාම

තණ්හාව,) භවාශ්‍රවය (භව තණ්හාවය,) අවිද්‍යාශ්‍රවය (මොහය) යන තුනයි. අවිද්‍යාව හේතුකොටගෙන ආශ්‍රවයන්ගේ හටගැන්ම වේ. අවිද්‍යාව නැති කිරීමෙන් ආශ්‍රවයන්ගේ නැති කිරීම වේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ආශ්‍රවයන් නැති කිරීමේ ප්‍රතිපදාව වෙයි. එනම්: නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකතෙම මෙසේ ආශ්‍රවයන් දනීද, ආශ්‍රවයන්ගේ හටගැන්මත් දනීද, ආශ්‍රව නැතිකිරීමත් දනීද, ආශ්‍රව නැතිකිරීමේ ප්‍රතිපදාවත් දනීද, හෙතෙම සර්ව ප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරු කොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරු කොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

"ඇවැත්නි, මෙපමණකින්ද ආර්ය ශ්‍රාවකතෙමේ සම්‍යක් දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටි සෘජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි."

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය වදාළහ. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය ඉතා සතුටින් පිළිගත්තාහුය.

(නව වැනිවූ සම්මාදිට්ඨි සූත්‍රය නිමි)

---

## 10 සතිපට්ඨාන සූත්‍රය

1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු ජනපදයෙහි කල්මාසදම්‍ය නම්වූ කුරු රට වැස්සන්ගේ නියම් ගම වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට, "මහණෙනි"යි කථා කළෝය. භික්ෂූහු

"ස්වාමීන් වහන්සැ"යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළාහුය.

"මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන ධර්ම කෙතෙක් ඇද්ද ඒ සතර සතිපට්ඨාන ධර්මයෝ සත්ත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, සෝක කිරීමය, වැළපීමය යනාදීන්ගේ ඉක්මවීම පිණිසද, කයෙහි හටගන්නා දුක්ය. සිතෙහි හටගන්නා දුක්ය, යන මොවුන්ගේ දුරලීම පිණිසද ඤායය නම් ලද ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය අවබොධ කිරීම පිණිසද එකම මාර්ගය වන්නේයයි" දේශනා කළාහුය.

"ඒ සතර (සතිපට්ඨාන ධර්මයෝ) කවරහුද යත්? මහණෙනි, මේ සස්නෙහි මහණ තෙම කෙලෙස් තවන වීර්ය ඇතුව යහපත් ප්‍රඥා ඇතුව, සිහියෙන් යුක්තව මේ ශරීරයෙහි ලෝභයද, ක්‍රොධයද සිංසිඳුවාගෙන, මේ ශරීරයෙහි ශරීරය අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, කෙලෙස් තවන වීර්ය ඇතුව, යහපත් ප්‍රඥා ඇතුව සිහි ඇතුව විඳීම් රාශියෙහි, ලෝභය හා දොම්නස (ක්‍රොධය) සංසිඳුවාගෙන විඳීම් කෙරෙහි විඳීම් අනුව දක්නා ස්වභාව ඇතිව වාසයකෙරේද, කෙලෙසුන් තවන වීර්ය ඇතුව යහපත් ප්‍රඥා ඇතුව සිහි ඇතුව සිත් සමූහයෙහි ලෝභය හා දොම්නස (ක්‍රොධය) සංසිඳුවාගෙන සිත් කෙරෙහි සිත් අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, කෙලෙසුන් තවන වීර්ය ඇතිව, සිහි ඇතිව යහපත් ප්‍රඥා ඇතිව, නීවරණාදී ධර්ම රාශියෙහි ලෝභය හා දොම්නස (ක්‍රොධය) සංසිඳුවාගෙන නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව සිහි කරමින් වාසය කෙරේද (මේ සතර සතිපට්ඨාන ධර්මයෝ නම් වෙත්)

**2.** "මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කැලයකට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පර්යංකය බැඳ (අරමිනිය ගොතා ගෙන) ශරීරය කෙළින් පිහිටුවා ගෙන සිහිය ඉදිරිපත් කොට තබා ගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය, සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය, දීර්ඝ කොට (කල්

ගනිමින් හෙමින් හෙමින්) ආශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට (කල් ගනිමින්) ආශ්වාස කරන්නෙමි'යි දන්නේය. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය ලුහුඬු කොට (ඉක්මණින්) ආශ්වාස කරන්නේ හෝ 'ලුහුඬු කොට ආශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නේ හෝ 'ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නෙමියි' දන්නේය. මුල මැද අග යන සියලු ආශ්වාසය ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. මුල මැද අග යන සියලු ප්‍රශ්වාසය දැන ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය.

"මහණෙනි, දක්‍ෂවූ ලියන වඩුවෙක් හෝ ලියන වඩුවෙකුගේ අතවැස්සෙක් හෝ දික් කොට අදින්නේ හෝ දික් කොට අදින්නෙමියි කියා යම්සේ දනීද, ලුහුඬුව අදින්නේ හෝ එසේ ලුහුඬු කොට අදින්නෙමියි කියා යම්සේ දනීද, එපරිද්දෙන්ම මහණෙනි, මහණ තෙමේ දීර්ඝ කොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය. ලුහුඬුකොට ආශ්වාස කරන්නේ හෝ ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. ලුහුඬුකොට ප්‍රශ්වාස කරන්නේ හෝ ලුහුඬු කොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය. මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස දැන ගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. මුල මැද අග යන සියලු ප්‍රශ්වාස දැනගනිමි යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය. සියලු ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමි. යන අදහසින් ප්‍රශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය.

මෙසේ තමාගේ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ආශ්වාස ප්‍රශ්වාස ශරීරයෙහි හෝ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරය අනුව නුවණින් බලමින් වාසය කරන්නේය. අනුන්ගේ හා තමන්ගේ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරයෙහි හෝ (ආශ්වාස ප්‍රශ්වාස) ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ හටගැනීම බලමින් හෝ වාසය කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නැතිවීම බලමින් හෝ වාසය කරන්නේය. කලෙක හටගැනීම, කලෙක විනාශය බලමින් හෝ වාසය කරන්නේය. මොහුට සත්ව පුද්ගල නොවූ ආශ්වාස ප්‍රශ්වාස කය පමණක් ඇත්තේය යන සිහිය එළඹ සිටියා වෙයි. එය ඥානය වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද වෙයි. තණ්හා දෘෂ්ටි දෙකින් දුරුව වසන්නේද වේ. එහෙයින් සත්ව ලෝකයෙහි, කිසි රූපාදියක් (ආත්මාදි වශයෙන්) නොගන්නේය. මහණෙනි, මෙසේද මහණතෙම ශරීරයෙහි, ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.”

3. “මහණෙනි, නැවතද මහණ තෙම යන්නේ හෝ යන්නෙමියි දන්නේය. සිටියෝ හෝ සිටියෙමියි දන්නේය. හුන්නේ හෝ හුන්නෙමියි දන්නේය. ශයනය කරන්නේ හෝ ශයනය කරන්නෙමියි දන්නේය. ඔහුගේ කය වනාහි යම් යම් ඉරියව්වකින් පිහිටුවනලදද ඒ ඒ ආකාරයෙන් දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි හටගන්නා ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි හටගන්නා ස්වභාව හා කලෙක විනාශවීම් ස්වභාව දන්නේ හෝ වාසය කරන්නේය. ඒ භික්ෂුවට වනාහි (සත්වයෙක් පුද්ගලයෙක් නොවූ) ශරීර ඉරියව් පමණක් ඇත්තේය, කියා සිහිය එළඹසිටියේ වෙයි. එය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද වෙයි. තණ්හා දෘෂ්ටි දෙකින්

(දුරුව) වාසය කරන්නේය. මේ සත්ව ලෝකයෙහි කිසි රූපාදියක් (ආත්මාදි වශයෙන්) නොගනියි මහණෙනි, භික්ෂු තෙම මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

4. "මහණෙනි, නැවතද මහණ තෙමේ ඉදිරියට යාමෙහිද ආපසු ඒමෙහිද සිහියෙන් දැන කරන්නේ වෙයි. ඉදිරිපිට බැලීමෙහිද සරස බැලීමෙහිද ප්‍රඥාවෙන් දැන කරන්නේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද ප්‍රඥාවෙන් දැන කරන්නේය පාත්‍රා, දෙපට සිවුරු තනිපට සිවුරු දැරීමෙහිද ප්‍රඥාවෙන් දැන දරන්නේය. අනුභව කිරීමෙහිද පානය කිරීමෙහිද, කඩාකෑමෙහිද රස බැලීමෙහිද නුවණින් දැන කරන්නේය. මළමුත්‍ර පහකිරීමෙහිද නුවණින් දැන කරන්නේය. යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදීමෙහිද, නිදි දුරුකිරීමෙහිද, කථා කිරීමෙහිද, කථා නොකිරීමෙහිද, ප්‍රඥාවෙන් දැන ඒ ඒ කෘත්‍ය පවත්වන්නේ මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ හෝ ශරීරයෙහි ඇතිවීම බලමින් හෝ වාසය කරන්නේය. විනාශය බලමින් හෝ වාසය කරන්නේය. කලෙක ඉපදීම කලෙක නැතිවීම බලමින් හෝ වාසය කරන්නේය. මේ යෝගාවචරයාහට වනාහි සත්වයෙක් පුද්ගලයෙක් නොවූ කය පමණක් ඇත්තේයයි සිහිය එළඹ සිටියේ වෙයි, (ඒ සිහිය) ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුව වාසය කරන්නේය. ශරීර ලෝකයෙහි කිසිවක් ආත්ම වශයෙන් නොගන්නේය. මහණෙනි, භික්ෂුව මෙසේද මේ කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේය.

5. "නැවතද මහණෙනි, මහණ තෙම පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නානාවිධ අසුචියෙන් පිරිසිටි මේ ශරීරයම සිහි කරන්නේය. (කෙසේදයත්) මේ ශරීරයෙහි හිසකෙස්ය, ලොම්ය, නියපොතුය, දෙතිස් දත්ය, හමය, මස්පිඩුය, නහරය, ඇටය, ඇටමිදුලුය, වකුගඩුවය, හෘදයමාංශයය, අක්මාවය, දළබුවය, බඩදිවය, පෙණහැලිය,

බඩවැලය, අතුණුබහණය, නොදිරූ ආහාරය, මලය, හිස්මොලය පිතය, සෙමය, සැරවය, ලෙහෙය, ඩහදියය, මේද තෙලය, කඳුලුය, වුරුණු තෙලය, කෙලය, සොටුය, සඳමිදුලුය, මුත්‍රය (යන මේ කුණපයෝ) ඇත්තාහ.

මහණෙනි, නොයෙක් ආකාරවූ ධාන්‍යයන්ගෙන් පුරවනලද උඩ යට දෙපැත්තෙන් කටවල් දෙකක් ඇති මල්ලක් වේද, කිනම් ධාන්‍යවලින් යුත් මල්ලක්ද යත්? හැල්වීය, මහවීය, මුංය, මෑය, තලය, සහල්ය, (යන මේ ධාන්‍යවලිනි.) ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල ලිහා මේ හැල්ය, මේ මහ වීය, මේ මුංය, මේ මෑය, මේ තලය, මේ සහල්යයි යම්සේ මෙනෙහි කරන්නේද එපරිද්දෙන්ම මහණෙනි, මහණ තෙම පාදයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති නොයෙක් ආකාර අසුචිවලින් පිරුණාවූ මේ ශරීරයම සිහි කරන්නේය. ඒ කෙසේදයත්: හිසකෙස්ය, ලොම්ය, නියපොතුය, දත්ය, සමය, මස්පිඩුය, නහරය, ඇටය ඇට මිදුළුය, වකුගඩුය, හෘදයමාංශය, අක්මාවය දළබුවය, බඩදිවය, පෙණහැලිය, අතුණුය. අතුණුබහන්ය, නොපැසුණු ආහාරය, මලය, හිස්මොලය, පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සඳමිදුලුය, මුත්‍රය, (යන මේ කුණපයෝ) මේ ශරීරයෙහි ඇත්තාහ. කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඉපදීම් ස්වභාවය අනුව බලමින් හෝ වාසය කරන්නේය. ශරීරයෙහි විනාශවීම් ස්වභාවය අනුව බලමින් හෝ වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව හෝ අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්වයෙක් පුද්ගලයෙක් නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියේ වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. තණ්හා දෘෂ්ටි දෙදෙනෙ ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලෝකයෙහි

කිසිවක් ආත්මාදී වශයෙන් නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

6. "මහණෙනි, නැවතද භික්ෂුව යම් ඉරියව්වකින් සිටියාවූද යම් ආකාරයකින් තබන ලද්දාවූද මේ ශරීරය ධාතු වශයෙන් සිහිකරන්නේය. මේ ශරීරයෙහි පෘථිවි ධාතුව (තද ගතිය) ඇත්තේය. ආපෝ ධාතුව (බැඳීම් ගතිය) ඇත්තේය. තේජෝ ධාතුව (උණු ගතිය) ඇත්තේය. වායො ධාතුව (පිම්බීම් ගතිය) ඇත්තේය කියායි.

"මහණෙනි, යම්සේ දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ, ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගවයකු මරා සතර මංසන්ධියක කොටස් වශයෙන් වෙන් වෙන් කොට බෙදා උන්නේද, එපරිද්දෙන්ම මහණෙනි, භික්ෂුව මේ ශරීරය ධාතු වශයෙන් සිහිකරන්නේය කෙසේදයත්? මේ ශරීරයෙහි පඨවි ධාතුව, ආපෝ ධාතුව, තෙජො ධාතුව, වායො ධාතුව ඇත්තේය කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයාගේ ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයාගේ නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ධාතු මාත්‍රවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියේ වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. හෙතෙම තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

7. "මහණෙනි, නැවතද භික්ෂුව, මැරී එක දවසක් ගියාවූ හෝ දෙදවසක් ගියාවූ හෝ තුන්දවසක් ගියාවූ හෝ ඉදිමුනාවූ

නිල්වූ සැරව වැගිරෙන්නාවූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දකින්නේද ඒ භික්ෂුව තම ශරීරය ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. කෙසේද? මේ ශරීරය මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳුවූ ස්වභාවයකට පැමිණෙන්නේය. මෙබඳුවූ ස්වභාව නොඉක්ම සිටියේය කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය පිහිටියේ වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. ලෝකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

8. "මහණෙනි, නැවතද භික්ෂුව කවුඩන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ උකුසන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ ගිජුලිහිණියන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ බල්ලන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ හිවලුන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ නොයෙක් සතුන් විසින් කඩාකනු ලබන්නාවූ හෝ අමු සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද ඒ භික්ෂුව විසින් තමාගේ ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. කෙසේදයත්? මේ ශරීරයද මෙබඳුවූ ස්වභාව ඇත්තේය. මෙබඳුවූ ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳුවූ ස්වභාවය නොඉක්ම සිටියේය කියාය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි විනාශවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්වයෙක් පුද්ගලයෙක් නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය මනාකොට පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. හෙතෙම තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනියි. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

**9.** "මහණෙනි, නැවතද භික්ෂුව ලේ මස් සහිතවූ නහරවලින් බැඳුනාවූ ඇටසැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළමිනියක් යම්සේ දක්නේ වේද, ඒ භික්ෂුව මේ ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. කෙසේදයත්? මේ (මගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි.

ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. හෙතෙම තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොගනියි. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

"මහණෙනි, නැවතද භික්ෂුව මස් නැති ලෙයින් වැකුණු නහරින් බැඳුන ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව මේ (තම) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

"මහණෙනි, නැවතද භික්ෂුව මස් ලේ දෙකින් පහවූ නහරින් බැඳුන ඇටසැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව මේ (තම) ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය

කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

"මහණෙනි, නැවතද භික්ෂුව නහර බැඳුම්වලින් වෙන්වූ දිශා අනුදිශාවන්හි විසුරුණු ඇට කැබලිද, වෙන දිශාවක විසිරුණු පාඇටද, වෙන දිශාවක විසුරුණු කෙණ්ඩා ඇටද, වෙන දිශාවක විසුරුණු කලවා ඇටද, වෙන දිශාවක විසුරුණු කටී ඇටද, වෙන දිශාවක විසුරුණු පිටකටුද, වෙන දිශාවක විසුරුණු හිස්කැබලිද ඇතිව සොහොනෙහි දමනලද මළමිනිය යම්සේ දකීද,ඒ භික්ෂුව (තම) ශරීරය ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවන ලද්දේය. කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියාවෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

**10.** "මහණෙනි, නැවතද භික්ෂුව සක්ගෙඩියක පාටට සමාන ස්වභාව ඇති සුදුවූ ඇට ඇත්තාවූ සොහොනෙහි දමන ලද මළ මිනියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව (තම) ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාවය නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි හටගන්නා ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාවද කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාවද දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී තෘෂ්ණාදෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය,

"මහණෙනි, නැවතද භික්ෂුව අවුරුදු ගණන් ඉක්මගිය ඇට ගොඩක්වූ සොහොනෙහි දමනලද මළ මිනියක් යම්සේ දක්නේද,

ඒ භික්ෂුව (තමා) ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාවය නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාවය දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක් ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

"මහණෙනි, නැවතද භික්ෂුව කුණුවූ, සුණුවූ ඇට කැබලිවලට පැමිණි සොහොනෙහි දමනලද මළමිණියක් යම්සේ දක්නේද, ඒ භික්ෂුව (තම) ශරීරයද ඒ ශරීරය හා සසඳා නුවණින් බලන්නේය. මේ (මාගේ) ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාවය නොඉක්මවන ලද්දේය කියායි. මෙසේ තමන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

කලෙක ශරීරයෙහි ඇතිවීම් ස්වභාව හා කලෙක ශරීරයෙහි නැතිවීම් ස්වභාව දක්නේ හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ ශරීරය පමණක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි, ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම් පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රය කොට නොගෙන වාසය කරන්නේය. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද ශරීරයෙහි හෝ ශරීරය අනුව බලමින් වාසය කරන්නේය.

11. "මහණෙනි, කෙසේ නම් භික්ෂුව විඳීම් කෙරෙහි විඳීම් අනුව බලමින් වාසය කරන්නේද? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව සැප වේදනාවක් විඳින්නේ, සැප වේදනාවක් විඳීමියි දැනගනී. දුක් වේදනාවක් විඳින්නේ, දුක් වේදනාවක් විඳිමියි දැනගනී. දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳින්නේ දුක්ද නොවූ, සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ සැප වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ සැප වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවූ සැප වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවූ සැප වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ දුක් වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ දුක් වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවූ දුක් වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවූ දුක් වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳවූ දුක්ද නොවූ සැපද නොවූ (උපෙක්ෂා) වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳවූ දුක් නොවූ සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. කාමාසාවන් පිළිබඳ නොවන දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳින්නේ හෝ කාමාසාවන් පිළිබඳ නොවන දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳිමියි දැනගනී. මෙසේ තමන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳීම් අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳීම්, අනුව බලමින් වාසය කරන්නේය තමන්ගේ හා අනුන්ගේ විඳීම් කෙරෙහි හෝ විඳීම් අනුව බලමින් වාසය කරන්නේය. වේදනාවන්හි ඇතිවීම් ස්වභාව දක්නේ හෝ වේදනාව අනුව බලමින් වාසය කරන්නේය. වේදනාවන්හි නැතිවීම් ස්වභාව දක්නේ හෝ වේදනා අනුව බලමින් වාසය කරන්නේය. කලෙක වේදනාවන්හි

ඇතිවීම් ස්වභාව හා කලෙක වේදනාවන්හි නැතිවීම් ස්වභාව දක්නේ හෝ වේදනා අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්ව පුද්ගල නොවූ වේදනා (විඳීම්) ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. මේ ලෝකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද විඳීම් අනුව බලමින් වාසය කරන්නේය.

**12.** "මහණෙනි, භික්ෂුව කෙසේනම් සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේදයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ සරාග (අටවැදෑරුම් ලොභ සහගත) සිත හෝ රාගසහිත සිතයයි දැනගනී. වීතරාග (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ වීතරාග සිතයයි දැනගනී. සදොස (දෙවදෑරුම් දොසමූල) සිත හෝ සදොස සිතයයි දැනගනී. වීතදොස (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ වීතදොස සිතයයි දැනගනී. සමොහ (දෙවැදෑරුම්) මෝහමූලවූ හෝ දොළොස් අකුසල්වූ) සිත හෝ සමොහ සිතයයි දැනගනී. වීතමොහ (ලෞකික කුසල් විපාක ක්‍රියා) සිත හෝ වීත මොහ සිතයයි දැනගනී. සංඛිත්ත (ථීනමිද්ධයන් - චිත්ත චෛතසිකයන්ගේ ගිලන් ස්වභාවය - හා යෙදුණ) සිත හෝ සංඛිත්ත සිතයයි දැනගනී. වික්ඛිත්ත (උද්ධච්චය - සිතේ විසිරයාම - හා යෙදුණ) සිත හෝ වික්ඛිත්ත සිතයයි දැනගනී. මහග්ගත (රූපාවචර අරූපාවචර) සිත හෝ මහග්ගත සිතයයි දැනගනී. අමහග්ගත (කාමාවචර) සිත හෝ අමහග්ගත සිතයයි දැන ගනී. සඋත්තර (කාමාවචර) සිත හෝ සඋත්තර සිතයයි දැනගනී. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත හෝ අනුත්තර සිතයයි. දැනගනී. සමාහිත (අපර්ණා සමාධි උපචාර සමාධියෙන් යුත්) සිත හෝ සමාහිත සිතයයි දැනගනී. අසමාහිත (අර්පණා සමාධි උපචාර සමාධියෙන් තොරවූ) සිත හෝ අසමාහිත සිතයයි දැනගනී. විමුක්ත (තදඞ්ග විෂ්කම්භන විමුක්තීන්ගෙන් මිදුණ) සිත විමුක්ත සිතයයි දැනගනී, අවිමුත්ත (තදඞ්ග විෂ්කම්භන විමුක්තීන්ගෙන් නොමිදුණු) සිත හෝ අවිමුත්ත සිතයයි දැන ගනී.)

මෙසේ තමාගේ සිත කෙරෙහි හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ සිත කෙරෙහි හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. තමන්ගේ හා අනුන්ගේ සිත කෙරෙහි හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය සිතෙහි ඉපදීම් ස්වභාව දක්නේ හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. විනාශවීම් ස්වභාව දක්නේ හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. කලෙක ඉපදීම හා කලෙක විනාශවීම දක්නේ හෝ සිත අනුව බලමින් වාසය කරන්නේය. ඔහුට සත්ව පුද්ගල නොවූ සිත ඇත්තේය යන සිහිය හොඳින් පිහිටියා වෙයි. ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. ඒ භික්ෂුව තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ආශ්‍රයකොට නොගෙන වාසය කෙරේ. මේ ලොකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, භික්ෂුව මෙසේද සිත කෙරෙහි සිත අනුව බලමින් වාසය කරන්නේය.

13. "මහණෙනි, භික්ෂුව කෙසේනම් ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව පංචනීවරණ ධර්මයන් (කුසල් ආවරණය කරන කෙලෙස් පස) කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. මහණෙනි, භික්ෂුව පංචනීවරණ ධර්මයන් කෙරෙහි (ඒ නීවරණ) ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කෙරේද? මේ ශාසනයෙහි භික්ෂුව තමා කෙරෙහි ඇත්තාවූ හෝ කාමච්ඡන්දය (පස්කම් සැපයෙහි ආසාව) මා තුළ කාමච්ඡන්දය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ කාමච්ඡන්දය, මා තුළ කාමච්ඡන්දය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, ඒ කාරණයත් දැනගනී. යම් කරුණකින් උපන්නාවූ කාමච්ඡන්දයාගේ දුරුකිරීම් වන්නේද ඒ කාරණයද, දැනගනී. යම් කරුණකින් දුරු කරන ලද කාමච්ඡන්දයාගේ නැවත ඉපදීමක් නොවේද, ඒ කාරණයද දැනගනී.

ඇත්තාවූ හෝ ආධ්‍යාත්මිකවූ (තමා තුළවූ) ව්‍යාපාදය (ක්‍රොධය) මා තුළ (ආධ්‍යාත්මක) ව්‍යාපාද ඇතැයි දැනගනී. තමා තුළ නැත්තාවූ, හෝ ක්‍රොධය, මා තුළ ක්‍රොධය නැතැයි

දැනගනී. යම් කරුණකින් නූපන්නාවූ ක්‍රොධයේ ඉපදීම වේද, ඒ කරුණද දැනගනී. යම්කරුණකින් උපන්නාවූ ක්‍රොධයේ දුරුවීම වන්නේද එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ ක්‍රොධයෝ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී.

තමා තුළ ඇත්තාවූ හෝ ථිනමිද්ධය (චිත්ත චෛතසිකයන්ගේ මැලිබව) මා තුළ ථිනමිද්ධය ඇතැයි දැනගනී. තමා තුළ නැත්තා වූ හෝ ථිනමිද්ධය, මා තුළ ථිනමිද්ධය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් ථිනමිද්ධයාගේ ඉපදීම වේද එයද දැනගනී. යම් කරුණකින් උපන් ථිනමිද්ධයාගේ දුරුවීම වන්නේද එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ ථිනමිද්ධයාගේ නැවත ඉපදීමක් නොවේද එයද දැනගනී.

තමා තුළ ඇත්තාවූ හෝ උද්ධච්චකුක්කුච්චය (නොසන්සුන්කම හා පසුතැවිල්ල) මා තුළ උද්ධච්චකුක්කුච්චය ඇතැයි දැනගනී. තමා තුළ නැත්තාවූ හෝ උද්ධච්චකුක්කුච්චය මා තුළ උද්ධච්චකුක්කුච්චය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම වේද එයද දැනගනී. යම් කරුණකින් උපන් උද්ධච්චකුක්කුච්චයාගේ දුරුකිරීම වන්නේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ උද්ධච්චකුක්කුච්චයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ විචිකිච්ඡාව (බුද්ධාදි අට තැන්හි සැකය) මා තුළ විචිකිච්ඡාව ඇතැයි දන්නේය. තමා කෙරෙහි නැත්තාවූ හෝ විචිකිච්ඡාව මා තුළ විචිකිච්ඡාව නැතැයි දන්නේය. යම් කරුණකින් නූපන් විචිකිච්ඡාවගේ ඉපදීම වන්නේද, එයද දන්නේය. යම් කරුණකින් උපන් විචිකිච්ඡාවගේ දුරුකිරීම වන්නේද, එයද දන්නේය. යම් කරුණකින් දුරුවූ විචිකිච්ඡාව නැවත නූපදින්නේද, එයද දන්නේය.

මෙසේ තමා තුළවූ හෝ (පංචනීවරණ) ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. බාහිරව පවත්නාවූ හෝ (අනුන් පිළිබඳවූ) නීවරණ ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් පිළිබඳවූද, අනුන්

පිළිබඳවූද ධර්මයන් කෙරෙහි හෝ ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

ඒ ධර්මයන්ගේ ඉපදීම ස්වභාව හෝ දකිමින් වාසය කරන්නේය. ඒ ධර්මයන්ගේ නැතිවීම් ස්වභාව හෝ දකිමින් වාසය කරන්නේය. විටක ඉපදීම් ස්වභාව හා විටක නැතිවීම් ස්වභාව හෝ බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුවට සත්ත්වයෙක් පුද්ගලයෙක් නොවූ නීවරණ ධර්මයෝ ඇත්තාහුය යන සිහිය මනාකොට පිහිටියා වෙයි. ඒ සිහිය නුවණ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. ලොකයෙහි කිසිවක් (මමය මගේ යයි) ගැනීම නොකරන්නේය. මහණෙනි, ඒ භික්ෂුව මෙසේ පඤ්චනීවරණ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

14. "මහණෙනි, භික්ෂුව නැවතද පසක්වූ උපාදාන ස්කන්ධ (රූප, වෙදනා සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ.

"මහණෙනි, භික්ෂුව පසක්වූ උපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් කෙසේ වාසයකරන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මේ රූපරාශියයි, මේ රූපයන් පහළවීමේ හේතුවයි. මේ රූපයන්ගේ විනාශයයිද, මේ වේදනාවය (විඳීමය) මේ වෙදනාව පහළවීමේ හේතුවය. මේ වේදනාවගේ විනාශයයිද, මේ සංඥාවය, මේ සංඥාව පහළවීමේ හේතුවය. මේ සංඥා විනාශයයිද, මේ සංස්කාරයෝය, මේ සංස්කාරයන්ගේ පහළවීමේ හේතුවය, මේ සංස්කාර විනාශයයිද මේ විඤ්ඤාණයය, මේ විඤ්ඤාණයාගේ පහළවීමේ හේතුවය, මේ විඤ්ඤාණයාගේ විනාශයයිද මෙසේ තමා තුළවූ (පංචස්කන්ධ) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. බාහිරවූ (අනුන් තුළවූ) හෝ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් කෙරෙහිවූ හෝ අනුන් කෙරෙහිවූ හෝ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. ධර්මයන්ගේ ඇතිවීම් ස්වභාව හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දකිමින් වාසය කරන්නේය. ධර්මයන්ගේ විනාශවීම් ස්වභාවය හෝ බලමින් වාසය කරන්නේය. කලෙක ධර්මයන්ගේ පහළවීම හා කලෙක ධර්මයන්ගේ විනාශවීම හෝ බලමින් වාසය කරන්නේය. ඔහුට (සත්ව පුද්ගල නොවන) ස්කන්ධධර්මයෝ ඇත්තාහුය. (යන) සිහිය හොඳින් පිහිටියා වෙයි (ඒ සිහිය) නුවණ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. ඔහු තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන ඇසුරුනොකොට වාසය කරයි. (පංච ස්කන්ධ) ලෝකයෙහි (කිසිවක් මෙය මාගේයයි ගැනීමක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුව මෙසේ පඤ්ච උපදාන ස්කන්ධයන් කෙරෙහි, ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

15. "මහණෙනි, නැවතද භික්ෂුව තමන් තුළවූ සය ආයතනයන්ද (ඇස, කණ, නාසය, දිව, කය, සිත,) පිටතවූ සය ආයතනයන්ද (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම) යන ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. මහණෙනි, භික්ෂුව තමන් තුළවූද, පිටතවූද සය ආයතනයන් කෙරෙහි ධර්මයන් අනුව කෙසේනම් බලමින් වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ඇසද දැනගනී. රූපයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීම හේතුකොටගෙන යම් සංයෝජනයක් උපදින්නේද එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයෝජනයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයෝජනයාගේ දුරුවීම වේද, එයද, දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයෝජනයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී. කණද දැනගනී. ශබ්දයද දැනගනී ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයෝජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීම වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවේද, එයද දැනගනී. නාසයද දැනගනී. ගන්ධයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ

දුරුවීම වේද එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවේද එයද දැනගනී.

දිවද දැනගනී. රසයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයොජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයොජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයොජනයාගේ දුරුවීම වේද, එයද දැනගනී යම් කරුණකින් දුරුවූ සංයොජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද, එයද දැනගනී.

කයද දැනගනී. ස්පර්ශයද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයෝජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයෝජනයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයෝජනයාගේ දුරුවීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයෝජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද එයද, දැනගනී.

සිතද දැනගනී. ධර්මයන්ද දැනගනී. ඒ දෙදෙනාගේ එක්වීමෙන් යම් සංයෝජනයක් උපදින්නේද, එයද දැනගනී. යම් කරුණකින් නූපන් සංයෝජනයාගේ ඉපදීමක් වේද එයද දැනගනී. යම් කරුණකින් උපන් සංයෝජනයාගේ දුරුවීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් දුරුවූ සංයෝජනයාගේ නැවත ඉපදීමක් නොවන්නේද එයද දැනගනී.

මෙසේ තමා තුළවූ (ආයතන) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. පිටත්හිවූ ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. තමන් තුළවූද පිටත්හි වූද ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. ධර්මයන්ගේ ඉපදීම් ස්වභාව හෝ බලමින් වාසය කෙරේ. ධර්මයන්ගේ විනාශවීම් ස්වභාව හෝ බලමින් වාසය කෙරේ. කලෙක ධර්මයන්ගේ ඉපදීම හා කලෙක විනාශවීම බලමින් හෝ වාසය කෙරේ. ඔහුට (සත්ත්ව පුද්ගල නොවන) ආයතන ධර්මයෝ ඇත්තාහුය යන සිහිය මනාකොට පිහිටියා වෙයි. (එය) නුවණ වැඩීම පිණිසද, සිහිය දියුණුවීම පිණිසද පවතී ඔහු තෘෂ්ණා දෘෂ්ටි දෙදෙන අසුරු නොකොට

වාසය කරන්නේය. (ආයතන ධර්ම) ලොකයෙහි කිසිවක් (මමය, මාගේයයි) ගැනීම නොකෙරේ. මහණෙනි ඒ භික්ෂුව මෙසේ තමන් තුළවූද, පිටත්හි වූද දොළොස් ආයතන ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ.

**16.** "මහණෙනි, නැවතද භික්ෂුව සප්තබොද්ධ්‍යංග (අවබොධයට හෙතුවන අවයව හත) ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. මහණෙනි භික්ෂුව සත් වැදෑරුම් බොද්ධ්‍යංග ධර්මයන් අනුව කෙසේ බලමින් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව තමා තුළ ඇත්තාවූ හෝ සතිසම්බොජ්ජඞ්ගය, (සිහිය) මා තුළවූ සතිසම්බොජ්ජඞ්ගය ඇතැයි දැනගනී. තමා තුළ නැත්තාවූ හෝ සතිසම්බොජ්ජඞ්ගය මා තුළ සතිසම්බොජ්ජඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් සතිසම්බොජ්ජඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ සතිසම්බොජ්ජඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ ධම්මවිචය (ප්‍රඥාව) සම්බොජ්ජඞ්ගය, මා තුළ ධම්මවිචය සම්බොජ්ජඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ ධම්මවිචය සම්බොජ්ජඞ්ගය, මා තුළ ධම්මවිචය සම්බොජ්ජඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් ධම්මවිචය සම්බොජ්ජඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ජඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ විරිය (වීර්ය) සම්බොජ්ජඞ්ගය හෝ මා තුළ විරිය සම්බොජ්ජඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ විරිය සම්බොජ්ජඞ්ගය මා තුළ විරිය සම්බොජ්ජඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් විරිය සම්බොජ්ජඞ්යාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ විරිය සම්බොජ්ජඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ පීති (ප්‍රීතිය) සම්බොජ්ඣඞ්ගය, හෝ මා තුළ පීති සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ පීති සම්බොජ්ඣඞ්ගය මා තුළ පීති සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන් පීති සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීමක් වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නාවූ පීති සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද, එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ පස්සද්ධි (සංසිඳීම) සම්බොජ්ඣඞ්ගය, මා තුළ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය මා තුළ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නා වූ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නා වූ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ සමාධි (සිතේ එකඟකම) සම්බොජ්ඣඞ්ගය, මා තුළ සමාධි සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ සමාධි සම්බොජ්ඣඞ්ගය මා තුළ සමාධි සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නා වූ සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නා වූ සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද එයද දැනගනී.

තමා කෙරෙහි ඇත්තාවූ හෝ උපෙක්ඛා (මැදහත් බව) සම්බොජ්ඣඞ්ගය, මා තුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය ඇතැයි දැනගනී. තමා කෙරෙහි නැත්තාවූ හෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය මා තුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය නැතැයි දැනගනී. යම් කරුණකින් නූපන්නා වූ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේද, එයද දැනගනී. යම් කරුණකින් උපන්නා වූ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීම වේද එයද දැනගනී.

මෙසේ තමා කෙරෙහි ඇත්තාවූ හෝ (සප්ත බොද්ධ්‍යංග) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරයි. අනුන්

පිළිබඳවූ (සප්ත බොද්ධ්‍යංග) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරයි. තමන් පිළිබඳවූද, අනුන් පිළිබඳවූද ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරයි. ධර්මයන්ගේ ඉපදීම් ස්වභාව හෝ බලමින් වාසය කරයි. විනාශවීම් ස්වභාව හෝ බලමින් වාසය කරයි. කලෙක ඉපදීම හා කලෙක විනාශවීම හෝ බලමින් වාසය කරයි.

ඒ භික්ෂුවට (සත්ත්ව පුද්ගල නොවන) බොද්ධ්‍යංග ධර්මයෝ ඇතැයි යන සිහිය හොඳින් එළඹෙන ලද්දීය. (ඒ සිහිය) ඥානයාගේ වැඩීම පිණිසද, සිහිය වැඩීම පිණිසද පවතී. (ඒ භික්ෂුව) තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා ආශ්‍රය නොකොට වාසය කරයි. ලෝකයෙහි කිසිවක් ආත්ම වශයෙන් ගැනීම නොකරයි. මහණෙනි, භික්ෂුව මෙසේ සප්ත බොද්ධ්‍යංග ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරයි.

17. "මහණෙනි, භික්ෂුව නැවතද චතුරාර්ය සත්‍ය (උතුම් සත්‍ය හතර) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරයි. මහණෙනි, භික්ෂුව චතුරාර්ය සත්‍යය ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මේ දුකයයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් ඉපදීමේ හේතුවයයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැතිකිරීමයයි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති කිරීමේ මාර්ගය යයි ඇති සැටියෙන් දැනගනී.

මෙසේ තමන් තුළවූ (චතුරාර්ය සත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. අනුන් පිළිබඳවූ (චතුරාර්ය සත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමන් පිළිබඳවූ හා අනුන් පිළිබඳවූ (චතුස්සත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. (චතුරාර්ය සත්‍යය) ධර්මයන්ගේ ඇතිවීමට හේතුවූ (ප්‍රත්‍යය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. (චතුරාර්ය සත්‍ය) ධර්මයන්ගේ විනාශයට හේතුවූ (ප්‍රත්‍ය) ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. කලෙක (චතුරාර්ය සත්‍ය ධර්මයන්ගේ

උත්පත්තියද කලෙක විනාශයද දක්නේ හෝ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. ඒ භික්ෂුව (සත්ත්ව පුද්ගල නොවන) චතුරාර්ය සත්‍ය ධර්මයෝ ඇත්තාහ යන එළඹ සිටි සිහිය ඇත්තේ වෙයි. ඒ සිහිය ඥානය වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. (ඒ භික්ෂුව) තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා ආශ්‍රයකොට නොගෙන වාසය කරන්නේය. ලෝකයෙහි කිසිවක් (ආත්ම වශයෙන්) නොගනී. මහණෙනි, මෙසේ භික්ෂුව (චතුරාර්ය සත්‍ය) ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය.

18. "මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ වඩන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයකට පැමිණීම කැමතිවිය යුතුය. (ලැබිය යුතුය.)

"මහණෙනි, සත් වර්ෂයක් කල් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් හය අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය.)

"මහණෙනි, සාවුරුද්දක් කල් තිබියේවා. යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් පස් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාර ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය.)

"මහණෙනි, පස් වසක් කල් තිබේවා. මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් සතර අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අර්හත්

ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය. (ලැබිය යුතුය)

"මහණෙනි, සතර අවුරුද්දක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් භවට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය.

"මහණෙනි, තුන්අවුරුද්දක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් අවුරුදු දෙකක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමිඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය.)

"මහණෙනි, අවුරුදු දෙකක් තිබේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් එක් අවුරුද්දක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, එක් අවුරුද්දක් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත්මසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, සත් මසක් කල්තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් හයමසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට

පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, හය මාසයක් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් පස්මසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, පස් මාසයක් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් සාරමසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, සාරමසක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් තුන්මාසයක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, තුන් මාසයක් තිබේවා, මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් මාස දෙකක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, මාස දෙකක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් එක මාසයක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම රහත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, මාසයක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් ධර්මයන් පසළොස් දිනක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අරහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි වීමක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, පසළොස් දිනක් තිබේවා, මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨාන ධර්මයන් සත්දවසක් මුළුල්ලෙහි මෙසේ භාවනා කරන්නේ නම් ඔහු විසින් මේ ආත්මයේදීම අරහත් ඵලයට පැමිණීම හෝ කෙලෙසුන්ගේ ඉතිරි බවක් ඇති කල්හි අනාගාමි ඵලයට පැමිණීම හෝ යන දෙයාකාරවූ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. (ලැබිය යුතුය)

"මහණෙනි, රාගාදී කෙලෙස් නැතිව සත්ත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද ශෝක පරිදෙව දුඃඛයන්ගේ දුරුකිරීම පිණිසද දුක් දොම්නස් නැතිකිරීම පිණිසද ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේ ලැබීම පිණිසද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද යම් මේ සතර සතිපට්ඨාන ධර්මයෙක් ඇද්ද එය එකම මාර්ග වන්නේයයි මෙසේ යම් ඒ ධර්මයක් වදාරණ ලද්දේද මේ ධර්මය ඒ කාරණය පිණිස වදාරණ ලද්දේය."

භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ මේ (සතර සතිපට්ඨාන සූත්‍ර ධර්ම දේශනාව) මෙසේ දේශනා කොට වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම කථාව සතුටින් පිළිගත්හ.

(දසවෙනිවූ සතිපට්ඨාන සූත්‍රය නිමි.)

(මූල පරියාය වර්ගය නිමි)

# 11. චූල සීහනාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනාථපිණ්ඩික සිටුහු විසින් කරවනලද ජේතවනනම් විහාරයෙහි වැඩවාසය කරති. එකල භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "මහණෙනි, පළමුවැනි (සෝවාන්) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම ඇත්තේය. දෙවැනි (සකෘදාගාමි) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම ඇත්තේය. තුන්වැනි (අනාගාමි) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම ඇත්තේය. සතරවැනි (රහත්) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම ඇත්තේය. මෙයින් අන්‍යවූ වාදයෝ (ශාසන) ශ්‍රමණයන්ගෙන් හිස්ය. මහණෙනි මෙසේ මේ සිංහ නාදය මනාකොට නාද කරව්. මහණෙනි, මේ කාරණයක් ඇත්තේය. අන්‍යලබ්ධික පරිබ්‍රාජකයන් මෙසේ කියන්නට පුළුවන. පළමුවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, දෙවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, තුන්වැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, සතරවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, අන්‍යවූ වාදයෝ ශ්‍රමණයන්ගෙන් හිස්යයි ආයුෂ්මත්වූ තෙපි කියන්නාහුය. මෙසේ කීමට ආයුෂ්මතුන්හට ඇති පිහිට කවරේද? බලය කුමක්දැයි කියන්නාහුය.

3. "මහණෙනි, මෙසේ කියන්නාවූ අන්‍යලබ්ධික පරිබ්‍රාජකයන්හට තොප විසින් මෙසේ කියයුතුය. ඇවැත්නි, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද ධර්ම සතරක් ඇත්තාහුමය. ඒ ධර්ම සතර අප කෙරෙහි ඇති බව දකිමින් අපි පළමුවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, දෙවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, තුන්වැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, හතරවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, අන්‍යවූ වාදයෝ ශ්‍රමණයන්ගෙන් සූන්‍යයයි කියමු. කවර සතරක්ද යත්? ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කෙරෙහි අපගේ පැහැදීම ඇත්තේමය. ධර්මයෙහි පැහැදීම ඇත්තේමය. සීලයන් සම්පූර්ණ කරන බව ඇත්තේමය. ගිහිවූද, පැවිදිවූද මේ සියලුදෙන එක්ව ධර්මයෙහි හැසිරෙන්නාහු ඔවුනොවුන්ට ප්‍රිය වෙත්. මනාපවෙත්. ඇවැත්නි, යම් ධර්මයක් අප කෙරෙහි ඇති බව දකිමින් අපි පළමුවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, දෙවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, තුන්වැනි ශ්‍රමණ තෙමේද මෙහිමය, හතරවැනි ශ්‍රමණ තෙමේද මෙහිමය. අන්‍යවූ වාදයෝ ශ්‍රමණයන්ගෙන් ශූන්‍යහයි කියමු නම් අපට ඒ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලද මේ ධර්ම හතර ඇත්තේමය.

"මහණෙනි, (තොප මෙසේ කියූවිට) අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයන් මෙසේ කියන්නට පුළුවන. ඇවැත්නි යම් කෙනෙක් අපගේ ශාස්තෘනම් ඒ ශාස්තෘන්කෙරෙහි අපගේද පැහැදීම ඇත. යමක් අපගේ ධර්මය නම් ඒ ධර්මයෙහි අපගේද පැහැදීම ඇත. අපගේ යම් සීල වෙත් නම් ඒ සීලයන් අපිත් සම්පූර්ණ කරන්නෙමු. අපගේද එක්ව ධර්මයෙහි හැසිරෙන්නාවූ ගිහියෝද පැවිද්දෝද ඔවුනොවුන්ට ප්‍රියවෙත් මනාප වෙත්. ඇවැත්නි මෙහිලා තොපගේද අපගේද වෙනස කවරේද? අදහස කවරේද? වෙනස් කාරණය කුමක්දැ? (යි) කියන්නාහුය.

4. "මහණෙනි, මෙසේ කියන්නාවූ අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයන්හට මෙසේ කියයුතුය. ඇවැත්නි, කිමෙක්ද? නිෂ්ඨාව (කෙළවර) එකක්ද, නොහොත් බොහෝදැයි (ඇසිය යුතුය) මහණෙනි, හරියට උත්තරදෙන අන්‍යලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ.

"ඇවැත්නි, කෙළවර එකක්ය. බොහෝ නොවෙත්යයි (කියති) ඇවැත්නි, ඒ නිෂ්ඨාව (කෙළවර) රාග සහිතයාටද නොහොත් රාග නැත්තටදැයි (ඇසිය යුතුය) හරියට උත්තර දෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නි, ඒ කෙළවර රාග නැති තැනැත්තාටය. රාග සහිත තැනැත්තාට නොවේයයි (කියති) ඇවැත්නි, ඒ කෙළවර ද්වේෂ සහිතයාටද? නොහොත්

පහවූ ද්වේෂ ඇත්තහුට දැයි (ඇසිය යුතු) හරියට උත්තර දෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නී, ඒ කෙළවර පහවූ ද්වේෂ ඇත්තාහටය, ඒ කෙළවර ද්වේෂ සහිතයාට නොවේ. (යයි කියති) ඇවැත්නි, ඒ කෙළවර මොහ සහිතයාටද? නොහොත් පහවූ මොහ ඇත්තාහටදැයි (ඇසිය යුතුය) මහණෙනි, හරියට උත්තරදෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ ඇවැත්නි, ඒ කෙළවර පහවූ මොහ ඇත්තාහටය. ඒ කෙළවර මොහ සහිතයාට නොවේ යැයි (කියති) ඇවැත්නි, ඒ කෙළවර තෘෂ්ණාව ඇති තැනැත්තාටද? නොහොත් තෘෂ්ණාව පහකළ තැනැත්තාහටදැයි (ඇසිය යුතුය) මහණෙනි, හරියට උත්තරදෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නි, ඒ කෙළවර පහවූ තෘෂ්ණා ඇත්තාහටය ඒකෙළවර තෘෂ්ණා ඇති තැනැත්තාට නොවේයැයි (කියති) ඇවැත්නි ඒ කෙළවර උපාදාන (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩිකොට අල්ලා ගැනීම) ඇත්තාහටද? නොහොත් උපාදාන නැත්තාහට දැයි (ඇසිය යුතු) මහණෙනි, හරියට උත්තර දෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නි, ඒ කෙළවර උපාදාන නැත්තාටය. ඒ කෙළවර උපාදාන ඇත්තාට නොවේයයි (කියති) ඇවැත්නි, ඒ කෙළවර නුවණැතියාටද? නොහොත් මෝඩයාටදැයි (ඇසිය යුතු) මහණෙනි, හරියට උත්තරදෙන අන්‍ය ලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නි, ඒ කෙළවර නුවණැතියාටය ඒ කෙළවර මෝඩයාට නොවේයයි (කියති) ඇවැත්නි, ඒ කෙළවර රාගයෙන් ඇලුණු ක්‍රොධයෙන් කිපුණු පුද්ගලයාටද? නොහොත් රාගයෙන් නොඇළුණු ක්‍රොධයෙන් නොකිපුණු පුද්ගලයාටදැයි (ඇසිය යුතු) මහණෙනි, හරියට උත්තරදෙන අන්‍යලබ්ධික පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහ. ඇවැත්නි, ඒ කෙළවර රාගයෙන් නොඇළුණු ක්‍රොධයෙන් නොකිපුණු පුද්ගලයාටය, රාගයෙන් ඇළුණු ක්‍රොධයෙන් කිපුණු පුද්ගලයාහට නොවේයයි (කියති.)

"ඇවැත්නි, ඒ කෙළවර තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ප්‍රමාද වීමෙහි ඇලුණහුටද නොහොත් තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ප්‍රමාද නොවූවහුටදැයි (ඇසිය යුතුය.) ඇවැත්නි, ඒ කෙළවර තෘෂ්ණා

දෘෂ්ටි දෙකින් ප්‍රමාදවූවහුට නොවේ. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ප්‍රමාද නොවූවහුටයයි (කියති)

5. "මහණෙනි, මේ දෘෂ්ටි දෙකක් වෙත්. සාශ්වත දෘෂ්ටියය (නිත්‍ය ආත්මයක් ඇතැයි සිතන දෘෂ්ටිය,) උච්ඡේද දෘෂ්ටියය (ආත්මය සිඳේ යයි ගන්නා දෘෂ්ටිය) යන දෙකයි මහණෙනි, සාශ්වත දෘෂ්ටියෙහි ඇළුණාවූ සාශ්වත දෘෂ්ටියට පැමිණියාවූ සාශ්වත දෘෂ්ටියෙහි ගැළුණාවූ යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔවුහු උච්ඡේද දෘෂ්ටියට විරුද්ධවෙත්. මහණෙනි, උච්ඡේද දෘෂ්ටියෙහි ඇලුණාවූ උච්ඡේද දෘෂ්ටියට පැමිණියාවූ, උච්ඡේද දෘෂ්ටියෙහි ගැලුනාවූ යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔවුහු සාශ්වත දෘෂ්ටියට විරුද්ධ වෙත්.

"මහණෙනි, යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ දෘෂ්ටි දෙදෙනාගේ හටගැන්මද, නැතිවීමද ආශ්වාදයද ආදීනවද, දුරුකිරීමද ඇති සැටියෙන් නොදනිත් නම් ඔවුහු රාගසහිතයෝය. ඔවුහු ද්වේෂ සහිතයෝය, ඔවුහු මෝහ සහිතයෝය, ඔවුහු උපාදාන සහිතයෝය, ඔවුහු මෝඩයෝය, ඔවුහු රාගයෙන් ඇලුණු ක්‍රොධයෙන් කිපුණෝය, ඔවුහු ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීමෙන්ද, ශාරීරික දුකින්ද, දොම්නසින්ද, දැඩි වෙහෙසින්ද, නොමිදෙත්. සියලු සංසාර දුකින් නොමිදෙත් යයි කියමි.

මහණෙනි, යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ දෘෂ්ටීන් දෙදෙනාගේ හටගැන්මද නැතිවීමද ආශ්වාදයද ආදීනවද දුරු කිරීමද ඇති සැටියෙන් දනිත්ද, ඔවුහු පහවූ රාග ඇත්තෝය, ඔවුහු පහවූ ද්වේෂ ඇත්තෝය. ඔවුහු පහවූ මොහ ඇත්තෝය, ඔවුහු පහවූ තෘෂ්ණා ඇත්තෝය, ඔවුහු උපාදාන නැත්තෝය, ඔවුහු නුවණැතියෝය, ඔවුහු ඉපදීමෙන්ද ජරාවෙන්ද මරණයෙන්ද ශොකයෙන්ද වැළපීමෙන්ද ශාරීරික දුකින්ද මානසික දුකින්ද දැඩිවෙහෙසින්ද මිදෙන්නාහුය. සියලු සසර දුකින් මිදෙන්නාහුයයි කියමි.

**6.** "මහණෙනි, මේ උපාදාන සතරක් වෙත්. කාමඋපාදානයය, දිට්ඨි උපාදානයය, ශීලව්‍රත උපාදානයය, ආත්මවාද උපාදානයය, යන සතරයි. මහණෙනි, සියලු උපාදානයන්ගේ නැතිකිරීම දන්නෙමුයයි කියන්නාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔවුහු සියළු උපාදානයන්ගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්. දෘෂ්ටි උපාදානයාගේ නැතිකිරීම නොපණවත්. ශීලව්‍රතඋපාදානයාගේ නැතිකිරීම නොපණවත්. ආත්මවාද උපාදානයාගේ නැතිකිරීම නොපණවත්. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ මේ කරුණු තුන ඇති සැටියෙන් නොදනිත්. එහෙයින් ඒ පින්වත් මහණ බමුණෝ සියලු උපාදානයන්ගේ නැතිකිරීම දන්නා බව ප්‍රකාශකරන නමුත් සියලු උපාදානයන්ගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්, දිට්ඨි උපාදානයාගේ නැතිකිරීම නොපණවත්, ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම නොපණවත්, ආත්මවාද උපාදානයාගේ නැතිකිරීම නොපණවත්.

"මහණෙනි, සියලු උපාදානයාගේ නැතිකිරීම පණවන්නෙමුයි ප්‍රකාශ කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ වෙත්. ඔවුහු සියලු උපාදානයාගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්. දෘෂ්ටිඋපාදානයාගේ නැතිකිරීම පණවත්. ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම නොපණවත් ආත්මවාද උපාදානයාගේ නැතිකිරීම නොපණවත් ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ මේ කරුණුදෙක ඇතිසැටියෙන් නොදනිත්. එහෙයින් ඒ පින්වත් මහණ බමුණෝ සියලු උපාදානයාගේ නැතිකිරීම දන්නා බව ප්‍රකාශකරණ නමුත් සියලු උපාදානයන්ගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්. දෘෂ්ටි උපාදානයාගේ නැතිකිරීම පණවත්. ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම නොපණවත්.

"මහණෙනි, සියලු උපාදානයන්ගේ පහකිරීම පණවන්නෙමුයි. ප්‍රකාශ කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ වෙති. ඔවුහු සියලු

උපාදානයන්ගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්, දෘෂ්ටි උපාදානයාගේ නැතිකිරීම පණවත්, ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම පණවත්. ආත්මවාද උපාදානයාගේ නැතිකිරීම නොපණවත්, ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ ඒ මේ එකම කාරණය ඇති සැටියෙන් නොදනිත්. එහෙයින් ඒ පින්වත් මහණ බමුණෝ සියලු උපාදානයන්ගේ නැතිකිරීම දන්නා බව ප්‍රකාශකරන නමුත් සියලු උපාදානයන්ගේ නැතිකිරීම හරියට නොපණවත්. කාම උපාදානයාගේ නැතිකිරීම පණවත්. දෘෂ්ටි උපාදානයාගේ නැතිකිරීම පණවත්. ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම පණවත්. ආත්මවාද උපාදානයාගේ නැතිකිරීම නොපණවත්.

7. "මහණෙනි, මෙබඳුවූ ශාසනයෙහි ශාස්තෘන් කෙරෙහි යම් පැහැදීමක් වේද? ඒ ප්‍රසාදය මනාව පිහිටියේයයි කියනු නොලැබේ. ධර්මයෙහි යම් පැහැදීමක් වේද ඒ ප්‍රසාදය මනාව පිහිටියේයයි නොකියනු ලැබේ. සීලයන් හොඳින් සම්පූර්ණ කිරීමක් වේද එය මනාව පිහිටියේයයි කියනු නොලැබේ. එක්ව ධර්මයෙහි හැසිරෙන්නවුන් අතර යම් ප්‍රියමනාප බවක් වේද එය මනාව පිහිටියේ යයි කියනු නොලැබේ.

ඊට හේතු කවරේද? මහණෙනි, වරදවා ප්‍රකාශ කරණ ලද්දාවූ වරදවා දන්නා ලද්දාවූ නිවන් පිණිස නොපවත්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස නොපවත්නාවූ බුදු නොවූවෙකු විසින් කියන ලද්දාවූ ධර්මයක සැටි මෙසේ වීමයි.

"මහණෙනි, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ සියලු උපදානයන්ගේ නැතිකිරීම කියන්නේයයි ප්‍රකාශ කරන්නේ සියලු උපාදානයන්ගේ නැතිකිරීම පණවයි. කාම උපාදානයාගේ නැතිකිරීම පණවයි. දෘෂ්ටි උපාදානයාගේ නැතිකිරීම පණවයි. ශීලව්‍රත උපාදානයාගේ නැතිකිරීම පණවයි ආත්මවාද උපාදනයාගේ නැතිකිරීම පණවයි. මහණෙනි, මෙබඳු ශාසනයෙහි වනාහි බුදුන් කෙරෙහි යම් පැහැදීමක් වේද, ඒ මනාව පිහිටියේයයි කියනු ලැබේ. ධර්මයෙහි යම් පැහැදීමක්වේද ඒ මනාව පිහිටියේයයි කියනු ලැබේ. ශීලයන්හි යම් හොඳින්

සම්පූර්ණ කිරීමක්වේද ඒ මනාව පිහිටියේයයි කියනු ලැබේ. එක්ව ධර්මයෙහි හැසිරෙන්නවුන් අතර යම් ප්‍රියමනාප බවක් වේද, ඒ මනාව පිහිටියේයයි කියනු ලැබේ. මහණෙනි, මනාව ප්‍රකාශ කරණලද මනාව අවබොධ කරගත්, නිවන් පිණිස පවතින්නාවූ කෙලෙස් සංසිඳීම පිණිස පවතින්නාවූ සම්‍යක් සම්බුදුවරයෙකු විසින් දෙශනා කරන ලද්දාවූ ධර්මයෙහි ආකාරය මෙසේ වීමයි.

8. "මහණෙනි, මේ උපාදාන සතර කුමක් මුල්කාරණය කොට ඇත්තාහුද? කුමක් උත්පත්ති හෙතුව කොට ඇත්තාහුද? කුමක් ජාති කොට ඇත්තාහුද? කුමකින් පහළ වන්නාහුද? මේ උපාදාන සතර තෘෂ්ණාව මූලකාරණ කොට ඇත්තාහුය. තෘෂ්ණාව හෙතු කොට ඇත්තාහුය. තෘෂ්ණාව ජාති කොට ඇත්තාහුය. තෘෂ්ණාවෙන් පහළ වන්නාහුය.

"මහණෙනි, මේ තෘෂ්ණාව කුමක් මුල් කාරණ කොට ඇත්තීද? කුමක් උත්පත්ති හෙතුවකොට ඇත්තීද? කුමක් ජාතික කොට ඇත්තීද? කුමකින් පහළ වන්නීද? තෘෂ්ණාව වේදනාව මුල් කාරණය කොට ඇත්තීය. වේදනාව උත්පත්ති හෙතුව කොට ඇත්තීය. වේදනාව ජාති කොට ඇත්තීය වේදනාවෙන් පහළ වන්නීය.

"මහණෙනි. මේ වේදනාව කුමක් මූල කාරණකොට ඇත්තීද? කුමක් උත්පත්ති හෙතුව කොට ඇත්තීද? කුමක් ජාතිකොට ඇත්තීද? කුමකින් පහළ වන්නීද? වෙදනාව ස්පර්ශය මූල කාරණා කොට ඇත්තීය ස්පර්ශය උත්පත්ති හෙතුව කොට ඇත්තීය. ස්පර්ශය ජාතිකොට ඇත්තීය. ස්පර්ශය නිසා පහළ වන්නීය.

"මහණෙනි, මේ ස්පර්ශයතෙම කුමක් මුල් කාරණයකොට ඇත්තේද? කුමක් උත්පත්ති කාරණය කොට ඇත්තේද? කුමක් ජාති කොට ඇත්තේද? කුමකින් පහළ වන්නේද? ස්පර්ශය තෙම ෂඩායතනයන් (ඇස ආදී ආයතන සය) මුල් කාරණයකොට ඇත්තේය. ෂඩායතනයන් උත්පත්ති හෙතුව කොට ඇත්තේය. ෂඩායතනයන් නිසා පහළ වන්නේය.

"මහණෙනි, මේ ෂඩායතනය කුමක් මුල් කාරණය කොට ඇත්තේද? කුමක් උත්පත්ති හෙතුව කොට ඇත්තේද? කුමක් ජාති කොට ඇත්තේද? කුමකින් පහළ වන්නේද? ෂඩායතනය නාම රූපයන් මුල් කාරණය කොට ඇත්තේය. නාම රූපයන් උත්පත්ති හෙතුව කොට ඇත්තේය. නාම රූපයන් ජාතිකොට ඇත්තේය. නාම රූපයන් නිසා පහළ වන්නේය.

"මහණෙනි, මේ නාම රූපය කුමක් මුල් කාරණය කොට ඇත්තේද? කුමක් උත්පත්ති හෙතුව කොට ඇත්තේද? කුමක් ජාති කොට ඇත්තේද? කුමකින් පහළ වන්නේද? නාම රූපය විඤ්ඤාණය මුල් කාරණය කොට ඇත්තේය. විඤ්ඤාණය උත්පත්ති කාරණය කොට ඇත්තේය. විඤ්ඤාණය ජාතිකොට ඇත්තේය. විඤ්ඤාණය නිසා පහළ වන්නේය.

"මහණෙනි, මේ විඤ්ඤාණය කුමක් මුල් කාරණය කොට ඇත්තේද? කුමක් උත්පත්ති හෙතුව කොට ඇත්තේද? කුමක් ජාතික කොට ඇත්තේද? කුමකින් පහළ වන්නේද? විඤ්ඤාණය සංස්කාරයන් මුල් කාරණය කොට ඇත්තේය. සංස්කාරයන් උත්පත්ති හෙතුකොට ඇත්තේය. සංස්කාරයන් උත්පත්ති කාරණය කොට ඇත්තේය. සංස්කාරයන් ජාතිකොට ඇත්තේය. සංස්කාරයන් නිසා පහළ වන්නේය.

"මහණෙනි, මේ සංස්කාරයෝ කුමක් මුල් කාරණය කොට ඇත්තාහුද? කුමක් උත්පත්ති කාරණය කොට ඇත්තාහුද? කුමක් ජාති කොට ඇත්තාහුද? කුමක් නිසා පහළ වන්නාහුද? අවිද්‍යාව මුල්කාරණය කොට ඇත්තාහුය. අවිද්‍යාව උත්පත්ති කාරණය කොට ඇත්තාහුය. අවිද්‍යාව ජාති කොට ඇත්තාහුය. අවිද්‍යාව නිසා පහළ වන්නාහුය.

"මහණෙනි, යම් තැනක පටන් භික්ෂුවගේ අවිද්‍යාව නැති වූවා වේද විද්‍යාව උපන්නී වේද, අවිද්‍යාවෙන් වෙන්වී විද්‍යාව පහළවීම නිසා කාම උපාදාන වශයෙන් නොගණියි. දෘෂ්ටි උපාදාන වශයෙන් නොගණියි. ශීලව්‍රත උපාදාන වශයෙන් නොගණියි. ආත්මවාද උපාදාන වශයෙන් නොගනියි. උපාදාන වශයෙන් නොගන්නේ තැති නොගණියි, තැති නොගන්නේ

තෙමෙම කෙලෙස් නැති කරයි, ජාතිය කෙළවරවීයයිද බ්‍රහ්මචර්ය වාසය නිමවන ලදැයිද මේ ආත්මයෙහි තවත් කළයුතු දෙයක් නැතැයිද දැනගනියි.”

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවෙන් සතුටුවූහ.

(චූල සීහනාද සූත්‍රය නිමි)

## 12. මහා සීහනාද සූත්‍රය

**1.** “මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර නගරයෙන් පිටත බටහිර පැත්තේ පිහිටි වන ලැහැබෙහි වාසය කළහ. එකල්හි සුනක්ඛත්ත නම් ලිච්ඡවිපුත්‍රතෙම මේ ශාසනයෙන් ඉවත්ව ගොස් නොබෝ කල් ඇත්තේ වෙයි. හෙතෙම විශාලා මහනුවර පිරිස්වල මෙබඳු වචන කියයි.

**2.** “ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්ය භාවයක් ඇති කිරීමට සමර්ථ විශේෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනාකරයි. ඒ ශ්‍රමණ ගෞතමයන් විසින් යම් අර්ථයක් සඳහා ධර්මය දෙනා කරන ලද්දේද,ඒ ධර්මය තෙම ඊට අනුව ක්‍රියාකරන්නහුගේ දුක් විනාශකිරීම පිණිස පවතී” (කියාය) එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පාත්‍රා සිවුරුගෙන විශාලාමහනුවරට පිඩුපිණිස පැමිණියෝය ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රයා විශාල මහනුවර පිරිස් මැද “ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවයක් ඇති කිරීමට සමර්ථ විශේෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනා කරයි. ඔහු විසින් යම් ප්‍රයෝජනයක් සඳහා ධර්මය දෙශනා කරන ලද්දේද ඒ ධර්මය

තෙම ඊට අනුව ක්‍රියාකරන්නහුගේ දුක් විනාශකිරීම පිණිස පවති'යයි මෙසේ කියන වචනය අසන්ට ලැබුණේය.

එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විශාලා මහනුවර පිඩුපිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුනේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිතැනට පැමිණියේය. පැමිණ එක පැත්තක වාඩිවිය. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළේය. "ස්වාමීනි සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රතෙම මේ ශාසනයෙන් ඉවත්වගිය නොබෝකල් ඇත්තේවෙයි. හෙතෙම විශාලා මහනුවර පිරිස් මැද මෙබඳු වචන කියයි. "ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්යභාවයක් ඇති කිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතමතෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනාකරයි. ඒ ශ්‍රමණ ගෞතමයන් විසින් යමක් සඳහා ධර්මය දේශනා කරණ ලද්දේද ඒ ධර්මය තෙම ඊට අනුව ක්‍රියා කරන්නහුගේ දුක් නැතිකිරීම පිණිස පවතී" (කියායි)

3. "ශාරීපුත්‍රය, සුනක්ඛත්ත හිස් පුරුෂතෙම කෝපවන්නෙකි. ඔහු විසින් ක්‍රොධයෙන්ම මේ වචන කියනලදී. ශාරීපුත්‍රය, ඒ සුනක්ඛත්ත නම් හිස් පුරුෂතෙම තථාගතයන්ගේ අගුණයක් කියන්නෙමියි සිතා තථාගතයන්ගේ ගුණයක්ම කියයි. ශාරීපුත්‍රය, "තථාගතයන් විසින් යමක් සඳහා ධර්මය දෙශනා කරන ලද්දේද ඒ ධර්මයතෙම ඊට අනුව ක්‍රියාකරන්නහුගේ දුක් නැති කිරීම පිණිස පවතී" යයි යමෙක් කියා නම් එය තථාගතයන්ගේ ගුණයක්මය.

"ශාරීපුත්‍රය, සුනක්ඛත්ත නම්වූ ඒ හිස් පුරුෂයාහට මා පිළිබඳ ධර්මාවබොධයක් නැත්තේය. මේ කාරණයෙන්ද ඒ භාග්‍යවත්තෙමේ අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයෙන් යුක්තය, සුගතය, සියලු ලෝකය දන්නේය. තමන්ට වඩා උතුම්වූ කෙනෙක් නැත. දමනය නොකළහැකි පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙකු වැනිය. දෙව් මිනිසුන්ට අනුශාසනා කරන්නේය. බුද්ධය, භගවත්යයි (මා පිළිබඳ දැනීමක් නැත්තේය.)

**4.** "ශාරීපුත්‍රය, සුනක්ඛත්ත නම් ඒ හිස් පුරුෂයාහට මා පිළිබඳවූ මේ ධර්මාවබොධයද නැත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද නොයෙක් ආකාරවූ ඍද්ධිවිධි විශෙෂයෙන් විඳින්නාහ. කෙසේද? එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වන්නාහ. බොහෝදෙනෙක්ව එක්කෙනෙක් වන්නාහ. ප්‍රකට බවටද, අප්‍රකට බවටද පැමිණෙන්නාහ. භිත්ති සරසද, ප්‍රාකාර සරසද, පර්වත සරසද අහසේ යම්සේද එසේ නොගැටෙමින් ගමන් කරන්නාහ. දියෙහි මෙන් පොළොවෙහිද කිමිදීම් මතුවීම් කරන්නාහ. පොළොවෙහි මෙන් ජලයෙහිද නොකිමිදෙමින් යන්නාහ. පක්ෂියෙක් මෙන් අහසෙහි හිඳගෙනම (හිඳීමෙන්ම) යන්නාහ. මහත් ඍද්ධි ඇති මේ සඳ හිරු දෙදෙනද අතින් අල්ලන්නාහ. අතගාන්නාහ. බ්‍රහ්ම ලොකය දක්වා ශරීරයෙන් තමන්ගේ වසඟයෙහි පවත්වන්නාහ.

**5.** "ශාරීපුත්‍රය, සුනක්ඛත්ත නම් ඒ හිස් පුරුෂයාට මා පිළිබඳ මේ ධර්මාවබොධයද නැත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මිනිස් කණ ඉක්ම සිටින්නාවූ පිරිසිදුවූ දිව කණින් දෙවියන් පිළිබඳවූද මිනිසුන් පිළිබඳවූද, දුරවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි (යනුයි)

**6.** ශාරීපුත්‍රය, සුනක්ඛත්ත නම් ඒ හිස් පුරුෂයාහට මා පිළිබඳවූ මේ ධර්මය දැනීමද නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ අන්‍යසත්වයින්ගේ ද අන්‍ය පුද්ගලයින්ගේ ද සිත තම සිතින් පිරිසිඳ දන්නාහ. රාග සහිත සිත රාග සහිත සිතයයි දන්නාහ. රාග රහිත සිත රාග රහිත සිතයයි දන්නාහ. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දන්නාහ. විසිරුණු සිත විසුරුණු සිතයයි දන්නාහ. මහත්බවට පැමිණි සිත මහත්බවට පැමිණි සිතයයි දන්නාහ මහත් බවට නොපැමිණි සිත මහත් බවට නොපැමිණි සිතයයි දන්නාහ. උසස් බවට පැමිණි සිත උසස් බවට පැමිණි සිතයයි දන්නාහ. උසස් බවට නොපැමිණි සිත උසස් බවට නොපැමිණි සිතයයි දන්නාහ. සංසිඳුනු සිත සංසිඳුනු සිතයයි දන්නාහ. නොසංසිඳුනු සිත නොසංසිඳුනු සිත යයි දන්නාහ. මිදුනු සිත මිදුනු සිතයයි දන්නාහ. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දන්නාහ. (යනුයි.)

7. "ශාරීපුත්‍රය, තථාගතයන්ගේ මේ තථාගත බල දශයක් වෙත්. යම් බලවලින් යුක්තවූ තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහ නාදය කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද (එබඳු බල දශයක් වෙත්.) කවර දශයක්ද? ශාරීපුත්‍රය, තථාගත තෙම කාරණය කාරණය වශයෙන්ද අකාරණය අකාරණය වශයෙන්ද ඇතිසැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගතයන් වහන්සේ කාරණය කාරණය වශයෙන්ද අකාරණය අකාරණය වශයෙන්ද ඇති සැටියෙන් දන්නාහ යන යමක් වේද, ශාරීපුත්‍රය යම් බලයක් නිසා තථාගතතෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

8. ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම අතීත අනාගත වර්තමාන කාලයන්හිවූ සියලු කර්මයන්ගේ විපාක ප්‍රත්‍යය වශයෙන්ද හේතු වශයෙන්ද ඇතිසැටියෙන් දන්නාහ.

"ශාරීපුත්‍රය, තථාගතතෙම අතීත අනාගත වර්තමාන කාලයන්හි වූ සියලු කර්මයන්ගේ විපාක ප්‍රත්‍යය වසයෙන්ද හේතු වසයෙන්ද ඇතිසැටියෙන් දන්නාහ යන යමක් වේද, ශාරිපුත්‍රය, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

9. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි තථාගතතෙම සියලු ගතිවලට යන්නාවූද නොයන්නාවූද මාර්ගය ඇතිසැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගත තෙමේ සියලු ගතිවලට යන්නාවූද නොයන්නාවූද මාර්ගය ඇතිසැටියෙන් දන්නාහ යන යමක් වේද ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගතතෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

10. ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම බොහෝ ස්වභාව ධාතු ඇත්තාවූද නොයෙක් ස්වභාව ධාතු ඇත්තාවූද ලොකය ඇති සැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගත තෙමේ බොහෝ ස්වභාව ධාතු ඇත්තාවූද නොයෙක් ස්වභාව ධාතු

ඇත්තාවූද ලොකය ඇති සැටියෙන් දන්නාහ. යන යමක්වේද, ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

11. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම සත්වයන්ගේ නොයෙක් අදහස් ඇති බව ඇති සැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගත තෙම සත්වයන්ගේ නොයෙක් අදහස් ඇති බව දන්නාහ යන යමක් වේද, ශාරීපුත්‍රය යම් බලයක් නිසා තථාගතතෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

12. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගත තෙම අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් පිළිබඳ අඩු වැඩි බව ඇති සැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගතතෙම අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ ඉන්ද්‍රියයන් පිළිබඳ අඩුවැඩි බව ඇති සැටියෙන් දන්නාහ යන යමක් වේද, ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

"ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගත තෙම ධ්‍යානයන්ගේද, විමොක්ෂයන්ගේද, සමාධීන්ගේද, සමාපත්තීන්ගේද කෙලෙසීම, පිරිසිදු බව, නැගීසිටීම ඇති සැටියෙන් දන්නාහ. ශාරීපුත්‍රය, තථාගත තෙම යම් හේතුවකින් ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ කෙලෙසීම, පිරිසිදු බව නැගී සිටීම ඇති සැටියෙන් දන්නාහ යන යමක් වේද, ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගතතෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්ම චක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

13. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම නොයෙක් පෙර විසූ තැන් සිහි කරන්නාහ. එනම්, එක ජාතියක්ද,

ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද නොයෙක් විවර්ත කල්පයන්ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව, නොයෙක් ආකාර පූර්වෙනිවාසය සිහි කරන්නාහ.

තථාගත තෙම එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් ආකාර පූර්වෙනිවාසය සිහි කරන්නාහ යන යමක් වේද, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රේෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

**14.** "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම මිනිස් බව ඉක්මවා සිටි දිව ඇසින් චුතවන්නාවූද උපදින්නා වූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත්ගති ඇත්තාවූද, අයහපත්ගති ඇත්තාවූද කම්වූපරිදි මිය පරලොව යන්නාවූ සත්ත්වයන් දැනගනිත්ද එබඳුවූ චිත්ත සමාධිය ලබයි. මේ පින්වත් සත්ත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස් කියන්නාහු, මිසදිටුවූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්මයන් සමාදන් වූවාහු මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ දුකට පමුණුවන හෙයින් දුර්ගතීනම්වූ විවසව (හිස යටිකුරුව) වැටෙන හෙයින් විනිපාත නම්වූ නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්ත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්ත වූවාහු, වචනයෙන් කරන සුචරිතයෙන් යුක්ත වූවාහු, හිතින් කරන සුචරිතයෙන්

යුක්තවූවාහු, ආර්යයන්ට දොස් නොකියන්නාහු, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු, ශරීර භෙදයෙන්, මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද දුර්වර්ණවූද යහපත් ගති ඇත්තාවූද අයහපත් ගති ඇත්තාවූද කම්වූපරිදි පරලොව යන සත්ත්වයන් දැනගනිත්.

15. "ශාරීපුත්‍රය, තථාගත තෙම මිනිස් බව ඉක්මවා සිටි දිවැසින් චුත වන්නාවූද උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කම්වූ පරිදි මිය පරලොව යන්නාවූ සත්ත්වයන් දැනගනිත්ද එබඳුවූ චිත්ත සමාධිය ලබයි. මේ පින්වත් සත්වයෝ එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට දොස් කියන්නාහු, මිසදිටු වූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්මයන් සමාදන් වූවාහු මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ දුකට පමුණුවන හෙයින් දුර්ගතිනම් වූ, විවසව (හිස යටිකුරුව) වැටෙන හෙයින් විනිපාත නම්වූ නරකයෙහි උපන්නාහුය මේ පින්වත් සත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්ත වූවාහු, වචනයෙන් කරන සුචරිතයෙන් යුක්ත වූවාහු හිතින් කරන සුචරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු, ශරීර භෙදයෙන්, මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ, පිරිසිදු දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කම්වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් දකිත් යන යමක් වේද ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

**16.** "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. තථාගතතෙම කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත් ඵලය තමාම දැන ප්‍රත්‍යක්ෂ කරගෙන ඊට පැමිණ වාසය කරති. ශාරීපුත්‍රය, තථාගත තෙමේ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතව අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරත් යන යමක් වේද ශාරීපුත්‍රය, යම් බලයක් නිසා තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහනාද කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වාද, මේද තථාගතයන්ගේ තථාගත බලයක් වෙයි.

"ශාරීපුත්‍රය, යම් බලයන්ගෙන් යුක්තවූ තථාගත තෙමේ ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද පිරිස්හි සිංහනාද කෙරේද ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වයිද තථාගතයන්ගේ මේ ඒ තථාගත බලදසය වෙත්.

**17.** "ශාරීපුත්‍රය, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මට යමෙක් "ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවයක් ඇති කිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙසනා කරයි" කියා කියයි නම් ශාරීපුත්‍රය, (මේ පුද්ගලයා) ඒ වචනය දුරු නොකොට ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරු නොකොට (සිටියහොත්) ඔසොවා ගෙනෙන ලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය.

**18.** "ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්තවූ, සමාධියෙන් යුක්තවූ, ප්‍රඥාවෙන් යුක්තවූ මහණ තෙම යම්සේ මේ ජාතියේදීම රහත් වන්නේද මෙයත් එසේයයි කියමි (ඒ පුද්ගලයා) ඒ වචනය දුරු නොකොට, ඒ සිත වෙනස් නොකොට ඒ ගැනීම දුරු නොකොට (සිටියහොත්) ඔසොවා ගෙනෙනලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය.

**19.** "ශාරීපුත්‍රය, යම් විශාරද (තැති ගැන්මක් නැති) ඥානයන්ගෙන් යුක්තවූ තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයයි ප්‍රකාශ කෙරේද පිරිස්හි සිංහ නාදය කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්ම චක්‍රය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පවත්වාද තථාගතයන්ගේ මේ විශාරද ඥාන සතරක් වෙත්. කවර සතරක් ද යත්? (මාගේ) සම්‍යක් සම්බුදුබව ප්‍රකාශ කරන්නාවූ තොපට මා විසින් මේ ධර්මයෝ අවබොධ නොකරණ ලද්දාහුයයි ඒ කාරණයෙහිලා එකාන්තයෙන් මට ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව චොදනා කරන්නේය යන මේ කාරණය මම නොදකිමි. ශාරීපුත්‍රය, මම එබඳු පුද්ගලයෙක් හෝ එබඳු ධර්මයක් හෝ නොදක්නේ කිසිම භයක් නැත්තේ විශාරද බවට පැමිණියේ වාසය කරමි.

**20.** "ක්ෂිණාශ්‍රව භාවය (කෙලෙස් සියල්ල නැති කළ බව) ප්‍රකාශ කරන්නාවූ තොපට මේ කෙලෙස් නැති නොකරන ලදැයි මට ඒ කාරණයෙහිලා ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව චොදනා කරන්නේය යන මේ කාරණය මම නොදකිමි ශාරීපුත්‍රය, මම එබඳු පුද්ගලයෙක් හෝ එබඳු ධර්මයක් හෝ නොදක්නේ කිසිම භයක් නැත්තේ විශාරද බවට පැමිණියේ වාසය කරමි.

**21.** "යම් ඒ කරුණු කොටසක් අන්තරායකරයයි මා විසින් දක්වනලද නම් ඒ කරුණු සේවනය කරන්නාහට ඒවා අන්තරාය පිණිස නොවේ යැයි එකාන්තයෙන් මට ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව චොදනා කරන්නේය යන මේ කාරණය මම නොදකිමි. ශාරීපුත්‍රය, මම එබඳු කාරණයක් නොදක්නේ කිසිම භයක් නැත්තේ විශාරද බවට පැමිණියේ වාසය කරමි.

**22.** "යම් අර්ථයක් සඳහා ධර්මය දෙශනා කරනලද නම් ඒ ධර්මය ඊට අනුව පිළිපදින්නාහට දුක් කෙළවර කිරීම පිණිස නොපවතීයයි එකාන්තයෙන් මට ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව චොදනා කරන්නේය යන මේ කාරණය මම නොදකිමි. ශාරීපුත්‍රය මම

එබඳු කාරණයක් නොදක්නේ කිසිම භයක් නැත්තේ විශාරද බවට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, යම් විශාරද ධර්මයන්ගෙන් යුක්තවූ තථාගත තෙම තමා ශ්‍රෙෂ්ඨයැයි ප්‍රකාශ කෙරේද, පිරිස්හි සිංහ නාදය කෙරේද, ශ්‍රෙෂ්ඨ ධර්ම චක්‍රය පවත්වාද එබඳුවූ විශාරද ධර්ම සතර මේය. ශාරීපුත්‍රය, මෙසේ දන්නාවූ දක්නාවූ මට යමෙක් "ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවයක් ඇතිකිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනා කෙරේය"යි මෙසේ කියන්නේද, ශාරීපුත්‍රය, (ඒ පුද්ගලයා) ඒ වචනය දුරු නොකොට ඒ සිත වෙනස්නොකොට ඒ ගැන්ම දුරුනොකොට (සිටියහොත්) ඔසොවා ගෙනෙනලද බරක් බිම දමන්නේ යම් සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටේ. ශාරීපුත්‍රය ශීලයෙන් යුක්තවූ සමාධියෙන් යුක්තවූ ප්‍රඥාවෙන් යුක්තවූ මහණතෙම යම්සේ මේ ජාතියේදීම රහත් වන්නේද මෙයත් එසේයයි කියමි. (ඒ පුද්ගලයා) ඒ වචනය දුරුනොකොට, ඒ සිත වෙනස් නොකොට ඒ ගැනීම දුරු නොකොට (සිටියහොත්) ඔසොවා ගෙනෙන ලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටේ.

23. "ශාරීපුත්‍රය, මේ පිරිස් අටක් වෙත්. කවර අටක්ද යත්? ක්ෂත්‍රිය පිරිසය, බ්‍රාහ්මණ පිරිසය, ගෘහපති පිරිසය, ශ්‍රමණ පිරිස්ය, චාතුර්මහාරාජික පිරිසය, තව්තිසා පිරිසය, මාර පිරිසය, බ්‍රහ්ම පිරිසය. ශාරීපුත්‍රය, මේ පිරිස් අටය.

"ශාරීපුත්‍රය, මේ විශාරද ධර්ම (බිය නොවන කරුණු) හතරෙන් යුක්තවූ තථාගත තෙම මේ අට පිරිස වෙතට පැමිණෙත්ද ඇතුල්වෙත්ද ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් ක්ෂත්‍රියයන් ඇති පිරිස් වෙතට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැතිගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි, ශාරීපුත්‍රය,

මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් බ්‍රාහ්මණ පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳින ලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගන්නා බවට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් ගෘහපති පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් ශ්‍රමණ පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථා කළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බයක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

**24.** "ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් චාතුර්මහාරාජික පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැතිගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් තව්තිසා පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් මාර පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනා ලද පරිදිද කථා කළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

**25.** "ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් බ්‍රහ්ම පිරිස්වලට පැමිණි බව දනිමි. එහි මා විසින් හිඳිනාලද පරිදිද කථාකළ පරිදිද සාකච්ඡාවට පැමිණි පරිදිද දනිමි. ශාරීපුත්‍රය, එහිදී මට ඒකාන්තයෙන් බියක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේය යන මේ කාරණය නොදකිමි. ශාරීපුත්‍රය, මම මේ කාරණයද නොදක්නේ ක්ෂේමයට පැමිණියේ නිර්භය බවට පැමිණියේ තැති නොගැන්මට පැමිණියේ වාසය කරමි.

"ශාරීපුත්‍රය, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මට යමෙක් ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්යභාවයක් ඇතිකිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනාකරයි. ඒ ශ්‍රමණ ගෞතමයන් විසින් යම් අර්ථයක් හා ධර්මයක් දෙසනලදද ඒ ධර්මයතෙම ඊට අනුව ක්‍රියා කරන්නහුගේ දුක් විනාශකිරීම පිණිස පවතී"යි (කියන්නේද) ශාරීපුත්‍රය, ඒ (පුද්ගලයා) ඒ වචනය දුරුනොකොට ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරුනොකොට (සිටියහොත්) ඔසවා ගෙනෙන ලද බරක් බිම දමන්නේ යම්සේද

එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්තවූ, සමාධියෙන් යුක්තවූ, ප්‍රඥාවෙන් යුක්තවූ මහණතෙම යම්සේ මේ ජාතියේදීම රහත්වන්නේද, මෙයත් එසේයයි කියමි. (ඒ පුද්ගලයා) ඒ වචනය දුරුනොකොට, ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරුනොකොට (සිටියහොත්) ඔසවාගෙනන ලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය.

**26.** "ශාරීපුත්‍රය, මේ යොනි (සත්ත්වයන් උපදින වර්ග) සතරක්වෙත්. කවරසතරක්ද? අණ්ඩජයොනිය, (බිත්තරෙන් හටගන්නා සත්ත්ව වර්ගය) ජලාබුජ යොනිය, (ගර්භ කොෂය තුළ හටගන්නා සත්ත්ව වර්ගය) සංසෙදජ යොනිය (තෙත්වූ තැන්වල හටගන්නා සත්ත්ව වර්ගය) ඕපපාතික යොනිය (මැවුණාක් මෙන් උපදින සත්ත්ව වර්ගය) යන සතරයි. ශාරීපුත්‍රය, අණ්ඩජයොනිය කවරීද? ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්වයෝ බිත්තරය බිඳගෙන උපදිත්ද, ශාරීපුත්‍රය, මේ අණ්ඩජ යොනියයයි කියනු ලැබේ. ශාරීපුත්‍රය, ජලාබුජ යොනිය නම් කවරීද? ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්වයෝ ගර්භකොෂය බිඳ උපදිත්ද, ශාරීපුත්‍රය, මේ ජලාබුජ යොනියයයි කියනු ලැබේ ශාරීපුත්‍රය, සංසෙදජයොනිය කවරීද, ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්ව කෙනෙක් කුණු මසෙහි හෝ උපදිත්ද කුණුවූ ශරීරවල හෝ පිළුණුවූ කොමුපිඩු ආදියෙහි හෝ අපවිත්‍රාදිය දමන තැන හෝ කුණුදිය ගලාබසින ගම්දොර ගවරවළෙහි හෝ උපදිත්ද, මේ සංසෙදජ යොනියයයි කියනු ලැබේ. ශාරීපුත්‍රය, ඔපපාතික යොනිය කවරීද? දෙවියෝද නිරිසත්තුද ඇතැම් මනුෂ්‍යයෝද ඇතැම් ප්‍රෙතයෝද වෙත්. ශාරීපුත්‍රය, මේ ඔපපාතික යොනියයි කියනු ලැබේ. මේ යොනි සතරයි.

**27.** "ශාරීපුත්‍රය, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මට යමෙක් "ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්යභාවයක් ඇතිකිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනාකරයි. ඒ ශ්‍රමණ ගෞතමයන්

විසින් යමක් සඳහා ධර්මය දෙශනා කරනලදද ඒ ධර්මයතෙම ඊට අනුව ක්‍රියාකරන්නහුගේ දුක් විනාශකිරීම පිණිස පවතී" කියා කියයි නම් ශාරීපුත්‍රය, (ඒ පුද්ගලයා) ඒ වචනය දුරුනොකොට ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරුනොකොට (සිටියහොත්) ඔසොවා ගෙනෙනලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්තවූ සමාධියෙන් යුක්තවූ, ප්‍රඥාවෙන් යුක්තවූ මහණතෙම යම්සේ මේ ජාතියේදීම රහත් වන්නේද, මෙයත් එසේයයි කියමි. (ඒ පුද්ගලයා) ඒ වචනය දුරුනොකොට, ඒ සිත වෙනස් නොකොට ඒ ගැනීම දුරුනොකොට (සිටියහොත්) ඔසවා ගෙනෙනලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය.

28. "ශාරීපුත්‍රය, මේ ගති පසෙකි. කවර පසක්ද? නිරය අපාය, තිරිසන් අපාය, ප්‍රේත අපාය, මනුෂ්‍ය ලොකය, දිව්‍ය ලොකය, (යනපසයි) ශාරීපුත්‍රය, මම නිරයත් දනිමි. නිරයට යන මාර්ගයද නිරයට යන්නාවූ ප්‍රතිපදාවද දනිමි. යම්සේ පිළිපන්නේ ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරුගති ඇති යටිකුරුව වැටෙන නරකයෙහි උපදීද එයද දනිමි. ශාරීපුත්‍රය, මම තිරිසන් යොනියද දනිමි. තිරිසන් යොනියට යන මගත් දනිමි. තිරිසන් යොනියට යන්නාවූ ප්‍රතිපදාවත් දනිමි. යම්සේ පිළිපන්නේ ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි තිරිසන් යෝනියෙහි උපදීද, ඒ ද දනිමි ශාරීපුත්‍රය, මම ප්‍රෙත නිකායද දනිමි. ප්‍රෙතනිකායට යන මාර්ගයද දනිමි. යම්සේ පිළිපන්නේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි ප්‍රෙත නිකායෙහි උපදීද ඒ ප්‍රෙත නිකායට යන ප්‍රතිපදාවද දනිමි. ශාරීපුත්‍රය, මම මනුෂ්‍යයන්ද දනිමි. මිනිස් ලොවට යන මාර්ගයද දනිමි. යම්සේ පිළිපන්නේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි මනුෂ්‍ය ලොකයෙහි උපදීද, මිනිස්ලොවට යන්නාවූ ඒ ප්‍රතිපදාවද දනිමි. ශාරීපුත්‍රය, මම දෙවියන්ද දනිමි. දෙව් ලොවට යන මාර්ගයද දනිමි. යම්සේ පිළිපන්නේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදීද ඒ දෙව්ලොව යන

ප්‍රතිපදාවද දනිමි. ශාරීපුත්‍රය, මම නිවණද දනිමි. නිවණට යන මාර්ගයද දනිමි. යම්සේ පිළිපන්නේ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත් ඵල විමුක්තියද මේ ආත්මයෙහි තෙමේම ප්‍රඥාවෙන් දැක ඊට පැමිණ වාසය කෙරේද, ඒ නිර්වාණයට යන ප්‍රතිපදාවද දනිමි. ශාරීපුත්‍රය, මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ මරණින් මතු සැපයක් නැති දුක් ගති ඇති යටිකුරුව වැටෙන නරකයෙහි උපදින්නේද ඒ පුද්ගල තෙම එසේ පිළිපන්නේය, එසේම පවතියි, ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ සිතින් පිරිසිඳ දනිමි. පසු කාලයෙහි ඒ පුද්ගලයා සැපයක් නැති දුක් ඇති යටිකුරුව වැටෙන නිරයෙහි ඉපදී ඒකාන්තයෙන් දුක්වූ, තියුණුවූ කටුකවූ වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසුදු දිවැසින් දකින්නෙමි.

"ශාරීපුත්‍රය, පුරුෂයෙකුගේ උසටත් වඩා ගැඹුරුවූ, ගිනිදැල් නැති, දුම්නැති අඟුරු පිරුණු වළක් ඇත්තේය. එකල්හි ග්‍රීෂ්මයෙහි තැවුණාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ ක්ලාන්තවූ තැතිගත්තාවූ හටගත් පිපාසා ඇති පුරුෂයෙක් ඒ අඟුරුවළ කරා යන එකම මාර්ගයෙන් ඊට මුහුන ලා යන්නේය.

ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂ තෙම යම්සේ මේ අඟුරු වළටම එන්නේද එසේ පිළිපන්නේය. එසේම ගමන් කරයි. ඒ මාර්ගයට බැස සිටී (කියායි) පසුව අඟුරුවළෙහි වැටුනාවූ ඒකාන්තයෙන් දුක්වූ තියුණුවූ කෲරවූ වේදනාවන් විඳින ඔහු දක්නේය. ශාරීපුත්‍රය, මෙපරිද්දෙන්ම මම මේ ලොකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් යම්සේ මරණින් මතු සැපයක් නැති දුක් ගති ඇති යටිකුරුව වැටෙන නරකයෙහි උපදින්නේද ඒ පුද්ගලතෙම එසේ පිළිපන්නේය. එසේම පවතියි. ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ සිතින් පිරිසඳ ගනිමි. පසුව ඒ පුද්ගලයා සැපයක් නැති දුක් ඇති යටිකුරුව වැටෙන අපායෙහි ඉපදී ඒකාන්තයෙන් දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකින්නෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**29.** "ශාරීපුත්‍රය, මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම් සේ මරණින් මතු තිරිසන් යොනියෙහි උපදින්නේද එසේ පිළිපන්නේය. එසේම පවතියි. ඒ මාර්ගයට බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. ටික කලකට පසු ඒ පුද්ගලයා තිරිසන් යොනියෙහි ඉපදී දුක්වූ තියුණුවූ කෘරවූ වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසුදු දිවැසින් දකින්නෙමි, ශාරීපුත්‍රය, පුරුෂයෙකුගේ උසටත් වඩා ගැඹුරුවූ, අසුචියෙන් පිරුණාවූ අසුචිවළක් ඇත්තේය. ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිත වූ ක්ලාන්තවූ තැතිගත්තාවූ පිපාසා ඇති පුරුෂයෙක් ඒ අසුචි වළ කරා යන එකම මාර්ගයෙන් යන්නේය. ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂතෙම යම්සේ මේ අසුචිවළට වැටෙන්නේද එසේ පිළිපන්නේය. එසේම ගමන් කරයි. ඒ මාර්ගයට බැස සිටීයයි (කියායි) පසුව අසූචිවළෙහි වැටුනාවූ ඒකාන්තයෙන් දුක්වූ කටුකවූ කෘරවූ වේදනාවන් විඳින ඔහු දක්නේය. ශාරීපුත්‍රය, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් යම්සේ මරණින් මතු තිරිසන් යොනියෙහි උපදින්නේද ඒ පුද්ගලතෙම එසේ පිළිපන්නේය. එසේම පවතියි, ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. ටික කලකට පසුව ඒ පුද්ගලයා තිරිසන් යොනියෙහි ඉපද ඒකාන්තයෙන් දුක්වූ තියුණුවූ කටුක වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකින්නෙමි.

**30.** "ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ මරණින් මතු ප්‍රෙත නිකායෙහි උපදින්නේද එසේ මේ පුද්ගලතෙමේ පිළිපන්නේය. එසේ ඉරියව් පවත්වයි. ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. ටික කලකට පසු ඒ පුද්ගලයා ප්‍රෙතනිකායෙහි ඉපදී ඒකාන්තයෙන් දුක්වූ තියුණුවූ කටුකවූ බොහෝ දුක් වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්ම වූ පිරිසිදුවූ දිවැසින් දකිමි. ශාරීපුත්‍රය, විෂම බිමක හටගත් ඉතා තුනීවට පිහිටි කොළ දලු ඇති කබරසේ (තැනින් තැන) සෙවන ඇති ගසක් ඇත්තේය එකල ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ, ක්ලාන්තවූ,

තැතිගත්තාවූ, පිපාසා ඇති පුරුෂයෙක් තෙම ඒ ගස වෙත යන එකම මාර්ගයෙන් එයි. ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂතෙම යම්සේ මේ ගස යටටම එන්නේද එසේ පිළිපන්නේය. එසේම ගමන් කරයි. ඒ මාර්ගයට බැස සිටීයයි (කියායි) පසුව ඒ ගස සෙවනෙහි හුන්නාවූ හෝ නිදන්නාවූ හෝ බොහෝ දුක් වේදනාවන් විඳින ඔහු දක්නේය. ශාරීපුත්‍රය, මෙපරිද්දෙන්ම මට මේ ලොකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් යම්සේ මරණින් මතු ප්‍රේත යොනියෙහි උපදින්නේද ඒ පුද්ගල තෙම එසේ පිළිපන්නේය. එසේම පවතියි. ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. කලකට පසුව ඒ පුද්ගලයා ප්‍රේත යොනියෙහි දුක්වූ තියුණුවූ කටුකවූ බොහෝ වෙදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකින්නෙමි.

31. "ශාරීපුත්‍රය මට මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ මරණින් මතු මනුෂ්‍යයන් අතර උපදින්නේද මේ පුද්ගලතෙම එසේ පිළිපන්නේය. එසේම පවතියි. ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. කලකට පසු ඒ පුද්ගලයා මනුෂ්‍යයන් අතර ඉපදී සැප බහුල වේදනාවන් විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකිමි. ශාරීපුත්‍රය, සමබිම් පෙදෙසක හටගත් ඝනවූ කොළ දලු ඇති සෞම්‍ය සෙවනැලි ඇති ගසක් ඇත්තේය. එකල ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ ක්ලාන්තවූ තැතිගත්තාවූ හටගත් පිපාසා ඇති පුරුෂයෙක් ඒ ගස වෙත යන එකම මාර්ගයෙන් ගමන් කරයි. ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂතෙම යම්සේ මේ ගස කරා එන්නේද එසේ මේ පින්වත් පුරුෂතෙම පිළිපන්නේය. එසේම ගමන් කරමි. ඒ ගමටම බැස සිටියි. (කියායි) ටික කලකට පසු ඒ ගසයට සෙවනෙහි හිඳින්නාවූ හෝ නිදන්නාවූ හෝ සැප බහුල වේදනාවන් විඳින ඒ පුරුෂයා දක්නේය.

"ශාරීපුත්‍රය, එපරිද්දෙන්ම මම මේ ලොකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් යම්සේ මරණින් මතු මනුෂ්‍යයන් අතර උපදින්නේද

ඒ පුද්ගල තෙම එසේ පිළිපන්නේය. එසේම පවතියි. ඒ මාර්ගයටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. ටික කලකට පසුව ඒ පුද්ගලයා මිනිස් ලොව ඉපිද සැප බහුල වේදනා විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකින්නෙමි.

32. "ශාරීපුත්‍රය, මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ කායභෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේද, එසේ මේ පුද්ගලතෙම පිළිපන්නේය එසේ පවතියි. ඒ මගටම බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. ටික කලකට පසු ඒ පුද්ගලයා ස්වර්ග ලොකයෙහි ඉපදී ඒකාන්ත සැපවිඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ දිවැසින් දකිමි.

"ශාරීපුත්‍රය, ප්‍රාසාදයක් ඇත්තේය. එහි ඇතුළත පිටත ආලේපකළ, වාත රහිතවූ දමන ලද අගුල් ඇති, කුළුගෙයක් වන්නේය. එහි කොඳුපලස් අතුරණ ලද්දාවූ සුදු එළුලොම් පලස් අතුරණ ලද්දාවූ ඝන මල් ඇති එළුලොම් ඇතිරිලි අතුරන ලද්දාවූ කෙසෙල්මුව සමින් කළ උතුම් ඇතිරිලි අතුරන ලද්දාවූ උඩුවියන් සහිතවූ දෙපසෙහි තුබූ රතුකොට්ට ඇත්තාවූ ආසනයක් වන්නේය. ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ ක්ලාන්තවූ තැතිගත්තාවූ හටගත් පිපාසා ඇති පුරුෂයෙක් ඒ ප්‍රාසාදයම බලාගෙන ඊට පැමිණෙන එකම මාර්ගයෙන් එන්නේය. ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂතෙම යම්සේ මේ ප්‍රාසාදයටම එන්නේද එසේ පිළිපන්නේය. එසේම ගමන් කරයි. ඒ මඟට බැස සිටියි. (කියාය) පසු කලකදී ඒ පහයෙහි ඒ කුළුගෙයි ඒ ආසනයෙහි හිඳින්නාවූ හෝ නිදන්නාවූ හෝ ඒකාන්තයෙන් සැපවූ වේදනාවන් විඳින ඒ පුද්ගලයා දක්නේද, ශාරීපුත්‍රය, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ මරණින් මතු සුගති නම් වූ ස්වර්ග ලොකයෙහි උපදින්නේද එසේ මේ පුද්ගලතෙම පිළිපන්නේය. එසේ පවතියි. ඒ මගට බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ සිතින් පිරිසිඳ ගනිමි. ටික කලකට පසු ඒ පුද්ගලයා

ස්වර්ග ලොකයෙහි ඉපදී ඒකාන්ත සැප විඳිමින් සිටින බව මිනිස් ඇස ඉක්මවූ පිරිසුදු දිවැසින් දකිමි.

33. "ශාරීපුත්‍රය, මෙහි වනාහි මම ඇතැම් පුද්ගලයෙක් යම්සේ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහි තෙමේ ශ්‍රෙෂ්ඨ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට එළඹ වාසය කරන්නේද එසේ මේ පුද්ගලතෙම පිළිපන්නේය. එසේම පවතියි. ඒ මඟට බැස සිටීයයි ඒ පුද්ගලයාගේ හිත මගේ හිතින් පිරිසිඳ දනිමි. කලකට පසු ඔහු කෙලෙස් නැතිකිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත් ඵලසමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහි තෙමේ ශ්‍රෙෂ්ඨ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වාසය කරන බව මිනිස් ඇස ඉක්මවූ පිරිසිදු දිවැසින් දකිමි. ශාරීපුත්‍රය, පිරිසිදු දිය ඇති, සැපදායක දිය ඇති, සීතල දිය ඇති, සුදුවැලිතලා ඇති මනාව පිහිටි තොටවල් ඇති, සිත්කලුවූ පොකුණක් ඇත්තේය. ඒ පොකුණට නුදුරෙහි වන ලැහැබක්ද වෙයි. එසේ ඇති කල්හි ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ ක්ලාන්තවූ තැතිගත්තාවූ පිපාසා ඇති පුරුෂයෙක් එම පොකුණට පැමිණෙන එකම මාර්ගයෙන් පොකුණ කරා එන්නේය. ඇස් ඇති පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂතෙම යම්සේ මේ පොකුණටම එන්නේද, එසේ පිළිපන්නේය. එසේම ගමන් කරයි. ඒ මඟට බැස සිටියි (කියායි) ඉන්පසු මෑත කලක ඒ පොකුණට බැස නා වතුර බී සියලු වෙහෙස ක්ලාන්ත දැවිලි මැඩ එතරට ඒ වන ලැහැබෙහි හිඳින්නාවූ හෝ නිදන්නාවූ හෝ ඒකාන්තයෙන් සැපවූ වේදනාවන් විඳින ඒ පුද්ගලයා දක්නේය. ශාරීපුත්‍රය, එපරිද්දෙන්ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්සේ කෙලෙස් නැතිකිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත්ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහි තෙමේ විශෙෂ ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට එළඹ වාසය කරන්නේද එසේ මෙතෙම පිළිපන්නේය. එසේ පවතියි. ඒ මඟට බැස සිටීයයි මගේ හිතින් ඔහුගේ හිත පිරිසිඳ දනිමි. ටික කලකට පසු ඔහු කෙලෙස් නැතිකිරීමෙන් කෙලෙස් රහිතවූ අර්හත් ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහි තෙමේ

විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වසන්නාවූ ඒකාන්ත සැප වේදනා විඳින ඒ පුද්ගලයා දකින්නෙමි. ශාරීපුත්‍රය, මේ වනාහි ගති පසය.

"ශාරීපුත්‍රය, යමෙක් වනාහි මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මට යමෙක් ශ්‍රමණ ගෞතමයන්ට මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්ය භාවයක් ඇති කිරීමට සමර්ථ විශෙෂ නුවණක් නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම කල්පනාවෙන් සලකා නුවණින් විමසා තමහට වැටහෙන්නාවූ ධර්මයක් දෙශනා කෙරේය'යි කියයි නම් ශාරීපුත්‍රය, (ඒ පුද්ගලයා) ඒ වචනය දුරු නොකොට ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරු නොකොට (සිටියහොත්) ඔසවා ගෙනෙන ලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකහි වැටෙන්නේය. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්තවූ, සමාධියෙන් යුක්තවූ, ප්‍රඥාවෙන් යුක්තවූ මහණතෙම යම්සේ මේ ජාතියේදීම රහත් වන්නේද, මෙයත් එසේයයි කියමි. (ඒ පුද්ගලයා) ඒ වචනය දුරු නොකොට, ඒ සිත වෙනස් නොකොට ඒ ගැන්ම දුරු නොකොට (සිටියහොත්) ඔසවා ගෙනෙන ලද බරක් බිම දමන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකයෙහි වැටෙන්නේය.

34. "ශාරීපුත්‍රය, මම අඞ්ග සතරකින් යුක්තවූ වීර්යය කළ බව දනිමි. තපස් ඇත්තේ තපස් ඇත්තවුන් අතුරෙන් කෙළවරට ගිය තපස් ඇත්තේ වීමි. රළු පිළිපැදීම් ඇත්තේ රළු පිළිපැදීම් ඇත්තවුන් අතුරෙන් කෙළවරට ගිය රළු පිළිපැදීම් ඇත්තේ වීමි, පාපයට පිළිකුල් කරන්නේ පාපයට පිළිකුල් කරන්නවුන් අතුරෙන් කෙළවරට පැමිණියේ වීමි. උතුම් විවේක ඇත්තේ උතුම් විවේක ඇත්තවුන් අතරින් උසස්ම තැනට පැමිණියේ වීමි. ශාරීපුත්‍රය, මා රැක්ක ඒතපස් මෙසේය. හොඳ පැවතුම් නැති නිර්වස්ත්‍රයෙක් වෙමි. දිවෙන් අතලොවින්නේ නොහොත් මළපහකොට (දණ්ඩක්යයි හිතාගෙන) අතින් පිසින්නේ වෙමි. ආහාර දීම පිණිස එව වහන්සැයි කී කල්හි නොපිළිගන්නේ වෙමි. සිටුව වහන්සැයි කියා දුන්දෙය නොපිළිගනිමි. පෙරටුව ගෙණෙන ලද ආහාරය නොපිළිගනිමි. මා උදෙසා කරණ ලද්ද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොපිළිගනිමි. ආරාධනා කර දුන් බත නොඉවසමි. ඒ මම කළගෙඩි කටින් ගෙන දුන් දෙය නොපිළිගනිමි. සැලිකටින් ගෙණ දුන් දෙය නොපිළිගනිමි. එළිපත අතරකොට සිට දුන්දෙය නොපිළිගනිමි. දණ්ඩක් අතරකොට සිට දුන්දෙය නොපිළිගනිමි. මෝල්ගසක් අතරකොට සිට දුන්දෙය නොපිළිගනිමි. අනුභව කරන්නාවූ දෙදෙනෙකුගෙන් එකෙකු දුන්දෙය නොපිළිගනිමි. ගැබිනිය විසින් දුන්දෙය නොපිළිගනිමි. කිරි පොවන්නිය විසින් දුන්දෙය නොපිළිගනිමි. පුරුෂයෙකු වෙත ගිය තැනැත්තිය විසින් දුන්දෙය නොපිළිගනිමි. සම්මාදම් කළ දෙයින් කිසිවක් නොපිළිගනිමි. යම් තැනක බල්ලෙක් එළඹ සිටියේද (ඔහුට නොදී) එහිදී දුන් දෙය නොපිළිගනිමි. යම් තැනක මැස්සෝ කැටි කැටිව හැසිරෙත්ද එහිදී දුන් දෙය නොපිළිගනිමි. දියමස් අනුභව නොකරමි. ගොඩමස් අනුභව නොකරමි. සුරාව නොබොමි මේරය (මල්යුසින් කළ මත්පැන්) නොබොමි. කාඩිදිය නොබොමි.

ඒ මම පිඬුසිඟීමට එකම ගෙයක් ඇත්තේ හෝ වෙමි. එකම බත් පිඩකින් යැපෙන්නේ හෝ වෙමි. ගෙවල් දෙකක පිඬු සිඟන්නේ හෝ වෙමි. බත් පිඬු දෙකින් යැපෙන්නේ හෝ වෙමි. ගෙවල් සතක පිඬු සිඟන්නේ හෝ වෙමි. බත් පිඬු සතකින් යැපෙන්නේ හෝ වෙමි. එක් කුඩා බත් තැටියකින් යැපෙන්නේ හෝ වෙමි. බත් තැටි දෙකකින් යැපෙන්නෝ හෝ වෙමි. බත් තැටි සතකින් යැපෙන්නේ හෝ වෙමි. එක දවසකට වරක් හෝ ආහාර ගනිමි. දෙදිනකට වරක් හෝ ආහාර ගනිමි. සත්දිනකට වරක් හෝ ආහාර ගනිමි. මෙපරිද්දෙන් අඩමසකට වරක් ආහාර ගනිමින්ද වාර භොජනයෙහි යෙදී වාසය කරමි.

35. "ඒ මම අමුපලා කන්නේත් වෙමි. බඩහමු කන්නේත් වෙමි. උඟුරුහැල් (වනයෙහි ඉබේට හැදෙන වී වර්ගයක්) කන්නේත් වෙමි. සම් කැලි කන්නේත් වෙමි. මැලියම් කන්නේත් වෙමි. කුඩු අනුභව කරන්නේත් වෙමි. දන්කුඩ කන්නේත් වෙමි. තල් ආදී මුරුවට කන්නේත් වෙමි. ලා තණකොළ කන්නේත් වෙමි. වනමුල් ඵල ආහාර කොට ඇත්තේ ඉබේ වැටුණ ඵල අනුභව කරන්නේත් යැපෙමි. ඒ මම හන වැහැරිත් අඳිමි. මිශ්‍ර

වස්ත්‍රත් අඳිමි. මිනියෙන් ඉවත් ළ වස්ත්‍රත් අඳිමි. පාංශුකූළ වස්ත්‍රත් අඳිමි. ගස්වල පතුරුත් අඳිමි. අඳුන්දිවි සම් ද දරමි. මැදින් පැලූ අඳුන්දිවි සම්ද අඳිමි. කුසතණ වැහැරීද අඳිමි. නියඳ වැහැරිද අඳිමි. පට්ටාද අඳිමි. ඉසකේවලින් කළ කම්බිලිද දරමි. බකමුහුණු පිහාටුවලින් කළ වැහැරීද දරමි. ඉසකේ රැවුල් උගුල්ලන්නෙක් වෙමි. ඉසකේ රැවුල් ඉගිල්ලීමෙහි යෙදුනේ වෙමි. ආසනවල වාඩිනොවන්නේ උඩුකුරුව සිටියේ වෙමි. උඩුකුරුව සිටීමේ වීර්යයෙන් යුක්තවූයේ උඩුකුරුව සිටින්නේ වෙමි. කටු යහනෙහි හේත්තුවන්නේ වෙමි. කටු ඇතිරිලි මතුයෙහි සයනය කරමි. සවස තුන්වැනි කොට (දවසට තුන්වරක්) දියට බැසීමෙහි යෙදුනේ වාසය කරමි. මෙසේ නොයෙක් අන්දමින් ශරීරය තවන පෙළන තපස්කම්වල යෙදී වාසය කෙළෙමි. ශාරීපුත්‍රය, මාගේ තපස්කම් මෙසේ විය.

"ශාරීපුත්‍රය, මාගේ කටුක පැවතුම් මෙසේය. අවුරුදු ගණනක් මුළුල්ලේ බැඳුන දූවිලි ශරීරයෙහි රැස්වී පතුරු සෑදුනේ වෙයි. ශාරීපුත්‍රය, අවුරුදු ගණනක් මුළුල්ලේ පොතු එක්වූ තිඹිරිකණුවක් යම්සේ හටගත් පතුරු ඇත්තේ වේද ශාරීපුත්‍රය, එපරිද්දෙන්ම මාගේ ශාරීරයෙහි අවුරුදු ගණනක් මුළුල්ලේ බැඳුණු දූවිලි ශරීරයෙහි රැස්වී පතුරුසෑදුනේ වෙයි. ශාරීපුත්‍රය, ඒ මට මෙසේ කල්පනා නොවෙයි. මම මේ දූවිලි අතින් පිසදමන්නෙම් නම් අන්කෙනෙක් හෝ අතින් පිස දමන්නාහු නම් ඉතායෙහෙකැයි කියා නොසිතෙයි. ශාරීපුත්‍රය, මේ වනාහි මාගේ කටුක පැවැත්මයි.

"ශාරීපුත්‍රය, මාගේ පාපයට පිළිකුල් බව මෙසේ වෙයි. ශාරීපුත්‍රය, ඒ මම සිහි ඇතිවම ඉදිරියට යමි. සිහි ඇතිව පෙරළා එමි. මම නුසුදුසු තැනකට පැමිණීමෙන් කුඩා ප්‍රාණීන් විනාශයට පත් නොකරන්නෙමි කියා දියබින්දුවක්* කෙරෙහිද මාගේ දයාව පැතිර සිටියා වෙයි. ශාරීපුත්‍රය මෙය මාගේ පාපයෙහි පිළිකුල් බව වෙයි.

"ශාරීපුත්‍රය, මෙය මාගේ උසස් විවේක බව වේ. ශාරීපුත්‍රය, ඒ මම එක්තරා වනයකට වැද වෙසෙමි. යම් විටක ගොපල්ලෙකු

* ඒ තාපසයෝ වතුර බිංදු ගල්කැට ආදියත් කුඩා ප්‍රාණීන් මෙන් සලකති.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හෝ අවශෙෂ සිවුපාවුන් රකින්නෙකු හෝ තණ ගෙනයන්නෙකු හෝ දර ගෙන යන්නෙකු හෝ වනයේ කටයුතු කරන්නෙකු හෝ දකිම්ද, (එවිට මම) සිටි වනයෙන් අන් වනයකටද ලැහැබින් ලැහැබටද බෑවුමෙන් බෑවුමටද ගොඩින් ගොඩටද පනිමි. ඊට හේතු කවරේද? ඔවුහු මා නොදකිත්වා, මමද ඔවුන් නොදකිම්වා කියා (සිතාගෙනය.) ශාරීපුත්‍රය, යම්සේ වනවැසි මුවෙක් මිනිසුන් දැක වනයෙන් වනයට ලැහැබින් ලැහැබට බෑවුමෙන් බෑවුමට ගොස් පනින්නේද එමෙන් මමද ගොපල්ලෙකු හෝ අවශෙෂ සිවුපාවුන් රකින්නෙකු හෝ තණ ගෙන යන්නෙකු හෝ දර ගෙනයන්නෙකු හෝ වනයේ කටයුතු කරන්නෙකු හෝ දකිම්ද, (එවිට මම) සිටි වනයෙන් අන් වනයකටද ලැහැබින් ලැහැබටද බෑවුමෙන් බෑවුමටද ගොඩින් ගොඩටද පනිමි. ඊට හේතු කවරේද? ඔහු මා නොදකිත්වා, මමද ඔවුන් නොදකිම්වා කියා (සිතාගෙනය) ශාරීපුත්‍රය, මෙය උසස් විවේක ඇති බව වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම නික්මුණු ගවයන් ඇති ගොපළුන් නැති යම් ඒ ගාල් වෙත්ද එහි චතුගුණ්ඩිකව (දෙදණ දෙවැළ මිටි බිම තබා) දෙනුන් වෙතට කිරිබීමට පැමිණෙන්නාවූ බාලවූ වස්සන්ගේ යම් ඒ ගොම ඇත්ද ඒ ගොම අනුභව කරමි. ශාරීපුත්‍රය, මළමුත්‍රකොට අවසානවීමට පෙර තමාගේම මළ මුත්‍ර ගෙන අනුභව කරමි. ශාරීපුත්‍රය, මෙය මාගේ විශෙෂ මහත් භෝජනය වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම කිසියම් භයානකවූ වන ලැහැබකට පිවිස වෙසෙමි. ශාරීපුත්‍රය, ඒ භයානක වන ලැහැබෙහි භයානක කම මෙසේය. යම්කිසි වීතරාගී නොවූවෙක් (රාග සහිත කෙනෙක්) ඒ වන ලැහැබට ගියහොත් බොහෝසෙයින් ලොමු ඩැහගනිත්. ශාරීපුත්‍රය, ඒ මම පිනි වැටෙන කාලයවූ නවන් මැදින් දෙමස අතර අටදවසෙහිවූ හිම ඍතුවේ ශීතල අධිකවූ යම් ඒ රාත්‍රීහු වෙත්ද, එබඳු රාත්‍රීන්හි එළිමහනේ වාසය කරමි. දවල් වන ලැහැබෙහි වාසය කරමි. ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසයෙහි දවල් එළිමහනේ වාසය කරමි. රාත්‍රියෙහි වන ලැහැබෙහි වාසය කරමි. ශාරීපුත්‍රය, මට පෙර නොඇසූ මේ ආශ්චර්යවූ ගාථාව වැටහිණ,

"ශුද්ධිය සෙවීමෙහි යෙදුනු ඒ මම උෂ්ණයෙන් අතිශයින් තැවුනේ සිහිලක් නොසෙවීමි. අතිශයින් සීතලවූ භයානක වනයෙහි තනියම නග්නව වාසය කරමිනුත් ගින්න වෙත නොගියෙමි."

"ශාරීපුත්‍රය, ඒ මම සොහොනෙහි මිනී ඇට කොට්ට වශයෙන් තබා ශයනය කරමි. ශාරීපුත්‍රය, ගවපාලක දරුවෝ මා වෙත පැමිණ (ඇඟට) කැසි කාරා දමත්, මුත්‍රද කරත්. පස්ද වීසිකරත්, කන්සිදුරුවල ඉරටුගසත්, ශාරීපුත්‍රය, මම වනාහි ඔවුන් කෙරෙහි පවිටු සිතක් ඉපදවූ බවත් නොදනිමි. ශාරීපුත්‍රය, මෙය මාගේ උපෙක්ෂා විහරණයයි.

**36.** "ශාරීපුත්‍රය, ආහාරය කරණකොටගෙණ ශුද්ධියවේයයි කියන්නාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය. ඔව්හු (අපි) ඩෙබරවලින් යැපෙමුයයි කියති. ඔව්හු ඩෙබරද කත්, ඩෙබර කුඩුද කත්, ඩෙබර මිරිකා ගත් දියද බොත්. ඩෙබරවලින් කළ නානාප්‍රකාරවූ ආහාරද අනුභව කරත්. ශාරීපුත්‍රය, මම වනාහි එකම ඩෙබර ඵලයක් ආහාර කොට ගත් බව දනිමි. ශාරීපුත්‍රය, ඒ කාලයේ ඩෙබර ගෙඩි බොහෝ ලොකුවට තිබෙන්නට ඇතැයි තොපට කල්පනා වෙනවාද, ශාරීපුත්‍රය, එසේ නොසිතිය යුතුය. එකල්හිද ඩෙබර ගෙඩිය අද තරම්ම විය.

"ශාරීපුත්‍රය, එකම ඩෙබර ඵලය ආහාරකොට ගන්නාවූ ඒ මාගේ ශරීරය අතිශයින් කෙට්ටු බවට පැමිණියේ වෙයි. ඒ ස්වල්ප ආහාරය ඇති බව නිසාම මගේ ශරීර අවයව අසූ අවුරුදු ගිය වැල් පුරුක් හෝ කලුවැල් පුරුක් හෝ යම්සේද එපරිද්දෙන්ම විය. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ නිසීදන මාංශය (තට්ටම) ඔටුවෙකුගේ කුරයක් යම්සේද එසේ විය. රැහැණින් අමුණනලද ලීවැටිය යම්සේද එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ කොඳු ඇටය උඩට යටට නැමුනේ වෙයි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ ඉළඇට දිරූ ශාලාවක පරාල යම්සේ උඩු යටිව කැඩී නැමුනාහු වෙත්ද එපරිද්දෙන්ම උඩු යටිව නැමී වැටුණාහු වෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඇස්වල කළු ඉංගිරියා ගැඹුරු ළිඳක

තාරකා ඡායා ගැඹුරට ගියාහු ඇතුළට කාවැදී දක්නාලැබෙත්ද එපරිද්දෙන්ම ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු දක්නා ලැබෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඉසේ හම අමුවෙන් කැපූ තිත්ත ලබු ගෙඩියක් අව්වෙන් හා සුළඟින් ඇකිළී මලානිකවී යන්නේ යම්සේද එපරිද්දෙන්ම ඇකිළී මලානික වූයේ වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම බඩ අතගාන්නෙමියි පිටකොන්දම අතගාමි. පිටකොන්ද අතගාන්නෙමියි බඩම අතගාමි. (කවර හෙයින්ද?) ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ බඩේ සම පිටකොන්දට ඇලී පැවති හෙයිනි.

"ශාරීපුත්‍රය, මම මළ හෝ මුත්‍ර හෝ පහ කරන්නෙමියි (වාඩිවූ කල) එහිම යටිකුරුව ඇදවැටෙමි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය ශාරීපුත්‍රය, ඒ මම ඒ ශරීරය අස්වසන්නේ අතින් ශරීරාවයව පිරිමදිමි ශාරීපුත්‍රය, අතින් අවයව පිරිමදින්නාවූ ඒ මාගේ ශරීරයෙන් මුල් කුණුවූ ලොම් වැටෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය.

37. "ශාරීපුත්‍රය, ආහාරය කරණකොට ගෙන ශුද්ධිය වේයයි කියන්නාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුය. ඔවුහු අපි මුං ඇටවලින් යැපෙමුයයි කියති. ඔව්හු මුං ඇටද කත් මුං ඇට කුඩුද කත්. මුං ඇට තම්බාගත් දියද බොත්. මුං ඇටවලින් කළ නානාප්‍රකාරවූ ආහාර අනුභව කරත්. ශාරීපුත්‍රය, මම වනාහි එකම මුං ඇටයක් ආහාරකොට ගත් බව දනිමි. ශාරීපුත්‍රය, ඒ කාලයේ මුං ඇට මහත්ව තිබෙන්නට ඇතැයි තොපට කල්පනා වෙනවාද, ශාරීපුත්‍රය, එසේ නොසිතිය යුතුය, එකල්හිදු මුං ඇට අද තරම්ම විය.

"ශාරීපුත්‍රය, එකම මුං ඇටයක් ආහාර කොට ගන්නාවූ ඒ මාගේ ශරීරය අතිශයින් කෙට්ටු බවට පැමිණියේ වෙයි. ඒ ස්වල්ප ආහාරය ඇති බව නිසාම මගේ ශරීර අවයව අසූ අවුරුදු ගිය වැල් පුරුක් හෝ කලුවැල් පුරුක් හෝ යම්සේද එපරිද්දෙන්ම විය. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ නිසීදන මාංශය (තට්ටම) ඔටුවෙකුගේ කුරයක් යම්සේද එසේ විය. ලුණුවෙන්

අමුණන ලද ලී වැටිය යම්සේද එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ කොඳු ඇටය උඩට යටට නැමුනේ වෙයි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ ඉළඇට දිරූ ශාලාවක පරාල යම්සේ උඩුයටිව කැඩී නැමුනාහු වෙත්ද එපරිද්දෙන් උඩුයටිව නැමී වැටුණාහු වෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඇස්වළ කළු ඉංගිරියා ගැඹුරු ලිඳක තාරකා ඡායා ගැඹුරට ගියාහු ඇතුළට කාවැදී දක්නා ලැබෙත්ද එපරිද්දෙන්ම ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු දක්නා ලැබෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඉසේ හම අමුවෙන් කැපූ තිත්ත ලබු ගෙඩියක් අව්වෙන් හා සුළඟින් ඇකිළී මලානිකවී යන්නේ යම්සේද එපරිද්දෙන්ම ඇකිළී මලානික වූයේ වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම බඩ අතගාන්නෙමියි පිටිකොන්දම අතගායි. පිටිකොන්ද අතගාන්නෙමියි. බඩම අතගාමි. (කවර හෙයින්ද?) ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ බඩේ සම පිටකොන්දට ඇලී පැවති හෙයිනි.

"ශාරීපුත්‍රය, මම මළ හෝ මුත්‍ර හෝ පහ කරන්නෙමියි (වාඩිවූකල) එහිම යටිකුරුව ඇදවැටෙමි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය. ශාරීපුත්‍රය, ඒ මම ඒ ශරීරය අස්වසන්නේ අතින් ශරීරාවයව පිරිමදිමි. ශාරීපුත්‍රය, අතින් අවයව පිරිමදින්නාවූ ඒ මාගේ ශරීරයෙන් මුල්කුණුවූ ලොම් වැටෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය.

38. "ශාරීපුත්‍රය, ආහාරය කරණකොට ගෙන ශුද්ධිය වේයයි කියන්නාවූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහුය. ඔවුහු අපි තලවලින් යැපෙමුයයි කියති. ඔවුහු තලද කත්. තල කුඩුද කත්. තල මිරිකා ගත් දියද බොත්. තලවලින් කළ ආහාරද අනුභව කරත්. ශාරීපුත්‍රය, මම වනාහි එකම තල ඇටයක් ආහාර කොට ගත් බව දනිමි. ශාරීපුත්‍රය, ඒ කාලයේ තල ඇට බොහෝ ලොකුවට තිබෙන්නට ඇතැයි තොපට කල්පනා වෙනවාද, ශාරීපුත්‍රය, එසේ නොසිතිය යුතුය. එකල්හිදු තල ඇට අද තරම්මය.

"ශාරීපුත්‍රය, එකම තල ඇටය ආහාර කොට ගන්නාවූ ඒ මාගේ ශරීරය අතිශයින් කෙට්ටු වූයේ වෙයි. ඒ ස්වල්ප ආහාරය ඇති බව නිසාම මගේ ශරීර අවයව අසූ අවුරුදු ගිය වැල් පුරුක් හෝ කලුවැල් පුරුක් හෝ යම්සේද එපරිද්දෙන්ම විය. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ නිසීදන මාංශය (තට්ටම) ඔටුවකුගේ කුරයක් යම්සේද එසේ විය. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ කොඳුඇටය ලණුවකින් අමුණනලද ලී වැටිය යම්සේද එපරිද්දෙන්ම උඩට යටට නැමුනේ වෙයි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ ඉළ ඇට දිරාගිය ශාලාවක පරාල යම්සේ උඩුයටිව කැඩී නැමුනාහු වෙත් ද එපරිද්දෙන් උඩුයටිව නැමී වැටුණාහු වෙත්. ඒ ස්වල්ප ආහාර ඇතිබව නිසාම මගේ ඇස්වල කළු ඉංගිරියා ගැඹුරු ළිඳක තාරකා ඡායාව ගැඹුරට ගියාහු ඇතුළට කාවැදී දක්නා ලැබෙත්ද එපරිද්දෙන්ම ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු දක්නා ලැබෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඉසේ හම අමුවෙන් කැපූ තිත්ත ලබුගෙඩියක් අව්වෙන් හා සුළඟින් ඇකිළී මලානිකවී යන්නේ යම්සේද එපරිද්දෙන්ම ඇකිළී මළානික වූයේ වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම බඩ අතගාන්නෙමියි පිටිකොන්දම අතගාමි. පිටිකොන්ද අතගාන්නෙමියි. බඩම අතගාමි. (කවර හෙයින්ද?) ඒ ස්වල්ප ආහාර ඇතිබව නිසාම මගේ බඩේ සම පිටි කොන්දට ඇලී පැවතී හෙයිනි.

"ශාරීපුත්‍රය, මම මළ හෝ මුත්‍ර හෝ පහකරන්නෙමියි (වාඩිවූ කල) එහිම යටිකුරුව ඇදවැටෙමි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය. ශාරීපුත්‍රය, මම ඒ ශරීරය අස්වසන්නේ අතින් ශරීරාවයව පිරිමදිමි. ශාරීපුත්‍රය, අතින් අවයව පිරිමදින්නාවූ ඒ මාගේ ශරීරයෙන් මුල් කුණුවූ ලොම් වැටෙත් ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය.

**39.** "ශාරීපුත්‍රය, ආහාරය කරණකොට ගෙන ශුද්ධිය වේයයි කියන්නාවූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහුය. ඔවුහු අපි සහල්වලින් යැපෙමුයයි කියති. ඔවුහු බත්ද කත් සහල් සුණුද කත්, සහල් මිරිකා ගත් දියද බොත්. සහල්වලින් කළ නානාප්‍රකාරවූ ආහාරද අනුභව කරත්. ශාරීපුත්‍රය මම වනාහි

එකම සහල් ඇටයක් ආහාර කොට ගත් බව දනිමි. ශාරීපුත්‍රය, ඒ කාලයේ සහල් ඇට බොහෝ ලොකුවට තිබෙන්නට ඇතැයි තොපට කල්පනා වෙනවාද, ශාරීපුත්‍රය, එසේ නොසිතිය යුතුය. එකල්හිදු සහල් ඇටය අද තරම්ම විය.

"ශාරීපුත්‍රය, එකම සහල් ඇටයක් ආහාරකොට ගන්නාවූ ඒ මාගේ ශරීරය අතිශයින් කෙට්ටු වූයේ වෙයි. ඒ ස්වල්ප ආහාරය ඇති බව නිසාම මගේ ශරීර අවයව අසූ අවුරුදු ගිය වැල්පුරුක් හෝ කලු වැල්පුරුක් හෝ යම්සේද එපරිද්දෙන්ම විය ඒ ස්වල්ප ආහාර ඇතිබව නිසාම මාගේ නිසීදන මාංශය (තට්ටම) ඔටු කුරයක් යම්සේද එසේ විය. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ කොඳුඇටය ලණුවකින් අමුණන ලද ලීවැටියක් සේ උඩට යටට නැමුනේ වෙයි. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මාගේ ඉළඇට දිරාගිය ශාලාවක පරාල යම්සේ උඩුයටිව කැඩී නැමුනාහු වෙත්ද එපරිද්දෙන් උඩු යටිව නැමී වැටුණාහු වෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඇස්වල කළු ඉංගිරියා ගැඹුරු ලිඳක තාරකා ඡායා ගැඹුරට ගියාහු ඇතුළට කාවැදී දක්නා ලැබෙත්ද එපරිද්දෙන්ම ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු දක්නා ලැබෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ ඉසේ හම අමුවෙන් කැපූ තිත්ත ලබු ගෙඩියක් අව්වෙන් හා සුළඟින් ඇකිළී මලානිකවී යන්නේ යම්සේද එපරිද්දෙන්ම ඇකිළී මලානික වූයේ වෙයි.

"ශාරීපුත්‍රය, ඒ මම බඩ අතගාන්නෙමියි පිටිකොන්දම අතගාමි. පිටිකොන්ද අතගාන්නෙමියි බඩම අතගාමි. (කවර හෙයින්ද?) ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාම මගේ බඩේ සම පිටකොන්දට ඇලී පැවති හෙයිනි.

"ශාරීපුත්‍රය, මම මළ හෝ මුත්‍ර හෝ පහ කරන්නෙමියි (වාඩිවූවිට) එහිම යටිකුරුව ඇදවැටෙමි. ඒ ස්වල්ප ආහාර ඇතිබව නිසාමය. ශාරීපුත්‍රය, ඒ මම ඒ ශරීරය අස්වසන්නේ අතින් ශරීරාවයව අතගාමි. ශාරීපුත්‍රය, අතින් අවයව පිරිමදින්නාවූ ඒ මාගේ ශරීරයෙන් මුල් කුණුවූ ලොම් වැටෙත්. ඒ ස්වල්ප ආහාර ඇති බව නිසාමය.

"ශාරීපුත්‍රය, මම ඒ පැවතුම්වලින්ද ඒ දුෂ්කරක්‍රියාවලින්ද මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවයක් ඇතිකිරීමට සමර්ථ විශෙෂ නුවණක් නොලැබීමි. කවර හෙයින්ද යත්? දැන් මා විසින් ආර්යවූ නිවනට පමුණුවන්නාවූ, ඊට අනුව පිළිපදින්නාහුගේ දුක් කෙළවර කරන්නාවූ යම් ප්‍රඥාවක් අවබොධ කරන ලද්දේ වේද ඒ ප්‍රඥාව අවබොධ නොකළ බැවිනි.

**40.** "ශාරීපුත්‍රය සසර සැරිසරීමෙන් ශුද්ධිය වේයයි කියන්නාවූ ඒ ලබ්ධිය ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය. ශාරීපුත්‍රය, මේ දීර්ඝකාලයෙහි සුද්ධාවාස දෙව්ලොව හැර මා විසින් නොවසන ලද සංසාරයක් නැත. ශාරීපුත්‍රය, මම ශුද්ධාවාස දෙව්ලොව හැසුරුනෙම් නම් මේ ලොකයට නැවත නොඑන්නෙමි.

"ශාරීපුත්‍රය, බොහෝකොට ඉපදීමෙන් ශුද්ධිය වේයයි කියන්නාවූ ඒ ලබ්ධිය ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය. ශාරීපුත්‍රය, මේ දීර්ඝ කාලයෙහි ශුද්ධාවාස දෙව්ලොව හැර මා නූපන් උත්පත්තියක් නැත. ශාරීපුත්‍රය, ශුද්ධාවාස දෙව්ලොව ඉපදුනේ නම් මේ ලොකයට නැවත නොඑන්නෙමි.

"ශාරීපුත්‍රය, බොහෝ කොට විසීමෙන් ශුද්ධිය වේයයි කියන්නාවූ ඒ ලබ්ධිය ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය. ශාරීපුත්‍රය මේ දීර්ඝකාලයෙහි ශුද්ධාවාස දෙවියන් හැර මා නොවිසූ සත්ත්වාවාසයක් නැත. ශාරීපුත්‍රය, මම ශුද්ධාවාස දෙව්ලොව විසූයෙම් නම් මේ ලොකයට නැවත නොඑන්නෙමි. ශාරීපුත්‍රය බොහෝ යාග කිරීමෙන් ශුද්ධිය වේයයි කියන්නාවූ ඒ ලබ්ධිය ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය මේ දීර්ඝකාලයෙහි මා විසින් නොකරණ ලද යාගයත් සුලභ නොවේ. ඒ යාග කිරීමද අභිෂෙක කරණ ලද ක්ෂත්‍රිය රජවූ හෝ මහාසාර කුලවල බ්‍රාහ්මණවූ හෝ මා විසින් කරන ලදී.

"ශාරීපුත්‍රය, බොහෝකොට ගිනිදෙවියන් පිදීමෙන් ශුද්ධිය වේයයි කියන්නාවූ ඒ ලබ්ධිය ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය. මා විසින් නොපුදන ලද ඒ ගින්නත් සුලභ නොවේ. ඒ අග්නිපරිචරියාවද (ගිනි පූජාව) අභිෂෙක කරන ලද ක්ෂත්‍රිය

රජවූ හෝ මහාසාර කුලවත් බ්‍රාහ්මණවූ හෝ මා විසින් කරන ලදී.

"ශාරීපුත්‍රය, යම්තාක්කල් මේ පින්වත් පුරුෂතෙම කළුකෙස් ඇති යහපත් යෞවනයෙන් යුක්තවූ පළමුවෙනි වයසෙහි සිටි තරුණයෙක් වේද ඒතාක් කල් උතුම්වූ නුවණින් යුක්තවෙයි යම් කලක පටන් මේ පින්වත් පුරුෂතෙම ජරාවෙන් ජීර්ණවූයේද වැඩිසිටි අඟපසඟ ඇත්තේද මහලුද බොහෝ කල් ඉක්මවූයේද තුන්වන වයසට පැමිණියේ උත්පත්තියෙන් අසූවයස් ඇත්තේ හෝ අනූ වයස් ඇත්තේ හෝ සියක් වස් ඇත්තේ හෝ වේද එවිට ඒ උතුම් නුවණින් පිරිහේයයි, කියන්නාවූ ඒ ලබ්ධිය ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ.

"ශාරීපුත්‍රය, මේ කාරණය මෙසේ නොදත යුතුයි. ශාරීපුත්‍රය, මම වනාහි දැන් ජරාජීර්ණය, වැඩී සිටියෙමි. මහලු වෙමි. කල් ඉක්මවූයෙමි. තුන්වන වයසට පැමිණියෙමි. මාගේ අසූවැනි වයස පවතියි. ශාරීපුත්‍රය, මාගේ මේ ශාසනයෙහි වර්ෂ සියයක් ආයු ඇති වර්ෂ සියයක් ජීත්වන සුලු උතුම්වූ සිහියෙන් (පද දහසක් වුවත් එකවර ඇසූ පමණින් ඉගෙන ගැණීමට සමර්ථවූ) ගතියෙන්ද (උගත් දේ දැරීමෙන්ද දැරීම, හැදෑරීම ආදියෙහි) වීර්යයෙන්ද, උතුම්වූ ප්‍රඥා ව්‍යක්ත භාවයෙන්ද යුක්තවූ ශ්‍රාවකයෝ සතරදෙනෙක් වෙත්ද, ශාරීපුත්‍රය, බොහෝ කල් උගත් ශිල්ප ඇති පළපුරුද්ද ඇති රාජකුලාදියෙහි දැක්වූ ශිල්ප ඇති දෙදහසකගේ බල ඇති දුනු දරන්නෙක් තෙම සැහැල්ලු ඊයකින් කිසි අමාරුවක් නැතිව එක්වියත් සතරඟුල් පමණ තල් සෙවන සරස ඉක්මවන්නේද මෙසේ ඉතා සිහි ඇත්තාවූ ඉතා ප්‍රඥා ඇත්තාවූ අධික වීර්ය ඇත්තාවූ ප්‍රඥාව සම්බන්ධ උතුම් ව්‍යක්තභාවයෙන් යුක්තවූ ඒ ශ්‍රාවකයෝ සතරදෙන සතර සතිපට්ඨානයන් අතුරෙන් එකිනෙක ගෙන මා ප්‍රශ්න විචාරන්නාහුද විචාළ විචාළ දෙය මම ඔවුන්ට ප්‍රකාශ කරන්නෙමි. මා විසින් ප්‍රකාශ කරන ලද්ද ප්‍රකාශකරන ලද්ද වශයෙන් ඔව්හු දරන්නාහුය. දෙවැනි වරක් මා නොවිචාරන්නාහුය. (මෙසේ) කෑම බීම ආදිය සඳහා යන කාලය

මළමුත්‍ර පහකිරීම සඳහා යන කාලය නිදිමත ක්ලාන්ත ගතිය හැරගන්නා කාලය (යන මේවා) හැර (අවශෙෂ සියලු කාලයෙහි ප්‍රශ්න විචාළත්) ශාරීපුත්‍රය තථාගතයන්ගේ ධර්ම දෙනාව නොඅඩුවන්නෙමැයි තථාගතයන් වහන්සේගේ ධර්මපදයන්ගේ වැටහීම නොඅඩුවමය. තථාගතයන් වහන්සේගේ ප්‍රශ්න වැටහීම නොඅඩුවන්නේ මැයි.

ඉක්බිති වර්ෂ සියයක් ආයු ඇති වර්ෂ සියයක් ජීවත්වන සුලු ඒ මාගේ ශ්‍රාවකයෝ සතරදෙන වර්ෂ සියයක් ඉක්මීමෙන් කලුරිය කරන්නාහුද? ශාරීපුත්‍රය, මා දුර්වලකාලයක ඇඳක තබාගෙන හැසිරෙන්නාහුද (එකලද) තථාගතයන් වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්ත භාවයෙහි වෙනස් බවක් නොම ඇත්තේ මැයි.

"ශාරීපුත්‍රය, යමෙකු සඳහා "නුමුළා ස්වභාව ඇති සත්ත්වයෙක් තෙම ලොකයෙහි බොහෝදෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස උපන්නේය"යි යමෙක් හරියට කියන්නේ නම් ඒ වචනය මා සඳහාම "නුමුළා ස්වභාව ඇති සත්වයෙක් තෙම ලොකයෙහි බොහෝදෙනාට වැඩ පිණිස බොහෝදෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස උපන්නේය"යි හරියට කියන්නේය.

එකල්හි නාගසමාල ආයුෂ්මත් තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පිටුපසෙහි භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේය. ඉක්බිති ඒ ආයුෂ්මත් නාගසමාල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට ස්වාමීනි, ඉතා ආශ්චර්යයකි. ඉතා පුදුමයකි. මේ ධර්මදෙශනාව අසා මාගේ ලොම්ඩැහැගත්හ. මේ ධර්ම ක්‍රමය කවර නාමයක් ඇත්තේදැයි සැලකෙළේය. එසේ නම් නාගසමාලා තොප මේ ධර්ම ක්‍රමය ලොමහංස ධර්ම ක්‍රමයයි දැනගනුවයි වදාළේය. සතුටුවූ නාගසමාල ස්ථවිරයන් වහන්සේ දෙශනාවට සතුටු විය.

(දොළොස් වෙනිවූ මහාසීහනාද සූත්‍රය නිමි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 13 මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනාථ පිණ්ඩික සිටුහු විසින් කරවා පූජාකරන ලද ජේතවන නම් ආරාමයෙහි වාසය කරති. එකල බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා පාත්‍රයද සිවුරුද ගෙන සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස ගියාහුය. එකල ඒ භික්ෂූන්ට මේ සිත ඇතිවිය. තවම සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස හැසිරෙන්ට කල් වැඩිය. යම් හෙයකින් අපි 'අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ (ශාසනයෙන් පිට මහණවූවන්ගේ) ආරාමය යම් තැනකද එතනට පැමිණෙන්නෙමු නම් යහපතැයි කියායි.

2. එකල ඒ භික්ෂූහු අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනකද එතනට පැමිණියාහුය. පැමිණ, ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූවාහුය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක පැත්තක හුන්නාහුය. ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ එක පැත්තක හුන්නාවූ ඒ භික්ෂූන්ට මෙසේ කීවාහුය. "ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම කාමයන්ගේ නැති කිරීම (පණවයි) ප්‍රකාශ කරයි. අපිත් කාමයන්ගේ නැතිකිරීම ප්‍රකාශකරමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙම රූපයන්ගේ නැතිකිරීම ප්‍රකාශ කරයි. අපිත් රූපයන්ගේ නැතිකිරීම ප්‍රකාශ කරමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම වේදනාවන්ගේ නැතිකිරීම ප්‍රකාශ කරයි. අපිත් වේදනාවන්ගේ නැතිකිරීම ප්‍රකාශ කරමු. ඇවැත්නි, මෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ දෙශනාවෙන් අපගේ දෙශනාවෙහි හෝ අනුශාසනාවෙන් අපගේ අනුශාසනාවෙහි හෝ වෙනස කවරේද, වෙනස් අදහස කවරේද වෙනස් කාරණය කුමක්ද කියායි.

3. එවිට ඒ භික්ෂූහු ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ වචනයට සතුටු නුවූහ, ඉවතද නොදැමූහ. සතුටුද නොවී, ඉවතද නොදමා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ කථාවේ අර්ථය දැනගන්නෙමුයි හුන් ආසනයෙන් නැගිට පිටත්ව ගියාහුය. එකල

ඒ භික්ෂූහු සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩාපතයෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකපැත්තක උන්නාහුය. එක පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්නුවෝය. "ස්වාමීනි, මේ දවසෙහි අපි පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා පාත්‍රාද සිවුරුද ගෙන සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස ගියෙමු. ස්වාමීනි, එකල අපට මේ සිත ඇතිවිය. තවම සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස හැසිරෙන්ට කල් වැඩිය. යම්හෙයකින් අපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනකද එතනට පැමිණෙන්නෙමු නම් යහපතැයි' කියායි.

එකල අපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනකද එතනට පැමිණියෙමු. පැමිණ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු වුනෙමු. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථා කොට නිමවා එක පැත්තක උන්නෙමු. ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ එක පැත්තක උන්නාවූ අපට මෙසේ කීවාහුය. "ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම. කාමයන්ගේ නැතිකිරීම ප්‍රකාශකරයි, අපිත් කාමයන්ගේ නැතිකිරීම ප්‍රකාශකරමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම රූපයන්ගේ නැතිකිරීම ප්‍රකාශකරයි, අපිත් රූපයන්ගේ නැතිකිරීම ප්‍රකාශ කරමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම වේදනාවන්ගේ නැතිකිරීම ප්‍රකාශකරයි, අපිත් වේදනාවන්ගේ නැතිකිරීම ප්‍රකාශකරමු, ඇවැත්නි, මෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ දේශනාවෙන් අපගේ ධර්මදේශනාවෙහි හෝ අනුශාසනාවෙන් අපගේ අනුශාසනාවෙහි හෝ වෙනස කවරේද? වෙනස් අදහස කවරේද? වෙනස් කාරණය කුමක්ද?" කියායි.

"ස්වාමීනි අප එකල්හි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ කියමන සතුටින් පිළිගැනීමද නොකෙළෙමු. ඉවතද නොදැමීමු. සතුටුද නොවී ඉවතද නොදමා හුන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ කියමනේ අර්ථය දැනගන්නෙමුයි" පිටත්ව ගියෙමු.

**4.** "මහණෙනි, මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතු වන්නේය. (කෙසේද?) ඇවැත්නි, කාමයන්ගේ සැපය කවරේද? දොෂය කවරේද? (කාමයන්ගෙන්) නික්මීම කවරේද? රූපයන්ගේ සැපය කවරේද? දොෂය කවරේද? (රූපයන්ගෙන්) නික්මීම කවරේද? වේදනාවන්ගේ සැපය කවරේද? දොෂය කවරේද? වේදනාවන්ගෙන් නික්මීම කවරේද? මහණෙනි, මෙසේ විචාරණ ලද්දාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ සම්පූර්ණ කොට නොකියන්නාහ. මත්තෙහිද දුකට පැමිණෙන්නාහ. ඊට හේතු කවරේද? මහණෙනි, නොවැටහෙන දෙයෙහි ඒ එසේමය. මහණෙනි, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ මේ ශාසනයෙන් ඇසුවෙකු හෝ හැර, (වෙන) යමෙක් මේ ප්‍රශ්නය විසඳීමෙන් සිත සතුටු කරන්නේද, එබඳු කෙනෙකු දෙවියන් සහිතවූ මරුන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, ලොකයෙහි දෙව් මිනිසුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ ප්‍රජාවෙහි ඇති බව නුවණින් නොම දකිමි.

**5.** "මහණෙනි, කාමයන්ගේ සැපය කවරේද? මහණෙනි, කාමගුණයෝ මේ පසකි. කවර පසක්දයත්? චක්ඛු විඤ්ඤාණයෙන් (රූපය දැනගන්නා සිතින්) දත යුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ ආශාව ඉපදීමට කරුණුවූ රූපාරම්මණයෝද යහපත්වූද කැමති වන්නාවූද මන වඩන්නාවූද ප්‍රියවූද ඇලීමෙන් යුක්තවූද ඇලිය යුත්තා වූද සොත විඤ්ඤාණයෙන් (ශබ්දය දැනගන්නා සිතින්) දත යුතුවූ ශබ්දයෝද, ඝාණවිඤ්ඤාණයෙන් (ගඳ සුවඳ දැනගන්නා සිතින්) දතයුතුවූ ගන්ධයෝද, ජිව්හාවිඤ්ඤාණයෙන් (රස දැනගන්නා සිතින්) දතයුතුවූ රසයෝද, කාය විඤ්ඤාණයෙන් (ස්පර්ශය දැනගන්නා සිතින්) දත යුතුවූ ස්පර්ශයෝද යන මොහු කාම ගුණ පසයි.

"මහණෙනි, මේ පංචකාම ගුණයන් යම් කායික සැපක් හෝ මානසික සැපක් උපදවයිද, මෙය කාමයන්ගේ සැපය වන්නේය. මහණෙනි, කාමයන්ගේ දොෂය (විපත) කවරේද? මහණෙනි, මේ ලොකයෙහි කුලපුත්‍ර තෙම යම්කිසි ශිල්පයකින් ජීවත් වෙයිද,

එනම් රේඛා ශාස්ත්‍ර කීමෙන්, ගණන් තැබීමෙන් සංඛ්‍යාලේඛන ගැනීමෙන්, ගොවිකමින්, වෙළඳාමෙන්, ගව පාලනයෙන්, (රජුන්ට) උපස්ථාන කිරීමෙන්. රාජ භටයෙකු වීමෙන්, මෙයින් අන්‍යවූ (ඇත්, අස්) ශිල්පයකින්ද, (ජීවත්වනු සඳහා) සිතෙන් පෙළනු ලබන්නේ, උෂ්ණයෙන් පෙළනු ලබන්නේ, ඩැහැ ලේ බොන මැස්සෝය, මදුරුවෝය, සුළඟය අව්වය, සර්පයෝය යන මොවුන්ගේ ස්පර්ශයෙන් ගැටෙමින්, බඩගින්නෙන් හා පිපාසයෙන් මිරිකෙමින් ජීවිතය පවත්වයිද මහණෙනි, මෙයද කාමය හේතුකොට ගෙන, කාමය මුල් කරුණ කොට ගෙන, කාමය කරණකොට ගෙන, කාමය නිසා මෙලොවම වින්ද යුතුවූ ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය.

"මහණෙනි, මෙසේ වීර්ය කරන්නාවූ, උත්සාහ කරන්නාවූ ඒ කුලපුත්‍රයාහට ඒ වස්තු සම්පත් හොඳින් නොඋපදිද්ද නොලබත්ද හෙතෙම ඒකාන්තයෙන් මාගේ වීර්ය හිස්විය, මාගේ උත්සාහය නිෂ්ඵලවීයයි කියා ශොකවෙයි. වෙහෙස වෙයි වැලපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. සිහි නැති බවට පැමිණෙයි. මහණෙනි, මෙයද කාමය හෙතුකොට, කාමය මුල් කාරණයකොට, කාමය කරණකොට කාමයන් නිසා මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය.

"මහණෙනි, මෙසේ වීර්ය කරන්නාවූ, උත්සාහකරන්නාවූ ඒ කුලපුත්‍රයාගේ ඒ සම්පත්තීහු උපදිත් ද ලබත්ද ඔහු ඒ ලැබූ සම්පත්තිය ආරක්ෂාකරනු පිණිස කයිනුත් සිතිනුත් දුක් විඳියි, කෙසේද? මාගේ මේ සම්පත්තිය රජවරු පැහැර නොගන්නාහු නම්, සොරු පැහැර නොගන්නාහු නම්, ගින්නෙන් නොදැවෙන්නේ නම් දියෙහි නොයානම්, අප්‍රියවූවෝ නොගන්නාහු නම් යෙහෙකැයි කියායි. මෙසේ රකින්නාවූ, පාලනය කරන්නාවූ, ඔහුගේ ඒ සම්පත්තීහු රජවරුද පැහැර ගනිත්, සොරුද පැහැර ගනිත්, ගින්නෙන් හෝ දැවෙයි, දියෙහි හෝ යයි. අප්‍රියවූවෝ හෝ ගනිති. මා විසින් යම් වස්තුවකුත් උපදවන ලද්දේවී ද එයද දැන් අපට නැතැයි ශොක කෙරෙයි. වෙහෙස වෙයි. වැලපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. සිහි නැති බවට පැමිණෙයි. මහණෙනි, කාමය හෙතුකොට කාමය

මුල් කරුණකොට, කාමය කරණකොට ගෙන, කාමය නිසා මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය.

**6.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. කාමය හේතු කොට කාමය මුල් කරුණ කොට, කාමය කරණකොට ගෙන කාමය නිසා රජවරුද රජවරු සමග කලහ කරති. ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් සමග කලහ කරති. බමුණෝද බමුණන් සමග කලහ කරති. ගෘහපතියෝද ගෘහපතීන් සමග කලහ කරති. මවද පුතා සමග කලහ කරයි. පුතාද මව සමග කලහ කරයි. පියාද පුතා සමග කලහ කරයි. පුතාද පියා සමග කලහ කරයි. සහෝදරයාද සහෝදරයා සමග කලහ කරයි, සහෝදරයාද සහෝදරිය සමග කලහ කරයි. සහෝදරියද සහෝදරයා සමග කලහ කරයි. යහළුවාද යහළුවා සමග කලහ කරයි. ඔවුහු කෝලාහල, විරුද්ධකම්, විවාද යන මීට පැමිණියාහු එකිනෙකා අතින්ද පහරදෙති, කැට කැබලිතිවලින්ද පහර දෙති, පොලුවලින්ද පහර දෙති. (කඩු ආදී) ආයුධවලින්ද පහර දෙති. ඔවුහු එයින් මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද කාමය හෙතුකොට, කාමය මුල් කරුණකොට, කාමය කරණ කොටගෙන, කාමය නිසා මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය දුක් රාශිය වන්නේය.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. කාමය හේතුකොට, කාමය මුල් කරුණ කොට, කාමය කරණකොට ගෙන කාමය නිසා කඩුව හා පලිහ ගෙන දුන්න හා හියවුර (ඊතල දමන කොපුව) බැඳ දෙපසින් රැස්ව යුද්ධ භූමියට පනිති. ඊතල විදින කල්හි, කඩු කරකවන කල්හි, එහි ඔවුහු ඊතලවලින්ද විදිනු ලබත්. අඩයටිවලින්ද විදිනු ලබත්. කඩුවෙන් හිස සිඳිනු ලබත්, ඔවුහු එහි මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද කාමය හේතුකොට කාමය මුල් කරුණ කොට, කාමය කරණ කොට ගෙන, කාමය නිසාම මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය දුක් රාශිය වන්නේය.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. කාමය හේතුකොට, කාමය මුල් කරුණකොට, කාමය කරණකොට ගෙන, කාමය

නිසා ගෙවල් බිඳිති, ගම් පැහැරීමෙන් (වස්තුව) ගෙන යත්, ගෙයි වැසියන් පණපිටින් අල්වාගෙන වස්තුව පැහැර ගනිති. මංපැහැරීම (මංකොල්ලකෑම) කරති. පර ස්ත්‍රීන් දූෂ්‍යද කරති. ඒ සොරුන් රජවරු අල්වා නොයෙක් කම්කටොළු කරවත්, කසවලින් තලවත්, වේවැල්වලින් තලවත්, දෙකට පැලූ (දෙරියන් පමණ) අඬුවලින් තළවත්, අත්ද කපත්, පයද කපත්, අත් පා සියල්ලමත් කපත්, කණත් කපත්, නාසයත් කපත්, කන් නාසාත් කපත්, බිලංගථාලික (ඉස්කබල ගලවා මොළය උතුරවමින් කරන) නම් වධය කරත්, සංඛමුණ්ඩික (හිසේ කෙස් හා සම ගලවා බොරළු ලා උලා සුදු කිරීම) නම් වධය දෙති, රාහු මුඛ (අඬුවෙන් කට අරවා එහි තුළ ගිනි දැල්වීම) නම් වධය දෙත්, ජෝතිමාලික (ශරීරය තෙල් රෙදිවලින් වෙලා ගිනි දැල්වීම) නම් වධය දෙත්, හත්ථපජ්ජෝතික (අත්දෙකේ තෙල් රෙදි වෙලා ගිනි දැල්වීම) නම් වධය දෙත්, එරකවත්තික (බෙල්ලෙහි පටන් ඇස්වටය දක්වා හම ගලවා ඔහු ලවා පෑගවීම) නම් වධය දෙත්, චීරක වාසික (බෙල්ලෙහි පටන් තුනටිය දක්වා සම ගලවා තබා එතනින් පටන්ගෙන ඇස්වටය දක්වා සම ගලවා තැබීම) නම් වධය දෙත්, එණෙයයක (දෙදන දෙවැලමිටිවල යවුල් ගසා වටකොට ගිනිතැබීම) නම් වධය දෙත්, බලිස මංසික (දෙපැත්තෙන් තුඩු ඇති බිලියෙන් ගසා මස් කැඩීම) නම් වධය දෙත්, කහාපණක (කහවනු සේ මස් කැපීම) නම් වධය දෙත්, ඛාරාපතච්ඡික (සිරුර සිදුරුකොට කාරම් දිය ඉසීම) නම් වධය දෙත්, පළිඝ පරිවත්තික (ඇලයකින් බිම හොවා කණෙහි යවුල් ගසා පය ගෙන කරකැවීම) නම් වධය දෙත්, පලාල පිඨික (සම නොබිඳෙන සේ ඇට මස් තළා පිදුරු වැටියක් සේ ඇකිලීම) නම් වධය දෙත්, රත්වූ තෙල් ඉසිත්, බල්ලන් ලවා කවත්, ජීවිතය තිබියදීම උලෙහි ඉඳුවත්, කඩුවෙන් හිස් සිඳිත්, ඔවුහු එහි මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්. මහණෙනි, මෙයද කාමය හෙතුකොට, කාමය මුල් කරුණකොට, කාමය කරණකොට ගෙන, කාමය නිසාම මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය. මෙයද කාමයන්ගේ දොෂයකි.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. කාමය හේතුකොට, කාමය මුල් කරුණ කොට, කාමය කරණකොට ගෙන කාමය නිසා කයින් දුසිරිතෙහි හැසිරෙති, වචනයෙන් දුසිරිතෙහි හැසිරෙති, සිතින් දුසිරිතෙහි හැසිරෙති. ඔවුහු කයින් දුසිරිතෙහි හැසිර, වචනයෙන් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරුකොට වැටීමක් ඇත්තාවූ නිරයෙහි උපදිති. මහණෙනි, මෙය කාමය හේතු කොට, කාමය මුල් කරුණකොට, කාමය කරණකොට ගෙන, කාමය නිසා පරලොව වින්දයුතු ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය.

"මහණෙනි, කාමයන්ගේ නැතිකිරීම කවරේද? මහණෙනි, කාමයන්හි ආශාව මැඩ දුරුකිරීමක් වේද, ආශාව නැතිකිරීමක් වේද, මෙය කාමයන්ගෙන් නිදහස්වීමයි. මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ කාමයන්ගේ සැපය සැපය වශයෙන්ද, දොෂය දෝෂය වශයෙන්ද වෙන්වීම වෙන්වීම වශයෙන්ද තත්වූ පරිද්දෙන් නොදනිත්ද, ඔහු ඒකාන්තයෙන් තමා හෝ කාමයන් පහකරන්නේය. අන්‍යයෙකු යම්සේ පිළිපැදීමෙන් ඒ කාමයන් දුරුකරන්නේද ඒ ආකාරයෙන් සමාදන් කරවන්නේය. (යොදවන්නේය) යන මේ කාරණය විද්‍යමාන නොවෙයි, (සිදුනොවෙයි.)

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ කාමයන්ගේ සැපය, සැපය වශයෙන් ද දොෂය දොෂය වශයෙන්ද වෙන්වීම වෙන්වීම වශයෙන්ද තත්වූ පරිද්දෙන් දනිත්ද, ඔව්හු ඒකාන්තයෙන් තමා හෝ කාමයන් පහ කරන්නේය, අන්‍යයකු හෝ යම්සේ පිළිපැදීමෙන් ඒ කාමයන් පහකරන්නේද ඒ ආකාරයෙන් සමාදන් කරවන්නෝය. (යොදවන්නෝය) යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.)

8. "මහණෙනි, රූපයන්ගේ සැපය කවරේද? මහණෙනි, පසළොස් වයස් ඇත්තාවූ හෝ සොළොස් වයස් ඇත්තාවූ හෝ ඉතා උස් නොවූ, ඉතා මිටි නොවූ, ඉතා කෙට්ටු නොවූ, ඉතා මහත නොවූ, ඉතා කළු නොවූ, ඉතා සුදු නොවූ ක්ෂත්‍රිය

කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ යම්සේ වන්නීද, මහණෙනි, ඒ කාලයෙහි ශරීර වර්ණය යහපත් වේද? "ස්වාමීනි, එසේය" මහණෙනි, යම්හෙයකින් ඒ යහපත් ශරීර වර්ණය නිසා යම් කායික සැපක් හෝ මානසික සැපක් හෝ උපදීද, මෙය රූපයන්ගේ සැපය වේ.

"මහණෙනි, රූපයන්ගේ දොෂය කවරේද? මහණෙනි, පසු කලෙකදී අසූවයස් ගියාවූ හෝ, අනූවයස් ගියාවූ හෝ සියක්වයස් ගියාවූ හෝ ජරාජීර්ණවූද, (මහලුවූද) ගොනැස්සක් (වකුටු යටලීයක්) සේ වක්වූ, කොන්ද මැදින් බිඳුනාවූ, සැරයටිය පිහිටකොට ඇති, වෙවුලමින් යන්නාවූ, රොගීවූ, තරුණ බව නැතිවූ දත් වැටුනු, කෙස් පැහුනු, හිසකෙස් සිඳුනු හිසේ තට්ටය පෑදුනු, ඇඟ රැලි වැටුනාවූ, ශරීරය කැලැල්වලින් කිලුටුවූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි හඟින්නහුද, පෙරවූ යම් යහපත් වර්ණයක්වීද, එයම අතුරුදන්වී දොෂය පහළ වූයේද? "ස්වාමීනි, එසේය." මහණෙනි, මේත් රූපයන්ගේ දොෂයයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. හටගත් ආබාධ ඇති, හටගත් දුක් ඇති, දැඩි ගිලන්වූ, තමන්ගේම මළමුත්‍රයෙහි වැටුණාවූ, එහිම සයනය කරන්නාවූ, අනුන් විසින් නැගිටුවනු ලබන්නාවූ, අනුන් විසින් හොවවනු (සයනය කරවනු) ලබන්නාවූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද, එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි, එසේය" මහණෙනි, මේත් රූපයන්ගේ දොෂයයි.

**9.** "මහණෙනි, මැරී එක් දවසක්වූද, මැරී දෙදවසක්වූද, මැරී තුන් දවසක්වූද ඉදිමී ගියාවූද, තද නිල් පැහැවූද, හටගත් පූයා (සැරව) ඇත්තාවූද සොහොනෙහි දමන ලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද, එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. කපුටන් විසින් කඩා කනුලබන්නාවූ, උකුස්සන් විසින් කඩා කනුලබන්නාවූ, ගිජුලිහිණියන් විසින් කඩා කනුලබන්නාවූ, බල්ලන් විසින් කඩා කනුලබන්නාවූ, සිවලුන් විසින් කඩා කනුලබන්නාවූ, නොයෙක් කුඩා සතුන් විසින් කඩා කනුලබන්නාවූ සොහොනෙහි දමන ලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද එය අතුරුදන්වී දොෂය පහළවීද "ස්වාමීනි, එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මස් ලේ සහිතවූ නහරින් බැඳුනාවූ, ඇටසැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළසිරුරක්වූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

මස් නැති, ලෙයින් තැවරුනාවූ, නහරින් බැඳුනාවූ, ඇටසැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

මස් ලේ නැති, නහරින් බැඳුනාවූ ඇටසැකිල්ලක්වූ සොහොනෙහි දමන ලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද මහණෙනි, ඒ ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක් වීද, එය අතුරුදන්වී දොෂය පහළවීද? ස්වාමීනි, එසේයි. මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

සම්බන්ධයෙන් (සන්දිවලින්) වෙන්වූ, දිසා අනුදිසාවන්හි විසුරුනු ඇට ඇති (හෙවත්) වෙන දිසාවක අත් ඇටද, වෙන දිසාවක පා ඇටද, වෙන දිසාවක කෙණ්ඩා ඇටද, වෙන දිසාවක කලවා ඇටද, වෙන දිසාවක කටි ඇටයද, වෙන දිසාවක කොඳු ඇටයද, වෙන දිසාවක හිස්කබලද වූ සොහොනෙහි දමන ලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද, මහණෙනි, ඒ කුමකැයි

සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක්වීද, එය අතුරුදන්වී දොෂය පහළවීද? ස්වාමීනි, එසේය. මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

සක් ගෙඩියකට බඳු පැහැය ඇති, සුදුවූ, ඇට ඇති සොහොනෙහි දමනලද මළසිරුරක්වූ ඒ නැගනියම දක්නේද මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පෙරවූ යම් යහපත් වර්ණයක්වීද, එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

අවුරුදු ගණන් ඉක්මගියාවූද, කැටිගැසුනාවූද, ඇට ඇති සොහොනෙහි දමන ලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද, කුණුවූ, සුනුවූ ඇට ඇති සොහොනෙහි දමනලද මළ සිරුරක්වූ ඒ නැගනියම දක්නේද? මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද, පෙරවූ යම් යහපත් වර්ණයක් වීද එය අතුරුදන්වී දොෂය පහළවීද? "ස්වාමීනි, එසේය" මහණෙනි, මෙයද රූපයන්ගේ දොෂයයි.

**10.** "මහණෙනි, රූපයන්ගෙන් නිදහස්වීම නම් කුමක්ද? මහණෙනි, රූපයන්හි ආශාව මැඩ පැවැත්වීමක් වේද, ආශාව නැති කිරීමක් වේද, මෙය රූපයන්ගෙන් නිදහස් වීමයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ රූපයන්ගේ සැපය සැපය වශයෙන්ද දොෂය දොෂය වශයෙන්ද වෙන්වීම වෙන්වීම වශයෙන්ද තත්වූ පරිද්දෙන් නොදනිත්ද, ඔව්හු ඒකාන්තයෙන් තමා හෝ රූපය දුරු කරන්නේය. අන්‍යයකු හෝ යම්සේ පිළිපැදීමෙන් ඒ රූපයන් දුරුකරන්නේද එසේ සමාදන් කරවන්නෝය. (යොදවන්නෝය.) යන මේ කාරණය විද්‍යමාන නොවෙයි. (සිදුනොවෙයි)

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ රූපයන්ගේ සැපය සැපය වශයෙන්ද, දොෂය දොෂය වශයෙන්ද වෙන්වීම වෙන්වීම වශයෙන්ද, තත්වූ පරිද්දෙන් දනිත්ද, ඔව්හු ඒකාන්තයෙන් තමා හෝ රූපයන් දුරුකරන්නේය, අනුන් හෝ ඒ පිණිස සමාදන් කරවන්නෝය. (යොදන්නෝය) යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. "මහණෙනි, වේදනාවන්ගේ සැපය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක විචාර සහිතවූ, විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් යුක්තවූ ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරේද?

"මහණෙනි, භික්ෂුව යම්කලෙක්හි කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් යුක්තවූ ප්‍රථම ධ්‍යානයට සමවැද වාසය කෙරේද, ඒ කාලයෙහි තමන්ට වෙහෙස (දුක්) පිණිස උත්සාහ නොකරයි. අනුන්ට වෙහෙස (දුක්) පිණිස උත්සාහ නොකරයි. දෙකොටසටම වෙහෙස පිණිස උත්සාහ නොකරයි. ඒ කාලයෙහි නිදුක්වූම වේදනාව විඳියි. මහණෙනි, නිදුක් බවම කෙළවර කොට ඇති බව වේදනාවන්ගේ සැප යයි මම කියමි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳවීමෙන් තමන්ගේ සිතෙහි යහපත් පැහැදීම ඇතිකරන්නාවූ, සිතේ එකඟ බව ඇති විතර්ක විචාර රහිතවූ, සමාධියෙන් උපන් ප්‍රීති සුවය ඇති, ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, මහණෙනි, භික්ෂුව යම්කලෙක සැපය නැති කිරීමෙන්ද දුක නැති කිරීමෙන්ද, පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරලීමෙන්ද දුක් නැත්තාවූ, සැප නැත්තාවූ උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇති චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ඒ කාලයෙහි තමන්ට වෙහෙස පිණිස උත්සාහ නොකරයි. අනුන්ට වෙහෙස පිණිස උත්සාහ නොකරයි. දෙකොටසටම වෙහෙස පිණිස උත්සාහ නොකරයි. ඒ කාලයෙහි නිදුක්වූම වේදනාව විඳියි. මහණෙනි, නිදුක් බවම කෙළවර කොට ඇති බව වේදනාවන්ගේ සැප යයි මම කියමි.

12. "මහණෙනි, වේදනාවන්ගේ දොෂය කවරේද? මහණෙනි, යම්හෙයකින් වේදනාවෝ නිත්‍ය නොවන්නාහුද, දුක් වූවාහුද, පෙරළෙන ස්වභාව ඇත්තාහුද, මේ ආකාරය වේදනාවන්ගේ

දොෂයයි මහණෙනි, වේදනාවන්ගේ නිදහස් වීම කවරේද? මහණෙනි, වේදනාවන් කෙරෙහි ආශාව මැඩ පැවැත්වීමක් වේද, ආශාව නැති කිරීමක් වේද, මෙය වේදනාවන්ගේ නිදහස් වීමයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ වේදනාවන්ගේ සැපය සැපය වශයෙන්ද, දොෂය දොෂය වශයෙන්ද නිදහස්වීම නිදහස්වීම වශයෙන්ද තත්වූ පරිද්දෙන් නොදන්නේද, ඔව්හු ඒකාන්තයෙන් තුමූ හෝ වේදනාවන් දන්නෝය. අන්‍යයකු යම්සේ පිළිපැදීමෙන් ඒ වේදනාවන්ගේ තත්ත්වය දැනගනී නම් එසේ හෝ සමාදන් කරවන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවෙයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ වේදනාවන්ගේ සැපය සැපය වශයෙන්ද, දොෂය දොෂය වශයෙන්ද නිදහස්වීම නිදහස්වීම වශයෙන්ද තත්වූ පරිද්දෙන් නොදන්නේද, ඔව්හු ඒකාන්තයෙන් තුමූ හෝ වේදනාවන් දන්නෝය. අන්‍යයෙකු යම්සේ පිළිපැදීමෙන් ඒ වේදනාවන්ගේ තත්ත්වය දැනගනී නම් එසේ හෝ සමාදන් කරවන්නෝය. යන මේ කාරණය විද්‍යමාන වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. භාග්‍යවතුන් වහන්සේගේ මේ දෙශනාව ඇසූ භික්ෂූහු සතුටු වූහ.

(මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය නිමි)

---

## 14. චූල දුක්ඛක්ඛන්ධ සූත්‍රය.

1. මා විසින් මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩ වාසය කරති. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකපැත්තක හුන්නේය. එකපැත්තක උන්නාවූ මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

"ස්වාමීනි, මම බොහෝ කලක් මුළුල්ලෙහි ලොභය සිත කෙලසන ධර්මයකි, ද්වේෂය සිත කෙලසන ධර්මයකි, මොහය සිත කෙලෙසන ධර්මයකි කියා මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය දනිමි. ස්වාමිනි, මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදි ලොභය සිත කිළුටු කරන ධර්මයකි. ද්වේෂය සිත කිළුටු කරන ධර්මයකි, මොහය සිත කිළුටු කරන ධර්මකියි මම දනිමි. එතකුදු වුවත් ඇතැම් කලෙක ලොභ ධර්මයෝත් මාගේ සිත මැඩගෙන සිටිත්. ද්වේෂ ධර්මයෝද සිත මැඩගෙන සිටිත්. මෝහ ධර්මයෝද සිත මැඩගෙන සිටිත්. ස්වාමීනි, ඒ මට මෙබඳු අදහසක් වෙයි. යමක් හේතුකොට එක් කලෙක ලොභ ධර්මයෝත් මාගෙ'සිත මැඩගෙන සිටිත්ද, ද්වේෂ ධර්මයෝත් මාගේ සිත මැඩගෙන සිටිත්ද, මෝහ ධර්මයෝත් මාගේ සිත අල්වාගෙන සිටිත්ද, ඊට හේතුවූ කිනම් අධ්‍යාත්ම ධර්මයක් මා විසින් පහනොකරන ලද්දේද කියායි. "මහානාමය, යමක් හෙතු කොට ගෙන එක් කලෙක්හි ලොභ ධර්මයෝත් තාගේ සිත මැඩගෙන සිටිත්ද, ද්වේෂ ධර්මයෝත් තාගේ සිත මැඩගෙන සිටිත්ද, මෝහ ධර්මයෝත් තාගේ සිත මැඩගෙන සිටිත්ද, ඒ අධ්‍යාත්ම ධර්මයම තොප විසින් පහනොකරන ලද්දේය. මහානාමය, ඒ ධර්මය තා විසින් පහකරන ලද්දේ නම් තෝ ගිහිගෙයි නොවසන්නෙහිය. කාමයන් පරිභොග නොකරන්නෙහිය. මහානාමය, යම් හෙයකින් ඒ ධර්මයම තොප විසින් පහනොකරන ලද්දේය. එහෙයින් නුඹ ගිහිගෙයි වසන්නෙහිය. කාමයන් සේවනය කරන්නෙහිය. කාමයෝ ස්වල්ප සැප ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. දැඩි වෙහෙස ඇත්තාහ, මෙහි දොෂය බොහෝ යයි, මහානාමය මෙසේ ආර්ය ශ්‍රාවකයා විසින් තතුසේ දක්නා ලද්දේ ද හෙතෙමේද කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම ප්‍රීති සැපය (ප්‍රථමධ්‍යාන) නොලබයිද ඊට වඩා අතිශයින් ශාන්තවූ (තෘතීය චතුර්ථ) ධ්‍යාන හෝ නොලබයි. එකල්හි හෙතෙම ඒතාක් කාමයන් පරිභොග නොකරන්නෙක් නොවෙයි.

**2.** "මහානාමය, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකයා විසින් ඇතිසැටියෙන් විදර්ශනා නුවණින් හොඳින් දක්නා ලද්දේද,

හෙතෙමේද කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම ප්‍රීතිසැපය ලබයි. එයින් අන්‍යවූ අතිශයින් ශාන්තවූ (අර්හත් ඵලය) ලබයි. එකල්හි හෙතෙම කාමයන් පරිභොග නොකරන්නෙක් වෙයි.

"මහානාමය, බුදුවන්නට පළමුකොටම බුදු නොවූ බෝසත්වූම මා විසින්ද කාමයෝ ස්වල්ප සැප ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. දැඩි ආයාස ඇත්තාහ. මෙහි දොෂයම බොහෝයයි මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් නුවණින් මනාව දක්නා ලද්දේය.

ඒ මම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම යම්තාක් ධ්‍යාන ප්‍රීතිසැපයට නොපැමිණියෙම්ද එයින් අන්‍යවූ අතිශයින් ශාන්තවූ ධ්‍යාන මාර්ග සැපයන්ට නොපැමිණියෙම්ද මම ඒතාක් කාමයන් පරිභොග නොකරන්නෙක්ම යයි නොකීමි.

"මහානාමය, යම් තැනක පටන් කාමයෝ ස්වල්ප සැප ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ. දැඩි ආයාස ඇත්තාහ. මෙහි ආදීනව බොහෝ යයි මෙසේ මා විසින් ඇති සැටියෙන් යහපත් නුවණින් හොඳින් දක්නා ලද්දේද ඒ මමද කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම ධ්‍යාන ප්‍රීති සැපයට පැමිණියෙම්ද එයින් අන්‍යවූ ශාන්තවූ ධ්‍යාන මාර්ග සැපයන්ට පැමිණියෙම්ද එකල්හි මම කාමයන් පරිභොග නොකරන්නෙක්මියි ප්‍රතිඥා කෙළෙමි.

3. "මහානාමය, කාමයන්ගේ ආස්වාදය (රසවිඳීම) කවරේද? මහානාමය, කාම ගුණයෝ මේ පසකි. කවර පසක්ද යත්?

ඇසින් දතයුතුවූ යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ආශාව ඉපදීමට කරුණුවූ රූප (අරමුණු) වෙත්ද, කණින් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ආශාව ඉපදීමට කරුණුවූ ශබ්දයෝ වෙත්ද, නාසයෙන් දතයුතුවූ යහපත්වූ සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ,

ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ආශාව ඉපදීමට කරුණුවූ ගන්ධයෝ වෙත්ද, දිවෙන් දතයුතුවූ යහපත්වූ සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ආශාව ඉපදීමට කරුණුවූ රසයෝ වෙත්ද, කයින් දතයුතුවූ යහපත්වූ සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ, ආශාව ඉපදීමට කරුණුවූ ස්පර්ශයෝ වෙත්ද යන මොහු කාම ගුණ පසයි.

"මහානාමය, මේ පඤ්චකාම ගුණයන් නිසා යම් කායික සැපක් හෝ මානසික සැපක් උපදීද, මෙය කාමයන්ගේ ආස්වාදය (රසවිඳීම) නම් වෙයි.

4. "මහානාමය, කාමයන්ගේ ආදීනව (දෝෂය) කවරේද? මහානාමය, මේ ලොකයෙහි කුලපුත්‍රතෙම යම්කිසි ශිල්පකින් ජීවිකාව කරයිද, එනම්: රේඛා ශාස්ත්‍ර කීමෙන්, ගණන් තැබීමෙන්, සංඛ්‍යා ලෙඛන තැබීමෙන්, ගොවිකමින්, වෙළඳමෙන්, ගව පාලනයෙන්, (රජුන්ට) උපස්ථාන කිරීමෙන්, රාජ භටයෙකු වීමෙන්, මෙයින් අන්‍යවූ, (ඇත්, අස්, ආදී) ශිල්පයකින් (ජීවත්වනු සඳහා) සීතෙන් පෙළනු ලබන්නේ, උෂ්ණයෙන් පෙළනු ලබන්නේ ඩැහැ ලේ බොන මැස්සෝය, මදුරුවෝය, සුලඟය, අව්වය, සර්පයෝය යන මොවුන්ගේ ස්පර්ශයෙන් ගැටෙමින් බඩගින්නෙන් හා පිපාසයෙන් මිරිකෙමින් ජීවිතය පවත්වයි. මහානාමය, මෙලොවදීම විඳිය යුතුවූ මේ දුක් රාශිය කාමය හෙතුකොට ගෙන කාමය මුල් කරුණු කොටගෙන, කාමය නිසා උපදින කාමයන්ගේ දෝෂයයි. මහානාමය, වීර්ය කරන්නාවූ ගැටෙන්නාවූ උත්සව කරන්නාවූ ඒ කුලපුත්‍රයාට ඒ භොගයෝ (වස්තුව) හොඳින් නොඋපදිත්ද, (අත්පත් නොවෙත්ද) හෙතෙම ඒකාන්තයෙන් මාගේ වීර්යය හිස්ය, මාගේ උත්සාහ නිෂ්ඵලයයි කියා ශොක වෙයි, වෙහෙස වෙයි, වැළපෙයි, පපුවේ අත් ගසමින් හඬයි, සිහි නැති බවට පැමිණෙයි. මහානාමය, මෙලොවදීම විඳිය යුතුවූ මේ දුක් රාශිය කාමය හෙතුකොට කාමය මුල් කාරණයකොට, කාමය කරණකොට, කාමයන් නිසා උපදින කාමයන්ගේ දෝෂයයි.

"මහානාමය, මෙසේ වීර්යකරන්නාවූ ගැටෙන්නාවූ උත්සාහ කරන්නාවූ ඒ කුලපුත්‍රයාට ඒ සම්පත්තීහු සමෘද්ධ වෙත්ද, (දියුණු වෙත්ද) ඔහු ඒ සම්පත්තිය ආරක්ෂා කරණු පිණිස කය සිත යන දෙකින් දුක් විඳියි. කෙසේ නම් මාගේ මේ සම්පත්තිය රජවරු පැහැර නොගන්නාහුද, සොරු පැහැර නොගන්නාහුද ගින්නෙන් නොදැවෙන්නේද දියෙන් විනාශ නොවන්නේද, සතුරෝ නොගන්නාහුදැයි මෙසේ රකින්නාවූ පාලනය කරන්නාවූ ඔහුගේ ඒ සම්පත්තීහු රජවරු පැහැර ගනිත්. සොරුද පැහැර ගනිත් ගින්න හෝ දවයි. වතුර හෝ නසයි. අප්‍රියවූවෝ හෝ ගනිති. මා විසින් මේ වස්තුවකුත් උපදවන ලද්දේවේද, එයද අපට නැතැයි හෙතෙම ශෝක කරයි. වෙහෙස වෙයි, වැළපෙයි, පපුවේ අත් ගසමින් හඬයි. සිහිනැති බවට පැමිණෙයි. මහානාමය මෙලොවදීම විඳිය යුතුවූ මේ දුක් රාසිය කාමය හේතුකොට, කාමය මුල් කරුණ කොට කාමය කරණකොටගෙණ කාමය නිසා උපදින කාමයන්ගේ දෝෂයයි.

5. "මහානාමය, නැවත අනිකක්ද කියමි. කාමය හේතුකොට කාමය මුල් කරුණ කොට කාමය කරණ කොට ගෙණ කාමය නිසා රජවරුද රජවරු සමග කලහ කරති. ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් සමග කලහ කරති. බමුණෝද බමුණන් සමග කලහ කරති. ගෘහපතියෝද ගෘහපතීන් සමග කලහ කරති, මවද පුතා සමග කලහ කරයි. පුතාද මව සමග කලහ කරයි. පියා ද පුතා සමග කලහ කරයි. පුතාද පියා සමග කලහ කරයි, සහෝදරයාද සහෝදරයා සමග කලහ කරයි. සහෝදරයාද සහෝදරිය සමග කලහ කරයි. සහෝදරිය සහෝදරයා සමග කලහ කරයි. යහළුවා යහළුවා සමග කලහ කරයි. ඔව්හු කෝලාහල, විරුද්ධකම්, විවාද යන මීට පැමිණියාහු එකිනෙකාට අතින්ද පහර දෙති. කැට කැබිලිතිවලින්ද පහර දෙති. පොලුවලින්ද පහර දෙති. (කඩු ආදී) ආයුධවලින්ද පහර දෙති ඔව්හු එයින් මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත් මහානාමය, මෙලොවදීම විඳියයුතුවූ මේ දුක් රාසිය කාමය හෙතු කොට කාමය මුල් කරුණකොට කාමය කරණකොට ගෙන කාමය නිසා උපදිති. මෙයද කාමයන්ගේ දෝෂයයි.

"මහානාමය, නැවත අනිකක්ද කියමි. කාමය හේතුකොට කාමය මුල් කරුණු කොට කාමය කරණ කොට ගෙණ කාමය නිසා කඩුව හා පලිහ ගෙණ දුන්නා හා හියවුර (ඊතල දමන කොපුව) බැඳ දෙපසින් රැස්ව යුද්ධ භූමියට පනිති. ඊතල විදින කල්හි කඩු කරකවන කල්හි එහි ඔවුන්ට ඊතලවලින්ද විදිත්, අඩයටිවලින්ද අනිත්, කඩුවෙන් හිසද සිඳිත්, ඔව්හු එහි මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්.

"මහානාමය, මෙලොවදීම විඳියයුතුවූ මේ දුක් රාසිය කාමය හෙතුකොට කාමය මුල් කරුණු කොට ගෙන කාමය කරණකොට ගෙන කාමය නිසා උපදින කාමයන්ගේ දෝෂයයි.

"මහානාමය, නැවත අනිකක්ද කියමි. කාමය හෙතුකොට, කාමය මුල් කරුණුකොට, කාමය කරණ කොට ගෙන කාමය නිසා කඩුව හා පලිහ ගෙණ දුන්න හා හියවුර (ඊතල දමන කොපුව) බැඳ තෙත් මඩ තැවරූ පවුරු වළලු ලඟට පැනයෙත්, ඊතල විදින කල්හි, අඩයටි දමාගසන කල්හි, කඩු කරවන කල්හි, එහි ඔව්හු ඊතලවලින්ද විදිනු ලබත්, අඩයටිවලින්ද, විදිනු ලබත්. ලෝදියද ඉසිත්, (සත්දන්ත නම්) දණ්ඩෙන් මඩිත්, කඩුවෙන්ද හිස සිඳිත්, ඔව්හු එහි මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්

"මහානාමය, මෙලොවදීම විඳිය යුතුවූ මේ දුක් රාසිය කාමය හෙතු කොට කාමය මුල් කරුණුකොට කාමය කරණ කොට ගෙන කාමය නිසා උපදින කාමයන්ගේ දෝෂයයි.

"මහානාමය, නැවත අනිකක්ද කියමි. කාමය හෙතුකොට ගෙවල් බිඳිති. ගම් පැහැරීමෙන් (වස්තුව) ගෙන යති, ගෙයි වැසියන් පණපිටින් ගෙණ වස්තුව පැහැරගණිති, මං පැහැරීම (මංකොල්ලකෑම) කරති. පරස්ත්‍රීන් කරාද යති, (මෙසේ කරන) ඒ මේ සොරුන් රජවරු අල්වා නොයෙක් කම් කටුළු කරවත්. කසවලින්ද තලත්. වේවැල්වලින්ද තලත්, දෙකට පැලූ (දෙරියන් පමණ) දඬුවලින්ද තලත්, අතද කපත්, පයද කපත්, අත් පා සියල්ලද කපත්, කණද කපත්, නාසයද කපත්, කන් නාසා ද කපත්, බිලංගථාලික (හිස් කබල ගලවා මොලය උතුරවමින්

කරන) නම් වධය කරත්. සංඛමුණ්ඩික (හිසේ කෙස් හා සම ගලවා බොරළු ලා උලා සුදු කිරීම) නම් වධය කරත්. රාහුමුඛ (අඬුවෙන් කට අරවා එහි තුළ ගිනිදැල්වීම) නම් වධය කරත් ජෝතිමාලික (ශරීරය තෙල් රෙදිවලින් වෙලා ගිනි දැල්වීම) නම් වධය දෙත්, හත්ථපජ්ජෝතික (අත්දෙකේ තෙල් රෙදි වෙලා ගිනි දැල්වීම) නම් වධය දෙත්, එරකවත්තික (බෙල්ලෙහි පටන් ඇස්වටය දක්වා හම ගලවා ඔහු ලවා පෑගවීම) නම් වධය දෙත්, චීරකවාසික (බෙල්ලෙහි පටන් තුනටිය දක්වා සම ගලවා තබා එතැනින් පටන්ගෙණ ඇස්වටය දක්වා සම ගලවා තැබීම) නම් වධය දෙත්, එණෙය්‍යක (දෙදන දෙවැලමිටිවල යවුල් ගසා වටකොට ගිනි කිරීම) නම් වධය යත්, බලිසමංසික (දෙපැත්තෙන් තුඩු ඇති බිලියෙන් ගසා මස් කැඩීම) නම් වධය දෙත්. කහාපණක (කහවණු සේ මස් කැපීම) නම් වධය දෙත්, ඛාරාපතච්ඡික (සිරුර සිදුරු කොට කාරම්දිය ඉසීම) නම් වධය දෙත්, පළිඝපරිවත්තික (ඇලයකින් බිම හොවා කණෙහි යවුල් ගසා පය ගෙණ කරකැවීම) නම් වධය දෙත්, පලාලපීඨික (සම නොබිඳෙන සේ ඇට මස් තලා පිදුරු වැටියක්සේ ඇකිලීම) නම් වධය දෙත්, රත්වූ තෙල් ඉසිත්, බල්ලන් ලවා කවත්, ජීවිතය තිබියදීම උලෙහි ඉඳුවත්, කඩුවෙන් හිස සිඳිත්, ඔව්හු එහි මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්, මහානාමය, මෙලොවදීම විඳියයුතුවූ මේ දුක් රාසිය කාමය හෙතුකොට, කාමය මුල් කරුණකොට, කාමය කරණකොට ගෙන කාමය නිසා ඇතිවන කාමයන්ගේ දෝෂයයි.

**6.** "මහානාමය, නැවත අනිකක්ද කියමි. කාමය හෙතුකොට, කාමය මුල් කරුණ කොට, කාමය කරණකොට ගෙන කාමය නිසා කයින් දුසිරිතෙහි හැසිරෙති, වචනයෙන් දුසිරිතෙහි හැසිරෙති, සිතින් දුසිරිතෙහි හැසිරෙති, ඔව්හු කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු වැටීමක් ඇත්තාවූ නිරයෙහි උපදිති. මහානාමය, පරලොවදී විඳිය යුතුවූ මේ දුක් රාසිය කාමය හෙතුකොට, කාමය මුල් කරුණ කොට කාමය කරණ කොට ගෙන, කාමය නිසා ඇතිවන කාමයන්ගේ දෝෂයයි.

"මහානාමය, මම එක් කලෙක රජගහනුවර ගිජ්ජකූට නම්වූ පර්වතයෙහි වාසය කරමි. එකල්හි බොහෝවූ නිගණ්ඨයෝ, ඉසිගිලි පර්වතය අසලවූ කලුගල් තලාවෙහි උඩුකුරුව සිටියාහු ආසනවල වාඩි නොවන්නාහු උත්සාහයෙන් ඇතිකරගත් දුක්වූ තියුණුවූ වෙදනාවන් විඳිත්. මහානාමය, එකල්හි මම සවස් කාලයෙහි, උතුම් පලසමවතින් නැගිටියේ ඉසිගිලි පර්වතය අසල කලුගල් තලාව යම් තැනෙක්හිද, ඒ නිගණ්ඨයෝ යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් නිගණ්ඨයන්ට මෙසේ කීයෙමි. 'ඇවැත්නි, නිගණ්ඨයෙනි, තෙපි කුමකට උඩුකුරු වූවාහු අසුන්වල වාඩි නොවන්නාහු උත්සාහයෙන් ඇතිකරගත් තියුණුවූ වේදනාවෙන් විඳින්නාහුදැ'යි ඇසීමි.

"මහානාමය, මෙසේ කීකල්හි, ඒ නිගණ්ඨයෝ මට මෙසේ කීවාහුය. 'ඇවැත්නි, නිගණ්ඨනාත පුත්‍රතෙම, හැසිරෙන්නා වූද, සිටින්නාවූද, නිදන්නාවූද, නිදි නැතිව සිටින්නාවූද මට සියල්ල දන්නාවූ, සියල්ල දක්නාවූ ඥාන දර්ශනය නිතරම එළඹ සිටියේයයි ප්‍රතිඥා කරයි. ඒ නිගණ්ඨනාත පුත්‍ර තෙම මෙසේ කියයි. නිගණ්ඨයෙනි, තෙපි සියලුදෙන විසින් කරන ලද පාපකර්ම ඇත්තේය. එය කටුකවූ මේ දුෂ්කර ක්‍රියාවෙන් දිරවව්. යම් හෙයකින් මෙහි දැන් කයින් සංවර වූවාහුද වචනයෙන් සංවර වූවාහුද සිතින් සංවර වූවාහුද ඒ සංවරය නම් මත්තෙහි විපාක දෙන්නාවූ පාපකර්ම නොකිරීමයි. මෙසේ පූර්ව කර්ම තපස් බලයෙන් තුනීකිරීමෙන් අළුත් කර්ම නොකිරීමෙන් මත්තෙහි කර්ම රැස්නොවීම වෙයි. කර්ම රැස්නොවීමෙන් කර්මයන්ගේ අවසන්වීම වෙයි. කර්ම අවසන් වීමෙන් දුක් කෙළවර වෙයි. දුක් කෙළවර වීමෙන් වේදනා කෙළවර වේ. වේදනාවන්ගේ කෙළවර වීමෙන් සියලු දුක් දිරූයේ වන්නේයයි (කියයි) අපට ඒ ක්‍රමය රුචිද වෙයි. කැමතිද වෙයි. එයින් අපි සතුටු වෙමු"යි (කීහ.)

"මහානාමය මෙසේ කීකල්හි මම ඒ නිගණ්ඨයන්ට මෙසේ කීවෙමි. ඇවැත් නිගණ්ඨයෙනි, කිමෙක්ද? තෙපි පෙර අපි වීමුද, නොවීමුදැයි, දන්නහුද? ඇවැත්නි, අපි නොදන්නෙමු. කිමෙක්ද?

ඇවැත්වූ නිගණ්ඨයෙනි, තෙපි පෙර පව්කම් කෙළෙමුද නොකෙළෙමුදැයි දන්නාහුද? ඇවැත්නි, නොදන්නෙමු. ඇවැත්නි, නිගණ්ඨයෙනි, අපි පෙර මෙබඳු මෙබඳුවූ පව්කම් කෙළෙමුයයි දන්නාහුද? ඇවැත්නි, නොදන්නෙමු. ඇවැත්නි, නිගණ්ඨයෙනි, කිමෙක්ද? තෙපි මෙපමණ දුක් දිරා ගියේය. මෙපමණ දුක් දිරවිය යුතුය, මෙපමණ දුක් දිරූ කල්හි සියලු දුක දිරූයේ වන්නේයයි දන්නහුද? ඇවැත්නි, නොදන්නෙමු. ඇවැත්නි, නිගණ්ඨයෙනි. කිමෙක්ද? තෙපි මේ ආත්මයෙහිම අකුශලධර්මයන් නැතිකිරීමද කුසල ධර්මයන් රැස්කිරීමද දන්නහුද? ඇවැත්නි, මෙය නොදන්නෙමු.

"නිගණ්ඨයෙනි, මෙසේ වනාහි තෙපි "පෙර අපි වීමුද, නොවීමුදැයි කියාත් නොදන්නහුය. අපි පෙර පව්කම් කෙළෙමුද, නොකෙළෙමුදැයි කියාත් නොදන්නහුය. අපි පෙර මෙබඳු මෙබඳුවූ පව්කම් කෙළෙමුයයි කියාත් නොදන්නහුය. මෙපමණ දුක් දිරුවේය. මෙපමණ දුක් දිරවිය යුතුය. මෙපමණවූ දුක් දිරූකල්හි සියලු දුක් දිරූයේ වන්නේයයි කියාත් නොදන්නහුය. මේ ආත්මයෙහි අකුසල ධර්මයන් නැතිකිරීම හා කුසල ධර්මයන් රැස්කිරීමත් නොදන්නහුය. ඇවැත්නි නිගණ්ඨයෙනි, මෙසේ ඇතිකල්හි මිනිසුන් අතර උපන් රෞද්‍රවූ ලේ තැවරුණ අත් ඇති ක්‍රෑර ක්‍රියා ඇති යම් මනුෂ්‍ය කෙනෙක් වෙත්ද, ඔව්හු නිගණ්ඨයන් අතර පැවිදි වෙතියයි (කීමි.)

"ඇවැත්නි, ගෞතමයෙනි, සැපයෙන් සැපය නොලැබිය හැකිය, දුකින්ම සැපය ලැබිය යුතුය. ඇවැත්නි, ගෞතමයෙනි, සැපයෙන් සැපය ලැබිය හැකි වන්නේ නම්, මගධ රටට අධිපති සෙනිය බිම්බිසාර රජතෙම සැප ලබන්නේය. ආයුෂ්මත් ගෞතමයන්ට වඩා මගධ රටට අධිපතිවූ සෙනිය බිම්බිසාර රජතෙම අතිශයින් සැප විහරණ ඇත්තේයයි (කීවාහුය.) ආයුෂ්මත් නිගණ්ඨයන් විසින් ඒකාන්තයෙන් වහා කරුණු නොසලකා, ඇවැත් ගෞතමයෙනි, සැපයෙන් සැපය නොලැබිය හැකිය. දුකින්ම සැපය ලැබිය යුතුය. ඇවැත් ගෞතමයෙනි, සැපයෙන් සැපය ලැබිය හැකි වන්නේ නම්, මගධ රටට අධිපති

සෙනිය බිම්බිසාර රජතෙම සැප ලබන්නේය. ආයුෂ්මත් ගෞතමයන්ට වඩා මගධරටට අධිපති සෙනිය බිම්බිසාර රජතෙම අතිශයින් සැපවිහරණ ඇත්තේය යන වචනය කියනලදී, නොඑසේ නම් තොප විසින් ආයුෂ්මතුන් අතුරෙන් මගධ රටට අධිපති සේනා ඇති බිම්සර රජ වඩා සැප විහරණ ඇත්තේද ආයුෂ්මත් ගෞතම තෙමේ වඩා සැපවිහරණ ඇත්තේදැයි මගෙන්ම ඇසිය යුත්තේය.

"ඇවැත් ගෞතමයෙනි, අප විසින් "ඇවැත්නි ගෞතමයෙනි, සැපයෙන් සැපය නොලැබිය හැකිය. දුකින්ම සැපය ලැබිය යුතුය. ඇවැත්නි, ගෞතමයෙනි සැපයෙන් සැපය ලැබිය හැකි වන්නේ නම්, මගධ රටට අධිපති සෙනිය බිම්බිසාර රජතෙම සැපය ලබන්නේය. ආයුෂ්මත් ගෞතමයන්ට වඩා මගධ රටට අධිපතිවූ සෙනිය බිම්බිසාර රජතෙම අතිශයින් සැප විහරණ ඇත්තේය" යන වචනය එකාන්තයෙන්ම කරුණු නොසලකා වහා කියන ලද්දේය.

ඒ වචනය තිබේවා, දැන් අපි ආයුෂ්මත් ගෞතමයන්ගෙන් විචාරන්නෙමු. 'මගධ රටට අධිපතිවූ සේනා ඇති බිම්බිසාර නම්වූ රජත් ආයුෂ්මත් ගෞතමයෝත් යන දෙදෙනා අතුරෙන් කවරෙක් අතිශයින් සැපවිහරණ ඇත්තේදැයි (අසමු.)

"ඇවැත්නි, නිගණ්ඨයෙනි, එසේ වීනම් එහිලා තොපම විචාරන්නෙමි. යම්සේ තොපට රුචිවේද, එසේ එය ප්‍රකාශ කරව්. ඇවැත්නි, නිගණ්ඨයෙනි, මගධෙශ්වරවූ සෙනිය බිම්බිසාර රජතෙම කයින් නොසෙල්වෙමින් වචනයක් නොකියමින් සත් රෑ දවාලක් මුළුල්ලෙහි නිරතුරු සැප විඳිමින් වාසය කරන්නට සමර්ථ වේද? නැත ඇවැත්නි, රෑ දාවල් සයක් වාසය කරන්ට හැකිවේද, රෑ දාවල් පහක් - රෑ දාවල් හතරක් - රෑ දාවල් තුනක් - රෑ දාවල් දෙකක් - රෑ දාවල් එකක් වාසය කරන්ට හැකිවේද, නැත ඇවැත්නි,

"ඇවැත්නි නිගණ්ඨයෙනි, මම වනාහි කයින් නොසෙල්වෙමින් වචනයක් නොකියමින් එක් රෑ දවාලක් මුළුල්ලෙහි එකාන්තයෙන් සැපවිඳිමින් වාසය කරන්ට

පොහොසත් වෙමි. රෑ දාවල් දෙකක් - රෑ දාවල් තුනක් - රෑ දාවල් හතරක් - රෑ දාවල් පහක් - රෑ දාවල් හයක් - රෑ දාවල් හතක් - මුළුල්ලෙහි එකාන්තයෙන් සැප විඳිමින් වාසය කරන්ට සමර්ථවෙමි. (ඇවැත්නි) මෙසේ ඇතිකල්හි මගධෙශ්වරවූ සෙනිය බිම්බිසාරය, මමය යන අප දෙදෙනා අතුරෙන් කවරෙක් අතිශයින් සැපවිහරණ ඇත්තේදැයි සිතන්නහුද? මෙසේ ඇතිකල්හි ආයුෂ්මත් ගෞතම තෙමේම, මගධෙශ්වරවූ සෙනිය බිම්බිසාර රජුට වඩා අතිශයින් සැපවිහරණ ඇත්තේය”යි කීවාහුය.

මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ වදාළහ. සතුටුවූ මහානාම ශාක්‍ය රජතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

(දහහතරවෙනිවූ චූලදුක්ඛක්ඛන්ධ සූත්‍රය නිමි.)

---

## 15. අනුමාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිර තෙම භග්‍ග නම් දනව්වෙහි සුංසුමාර ගිරි නම් නුවර මිගදාය නම්වූ භෙසකලා නම් වනයෙහි වාසය කරති. එකල්හි ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ‘ඇවැත්නි, මහණෙනි, කියා භික්ෂූන්ට කථාකළහ. ‘ඇවැත්නි, කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළහ.

ඇවැත්නි, (යම්කිසි) භික්ෂුවක් තෙම “මම ආයුෂ්මතුන් විසින් අනුශාසනා වශයෙන් කියයුත්තේ වෙමි. මට ආයුෂ්මත්හු අවවාද වශයෙන් කරුණු කියත්වා” යයි ඉදින් (අන්‍ය භික්ෂූන්) පවරාද, (එසේ ඉල්ලා සිටියත්) ඒ භික්ෂුව දුර්වචයෙක් (අවවාදය නොපිළිගන්නා හෙයින් අවවාද කිරීමට අමාරුවූවෙක්) වෙයි නම් දුර්වචබව ඇතිකරන ගතිවලින් යුක්ත නම් නොඉවසන

ගතියෙන් යුක්ත නම්, අනුශාසනාව නුහුරට ගන්නේ නම් එසේ ඇතිකල්හි එක්ව මහණදම් පුරන භික්ෂූහු ඔහු අවවාද කළ යුත්තෙකු කොට නොහඟිත්. අනුශාසනා කළ යුත්තෙකු කොට නොහඟිත්. ඒ පුද්ගලයා විශ්වාසය තැබිය යුත්තෙකු කොට නොහඟිත්.

**2.** "ඇවැත්නි, දුර්වච බව කරන කරුණු කවරහුද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම (තැතිගුණ අඟවන) ලාමක අදහස් ඇත්තේ වෙයිද, ලාමක අදහස්වලට වසඟවූයේ වෙයිද, ඇවැත්නි, මහණ තෙම ලාමක අදහස් ඇත්තේය. ලාමක අදහස්වලට වසඟවූයේය යන යමක් වේද, මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම තමා උසස් කොට සලකන්නේ වෙයිද අනුන්ට ගරහන්නේ වෙයිද, ඇවැත්නි, මහණ තෙම තමන් උසස් කොට සිතන්නේය. අනුන්ට ගරහන්නේය යන යමක් වේද, මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේද, ක්‍රොධයෙන් මඩනාලද සිත් ඇත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේය. ක්‍රොධයෙන් මඩනාලද සිත් ඇත්තේය යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේ ක්‍රොධය හෙතුකොටගෙන බද්ධ වෛර ඇත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේ ක්‍රොධය හෙතුකොටගෙන බද්ධ වෛර ඇත්තේය යන යමක් වේද, මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේ ක්‍රොධය හෙතුකොටගෙන නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නේවේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේ, ක්‍රොධය හෙතුකොටගෙන නපුරු

ක්‍රියාවන්හි ඇලෙන්නේය යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේවේද ක්‍රොධයට කිට්ටු වචන කියන්නේ වේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ කරන ස්වභාව ඇත්තේ ක්‍රොධයට කිට්ටු වචන කියන්නේය යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

3. "ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. චෝදනා කරන්නකු විසින් චොදනා කරන ලද්දේ චොදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව සිටීද, ඇවැත්නි, මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ චොදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව සිටියි යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ චොදනා කරන තැනැත්තාට අවමන් කෙරේද, ඇවැත්නි, මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ චොදකයාට අවමන් කරයි යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම චොදනා කරන්නෙකු විසින් චොදනා කරනලද්දේ චොදකයාට (චොදනා කළ තැනැත්තාට) චොදනාව හරවයිද, ඇවැත්නි, මහණ තෙම චොදනාකළ තැනැත්තා විසින් චොදනා කරන ලද්දේ චොදනා කළ තැනැත්තාට චෝදනාව හරවයි යන යමක් වේද මේ කාරණය දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ අනික් කථාවකින් අනික් කරුණක් වසාද, කථාව පිටතට නමාද කොපයද තරහයද නොසතුටද පහළ කරයිද, ඇවැත්නි, මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ අනික් කථාවකින් අනික් කරුණක් වසයි. කථාව පිටතට නමයි කොපයද තරහයද

නොසතුටද පහළ කරයි යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ තමන්ගේ පැවැත්ම ප්‍රකාශ නොකරයිද, ඇවැත්නි, මහණතෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ තමන්ගේ පැවැත්ම, ප්‍රකාශ නොකරයි යන යමක්වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

4. "ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ගුණමකු වේද (ගුණ නැතිව සිටිමින් ගුණවතුන් හා තමා සමකර සලකන්නේ) යුගග්‍රාහ ඇත්තේ වෙයිද, ඇවැත්නි, මහණතෙම ගුණමකු වේය යුගග්‍රාහ ඇත්තේවේය යනයමක් වේද, මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ඊර්ෂ්‍යා කරන්නේ වෙයිද මසුරු මලයෙන් යුක්ත වූයේ වෙයිද ඇවැත්නි, මහණ තෙම ඊර්ෂ්‍යා කරන්නේය. මසුරු මලින් යුක්ත වූයේය යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම කෛරාටිකවේද, රැවටිලි ඇත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම කෛරාටික වෙයි. රැවටිලි ඇත්තේ වෙයි. යන යමක් වේද මේ කාරණයද දුර්වච බව කරන්නේය.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තදගති ඇත්තේවේද අධික මාන ඇත්තේ වේද ඇවැත්නි, මහණ තෙම තද ගති ඇත්තේය. අධික මාන ඇත්තේය යන යමක් වේද මේ කාරණය දුර්වච බව කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම තමාගේම ලබ්ධිය දැඩි වශයෙන් ගන්නේ එයින් දුකසේ බැහැර කරවිය යුතු වූයේ වෙයිද ඇවැත්නි, මහණ තෙම තමාගේම ලබ්ධිය දැඩිවශයෙන් ගන්නේ එයින් දුකසේ බැහැර කරවිය යුතුය යන යමක් වේද, මේ කාරණයද දුර්වච බව කරන්නකි. ඇවැත්නි, මේ කරුණු දුර්වච බව කරන ගතියයි කියනු ලැබෙත්.

"ඇවැත්නි, මහණ තෙම 'ආයුෂ්මත්හු මට අවවාද වශයෙන් කියත්වා, මම ආයුෂ්මතුන් විසින් කියයුත්තෙක් වෙමියි ඉදින් (අන්‍ය භික්ෂූන්) නොපවරාද (එසේ ඉල්ලා නොසිටියත්) ඒ භික්ෂුව සුවචයෙක් නම්, (අවවාදය පිළිගන්නා හෙයින් අවවාද කිරීමට පහසු කෙනෙක්) වෙයි නම්, සුවච බව ඇති කරන්නාවූ කරුණුවලින් යුක්ත නම්, ඉවසන ගතියෙන් යුක්ත නම් අනුශාසනාව ගෞරවයෙන් පිළිගන්නේ නම් එකල්හි එක්ව මහණදම් පුරන භික්ෂූහු ඔහු කියයුත්තෙකු කොට හඟිත්. අනුශාසනා කටයුත්තෙකු කොට හඟිත්. ඒ පුද්ගලයා කෙරෙහි විශ්වාසය තැබිය යුතුයයි හඟිත්.

**5.** "ඇවැත්නි, සුවචබව කරන ධර්මයෝ කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම (නැති ගුණ හඟවන) ලාමක අදහස් ඇත්තේ නොවේද, ලාමක අදහස්වලට වසඟනොවූයේ වේද, ඇවැත්නි, මහණතෙම ලාමක අදහස් ඇත්තේ නොවේ, ලාමක අදහස්වලට වසඟ නොවූයේය යන යමක් වේද මේ කාරණයද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමා උසස්කොට නොසලකන්නේ වේද, අන්‍යයා පහත් කොට නොසලකන්නේ වේද, මහණතෙම, තමා උසස් කොට නොසලකන්නේ අන්‍යයා පහත් කොට නොසලකන්නේය යන යමක් වේද මේ කාරණයද සුවච බව ඇතිකරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේ, ක්‍රොධයෙන් මඩනාලද සිත් ඇත්තේ නොවේද, ඇවැත්නි, මහණතෙම ක්‍රොධ නොකරණ ස්වභාව ඇත්තේය. ක්‍රොධයෙන් මඩනාලද සිත් නැත්තේය. යන යමක් වේද, මේ කාරණයද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ක්‍රොධ නොකරණ ස්වභාව ඇත්තේ ක්‍රොධය හෙතුකොටගෙන බද්ධ වෛර නැත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේ, ක්‍රොධය හෙතුකොටගෙන බද්ධ වෛර නැත්තේය යන යමක් වේද, මේ කාරණයද සුවච බව ඇති කරන්නකි.

ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේ ක්‍රොධ හෙතුවෙන් (නපුරු ක්‍රියාවන්හි) නොඇලෙන්නේ වේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේ, ක්‍රොධ හෙතුවෙන් නපුරු ක්‍රියාවන්හි නොඇලෙන්නේය යන යමක්වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේ ක්‍රොධයට කිට්ටු වචන නොකියන්නේද, ඇවැත්නි, මහණ තෙම ක්‍රොධ නොකරන ස්වභාව ඇත්තේය, ක්‍රොධයට කිට්ටු වචන නොකියන්නේය යන යමක් වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

**6.** "ඇවැත්නි, මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ චොදනාකළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව නොසිටීද, මහණ තෙම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ චොදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව නොසිටී යන යමක් වේද, මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අවමන් නොකෙරේද, ඇවැත්නි, මහණ තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අවමන් නොකරයි යන යමක්වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චොදනා කළ තැනැත්තාට චෝදනා නොනංවයිද ඇවැත්නි, මහණ තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තා පිට චෝදනාව නොනංවයි යන යමක් වේද, මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරනලද්දේ අනික් කථාවකින් අනික් කරුණක් නොවසයිද කථාව පිටතට නොනමයිද කෝපයද

තරහද නොසතුටද පහළනොකරයිද ඇවැත්නි, මහණතෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ අනික් කථාවකින් අනික් කරුණක් නොවසයි. කථාව පිටතට නොනමයි. කෝපයද තරහද නොසතුටද පහළ නොකරයි යන යමක් වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ තමාගේ පැවැත්ම නොකියයිද ඇවැත්නි, මහණ තෙම චෝදකයා විසින් චෝදනා කරන ලද්දේ තමාගේ පැවැත්ම නොකියයි යන යමක් වේද, මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

7. "ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ගුණමකු නොවේද ගුණ නැතිව ගුණ ඇති අනුන් හා සමාන නොකරන්නේ වේද, ඇවැත්නි, මහණ තෙම ගුණමකු නොවේ. ගුණයෙන් අනුන් හා සමාන නොකරන්නේ වේ යන යමක් වේද, මේ කරුණද සුවච බව ඇති කරන්නකි. ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ඊර්ෂ්‍යා නොකරන්නේ වේද, මසුරුමල නැත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම ඊර්ෂ්‍යා නොකරන්නේ වෙයි. මසුරුමල නැත්තේය යන යමක් වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම කෛරාටික නොවේද රැවටිලි නැත්තේ වේද, ඇවැත්නි, මහණතෙම කෛරාටික නොවේ. රැවටිලි නැත්තේය යන යමක් වේද, මේ කරුණද සුවච බව ඇති කරන්නකි.

"ඇවැත්නි නැවත අනිකක්ද කියමි. මහණතෙම තද ගති නැත්තේ වේද, අධික මාන නැත්තේ වේද, ඇවැත්නි, මහණ තෙම තදගති නැත්තේය. අධික මාන නැත්තේය යන යමක්වේද මේ කරුණද සුවච බව ඇතිකරන්නකි. ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමාගේ විශ්වාසයම නොගන්නේ වේද, තමාගේම ලබ්ධිය දැඩි වශයෙන් නොගන්නේ එයින් පහසුවෙන් වෙන් කළ හැක්කේ වේද, ඇවැත්නි, මහණතෙම තමාගේම විශ්වාසය නොගන්නේය. තමාගේම ලබ්ධිය දැඩි

වශයෙන් නොගන්නේ පහසුවෙන් එයින් වෙන් කළ හැක්කේය යන යමක් වේද මේ කරුණද සුවච බව ඇති කරන්නකි. ඇවැත්නි. මොව්හු සුවචභාවය ඇති කරන කරුණුයයි කියනු ලැබෙත්.

8. "ඇවැත්නි, මහණහු විසින් මේ කරුණු දහසයෙහි තමා විසින්ම තමා මෙසේ මැන බැලිය යුතුයි. (කෙසේද?) යම් මේ පුද්ගලයෙක් තෙම ලාමක අදහස් ඇත්තේ ලාමක අදහස්වල වසඟයට ගියේ වේද, (එහෙයින්) මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද ලාමකවූ අදහස් ඇත්තේ ලාමක අදහස්වල වසඟයට ගියේ වෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූයේ අමනාප වූයේ වන්නෙමි. ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් ලාමක අදහස් ඇත්තෙක් නොවන්නෙමියි, ලාමකවූ අදහස්වල වසඟයට ගියේත් නොවන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි තමා උසස් කරන්නේ අනුන් පහත් කරන්නේ වේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද තමා උසස් කරන්නෙක් අනුන් පහත් කරන්නෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමියි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් තමා උසස් නොකරන්නෙක් අනුන් පහත් නොකරන්නෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි කිපෙන ගති ඇත්තේ ක්‍රොධයෙන් මඩනාලද්දේ වේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද කිපෙනසුලු වූවෙක් ක්‍රොධයෙන් මඩනා ලද්දෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමියි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් නොකිපෙන ගති ඇත්තෙක් ක්‍රොධයෙන් නොමඩනා ලද්දෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුය.

"යම් මේ පුද්ගලයෙක් වනාහි කිපෙන ගතිය ඇත්තේ ක්‍රොධය හෙතුකොට ඇති බද්ධ වෛර ඇත්තෙක් වේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද කිපෙන ගතිය ඇත්තෙක් ක්‍රොධය හෙතුකොට බද්ධ වෛර ඇත්තෙක් වන්නෙම්ද, මමද,

අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි. ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් කිපෙන ගති ඇත්තෙක් නොවන්නෙමි. ක්‍රොධය හෙතුකොට බද්ධ වෛර ඇත්තෙක් නොවන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි කිපෙන ගතිය ඇත්තේ ක්‍රොධය හෙතුකොට නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නෙක් වේද, මේ පුද්ගල තෙමේ මට අප්‍රියය, අමනාපය, මමද අනුන්ට ක්‍රොධ කරන්නෙම් නම්, ක්‍රොධය හෙතු කොට නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියවූවෙක් අමනාප වූවෙක් වන්නෙමි. ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් කිපෙන ගති ඇත්තෙක් නොවන්නෙමි. ක්‍රොධය හෙතුකොට නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නෙක් නොවන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි කිපෙනසුලු වූයේ ක්‍රොධයට සමීපවූ වචන කියන්නේවේද, මේ පුද්ගලතෙම මට අප්‍රියය අමනාපය, මමද කිපෙනසුලු වූවෙක් ක්‍රොධයට සමීපවූ වචන කියන්නෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියයෙක් අමනාප වූවෙක් වන්නෙමියි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් කිපෙන ගති ඇත්තෙක් නොවන්නෙමි, ක්‍රොධයට සමීප වචන කියන්නෙක් නොවන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

**9.** "යම් පුද්ගලයෙක් වනාහි චොදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා කරයිද මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා කරන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා නොකරන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් තෙම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අවමන් කරයිද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද චෝදනා කරන්නා

විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අපහාස කරන්නෙම් නම්, මමද අනුන්ට අප්‍රියවූවෙක් අමනාප වූවෙක් වන්නෙමියි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අපහාස නොකරන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා කෙරේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා කරන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියයෙක් අමනාපයෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරලා චෝදනා නොකරන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ අනිකකින් අනිකක් වසාද, කථාව පිටතට නමයිද, කොපයද, තරහද, නොසතුටද, පහළ කෙරේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ, අනිකකින් අනිකක් වසන්නෙම් නම්, කථාව පිටතට නමන්නෙම් නම් කෝපයත්, තරහයත්, නොසතුටත්, පහළ කරන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියයෙක් අමනාපයෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්සුව විසින් චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ අනිකකින් අනිකක් නොවසන්නෙමි කතාව පිටතට නොනමන්නෙමි. කොපයත් තරහයත් නොසතුටත් පහළ නොකරන්නෙමියි, සිත ඉපද විය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ තමන්ගේ පැවැත්ම නොකියයි නම් මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ තමන්ගේ පැවැත්ම නොකියන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියයෙක් අමනාපයෙක්

වන්නෙමි. ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ තමන්ගේ පැවැත්ම කියන්නෙමියි සිත ඉපදවිය යුතුයි.

**10.** "යම් මේ පුද්ගලයෙක් වනාහි ගුණමකුවූයේ, යුගග්‍රාහ ඇත්තේවේද මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද මකුගුණ ඇත්තේ යුගග්‍රාහ ඇත්තේ වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රියයෙක් අමනාපයෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් මකුගුණ නැත්තෙක් යුගග්‍රාහ නැත්තෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි ඊර්ෂ්‍යා කරන ස්වභාව ඇත්තේ මසුරුවූයේද මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මම ඊර්ෂ්‍යා ඇත්තේ මසුරු බැව් ඇත්තේ වන්නෙම්ද, මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් ඊර්ෂ්‍යා නැත්තෙක් මසුරු බැව් නැත්තෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි කෛරාටික වූයේ මායා ඇත්තේ වේද, මේ පුද්ගලතෙම මට අප්‍රියය, අමනාපය, මමද කෛරාටික වූයේ මායා ඇත්තේ වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් කෛරාටික නුවූවෙක්, මායා නැත්තෙක් වන්නෙමියි සිත ඉපදවිය යුතුයි. යම් මේ පුද්ගලයෙක් වනාහි තදගති ඇත්තෙක් අධික මාන ඇත්තෙක්වේද, මේ පුද්ගල තෙම මට අප්‍රියය, අමනාපය, මමද තදගති ඇත්තෙක් අධික මාන ඇත්තෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් තදගති නැත්තෙක් අධික මාන නැත්තෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

"යම් මේ පුද්ගලයෙක් වනාහි තමාගේම මතය ගෙන සිටින්නේ තමාගේම ලබ්ධිය දැඩිලෙස ගන්නේ එයින් බැහැර කරවිය නොහැක්කේ වේද? මේ පුද්ගල තෙම මට අප්‍රියය අමනාපය, මමද මගේම මතය ගෙන සිටින්නේ මගේම ලබ්ධිය

දැඩිකොට ගැණීම ඇත්තේ එයින් බැහැර කරවිය නොහැක්කෙක් වන්නෙම් නම් මමද අනුන්ට අප්‍රිය වූවෙක් අමනාප වූවෙක් වන්නෙමි, ඇවැත්නි, මෙසේ දන්නාවූ භික්ෂුව විසින් තමාගේම මතය නොගන්නෙක් තමාගේම ලබ්ධිය දැඩිකොට ගැණීම නැත්තෙක්, පහසුවෙන් එයින් බැහැරකළ හැක්කෙක් වන්නෙමියි, සිත ඉපදවිය යුතුයි.

11. "ඇවැත්නි, ඒ කාරණයන්හි භික්ෂුව තමා විසින්ම තමා ගැන මෙසේ සලකාබැලිය යුතුයි. කිමෙක්දෝ මම ලාමක අදහස් ඇත්තේ වෙම්ද ලාමකවූ අදහස්වල වසඟයට ගියේ වෙම්දෝයි (සැලකිය යුතුයි) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකාබලන්නේ ලාමක අදහස් ඇත්තෙම් ලාමකවූ අදහස්වල වසඟයට ගියෙම් වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි. ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම එසේ සලකා බලන්නේ ලාමක අදහස් ඇත්තෙම් නොවෙමි, ලාමක අදහස්වල වසඟයට ගියෙම් නොවෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කළ යුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා ගැන මෙසේ සලකා බැලිය යුතුයි කිමෙක්දෝ මම තමා උසස් කරන්නේ අනුන් පහත් කරන්නෙක් වෙම්දැයි, (සලකා බැලිය යුතුයි.) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකාබලන්නේ මම තමන් උසස් කරන්නෙක්, අනුන් පහත් කරන්නෙක් වෙමියි මෙසේ දනීද, ඇවැත්නි. ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරු කිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම සලකා බලන්නේ මම තමා උසස් නොකරන්නේ අනුන් පහත් නොකරන්නෙක් වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි, භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම කිපෙන

සුළුවූයේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ වෙම්දැයි, (සලකා බැලිය යුතුයි.) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ ක්‍රොධයෙන් මඩනාලද්දේ වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ නොවෙමියි මෙසේ දනීද, ඇවැත්නි,ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන් යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි, භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම කිපෙන ස්වභාව ඇත්තේ ක්‍රොධය නිසා බද්ධ වෛර ඇත්තේ වෙම්දැයි (සලකා බැලිය යුතුය) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ ක්‍රොධය නිසා බද්ධ වෛර ඇත්තේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

"ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ නොවෙමි. ක්‍රොධයට හෙතුවූ බද්ධ වෛර ඇත්තේ නොවෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්සුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම කිපෙනසුලු වූයේ වෙම්දෝයි. (සලකා බැලිය යුතු) ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නෙක් වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ නපුරු ක්‍රියාවන්හි ඇලෙන්නෙක් නොවෙමියි මෙසේ දනීද,

ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ, මම කිපෙන ස්වභාව ඇත්තේ වෙම්ද, ක්‍රොධයට සමීපවූ වචන කියන්නේ වෙම්දැයි (සලකා බැලිය යුතුය) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ වෙමි, ක්‍රොධයට සමීපවූ වචන කියන්නේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම කිපෙන ස්වභාව ඇත්තේ නොවෙමි. කිපීමට සමීපවූ වචන නොකියන්නේ වෙමියි මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂනේම යුක්තව වාසය කටයුතුයි.

12. "ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා ගැන මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව සිටිම්දැයි (සලකා බැලිය යුතුය.)

"ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම මෙසේ සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව සිටිමියි මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම එසේ සලකන්නේ මම චොදනා කරන ලද්දේ, චෝදනා කළ තැනැත්තාට ප්‍රතිවිරුද්ධව නොසිටිමියි මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි, කිමෙක්දෝ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අපහාස කරම්දැයි (සලකා බැලිය යුතුයි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අපහාස කරමියි, මෙසේ දනීද ඇවැත්නි,ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට අපහාස නොකරමියි මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ, මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරළා චෝදනා කෙරෙම්දැයි (සලකා බැලිය යුතුය.)

"ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරළා චෝදනා කරමියි, මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල් ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

"ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ චෝදනා කළ තැනැත්තාට පෙරළා චෝදනා නොකරමියි, මෙසේ දනීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුශල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුය. කිමෙක්දෝ, මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ අනිකකින් අනිකක් වසම්ද, කථාව පිටතට නමම්ද, කොපයත්, තරහත් නොසතුටත් පහළ කෙරෙම්දැයි (සලකා බැලිය යුතුයි.)

"ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ මම චෝදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ අනිකකින්

අනිකක් වසමි. කථාව පිටතට නමමි, කොපයත්, තරහත්, නොසතුටත් පහල කරමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ලාමකවූ ඒ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකන්නේ මම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දෙම් අනිකකින් අනිකක් නොඉවසමි. කථාව පිටතට නොනමමි. කොපයත්, තරහත්, නොසතුටත් පහළ නොකරමියි, මෙසේ දනීද, ඇවැත්නි ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ, ඇවැත්නි, පැවැත්ම ප්‍රකාශ නොකරන්නෙම් දැයි (සලකා බැලිය යුතුයි.) ඒ භික්ෂුව විසින් එසේ සලකා බලන්නේ චොදනා කරන්නා විසින් චෝදනා කරන ලද්දේ පැවැත්ම ප්‍රකාශ නොකරන්නෙමියි මෙසේ දනීද, ඇවැත්නි,ඒ භික්ෂුව විසින් ලාමකවූ ඒ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මම චොදනා කරන්නා විසින් චොදනා කරන ලද්දේ පැවැත්ම ප්‍රකාශ කරමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

13. "ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම ගුණමකුවූයේ යුගග්‍රාහ ඇත්තේ වෙම්දැයි, (සලකා බැලිය යුතු) ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ, මම ගුණමකුවූයේ යුගග්‍රාහ ඇත්තේ වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මම ගුණමකු නොවූයේ යුගග්‍රාහ නැත්තේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියම් භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම ඊර්ෂ්‍යා ඇත්තේ මසුරු බැව් ඇත්තේ වෙම්දෝයි, (සලකා බැලිය යුතුයි.) ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ මම ඊර්ෂ්‍යා ඇත්තේ මසුරු බැව් ඇත්තේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරු කිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මම ඊර්ෂ්‍යා නැත්තේ මසුරු බැව් නැත්තේ වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියම්. භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම කෛරාටික වූයේ මායා ඇත්තේ වෙම්දෝයි, (සලකා බැලිය යුතු.) ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම එසේ සලකා බලන්නේ මම කෛරාටික වූයේ මායා ඇත්තේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරු කිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මම කෛරාටික නොවූයේ මායා නැත්තේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තෝෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

ඇවැත්නි, නැවත අනිකක්ද කියම්. භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ, මම තදගති ඇත්තේ අධික මාන ඇත්තේ වෙම්දෝයි, (සලකා බැලිය යුතුය) ඇවැත්නි, ඉදින් භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම තදගති ඇත්තේ අධික මාන ඇත්තේ වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුසල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භිකෂුතෙම එසේ සලකා බලන්නේ මම තදගති නැත්තේ අධික මාන නැත්තේ වෙමියි, මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව

විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව විසින් තමා විසින්ම තමා මෙසේ සලකා බැලිය යුතුයි. කිමෙක්දෝ මම තමාගේම මතය දැඩිකොට අල්වාගත්තේ තමාගේම ලබ්ධිය දැඩිකොට ගැනීම ඇත්තේ එයින් බැහැර කරවිය නොහැක්කේ වෙම්දෝයි, (සලකා බැලිය යුතුය) ඇවැත්නි, ඉදින් භික්ෂුතෙම එසේ සලකා බලන්නේ, මම තමාගේම මතය අල්වාගත්තේ තමාගේ ලබ්ධිය දැඩිකොට ගැනීම ඇත්තේ එයින් බැහැර කරවිය නොහැක්කේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් ඒ ලාමකවූ අකුශල ධර්මයන්ගේම දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂු තෙම එසේ සලකා බලන්නේ මම තමාගේම මතය අල්වා නොගත්තේ තමාගේම ලබ්ධිය දැඩිකොට ගැනීම නැත්තේ එයින් පහසුවෙන් බැහැර කරවිය හැක්කේ වෙමියි මෙසේ දනීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, ඉදින් මහණතෙම සලකා බලන්නේ තමා කෙරෙහි පහනොකළාවූ මේ සියලු ලාමකවූ අකුසලධර්මයන් දකීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් මේ සියලු ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකාබලන්නේ මේ සියලු ලාමකවූ අකුසල ධර්මයන් තමන් කෙරෙහි නැතැයි දකීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි.

"ඇවැත්නි, යම්සේ වයසින් අඩුවූ, තරුණවූ සැරසීම ස්වභාව කොට ඇත්තාවූ ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ පිරිසිදුවූ නිර්මල වූ කැඩපතක හෝ පැහැදිලි දිය බඳුනක හෝ තමාගේ මුහුණ බලන්නේ ඉදින් එහි දූවිලි හෝ තල කැලල් පිළිකා ආදී දොසක් හෝ දකීද, එම දූවිලි හෝ කිළුටු හෝ දුරු කිරීම පිණිස යම්සේ වෑයම් කරයිද, ඉදින් එහි දූවිලි හෝ කිළුටක් හෝ නොදකීද,

මට ඒකාන්තයෙන් ලාභය, ඒකාන්තයෙන් මාගේ මුහුණ පිරිසිදුයයි, එයින්ම යම්සේ සතුටුවේද, ඇවැත්නි, එපරිද්දෙන්ම ඉදින් භික්ෂුතෙම සලකා බලන්නේ මේ සියලුම ලාමකවූ අකුසල ධර්මයන් තමා කෙරෙහි ඇති බව දකීද, ඇවැත්නි, ඒ භික්ෂුව විසින් සියලුම මේ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි. ඇවැත්නි, ඉදින් වනාහි භික්ෂුතෙම සලකා බලන්නේ මේ සියලුම ලාමකවූ අකුසලධර්මයන් තමා කෙරෙහි නැති බව දකීද ඇවැත්නි, ඒ භික්ෂුව විසින් කුසල ධර්මයන්හි රෑ දාවල් හික්මෙමින් ඒ සන්තොෂයෙන්ම යුක්තව වාසය කටයුතුයි."

ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරතෙම මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

(පස්වෙනිවූ අනුමාන සූත්‍රය නිමි.) (2-5)

---

## 16 චෙතොඛිල සූත්‍රය

**11.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු මහ සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

"මහණෙනි, යම්කිසි භික්ෂුවක් විසින් සිත බැඳී පවත්නා කණු වැනි හෙයින් චෙතොඛිල නම්වූ ධර්මපහක් පහනොකරන ලද්දාහුද හිත සම්බන්ධවූ බැමි පසක් නොසිඳින ලද්දාහුද ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියටද වැඩීමටද මහත් බවටද පැමිණෙන්නේය, යන මේ කාරණය සිදු නොවෙයි ඔහු විසින් පහ නොකරන ලද චෙතොඛිල

ධර්මපස කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි, මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයිද, අවිශ්වාස කරයිද මෙසේ මෙසේයයි නිශ්චයට නොපැමිණේද නොපහදීද මහණෙනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැකකෙරේද විශ්වාස නොකෙරේද, නිශ්චයට නොපැමිණේද නොපහදීද ඒ භික්ෂුහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් පළමුවන චෙතොඛිල ධර්මය පහනොකරන ලද්දේ වෙයි.

2. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ධර්මයෙහි සැකකෙරේද අවිශ්වාස කරයිද මෙසේ මෙසේ යයි නිශ්චයට නොපැමිණේද, නොපහදීද මහණෙනි, යම් භික්ෂුවක් ධර්මයෙහි සැකකෙරේද අවිශ්වාස කරයිද, මෙසේ මෙසේයයි නිශ්චයට නොපැමිණේද නොපහදීද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි, යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් දෙවෙනි චෙතොඛිල ධර්මය පහ නොකරන ලද්දේ වෙයි.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සංඝයා කෙරෙහි සැක කෙරේද? අවිශ්වාස කරයිද, මෙසේ මෙසේයයි නිශ්චයට නොපැමිණේද, නොපහදීද මහණෙනි, යම් ඒ භික්ෂුවක් සංඝයා කෙරෙහි සැක කෙරේද? අවිශ්වාස කරයිද, මෙසේ මෙසේ යයි නිශ්චයට නොපැමිණේද, නොපහදීද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම

පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් තුන්වැනි චෙතොඛිල ධර්මය පහ නොකරන ලද්දේ වෙයි.

**4.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැකකෙරේද, අවිශ්වාස කෙරේද, නිශ්චයට නොපැමිණේද, නොපහදීද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැකකෙරේද අවිශ්වාස කෙරේද, නිශ්චයට නොපැමිණේද, නොපහදීද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස, නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් සතරවැනිවූ චෙතොඛිල ධර්මය පහ නොකරන ලද්දේ වෙයි.

**5.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සබ්‍රම්සරුන් (එකට මහණ දම් පුරණ භික්ෂූන්) කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ තරහයෙන් මැඩුණු සිත් ඇත්තේ තද ගතියෙන් යුක්තවූයේ වේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ තරහයෙන් මැඩුණ සිත් ඇත්තේ තදගතියෙන් යුක්තවූයේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද, මෙසේ ඔහු විසින් මේ පස්වැනි චෙතොඛිල ධර්මය පහනොකරන ලද්දේ වෙයි. ඔහු විසින් මේ චෙතොඛිල ධර්ම පස පහ නොකරන ලද්දාහු වෙත්.

**6.** "ඔහු විසින් කවර නම් සිත පිළිබඳ බැමි පසක් නොසිඳින ලද්දාහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයෙහි පහනුවූ ආශාව ඇත්තේ වේද පහ නුවූ කැමැත්ත ඇත්තේවේද

පහ නුවූ ප්‍රේමය ඇත්තේවේද පහ නුවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද මහණෙනි, යම් මහණෙක් තෙම කාමයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහනුවූ කැමැත් ඇත්තේ වේද පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද, පහ නුවූ පිපාසය ඇත්තේවේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ පළමුවෙනි සිත පිළිබඳ බැම්ම නොසිඳින ලද්දේ වේ.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමන්ගේ කයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද පහනොවූ කැමැත්ත ඇත්තේ වේද, පහ නොවූ ප්‍රේමය ඇත්තේ වේද, පහනොවූ පිපාසය ඇත්තේවේද, පහ නොවූ දැවිල්ල ඇත්තේ වේද, පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද මහණෙනි, යම් මේ භික්ෂුවක් තමන්ගේ කයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහ නොවූ කැමැත්ත ඇත්තේ වේද පහ නොවූ ප්‍රේමය ඇත්තේ වේද, පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නොවූ දැවිල්ල ඇත්තේ වේද, පහනොවූ තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ දෙවෙනි බැම්ම නොසිඳින ලද්දේ වේ.

8. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමාගෙන් අන්‍යවූ රූපයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද,

පහ නොවූ කැමැත්ත ඇත්තේ වේද පහ නොවූ ප්‍රේමය ඇත්තේවේද, පහනොවූ පිපාසය ඇත්තේ වේද, පහ නොවූ දැවිල්ල ඇත්තේ වේද, පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද, මහණෙනි, යම් ඒ මහණෙක් තමාගෙන් අන්‍යවූ රූපයෙහි පහ නොවූ රාගය ඇත්තේ වේද, පහ නොවූ කැමැත්ත ඇත්තේ වේද, පහ නොවූ ප්‍රේමය ඇත්තේ වේද, පහ නොවූ පිපාසය ඇත්තේ වේද, පහ නොවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් සිත පිළිබඳවූ මේ තුන් වෙනි බැම්ම නොසිඳින ලද්දේ වෙයි.

**9.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම කුස පිරන තෙක් අනුභව කොට නිදීම් සැපයෙහිද, ඒ මේ අත පෙරළි පෙරළී නිදීම් සැපයෙහිද යෙදී වාසය කෙරේද, මහණෙනි, යම් මේ භික්ෂුවක් කුස පිරෙන තෙක් අනුභව කොට නිදන සැපයෙහිද, ඒ මේ අත පෙරළි පෙරළී නිදීම් සැපයෙහිද, යෙදී වාසය කෙරේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ, මේ සතර වෙනි බැම්ම නොසිඳින ලද්දේ වේ.

**10.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්ම චරියාවෙන් හෝ මහෙශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමියි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්යාවෙහි හැසිරේද,

මහණෙනි, යම් ඒ භික්ෂුවක් මම මේ ශීලයෙන් හෝ ව්‍රතින් හෝ තපසින් හෝ බ්‍රහ්මචරියාවෙන් හෝ මහෙශාක්‍ය දෙවියෙක් හෝ අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමියි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්යාවෙහි හැසිරේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ පස්වෙනි බැම්ම නොසිඳින ලද්දේ වේ. ඔහු විසින් මේ පස්වැදෑරුම් බැමි නොසිඳින ලද්දේ වේ.

11. "මහණෙනි, යම්කිසි භික්ෂුවක් විසින් චෙතොඛිල ධර්ම පසද මේ විනිබන්ධ ධර්මපසද නොසිඳින ලද්දාහුද ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියටද වැඩීමටද මහත් බවටද පැමිණෙන්නේය යන මේ කාරණය සිදු නොවෙයි.

"මහණෙනි, යම් කිසි භික්ෂුවක් විසින් මේ පස් වැදෑරුම් චෙතොඛිල ධර්මයෝත් පස්වැදෑරුම් විනිබන්ධ ධර්මයෝත් සිඳින ලද්දාහුද ඒ භික්ෂු තෙම ඒ කාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියටද වැඩීමටද මහත් බවටද පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඔහු විසින් කවර නම් චෙතොඛිල ධර්ම පසක් පහකරන ලද්දාහුද යත්?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, නිශ්චයට පැමිණේද, පහදීද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, නිශ්චයට පැමිණේද, පහදීද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර

වීර්ය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් මේ පළමුවැනි චෙතොඛිල ධර්මය පහ කරන ලද්දේ වෙයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ධර්මයෙහි සැක නොකෙරේද අවිශ්වාස නොකෙරේද මෙසේ මෙසේයයි නිශ්චයට පැමිණේද, පහදීද, මහණෙනි, යම් මේ භික්ෂුවක් ධර්මයෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, මෙසේ මෙසේයයි නිශ්චයට පැමිණේද, පහදීද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස, නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් මේ දෙවැනි චෙතොඛිල ධර්මය පහකරන ලද්දේ වෙයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සංඝයා කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, මෙසේ මෙසේයයි නිශ්චයට පැමිණේද, පහදීද, මහණෙනි, යම් මේ භික්ෂුවක් සංඝයා කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, මෙසේ මෙසේයයි නිශ්චයට පැමිණේද, පහදීද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද, මෙසේ ඔහු විසින් මේ තුන්වැනි චෙතොඛිල ධර්මය පහ කරන ලද්දේ වේ.

**12.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේද, මෙසේ මෙසේයයි නිශ්චයට පැමිණේද, පහදීද, මහණෙනි, යම් මේ භික්ෂුවක් ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැක නොකෙරේද, අවිශ්වාස නොකරේද මෙසේ මෙසේ යයි නිශ්චයකට පැමිණේද, පහදීද. ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය පිණිස එම

වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද, මෙසේ ඔහු විසින් මේ සතරවැනි චෙතොඛිල ධර්මය පහ කරන ලද්දේ වෙයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සබ්‍රම්සරුන් (එකට මහණ දම් පුරණ භික්ෂූන්) කෙරෙහි නොකිපියේ සතුටු සිත් ඇත්තේ තරහෙන් නොමඩනා ලද සිත් ඇත්තේ තද ගතියක් නැත්තේ වේද, මහණෙනි, යම් මේ භික්ෂුවක් සබ්‍රම්සරුන් කෙරෙහි නොකිපියේ සතුටු සිත් ඇත්තේ තරහෙන් නොමඩනා ලද සිත් ඇත්තේ තදගති නැත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස. එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්ය පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්ය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් මේ පස්වන චෙතොඛිල ධර්මය පහ කරන ලද්දේ වෙයි. මෙසේ ඔහු විසින් මේ චෙතොඛිල ධර්ම පස පහ කරන ලද්දාහු වෙත්.

13. "ඔහු විසින් කවර නම් සිත පිළිබඳ බැමි පසක් සිඳින ලද්දාහු වෙත්ද? මහණෙනි, මේ ලොකයෙහි මහණ තෙම කාමයෙහි පහවූ ආශාව ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසා ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, මහණෙනි, යම් මේ භික්ෂුවක් කාමයෙහි පහවූ ආශාව ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස,

එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ පළමුවෙනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමන්ගේ කයෙහි පහවූ ආශාව ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, මහණෙනි, යම් මේ භික්ෂුවක් තමන්ගේ කයෙහි පහවූ ආශාව ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නැමේද, මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ දෙවෙනිවූ විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ.

14. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම බාහිරවූ රූපයෙහි පහවූ ආශාව ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් බාහිරවූ රූපයෙහි පහවූ රාගය ඇත්තේ වේද, පහවූ කැමැත්ත ඇත්තේ වේද, පහවූ ප්‍රෙමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස

නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද, මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ තුන්වෙනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම බඩ පුරා අනුභවකොට සයන සැපයෙහිද, ඒ මේ අත පෙරළෙමින් නිදන සැපයෙහිද, නිදි සැපයෙහිද යෙදී වාසය නොකෙරේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් බඩ පුරා අනුභව කොට සයන සැපයෙහිද ඒ මේ අත පෙරළෙමින් නිදන සැපයෙහිද, නිදි සැපයෙහිද යෙදී සයනය නොකෙරේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස, එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස, වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් සිත පිළිබඳවූ මේ සතරවෙනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ.

15. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම මම මේ ශීලයෙන් හෝ මේ වතින් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්ම චරියාවෙන් හෝ මහෙශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි. අල්පෙශාක්‍ය දෙවියෙක් හෝ, වන්නෙමියි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්යාවෙහි නොහැසිරේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් මම මේ ශීලයෙන් හෝ මේ වතින් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්මචරියාවෙන් හෝ මහෙශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි. අල්පෙශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමියි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචරියාවෙහි නොහැසිරේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්යය කිරීම පිණිස එම වීර්යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්යය කිරීම පිණිස වීර්යය පිහිටුවීම පිණිස නැමේද මෙසේ ඔහු විසින් හිත පිළිබඳවූ මේ පස්වෙනිවූ විනිබන්ධය මනා කොට සිඳින ලද්දේ

වෙයි. ඔහු විසින් හිත පිළිබඳවූ මේ විනිබන්ධ පස මනාකොට සිඳින ලද්දාහු වෙත්.

**16.** "මහණෙනි, යම්කිසි භික්ෂුවක් විසින් මේ චෙතොඛිල ධර්ම පසද මේ විනිබන්ධ ධර්ම පසද සිඳින ලද්දාහුද ඒ භික්ෂු තෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියටද වැඩීමටද නැගීමටද මහත් බවටද පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඒ භික්ෂුතෙම ඡන්දය නිසා පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි. හිත නිසා පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි. වීර්යය නිසා පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි. විමංසාව නිසා පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඎද්ධිපාදය වඩයි. සෑමතන්හි කටයුතු වීර්යයම හෙවත් සියලු කටයුතු සිදුකරන වීර්යයම පස්වෙනිකොට ඇත්තේ වේද, මහණෙනි, මෙසේ සියලු අභිවෘද්ධිය සිදුකරන වීර්යය සහිත පසළොස් අඞ්ගයකින් සමන්විතවූ ඒ මේ භික්ෂු තෙම නුවණින් කෙලෙස් බිඳීමට සුදුසු වේ. සතරමාර්ගඥානය අවබොධ කරගැනීමට යොග්‍යවේ. උතුම්වූ අර්හත්ඵල අවබොධයට යොග්‍ය වේ. මහණෙනි, යම්සේ කිකිළියගේ බිජුවට අටක් හෝ දහයක් හෝ දොළසක් හෝ වෙද්ද ඒ බිජුවට කිකිළිය විසින් මනාකොට රකින ලද්දාහු උණුසුම් කරන ලද්දාහු මනාකොට වඩන ලද්දාහු වෙත්ද, ඒ කිකිළියට මාගේ කුකුල් පැටව් පයේ නියවලින් හෝ හොටෙන් හෝ සුවසේ බීජයන් බිඳගෙන නික්මෙන්නාහුනම් ඉතායෙහෙකැයි යන මෙබඳු ආශාවක් නූපදින්නීය. එහෙත් ඒ කුකුල් පැටව් පයේ නියවලින් හෝ හොටෙන් හෝ සුවසේ බිජු බිඳගෙන නික්මෙන්නට යොග්‍යවූවාහු වෙද්ද, මහණෙනි, එපරිද්දෙන්ම මෙසේ සියලු කටයුතු සිදුකරණ වීර්යය සහිත පසළොස් අඞ්ගයෙන් සමන්විතවූ මහණ තෙම නුවණින් කෙලෙස් බිඳීමට යොග්‍යවේ. සතර මාර්ගඥානය අවබොධයට යොග්‍යවේ. උතුම්වූ අර්හත් ඵලයාගේ අවබොධයට යොග්‍ය වේමය."

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළහ. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිත්තෝය.

(භය වැනිවූ චෙතොඛිල සූත්‍රය නිමි.) (2-6)

## 17. වනපත්ථ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු මහසිටුහු විසින් කරවන ලද ජෙතවන නම් ආරාමයෙහි වැඩවාසය කරති. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. 'ස්වාමීනි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, තොපට වනපත්ථ පර්යාය (අරණ්‍ය සේනාසන පිළිබඳ ක්‍රමය) දෙශනා කරන්නෙමි. එය අසව් මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි" ඒ භික්ෂූහු 'එසේය ස්වාමීනි,' කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

**2.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා වන සෙනසුනක් ඇසුරු කොට වාසය කරයිද, ඒ වන සෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොකළාවූ කෙලෙස් විනාශයට නොපැමිණේද, නොපැමිණියාවූ නිවණට නොපැමිණෙයිද, පැවිද්දන් විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිත පැවැත්මට අවශ්‍යවූ යම් දේ වෙත්ද, ඒ දේ ඔහුට දුකසේ ලැබෙත්ද මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහී මේ වන සෙනාසනය ඇසුරු කොට වාසය කරමි. මේ වන සෙනසුන ඇසුරු කොට වාසය

කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි එකඟනුවූ සිත එකඟ නොවෙයි. පහ නුවූ කෙලෙස් පහවීමට නොපැමිණෙයි පෙර නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයටද නොපැමිණෙයි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන යමක් ඇද්ද එය දුකසේ ලැබේය'යි සිතිය යුතුය. මහණෙනි, ඒ මහණ විසින් රාත්‍රි කාලයෙහි හෝ දහවල් කාලයෙහි හෝ ඒ වන සෙනසුන අත්හැර යායුතුයි. එහි නොසිටිය යුතුයි.

3. "මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම එක්තරා වනසෙනසුනක් ඇසුරුකොට වාසයකරයිද, ඒ වනසේනාසනය ඇසුරු කොට වාසයකරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොකළාවූ කෙලෙස් විනාශයට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයට නොපැමිණෙයිද, එහෙත් පැවිද්දන් විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද එය ඔහුට පහසුවෙන් ලැබෙයි. මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ වන සේනාසනය ඇසුරුකොට වාසය කරමි. මේ වන සෙනසුන ඇසුරුකොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි, එකඟනුවූ සිත එකඟ නොවෙයි. පහ නොකළාවූ කෙලෙස් නැතිවීමට නොපැමිණෙයි, පෙර නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයටද නොපැමිණෙයි. එහෙත් පැවිද්දහු විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද, එය මට පහසුවෙන් ලැබේ. එතකුදු වුවත් මේ වන සෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ මට එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි. එකඟ නොවූ සිත එකඟ නොවෙයි. පහ නොවූ කෙලෙස් පහ නොවෙයි. නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙමි. මහණෙනි, 'මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවූයෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවීමි. සෙනසුන් උදෙසා ගිහිගෙන්

නික්ම සස්නෙහි පැවිදි නොවූයෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවීමි'යි සිතා, මහණෙනි, ඒ භික්ෂුව විසිනුදු ඒ වන සෙනසුන හැර යා යුතුයි. එහි නොවිසිය යුතුයි.

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා වන සෙනසුනක් ඇසුරුකොට වාසය කරයිද, ඒ වන සෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් පහ වෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, (එහෙත්) පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද, මෙය ඔහුට දුකසේ ලැබේද, මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සිහිකටයුතුයි. 'මම වනාහි මේ වන සෙනාසනය ඇසුරු කොට වාසය කරමි. මේ වන සෙනාසනය ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියි එකඟ නොවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින් පැමිණෙමි. (එහෙත්) පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, ගිලන්පස, බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද, එය මාහට දුකසේ ලැබේ. මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ නොවෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස, බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි එතකුදු වුවත් මේ වන සෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියි, එකඟ නොවූ සිතද එකඟ වෙයි පහ නොවූ කෙලෙස්ද පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙමි'යි සිතා, මහණෙනි, ඒ භික්ෂුව විසින් එම සෙනාසනයෙහි විසිය යුතුයි. බැහැර නොයා යුතුයි.

**5.** "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම එක්තරා වන සෙනසුනක් ඇසුරුකොට වාසයකරයිද, ඒ වනසෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහනොවූ කෙලෙස් පහවී යයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, පැවිද්දහු විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යමක් වෙයිද, එය ඔහුට සුවසේ ලැබේද මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සිහිකටයුතුයි 'මම වනාහි මේ වන සෙනසුන ඇසුරු කොට වාසය කරමි මේ වන සෙනසුන ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහියද එළඹ සිටියි. එකඟ නොවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස්ද පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයට අවශ්‍ය යමක් වෙයිද, ඒවා සුවසේ ලැබෙත්ය'යි සිතිය යුතුයි. ඒ භික්ෂුව විසින් දිවි ඇතිතාක් ඒ වන සෙනසුනෙහි විසිය යුතුයි. බැහැර නොයා යුතුයි.

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා ගමක් ඇසුරුකොට වාසය කරයිද, ඒ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහනොකළාවූ කෙලෙස් නැතිවීමට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට දුකසේ ලැබෙයිද, මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සිහි කටයුතුයි. 'මම වනාහි මේ ගම ඇසුරුකොට වාසය කරමි මේ ගම ඇසුරුකොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියි. එකඟ නොවූ සිත එකඟ නොවෙයි. පහ නොකළාවූ කෙලෙස් පහවීමට නොපැමිණෙයි. නොපැමිණියාවූ උතුම්වූ නිවණට නොපැමිණෙයි පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය,

සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද, එය දුකසේ ලැබේය'යි සැලකිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසින් රාත්‍රි භාගයෙහි හෝ දවල් කාලයෙහි හෝ ඒ ගම අත්හැර යායුත්තේය. එහි නොවිසිය යුතුය.

7. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා ගමක් ඇසුරුකොට වාසය කරයිද, ඒ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොවූ කෙලෙස් විනාශයට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පසය, බෙහෙත් පිරිකර යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද, එය ඔහුට සුවසේ ලැබෙයිද, මහණෙනි ඒ භික්ෂුව විසින් මෙසේ සිහි කටයුතුයි. 'මම වනාහි මේ ගම ඇසුරු කොට වාසය කරමි. මේ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි. එකඟ නොවූ සිත එකඟ නොවෙයි. පහ නොවූ කෙලෙස් පහ නොවෙයි. නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද එය සුවසේ ලැබෙයි. 'මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූයෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ ගම ඇසුරුකොට වාසයකරන්නාවූ මට පෙර නූපන් සිහිය නූපදියි, එකඟ නොවූ සිත එකඟ නොවෙයි, පහ නොවූ කෙලෙස් පහ නොවෙයි, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙමි'යි සිතා මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ ගම අත්හැර යා යුත්තේය. එහි නොවිසිය යුත්තේය.

8. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා ගමක් ඇසුරුකොට වාසය කෙරේද, ඒ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට නූපන්නාවූ සිහිය උපදියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් පහ වෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට දුකසේ ලැබෙයිද, මහණෙනි. ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ ගම ඇසුරු කොට වාසය කරමි. මේ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර නූපන් සිහිය උපදියි. එකඟ නොවූ සිතද එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් පහවෙයි. නොපැමිණියා වූද උතුම් නිවණට පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යම් දෙයක් වෙයිද, මොව්හු මට දුකසේ ලැබෙත්. මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ නොවෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ ගම ඇසුරුකොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි. එකඟ නොවූ සිතද එකඟ වෙයි පහ නොවූ කෙලෙස්ද පහවීයයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින් පැමිණෙමියි' සිතා, මහණෙනි, ඒ භික්ෂුව විසින් එම ගම විසිය යුතුය. බැහැර නොයා යුතුය.

9. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා ගමක් ඇසුරු කොට වාසය කරයිද, ඒ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට, පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් පහවී යයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යමක් වෙයිද

එය ඔහුට සුවසේ ලැබේද, මහණෙනි ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ ගම ඇසුරු කොට වාසය කරමි. මේ ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි. එකඟ නොවූ සිතද එකඟවෙයි. පහ නොවූ කෙලෙස්ද පහවීයයි. නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයට අවශ්‍ය යමක් වෙයිද ඒවා සුවසේ ලැබෙත්ය'යි සැලකිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසින් දිවි ඇතිතෙක් ඒ ගම වාසය කළ යුත්තේය බැහැර නොයා යුතුයි.

**10.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා නියම්ගමක් ඇසුරුකොට වාසය කරයිද, ඒ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොකළාවූ කෙලෙස් පහ වීමට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යමක් වෙයිද, එය ඔහුට දුකසේ ලැබෙයිද, මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සිහිකටයුතුයි. 'මම වනාහි මේ නියම්ගම ඇසුරු කොට වාසය කරමි. මේ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියි. එකඟනොවූ සිත එකඟ නොවෙයි. පහ නොකළාවූ කෙලෙස්ද විනාශයට නොපැමිණෙයි. නොපැමිණියාවූ උතුම්වූ නිවණටද නොපැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය දුකසේ ලැබේය'යි සැලකිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසින් රාත්‍රි භාගයෙහි හෝ දවල් කාලයෙහි හෝ ඒ නියම්ගම අත්හැර යා යුත්තේය. එහි නොසිටිය යුතුය.

**11.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා නියම්ගමක් ඇසුරු කොට වාසය කරයිද ඒ නියම්ගම ඇසුරු

කොට වාසයකරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද පහ නොවූ කෙලෙස් විනාශයට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද, එය ඔහුට සුවසේ ලැබෙයිද, මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සිහිකටයුතුයි. 'මම වනාහි මේ නියම්ගම ඇසුරු කොට වාසය කරමි. මේ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහියද එළඹ නොසිටියි. එකඟ නොවූ සිතද එකඟ නොවෙයි. පහ නොකළාවූ කෙලෙස්ද විනාශයට නොපැමිණෙයි. නොපැමිණියාවූ උතුම් නිවණටද නොපැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය සුවසේ ලැබෙයි. එහෙත් මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූයෙමි ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ නියම්ගම් ඇසුරුකොට වාසය කරන්නාවූ මට පෙර නූපන් සිහියද නූපදියි. එකඟ නොවූ සිතද එකඟ නොවෙයි. පහනොවූ කෙලෙස්ද විනාශයට නොයයි. නොපැමිණියාවූ උතුම් නිවණටද නොපැමිණෙමි'යි සිතිය යුතුය. මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ නියම්ගම අත්හැර යායුත්තේය. නොවිසිය යුත්තේය.

12. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා නියම්ගමක් ඇසුරුකොට වාසය කෙරේද, ඒ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට නූපන්නාවූ සිහිය උපදීද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් විනාශයට යයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය

යමක් වෙයිද, එය ඔහුට දුකසේ ලැබෙයිද මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ නියම්ගම ඇසුරු කොට වාසය කරමි. මේ නියම් ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර නූපන් සිහිය උපදියි, එකඟ නොවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් පහවීමට යයි, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙමි, පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයට අවශ්‍ය යමක් වෙයිද එය මට දුකසේ ලැබෙයි. එහෙත් මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි, එකඟ නොවූ සිත එකඟ වෙයි, පහ නොවූ කෙලෙස් පහවීමට යයි, නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින් පැමිණෙන්නෙමි'යි සිතා මහණෙනි, ඒ භික්ෂුව විසින් දිවි ඇතිතෙක් ඒ නියම්ගම විසිය යුතුය. බැහැර නොයා යුතුයි.

13. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා නියම්ගමක් ඇසුරු කොට වාසය කරයිද, ඒ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට, පෙර එළඹනොසිටි සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් නැතිවීමට යයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, පැවිද්දා විසින් ලැබියයුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට සුවසේ ලැබේද, මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ නියම්ගම ඇසුරු කොට වාසය කරමි. මේ නියම්ගම ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි. එකඟ නොවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් විනාශයට යයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින්

පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන මෙය මට සුවසේ ලැබේය'යි සිතිය යුතුය. මහණෙනි, ඒ භික්ෂුව විසින් දිවි ඇති තෙක් ඒ නියම්ගම වාසය කළ යුත්තේය. බැහැර නොයා යුතුයි.

14. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා නගරයක් ඇසුරු කොට වාසය කරයිද, එම නගරය ඇසුරු කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොකළාවූ කෙලෙස් පහවීමට නොපැමිණෙයිද, නොපැමිණියාවූ නිවණට නොපැමිණෙයිද, පැවිද්දන් විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය වූ යම් දේ වේද්ද, ඒ දේ ඔහුට දුකසේ ලැබෙත්ද, මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සැලකිය යුතුයි. මම වනාහි මේ නගරය ඇසුරු කොට වාසය කරමි. මේ නගරය ඇසුරුකොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි. එකඟ නුවූ සිත එකඟ නොවෙයි. පහනුවූ කෙලෙස් පහවීමට නොපැමිණෙයි. පෙර නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයටද නොපැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන යමක් ඇද්ද එය දුකසේ ලැබේය'යි සිතිය යුතුය. මහණෙනි, ඒ මහණ විසින් රාත්‍රි කාලයෙහි හෝ දහවල් කාලයෙහි හෝ ඒ නගරය අත්හැර යායුතුයි. එහි නොවිසිය යුතුයි.

15. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා නගරයක් ඇසුරු කොට වාසය කරයිද, ඒ නගරය ඇසුරු කොට වාසයකරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොකළාවූ කෙලෙස් විනාශයට නොපැමිණෙත්ද, නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයට නොපැමිණෙයිද, එහෙත් පැවිද්දන් විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය. ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක්

පටුන



වෙයිද, එය ඔහුට පහසුවෙන් ලැබෙයිද, මහණෙනි ඒ මහණ විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ නගරය ඇසුරු කොට වාසය කරමි. මේ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි. එකඟ නුවූ සිත එකඟ නොවෙයි. පහ නොකළාවූ කෙලෙස් නැතිවීමට නොපැමිණෙයි, නොපැමිණියාවූ උතුම්වූ නිර්වාණයටද නොපැමිණෙමි. එහෙත් පැවිද්දාහු විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යම් දෙයක් වෙයිද, එය මට පහසුවෙන් ලැබේ. එතකුදු වුවත් මේ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ මට එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියි එකඟ නොවූ සිත එකඟ නොවෙයි, පහ නොවූ කෙලෙස් පහ නොවෙයි. නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙමි. මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවූයෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවීමි. සෙනසුන් උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවූයෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවීමි'යි සිතිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසිනුදු ඒ නගරය හැර යා යුතුයි. එහි නොවිසිය යුතුයි.

**16.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමෙ එක්තරා නගරයක් ඇසුරුකොට වාසය කරයිද ඒ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහ නොවූ කෙලෙස් පහවෙයිද නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, (එහෙත්) පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට දුකසේ ලැබේද, මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සිහි කටයුතුයි. "මම වනාහි මේ නගරය ඇසුරු කොට වාසය කරමි. මේ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියි. එකඟ නුවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැමිණෙමි. (එහෙත්) පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය මාහට දුකසේ ලැබේ. මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසන උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ සිටියි. එකඟනොවූ සිතද එකඟ වෙයි. පහනොවූ කෙලෙස්ද පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින් පැමිණෙමි'යි සිතිය යුතුය. මහණෙනි, ඒ භික්ෂුව විසින් එම නගරයෙහි විසිය යුතුයි. බැහැර නොයා යුතුයි.

17. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම එක්තරා නගරයක් ඇසුරු කොට වාසය කරයිද, ඒ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහනොවූ කෙලෙස් පහවීයයිද, නොපැමිණියාවූ උතුම් නිවණට පිළිවෙළින් පැමිණෙයිද, පැවිද්දහු විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවත්වීමට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට සුවසේ ලැබේද මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සිහිකටයුතුයි. මම වනාහි මේ නගරය ඇසුරු කොට වාසය කරමි. මේ නගරය ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහියද එළඹ සිටියි. එකඟ නොවූ සිතද එකඟ වෙයි. පහ නොවූ කෙලෙස්ද පහවී යයි. නොපැමිණියාවූ උතුම් නිවණටද පිළිවෙළින් පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයට අවශ්‍ය යමක් වෙයිද ඒවා සුවසේ ලැබෙත්ය'යි සිතිය යුතුයි. ඒ භික්ෂුව විසින් දිවි ඇතිතාක් ඒ නගරයෙහි විසිය යුතුයි. බැහැර නොයා යුතුයි.

18. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම එක්තරා පුද්ගලයෙකු ඇසුරු කොට වාසය කරයිද, ඒ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොවූ කෙලෙස් පහවීමට නොපැමිණෙයිද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනසුන්ය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය ඔහුට දුකසේ ලැබෙයිද, මහණෙනි, ඒ මහණ විසින් මෙසේ සිහි කටයුතුයි. මම වනාහි මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරමි. මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටියාවූ සිහිය එළඹ නොසිටියි. එකඟනොවූ සිත එකඟ නොවෙයි. පහ නොවූ කෙලෙස්ද විනාශයට නොපැමිණෙත්. නොපැමිණියාවූ උතුම්වූ නිවණටද නොපැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද, එය දුකසේ ලැබේ. මහණෙනි, ඒ භික්ෂුව විසින් රාත්‍රි කාලයෙහි හෝ දවල් කාලයෙහි හෝ ඒ පුද්ගලයාට නොකියාම බැහැර යායුත්තේය, ඔහුට බැඳී නොවිසිය යුතුය.

19. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා පුද්ගලයෙකු ඇසුරුකොට වාසය කරයිද, ඒ පුද්ගලයා ඇසුරු කොටවාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ නොසිටියිද, එකඟ නොවූ සිත එකඟ නොවෙයිද, පහ නොවූ කෙලෙස් විනාශයට නොපැමිණෙත් ද, නොපැමිණියාවූ උතුම් නිවණට නොපැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද, එය ඔහුට සුවසේ ලැබෙයිද, මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සිහි කටයුතුයි. 'මම වනාහි මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරමි. මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහියද එළඹ නොසිටියි. එකඟ නොවූ සිතද එකඟ නොවෙයි. පහ නොවූ කෙලෙස්ද විනාශයට නොපැමිණෙත්.

නොපැමිණියාවූ උතුම් නිවණටද නොපැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් වෙයිද එය සුවසේ ලැබෙයි. මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූයෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. සෙනාසනය නිසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර නිසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ නොවෙමි. එතකුදුවුවත් මේ පුද්ගලයා ඇසුරුකොට වාසය කරන්නාවූ මට පෙර නූපන් සිහියද නූපදියි. එකඟ නොවූ සිතද එකඟ නොවෙයි. පහ නොවූ කෙලෙස්ද විනාශයට නොයෙත්. නොපැමිණියාවූ උතුම් නිවණටද නොපැමිණෙමි'යි සිතිය යුතුය. මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ පුද්ගලයාට නොකියාම බැහැර යායුත්තේය. ඔහුට බැඳී නොවිසිය යුත්තේය.

**20.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා පුද්ගලයෙකු ඇසුරුකොට වාසය කෙරේද, ඒ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට නූපන්නාවූ සිහිය උපදියිද, එකඟ නොවූ සිත එකඟවෙයිද, පහ නොවූ කෙලෙස් විනාශයට යත්ද, නොපැමිණියාවූ උතුම් නිවණට පැමිණෙයිද, පැවිද්දා විසින් ලැබියයුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් ඇත්තේද, එය ඔහුට දුකසේ ලැබෙයිද, 'මහණෙනි, ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරමි. මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර නූපන් සිහියද උපදියි. එකඟ නොවූ සිතද එකඟ වෙයි. පහ නොවූ කෙලෙස්ද විනාශයට යෙත්. නොපැමිණියාවූ උතුම් නිවණටද පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතුවූ සිවුරුය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් ඇත්තේද, එය මට දුකසේ ලැබෙයි. එහෙත් මම වනාහි සිවුරු උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ආහාරය උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි සෙනාසන උදෙසා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. ගිලන්පස බෙහෙත් පිරිකර උදෙසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ නොවෙමි. එතකුදු වුවත් මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි. එකඟ නොවූ සිත එකඟ වෙයි. පහනොවූ කෙලෙස් විනාශයට යෙත්. නොපැමිණියාවූ උතුම් නිවණටද පැමිණෙමි'යි සිතිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ පුද්ගලයා වෙත විසිය යුතුය. බැහැර නොයා යුතුය.

**21.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා පුද්ගලයෙකු ඇසුරු කොට වාසය කරයිද, ඒ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඔහුට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියිද, එකඟ නොවූ සිත එකඟ වෙයිද, පහනොවූ කෙලෙස් විනාශයට යෙත්ද, නොපැමිණියාවූ උතුම් නිවණට පැමිණෙයිද, පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පසය බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් ඇත්තේද එය ඔහුට සුවසේ ලැබෙයිද, මහණෙනි ඒ භික්ෂුව විසින් මෙසේ සැලකිය යුතුයි. 'මම වනාහි මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරමි. මේ පුද්ගලයා ඇසුරු කොට වාසය කරන්නාවූ ඒ මට පෙර එළඹ නොසිටි සිහිය එළඹ සිටියි. එකඟ නොවූ සිත එකඟ වෙයි. පහ නොවූ කෙලෙස් විනාශයට යෙත්. නොපැමිණියාවූ උතුම් නිවණට පැමිණෙමි. පැවිද්දා විසින් ලැබිය යුතු සිවුරුය, ආහාරය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය යන ජීවිතයේ පැවැත්මට අවශ්‍ය යමක් ඇත්තේද, එය මට සුවසේ ලැබෙත්ය'යි සිතිය යුතුයි. මහණෙනි, ඒ භික්ෂුව විසින් දිවි ඇති තෙක් ඒ පුද්ගලයා හා එක්ව වාසය කළ යුත්තේය. බැහැර කරනු ලබන්නේද බැහැර නොයා යුතුයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

(හත්වෙනිවූ වනපත්ථ සූත්‍රය නිමි.) (2-7)

---

# 18. මධු පිණ්ඩික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි සර්වඥයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරවා පාත්‍රය හා සිවුරගෙන කිඹුල්වත්පුරයට පිඬු පිණිස පිවිසියහ. කිඹුල්වත්පුරයෙහි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ මහා වනය යම් තැනෙක්හිද එතැනට දහවල් වාසය පිණිස එළඹියහ. මහා වනයට වැද තරුණ බෙලි ගසක් මුල දිවාවිහරණය පිණිස වැඩහුන්හ.

දණ්ඩපාණී නම් ශාක්‍ය තෙමේද පා රුජා දුරු කර ගැනීම සඳහා සක්මන්කිරීම වශයෙන් ඇවිදින්නේ මහාවනය යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. මහා වනයට වැද තරුණ බෙලි රුක යම්තැනෙක්හිද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ සර්වඥයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූද සිහි කටයුතු වූද කථාව කොට නිමවා සැරයටියෙහි එල්බගෙන (ඉදිරියෙහි තැබූ සැරයටි මුදුනෙහිවූ දෙ අත් පිට නිකට තබා) සිටියේය. එකත්පස්ව සිටියාවූ දණ්ඩපාණී ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ශ්‍රමණ තෙමේ කිනම් වාද ඇත්තෙක්ද? කිනම් වාදයක් ප්‍රකාශ කරන්නෙක්ද?"

2. "ඇවැත්නි, යම් බඳුවූ වාද ඇත්තෙක් දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ ප්‍රජා සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සියලු ලොකයෙහි කිසිවෙකු හා වාද විවාද කරමින් නොසිටීද, කාමයන්ගෙන් වෙන්ව වාසය කරන්නාවූ සැක නැත්තාවූ, කුකුස් නැති කළාවූ, කුඩා මහත් භවයන් කෙරෙහි ආශා නැත්තාවූ කෙලෙස් රහිතවූ යම් ඒ බ්‍රාහ්මණයෙකු තුළ කෙලෙස් හැඟීම නොපවත්නාහුවෙත්ද, ඇවැත්නි, මම මෙබඳු වාද ඇත්තෙක් වෙමි. මෙසේ කියන්නෙක් වෙමි"යි (ප්‍රකාශ කළහ) මෙසේ කී

කල්හි දණ්ඩපාණී ශාක්‍යතෙම හිස වනා දිව පිටට දමා ලෙලවා රැළි තුනක් ඇති නළල් රැළිය නළලෙහි නංවා සැරයටිහි එල්බගෙන ගියේය.

3. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි උතුම් පල සමවතින් නැගිටියේ නිග්‍රොධාරාම විහාරය යම් තැනෙක්හිද එතැනට වැඩියහ. වැඩමවා පණවනලද ආසනයෙහි වැඩහුන්හ. වැඩහිඳ භික්ෂූන්ට මෙසේ කීහ.

"මහණෙනි, මම පෙරවරුවෙහි හැඳ පාසිවුරු ගෙන කිඹුල්වත් නුවරට පිඬු පිණිස පිවිසියෙමි. කිඹුල්වත් නුවර පිඬු පිණිස හැසිර සවස්වරුවෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ මහා වනය යම් තැනෙක්හිද එතැනට දවල් කාලය ගතකරනු පිණිස ගියෙමි. මහවනයට වැද තරුණ බෙලිගස මුල දිවා විහරණය වශයෙන් (දහවල් හැසිරීම් වශයෙන්) හුන්නෙමි. දණ්ඩපාණී ශාක්‍ය තෙමේද පා රුජා දුරුකර ගැනීම වශයෙන් ඇවිදින්නේ, මහාවනය යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. මහාවනයට පැමිණ තරුණ බෙලිගස යම් තැනෙක්හිද, මා යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, මා සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා දණ්ඩෙහි එල්බගෙන එකත්පසක සිටියේය. මහණෙනි, එකත්පසක සිටියාවූ දණ්ඩපාණී ශාක්‍යතෙම 'ශ්‍රමණතෙම කුමන වාද ඇත්තෙක්ද? කුමක් ප්‍රකාශ කරන්නෙක්දැ'යි මාගෙන් ඇසීය.

"ඇවැත්නි, යම්බඳු වාද ඇත්තෙක් දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ සත්ත්වයන් සහිතවූ ලොකයෙහි කිසිවෙකු හා වාද විවාද කරමින් නොසිටීද, කාමයන්ගෙන් වෙන්ව වාසය කරන්නාවූ සැක නැත්තාවූ කුකුස් සින්දාවූ කුඩා මහත් භවයන් කෙරෙහි පහවූ තණ්හා ඇති යම් ඒ බ්‍රාහ්මණයකු තුළ කෙලෙස් හැඟීම් නොපවතිද්ද, ඇවැත්නි, මම එබඳු වාද ඇත්තෙක් වෙමියි කීවෙමි. මෙසේ කී කල්හි දණ්ඩපාණී ශාක්‍යතෙම හිස වනා දිව පිටට ගෙන ලෙලවා රැළි තුනක් ඇති නළල් රැළිය නළලෙහි නංවා සැරයටිය ගෙන ගියේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කිනම් වාදයක් ඇත්තාවූ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ සත්ත්වයන් සහිත ලොකයෙහි කිසිවෙකු හා වාද විවාද කරමින් නොසිටින්නහුද?

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කෙසේ නම් කෙලෙසුන්ගෙන් වෙන්ව වාසය කරන්නාවූ, සැක නැත්තාවූ කුකුස් සින්දාවූ කුඩා මහත් භවයන් කෙරෙහි පහවූ තණ්හා ඇති ඒ බ්‍රාහ්මණයා තුළ කෙලෙස් හැඟීම් අනුශය වශයෙන් නොපවත්නාහුද?"

"මහණ, යමක් හෙතුකොටගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හේතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු වියයුත්තක් නැත්තේද, මමය මාගේයයි කිවයුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය, දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධව කථා කිරීමය, තා තෝ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුසලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුසල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්" භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ මෙසේ වදාරා සුගතයන් වහන්සේ උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් ඒ භික්ෂූන්ට මේ අදහස පහළ විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව අපට කොටින් දෙශනා කොට විස්තර වශයෙන් අර්ථය ප්‍රකාශ නොකොට උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

"මහණෙ, යමක් හෙතුකොටගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හෙතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු වියයුත්තක් නැත්තේද, මමය මාගේයයි කිවයුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය. දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධව කථාකිරීමය, තා තෝ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුසලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුසල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්" යයි භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කළාවූ විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ මේ දේශනාවේ අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදා දක්වන්නේද? (කියායි)

**6.** ඉන්පසු ඒ භික්ෂූන්ට මේ අදහස ඇති විය 'මේ ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ශාස්තෲන් වහන්සේ විසින් වර්ණනා කරන ලද්දේමය. නුවණ ඇත්තාවූ සමාන බ්‍රහ්මචර්යා ඇත්තවුන් විසින් ගරු කරන ලද්දේය. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ කොටින් දෙශනාකළාවූ විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ දෙශනාවේ අර්ථය බෙදා ප්‍රකාශ කරන්ට සමර්ථ වෙත්. අපි ආයුෂ්මත් මහා කෘත්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට යන්නෙමු නම් ඉතා යෙහෙක. එසේ පැමිණ, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය අසන්නෙමු" (කියායි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඉන්පසු ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූහ, සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක පැත්තක උන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීවාහුය. "ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්ස මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ අපට කොටින් දෙශනාකොට විස්තර වශයෙන් අර්ථය නොබෙදා උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

"මහණ, යමක් හෙතුකොට ගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියනලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හෙතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු වියයුත්තක් නැත්තේද, මෙය මාගේයයි කිවයුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය. විරුද්ධව කථා කිරීමය, තා තෝ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුසලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුසල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්ය'යි (වදාළේය.)

"ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩිය ටික වේලාවකින් ඒ අපට මේ අදහස විය.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව කොටින් දෙශනා කොට විස්තර වශයෙන් අර්ථය ප්‍රකාශ නොකොට උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'මහණෙ, යමක් හෙතුකොට ගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හෙතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටුවිය යුත්තක් නැත්තේද, මෙය මාගේයයි කිවයුත්ක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය. දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධව කථා කිරීමය, තා තෝ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුසලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුසල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්ය'යි (වදාළේය.)

"ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩිය ටික වේලාවකින් ඒ අපට මේ අදහස විය.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කළාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ මේ දෙශනාවේ අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදා දක්වන්නේද (කියායි) එසේ සිතූ පසු ඒ අපට මේ අදහස ඇතිවිය. මේ ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ශාස්තෲන් වහන්සේ විසින් වර්ණනා කරන ලද්දේමය. නුවණ ඇත්තාවූ, සමාන බ්‍රහ්මචරියා ඇත්තවුන් විසින් ගරුකරන ලද්දේය. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ කොටින් දෙශනාකළාවූ විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ මේ දෙශනාවේ අර්ථය බෙදා ප්‍රකාශ කරන්ට සමර්ථ වෙයි. අපි යම් හේතුවකින් ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට යන්නෙමු නම් ඉතා යෙහෙක. එසේ පැමිණ, ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය අසන්නෙමු"යි (කියායි)

"ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, මෙය විස්තර කරනු මැනවි."

7. "ඇවැත්නි, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් පවත්නාවූ අරටුව ඇති මහ ගසක මුල ඉක්මවා කඳ ඉක්මවා කොල අතුවල අරටුව සෙවිය යුතුයයි සිතන්නේද, එසේ මේ උපමාව ආයුෂ්මතුන්ට සුදුසුය.

"ශාස්තෘන් වහන්සේ ඉදිරිපිට සිට ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අපගෙන් ඇසිය යුතුයයි සිතව්ද?

"ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නාහ. දැක්කයුත්ත දකින්නාහ. ඇස් ඇති බවට පැමිණියෝය. ධර්මය බවට පැමිණියෝය. බ්‍රහ්ම (උසස්) බවට පැමිණියෝය. ධර්මය කියන්නෝය. ධර්මය පවත්වන්නෝය. අර්ථය පිටතට ගෙන දක්වන්නෝය. අමෘතය (නිවණ) දෙන්නෝය. තථාගතයන් වහන්සේ ධර්ම ස්වාමිය, (එහෙයින්) මේ ප්‍රශ්නය ඇසීමට සුදුසු කාලයම විය. යම් හේතුවකින් භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කාරණය ඇසුවාහු නම් යම්සේ තොපට භාග්‍යවතුන් වහන්සේ විස්තර කරන්නාහුද එසේ එය දරාගනිව්"යි (කීය.)

"ආයුෂ්මත් කාත්‍යායන ස්ථවිරයෙනි, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නාහ, දැක්කයුත්ත දකින්නාහ, ඇස් ඇති බවට පැමිණියහ, ඥාණය බවට පැමිණියහ, ධර්මය බවට පැමිණියහ, බ්‍රහ්ම බවට පැමිණියහ, ධර්මය කියන්නෝය, ධර්මය පවත්වන්නෝය, අමෘතය (නිවණ) දෙන්නෝය. තථාගත තෙම ධර්මස්වාමිය (එහෙයින්) මේ ප්‍රශ්නය ඇසීමට සුදුසු කාලය වේ. යම් හේතුවකින් භාග්‍යවතුන් වහන්සේගෙන් මේ කාරණය ඇසුවෙමු නම් යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ විස්තර කරන සේක්ද එසේ එය දරාගනිමු.

"ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයෙනි, එසේද වුවත් ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින්ද වර්ණනා කරන ලද්දේය. නුවණ ඇත්තාවූ සමාන බ්‍රහ්මචාරීන් විසින් ගරු කරන ලද්දේය. එබැවින්

භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කරන ලද අර්ථය විස්තර නොකරන ලද දෙශනාවෙහි අර්ථය විස්තර කිරීමට ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ සමර්ථ වන්නේය, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, බැරෑරුම්කොට නොසලකා විස්තර කරනු මැනවි."

8. "ඇවැත්නි, එසේනම් කියන්නෙමි. අසව්, හොඳින් සිහි කරව්"යි කීහ. "එසේය. ආයුෂ්මතුනි"යි, ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළහ.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ යමක් කොටින් දෙශනා කොට අර්ථය විස්තර නොකොට උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියාහුද,

"මහණ, යමක් හේතු කොටගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියනලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හේතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු විය යුත්තක් නැත්තේද, මමය මාගේ යයි කිව යුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය. එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය. දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධව කථා කිරීමය, තා, තෝ, කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුශලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුසල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්."

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කරනලද, අර්ථය විස්තර නොකරන ලද ඒ දෙශනාවෙහි අර්ථ විස්තරය මෙසේ දනිමි.

**9.** "ඇවැත්නි, ඇසනිසාද, රූපය නිසාද, චක්ඛුවිඤ්ඤාණය (රූපය දැනගන්නා සිත) උපදී. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොට ගෙන වේදනාව (විඳීම) වෙයි. යම් අරමුණක් වේදනාවෙන් විඳී ද එම අරමුණම සංඥාවෙන් අඳුනයි. යම් අරමුණක් අඳුනාද එම අරමුණම විතර්කයෙන් කල්පනා කරයි. යම් අරමුණක් විතර්කයෙන් කල්පනා කරයිද එම අරමුණම තණ්හා දිට්ඨි වශයෙන් සත්ත්වයා ප්‍රමාදකරයි. ඒ චක්ඛුරූපාදිය මුල්කාරණය කොට තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයෝ අතීත අනාගත වර්තමානවූ ඇසින් බලා දතයුතුවූ රූපයන් කෙරෙහි පුරුෂයා යටත් කරත්.

"ඇවැත්නි, කණ නිසාද, ශබ්දය නිසාද, සොතවිඤ්ඤාණය (ශබ්දය දැනගන්නා සිත) උපදී, ඒ තුන එක්වීමෙන් ස්පර්ශය ඇතිවෙයි ස්පර්ශය හේතුකොටගෙන වේදනාව (විඳීම) වෙයි. යම් අරමුණක් විඳීද එම අරමුණ අඳුනයි යම් අරමුණක් අඳුනයිද එම අරමුණ විතර්කයෙන් කල්පනා කරයි. යම් අරමුණක් කල්පනා කරයිද එය තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සත්ත්වයා ප්‍රමාද කරයි. ඒ කණ ශබ්ද ආදිය මුල්කාරණය කොට ඇති තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්චධර්මයෝ අතීත අනාගත වර්තමානවූ කණින් අසා දතයුතුවූ ශබ්දයන් නිසා පුරුෂයා යටත් කරත්.

"ඇවැත්නි, නාසය නිසාද, ගන්ධය (ගඳ සුවඳ) නිසාද ඝාණ විඤ්ඤාණය (ගඳ සුවඳ දැනගන්නා සිත) උපදියි. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොටගෙන වේදනාව වෙයි, යම් අරමුණක් විඳීද එය අඳුනයි. යම් අරමුණක් අඳුනයිද එය කල්පනා කරයි. යම් අරමුණක් කල්පනා කරයිද එය තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සත්ත්වයා ප්‍රමාද කරයි. ඒ නාසය ගන්ධය ආදිය මුල්කාරණය කොට ඇති තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයෝ අතීත අනාගත වර්තමානවූ නාසයෙන් විඳ දත යුතුවූ ගන්ධයන් නිසාද පුරුෂයා යටත් කරත්.

"ඇවැත්නි, දිව නිසාද, රසය නිසාද, ජිව්හාවිඤ්ඤාණය (රස දැන ගන්නා සිත) උපදියි. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොටගෙන වේදනාව වෙයි. යම් අරමුණක් විඳීද

එය අඳුනයි යම් අරමුණක් අඳුනයිද එය කල්පනා කරයි, යම් අරමුණක් කල්පනා කරයිද එය තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සත්ත්වයා ප්‍රමාද කරයි. ඒ දිව රසය ආදිය මුල් කාරණය කොට ඇති තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්චධර්මයෝ අතීත අනාගත වර්තමානවූ දිවෙන් විඳ තදයුතුවූ රසයන් නිසා පුරුෂයා යටත් කරත්.

"ඇවැත්නි, ශරීරය නිසාද, ස්පර්ශය නිසාද, කායවිඤ්ඤාණය (ස්පර්ශය දැනගන්නා සිත) උපදී. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොටගෙන විඳීම වෙයි යම් අරමුණක් විඳීද එය අඳුනයි. යම් අරමුණක් අඳුනයිද එය කල්පනා කරයි. යම් අරමුණක් කල්පනා කරයිද එය තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සත්ත්වයා ප්‍රමාද කරයි. ඒ ශරීරය ස්පර්ශය ආදිය මුල් කාරණය කොට ඇති තණ්හා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයෝ අතීත අනාගත වර්තමානවූ ශරීරයෙන් විඳ දතයුතුවූ ස්පර්ශයන් නිසා පුරුෂයා යටත් කරත්.

"ඇවැත්නි, සිත නිසාද, ධර්ම අරමුණු නිසාද, මනො විඤ්ඤාණය (ධර්ම අරමුණු දැනගන්නා සිත) උපදියි. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොටගෙන විඳීම වෙයි. යම් අරමුණක් විඳීද එය අඳුනයි, යම් අරමුණක් අඳුනයිද, එය කල්පනාකරයි. යම් අරමුණක් කල්පනා කරයිද, එය තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් සත්ත්වයා ප්‍රමාදකරයි. ඒ සිත ධර්ම අරමුණු ආදිය මුල්කාරණය කොට ඇති තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්චධර්මයෝ අතීත අනාගත වර්තමානවූ සිතින් සිතා දතයුතුවූ ධර්ම අරමුණු නිසා පුරුෂයා යටත් කරත්.

**10.** "ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම ඇස ඇති කල්හි රූපයන් ඇති කල්හි චක්ඛුවිඤ්ඤාණය (රූප දැනගන්නා සිත) ඇතිකල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය. යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) ස්පර්ශයයි පැනවීමක් ඇති කල්හි වේදනාව යයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) වේදනාවයයි පැනවීමක් ඇතිකල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය. යම මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි කල්පනා

කිරීමයයි පැනවීමක් පනවන්නේය. යන මේ කාරණය විද්‍යමාන වෙයි. කල්පනා කිරීමයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්චධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම කණ ඇති කල්හි ශබ්දය ඇති කල්හි සොතවිඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) ස්පර්ශයයයි පැනවීමක් ඇති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) වේදනාවයයි පැනවීමක් ඇති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි විතර්ක (කල්පනා කිරීම) යයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම නාසය, ඇති කල්හි ගන්ධය ඇති කල්හි ඝාණ විඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) ස්පර්ශයයයි පැනවීමක් ඇති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) වේදනාවයයි පැනවීමක් ඇති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම දිව ඇති කල්හි රසය ඇති කල්හි ජිව්හාවිඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි.

(සිදුවෙයි) ස්පර්ශයයයි පැනවීමක් ඇති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.) වේදනාවයයි පැනවීමක් ඇති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි (සිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම කය ඇති කල්හි ස්පර්ශය ඇති කල්හි කාය විඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.) ස්පර්ශයයයි පැනවීමක් ඇති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි) වේදනාවයයි පැනවීමක් ඇති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි (සිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම (භවාඞ්ග) සිත ඇති කල්හි ධර්ම අරමුණු ඇති කල්හි මනොවිඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි (සිදුවෙයි) ස්පර්ශයයයි පැනවීමක් ඇති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. (සිදුවෙයි.) වේදනාවයයි පැනවීමක් ඇති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් ඇති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් ඇති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච

ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි (සිදුවෙයි)

11. "ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම ඇස නැති කල්හි, රූපය නැති කල්හි, චක්ඛු විඤ්ඤාණය නැති කල්හි, ස්පර්ශයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (සිදු නොවෙයි) ස්පර්ශයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි (නොසිදුවෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) විතර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම කණ නැති කල්හි ශබ්දය නැති කල්හි, සොතවිඤ්ඤාණය නැති කල්හි, ස්පර්ශයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (සිදු නොවෙයි) ස්පර්ශයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමානවෙයි. (නොසිදුවෙයි) විතර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යාමාන වෙයි. (නොසිදුවෙයි)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම නාසය නැති කල්හි, ගන්ධය නැති කල්හි, ඝාණවිඤ්ඤාණය නැති කල්හි, ස්පර්ශයයි පැනවිමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි (සිදු නොවෙයි) ස්පර්ශයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි

(නොසිදු වෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) විර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමානවෙයි. (නොසිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම දිව නැති කල්හි, රසය නැති කල්හි, ජිව්හා විඤ්ඤාණය නැති කල්හි, ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (සිදුනොවෙයි) ස්පර්ශයයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. විතර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම කය නැති කල්හි ස්පර්ශය නැති කල්හි, කාය විඤ්ඤාණය නැති කල්හි, ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (සිදුනොවෙයි) ස්පර්ශයයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) විතර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි)

"ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙම (භවාඞ්ග) සිත නැති කල්හි, ධර්ම අරමුණු නැති කල්හි, මනොවිඥ්ඥාණය නැති කල්හි ස්පර්ශයයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (සිදු නොවෙයි) ස්පර්ශයයයි පැනවීමක් නැති කල්හි වේදනාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි) වේදනාවයයි පැනවීමක් නැති කල්හි සංඥාවයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදු වෙයි.) සංඥාවයයි පැනවීමක් නැති කල්හි විතර්කයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදුවෙයි.) විතර්කයයි පැනවීමක් නැති කල්හි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ පැවැත්මයයි පැනවීමක් පනවන්නේය යන මේ කාරණය අවිද්‍යමාන වෙයි. (නොසිදු වෙයි.)

12. "ඇවැත්නි, යමක් භාග්‍යවතුන් වහන්සේ තොපට කොටින් දෙශනා කොට විස්තර වශයෙන් අර්ථය නොබෙදා උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියාහුද 'මහණ යමක් හෙතුකොට ගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද ප්‍රමාදයට හෙතුවූබැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිද්ද, ඒ හේතුන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු විය යුත්තක් නැත්තේද, මමය මාගේයයි කිව යුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම පටිඝානුසයන්ගේ කෙළවර වන්නේය, එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය. දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධව කථාකිරීමය, තා තේ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුශලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුශල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්ය"යි (වදාළේද,)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කොට අර්ථ බෙදා විස්තර නොකළාවූ ඒ දෙශනාවේ විස්තර අර්ථය මෙසේ දනිමි. ඇවැත්නි, ඉදින් තොප කැමති වන්නාහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙතටම පැමිණ මෙහි විස්තරය විචාරව්. තොපට යම්සේ භාග්‍යවතුන් වහන්සේ විස්තර කරද්ද එසේ දරා ගනිව්."

13. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේගේ දෙශනාවට සතුටුව, අනුමෝදන්ව උන් අසුන්වලින් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක උන්නාහුය. එක පැත්තක උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළාහුය.

"මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ අපට කොටින් දෙශනා කොට විස්තර වශයෙන් අර්ථය නොබෙදා උන් ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

"මහණ, යමක් හෙතුකොට ගෙන තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද ප්‍රමාදයට හෙතුවූ බැවින් ප්‍රපඤ්ච නම් ධර්මයෝ පුරුෂයා කෙරෙහි පවතිත්ද, ඒ හේතූන් වන දොළොස් ආයතනයන් කෙරෙහි ඉදින් සතුටු විය යුත්තක් නැත්තේද, මමය මාගේයයි කිව යුත්තක් නැත්තේද, ගැලිය යුත්තක් නැත්තේද, එයම රාගානුසයයන්ගේ කෙළවරවන්නේය. එයම පටිඝානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම දිට්ඨානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම මානානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම භවරාගානුසයයන්ගේ කෙළවර වන්නේය, එයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර වන්නේය. දඬු මුගුරු ගැනීමය, ආයුධ ගැනීමය, කෝලාහල කිරීමය, විරුද්ධ කථා කීමය, තා තෝ කියා බැණීමය, කේලාම් කීමය, බොරු කීමය යන මේ අකුශලයන්ගේද කෙළවර වන්නේය. මේ දොළොස් ආයතනයන් කෙරෙහි ලාමකවූ මේ අකුශල ධර්මයෝ ඉතිරි නොවී විනාශ වෙත්" (කියායි)

"භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩිය ටික වේලාවකින් ඒ අපට මේ අදහස ඇතිවිය

"භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කළාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ මේ දේශනාවේ අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදා දක්වන්නේද (කියායි) එසේ සිතූ ඒ අපට මේ සිත පහළවිය මේ ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ශාස්තෘන් වහන්සේ විසින් වර්ණනා කරන ලද්දේමය. නුවණ ඇත්තාවූ සමාන බ්‍රහ්මචරියා ඇත්තවුන් විසින් ගරුකරන ලද්දේය, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ, මේ කොටින් දෙශනාකළාවූ විස්තර වශයෙන් අර්ථය නොබෙදුවාවූ මේ දෙශනාවේ අර්ථය බෙදා ප්‍රකාශ කරන්ට සමර්ථ වෙයි. අපි යම් හේතුවකින් ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට යන්නෙමු නම් ඉතා යෙහෙක, එසේ පැමිණ, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේගෙන් මෙහි තේරුම් අසන්නෙමුයි (කියායි.)

"ස්වාමීනි, ඉන්පසු අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෙමු. පැමිණ, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය ඇසුවෙමු. ස්වාමිනි, ඒ අපට ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ ක්‍රමයෙන් මේ පදවලින් යුක්තව, මේ අක්ෂරවලින් යුක්තව අර්ථය විස්තර කරන ලද්දේය"යි (කීවාහුය.)

"මහණෙනි, මහා කාත්‍යායන තෙම පණ්ඩිතය. මහණෙනි, මහා කාත්‍යායන තෙම මහත් ප්‍රඥාවෙන් යුක්තය. මහණෙනි, තොපි මගෙන්ද මේ කාරණය අසන්නහු නම් මමද එය යම්සේ මහා කාත්‍යායනයන් විසින් විස්තර කරන ලද්දේද එපරිද්දෙන්ම විස්තර කරන්නෙමි. එයම මේ දෙශනාවෙහි අර්ථය වන්නේය. මෙසේ ඒ අර්ථය දරාගනිව්"යි (වදාළහ.) මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

"ස්වාමීනි, බඩසාදුකින් දුර්වලව පෙළෙන්නාවූ පුරුෂයෙක් මීපැණි දමා කළ අග්ගලාවක් ලබාද, හෙතෙම යම් යම්

කොටසකින් රස විඳීද, (ඔහු) ඒ ඒ කොටසින් රස අඩු වැඩි යයි නොකිය යුතුවූ මිහිරි රසය ලබන්නේය. ස්වාමීනි, එපරිද්දෙන්ම සිතන්නාවූ පණ්ඩිත ස්වභාව ඇති මහණතෙම මේ ධර්ම ක්‍රමය පිළිබඳව යම් යම් කොටසකින් අර්ථය සලකන්නේද, (එයින්) සතුටු සිත් ඇති බවම ලබන්නේය. සිතේ පැහැදීමම ලබන්නේය. ස්වාමීනි, මේ ධර්ම ක්‍රමයේ නම කුමක් දැ"යි (ඇසීය) 'එසේ නම් ආනන්දය, තොප මේ ධර්ම ක්‍රමය "මධු පිණ්ඩික" කියාම දරාගනුව."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

(අටවෙනිවූ මධු පිණ්ඩික සූත්‍රය නිමි.) (2-8)

---

## 19. ද්වෙධා විතක්ක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඩු මහ සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළහ. "ස්වාමීනි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "මහණෙනි, බුදුවන්නට කලින් බුදුනොවූ බොධිසත්වවූ මට මේ අදහස ඇතිවිය 'මම විතර්කයන් (කල්පනාවන්) දෙකොටසක් දෙකොටසක් කොට බෙදා වාසය කරන්නෙම් නම් හොඳය' කියායි. "මහණෙනි, ඒ මම යම් මේ කාම විතර්කයක් (කාමයන් පිළිබඳ කල්පනාවක්) වේද යම් ව්‍යාපාද විතර්කයක් (ක්‍රොධ කල්පනාවක්) වේද, යම් විහිංසා විතර්කයක් (හිංසා කල්පනාවක්) වේද, මේ අකුසල කල්පනා එක් කොටසක් කෙළෙමි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් මේ නෛෂ්ක්‍රම්‍ය (කාමයන්ගෙන් වෙන්වීමේ) කල්පනාවක් වේද, යම් අව්‍යාපාද (මෛත්‍රී සහගත) කල්පනාවක් වේද යම් අවිහිංසා (හිංසා නොකිරීමේ) කල්පනාවක් වේද මේ කුසල කල්පනා දෙවෙනි කොටස කෙළෙමි.

3. "මහණෙනි, මෙසේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්යය ඇතිව වාසය කරන්නාවූ ඒ මට කාම කල්පනාවක් උපදියිද ඒ මම මෙසේ දනිමි. මට මේ කාම කල්පනාව උපන්නීය. ඒ කාම කල්පනාව වනාහි තමහටද දුක් පිණිස පවතියි. අන්‍යයා හටද දුක් පිණිස පවතී. දෙපක්ෂයටමද දුක් පිණිස පවතියි. ප්‍රඥාව වළකන්නීය. දුක් පක්ෂයෙහි සිටියාය. නිවන් පිණිස නොපවත්නීය. මහණෙනි, තමහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මගේ සිතේ උපන් කාම කල්පනාව විනාශයට යෙයි. මහණෙනි, පරහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මා තුළ උපන් කාම කල්පනාව විනාශයට යෙයි. දෙපක්ෂයටම දුක් පිණිස පවතීයයි සලකන්නාවූ මා තුළ උපන් කාම කල්පනාව විනාශයට යෙයි. ප්‍රඥාව වළකන්නීය. දුක් පක්ෂයෙහි සිටියාය. නිවන් පිණිස නොපවතින්නීයයි සලකන්නාවූ මා තුළ උපන් කාම කල්පනාව විනාශයට යෙයි.

"මහණෙනි, ඒ මම උපන් කාම විතර්කය දුරුකෙළෙම් මය, බැහැර කෙළෙම්මය. එය ඉතිරි නොකෙළෙම්මය.

"මහණෙනි, මෙසේ අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යය ඇතිව වාසය කරන්නාවූ ඒ මට ක්‍රොධ සහගත කල්පනාවක් පහළ වෙයිද, ඒ මම මෙසේ දනිමි. මට මේ ක්‍රොධ සහගත කල්පනාව උපන්නීය. ඒ ක්‍රොධ සහගත කල්පනාව වනාහි තමහටද දුක් පිණිස පවතී. අන්‍යයාහටද දුක් පිණිස පවතී. දෙපක්ෂයටමද දුක් පිණිස පවතියි, ප්‍රඥාව වළකන්නීය. දුක් පක්ෂයෙහි සිටියාය. නිවන් පිණිස නොපවත්නීය.

"මහණෙනි, තමහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මගේ සිතේ උපන් ක්‍රොධ සහගත කල්පනාව විනාශයට යෙයි. මහණෙනි, පරහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මා තුළ උපන් ක්‍රොධ සහගත කල්පනාව විනාශයට යෙයි.

දෙපක්ෂයටම දුක් පිණිස පවතීයයි සලකන්නාවූ මා තුළ උපන් ක්‍රොධ සහගත කල්පනාව විනාශයට යෙයි. ප්‍රඥාව වළකන්නීය, දුක් පක්ෂයෙහි පිහිටියාය, නිවන් පිණිස නොපවතින්නීයයි සලකන්නාවූ මා තුළ උපන් ක්‍රොධ සහගත කල්පනාව විනාශයට යෙයි. මහණෙනි, ඒ මම උපන් ක්‍රොධ සහගත කල්පනාව දුරුකෙළෙම්මය. බැහැර කෙළෙම්මය. ඉතිරි නොකෙළෙම්මය.

"මහණෙනි, මෙසේ අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යය ඇතිව වාසය කරන්නාවූ ඒ මට හිංසා කිරීමේ කල්පනාව පහළ වෙයිද, ඒ මම මෙසේ දනිමි. මට මේ හිංසා කිරීමේ කල්පනාව උපන්නීය. ඒ හිංසා කිරීමේ කල්පනාව වනාහි තමහටද දුක් පිණිස පවතී. අන්‍යයාහටද දුක් පිණිස පවතී. දෙපක්ෂයටමද දුක් පිණිස පවතියි. ප්‍රඥාව වළකන්නීය. දුක් පක්ෂයෙහි සිටියාය. නිවන් පිණිස නොපවත්නීය.

"මහණෙනි, තමහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මගේ සිතේ උපන් හිංසා කිරීමේ කල්පනාව විනාශයට යෙයි. මහණෙනි, පරහට දුක් පිණිස පවතීයයි කියා සලකන්නාවූ මා තුළ උපන් හිංසා කිරීමේ කල්පනාව විනාශයට යෙයි. දෙපක්ෂයටම දුක් පිණිස පවතීයයි සලකන්නාවූ මා තුළ උපන් හිංසා කිරීමේ කල්පනාව විනාශයට යෙයි. ප්‍රඥාව වළකන්නීය, දුක් පක්ෂයෙහි සිටියාය. නිවන් පිණිස නොපවත්නීයයි සලකන්නාවූ මා තුළ උපන් හිංසා කිරීමේ කල්පනාව විනාශයට යෙයි.

"මහණෙනි, ඒ මම උපන් හිංසා කිරීමේ කල්පනාව දුරු කෙළෙම්මය, බැහැර කෙළෙම්මය, ඉතිරි නොකෙළෙම්මය.

4. මහණෙනි, මහණතෙම යම් යම් කල්පනාවක් බොහෝ කොට නැවත නැවත කල්පනා කරයිද, නැවත නැවත සිත්හි පවත්වයිද, ඒ ඒ පරිද්දෙන් හිතේ නැමීම වෙයි. මහණෙනි, ඉදින් මහණතෙම කාම විතර්කය බොහෝ කොට නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත පවත්වයිද, කාමයන්ගෙන් වෙන්වීමේ කල්පනාව දුරු කෙළේද, කාම කල්පනා බහුල කෙළේද ඔහුගේ ඒ සිත කාම විතර්කය පිණිස නැමෙයි.

"මහණෙනි, ඉදින් මහණතෙම ක්‍රොධ කල්පනා බොහෝ කොට නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත සිත්හි පවත්වයි, ක්‍රොධයෙන් වෙන්වීමේ කල්පනාව දුරු කළේද, ක්‍රොධ කල්පනා බහුල කළේද, ඔහුගේ ඒ සිත ක්‍රොධ කල්පනා පිණිස නැමෙයි.

"මහණෙනි, ඉදින් හිංසා කිරීමේ කල්පනා බොහෝකොට නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත සිත්හි පවත්වයිද, විහිංසාවෙන් වෙන්වීමේ කල්පනාව දුරුකෙළේද, විහිංසා කල්පනා බහුල කෙළේද ඔහුගේ ඒ සිත විහිංසා කල්පනාව පිණිස නැමෙයි.

"මහණෙනි, යම්සේ වැහිකාලයට අයත් අන්තිම මාසයෙහි සරත් කාලයෙහි ගොයමට යෑම වැළැක්විය යුතු කල්හි ගොපලුතෙම ගවයන් පාලනය කෙරේද, හෙතෙම ඒ ගවයන්ට ඒ ඒ පැත්තෙන් කෙවිටෙන් පහර දෙන්නේය. නැවත නැවත පහර දෙන්නේය. ඔබ මොබ යානොදී වළක්වන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ගොපලුතෙම ඒ ගවයන් හොඳින් බලානොගැනීම හේතුකොට ගෙන පැමිණිය හැකි හිංසා පීඩාද, වධ බන්ධනද, ධන හානියද, නින්දා අපහාසද දකියි. මමද මහණෙනි, එසේම අකුශල ධර්මයන්ගේ දොෂයද, ලාමක බවද, කෙලෙසීමද, කුශල ධර්මයන්ගේද, කාමයන්ගෙන් වෙන්වීමෙහි අනුසස්ද, පිරිසිදු බවද දුටුයෙමි.

5. මහණෙනි, මෙසේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්යය ඇතිව කාය ජීවිත පරිත්‍යාග කොට වාසය කරන්නාවූ ඒ මට කාමයන්ගෙන් නික්මීමේ කල්පනාව උපදීද, ඒ මම මෙසේ දනිමි. මට මේ කාමයන්ගෙන් වෙන්වීමේ කල්පනාව උපන්නේය. ඒ වනාහි තමහට දුක් පිණිසද නොවෙයි. පරහට දුක් පිණිසද නොවෙයි. දෙපක්ෂයටමද දුක් පිණිස නොවෙයි. ලෞකික ලොකොත්තර ප්‍රඥාව වඩයි. දුක් උපදවන පක්ෂයෙහි නොවෙයි. නිවන් පිණිස පවත්නේය. මහණෙනි, මුළු රාත්‍රියෙහිම එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොටගෙන බයක් නොමදකිමි. දාවල් කාලය මුලුල්ලෙහි

එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොට ගෙන බයක් නොමදකිමි. රෑ දාවල් දෙක්හිම කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොට ගෙන භයක් නොමදකිමි. එසේද වුවත් බොහෝ වේලාවක් කල්පනා කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත වෙයි, ශරීරය ක්ලාන්තවූවිට සිත නොසන්සුන් වෙයි. සිත නොසන්සුන්වූ කල්හි සමාධිය කෙරෙන් සිත ඈත්වෙයි. මහණෙනි, ඒ මම ඇතුළතින්ම සිත මනාව තබමි, හිඳුවමි, එකඟ කරමි, මනාව පිහිටුවමි. ඊට හේතු කවරේද? මාගේ සිත නොවිසිරේවායි (සිතායි.)

**6.** "මහණෙනි, මෙසේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්යය ඇතිව, කාය ජීවිත පරිත්‍යාග කොට වාසය කරන්නාවූ ඒ මට මෛත්‍රී සහගත කල්පනාව උපදියිද, ඒ මම මෙසේ දනිමි. මට මේ මෛත්‍රි සහගත කල්පනාව උපන්නීය. ඒ වනාහි තමහට දුක් පිණිසද නොවෙයි. පරහට දුක් පිණිසද නොවෙයි. දෙපක්ෂයටම දුක් පිණිසද නොවෙයි. ලෞකික ලොකොත්තර ප්‍රඥාව වඩයි. දුක් උපදවන පක්ෂයෙහි නොවෙයි. නිවන් පිණිස පවත්නේය. මහණෙනි, මුලු රාත්‍රියෙහිම එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතු කොට ගෙන භයක් නොමදකිමි. දාවල් කාලය මුලුල්ලෙහි එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොටගෙන භයක් නොමදකිමි. රෑ දාවල් දෙක්හිම කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතු කොට ගෙන භයක් නොමදකිමි. එසේද වුවත් බොහෝ වේලාවක් කල්පනා කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්තය වෙයි. ශරීරය ක්ලාන්ත වූවිට සිත නොසන්සුන් වෙයි. නොසන්සුන්වූ කල්හි සමාධිය කෙරෙන් සිත ඈත්වෙයි. මහණෙනි, ඒ මම ඇතුළත්හිම සිත මනාව තබමි, හිඳුවමි, එකඟ කරමි, මනාව පිහිටුවමි, ඊට හේතු කවරේද? මාගේ සිත නොවිසිරේවායි (සිතායි.)

**7.** "මහණෙනි, මෙසේ අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යය ඇතිව, ආත්මය පරිත්‍යාග කොට වාසය කරන්නාවූ මට හිංසා

නොකිරීමේ කල්පනාව උපදියිද, ඒ මම මෙසේ දකිමි. මට මේ හිංසා නොකිරීමේ කල්පනාව උපන්නීය. ඒ වනාහි තමහට දුක් පිණිසද නොවෙයි. පරහට දුක් පිණිසද නොවෙයි. දෙපක්ෂයටම දුක් පිණිද නොවෙයි. ලෞකික ලොකොත්තර ප්‍රඥාව වඩයි. දුක් උපදවන පක්ෂයෙහි නොවෙයි. නිවන් පිණිස පවත්නේය. මහණෙනි, මුළු රාත්‍රියෙහිම එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොට ගෙන භයක් නොමදකිමි. දාවල් කාලය මුළුල්ලෙහි එය කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොට ගෙන භයක් නොමදකිමි. රෑ දාවල් දෙක්හිම කල්පනා කළත් නැවත නැවත කල්පනා කළත් ඒ හේතුකොටගෙන භයක් නොදකිමි. එසේද වුවත් බොහෝ වේලාවක් කල්පනා කරන්නාවූ මාගේ ශරීරය ක්ලාන්ත වෙයි. ශරීරය ක්ලාන්තවූවිට සිත නොසන්සුන් වෙයි. සිත නොසන්සුන්වූවිට සමාධිය කෙරෙන් සිත ඈත්වෙයි. මහණෙනි, ඒ මම ඇතුළතම සිත මනාව තබමි, හිඳුවමි, එකඟ කරමි, මනාව පිහිටුවමි. ඊට හේතු කවරේද? මාගේ සිත නොවිසිරේවායි (සිතාය.)

8. "මහණෙනි, මහණතෙම යම් යම් කල්පනාවක් බහුලව නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත සිතේ පවත්වයිද, ඒ ඒ ආකාරයෙන් නැමීම වෙයි. මහණෙනි, ඉදින් මහණතෙම කාමයෙන් වෙන්වීමේ කල්පනාව බොහෝ කොට නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත සිතේ පවත්වයිද, කාම කල්පනා බැහැර කෙරේද, කාමයෙන් වෙන්වීමේ කල්පනාව බහුල කෙරේද, ඔහුගේ සිත කාමයෙන් වෙන්වීමේ කල්පනාව පිණිස නැමෙයි.

"මහණෙනි, ඉදින් මහණතෙම මෛත්‍රී කල්පනාව බොහෝ කොට නැවත නැවත කල්පනා කෙරේද, නැවත නැවත සිත්හි කෙරේද, ක්‍රොධ කල්පනා බැහැර කෙරේද, මෛත්‍රී කල්පනා බහුල කෙරේද, ඔහුගේ ඒ සිත මෛත්‍රී කල්පනාව පිණිස නැමෙයි.

"මහණෙනි, ඉදින් මහණතෙම හිංසා නොකිරීමේ කල්පනා බොහෝ කොට කෙරේද, නැවත නැවත සිත්හි කෙරේද, හිංසා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කිරීමේ කල්පනා බැහැර කෙරේද, මෛත්‍රී කල්පනා බහුල කෙරේද, ඔහුගේ ඒ සිත මෛත්‍රී කල්පනාව පිණිස නැමෙයි.

"මහණෙනි, යම්සේ ග්‍රීෂ්ම ඍතුවට අයත් අන්තිම මාසයෙහි සියලු ශස්‍යයන් ගමට ගෙනගිය කල්හි ගොපලුතෙම ගවයන් නොරක්නේද, ගසක් යටටවී හෝ එළිමහන් තැනකටවී හෝ මේ ගවයෝයයි සිහිකිරීම පමණක් ඔහුට ප්‍රමාණවත් වෙයිද, මහණෙනි, එපරිද්දෙන්ම මේ ධර්මයෝයයි සිහිකිරීම පමණක් ප්‍රමාණවත්ය.

"මහණෙනි, ඒ මාගේ වීර්යය නොහැකිලී ආරම්භවිය. සිහිය එළඹ සිටියාය. කය සංසිඳුණේය. සැහැල්ලු විය. සිත සමාධිමත් විය. එකඟ විය.

**9.** "මහණෙනි, ඒ මම කාමයෙන් වෙන්වම සියලු අකුශලයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. විතර්ක විචාර දෙදෙනාගේ සන්සිඳීමෙන් හිතේ පැහැදීම ඇත්තාවූ, හිතේ එකඟකම ඇත්තාවූ විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනිවූ ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපේක්ෂා ඇත්තේ සිහි නුවණින් යුක්තවූයේ කයින් සැපය වින්දෙමි. යම් ධ්‍යානයක් උපේක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද, ඒ තුන්වැනි ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. සැපද නැති කිරීමෙන් දුක්ද නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපේක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවැනි ධ්‍යානයට එළඹ වාසය කෙළෙමි. ඒ මම, මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි අඞ්ගන (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, පහවූ උවදුරු ඇති කල්හි, මෘදුවූ කල්හි, කාර්යයට සුදුසුව සිටි කල්හි චංචල නොවී සිටි කල්හි පෙර විසූ කඳ පිළිවෙල දැනීම පිණිස සිත නැමූයෙමි. ඒ මම නොයෙක් ආකාරවූ පූර්වෙනිවාසය (පෙර උපන් ජාති) සිහි කරමි. එනම්ඃ

එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශ වන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසුවල් තැන උපන්නෙමි. එහි මෙ නම් ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැප දුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තෙත් වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍ය භවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නන්වැදෑරුම්වූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි.

"මහණෙනි, මා විසින් රාත්‍රියේ පළමුවෙනි යාමයෙහි මේ පළමුවන විද්‍යාව (පෙර විසූ තැන් දන්නා නුවණ) ලබන ලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය.

10. "ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, අඞ්ගණ (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කාර්යයට සුදුසුව සිටි කල්හි, චංචල නොවී සිටි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දැකීම පිණිස සිත නැමීමි ඒ මම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තා වූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මියගියාවූ සත්ත්වයන් දකිමි.

"ඒකාන්තයෙන් මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො

දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි කර්ම අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්ත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු වාක් සුචරිතයෙන් යුක්තවූවාහු මනො සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්යයන්ට දොස්නොකීවාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔව්හු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කර්මය පරිදි මියගියාවූ සත්ත්වයන් දනිමි.

"මහණෙනි, මා විසින් රාත්‍රියෙහි මැදියමෙහි මේ දෙවන විද්‍යාව (චුතවීම, ඉපදීම දක්නා නුවණ) ලබන ලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය.

11. "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි ආශ්‍රව ක්ෂයකර ඥානය (කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත නැමුයෙමි. ඒ මම මෙය දුකයයි තතුසේ දත්තෙමි. මේ දුක් ඉපදීමට හේතුවයයි තතුසේ දත්තෙමි. මේ දුක් නැති කිරීමයයි තතු සේ දත්තෙමි. මේ දුක නැතිකිරීමේ මාර්ගයයයි තතුසේ දත්තෙමි. මොහු ආශ්‍රවයෝ (කාම ආදී කෙලෙස්) යයි තතුසේ දැන ගතිමි. මේ ආශ්‍රවයන්ගේ හටගැන්මයයි තතුසේ දැනගතිමි. මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමයයි තතුසේ දැනගතිමි. මේ ආශ්‍රවයන් නැතිකිරීමේ මාර්ගයයි තතුසේ දැනගත්තෙමි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ සිත කාමාශ්‍රවයෙන්ද මිදුනේය. භවාශ්‍රවයෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයෙන්ද මිදුනේය. මිදුන කල්හි මිදුනේයයි දැනීම පහළ විය. උත්පත්තිය කෙළවර විය.

"මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ අර්හත්වය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දත්තෙමි.

"මහණෙනි, රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි මේ තුන්වෙනි විද්‍යාව (ආශ්‍රව ක්ෂයකර ඥාන නම්වූ අර්හත් මාර්ගය) මා විසින් ලබනලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේම විය.

**12.** "මහණෙනි, මහ වනයෙහි මහ වන ලැහැබෙක මහත්වූ මිටිවූ තැනිතලාවක් යම් සේ වේද, ඒ මේ තැනිතලාවක් ඇසුරුකොට මහත් මුව සමූහයෙක් වාසය කෙරෙයි. ඒ මෘග සමූහයාට අනර්ථය කැමැත්තාවූ අවැඩ කැමැත්තාවූ, අභය නොකැමැත්තාවූ කිසියම් පුරුෂයෙක් තෙම පහළ වෙයි. හෙතෙම ඒ ස්ථානයට භය නැතිව පහසුවෙන් යාහැකි මාර්ගය වසන්නේය. නපුරු මග විවෘත කරන්නේය. දඩමුවා සිටුවන්නේය. දඩමුවදෙන සිටුවන්නේය. මහණෙනි, මෙසේවූ කල්හි ටික කලකින් ඒ මහා මුව සමූහයා විනාශයට තුනී බවට පැමිණෙන්නේය. මහණෙනි, එම මහත් මුව සමූහයාගේ අභිවෘද්ධිය කැමැත්තාවූ වැඩ කැමැත්තාවූ අභය කැමැත්තාවූ කිසියම් පුරුෂයෙක් පහළ වෙයි. හෙතෙම ඒ ස්ථානයට භයනැතිව පහසුවෙන් යාහැකි මාර්ගය විවෘත කරන්නේය. නපුරු මාර්ගය වසන්නේය. දඩමුවා නසන්නේය දඩමුවදෙන නසන්නේය. මහණෙනි, මෙසේවූ කල්හි ඒ මහත් මුව සමූහය ටික කලකින් අභිවර්ධනයටද දියුණුවටද, ස්ථිර බවටද මහත් බවටද පැමිණෙන්නේය.

"මහණෙනි, අර්ථය තේරුම් කිරීම පිණිස මා විසින් මේ උපමාව දක්වන ලදී. මෙහි මේ අර්ථයයි. මහණෙනි, මහත්වූ මිටියාවත යනු පංචකාමයන්ට නමෙකි. මහණෙනි, මහා මෘග සමූහය යනු සත්ත්වයන්ට නමකි. අවැඩ කැමති, අනර්ථය කැමති අභය නොකැමැති පුරුෂයා යනු මාරයාට නමකි. නපුරු මාර්ගය

යනු අඞ්ග අටකින් යුක්තවූ වැරදි මාර්ගයට නමකි. එනම් වැරදි දැකීම, වැරදි කල්පනාව, වැරදි වචනය, වැරදි කර්මාන්තය, වැරදි ආජීවය, වැරදි ව්‍යායාමය, වැරදි සිහිය, වැරදි සමාධිය යන අටයි. මහණෙනි, දඩමුවා යනු තෘෂ්ණාවට නමෙකි. මහණෙනි, දඩමුවදෙන යනු අවිද්‍යාවට නමකි. වැඩකැමති අර්ථය කැමති, අභයකැමති පුරුෂයා යනු අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේට මේ නමකි. යහපත් මාර්ගය යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයට නමකි. එනම්, නිවැරැදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යනඅටයි.

"මහණෙනි, මෙසේ වනාහි මා විසින් නිර්භයවූ සැප පමුණුවන්නාවූ පහසුවෙන් යා හැකි මාර්ගය විවෘත කරන ලද්දේය. නොමඟ වසන ලද්දේය. දඩමුවා නසන ලද්දේය. දඩමුවදෙන නසන ලද්දීය.

"මහණෙනි, ශ්‍රාවකයන්ට හිතවත්වූ අනුකම්පා ඇති ශාස්තෘ කෙනෙකු විසින් අනුකම්පාවෙන් යම්බඳු යහපතක් කළයුතුද එය මා විසින් තොපට නොඅඩුව කරනලදී.

"මහණෙනි, මේ ගස් මුල් ඇත්තාහ. හිස් ගෙවල් ඇත්තාහ. එහි ගොස් භාවනා කරව්. ප්‍රමාද නොවව්, ප්‍රමාදවී පසුතැවිලි නොවව්. තොපට අපගේ මේ අනුශාසනාවයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

(නව වෙනිවූ ද්වේධා විතක්ක සූත්‍රය නිමි.) (2-9)

---

## 20. විතක්ක සණ්ඨාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඩු සිටුහු විසින් කරවනලද ජේතවන නම් ආරාමයෙහි වාසය කරති. එකල්හි

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි' කියා කථා කළහ. භික්ෂූහු, 'ස්වාමීනි' කියා උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

2. "මහණෙනි, විදර්ශනාවට පාදකවූ සමාධිය වඩන්නාවූ භික්ෂුව විසින් කලින් කළ කරුණු පසක් මෙනෙහි කළ යුත්තාහුය. කිනම් කරුණු පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට යම් අරමුණක් නිසා යම් අරමුණක් මෙනෙහි කිරීම හෙතුකොට ගෙන ලොභ සහගතවූද දොෂ සහගතවූද මොහ සහගතවූද ලාමකවූ අකුසල කල්පනා උපදිත්ද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ අරමුණෙන් අන්‍යවූ කුසල සහිත අරමුණක් මෙනෙහි කළ යුතුය. ඒ අරමුණෙන් අන්‍යවූ කුසල සහිතවූ අරමුණක් මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූ දොෂ සහගතවූ, මොහ සහගතවූ, ලාමකවූ, යම් අකුසල කල්පනාවෝවෙද්ද ඒ අකුසල කල්පනාවෝ පහවෙත්. විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන සිත ඇතුළතම පිහිටයි, නවතියි, එකඟ වෙයි සමාධිය ඇතිවෙයි.

"මහණෙනි, යම්සේ දක්ෂ වඩුවෙක් හෝ වඩු ගෝලයෙක් හෝ කුඩා ඇණයකින් ලොකු ඇණයක් පිටකරන්නේද, නිකුත් කරන්නේද, ගලවා දමන්නේද, මහණෙනි, එසේම භික්ෂුවහට යම් අරමුණක් නිසා යම් අරමුණක් මෙනෙහි කිරීම නිසා ලොභ සහගතවූද දෝෂ සහගතවූද මොහ සහගතවූද ලාමකවූ අකුසල කල්පනාවෝ උපදිද්ද, මහණෙනි, ඒ භික්ෂුව විසින් කුසල සහිතවූ ඒ අරමුණෙන් අන් අරමුණක් මෙනෙහි කළ යුතුය. කුසල සහිතවූ ඒ අරමුණෙන් අන් අරමුණක් මෙනෙහිකිරීම හෙතුකොටගෙන ඒ භික්ෂුවගේ ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහ සහගතවූද ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන සිත ඇතුළතම පිහිටයි, හිඳියි, නවතියි, එකඟ වෙයි, සමාධියට පැමිණෙයි.

3. "මහණෙනි, ඒ අරමුණෙන් අන්‍යවූ කුසල සහිත අරමුණක් මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දොෂ සහගතවූද මොහ සහගතවූද ලාමක අකුසල කල්පනාවෝ

උපදින්නාහුම වෙත්ද, මහණෙනි, එසේ නම් ඒ භික්ෂුව විසින් ඒ කල්පනාවන්ගේ ආදිනව මෙනෙහි කළ යුතුය. මෙසේද මේ කල්පනාවෝ අකුසල්ය, මෙසේද මේ කල්පනාවෝ වරද සහිතය. මෙසේද මේ කල්පනාවෝ දුක්වූ විපාක ඇත්තෝය. කියායි. ඒ කල්පනාවන්ගේ ආදීනව මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවගේ ලොභ සහගතවූද දොෂ සහගතවූද මොහ සහගත වූද යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් වෙත්ද, ඒ ලාමක අකුසල කල්පනාවෝ පහවෙත්, විනාශවෙත්, ඔවුන්ගේ පහවීම හේතුකොටගෙන සිත ඇතුළතම සිටියි, නවතියි, එකඟවෙයි, සමාධිය ඇතිවෙයි. මහණෙනි, යම්සේ තරුණවූ අලංකාරයට කැමතිවූ යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ සර්ප කුණක් හෝ බලු කුණක් හෝ මිනී කුණක් හෝ බෙල්ලෙහි එල්ලීමෙන් හැකිලෙන්නේද පිළිකුල් කරන්නේද මහණෙනි, එපරිද්දෙන්ම ඒ අරමුණෙන් අන්‍ය කුසලයෙන් යුක්තවූ අරමුණක් මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දෙෂ සහගතවූද මොහ සහගතවූද අකුසල කල්පනාවෝ උපදින්නාහුම වෙත් නම්, මහණෙනි, ඒ භික්ෂුව විසින් මේ ආකාරයෙන්ද මේ කල්පනාවෝ අකුසල්ය, මේ ආකාරයෙන්ද මේ කල්පනාවෝ වරද සහිතය. මේ ආකාරයෙන්ද මේ කල්පනාවෝ දුක් විපාක ඇත්තාහුයයි ඒ කල්පනාවන්ගේ දෝෂ මෙනෙහි කළ යුතුයි. ඒ කල්පනාවන්ගේ දෝෂ මෙනෙහි කරන්නාවූ ඔහුට ලොභ සහගතවූද දෝෂ සහගත වූද මොහ සහගතවූද යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් ඇද්ද, ඒ ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්. විනාශයට පැමිණෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන සිත ඇතුළතම පිහිටයි, නවතියි, එකඟබවට පැමිණෙයි. සමාධියට පැමිණෙයි.

"මහණෙනි, ලොභ සහගතවූද, දෝෂ සහගතවූද මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ ඒ කල්පනාවන්ගේ දෝෂ මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවහට උපදින්නාහුම වෙත්ද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ කල්පනා මෙනෙහි නොකිරීමට අමතක කිරීමට පැමිණිය යුතුයි. ඒ අකුසල කල්පනා මෙනෙහි නොකිරීමට අමතක කිරීමට පැමිණියාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දෝෂ සහගතවූද මොහ සහගතවූද යම් ලාමක

අකුසල කල්පනා කෙනෙක් වෙද්ද ඒ අකුසල කල්පනාවෝ පහ වෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ ප්‍රහාණය හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, හිඳියි, එකඟ බවට පැමිණෙයි. සමාධියට පැමිණෙයි.

"මහණෙනි, යම්සේ ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඇස් හමුවට පැමිණියාවූ රූපයක් නොදකිනු කැමැත්තේ නම් හෙතෙම ඇස් පියාගන්නේ හෝ වේද අන් දිශාවක් බලන්නේ හෝ වේද, මහණෙනි, එමෙන් ඒ ලාමක අකුසල ධර්මයන්ගේ දෝෂ මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ඒ ලොභ සහගතවූද දෝෂ සහගතවූද මොහ සහගතවූද ඒ ලාමක අකුශල ධර්මයෝ උපදින්නාහුම වෙත්ද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ කල්පනා මෙනෙහි නොකිරීමට අමතක කිරීමට පැමිණිය යුතුයි. ඒ කල්පනා මෙනෙහි නොකිරීමට අමතක කිරීමට පැමිණියාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දෝෂ සහගතවූද මොහ සහගතවූද යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් වෙත්ද, ඒ ලාමක අකුසල කල්පනාවෝ ප්‍රහීන වෙත්. අභාවයට යෙත්. ඔවුන්ගේ ප්‍රහාණය හේතුකොටගෙන සිත අභ්‍යන්තරයෙහිම පවතියි. නවතියි, එකඟ බවට පැමිණෙයි.

4. "මහණෙනි, ඒ කල්පනා මෙනෙහි නොකරන්නාවූ අමතක කරන්නාවූ භික්ෂුවට ලොභ සහගතවූද, දෝෂ සහගත වූද, මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ උපදින්නාහුම වෙත්ද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ කල්පනාවන්ගේ මුල් හේතුව මෙනෙහි කටයුතුයි. මහණෙනි, ඒ කල්පනාවන්ගේ මුල් හේතුව මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද, දෝෂ සහගතවූද, මොහ සහගතවූද යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් ඇද්ද ඒ අකුසල කල්පනාවෝ පහ වෙත්. අභාවයට යෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන අභ්‍යන්තරයෙහිම සිත පිහිටයි, නවතියි, එකඟ බවට පැමිණෙයි, සමාධියට පැමිණෙයි.

"මහණෙනි, යම්සේ පුරුෂයෙක් ඉක්මණින් යන්නේද, ඔහුට 'මම කුමක් නිසා වහා යන්නෙම්ද? සෙමින් යන්නෙම්ය'යි අදහස්

වන්නේය. හෙතෙම හෙමින් යන්නේය. ඔහු නැවත කුමක් නිසා 'මම සෙමින් යන්නෙම්ද? නැවතී සිටින්නෙම් නම් යහපතැ'යි සිතා නවතින්නේය. නැවත ඔහු කුමක් නිසා 'මම නැවතී සිටින්නෙම්ද? මම හිඳගන්නෙමි'යි සිතා හිඳගන්නේය. නැවත ඔහු 'කුමක් නිසා මම හිඳගන්නෙම්ද? නිදාගන්නෙමි'යි සිතා නිදාගන්නේය. මහණෙනි, මෙසේ ඒ පුරුෂතෙම ඔළාරික ඉරියව් නවත්වා සියුම් ඉරියව් පවත්වන්නේය. මහණෙනි, එසේම ඒ කල්පනා නොකරන්නාවූ අමතක කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දෝෂ සහගතවූද මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ උපදින්නාහුමද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ කල්පනාවන්ගේ මුල් හේතුව මෙනෙහි කළ යුතුයි. ඒ කල්පනාවන්ගේ මුල් හේතුව මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගත වූද දෝෂ සහගතවූද, මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්, අභාවයට යෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන සිත ඇතුළතම පවතියි, හිඳියි, එකඟ බවට පැමිණෙයි. සමාධියට පැමිණෙයි.

**5.** "මහණෙනි, ඒ කල්පනාවන්ගේ මූලහෙතුව මෙනෙහි කරන්නාවූ භික්ෂුවටද, ඉදින් ඒ ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහසහගතවූද, ඒ ලාමක අකුසල කල්පනාවෝ උපදින්නාහුම වෙත් නම් මහණෙනි, ඒ භික්ෂුව විසින් දත්වලින් දත් තදකොට දිවෙන් තලු තදකොටගෙන (දත්මිටි කාගෙන) සිතින් සිත නිග්‍රහ කළ යුතුයි. පෙළිය යුතුයි. තැවිය යුතුයි. දත්වලින් දත් තද කොටගෙන දිවෙන් තලු තදකොටගෙන සිතින් සිත නිග්‍රහ කරන්නාවූ පෙළන්නාවූ තවන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද, දොෂසහගත වූද, මොහ සහගතවූද, යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් වෙද්ද, ඒ ලාමක අකුසල කල්පනාවෝ පහවෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, නවතියි, එකඟවෙයි, සමාධියට පැමිණෙයි.

"මහණෙනි, යම්සේ බලවත් පුරුෂයෙක් දුර්වල පුරුෂයෙකු හිසෙන් හෝ අල්වා, කරෙන් හෝ අල්වා, නිග්‍රහකරන්නේද,

පෙළෙන්නේද, තබන්නේද, මහණෙනි, එසේම ඒ කල්පනාවන්ගේ මුල් හෙතුව මෙනෙහි කරන්නාවූ භික්ෂුවට ලොභ සහගතවූද, දෝෂ සහගතවූද, මොහ සහගත වූද, ඒ ලාමක අකුසල කල්පනාවෝ උපදින්නාහුම වෙත් නම්, මහණෙනි, ඒ භික්ෂුව විසින් දත්වලින් දත් තදකොට දිවෙන් තලු තදකොට ගෙන සිතින් සිත නිග්‍රහ කළ යුතුයි. පෙළිය යුතුයි. තැවිය යුතුයි. දත්වලින් දත් තදකොට දිවෙන් තලු තදකොට සිතින් සිත නිග්‍රහ කරන්නාවූ පෙළන්නාවූ තවන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද දොෂ සහගත වූද මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, නවතියි, එකඟවෙයි, සමාධියට පැමිණෙයි.

**6.** "මහණෙනි, යම් හෙයකින් යම් අරමුණක් නිසා යම් අරමුණක් මෙනෙහි කරන්නාවූ භික්ෂුවට ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහ සහගතවූද, ලාමක අකුසල කල්පනාවෝ උපදිත්ද, එම අරමුණෙන් අන්‍යවූ කුසල් පිණිස පවත්නාවූ අරමුණක් මෙනෙහි කරන්නාවූ ඒ භික්ෂුවට ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහ සහගතවූද ඒ ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, නවතියි, එකඟවෙයි, සමාධියට පැමිණෙයි. ඒ කල්පනාවන්ගේ දෝෂ පරීක්ෂා කර බලන්නාහටද ලොභ සහගතවූද, දොෂ සහගත වූද, මොහ සහගතවූද, යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් ඇද්ද, ඔවුහු පහ වෙත්, විනාශ වෙත් ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, නවතියි. එකඟවෙයි, සමාධියට පැමිණෙයි. ඒ කල්පනාවන්ගේ මුල් හෙතුව බලන්නාවූ භික්ෂුවහටද ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහ සහගතවූද, යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් ඇද්ද, ඒ ලාමක අකුසල කල්පනාවෝ පහවෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන ඇතුළතම සිත පිහිටයි, නවතියි, එකඟ වෙයි, සමාධියට පැමිණෙයි.

"දත්වලින් දත් තදකොට, දිවෙන් තලු තදකොට සිතින් සිත නිග්‍රහ කරන්නාවූද, පෙළන්නාවූද, තවන්නාවූද, භික්ෂුවටද ලොභ සහගතවූද, දොෂ සහගතවූද, මොහ සහගතවූද, යම් ලාමක අකුසල කල්පනා කෙනෙක් ඇද්ද ඒ ලාමක අකුසල කල්පනාවෝ පහ වෙත්, විනාශ වෙත්. ඔවුන්ගේ පහවීම හෙතුකොටගෙන සිත ඇතුළතම පිහිටයි, නවතියි, එකඟවෙයි, සමාධියට පැමිණෙයි. මහණෙනි, මේ භික්ෂුතෙම යම් කල්පනාවක් කැමති නම් එය කල්පනා කරන්නාවූද, යම් කල්පනාවක් නොකැමති නම් එය කල්පනා නොකරන්නාවූද කල්පනා විෂයෙහි පුරුදුකරන ලද වශීභාව ඇත්තේයයි කියනු ලැබේ. හෙතෙම තෘෂ්ණාව සින්දේය. සංයෝජනය පෙරළා දැමීය. මනාකොට අර්හත් මාර්ග ඥානයෙන් මානය ප්‍රහීනකොට දුක් කෙළවර කෙළේය."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළෝය. සතුටු සිත් ඇත්තාවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

**(දසවැනිවූ විතක්කසණ්ඨාන සූත්‍රය නිමි.) (2-10)**

(චූල සීහනාද සූත්‍රය, මහා සීහනාද සූත්‍රය, මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය, චූල දුක්ඛක්ඛන්ද සූත්‍රය, අනුමාන සූත්‍රය, චෙතොඛිල සූත්‍රය, වනපත්ථ සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය, ද්වෙධා විතක්ක සූත්‍රය, විතක්ක සණ්ඨාන සූත්‍රය යන සූත්‍ර දසයවූ
(මහා සීහනාද වර්ගය නිමි.)

---

## 21. කකචූපම සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඩු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරති.

එකල්හි මොලියඵග්ගුණ භික්ෂුව වේලාව ඉක්මවා භික්ෂුණීන් හා එක්ව වාසය කරන්නේය.

ඉදින් කිසි භික්ෂුවක් මොලියඵග්ගුණ භික්ෂුව ඉදිරියෙහි ඒ භික්ෂුණීන්ගේ අගුණ කියාද, මොලියඵග්ගුණ භික්ෂුව ඒ භික්ෂුව හා කිපියේ නොසතුටුවූයේ (විනය ධර භික්ෂූන් ඉදිරියෙහි) නඩුද පවරයි. ඉදින් කිසි භික්ෂුවක් ඒ භික්ෂුණීන් ඉදිරියෙහි මොලියඵග්ගුණ භික්ෂුවගේ නුගුණ කියාද, ඒ භික්ෂුණීහු ඒ භික්ෂුව සමග කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු (විනයධර භික්ෂූන් ඉදිරියෙහි) නඩුද කියත්. මොලියඵග්ගුණ භික්ෂුව මෙතරම් භික්ෂුණීන් හා එක්ව වාසය කරයි.

ඉක්බිති එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක උන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළේය. "ස්වාමීන් වහන්ස, මොලියඵග්ගුණ භික්ෂුව වේලා ඉක්මවා භික්ෂුණීන් හා එක්ව වාසය කරයි. ස්වාමීන් වහන්ස, ඉදින් යම් භික්ෂුවක් මොලියඵග්ගුණ භික්ෂුව ඉදිරියෙහි ඒ භික්ෂුණීන්ගේ නුගුණ කියාද, එයින් මොලියඵග්ගුණ භික්ෂුව කිපියේ නොසතුටු සිත් ඇත්තේ නඩුද කියයි. ඉදින් කිසි භික්ෂුවක් ඒ භික්ෂුණීන් ඉදිරියෙහි මොලියඵග්ගුණ භික්ෂුවගේ නුගුණ කියාද, එයින් ඒ භික්ෂුණීහු කිපුනාහු නොසතුටු සිත් ඇත්තාහු නඩුද කියත්. ස්වාමීන් වහන්ස, මොලියඵග්ගුණ භික්ෂුව මෙතරම් භික්ෂුණීන් සමග එක්ව වෙසේය'යි (කීය.)

**2.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවා, "මහණ මෙහි එව, මගේ වචනයෙන් 'ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවන්නේය'යි කියා මොලියඵග්ගුණ භික්ෂුව කැඳවා එව'යි වදාළහ. ඒ භික්ෂු තෙම 'එසේය ස්වාමීනි,' කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී මොලියඵග්ගුණ භික්ෂුව යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ මොලියඵග්ගුණ භික්ෂුවට මෙසේ කීය. 'ඇවැත්නි, ඵග්ගුණය, ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවනසේකැ'යි කීය. 'ඇවැත්නි, එසේය'යි කියා මොලියඵග්ගුණ භික්ෂුතෙම ඒ භික්ෂුහට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට ගියේය. ගොස්, භාග්‍යවතුන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වහන්සේ වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක උන්නාවූ මොලියඵග්ගුණ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"ඵග්ගුණය, තෝ වේලා ඉක්මවා භික්ෂුණීන් හා එක්ව වාසය කරන්නෙහිය. ඉදින් කිසි භික්ෂුවක් තොප ඉදිරියෙහි ඒ භික්ෂුණීන්ගේ නුගුණ කියාද එයින් කිපියේ නොසතුටු සිත් ඇත්තේ නඩුද කියන්නෙහිය. ඉදින් කිසි භික්ෂුවක් ඒ භික්ෂුණීන් ඉදිරියෙහි තොපගේ අගුණ කියාද, එයින් ඒ භික්ෂුණීහු කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු නඩුද කියත්, ඵග්ගුණය, තොප මෙපරිද්දෙන් භික්ෂුණීන් සමග මිශ්‍රව වාසය කෙරෙහිය යනු සැබෑද?"

"ස්වාමීනි, එසේය." "ඵග්ගුණය, තොප ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිදිවූ කුලපුත්‍රයෙක් නොවෙහිද?"

"එසේය, ස්වාමීනි."

"ඵග්ගුණය, යම් හෙයකින් තොප භික්ෂුණීන් සමග වේලාව ඉක්මවා එකතුව වාසය කරන්නෙහිද, මේ විහරණය ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ කුල පුත්‍රයෙකුට නුසුදුසුය.

"එහෙයින් ඵග්ගුණය, ඉදින් කිසිවෙක් තොප ඉදිරියෙහි ඒ භික්ෂුණීන්ගේ නුගුණ කියාද ඵග්ගුණය, තොප එහිදු පංචකාම ගුණය ආශ්‍රය කොට ඇති ආශාවෝ වෙත්ද, පංචකාම ආශ්‍රය කොට ඇති යම් කල්පනාවෝ වෙත්ද ඔවුන් දුරුකරව. ඵග්ගුණය, එහිදු 'මගේ සිත නොපෙරළේවා. ලාමක වචන නොකියන්නෙමි. හිතවත්ව අනුකම්පා කරමින් මෛත්‍රී සිත් ඇත්තේ ද්වේෂ සිත් නැත්තේ වාසය කරන්නෙමි'යි මෙසේ හික්මිය යුතුයි. ඵග්ගුණය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ඵග්ගුණය, එහෙයින් මෙහි තොප ඉදිරියෙහි කිසිවෙක් ඒ භික්ෂුණීන්ට අතින් පහරදෙන්නේද කැටයකින් ආයුධයකින්, දඬුවෙන්, පහර දෙන්නේද, ඵග්ගුණය, තොප එහිදු යම් පංචකාම සහගතවූ ආශාවෝ වෙත්ද, පංචකාම සහගතවූ කල්පනාවෝ වෙත්ද, ඔවුන් දුරු කරව. ඵග්ගුණය, එහිදු තොප විසින් මෙසේ හික්මිය යුතුයි. මාගේ සිත නොපෙරළේවා, ලාමක වචන නොකියන්නෙමි. හිතවත්ව අනුකම්පා ඇත්තේ, මෛත්‍රී සිත් ඇත්තේ, ද්වේෂ

සිත් නැත්තේ වාසය කරන්නෙමි'යි එග්ගුණය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

3. "එග්ගුණය, එහෙයින් මෙහි තොපට කිසිවෙක් අගුණ කියන්නේ නම් එග්ගුණය, එහිදු තොප පංචකාම සහගතවූ ආශාවෝ වෙත්ද, පංචකාම සහගතවූ කල්පනාවෝ වෙත්ද, ඔවුන් දුරු කරව. එග්ගුණය, තොප එහිදු මෙසේ හික්මිය යුතුයි. 'මාගේ සිත නොපෙරළේවා ලාමකවූ වචන නොකියන්නෙමි, හිතවත්ව අනුකම්පා ඇත්තේ මෛත්‍රී සිත් ඇත්තේ, ද්වේෂ සහගත සිත් නැත්තේ වාසය කරන්නෙමි'යි එග්ගුණය, මෙසේ වනාහි තොප හික්මිය යුතුයි.

"එග්ගුණය, එහෙයින් මෙහි තොපටද, කිසිවෙක් අතින් පහර දෙන්නේද, කැටකින් පහර දෙන්නේද, දණ්ඩකින් පහර දෙන්නේද, ආයුධයකින් පහර දෙන්නේද, එග්ගුණය, තොප එහිදු පංචකාම සහගතවූ යම් ආශාවෝ වෙත්ද, පංචකාම සහගතවූ යම් කල්පනාවෝ වෙත්ද ඔවුන් දුරු කරව, එග්ගුණය, තොප එහිදු මෙසේ හික්මිය යුතුයි. 'මාගේ සිත නොපෙරළේවා. ලාමකවූ වචනද නොකියන්නෙමි. හිතවත්ව අනුකම්පා ඇත්තේ මෛත්‍රී සිත් ඇත්තේ ද්වේෂ සහගත සිත් නැත්තේ වාසය කරන්නෙමි'යි එග්ගුණය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුය"යි වදාළහ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, එක් කාලයක (ප්‍රථම බොධි කාලයෙහි) භික්ෂූහු ඒකාන්තයෙන් මාගේ සිත සතුටු කළාහුය. මහණෙනි, එකල්හි භික්ෂූන් ඇමතුයෙමි. (අමතා) 'මහණෙනි, මම වනාහි එක් වේලේ වළඳන ආහාරය වළඳමි. මහණෙනි, එක් වේලේ වළඳනා භොජනය වළඳන්නේ නිරොගි බවද උපද්‍රව රහිතව ශරීරයාගේ සැහැල්ලු පැවතුම් ඇති බවද කාය බලයද සැප විහරණයද විඳිමි. මහණෙනි, එව්, තොපිත් එක් වේලේ වළඳව්.

"මහණෙනි, එක් වේලේ වළඳන තෙපිද අල්පාබාධ ඇති බවද, නිරොග බවද, ශරීරයාගේ සැහැල්ලු බවද, ශරීර බලයද, සැප විහරණයද විඳින්නාහුයි කීවෙමි.

"මහණෙනි, එකල භික්ෂූන්හට මා විසින් අනුශාසනාවක් කළයුතු නොවීය. මහණෙනි, ඒ භික්ෂූන්හට මා විසින් සිහි ඉපදවීම පමණක් ප්‍රමාණවත් විය. මහණෙනි, සමබිමක සතර මංසන්ධියක ආජානීය අසුන් යෙදූ රථයක් පහසුවෙන් ගත හැකි සේ තබන ලද කෙවිටි ඇතිව තැබුයේ වෙයිද, අශ්වයන් දමනය කිරීමෙහි දක්ෂවූ අශ්වාචාර්යයෙක් තෙම ඒ මේ රථයට නැඟ වමතින් රැහැන්ගෙන දකුණතින් කෙවිටිගෙන කැමැත්තේ යම් මාර්ගයකින්ද කැමැත්තේ යම් ගමනක්ද එසේ ඉදිරියට එළවන්නේය. ආපසුද එළවන්නේය.

"මහණෙනි, එපරිද්දෙන්ම ඒ භික්ෂූන් කෙරෙහි මා විසින් අනුශාසනාවක් කළ යුතු නොවීය. මහණෙනි ඒ භික්ෂූන්හට සිහි ඉපදවීම පමණක් ප්‍රමාණවත් විය.

"මහණෙනි, එහෙයින් තෙපිත් අකුසලය දුරු කරව්. කුසල ධර්මයන්හි යෙදෙව්. මෙසේ ඇති කල්හි තෙපිත් මේ ශාසනයෙහි (ශීලයෙන්) අභිවෘද්ධියටද (මාර්ගයෙන්) වැඩීමටද (නිර්වාණයෙන්) විපුල බවටද පැමිණෙන්නහුය,

**5.** මහණෙනි, ගමට හෝ නියම්ගමට හෝ නුදුරෙහි මහත් සල්වනයක් වෙයි. ඒ සල් වනයද සල් ගස් දූෂණය කරන පිළිලයෙන් ගැවසුනේය. ඒ සල් වනයට යහපත කැමැත්තාවූ හිත කැමැත්තාවූ නිර්භය බව කැමැත්තාවූ කිසියම් පුරුෂයෙක් තෙම පහළවන්නේද හෙතෙම වක්වූ ඕජාව ගලා බස්නාවූ යම් ඒ තරුණ සල්පැල වෙත්ද, ඔවුන් සැස පිටතට දමන්නේද, ඇතුල් සල්වනය මනාව ශුද්ධ කරන්නේද, සෘජුව හටගත්තාවූ මනාව හටගත්තාවූ යම් ඒ තරුණ සල්පැල වෙත්ද, ඔවුන් මනාකොට වඩන්නේද, මහණෙනි, මෙසේ ඇති කල්හි ඒ සල්වනය වෘද්ධියටද වැඩීමටද විපුල බවටද පැමිණෙන්නේය.

"මහණෙනි, එපරිද්දෙන්ම තෙපිත් අකුසලය දුරු කරව් නම්, කුසල ධර්මයන්හි යෙදෙව් නම්, එසේ ඇති කල්හි තෙපිදු මේ ශාසනයෙහි වෘද්ධියටද වැඩීමටද විපුල බවටද පැමිණෙන්නාහුය.

**6.** "මහණෙනි, පෙර වූවක් කියමි. මේ සැවැත් නුවරම වෙදෙහිකා නම්වූ ගෘහණියක් වූවාය. මහණෙනි, 'වෙදෙහිකා ගෘහපතිනිය, ප්‍රිය වචන කියන්නීය, උඩඟු නොවූවාය, සංසුන් සිත් ඇත්තීය'යි වෙදෙහිකා ගෘහපතිනියගේ මෙබඳුවූ ගුණ කීර්ති ශබ්දයක් පළව ගියේය.

"මහණෙනි, වෙදෙහිකා නම් ගෘහණියගේ දක්ෂවූ අලස නුවූ හොඳින් වැඩපල කරන්නාවූ කාලි නම් දාසියක් වූවාය. මහණෙනි එකල්හි කාලි නම් දාසියට මෙබඳු අදහසක් විය. වෙදෙහිකා නම් ගෘහපතිනිය ප්‍රිය වචන කියන්නීය. උඩඟු නොවූවාය. සංසුන් සිත් ඇත්තීය'යි මාගේ ආර්යාව පිළිබඳව කීර්ති රාවයක් පැතිර ඇත්තේය. කිමෙක්දෝ මාගේ ආර්යාව තමා තුළ ඇත්තාවූම කොපය පහළ නොකරන්නීද, කෝපය නැති නිසාම කෝපයක් පහළ නොකරන්නීද, නැතහොත් හොඳින් මා වැඩපල කරන නිසා තමා තුළ ඇති කෝපය පහළ නොකරන්නීද, අධ්‍යාත්මයෙහි කොපයද නැති නිසා පහළ නොකරන්නීද කියා මම ආර්යාව විමසන්නෙම් නම් යෙහෙකැ'යි සිතුවාය.

"මහණෙනි, ඉක්බිති කාලි දාසිතොම දවල්වී අවදිවූවාය. මහණෙනි, එකල්හි වෙදෙහිකා ගෘහපතිනිය කාලී දාසියට මෙසේ කීවාය. 'බොල කාලිය,' 'ඇයි? ආර්යාවෙනි. කුමක් නිසා දවල්ව නැගිට්ටෙහිද?' 'ආර්යාවෙනි කිසිත් නැත.' 'බොල පව්කාරිය, කිසිත් නැත්නම් දවල්වී අවදි වූයේ ඇයිදැ'යි කියා කෝප වූවා නොසතුටු සිත් ඇත්තී මුහුණ හකුළුවා ගත්තාය.

"මහණෙනි, ඉක්බිති කාලි නම් දාසියට මෙබඳු අදහසක් විය. 'මාගේ ආර්යා තොමෝ තමා කෙරෙහි ඇත්තාවූම කොපය පහළ නොකරන්නීය. නැත්තාවූ කොපයක් නොවේ. මා විසින්ම වැඩපළ හොඳින් කරනලද හෙයින් මාගේ ආර්යා තොමෝ තමා කෙරෙහි ඇත්තාවූම කොපය පහළ නොකරන්නීය, නැත්තාවූ කොපයක් නොවේ. මම තවදුරටත් ආර්යාව විමසන්නෙම් නම් යෙහෙක' කියායි. මහණෙනි, ඉක්බිති කාලී දාසි තොමෝ බොහෝ දහවල්වී නැගිට්ටාය. මහණෙනි, ඉක්බිති වෙදෙහිකා ගෘහපතිනිය කාලී දාසියට මෙය කීවාය. 'බොල

කාලිය,’ ‘කිමෙක්ද? ආර්යාවෙනි,’ බොල කුමට ඉතා දවල්වී නැගිට්ටෙහිදැ’යි ඇසීය. ‘ආර්යාවෙනි, කිසිත් නැත.’ ‘බොල කාලකන්නිය, කිසිවක් නැත්නම් වඩාත් දවල්වී අවදි වූයේ කුමටදැ’යි කෝප වූවා, නොසතුටු සිත් ඇත්තී නොසතුටු වචන කීවාය.

“මහණෙනි, ඉක්බිති කාලි නම් දාසියට මෙබඳු සිතක් විය. ‘මාගේ ආර්යා තොමෝ තමා කෙරෙහි ඇත්තාවූම කෝපය පහළ නොකරන්නීය. නැති කෝපයක් නොවේ. මා විසින් මේ වැඩපල මනාව කරනලද හෙයින් මාගේ ආර්යා තොමෝ තමා කෙරෙහි ඇත්තාවූම කොපය පහළ නොකරන්නීය. නැතිවූවක් නොවේ. මම වැඩියක්ම ආර්යාව විමසන්නෙම් නම්, යෙහෙකැ’යි කියායි.

“මහණෙනි, ඉක්බිති කාලී දාසි තොමෝ තවත් වඩා දහවල්වම අවදි වූවාය. මහණෙනි, එකල්හි වෙදෙහිකා නම් ගෘහපතිනිය, කාලි දාසියට මෙසේ කීවාය. ‘එම්බල කාලිය, ‘කිමෙක්ද ආර්යාවෙනි,’ ‘කිමෙක්ද, එම්බල කාලිය, තී ඉතා දහවල්වී අවදිවූයේ කවර හෙයින්ද? ‘ආර්යාවෙනි, කිසිවක් නැතැයි’ කීය. ‘බොල, පව්ටු දාසිය, කිසිවක් නැත්නම් කවර හෙයින් ඉතා දහවල්වී නැගිට්ටෙහිදැ’යි කිපී දොරපොල්ල ගෙන හිසට පහරක් දුන්නාය. හිස පැලුනේය. මහණෙනි, කාලි නම් දාසිය පැලුනු හිසින් ගලන්නාවූ ලෙයින් යුක්තව අසල් වැසියන්හට මෙසේ නුගුණ කීවාය. ‘ආර්යාවෙනි, ප්‍රිය වචන ඇති ස්ත්‍රියගේ වැඩක හැටි බලව්, උඩඟුනොවූ තැනැත්තියකගේ වැඩක හැටි බලව්, සංසුන් සිත් ඇත්තියකගේ වැඩක හැටි බලව්, එක් දාසියක් දහවල්වී නැගිටියායයි කිපී නොසතුටු සිත් ඇතිව, දොරපොල්ල ගෙන හිසට පහරදී පලන්නේදැ’යි (කීවාය.)

“මහණෙනි, ඉන් පසු කාලයෙහි වෙදෙහිකා ගෘහපතිනිය සම්බන්ධයෙන්, වෙදේහිකා ගෘහපතිනිය නපුරුය, වෙදෙහිකා ගෘහපතිනිය උඩඟුය, වෙදෙහිකා ගෘහපතිනිය දරුණුයයි ලාමකවූ අපකීර්තියක් පැනනැංගේය.

"මහණෙනි, එපරිද්දෙන්ම මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් යම්තාක් ඔහුට අමනාපවූ වචන අසන්ට නොලැබෙද්ද ඒතාක් ඉතා යහපත් වෙයි. ඉතා යටහත් පැවතුම් ඇත්තේ වෙයි. ඉතා සංසුන් පැවතුම් ඇත්තේ වෙයි. මහණෙනි, යම් හෙයකින් භික්ෂුවහට අමනාපවූ වචන අසන්ට ලැබේද එකල්හිම යහපත් භික්ෂුවකැයි යටත් පැවතුම් ඇති භික්ෂුවකැයි ශාන්තවූ භික්ෂුවකැයි දත යුත්තේය.

7. "මහණෙනි, යම් භික්ෂුවක් සිවුරු ආහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර හෙතුකොට සුවච වේද, සුවච බවට පැමිණේද ඔහු සුවචයෙකැයි මම නොකියමි. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ මහණ තෙම ඒ චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර නොලබන්නේ සුවච නොවෙයි, සුවච බවට නොපැමිණෙයි.

"මහණෙනි, යම්කිසි භික්ෂුවක් ධර්මයම සලකමින්, ධර්මයම ගරුකරමින්, ධර්මයම පුදමින් සුවචවේද, සුවච බවට පැමිණේද, මම ඒ භික්ෂුව සුවචයයි කියමි. මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ධර්මයම සලකමින්, ධර්මයම ගරු කරමින්, ධර්මයම පුදමින් සුවච වන්නෙමි. සුවච බවට පැමිණෙන්නෙමියි මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

"මහණෙනි, කල්හි හෝ නොකල්හි හෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදුව හෝ රළුව හෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ මෛත්‍රී සහගත සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ අන්‍යයන් තොපට කියන්නාවූ මේ වචන පසක් වෙත්. මහණෙනි, අන්‍යයෝ තොපට කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ කියන්නාහුද, මහණෙනි, අන්‍යයෝ තොපට මෘදුව හෝ රළුව හෝ කියන්නාහුද, මහණෙනි, අන්‍යයෝ තොපට අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෛත්‍රී සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ කියන්නාහුද එහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. අපගේ සිත නොපෙරළේවා. ලාමක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වචන නොකියන්නෙමු. අනුකම්පාවෙන් යුක්තව මෛත්‍රී සහගත සිත් ඇතිව නොකිපි සිත් ඇතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරවා වාසය කරන්නෙමු. මුළු ලෝකයම ඒ මෛත්‍රී චිත්තයාගේ අරමුණ කොට මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ද්වේෂ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්තව වාසය කරන්නෙමුයි, මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු

8. "මහණෙනි යම්සේ පුරුෂයෙක් තෙම උදැල්ලක් හා කුඩයක් ගෙන එන්නේය. හෙතෙම "මම මේ මහ පොළොව නොපොළොවක් කරමි"යි කියන්නේය. හෙතෙම මහ පොළොව නොපොළොවක් වේවා, නොපොළොවක් වේවා යි කියමින් ඒ ඒ තැන සාරන්නේය. ඒ ඒ තැන පස් විසුරු වන්නේය. ඒ ඒ තැන කාරා දමන්නේය. ඒ ඒ තැන මුත්‍ර කරන්නේය. මහණෙනි, කුමක් සිතන්නහුද, ඒ පුරුෂයා මේ මහපොළොව නොපොළොවක් කරන්නේයයි සිතන්නහුද?"

"ස්වාමීනි, එසේ නොසිතන්නෙමු. ඊට හේතු කවරේද? ස්වාමීනි, මේ මහා පෘථිවිය වනාහි ගැඹුරුය. අති විශාලය, ඒ පෘථිවිය නොපොළොවක් කරන්නට නොහැකිය. ඒ පුරුෂයා නම් ක්ලාන්තයටද වෙහෙසටද හිමි වන්නේය."

"මහණෙනි, කල්හි හෝ නොකල්හි හෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදුව හෝ රළුව හෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ මෛත්‍රී සහගත සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ අන්‍යයන් තොපට කියන්නාවූ මේ වචන පසක් වෙත්. මහණෙනි, අන්‍යයෝ තොපට කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෘදුව හෝ රළුව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෛත්‍රී සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ කියන්නාහුද, එහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. 'අපගේ සිත නොපෙරළේවා ලාමක

වචන නොකියන්නෙමු. අනුකම්පාවෙන් යුක්තව මෛත්‍රී සහගත සිත් ඇතිව නොකිපි සිත් ඇතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරුවා වාසය කරන්නෙමු. මුළු ලෝකයම ඒ මෛත්‍රී චිත්තයාගේ අරමුණ කොට මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ද්වේෂ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්තව වාසය කරන්නෙමු'යි, මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

9. "මහණෙනි, පුරුෂයෙක් තෙම ලාකිරි හෝ කහපාට හෝ නිල්පාට හෝ මදටිය පාට හෝ ගෙන එන්නේය. හෙතෙම මෙසේ කියන්නේය. මම මේ අහසෙහි රූපයන් අඳින්නෙමි. රූප පහළකරන්නෙමි. මහණෙනි, ඒ පුරුෂයා මේ ආකාශයෙහි රූප අඳින්නේය. රූප පහළකරන්නේයි සිතන්නහුද?

"ස්වාමීනි, එසේ නොසිතන්නෙමු. ඊට හේතු කවරේද, මේ ආකාශය රූප රහිතය, දැකීම් රහිතය, එහි රූප ඇඳීම රූප පහළකිරීම පහසු නොවෙයි. ඒ පුරුෂයා නම් වෙහෙසීමට දුකට කොටස්කාරයෙක් වන්නේය."

"මහණෙනි, කල්හි හෝ නොකල්හි හෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදුව හෝ රළුව හෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ මෛත්‍රී සහගත සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ අන්‍යයන් තොපට කියන්නාවූ මේ වචන පසක් වෙත්. මහණෙනි, අන්‍යයෝ තොපට කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෘදුව හෝ රළුව හෝ කියන්නාහුද මහණෙනි, තොපට අන්‍යයෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෛත්‍රීසිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ කියන්නාහුද, එහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. 'අපගේ සිත නොපෙරළේවා, ලාමක වචන නොකියන්නෙමු අනුකම්පාවෙන් යුක්තව මෛත්‍රී සහගත සිත් ඇතිව නොකිපි සිත් ඇතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරුවා වාසය කරන්නෙමු, මුළු ලෝකයම ඒ මෛත්‍රී චිත්තයාගේ අරමුණ කොට මහත්වූ මහත් බවට

ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ද්වේෂ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්තව වාසය කරන්නෙමු'යි, මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුය.

**10.** "මහණෙනි, පුරුෂයෙක් ඇවිලෙන්නාවූ තණසුලක් ගෙන එන්නේය. හෙතෙම මම මේ ඇවිලෙන්නාවූ තණ සුලෙන් ගංගානම් නදිය උණුකරන්නෙමි, කකාරවන්නෙමියි කියන්නේය. මහණෙනි, ඒ පුරුෂයා ඇවිලගත්තාවූ තණ සුලෙන් ගංගානම් නදිය උණුකරන්නේය කකාරවන්නේ යයි සිතන්නහුද?"

"ස්වාමීනි, එසේ නොසිතන්නෙමු. ඊට හේතු කවරේද, ස්වාමීනි, ගංගා නදිය ගැඹුරුය, අප්‍රමාණය, ගංගා නදිය ඇවිල ගත්තාවූ තණ සුලෙන් උණු කරන්නට කකාරවන්නට පහසු නොවේ. ඒ පුරුෂයා නම් වෙහෙසට දුකට කොටස්කාරයෙක් වන්නේය."

"මහණෙනි, කල්හි හෝ නොකල්හි හෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදුව හෝ රළුව හෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ මෛත්‍රී සහගත සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ අන්‍යයන් තොපට කියන්නාවූ මේ වචන පසක් වෙත් මහණෙනි, අන්‍යයෝ තොපට කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහුද මහණෙනි, තොපට අන්‍යයෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෘදුව හෝ රළුව හෝ කියන්නාහුද මහණෙනි, තොපට අන්‍යයෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෛත්‍රී සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ කියන්නාහුද, එහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. 'අපගේ සිත නොපෙරළේවා, ලාමක වචන නොකියන්නෙමු. අනුකම්පාවෙන් යුක්තව මෛත්‍රී සහගත සිත් ඇතිව නොකිපි සිත් ඇතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරවා වාසය කරන්නෙමු. මුළු ලෝකයම ඒ මෛත්‍රී චිත්තයාගේ අරමුණ කොට මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ද්වේෂ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්තව වාසය කරන්නෙමු'යි මහණෙනි, තොපවිසින් මෙසේ හික්මිය යුතුය.

11. "මහණෙනි, මදින ලද්දාවූ මනාව මදින ලද්දාවූ මෘදුවූ පුළුනක් වැනිවූ සර සර යන ශබ්ද නැති බර බර යන ශබ්ද නැති බළල් සමින් කළ පසුම්බියක් වෙයි. ඉක්බිති දණ්ඩක් හෝ ගල්කැටයක් හෝ ගෙන පුරුෂයෙක් එන්නේය. හෙතෙම මෙසේ කියන්නේය, 'මම මේ මදිනලද මොනවට මදිනලද හාත්පස මදිනලද මෘදුවූ පුළුන් වැනිවූ සර සර යන ශබ්ද නැති බර බර යන ශබ්ද නැති බළල් සමින් කළ පසුම්බිය දණ්ඩෙන් හෝ ගල්කැටයෙන් හෝ සරසර යන ශබ්ද ඇත්තක් කරන්නෙමි. බර බර යන ශබ්ද ඇත්තක් කරන්නෙමි'යි (කියයි) මහණෙනි, ඒ පුරුෂයා මදිනලද මනාව මදිනලද හාත්පස මදිනලද මෘදුවූ ශබ්ද නැති පුළුන් වැනිවූ සර සර බර බර යන ශබ්ද නැති මේ බළල් සමින් කළ පසුම්බිය දණ්ඩකින් හෝ කැටකින් හෝ සර සර යන ශබ්ද ඇත්තක් කරන්නේද? බර බර යන ශබ්ද ඇත්තක් කරන්නේද?" "ස්වාමීනි, මෙය එසේ නොකළ හැකිය. ඊට හේතු කවරේද? ස්වාමීනි, ඒ බළල් සමින් කළ පසුම්බිය මදිනලද මනාව මදිනලද හාත්පස මදිනලද, මෘදුවූ පුළුනක් වැනිවූ සර සර යන ශබ්ද නැති බර බර යන ශබ්ද නැති දෙයක් වන්නේය. එය කැටකින් හෝ දණ්ඩකින් හෝ සර සර යන ශබ්ද ඇත්තක් කරන්නට බර බර යන ශබ්ද ඇත්තක් කරන්නට පහසු නොවන්නේය. ඒ පුරුෂයා නම් වෙහෙසට දුකට කොටස්කාරයෙක් වන්නේය."

"මහණෙනි, කල්හි හෝ නොකල්හි හෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදුව හෝ රළුව හෝ අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ මෛත්‍රී සහගත සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ අන්‍යයන් තොපට කියන්නාවූ මේ වචන පසක් වෙත් මහණෙනි, තොපට අන්‍යයෝ කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ කියන්නාහුද මහණෙනි, තොපට අන්‍යයෝ මෘදුව හෝ රළුව හෝ කියන්නාහුද මහණෙනි, අන්‍යයෝ තොපට අර්ථ සහිතව හෝ අනර්ථ සහිතව හෝ කියන්නාහුද, මහණෙනි, තොපට අන්‍යයෝ මෛත්‍රී සිත් ඇතිව හෝ කිපි සිත් ඇතිව හෝ කියන්නාහුද, එහි තොප විසින්

මෙසේ හික්මිය යුතුයි. 'අපගේ සිත නොපෙරළේවා, ලාමක වචන නොකියන්නෙමු අනුකම්පාවෙන් යුක්තව මෛත්‍රී සහගත සිත් ඇතිව නොකිපි සිත් ඇතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරුවා වාසය කරන්නෙමු. මුළු ලෝකයම ඒ මෛත්‍රී චිත්තයාගේ අරමුණකොට මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ද්වේෂ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්තව වාසය කරන්නෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුය.

**12.** "මහණෙනි, පහත් ක්‍රියා කරන්නාවූ සොරු දෙපස දඬු ඇති කියතකින් ශරීර අවයව කපන්නාහුද යමෙක් ඒ සිය සිරුර කපන සොරුන් කෙරෙහිද හිත දූෂ්‍ය කරගනී නම් එයින් හෙතෙම මාගේ අවවාදයට අනුව පිළිපදින්නෙක් නොවෙයි. මහණෙනි, එහිදු මෙසේ හික්මිය යුතුයි. 'අපගේ සිත නොපෙරළේවා, ලාමකවූ වචනද නොකියන්නෙමු, හිතානුකම්පා ඇතිව මෛත්‍රී සිත් ඇතිව ඇතුළත තරහ නැතිව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහිද මෛත්‍රී සහගත සිත පතුරුවා වාසය කරන්නෙමු. මුළුලොකයද ඒ මෛත්‍රී සහගත සිතේ අරමුණ කොට විපුලවූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ නිදුක්වූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරන්නෙමු'යි (හික්මිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

"මහණෙනි, තොප මේ කකචූපමොවාද ධර්මය නිතර මෙනෙහි කරව්. මහණෙනි, තෙපි යම් හෙයකින් නොඉවසන්නාවූ අල්ප සාවද්‍යවූ හෝ මහා සාවද්‍යවූ හෝ යම් වචනයක් දක්නහුද?" "නැත, ස්වාමිනී".

"මහණෙනි, එහෙයින් තෙපි මේ කකචූපමොවාද ධර්මය නිතර මෙනෙහි කරව්. ඒ මෙනෙහි කිරීම තොපට බොහෝ කාලයක් මුළුල්ලෙහි වැඩ පිණිසද සැප පිණිසද වන්නේය'යි මේ සූත්‍ර ධර්මය භාග්‍යවතුන් වහන්සේ වදාළහ. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

(පළමුවෙනිවූ කකචූපම සූත්‍රය නිමි.) (3-1)

# 22. අලගද්දූපම සූත්‍රය

1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි (පෙර ගිජුලිහිණියන් නැසූ කුලයෙහි උපන් හෙයින්) ගද්ධබාධි පුබ්බයයි කියනු ලබන අරිට්ඨ නම් භික්ෂුවට මෙබඳුවූ ලාමකවූ වැරදි මතයක් උපන්නේ වෙයි (කෙබඳු මතයක්ද යත්) 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්ම කෙනෙක් ස්වර්ග මොක්ෂ දෙකට අන්තරායකරයයි වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම මෙසේ දනිමි'යි (කියායි.)

ඉක්බිති බොහෝ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් භික්ෂුවට මෙබඳු වැරදි මතයක් පහළවී තිබෙන බව ඇසූහ. එනම්:

'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්මකෙනෙක් ස්වර්ග මොක්ෂ දෙකට අන්තරායකරයයි වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද ධර්මය මම මෙසේ දනිමි'යි (කියායි.)

ඉක්බිති ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් භික්ෂුව යම් තැනෙකද එහි පැමිණියහ. පැමිණ, ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් භික්ෂුවට මෙසේ කීහ. "ඇවැත්වූ අරිට්ඨය, තොපට 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්ම කෙනෙක් ස්වර්ග මොක්ෂ දෙකට අන්තරායකරයයි වදාරණ ලද්දාහුද, ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද ධර්මය මම මෙසේ දනිමි යන පහත්වූ වැරදි මතයක් පහළ වී ඇත්තේය යනු සැබෑදැ'යි විචාළහ."

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්ම කෙනෙක් ස්වර්ග මොක්ෂ දෙකට අන්තරායකරයයි වදාරන ලද්දාහු නම් ඒ ධර්මයෝ අන්තරාය පිණිස නොවෙත් යන ආකාරයෙන්

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ඒ ධර්මය මම දනිමි”යි කීහ.

2. “ඉක්බිති ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් භික්ෂුව ඒ වැරදි මතයෙන් වෙන් කරවනු කැමැත්තාහු මතය විචාරමින් කරුණු කියති, මතයෙහි පිහිටුවමින් කරුණු කියති. ඊට හෙතු අසමින් කරුණු කියති.

“ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නොකියව, ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නොකියව, භාග්‍යවතුන් වහන්සේට දෝෂාරෝපණය නොකරව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ. ඇවැත් අරිට්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ස්වර්ග මොක්ෂ දෙකට අන්තරායකර ධර්මයෝ අන්තරායකර ධර්මයෝයයි වදාරණ ලදහ. ඔවුහු සේවනය කරන්නාහට අන්තරාය පිණිස වෙත්.

‘භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ස්වල්ප සැපක් ඇත්තාහ. බොහෝ දුක් හා බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනවම බහුලයයි වදාරන ලදී.

“භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඇට කැබැල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බහුලයයි වදාරන ලදී.

“භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ මස් කැටියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

“භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගිනිසුලකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

“භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඟුරු වළකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගසක ගෙඩියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනවම බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ කැත්ත හා මස් ලොඹුවකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ආයුධයක් හා හුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ වන්නේ යයි වදාරනලදැයි" (අවවාද කළාහුය.)

මෙසේද ඒ භික්ෂූන් විසින් මතය විචාරමින් කරුණු කියනු ලැබූ මතයෙහි පිහිටුවමින් කරුණු කියනු ලැබූ ඊට හෙතු අසමින් කරුණු කියන ලැබූ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමි'යි යන ඒ ලාමක වැරදි මතයම තරයේ අල්ලාගෙන ව්‍යවහාර කරයි.

3. යම් හෙයකින් ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව ඒ ලාමක වැරදි මතයෙන් වෙන් කරවන්නට අසමර්ථ වූවාහුද,

එවිට ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

"ස්වාමීනි, ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමි' යන මෙබඳු ලාමක වැරදි මතයක් උපන්නේය. ස්වාමීනි, අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ අන්තරායකර ධර්මකෙනෙක් වදාරන ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නා හට අන්තරායකර නොවෙත්, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ඒ ධර්මය මම ඒ ආකාරයෙන් දනිමි, යන ලාමක වැරදි මතයක් උපන් බව ඇසීමු. ස්වාමිනි, ඉක්බිති අප ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව යම්තැනකද, එතැනට පැමිණියෙමු පැමිණ, අරිට්ඨ භික්ෂුවට මෙසේ කීයෙමු. "ඇවැත් අරිට්ඨයෙනි, තොපට භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායක ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නා හට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමි යන මෙබඳු වැරදි ලාමක මතයක් පහළවී ඇත්තේය යනු සැබෑදැයි විචාළෙමු."

"ස්වාමීනි මෙසේ කී කල්හි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව අපට මෙසේ කීයේය. භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්මකෙනෙක් වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමි'යි (කියායි.)

'ස්වාමීනි, ඉක්බිති අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව ඒ ලාමක වැරදි මතයෙන් වෙන් කරවනු පිණිස මතය විචාරමින් කරුණු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කීයෙමු, මතයෙහි පිහිටුවමින් කරුණු කියෙමු. ඊට හේතු අසමින් කරුණු කීයෙමු. ඇවැත්නි, අරිට්ඨයෙනි, මෙසේ නොකියව. ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නොකියව, භාග්‍යවතුන් වහන්සේට දොෂාරොපනය නොකරව. භාග්‍යවතුන් වහන්සේට දොස් කීම හොඳ නැත. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ.

"භාග්‍යවතුන් වහන්සේ කාමයෝ ඇට කැබැල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බහුලයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ මස් කැටියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගිනිසුලකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඟුරු වළකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගසක ගෙඩියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ කැත්ත හා මස් ලොඹුවකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ,

බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ආයුධයක් හා හුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බොහෝයයි වදාරනලදී.

'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ වන්නේ යයි වදාරනලදැ"යි (අවවාද කෙළෙමු.)

"ස්වාමීනි, අප විසින් මෙසේද මතය විචාරමින් කරුණු කියනු ලැබූ මතයෙහි පිහිටුවමින් කරුණු කියනු ලැබූ හේතු විචාරමින් කරුණු කියනු ලැබූ, අරිට්ඨ භික්ෂුව 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදාරන ලද්දාහුද, ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමියි' යන ලාමක මතය තරකොට අල්ලාගෙන ඊට ඇතුළත්ව ව්‍යවහාර කරයි. ස්වාමීනි, යම් හෙයකින් අරිට්ඨ භික්ෂුව මේ ලාමක වැරදි මතයෙන් වෙන් කරවන්නට බැරිවූයෙමුද එහෙයින් අපි මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකරන්නෙමු."

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවූහ. 'මහණ, මෙහි එව, මගේ වචනයෙන් 'ඇවැත් අරිට්ඨය, ශාස්තෲන්වහන්සේ තොප කැඳවති'යි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව කැඳවාගෙන එව"යි කීහ. "එසේය ස්වාමීනි"යි කියා ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට උත්තරදී ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව යම් තැනකද එහි ගියේය. ගොස් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුවට, 'ඇවැත්නි අරිට්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ තොප කැඳවන්නාහ'යි කීවේය. 'එසේය ඇවැත්නි'යි කියා ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව ඒ භික්ෂූන් වහන්සේට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණියේය. පැමිණ

භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක වාඩිවිය. එකත්පසෙක උන් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'අරිට්ඨය, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය මම එපරිද්දෙන් දනිමි' යන මෙබඳු ලාමක දෘෂ්ටියක් තට උපන්නේය යනු සැබෑදැ"යි ඇසූහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් අන්තරායික ධර්මකෙනෙක් වදාරනලද්දාහුද, ඒ ධර්මයෝ සෙවනය කරන්නාහට අන්තරාය පිණිස නොපවත්නාහුයයි මම මේ ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කළ ධර්මය දනිමි"යි කීය.

"හිස් පුරුෂය, මා කාහට මෙබඳු ධර්මයක් දෙශනා කළ බව තෝ දන්නෙහිද, මා විසින් නොයෙක් ආකාරයෙන් අන්තරායකර ධර්ම අන්තරායකරයයි කියන ලද්දේ නොවේද? සේවනය කරන්නාහට ඒ ධර්මයෝ අන්තරාය පිණිස වෙත්මැයි.

"මා විසින් කාමයෝ ස්වල්ප සැපක් ඇත්තාහ. බොහෝ දුක් හා බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනවම බහුල යයි වදාරනලදී.

"මා විසින් කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බහුලයයි වදාරනලදී.

"මා විසින් කාමයෝ මස්කැටියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ යයි වදාරනලදී.

"මා විසින් කාමයෝ ගිනිසුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ යයි වදාරනලදී.

"මා විසින් කාමයෝ අඟුරුවළකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

"මා විසින් කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදිනවම මෙහි බොහෝ යයි වදාරනලදී.

"මා විසින් කාමයෝ ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ගසක ගෙඩියකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බොහෝ යයි වදාරනලදී.

"මා විසින් කාමයෝ කැත්ත හා මස්ලොඹුවකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනව මෙහි බොහෝයයි වදාරනලදී.

"මා විසින් කාමයෝ ආයුධයක් හා හුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බොහෝයයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ වන්නේයයි වදාරනලදී.

මෙසේ තිබියදීත් හිස් පුරුෂය, තෝ තමා වරදවා ගත් මතයෙන් අපටද දොස් නගන්නෙහිය, තමාද නැසෙන්නෙහිය, බොහෝ පව්ද රැස්කරගන්නෙහිය. හිස් පුරුෂය, තොපට මෙය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවත්නේය."

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළහ.

"මහණෙනි, මේ තොපි කුමක් සිතව්ද, ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුවට මේ ශාසනයෙන් ලබන ඥානය නමැති ගින්නෙහි උණුසුමවත් ඇත්තේද?

"ස්වාමීනි, කෙසේ නම් වන්නේද? ස්වාමීනි, එසේ නොවන්නේය."

මෙසේ කී කල්හි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව නිශ්ශබ්ද වූයේ මකුවූයේ කඳ නමා ගත්තේ මුහුණ පහතට හරවා ගත්තේ කල්පනා කරන්නේ කිසිවක් සිතාගත නොහැකිව හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අරිට්ඨ භික්ෂුව නිශ්ශබ්දව, මකුව, කඳ නමාගෙන මුහුණ පහතට හරවාගෙන කල්පනා කරමින් කිසිවක් නොවැටහී සිටිනු දැන, අරිට්ඨ භික්ෂුවට මෙසේ කීහ. "හිස් පුරුෂය, තෝ මේ තොපගේ ලාමක වැරදි මතයෙන් ප්‍රකට වන්නෙහිය. මම භික්ෂූන් විචාරන්නෙමි"යි කියා, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගෙන් මෙසේ විචාළහ. "මහණෙනි, මේ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව යම්සේ තමා වරදවා ගත් මතයෙන් අපටත් දොස් නගයිද, තමාත් වැනසෙයිද, බොහෝ අකුසලක් රැස් කර ගනියිද, එබඳුවූ ධර්මයක් මා දෙශනා කළ බව තොප දන්නහුද?"

"නැත ස්වාමීනි, අපට වනාහි භාග්‍යවතුන් වහන්සේ නොයෙක් පරිද්දෙන් අන්තරායකර ධර්ම අන්තරායකරයයි දෙශනා කරන ලදහ. ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස වෙත්මය.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ස්වල්ප සැපක් ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනවම බහුලයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඇට කැබැල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බහුලයයි වදාරනලදි.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ මස් කැටියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගිනිසුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඟුරු වළකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ගසක ගෙඩියකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බොහෝයයි වදාරනලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ කැත්ත හා මස් ලොඹුවකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ආයුධයක් හා හුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනව බොහෝයයි වදාරන ලදී.

"භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ වන්නේය"යි වදාරන ලදී.

**6.** "යහපත මහණෙනි, මා දෙසූ ධර්මය තොප දන්නා සැටි ඉතා මැනවි. මා විසින් තොපට නොයෙක් පරිද්දෙන් අන්තරායකර ධර්ම අන්තරායකරයයි දෙසන ලදී. ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස පවතිත්.

"මා විසින් කාමයෝ ස්වල්ප සැපක් ඇත්තාහ, බොහෝ දුක් හා බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනවම බහුල යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ඇට කැබැල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනවම බහුලයයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ මස් කැටියකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ගිනිසුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ අඟුරු වළකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ මස් සිහිනයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ගසක ගෙඩියකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ කැත්ත හා මස්ලොඹුවකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ ආයුධයක් හා හුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"මා විසින් කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ, බොහෝ වෙහෙස ඇත්තාහ, ආදීනවම මෙහි බොහෝ යයි වදාරන ලදී.

"එසේද වුවත් මේ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂුව තමා වරදවාගත් මතයෙන් අපටද දොස් නගයි, තමාත් වැනසෙයි, බොහෝ අකුසලුත් රැස්කරගනියි. ඒ වනාහි ඒ හිස් පුරුෂයා හට දීර්ඝ කාලයක් අහිත පිණිස, දුක් පිණිස පවත්නේය.

"මහණෙනි, හෙතෙම ක්ලෙශ කාමයන්ගෙන් වෙන්ව කාම හැඟීම්වලින් වෙන්ව, කාම කල්පනාවලින් වෙන්ව වස්තු කාමයන් සේවනය කරන්නේය යන මේකාරණය සිදු නොවන්නකි.

7. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ සූත්‍ර ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අද්භූතධර්ම, වෙදල්ල යන ධර්ම ඉගෙනගන්නාහුය. ඔහු ඒ ධර්ම ඉගෙන ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් සලකා නොබලන්නාහුය. නුවණින් අර්ථය සලකා නොබලන්නාවූ ඔවුනට එය හොඳින් නොවැටහෙයි. ඔව්හු අන්‍ය වාදවලට දොස් දැක්වීමේ හෝ තමන්ගේ වාදය අන්‍යයන්ගේ දෝෂාරොපනයෙන් නිදහස් කරගැනීමේ හෝ අදහසින් ධර්මය උගනිති. යම්කිසි ප්‍රයෝජනයක් සඳහා ධර්මය උගනිත් නම් ඒ ප්‍රයෝජනයද නොලබත්. නොමනාව ගන්නා ලද්දාවූ ඔවුන්ගේ ඒ ධර්මය බොහෝ කාලයක් මුළුල්ලෙහි ඔවුනට අවැඩ පිණිස දුක් පිණිස පවතී. ඊට හේතු කවරේද යත්? මහණෙනි, ධර්මය නොමනාව ගත් බැවිනි.

"මහණෙනි, සර්පයින්ගෙන් ප්‍රයෝජන ඇත්තාවූ සර්පයන් සොයන්නාවූ සර්පයන් සෙවීමෙහි හැසිරෙන්නාවූ පුරුෂයෙක් තෙම මහත් සර්පයෙකු දක්නේය. හෙතෙම ඒ සර්පයා කඳෙන් හෝ නගුටින් හෝ අල්වාගන්නේය. ඒ සර්පතෙම ආපසු කරකැවී ඔහුගේ අත හෝ බාහුව හෝ මින් පිටත් අන් අඟපසඟක් හෝ දෂ්ට කරන්නේය. හෙතෙම ඒ හේතු කොටගෙන මරණයට හෝ පැමිණෙන්නේය. මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ සර්පයා වරදවා අල්වාගත් හෙයිනි.

"මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක,

අද්භූතධර්ම, වෙදල්ල යන ධර්ම ඉගෙන ගන්නාහුය. ඔව්හු ඒ ධර්මය ඉගෙන ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් සලකා නොබලන්නාහුය. නුවණින් අනර්ථය සලකා නොබලන්නාවූ ඔවුනට එය හොඳින් නොවැටහෙයි. ඔව්හු අන්‍ය වාදවලට දෙස් දැක්වීමේ හෝ තමන්ගේ වාදය අන්‍යයන්ගේ දෝෂාරෝපයෙන් නිදහස් කරගැනීමේ හෝ අදහසින් ධර්මය උගනිති. යම්කිසි ප්‍රයෝජනයක් සඳහා ධර්මය උගනිත් නම් ඒ ප්‍රයෝජනයද නොලබත්. නොමනාව ගන්නා ලද්දාවූ ඔවුන්ගේ ඒ ධර්මය බොහෝ කාලයක් මුලුල්ලෙහි ඔවුනට අවැඩ පිණිස දුක් පිණිස පවතී. ඊට හේතු කවරේද යත්? මහණෙනි, ධර්මය නොමනාව ගත් බැවිනි.

8. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෝ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අද්භූත ධර්ම, වෙදල්ල යන ධර්ම පුහුණු කෙරෙති. ඔව්හු ඒ ධර්මය ඉගෙන එහි අර්ථය නුවණින් සලකා බලති. ඒ ධර්මයන් නුවණින් සලකා බලන්නාවූ ඔවුන්හට ඒ ධර්මය හොඳින් වැටහේ. ඔව්හු අන්‍ය වාදවලට දෝෂාරෝපනය කිරීම හෝ තමන්ගේ වාදය අන්‍යයන්ගේ දොෂාරොපනවලින් නිදහස් කරගැනීමෙන් හෝ අදහසින් ධර්මය නොම උගනිති. යම්කිසි ප්‍රයෝජනයක් සඳහා ධර්මය උගනිත් නම් ඔව්හු ඒ ප්‍රයෝජනයද ලබති. ඊට හේතු කවරේද? ධර්මය මනාව ගන්නාලද හෙයිනි.

"මහණෙනි, සර්පයන්ගෙන් ප්‍රයෝජන ඇත්තාවූ, සර්පයන් සොයන්නාවූ සර්පයන් සෙවීමෙහි හැසිරෙන්නාවූ පුරුෂයෙක් තෙම මහත් සර්පයෙකු දක්නේය. ඔහු ඒ සර්පයා එළු කුරයක් වැනි දණ්ඩකින් හොඳට තදකර ගන්නේය. තද කොට බෙල්ලෙන් අල්ලාගන්නේය. ඒ සර්පයා ඒ පුරුෂයාගේ අතක් හෝ බාහුව හෝ අන්‍ය අවයවයක් හෝ දරණවැලින් වෙලාගත් නමුත් එයින් හෙතෙම මරණයට හෝ මරණය සමාන දුකකට හෝ නොපැමිණෙන්නේය. ඊට හේතු කවරේද? සර්පයා හොඳින් අල්ලාගත් හෙයිනි.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෝ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අද්භූත ධර්ම, වෙදල්ල යන ධර්ම පුහුණු කෙරෙති. ඔව්හු ඒ ධර්මය ඉගෙන එහි අර්ථය නුවණින් සලකා බලති. ඒ ධර්මයන් නුවණින් සලකා බලන්නාවූ ඔවුන්හට ඒ ධර්මය හොඳින් වැටහේ. ඔව්හු අන්‍ය වාදවලට දොෂාරෝපනය කිරීම හෝ තමන්ගේ වාදය අන්‍යයන්ගේ දෝෂාරොපනවලින් නිදහස් කරගැනීමේ අදහසින් හෝ ධර්මය නොම උගනිති. යම්කිසි ප්‍රයෝජනයක් සඳහා ධර්මය උගනිත් නම් ඔව්හු ඒ ප්‍රයෝජනයද ලබති. ඊට හේතු කවරේද? ධර්මය මනාව ගන්නාලද හෙයිනි.

"මහණෙනි, මේ නිසා මා දෙශනා කළ යම් ධර්මයක අර්ථය දන්නාහු නම් එය එසේ දරව්, යම් ධර්මයක අර්ථය නොදන්නාහු නම් මගෙන් හෝ යම් දක්ෂ භික්ෂූහු වෙත් නම් ඔවුන්ගෙන් හෝ ඇසිය යුතුය.

**9.** "මහණෙනි, තොපට ධර්මය පහුරකට උපමාකොට දෙසන්නෙමි. එය එතරවීම පිණිසය, ගැනීම පිණිස නොවේ. එය අසව්. මනාකොට මෙනෙහි කරව කියන්නෙමි" "එසේය. ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, දීර්ඝ මාර්ගයක යන්නාවූ පුරුෂයෙක් සැක සහිතවූ භය සහිතවූ මෙතෙර ඇති සැක රහිතවූ භය රහිතවූ එතෙර ඇති මහත් සාගරය වැනි ජලයක් දක්නේය. ඔහුට එයින් එතෙරවීම පිණිස පැදයාහැකි නැවක් හෝ උඩින් යනු සඳහා ඒදණ්ඩක් හෝ නැත්තේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. 'මේ මහා ජලස්කන්ධය විශාලය. එහි මෙතෙර සැක සහිතය. භය සහිතය. එතෙර සැක රහිතය. භය රහිතය. එහා මෙහා යාම සඳහා නැවක්වත් ඒදණ්ඩක්වත් නැත. මම තෘණ ලී දඬු අතු කොළ ඇදගෙන පහුරක් බැඳ ඒ පහුර නිසා අත් පාවලින් පදිමින් සුවසේ එතෙර වන්නෙම් නම් යෙහෙකි' (කියාය) මහණෙනි, ඉක්බිති ඒ පුරුෂ තෙම තෘණ ලීදඬු අතු කොළ

රැස්කොට පහුරක් බැඳගෙන අතින් හා පයින් වෑයම් කරමින් සැපසේ එතෙරට යන්නේය.

"එතෙරට ගියාවූ ඔහුට මෙබඳු අදහසක් වන්නේය. 'මේ පහුර මට බොහෝ උපකාර ඇත්තේය. මම මේ පහුර නිසා අත් පාවලින් උත්සාහ කොට සැපසේ මේ මහ වතුරෙන් එගොඩ වීමි. මේ පහුර හිසෙහි තබාගෙන හෝ කරෙහි තබාගෙන හෝ කැමති තැනකට යන්නෙම් නම් යෙහෙකැ'යි (කියායි.) මහණෙනි, කුමක් සිතව්ද, එසේ කරන්නාවූ ඒ පුරුෂයා ඒ පහුරට නියම කටයුත්ත කළ කෙනෙකැයි සිතන්නාහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, කෙසේ ක්‍රියා කරන්නාවූ ඒ පුරුෂයා ඒ පහුරට නියම කටයුත්ත කළ කෙනෙක් වන්නේද? මහණෙනි, එතෙරවූ ඒ පුද්ගලයාට මෙබඳු කල්පනාවක් වෙයි. 'මේ පහුර මට බොහෝ උපකාරවත් විය. මේ පහුර නිසා මම අතින් පයින් වෑයම් කරමින් සැපසේ එතෙර වීමි. මේ පහුර ගොඩට ඇද දමා හෝ දියෙහි පාකර යවා හෝ කැමති තැනට යන්නෙම් නම් යෙහෙක' (කියායි) මහණෙනි, මෙසේ කරන්නාවූ ඒ පුද්ගලයා වනාහි ඒ පහුරට නියම කටයුත්ත කරන්නෙක් වන්නේය. එසේම මා විසින් තොපට ධර්මය පහුරකට උපමා කොට දෙශනා කරන ලද්දේය. එය එතරවීමට මිස ගැනීමට නොවේ. මහණෙනි, ධර්මය පහුරකට උපමා කොට දෙසනලදැයි දන්නාවූ තොප විසින් ධර්මයෝද දුරු කටයුත්තාහ. අධර්ම ගැන කියනුම කවරේද?

10. "මහණෙනි, මේ දෘෂ්ටි ඇතිවීමේ හේතු සයක් වෙත්, කවර සයක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණු සත් පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු නූගත් පෘථග්ජන තෙම 'මේ රූපය මාගේය, රූපය මම වෙමි, රූපය මාගේ ආත්මයයි දකියි. මේ වෙදනාව මාගේය, වේදනාව මම වෙමි. වේදනාව මාගේ ආත්මයයි දකියි. මේ සංඥාව මාගේය, සංඥාව

මම වෙමි, සංඥාව මාගේ ආත්මයයි දකියි. මේ සංස්කාරය මාගේය, සංස්කාරය මම වෙමි, සංස්කාරය මාගේ ආත්මයයි දකියි. මේ විඤ්ඤාණය මාගේය, විඥාණය මම වෙමි. විඤ්ඤාණය මාගේ ආත්මයයි දකියි. යම් මේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණ හා සිතින් දැනගන්නාලද සිතින් පැමිණෙනලද සිතින් සොයනලද සිත හැසිරෙනලද යමක් වේ නම් එය මගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දකියි. එය ලොකය වෙයි. එය ආත්මය වෙයි. පරලොව නිත්‍යවූ සදාකාලිකවූ විනාශ නොවන්නාවූ ඒ ආත්මය වන්නෙමි. පොළොව ආදී නිත්‍ය දේට සමාන වන්නෙමි යන යම් දෘෂ්ටියක් ඇත්තේද ඒ දෘෂ්ටිය මාගේය, ඒ දෘෂ්ටිය මම වෙමි එය මාගේ ආත්මය'යි දකියි.

11. "මහණෙනි, ආර්යයන් දක්නාවූ, ආර්ය ධර්මයෙහි දක්ෂවූ, ආර්ය ධර්මයෙහි හික්මුණාවූ, සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ උගත් පෘථග්ජන තෙම 'මේ රූපය මාගේ නොවේ. රූපය මම නොවෙමි. රූපය මාගේ ආත්මය නොවේයයි දකියි. මේ වේදනාව මාගේ නොවේ, වේදනාව මම නොවෙමි, වෙදනාව මාගේ ආත්මය නොවේයයි දකියි. මේ සංඥාව මාගේ නොවේ, සංඥාව මම නොවෙමි, සංඥාව මාගේ ආත්මය නොවේයයි දකියි. මේ සංස්කාර මගේ නොවෙයි, සංස්කාර මම නොවෙමි, සංස්කාර මාගේ ආත්මය නොවේයයි දකියි. මේ විඤ්ඤාණය මගේ නොවේ, විඤ්ඤාණය මම නොවෙමි, විඤ්ඤාණය මාගේ ආත්මය නොවේයයි දකියි. යම් මේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු හා සිතින් දැනගන්නා ලද, සිතින් පැමිණෙනලද, සිතින් සොයනලද, සිතින් සිතනලද යමක් වේ නම් එ මගේ නොවේය. ඒ මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේයයි දකියි. එය ලොකය වෙයි. එය ආත්මය වෙයි, ඒ පරලොව නිත්‍යවූ ස්ථිරවූ සදාකාලිකවූ නොපෙරෙලෙන සුලුවූ නිත්‍ය ආත්මය වන්නෙමි. මහපොළොව ආදි නිත්‍ය දේට සමාන වන්නෙමි යන යම් දෘෂ්ටියක් ඇත්තේද, ඒ දෘෂ්ටිය මගේ

නොවේය, එය මම නොවෙමි. ඒ මගේ ආත්මය නොවේය'යි දකියි.

'මෙසේ දක්නාවූ හෙතෙම අධ්‍යාත්ම ස්කන්ධ විනාශවීම ගැන තැති නොගනීය"යි (වදාළේය.)

12. "මෙසේ වදාළ කල්හි එක් භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ ඇසීය. "ස්වාමීනි, බාහිර පිරිකර විනාශවූ කල්හි තැති ගැන්මක් ඇතිවන්නේද?" "මහණ ඇති වන්නේය'යි භාග්‍යවතුන් වහන්සේ වදාළේය.

"මහණ, මෙහි ඇතමෙකුට මෙබඳු අදහසක් වෙයි. 'මට යමක් තිබුණේය. දැන් එය නැත, මතුලැබිය යුතු දේද මම නොලබන්නෙමි'යි හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි, වැළපෙයි. පපුවෙහි අතගසමින් අඬමින් මුළාවට පැමිණෙයි, මහණ, මෙසේ වනාහි බාහිර පිරිකර විනාශවූ කල්හි තැති ගැන්ම වේයයි වදාළහ.

"ස්වාමීනි, බාහිර පිරිකර විනාශවූ කල්හි තැති නොගැන්මක් වේද?" 'මහණ, වන්නේය'යි භාග්‍යවතුන් වහන්සේ වදාළේය. 'මහණ මේ සස්නෙහි කිසිවෙකුට මෙබඳු කල්පනාවක් නොවෙයිද, මට යමක් තිබුණේය, දැන් එය නැත, මතු ලැබිය යුතු දේද මම නොලබන්නෙමි' කියායි. හෙතෙම ශොක නොකරයි, ක්ලාන්ත නොවෙයි, නොවැළපෙයි, පපුවෙහි අත ගසමින් නොහඬයි, මුළාවට නොපැමිණෙයි. මහණ, මෙසේ වනාහි බාහිර පිරිකර විනාශවූ කල්හි තැති නොගැන්ම වන්නේය."

13. "ස්වාමීනි, අධ්‍යාත්ම ස්කන්ධ විනාශවූ කල තැතිගැන්මක් වේද?" "මහණෙනි, වන්නේය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළේය. "මහණ, මෙහි කිසිවෙකුට මෙබඳු දෘෂ්ටියක් වෙයිද, එය ලොකය වෙයි, 'එය ආත්මය වෙයි, ඒ මම පරලොව නිත්‍යවූ සදාකාලිකවූ, නොපෙරෙළෙන ස්වභාව ඇති, හැමදාම පවතින්නෙක් වන්නෙමි'යි (කියාය.) හෙතෙම සියලු දෘෂ්ටි දෘෂ්ටි හේතු, දෘෂ්ටි පිහිටීම්, දෘෂ්ටි පහළවීම්, දෘෂ්ටියට බැස ගැනීම් නැති කිරීම

පිණිසද, සියලු සංස්කාරයන්ගේ සංසිඳීම පිණිසද, සියලු උපධීන්ගේ විනාශය පිණිසද, තෘෂ්ණාව නැති කිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිර්වාණය පිණිසද, ධර්ම දෙශනා කරන්නාවූ තථාගතයන් වහන්සේගේ හෝ තථාගත ශ්‍රාවකයෙකුගේ හෝ දේශනාව අසයිද ඔහුට මෙබඳු කල්පනාවක් ඇතිවෙයි, "උත්පත්ති වශයෙන් සිඳෙන්නෙම් නොවෙම්ද වැනසෙන්නෙම් නොවෙම්ද, මතු නො උපදින්නෙම් නොවෙම්ද" (කියායි) හෙතෙම ශොක කරයි, ක්ලාන්ත වෙයි, වැළපෙයි, පපුවෙහි අත් ගසමින් අඬයි, මුළාවට පැමිණෙයි. මහණ, මෙසේ වනාහි අධ්‍යාත්ම ස්කන්ධ විනාශවීම ඇති කල්හි තැති ගැනීම ඇති වන්නේය."

"ස්වාමීනි, අධ්‍යාත්ම ස්කන්ධ විනාශවීම ඇතිකල්හි තැති නොගැන්මක් වන්නේද?" "මහණෙනි, වන්නේය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළේය. "මහණ මේ සස්නෙහි කිසිවෙකුට මෙබඳු දෘෂ්ටියක් ඇති නොවෙයිද, 'එය ලෝකයය, එය ආත්මයය ඒ මම පරලොව නිත්‍යවූ, නොපෙරළෙන ස්වභාව ඇති හැම කල්හි පවතින්නෙක් වන්නෙමි' යන දෘෂ්ටියක් ඇති නොවෙයිද හෙතෙම සියලු දෘෂ්ටි, දෘෂ්ටි හේතු, දෘෂ්ටි පිහිටීම්, දෘෂ්ටි ඉපදීම්, දෘෂ්ටියට බැසගැණීම් නැතිකිරීම පිණිසද, සියලු උපධීන්ගේ (ක්ලෙශ උපධි ආදී පඤ්චවිධ උපධි) විනාශය පිණිසද, තෘෂ්ණාව නැති කිරීම පිණිසද, නොඇල්ම පිණිසද, නිර්වාණය පිණිසද, ධර්මදෙශනා කරන්නාවූ තථාගතයන් වහන්සේගේ හෝ තථාගත ශ්‍රාවකයෙකුගේ හෝ දෙශනාව අසයිද, ඔහුට මෙබඳු කල්පනාවක් ඇති නොවෙයි. 'උත්පත්ති වශයෙන් සිඳෙන්නෙම් නොවෙම්ද, වැනසෙන්නෙම් නොවෙම්ද, මතු නොඋපදින්නෙම් නොවෙම්ද' කියායි. හෙතෙම ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවේ අත්ගසා නොඅඬයි. මුළාවට නොපැමිණෙයි. මහණ මෙසේ වනාහි අධ්‍යාත්ම ස්කන්ධ පිළිබඳ විනාශය ඇති කල්හි තැති නොගැන්ම වන්නේය.

"මහණෙනි, බාහිර පිරිකරක් නිත්‍ය නම් හැමදාම පවතී නම් නොපෙරළෙන ස්වභාව ඇත්තේ නම් ස්ථිර නම් එබඳු දෙයක්

පටුන



මගේ යයි ගනිව්, මහණෙනි, එසේ නිත්‍යවූ සදාකාලිකවූ නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ ස්ථිරවූ දෙයක් තොපි දක්නහුද?" "නැත ස්වාමීනි," "යහපති මහණෙනි, ස්ථිරවූ නිත්‍යවූ සදාකාලිකවූ නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ එබන්දක් මමද නොදකිමි.

14. "මහණෙනි, යමක් මමයයි ගන්නහුට ශොක පරිදෙව, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවන්නේ නම් එබඳු දෙයක් මමයයි ගනිව්. මහණෙනි, යමක් මමයයි ගන්නහුට ශොක, පරිදෙව, දුක් දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවේද, එබඳු දෙයක් තොපි දක්නහුද?" "නැත, ස්වාමීනි." "යහපති මහණෙනි, යමක් මමයයි ගන්නහුට ශොක පරිදෙව, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවේද, එබඳු දෙයක් මමද නොදකිමි.

"මහණෙනි, දෙසැට මිථ්‍යාදෘෂ්ටි අතුරෙන් යම් දෘෂ්ටියක් ගන්නහුට ශොක, පරිදෙව, දුක් දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවන්නේනම් එබඳු දෘෂ්ටියක් ගනිව්. මහණෙනි, දෙසැට මිථ්‍යාදෘෂ්ටි අතුරෙන් යම් දෘෂ්ටියක් ගන්නහුට ශොක, පරිදෙව, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවේද, එබඳු දෘෂ්ටියක් තොපි දක්නහුද?" "නැත ස්වාමීනි" "යහපති මහණෙනි, දෙසැට මිථ්‍යාදෘෂ්ටි අතුරෙන් යම් දෘෂ්ටියක් ගන්නහුට ශොක, පරිදෙව, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මේවා ඇති නොවේද, එබඳු දෘෂ්ටියක් මමත් නොදකිමි.

15. "මහණෙනි, මමයයි ගැනීමක් ඇති කල්හි මේ දේ මගේයයි ගැනීම ඇතිවන්නේද?" "එසේය, ස්වාමීනි."

"මහණෙනි, මගේයයි ගැනීම ඇති කල්හි මාගේ ආත්මයයයි ගැනීම ඇතිවන්නේද?" "එසේය, ස්වාමීනි."

"මහණෙනි තමාද තමහට අයත් දෙයක් ස්ථිර වශයෙන් නොලැබෙන කල්හි මෙය ලෝකයය, මෙය ආත්මයය, ඒ මම පරලොව නිත්‍ය හැමදාම පවතින නොපෙරළෙන ස්වභාව ඇති ස්ථිරවූවෙක් වන්නෙමිය යන යම් ගැනීමක් වේද, එය තනිකර සම්පූර්ණයෙන් මෝඩකමක් නොවේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, කුමක් හෙයින් නොවන්නේද, එය තනිකර සම්පූර්ණ මෝඩකමකි."

**16.** "මහණෙනි, කුමක් සිතව්ද? රූපස්කන්ධය නිත්‍යද අනිත්‍යද?" "ස්වාමීනි,අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍යනම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?" "ස්වාමීනි දුකය." "යමක් අනිත්‍ය නම්, දුකනම්, පෙරළෙනසුලුනම් එය මගේය' එය මම වෙමි, එය මගේ ආත්මයයි ගැනීමට සුදුසුද?" "නැත, ස්වාමීනි."

"මහණෙනි කුමක් සිතව්ද? වේදනාස්කන්ධය නිත්‍යද, අනිත්‍යද?" ''ස්වාමීනි, අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?" "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුලු නම් එය මගේය, එය මම වෙමි. එය මගේ ආත්මයයි ගැනීමට සුදුසුද?" "නැත, ස්වාමීනි."

"මහණෙනි, කුමක් සිතව්ද? සංඥාස්කන්ධය නිත්‍යද අනිත්‍යද?" "ස්වාමීනි, අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍යනම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?" "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍ය නම් දුක් නම් පෙරළෙනසුලු නම් එය මගේය, එය මම වෙමි එය මගේ ආත්මයයි ගැනීමට සුදුසුද?" "නැත, ස්වාමීනි."

"මහණෙනි, කුමක් සිතව්ද? සංස්කාරස්කන්ධය නිත්‍යද? අනිත්‍යද?" "ස්වාමීනි, අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?" "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් පෙරළෙනසුලු නම් එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි ගැනීමට සුදුසුද?" "නැත, ස්වාමීනි."

"මහණෙනි, කුමක් සිතව්ද? විඤ්ඤාණස්කන්ධය නිත්‍යද? අනිත්‍යද?" "ස්වාමීනි, අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?" "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් පෙරළෙනසුලු නම් එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි ගැනීමට සුදුසුද?" "නැත, ස්වාමීනි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. "මහණෙනි, එහෙයින් මෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ආධ්‍යාත්මිකවූද, බාහිරවූද, ඖදාරිකවූද, සූක්ෂම වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම් කිසි රූපයක් ඇත්තේද ඒ සියලු රූපය මගේ නොවෙයි. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි මෙසේ යහපත් ප්‍රඥාවෙන් තතුසේ දතයුතුයි.

"මහණෙනි, එහෙයින් මෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ආධ්‍යාත්මිකවූද, බාහිරවූද, ඖදාරිකවූද, සූක්ෂම වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම් කිසි වේදනාවක් ඇත්තේද ඒ සියලු වේදනාව මගේ නොවෙයි. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි මෙසේ යහපත් ප්‍රඥාවෙන් තතුසේ දතයුතුයි.

"මහණෙනි, එහෙයින් මෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ආධ්‍යාත්මිකවූද, බාහිරවූද, ඖදාරිකවූද, සූක්ෂම වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම්කිසි සංඥාවක් වේද ඒ සියලු සංඥාව මගේ නොවෙයි, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි මෙසේ යහපත් ප්‍රඥාවෙන් තතුසේ දතයුතුයි.

"මහණෙනි, එහෙයින් මෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ආධ්‍යාත්මිකවූද, බාහිරවූද, ඖදාරිකවූද, සූක්ෂම වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම්කිසි සංස්කාරයක් වේද ඒ සියලු සංස්කාරයන් මගේ නොවෙයි, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි මෙසේ යහපත් ප්‍රඥාවෙන් තතුසේ දතයුතුයි.

"මහණෙනි, එහෙයින් මෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ආධ්‍යාත්මිකවූද, බාහිරවූද, ඖදාරිකවූද, සූක්ෂම වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම්කිසි විඤ්ඤාණයක් වේද? ඒ සියලු විඤ්ඤාණය මගේ නොවෙයි. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි මෙසේ යහපත් ප්‍රඥාවෙන් තතුසේ දතයුතුයි.

**18.** "මහණෙනි, මෙසේ දක්නා උගත් ආර්ය ශ්‍රාවක තෙම රූපස්කන්ධයෙහිද කලකිරෙයි, වේදනාස්කන්ධයෙහිද කලකිරෙයි, සංඥාස්කන්ධයෙහිද කලකිරෙයි. සංස්කාරස්කන්ධයෙහිද කලකිරෙයි, විඥානස්කන්ධයෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ මාර්ගඥානයෙන් නොඇලෙයි. නොඇලීම නිසා ඵලඥානයෙන් කෙලෙසුන් කෙරෙන් මිදෙයි. කෙලෙසුන් කෙරෙන් මිදුණු කල්හි මිදුනේය යන ප්‍රත්‍යවෙක්ෂා ඥානය පහළ වෙයි. ජාතිය කෙළවර විය. බඹසර වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. අර්හත්වය සඳහා තවත් කළයුතු දෙයක් නැතැයිද දැනගනී.

**19.** "මහණෙනි, මේ භික්ෂුව උදුරා දමනලද අවිද්‍යාව නමැති දොර අගුල් ඇත්තෙකැයිද, විනාශ කරනලද සංස්කාර නමැති දිය අගල් ඇත්තෙකැයිද, උදුරා දමනලද තෘෂ්ණාව නමැති ඉන්ද්‍රඛීලය ඇත්තෙකැයිද, ගලවා දමනලද ඔරම්භාගිය සංයෝජන නමැති අගුල් ඇත්තෙකැයිද, ආර්යයෙකැයිද, හෙළන ලද මානය නමැති කොඩිය ඇත්තෙකැයිද, බර බහා තැබූවෙකැයිද සියලු කෙලෙසුන් කෙරෙන් වෙන්වූවෙකැයිද කියනු ලැබේ.

"මහණෙනි, කෙසේ නම් මහණ තෙම උදුරා දැමූ දොර අගුල් ඇත්තේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ අවිද්‍යාව නැති වූවා වෙයිද, සුන් කරන ලද මුල් ඇත්තීද, කැපූ තල් කඳක් මෙන් කරන ලද්දීද, අභාවයට පමුණුවන ලද්දීද, මතු නූපදින ස්වභාව ඇත්තීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව උදුරා දැමූ අවිද්‍යාව නමැති දොර අගුල් ඇත්තේ වෙයි.

"මහණෙනි, මහණ තෙම කෙසේ නම් විනාශ කරන ලද දිය අගල් ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු ගේ නැවත ඉපදීම ඇතිකරන්නාවූ ජාති සංසාරය ඇති කරන්නාවූ කර්මය නැතිවූයේ වෙයිද, මුල් සුන් කරන ලද්දේද, කැපූ තල් කඳක් මෙන් කරන ලද්දේද අභාවයට පමුණුවන ලද්දේ මතු නූපදින ස්වභාව ඇත්තේද මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව විනාශ කරන ලද කර්මය නමැති දිය අගල් ඇත්තේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

20. "මහණෙනි, කෙසේ නම් මහණ තෙම ඉගුළු ඉන්ද්‍රඛීල ඇත්තේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ තෘෂ්ණාව නැතිවූවා වෙයිද, මුල් සුන් කරන ලද්දීද, කැපූ තල් කඳක් මෙන් කරන ලද්දේද, අභාවයට පමුණුවන ලද්දේ මතු නූපදින ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව උදුරා දැමූ තෘෂ්ණාව නමැති ඉන්ද්‍රඛීල ඇත්තේ වෙයි.

21. "මහණෙනි, මහණතෙම කෙසේ නම් අගුල් රහිත වූයේ වෙයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ ඕරම්භාගීයයි කියනුලබන කාමලෝකය භජනයකරන්නාවූ සංයෝජන ධර්ම පස නැති වූවාහු වෙත්ද, මුල් සුන්කරන ලද්දාහුද, කැපූ තල් කඳක් මෙන්කරන ලද්දාහුද, අභාවයට පමුණුවන ලද්දාහුද, මතු නූපදින ස්වභාව ඇත්තාහුද මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව ඔරම්භාගිය සංයෝජන අගුල් රහිත වූයේ නම් වෙයි.

22. "මහණෙනි, මහණ තෙම කෙසේ නම් ආර්යවූ බිම හෙලූ කොඩිය ඇත්තෙක් බහා තැබූ බර ඇත්තෙක් කෙලෙසුන් කෙරෙන් වෙන්වූවෙක් වන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ (පංචස්කන්ධයෙහි) 'මම වෙමි' යන මානය ප්‍රහීණ වූයේ වෙයිද, මුල් සුන්කරන ලද්දේද, කැපූ තල් කඳක් මෙන් කරන ලද්දේද, අභාවයට පමුණුවන ලද්දේද මතු නූපදින ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව ආර්යවූ බිම හෙලූ කොඩිය ඇත්තෙක් බහා තැබූ බර ඇත්තෙක් කෙලෙසුන් කෙරෙන් වෙන් වූවෙක් වන්නේය.

"මහණෙනි, මෙසේ මිදුණු සිත් ඇති භික්ෂුව ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ දෙවියෝ සොයන්නාහු නමුත් අර්හත් පුද්ගලයාගේ සිත මෙය ඇසුරුකර සිටියේ යයි දැනගත නොහැකි වෙති. ඊට හේතු කවරේද? මහණෙනි, මම මේ ආත්මයෙහිම කෙලෙස් නැති කළ සත්වයා එසේ දැනගත නොහැකියයි කියමි.

23. "මහණෙනි, මෙසේ කියන්නාවූ මට ඇතැම් මහණ බමුණෝ අසත්‍යයෙන්, හිස් බසින් බොරුවෙන්, නොවූවකින්

දොස් කියති. 'ශ්‍රමණ ගෞතම තෙම සත්ත්ව විනාශය ප්‍රකාශ කරන්නෙක, ඇත්තාවූ සත්වයාගේ සිඳීම, වැනසීම, අභාවය පණවාය'යි (දොස් කියති.) මහණෙනි, මම යම්සේ විනාශකයෙක් නොවෙම්ද, යම් පරිද්දෙකින් නොකියම්ද, ඒ පින්වත් මහණ බමුණෝ මට එපරිද්දෙන් අසත්‍යයෙන්, හිස් බසින්, බොරුවෙන්, නොවූවකින්, දොස් කියති. 'ශ්‍රමණ ගෞතම තෙම සත්ත්ව විනාශය ප්‍රකාශ කරන්නෙක, ඇත්තාවූම සත්ත්වයාගේ සිඳීම, වැනසීම අභාවය පණවාය'යි (දොස් කියති.) මහණෙනි, මම පෙර මහ බෝමැඩදීත්, දැන් ධර්ම දෙශනා කිරීමේදීත් දුකද ප්‍රකාශ කරමි. දුකට හේතුවද ප්‍රකාශ කරමි. දුක නැතිකිරීමද ප්‍රකාශ කරමි. දුක නැති කිරීමේ මගද ප්‍රකාශ කරමි.

**24.** "මහණෙනි, ඒ කාරණයෙහිලා අන්‍යයෝ තථාගතයන්හට නින්දා කරති, පරිභව කරති, දොස් කියති, වෙහෙස කරති. එසේදවුවත් ඔවුන් කෙරෙහි තථාගතයන් වහන්සේගේ ක්‍රොධයක් නැත. දොම්නසක් නොසතුටක් නැත. එහිලා යම් කෙනෙක් තථාගතයන් හට සත්කාර කරත්ද, ගරු කරත්ද, බුහුමන් කරත්ද, පුදත්ද එහිද තථාගතයන්ගේ ප්‍රීතියක්, සොම්නසක්, හිත ඉල්පෙන බවක් නැත. මහණෙනි, එහි යම් කෙනෙක් තථාගතයන්හට සත්කාර කරත්ද, ගරු කරත්ද, බුහුමන් කරත්ද, පුදත්ද, එහිදී තථාගතයන් හට මෙබඳු කල්පනාවක් වෙයි 'යම් මේ පංචස්කන්ධයක් බෝමැඩදීම පිරිසිඳ දැනගන්නා ලද්දේද, ඒ පඤ්චස්කන්ධයට මෙබඳු සත්කාරයෝ කරනු ලැබෙත්' (කියාය.)

**25.** "මහණෙනි, එහෙයින් තොපටද අන්‍යයෝ නින්දා පරිභව කරත් නම්, දොස් කියත් නම් වෙහෙසවත් නම් එහි තොප විසින් කෝපයක් දොමනසක් නොසතුටක් ඇතිකර නොගත යුතුය. මහණෙනි, මේනිසා අන්‍යයෝ තොපට සත්කාර කරත්ද, ගරු කරත්ද, බුහුමන් කරත්ද, පුදත්ද, එහි තොප විසින් ප්‍රීතියක්, සොම්නසක්, හිත ඉල්පෙන බවක්, ඇතිකර නොගත යුතුය. එහිදී තොපටද මෙසේ කල්පනා වන්නේය. 'යම් මේ පංචස්කන්ධයක් කල් ඇතිවම පිරිසිඳ දැනගන්නා ලද්දේද ඒ පංචස්කන්ධයට මේ සත්කාරයෝ කරනු ලැබෙති' (කියාය.)

"මහණෙනි, එහෙයින් යමක් තොපගේ නොවේනම් එය දුරු කරව්. එය දුරුකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය.

**26.** "මහණෙනි, තොපගේ නොවන්නේ කුමක්ද? මහණෙනි, රූපය තොපගේ නොවේ. එය දුරුකරව්. එය නැති කිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, වේදනාව තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට දීර්ඝ කාලයක් හිතපිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, සංඥාව තොපගේ නොවේ. එය දුරුකරව් එය දුරුකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, සංස්කාරයෝ තොපගේ නොවෙත්. එය දුරුකරව්. එය දුරු කිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, විඥානය තොපගේ නොවේ. එය දුරුකරව්, එය නැති කිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය.

**27.** "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ ජේතවන විහාරයෙහි යම් බඳුවූ තණ, වියලි දඬු, අතු, කොළ වෙත්ද, එය මහජනයා ගෙනයන්නේ හෝ වේද, දවන්නේ හෝ වේද, කැමති දෙයක් කරන්නේ හෝ වේද, එවිට තොපට මේ ජනයා අප ගෙන යන්නේය, අප දවන්නේය, කැමති දෙයක් කරන්නේය කියා කල්පනා වේද?" "නැත, ස්වාමීනි" "ඊට හේතු කවරේද?" "ස්වාමීනි, එය අප මමයයි ගන්නා දෙයකුත් නොවෙයි. මගේයයි ගන්නා දෙයකුත් නොවෙයි."

"මහණෙනි, එසේම යමක් තොපගේ නොවේ නම් එය දුරුකරව්, මහණෙනි, එය දුරුකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, කුමක් තොපගේ නොවන්නේද? මහණෙනි, රූපය තොපගේ නොවේ. එය දුරුකරව්, එය නැතිකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. වේදනාව තොපගේ නොවේ. එය දුරුකරව්, එය නැතිකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, සංඥාව තොපගේ නොවේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එය දුරුකරව්, එය නැතිකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, සංස්කාරයෝ තොපගේ නොවෙත්. එය දුරුකරව්, එය නැතිකිරීම තොපට දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. මහණෙනි, විඥානය තොපගේ නොවේ. එය දුරුකරව්, එය නැතිකිරීමට තොපට දීර්ඝකාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය.

**28.** "මහණෙනි, මා විසින් ධර්මය මෙසේ මොනවට දෙසනලදී. ප්‍රකට කරනලදී. පැහැදිලි කරනලදී. අනාවරණය කරනලදී. කැලිකසල දුරුකරනලදී.

"මහණෙනි, මා විසින් මෙසේ මොනවට දෙසනලද ප්‍රකට කරනලද පැහැදිලි කරනලද අනාවරණය කරනලද කැලිකසල දුරුකරනලද ශාසනයෙහි යම් ඒ කෙලෙස් නැති කළ, වැස නිමවූ බ්‍රහ්මචරියා ඇති, කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති, ලැබූ පල ඇති, නැති කළ භව බන්ධන ඇති මනාව දැන මිදුණු යම් ඒ රහත්හු වෙත්ද, ඔවුන්හට ඇතැයි දැක්වීමට සංසාරයක් නැත.

**29.** "මහණෙනි, මා විසින් ධර්මය මෙසේ මොනවට දෙසනලදී. ප්‍රකට කරනලදී. පැහැදිලි කරනලදී. අනාවරණය කරනලදී. කැලිකසල දුරුකරන ලදී.

"මහණෙනි, මා විසින් මෙසේ මොනවට දෙසනලද, ප්‍රකට කරනලද, පැහැදිලි කරනලද, අනාවරණය කරනලද කැලිකසල දුරු කරන ලද, ශාසනයෙහි යම් භික්ෂුවකගේ කාමලොකය භජනය කරන සංයෝජන පහ නැතිවූයේ වේද ඒ සියල්ලෝ එහි (ඒ බඹලොව) පිරිනිවන් පානා ඕපපාතිකයෝ වෙත්. ඒ ලෝකයෙන් නැවත මේ කාම ලෝකයට ඉපදීම් වශයෙන් නොඑන්නෝ වෙත්.

**30.** "මහණෙනි, මා විසින් මෙසේ ධර්මය මොනවට දෙසනලදී, ප්‍රකට කරනලදී, පැහැදිලි කරනලදී, අනාවරණය කරනලදී, කැලිකසල දුරුකරනලදී. එසේ මොනවට දෙසන ලද, ප්‍රකට කරනලද, පැහැදිලි කරන ලද අනාවරණය කරන

ලද කැලිකසල දුරු කරනලද ශාසනයෙහි යම් භික්ෂූන්ගේ සංයෝජන තුන නැති වූවාහු වෙත්ද, රාග දොෂ මෝහයෝ තුනී වූවාහුද, ඒ සියල්ලෝ සකෘදාගාමී වෙති. එක් වරක් පමණක් මේ ලෝකයට (ඉපදීම වශයෙන්) අවුත් දුක් කෙළවර කරත්.

31. "මහණෙනි, මා විසින් ධර්මය මෙසේ මොනවට දෙසනලදී, ප්‍රකට කරනලදී, පැහැදිලි කරනලදී, අනාවරණය කරන ලදී, කැලිකසල දුරු කරනලදී, එසේ මොනවට දෙසනලද, ප්‍රකට කරනලද, පැහැදිලි කරනලද, අනාවරණය කරනලද, කැලිකසල දුරුකරනලද ශාසනයෙහි යම් භික්ෂූන්ගේ සංයෝජන තුන නැතිවූවාහු වෙත්ද, ඒ සියල්ලෝ සෝවාන් වෙත්. අපායෙහි නූපදින සුලුයහ, නියත වූවාහු සම්බෝධිය පිහිට කොට ඇත්තාහුය.

32. "මහණෙනි, මා විසින් ධර්මය මොනවට දෙසනලදී. ප්‍රකට කරනලදී. පැහැදිලි කරනලදී. අනාවරණය කරනලදී. කැලිකසල දුරු කරනලදී.

"මහණෙනි, මා විසින් මෙසේ මොනවට දෙසනලද, ප්‍රකට කරනලද, පැහැදිලි කරනලද, අනාවරණය කරනලද, කැලිකසල දුරු කරනලද ශාසනයෙහි යම් ඒ භික්ෂූහු ධම්මානුසාරී වෙත්ද, සද්ධානුසාරී වෙත්ද, ඒ සියල්ලෝ සම්බෝධිය පිහිට කොට ඇත්තාහුය.

33. "මහණෙනි, මා විසින් ධර්මය මෙසේ මොනවට දෙනලදී. ප්‍රකට කරනලදී, පැහැදිලි කරනලදී, අනාවරණය කරන ලදී, කැලිකසල දුරුකරනලදී.

එසේ මොනවට දෙසන ලද ප්‍රකට කරනලද අනාවරණය කරනලද කැලිකසල දුරු කරනලද ශාසනයෙහි යම් භික්ෂූන්ට මා කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක් පවතීද, ප්‍රේම මාත්‍රයක් පවතීද, ඒ සියල්ලෝ ස්වර්ගය පිහිටකොට ඇත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

(දෙවෙනිවූ අලගද්දූපම සූත්‍රය නිමි.) (3-2)

---

# 23 වම්මික සූත්‍රය

1. "මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති.

එසමයෙහි කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අන්ධ වනයෙහි වාසය කළහ. එකල එක්තරා බ්‍රහ්මරාජයෙක් රාත්‍රියේ පළමුවෙනි යාමය ඉක්මගිය කල්හි, විසිතුරු වර්ණයෙන් සියලු අන්ධවනය එකාලොක කොට බබුලුවා කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹියේය. එළඹ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ ඒ බ්‍රහ්මරාජතෙම කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය.

2. "මහණ, මහණ, මේ තුඹස රාත්‍රියෙහි දුම්දමයි, දවල් කාලයෙහි ඇවිලෙයි. බ්‍රාහ්මණයෙක් මෙසේ කීයේය 'සුමෙධය, ආයුධයක් ගෙන සාරව' (යි කීයේය.) ආයුධයක් ගෙන සාරා බලන්නාවූ සුමේධ තෙම දොර අගුලක් දුටුවේය. (දැක) 'ස්වාමීනි, දොර අගුලෙකැ'යි කීයේය. බ්‍රාහ්මණ තෙම 'දොර අගුල ඔසවා දමව, ආයුධය ගෙන සාරව'යි කීයේය. ආයුධය ගෙන සාරවන්නාවූ සුමෙධතෙම (පිම්බෙන වර්ගයේ) මැඩියෙකු දුටුයේය. 'වහන්ස, මැඩියෙකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'මැඩියා ඔසවා දමව, සුමෙධය ගෙන සාරව'යි කීයේය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධතෙම දෙමංසන්ධියක් දුටුයේය. (දැක) 'වහන්ස, දෙමංසන්ධියකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'දෙමංසන්ධිය උදුරා දමව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීයේය. ආයුධය ගෙන, සාරන්නාවූ සුමෙධතෙම, අළු පෙරහනක් දුටුයේය. 'ස්වාමීනි අළු පෙරහනකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'අළු පෙරහන උදුරා දමව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධයක් ගෙන සාරන්නාවූ සුමෙධ තෙම ඉදිබුවෙකු දුටුවේය. 'ස්වාමීනි, ඉදිබුවෙකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'ඉදිබුවා, ගොඩගනුව, සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගෙන සාරන්නාවූ සුමෙධ තෙම මස් කපන කැත්තක් හා මස් ලොඹුවක් දුටුවේය. 'ස්වාමීනි, මස් කපන කැත්තක් හා මස් ලොඹුවකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'මස් කපන කැත්ත හා මස්ලොඹුව ගොඩගනුව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධ තෙම මස්වැදැල්ලක් දුටුයේය. 'ස්වාමීනි, මස් වැදැල්ලකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'මස් වැදැල්ල ගොඩ ගනුව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධතෙම නාගයෙකු දුටුවේය. 'ස්වාමීනි, නාගයෙකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'නාගරාජතෙම සිටීවා. නාගරාජයා නොගටව, නාගරාජයාට නමස්කාර කරව'යි කීයේය.

3. "මහණ, ඔබ මේ ප්‍රශ්නයන් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ විචාරව, ඔබට භාග්‍යවතුන් වහන්සේ යම්සේ ප්‍රකාශ කොට වදාරණසේක්ද එපරිද්දෙන් ඒ ප්‍රශ්න දරාගනුව, මහණ සර්වඥයන් වහන්සේ හැර, සර්වඥයන් වහන්සේගේ ශ්‍රාවකයන් හැර, මා කෙරෙන් අසා කියන්නවුන් හැර, මේ ප්‍රශ්නයන් විසඳීමෙන් යමෙක් හිත සතුටු කරන්නේද එබඳු පුද්ගලයෙක් දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහිද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ පිරිස්හිද නොදක්නෙමි'යි කීයේය, මේ වචනය මෙසේ කියා ඒ බ්‍රහ්මරාජ තෙම එතැන්හිම අතුරුදන් වූයේය.

4. "ඉක්බිත්තෙන් ආයුෂ්මත් කුමාර කාශ්‍යප ස්ථවිරතෙම ඒ රාත්‍රියයේ ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ කුමාරකාශ්‍යප ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය.

"ස්වාමීනි, ඉකුත් රාත්‍රියෙහි එක්තරා බ්‍රහ්මයෙක් තමන්ගේ ශරීර ආලොකයෙන් මුළු අන්ධවනය එකාලොක කොට බබුලුවා මම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ එක පැත්තක උන්නේය. ස්වාමීනි, එක පැත්තක උන්නාවූ ඒ බ්‍රහ්මයා මටමෙසේ කීවේය.

"මහණ, මහණ, මේ තුඹස රාත්‍රියෙහි දුම් දමයි, දහවල් කාලයෙහි ඇවිලෙයි. බ්‍රාහ්මණයෙක් මෙසේ කීයේය. 'සුමේධය, ආයුධයක් ගෙන සාරව'යි (කීයේය.) ආයුධයක් ගෙන සාරා බලන්නාවූ සුමේධ තෙම දොර අගුලක් දුටුවේය. (දැක) 'ස්වාමීනි, දොර අගුලෙකැ"යි කීයේය. බ්‍රාහ්මණ තෙම 'දොර අගුල ඔසවා දමව, ආයුධය ගෙන සාරව'යි කීයේය. ආයුධය ගෙන සාරවන්නාවූ සුමෙධතෙම මැඩියෙකු දුටුයේය. 'වහන්ස, මැඩියෙකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'මැඩියා ඔසවා දමව, සුමෙධය, ආයුධය ගෙන සාරවයි කීයේය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධතෙම දෙමංසන්ධියක් දුටුයේය. (දැක) 'වහන්ස, දෙමංසන්ධියකැයි කීයේය. බ්‍රාහ්මණතෙම 'දෙමංසන්ධිය උදුරා දමව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීයේය. ආයුධය ගෙන, සාරන්නාවූ සුමෙධතෙම, අළු පෙරහනක් දුටුයේය. 'ස්වාමීනි අළු පෙරහනකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'අළු පෙරහන උදුරා දමව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධයක් ගෙන සාරන්නාවූ සුමෙධ තෙම ඉදිබුවෙකු දුටුවේය. 'ස්වාමීනි, ඉදිබුවෙකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'ඉදිබුවා, ගොඩගනුව, සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධ තෙම මස් කපන කැත්තක් හා මස් ලොඹුවක් දුටුවේය. 'ස්වාමීනි, මස් කපන කැත්තක් හා මස් ලොඹුවකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'මස් කපන කැත්ත හා මස්ලොඹුව ගොඩගනුව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධ තෙම මස්වැදැල්ලක් දුටුයේය. 'ස්වාමීනි, මස් වැදැල්ලකැ'යි කීය. බ්‍රාහ්මණ තෙම 'මස් වැදැල්ල ගොඩගනුව. සුමෙධය, ආයුධය ගෙන සාරව'යි කීය. ආයුධය ගෙන සාරන්නාවූ සුමෙධතෙම නාගයෙකු දුටුවේය. 'ස්වාමීනි, නාගයෙකැ'යි කීයේය. බ්‍රාහ්මණතෙම 'නාගරාජතෙම සිටීවා. නාගරාජයා නොගටව, නාගරාජයාට නමස්කාර කරව'යි කීයේය.

"ස්වාමීනි, තුඹස නම් කුමක්ද? රාත්‍රියෙහි දුම් දැමීම නම් කුමක්ද? දහවල් ඇවිලීම නම් කුමක්ද? බ්‍රාහ්මණ නම් කවරෙක්ද? සුමෙධ නම් කවරෙක්ද? ආයුධය නම් කුමක්ද? සෑරීම නම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කුමක්ද? දොර අගුල නම් කුමක්ද? මැඩියානම් කුමක්ද? දෙමංසන්ධිය නම් කවරක්ද? අළුපෙරහන නම් කුමක්ද? ඉදිබුවා නම් කුමක්ද? මස් කපන කැත්ත හා මස් ලොඹුව නම් කුමක්ද? මස්වැදැල්ල නම් කුමක්ද? නාගරාජයා නම් කවරෙක්ද?"

**5.** මහණ, තුඹස යනු මවු පිය දෙදෙනා නිසා පහළවූ ආහාර පානයෙන් වැඩුණාවූ, අනිත්‍යවූ, සුවඳ ගැල්වීම් පිරිමැදීම් ආදිය කළ යුතුවූ, කැඩී බිඳී යන සුලුවූ සතර මහාභූතයන්ගෙන් හටගත් මේ ශරීරයට නමකි.

"මහණ, දහවල් කළයුතු ගොවිතැන් වෙළඳම් ආදී කටයුතු සම්බන්ධයෙන් රාත්‍රි කාලයෙහි නැවත නැවත කල්පනා කරයි. සලකා බලයි. මෙය රාත්‍රියෙහි දුම් දැමීමය.

"මහණ, යමක් රාත්‍රියෙහි කල්පනාකර සලකා බලා, දහවල් ගොවිතැන් වෙළඳම් ආදියක් කයින් හෝ වචනයෙන් හෝ කරයිද මේ දහවල් ඇවිලීමය.

"මහණ, බ්‍රාහ්මණ යනු අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්හට නමකි. මහණ, සුමේධ යනු ශෛක්ෂ පුද්ගලයාට (අර්හත් ඵලයට පහළ මාර්ගඵල ලැබූ පුද්ගලයා) නමෙකි.

"මහණ, ආයුධය යනු ආර්ය පුද්ගලයන්ගේ ප්‍රඥාවට නමෙකි. මහණ, සෑරීම යනු වීර්යයට නමකි. මහණ දොර අගුල යනු අවිද්‍යාවට නමකි. සුමෙධය, ආයුධය ගෙන සාරා අවිද්‍යාව නමැති දොර අගුල ගළවා දමව යන අර්ථයි.

"මහණ, (පිම්බෙන වර්ගයේ) මැඩියා යනු ක්‍රොධයට නමකි. සුමෙධය, ආයුධය ගෙන සාරා බලවත් ක්‍රොධය නමැති මැඩියා උගුලා දමව යන අර්ථයි.

"මහණ දෙමංසන්ධිය යනු විචිකිච්ඡාවට හෙවත් සැකයට නමකි. සුමෙධය, ආයුධය ගෙන සාරා විචිකිච්ඡාව නමැති දෙමංසන්ධිය දුරුකරව යන අර්ථයි.

"මහණ, අළු පෙරහන යනු කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ පහට නමකි ආයුධය

ගෙන සාරා පඤ්චනීවරණ නමැති අළු පෙරහන පහකරව යන අර්ථයි.

"මහණ, ඉදිබුවා යනු රූප වෙදනා, පඤ්ඤා, සංඛාර විඤ්ඤාණ යන උපාදානස්කන්ධ පහට නමකි. සුමෙධය, ආයුධ ගෙන සාරා පඤ්චස්කන්ධය නමැති ඉදිබුවා උදුරා දැමීම යන අර්ථයි.

"මහණ මස් කපන කැත්ත හා මස් ලොඹුව යනු පංච කාමයට නමකි. (කවර පංචකාමයටද යත්) ඇසින් රසවින්ද යුතුවූ ප්‍රියවූ, කාන්තවූ, මනාපවූ, කාමසහගතවූ, ඇල්ම ඇතිකරන්නාවූ රූපයෝය. කණින් රස වින්ද යුතුවූ ප්‍රියවූ, කාන්තවූ, මනාපවූ, කාමසහගතවූ ඇල්ම ඇති කරන්නාවූ ශබ්දයෝය. නාසයෙන් රස විඳිය යුතුවූ ප්‍රියවූ, කාන්තවූ මනාපවූ කාමසහගතවූ ගන්ධයෝය, දිවෙන් රස වින්ද යුතුවූ ප්‍රියවූ, කාන්තවූ මනාපවූ කාම සහගතවූ ඇල්ම ඇතිකරන්නාවූ රසයෝය. කයින් රස විඳිය යුතුවූ ප්‍රියවූ, කාන්තවූ, මනාපවූ කාම සහගතවූ, ඇල්ම ඇතිකරන්නාවූ ස්පර්ශයෝය. සුමෙධය, ආයුධය ගෙන සාරා කැත්ත හා මස් ලොඹුව වැනි පඤ්චකාම ගුණ උදුරා දමව යන අදහසයි.

මහණ, මස් වැදැල්ල යනු නන්දිරාගයට නමකි. සුමෙධය, ආයුධය ගෙන සාරා මස්වැදැල්ල නම්වූ නන්දිරාගය දුරු කරව යන අර්ථයි.

"මහණ නාගරාජ යනු කෙලෙස් නැතිකළ රහත් භික්ෂුහට නමෙකි. නාගරාජ තෙම සිටීවා, නාගරාජයාට නොගසව, නාගරාජයාහට නමස්කාර කරවයි යන්නෙහි මේ තේරුමය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුවූ කුමාර කාශ්‍යප ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනය සතුටින් පිළිගත්තේය.

(තුන්වෙනිවූ වම්මික සූත්‍රය නිමි.) (3-3)

# 24. රථ විනීත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලනන්දකනිවාපනම්වූ වෙලුවන විහාරයෙහි වැඩ වාසය කරති.

එකල්හි බොහෝවූ ජාත භූමක භික්ෂූහු (බුදු රජාණන් වහන්සේ උපන් භූමියවූ කිඹුල්වත්පුර නිවැසි භික්ෂූහු) කිඹුල්වත් පුර නුවර වස්වැස පවාරණයෙන් පසු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකපැත්තක උන්නාහුය. එකපැත්තක උන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කිඹුල්වත්පුර නුවර වාසීවූ සමාන බඹසර ඇති භික්ෂූන් අතුරෙන් කවර නම් භික්ෂුවක් මෙසේ ගරු කරන ලද්දේද? තෙමේත් අල්පෙච්ඡව (ස්වල්පයකින් සතුටුව) භික්ෂූන්ටද අල්පෙච්ඡ කථා කියන්නේද? තෙමේත් ලැබුණ ප්‍රත්‍යයකින් සතුටුව භික්ෂූන්ටද ලද දෙයින් සතුටුවීමේ කථා කියන්නේද? තෙමේත් විවේකව වාසය කරමින් භික්ෂූන්ටද විවෙක වාසය පිළිබඳ කථා කියන්නේද? තෙමේත් අන්‍යයන් හා මිශ්‍රනොවී භික්ෂූන්ටත් මිශ්‍ර නොවීම පිළිබඳ කථා කියන්නේද, තෙමේත් පටන් ගත් වීර්ය ඇතිව භික්ෂූන්ටද වීර්ය කිරීම පිළිබඳ කථා කියන්නේද? තෙමේත් ශීලයෙන් යුක්තව භික්ෂූන්ටද සීල සම්පත්තිය පිළිබඳ කථා කියන්නේද? තෙමේත් සමාධියෙන් යුක්තව භික්ෂූන්ටද සමාධි සම්පත්තිය පිළිබඳ කථා කියන්නේද? තෙමේත් ප්‍රඥාවෙන් යුක්තව භික්ෂූන්ටද ප්‍රඥා සම්පත්තිය පිළිබඳ කථා කියන්නේද? තෙමේත් අර්හත් ඵලයෙන් යුක්තව භික්ෂූන්ටද අර්හත් ඵලය පිළිබඳ කථා කියන්නේද? තෙමේත් විමුක්ති ඥාන දර්ශනයෙන් (ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන්) යුක්තව භික්ෂූන්ටද විමුක්ති ඥානදර්ශන සම්පත්තිය පිළිබඳ කථා කියන්නේද, භික්ෂූන්ට අවවාද කරන්නේද, අවබොධ කරවන්නේද, කරුණු දක්වන්නේද, සමාදන් කරවන්නේද, උත්සාහ උපදවන්නේද, සතුටු කරවන්නේද, (කියාය.)

4. ස්වාමීනි, ආයුෂ්මත් මන්තානිපුත්‍ර පුණ්ණ නම් ස්ථවිරයන් වහන්සේ ජාත භූමියෙහි ජාත භූමක භික්ෂූන් විසින් මෙසේ ගරු බුහුමන් කරන ලද්දේය.

"තෙමේත් අල්පෙච්ඡව (ස්වල්පයකින් සතුටුව) භික්ෂූන්ටද අල්පෙච්ඡ කථා කියන්නේය. තෙමේත් ලැබුණ ප්‍රත්‍යයකින් සතුටුව භික්ෂූන්ටද ලද දෙයින් සතුටු වීමේ කථා කියන්නේය. තෙමේත් විවෙකව වාසය කරමින් භික්ෂූන්ටද විවෙක වාසය පිළිබඳ කථා කියන්නේය. තෙමේත් අන්‍යයන් හා මිශ්‍ර නොවී භික්ෂූන්ටත් මිශ්‍ර නොවීම පිළිබඳ කථා කියන්නේය. තෙමේත් පටන්ගත් වීර්ය ඇතිව භික්ෂූන්ටද වීර්ය කිරීම පිළිබඳ කථා කියන්නේය. තෙමේත් ශීලයෙන් යුක්තව භික්ෂූන්ටත් සීල සම්පත්තිය පිළිබඳ කථා කියන්නේය. තෙමේත් සමාධියෙන් යුක්තව භික්ෂූන්ටත් සමාධි සම්පත්තිය පිළිබඳ කථා කියන්නේය. තෙමේත් ප්‍රඥාවෙන් යුක්තව භික්ෂූන්ටත් ප්‍රඥා සම්පත්තිය පිළිබඳ කථා කියන්නේය. තෙමේත් අර්හත් ඵලයෙන් යුක්තව භික්ෂූන්ටත් අර්හත්ඵලය පිළිබඳ කථා කියන්නේය. තෙමේත් විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්තව භික්ෂූන්ටත් විමුක්ති ඥාන දර්ශන සම්පත්තිය පිළිබඳ කථා කියන්නේය. භික්ෂූන්ට අවවාද කරන්නේය. අවබොධ කරවන්නේය. කරුණු දක්වන්නේය. සමාදන් කරවන්නේය. උත්සාහ උපදවන්නේය. සතුටු කරවන්නේය" (කියාය.)

4. එකල්හි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සිටියහ. ඉක්බිති ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ කල්පනාව ඇතිවිය. "නුවණැත්තාවූ සමාන බඹසර ඇත්තාවූ භික්ෂූන් ශාස්තෲන් වහන්සේ හමුවෙහි දශ කථා වස්තූන්හට බසිමින් යමෙකුගේ ගුණ මෙසේ කියත්ද ඒ ආයුෂ්මත් මන්තානිපුත්‍ර පුණ්ණ ස්ථවිරයන් වහන්සේට ලාභයකි. මහත් ලාභයකි. අපි කිසියම් දවසක ආයුෂ්මත් මන්තානිපුත්‍ර පුණ්ණ ස්ථවිරයන් හා මුණගැසෙමු නම් හොඳය. කිසියම් කථා සල්ලාපයක් ඇතිවුවහොත් හොඳය' (කියාය.)

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැතිතාක් කල් රජගහනුවර වැඩ සිට, පිළිවෙළින් සැරිසරා සැවැත්නුවරට වැඩියහ. එහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරති. මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරට වැඩ අනේපිඬු සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරතියි ඇසූහ. ඉක්බිති මන්තානීපුත්ත පුණ්ණස්ථවිරයන් වහන්සේ තමාගේ සේනාසනය තැන්පත්කොට පාත්‍ර සිවුරු ගෙන සැවැත්නුවර යම් තැනකද එහි චාරිකාවෙහි වැඩියහ. පිළිවෙළින් සැරිසරා සැවැත්නුවර ජේතවනාරාමය යම් තැනකද භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි ළඟා වූහ. ළඟාවී, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක උන්හ. එකත්පසෙක උන් මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාවෙන් කරුණු දැක්වූහ. සමාදන් කරවූහ. උත්සාහ කරවූහ. සතුටු කරවූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු දක්වන ලද්දාවූ, සමාදන් කරවන ලද්දාවූ, උත්සාහ කරවන ලද්දාවූ සතුටු කරවන ලද්දාවූ, ආයුෂ්මත් මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ, පැදකුණු කොට, අන්ධ වනය යම් තැනෙක්හිද එතැන්හි දහවල් විසීම සඳහා වැඩියේය.

**6.** ඉක්බිති එක්තරා භික්ෂුවක් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එහි ගියේය. ගොස්, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. ඇවැත් ශාරීපුත්‍රයෙනි, ඔබ වහන්සේ යම් මන්තානීපුත්ත පුණ්ණ නම් භික්ෂුවක් ගැන නිතර කියන්නහුද ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ උත්සාහ කරවන ලද්දේ, සතුටු කරවන ලද්දේ, භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුව, අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ, පැදකුණුකොට අන්ධ වනය යම් තැනෙක්හිද එතැන්හි දහවල් විසීම සඳහා වැඩියේය.” (කියායි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඉක්බිති ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වහා වැඩ හිඳින සම්කඩ ගෙණ මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් පසු-පස උන්වහන්සේ යන අත බලාගෙන ගියහ. ඉක්බිති මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ අන්ධවනයට වැද එක්තරා රුකක් මුල දවල් වාසය සඳහා වැඩහුන්නේය. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද අන්ධවනයට පැමිණ, එක්තරා රුකක් මුල දවල් වාසය සඳහා වැඩ උන්හ.

7. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගිටියේ මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිර තෙම යම් තැනකද එහි ගියහ. ගොස්, මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ, සිහි කටයුතුවූ කථාව කොට නිමවා, එකත්පසෙක වැඩ උන්හ. එකත්පසෙක වැඩඋන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ඇවැත්නි, නුඹවහන්සේ අපගේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව පුරන්නහුද? 'ඇවැත්නි, එසේය.' 'ඇවැත්නි, කිමෙක්ද, ශීල විශුද්ධිය (ශීලයේ පිරිසිදු බව) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචර්යාව පුරන්නේද? 'ඇවැත්නි, එය එසේ නොවේය.' 'ඇවැත්නි, එසේ නම් චිත්ත විශුද්ධිය (හිතේ පිරිසිදු බව) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව පුරන්නේද? 'ඇවැත්නි, එය එසේ නොවේය" 'ඇවැත්නි, එසේ නම් දෘෂ්ටි විශුද්ධිය (නාම රූප දෙක ඇති සැටි දැකීම) පිණිස බුදුන් සමීපයෙහි බ්‍රහ්මචරියාව පුරන්නේද? 'ඇවැත්නි, එය එසේ නොවේය' 'ඇවැත්නි, එසේ නම් කංඛාවිතරණ විශුද්ධිය (නාම රූපයන් පිළිබඳ සැක දුරුකිරීම) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්ම චරියාව රකින්නේද? 'ඇවැත්නි, එය එසේ නොවේය. 'ඇවැත්නි, එසේ නම් මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය (මග නොමග දැනීම) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි 'බ්‍රහ්මචරියාව රකින්නේද?' 'ඇවැත්නි, එය එසේ නොවේය.' ඇවැත්නි, එසේ නම්, (පටිපදාඤාණදස්සන විශුද්ධිය) මුදුන් පැමිණි විදර්ශනා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඥානය හා (සත්‍යානුලොමික ඥානය) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නේද?' 'ඇවැත්නි, එය එසේ නොවේය.' 'ඇවැත්නි, එසේ නම් ඤාණදස්සන විශුද්ධිය (සෝවාන් ආදී සතර මාර්ග ඥානය) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නේද?' 'ඇවැත්නි, එසේ නොවේය.'

8. "කිමෙක්ද? ඇවැත්නි, සීල විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නේ දැයි ප්‍රශ්න කළ විට නැතැයි කියන්නෙහිය. කිමෙක්ද? ඇවැත්නි, චිත්ත විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහිදැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද? දිට්ඨි විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහිදැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය, ඇවැත්නි, කිමෙක්ද? කංඛාවිතරණ විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහි දැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද? මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහිදැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද? පටිපදා ඤාණදස්සන විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහිදැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද? ඤාණදස්සන විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙහි දැයි ඇසූවිටද නැතැයි කියන්නෙහිය.

"ඇවැත්නි, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි කුමක් පිණිස බ්‍රහ්මචරියාව රකින්නේද? 'ඇවැත්නි, අනුපාදා පරිනිර්වාණය (හෙතු ප්‍රත්‍යයන් නිසා හටගැනීමක් නැති අසංඛත නිර්වාණ ධාතුව) පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව රකින්නෙමි'.

9. "කිමෙක්ද? ඇවැත්නි, සීල විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයද, ඇවැත්නි, එය එසේ නොවේ. කිමෙක්ද?

ඇවැත්නි, චිත්ත විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයද? 'ඇවැත්නි' එය එසේ නොවේ' 'ඇවැත්නි, කිමෙක්ද දිට්ඨි විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයද? 'ඇවැත්නි, එය එසේ නොවේ.' 'ඇවැත්නි, කිමෙක්ද කංඛාවිතරණ විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයද? 'ඇවැත්නි, එය එසේ නොවේ.' ඇවැත්නි, කිමෙක්ද, මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය අනුපාද පරිනිර්වාණයද? ඇවැත්නි, එය එසේ නොවේ.' 'ඇවැත්නි කිමෙක්ද, පටිපදා ඤාණදස්සන විශුද්ධිය, අනුපාදා පරිනිර්වාණයද? ඇවැත්නි, එය එසේ නොවේ.' 'ඇවැත්නි, කිමෙක්ද ඤාණ දස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයද? 'ඇවැත්නි, එය එසේ නොවේ.'

"කිමෙක්ද ඇවැත්නි, මේ ධර්ම හැර හෝ මේ ධර්මවලින් පිටත්හි අනුපාදා පරිනිර්වාණය වේද 'ඇවැත්නි, එය එසේ නොවේ.'

10. "කිමෙක්ද ඇවැත්නි, සීල විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයදැයි ඇසූ විට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද, චිත්ත විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයදැයි ඇසූවිට නැතැයි කියන්නෙහිය. කිමෙක්ද ඇවැත්නි, දිට්ඨි විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය දැයි ඇසූ විට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද කංඛාවිතරණ විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයදැයි ඇසූවිට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය දැයි ඇසූවිට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි කිමෙක්ද, පටිපදා ඤාණ දස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය දැයි ඇසූ විට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, කිමෙක්ද ඤාණදස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය දැයි ඇසූවිට නැතැයි කියන්නෙහිය.

"ඇවැත්නි, මේ ධර්ම හැර හෝ මේ ධර්මවලින් පිටත්හි අනුපාදා පරිනිර්වාණය වේදැයි ඇසූවිට නැතැයි කියන්නෙහිය. ඇවැත්නි, මේ කීමෙහි අර්ථය කෙසේ දතයුතුද?"

11. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සීල විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන (තෘෂ්ණාදියෙන්

අල්වා ගැනීම් සහිතවූවක්, ප්‍රත්‍යයෙන් හටගැනීම් සහිත වූවක්ම) අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේය.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ චිත්ත විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක් පනවන්නේය.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දිට්ඨිවිශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක්ම පනවන්නේය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ කංඛාවිතරණ විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක්ම පනවන්නේය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක්ම පනවන්නේය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පටිපදා ඤාණදස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක්ම පනවන්නේය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ඤාණදස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයයයි පනවන්නේ නම් උපාදාන සහිතවූ අනුපාදා පරිනිර්වාණයක්ම පනවන්නේය. ඇවැත්නි, මේ ධර්මවලින් අන්‍යවූ අනුපාදා පරිනිර්වාණයක් පනවන්නේ නම් පෘථග්ජන තෙම පිරිනිවන්පාන්නේය. ඇවැත්නි, මෙයින් අන්‍යවූ පුද්ගලයා නම් පෘථග්ජනයාය.

"ඇවැත්නි, එසේ වීනම් මම ඔබට උපමාවක් දක්වන්නෙමි. උපමාවෙන්ද මේ ලෝකයෙහි ඇතැම් නුවණැත්තෝ කියන දෙයෙහි අර්ථය වටහා ගනිති.

**12.** "ඇවැත්නි, සැවැත්නුවර වසන පසෙනදි කොසොල් රජහට සාකෙත නුවර කිසියම් හදිසි කටයුත්තක් ඇතිවෙයි. සැවැත්නුවර හා සාකෙතනුවර අතර ඔහට හික්මුණු ආජානීය අසුන් යෙදූ රථසතක් පිළියෙල කර තබන්නාහුය. ඇවැත්නි, පසෙනදි කොසොල් රජතෙම සැවැත් නුවරින් නික්ම ඇතුළු

නුවර දොරටුව අසලදී හික්මුණු අසුන් යෙදූ පළමුවන රථයට නගින්නේය. පළමුවන රථයෙන් හික්මුණු අශ්වයන් යෙදූ දෙවෙනි රථය වෙතට පැමිණෙන්නේය. හික්මුණු අසුන් යෙදූ පළමුවන රථය හරනේය. දෙවන රථයෙන් හික්මුණු අසුන් යෙදූ තුන්වෙනි රථය වෙතට පැමිණෙන්නේය. හික්මුණු අසුන් යෙදූ දෙවෙනි රථය අත්හරින්නේය. හික්මුණු අසුන් යෙදූ තුන්වෙනි රථයෙන් හික්මුණු අසුන් යෙදූ හතරවෙනි රථය වෙතට පැමිණෙන්නේය. හික්මුණු අසුන් යෙදූ තුන්වෙනි රථය අත්හරින්නේය. හික්මුණු අසුන යෙදූ හතරවෙනි රථයෙන් හික්මුණු අසුන් යෙදූ පස්වෙනි රථය වෙතට පැමිණෙන්නේය. හික්මුණු අසුන් යෙදූ හතරවෙනි රථය අත්හරින්නේය. හික්මුණු අසුන් යෙදූ පස්වෙනි රථයෙන් හික්මුණු අසුන් යෙදූ හයවෙනි රථය වෙත පැමිණෙන්නේය. හික්මුණු අසුන් යෙදූ පස්වෙනි රථය අත්හරින්නේය. හික්මුණු අසුන් යෙදූ හයවෙනි රථයෙන් හික්මුණු අසුන් යෙදූ හත්වෙනි රථය ඇති තැනකට පැමිණෙන්නේය. හයවෙනි රථය අත්හරින්නේය. හික්මුණු අසුන් යෙදූ හත්වෙනි රථයෙන් සාකෙත නුවර ඇතුල් නුවර දොර සමීපයට පැමිණෙන්නේය. ඇතුල් නුවර දොරටු කරා ඒ රජු පැමිණි කල්හි මිත්‍රාමාත්‍යයෝද නෑ සහ ලේ නෑයෝද මෙසේ විචාරන්නාහුය. 'මහරජ, ඔබ මේ රථයෙන් සැවැත්නුවර සිට සාකෙත නුවර දොරටුව කරා පැමිණියෙහිදැ'යි (කියායි.)

"ඇවැත්නි, කෙසේ ප්‍රකාශ කරන්නාවූ පසෙනදී කොසොල් රජ තෙමේ මනාකොට ප්‍රකාශ කරන්නේද?

"ඇවැත්නි, මනාව ප්‍රකාශකරන්නාවූ පසෙනදි කොසොල් රජතෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'සැවැත්නුවර වාසය කරන්නාවූ මට සාකෙතනුවර හදිසි කටයුත්තක් ඇතිවිය. ඒ මට සැවැත්නුවර හා සාකෙත නුවර අතර හික්මුණු අසුන් යෙදූ රථ හතක් පිළියෙල කළහ. ඉක්බිති මම සැවැත්නුවරින් පිටත්වී ඇතුලු නුවර දොරටුව අසලදී පළමුවෙනි රථයට නැගී ගමන්කර දෙවෙනි රථය වෙත පැමිණියෙමි. පළමුවෙනි රථය අත්හළෙමි. දෙවෙනි රථයෙන් තුන්වෙනි රථය ඇති තැනට පැමිණියෙමි.

දෙවෙනි රථය අත්හැරියෙමි. තුන්වෙනි රථයෙන් හතරවෙනි රථය ඇති තැනට පැමිණියෙමි. තුන්වෙනි රථය අත්හැරියෙමි. හතරවෙනි රථයෙන් පස්වෙනි රථය ඇති තැනට පැමිණියෙමි. හතරවෙනි රථය අත්හැරියෙමි. පස්වෙනි රථයෙන් හයවෙනි රථය ඇති තැනට පැමිණියෙමි. පස්වෙනි රථය අත්හැරියෙමි. හයවෙනි රථයෙන් හත්වෙනි රථය ඇති තැනට පැමිණියෙමි. සයවෙනි රථය අත්හැරියෙමි.'

"ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කරන්නාවූ පසෙනදි කොසොල් රජතෙම මනාව ප්‍රකාශ කරන්නේය.

"ඇවැත්නි, සීලවිශුද්ධිය චිත්තවිශුද්ධිය ලැබීම ප්‍රයෝජන කොට ඇත්තීය. චිත්ත විශුද්ධිය දිට්ඨිවිශුද්ධිය ලැබීම ප්‍රයොජනකොට ඇත්තීය. දිට්ඨිවිශුද්ධිය කංඛාවිතරණ විශුද්ධිය ලැබීම ප්‍රයොජනකොට ඇත්තීය. කංඛාවිතරණ විශුද්ධිය මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය ලැබීම ප්‍රයෝජන කොට ඇත්තීය. මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය පටිපදා ඤාණස්සන විශුද්ධිය ලැබීම ප්‍රයෝජනකොට ඇත්තීය. පටිපදා ඤාණදස්සන විශුද්ධිය ඤාණදස්සන විශුද්ධිය ලැබීම ප්‍රයෝජනකොට ඇත්තීය. ඤාණදස්සන විශුද්ධිය අනුපාදා පරිනිර්වාණයට පැමිණීම ප්‍රයෝජනකොට ඇත්තීය.

"ඇවැත්නි අනුපාදා පරිනිර්වාණය පිණිස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචරියාව පුරන්නේය."

13. "මෙසේ කීකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. "ආයුෂ්මත් තෙම කිනම් ඇත්තේද? ආයුෂ්මතුන්ට කවර නමක් සබ්‍රම්සරුහු ව්‍යවහාර කරත්ද?" ඇවැත්නි, පුණ්ණය යනු මාගේ නමය. සබ්‍රම්සරහු මට මන්තානීපුත්ත යයිද ව්‍යවහාර කරත්" "ඇවැත්නි, ආශ්චර්යය, අද්භූතය. මනාකොට ශාස්තෘ ශාසනය දන්නාවූ ශ්‍රාවකයකු විසින් යම්සේ නම් එපරිද්දෙන්ම මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ විසින් ගැඹුරු ගැඹුරුවූ ප්‍රශ්නයෝ දශ කථා වස්තුන්ට පිවිසෙමින් පිවිසෙමින් ප්‍රකාශ කරන ලද්දාහ.

"යම් කෙනෙක් ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේගේ දැකීම ලබත්ද, සේවනය ලබත් ද ඒ සබ්‍රම්චාරීන්හට ලාභයක්ම වන්නේය, මහත් ලාභයක්ම වන්නේය. සබ්‍රම්සරහු වස්ත්‍ර දරණුවක් හිස තබා ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේ එහි වඩා හිඳුවා හිස් මුදුනෙහි තබාගෙන ඇවිදිමින් දැකීම ලබත්ද, සේවනය ලබත්ද, ඔවුන්ටද ලාභයකි. ඔවුන්ටද මහත්ම ලාභයකි. අපිද ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේ දකිමුද, සේවනය කරමුද, එය අපටද ලාභයකි, මහත් ලාභයකි,' මෙසේ කී කල්හි ආයුෂමත් මන්තානීපුත්ත පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. " ආයුෂ්මතුන් වහන්සේ කිනම් ඇත්තේද? සබ්‍රම්සරහු ආයුෂ්මතුන් වහන්සේ කවර නමකින් ව්‍යවහාර කරත්ද?"

"ඇවැත්නි, මගේ නම උපතිස්ස සබ්‍රම්සරහු මට ශාරීපුත්‍රයයි කියති."

"ශාස්තෘන් වහන්සේ හා සමාන ශ්‍රාවකයෙකු සමග කථා කරමිනුත් ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේයයි නොදනුම්හ. ඉදින් වනාහි අපි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේයයි දන්නෙමු නම් මෙපමණකුත් කථා නොකරන්නෙමු.

"ඇවැත්නි, ආශ්චර්යය, අද්භූතය, මනාකොට ශාස්තෘ ශාසනය දන්නාවූ ශ්‍රාවකයෙකු විසින් යම්සේ නම් එසේ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් දශකථාවස්තුවලට බැස බැස ගැඹුරු ගැඹුරුවූ ප්‍රශ්න විචාරන ලදහ."

"යමෙක් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දැකීම ලබත්ද, ආශ්‍රය ලබත්ද, එය ඒ සබ්‍රම්සරුන්හට ලාභයකි. මහත්ම ලාභයකි. සබ්‍රම් සරහු වස්ත්‍ර දරණුවක් හිස තබා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එහි වඩාහිඳුවා හිස්මුදුනෙහි තබාගෙන පරිහරණය කරත්ද, දකිත්ද, සෙවනය කරත්ද ඔවුනට ලාභයකි, මහත්ම ලාභයකි. අපිද ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ දකිමුද, ආශ්‍රය කරමුද, ඒ අපටද ලාභයකි. මහත්ම ලාභයකි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙසේ ඒ මහා නාගයෝ දෙදෙන (මහරහත් දෙනම) අන්‍යොන්‍යයන්ගේ යහපත් වචන සතුටින් අනුමෝදන් වූහ.

(සතරවෙනිවූ රථ විනීත සූත්‍රය නිමි.) (3-4)

---

## 25. නිවාප සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහු විසින් කරවනලද ජෙතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථාකළහ. "ස්වාමීන් වහන්ස" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "මහණෙනි, මුවන් ඇල්ලීමට තණ කොළ වවන තැනැත්තේ 'මා විසින් මේ වවන තණකොළ අනුභව කරන්නාවූ මුව සමූහයා එය අනුභව කොට දීර්ඝායුෂ වෙත්වා, වර්ණවත් වෙත්වා, බොහෝ කලක් යැපෙත්වායි' කියා නො වවන්නේය. ඔහු මෙසේ සිතාගෙන වවන්නේය. (කෙසේද?) මුව සමූහයා මා විසින් වවන මේ තණකොළ කොටුවට ඇතුල්වී මුසපත්ව ආහාර අනුභව කරන්නාහුය. ඇතුල්වී මුසපත්ව ආහාර අනුභව කරන්නාහු මත්වන්නාහුය. මත්වූවාහු සිහි නැති බවට පැමිණෙන්නාහ. සිහි නැති වූවාහු මේ තණකොළ කොටුවෙහිදී කැමතිසේ අල්ලාගත හැකි බවට පැමිණෙන්නාහුය'යි සිතා තණ කොටුව වවන්නේය.

3. "මහණෙනි, එහි පළමුවෙනි මුවසමූහය මුවන් ඇල්ලීම පිණිස තණ වවන්නහුගේ තණ කොටුවට ඇතුළුවී මුසපත් වූවාහු බොජුන් අනුභව කළහ. ඔව්හු එහි ඇතුල්ව මුසපත්ව බොජුන් අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට (සිහිනැති බවට) පැමිණියාහුය. ප්‍රමාදවූවාහු මුවන් අල්ලන්නාගේ ඒ කොටුවෙහි කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මහණෙනි

මෙසේ වනාහි පළමුවෙනි මුව සමූහයා මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහ.

4. "මහණෙනි, එහි ලා දෙවන මුව සමූහය මෙසේ සිතූහ. 'යම් ඒ පළමුවෙනි මුව සමූහය ඒ මුවන් අල්ලන්නාගේ තෘණ කොටුවට වැද මුසපත්වූවාහු භොජනයන් අනුභව කළාහුද, ඔව්හු එහි ඇතුල්ව සිහිමුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාද වූවාහු ඒ තණකොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ ඒ පළමුවෙනි මුව සමූහය මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුණාහ. යම්හෙයකින් අපි ඒ තණ කොටුවේ භොජනයෙන් සම්පූර්ණයෙන් වළකීමු නම් භය සහිත භොජනයෙන් වෙන්ව මහ වනයට වැද වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙක.' (කියායි) ඔව්හු මුළුමණින් තණ කොටු භෝජනයෙන් වැළැක්කාහුය. බියෙන් අනුභව කටයුතු බොජුනෙන් වැළැක්කාහු මහ වනයට වැද වාසය කළාහුය. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තෘණ හා ජල වියලී ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේය. ඉතා කෙට්ටු බවට පැමිණි ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුණේය. ශක්තිය පිරිහුනු කල්හි මුවන් අල්ලන්නාගේ ඒ තෘණ කොටුවට ආපසු පැමිණියහ. ඔව්හු එහි වැද සිහි මුළාවූවාහු ආහාර අනුභව කළහ. ඔව්හු එහි වැද සිහි මුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු ඒ තෘණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ ඒ දෙවෙනි මුව සමූහයද මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

5. "මහණෙනි, එහි තුන්වෙනි මුවසමූහය මෙසේ සිතූහ. 'යම් ඒ පළමුවෙනි මුව සමූහය මුවන් අල්ලන්නාගේ ඒ තණ කොටුවට වැද සිහිමුළා වූවාහු ආහාර අනුභව කළහ. ඔව්හු එහි ඇතුල්ව සිහිමුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට

පැමිණියාහු ඒ තණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ ඒ පළමුවැනි මුව සමූහය මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. යම් ඒ දෙවෙනි මුව සමූහය මෙසේ සිතූහ. යම් ඒ පළමු වෙනි මුව සමූහය මුවන් අල්ලන්නාගේ තණ කොටුවට වැද සිහි මුළාවූවාහු ආහාර අනුභව කළාහුද? ඔව්හු එහි ඇතුල්ව සිහිමුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු ඒ තෘණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියාහුය. මෙසේ ඒ පළමුවෙනි මුව සමූහය මුවන් අල්ලන්නාගේ උපක්‍රමබලයෙන් නොමිදුනාහුය. අපි සම්පූර්ණයෙන් තණ කොටු භොජනයෙන් වෙන්වෙමු නම් භයින් අනුභවකළ යුතු ආහාරයෙන් වෙන්ව වනයටවැද වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙකැයි' (කියායි) ඔව්හු තෘණ කොටු භොජනයෙන් සම්පූර්ණයෙන් වෙන්වූහ. භයින් අනුභව කළයුතු ආහාරයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේය. ඉතා කෙට්ටු බවට පැමිණි ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි මුවන් අල්ලන්නාගේ තණ කොටුවට ආපසු පැමිණියහ.

"ඔව්හු එහි වැද සිහි මුළාවූවාහු ආහාර අනුභව කළහ. ඔව්හු එහි වැද සිහිමුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාවූ ඒ තෘණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ ඒ දෙවෙනි මුව සමූහයද මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"එහෙයින් අපි මුවන් අල්ලන්නාගේ මේ තණ කොටුවට නුදුරුව සැඟවී සිටින තැනක් සදාගන්නෙමු නම් යහපති. එහි වාසය කොට මුවන් අල්ලන්නාගේ තණ කොටුවට ඇතුළු නොවී සිහිමුළා නොවී ආහාර අනුභව කරන්නෙමු. ඇතුළු නොවී සිහි

මුළානොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණෙන්නෙමු. මත් නොවූවෝම ප්‍රමාදයට නොපැමිණෙන්නෙමු. ප්‍රමාදයට නොපැමිණියෝම ඒ තෘණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළ හැකි බවට නොපැමිණෙන්නේමු’ (කියාය)

“ඔව්හු මුවන් අල්ලන්නාගේ තණ කොටුවට නුදුරුව සැඟවී සිටින ස්ථානයක් කොට වාසය කළාහුය. වාසය කොට මුවන් අල්ලන්නාගේ තණ කොටුවට ඇතුළු නොවී සිහි මුළානොවී ආහාර අනුභව කළාහුය. සිහි මුළානොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණියාහුය. මත් නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු ඒ තෘණ කොටුවෙහි මුවන් අල්ලන්නාගේ කැමැත්තක් කළහැකි බවට නොපැමිණියාහ.

**6.** “මහණෙනි, එහි මුව වැද්දාටද ඔහුගේ පිරිසටද මෙබඳු සිතක්විය. ‘මේ තුන්වන මුව සමූහය කයිරාටිකය. කපටිය. මේ තුන්වන මුව සමූහයා ඍද්ධි ඇත්තවුන් වැනිය, මොව්හු යක්ෂයන් වැනිය. ඔව්හු තෘණකොටුවේ තෘණද අනුභව කරත්. ඔවුන්ගේ ඊම් හෝ යාම හෝ නොදනිමු. අපි යම් හෙයකින් මේ තණකොටුව හාත්පස දැලකින් වටකරන්නෙමු නම් ඉතා යෙහෙක. යම් තැනෙක ඔව්හු ලැබීමට යන්නාහුද මේ තුන්වන මුව සමූහයාගේ වාසස්ථානය දක්නෙමු නම් ඉතා යෙහෙක (කියායි) ඔව්හු මේ තණ කොටුව හාත්පස මහත් ප්‍රදෙශයක් වටකළාහුය.

“මහණෙනි, මුවන් අල්ලන්නාද ඔහුගේ පිරිසද ඒ තුන්වන මුව සමූහය යම් තැනක ලැගීමට යත්ද ඒ වාසස්ථානය දුටුවාහුය මහණෙනි, ඒ තුන්වන මුව සමූහයාද මෙසේ ඒ මුව වැද්දාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

**7.** “මහණෙනි, එහි සතරවෙනි මුව සමූහයා මෙසේ සිතූහ. ‘යම් ඒ පළමුවෙනි මුව සමූහය මුව වැද්දන්ගේ තණ කොටුවට වැද සිහි මුළාවූවාහු ආහාර අනුභව කළාහුය. ඔව්හු එහි ඇතුල්ව

සිහි මුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු ඒ තෘණ කොටුවෙහි මුව වැද්දාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියාහුය.’ මෙසේ ඒ පළමුවෙනි මුව සමූහය මුව වැද්දාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. යම් ඒ දෙවෙනි මුව සමූහය මෙසේ සිතුවාහුද ‘අපි සම්පූර්ණයෙන් තෘණ කොටු ආහාරයෙන් වෙන්වෙමු නම් භයින් අනුභව කළ යුතු ආහාරයෙන් වෙන්ව වනයට වැද වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙකැයි’ (කියායි) ඔව්හු තණ කොටු ආහාරයෙන් සම්පූර්ණයෙන් වෙන්වූහ. භයින් අනුභව කළයුතු ආහාරයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේය. ඉතා කෙට්ටු බවට පැමිණි ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි මුව වැද්දාගේ ඒ තණ කොටුවට ආපසු පැමිණියහ.

8. “ඔව්හු එහි වැද සිහිමුළාවූවාහු ආහාර අනුභව කළහ. ඔව්හු එහි වැද සිහි මුළාව ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු ඒ තණ කොටුවෙහි මුව වැද්දාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ ඒ දෙවෙනි මුව සමූහයද මුවන් අල්ලන්නාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. (එහෙයින්) අපි මුවන් අල්ලන්නාගේ තණ කොටුවට නුදුරු සැඟවෙන තැනක් කොට වාසය කරන්නෙමු. එසේ වාසය කොට මුවන් අල්ලන්නාගේ තණ කොටුවට ඇතුළු නොවී සිහි මුළානොවී ආහාර අනුභව කරන්නෙමු. ඇතුළු නොවී සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණෙන්නෙමු. මත් නොවූවෝම ප්‍රමාදයට නොපැමිණෙන්නෙමු. ප්‍රමායට නොපැමිණියෝම ඒ තණ කෙටුවෙහි මුව වැද්දාගේ කැමැත්තක් කළහැකි බවට නොපැමිණෙන්නෙමු’ (කියාය)

9. “ඔව්හු මුවවැද්දාගේ තණකොටුවට නුදුරු සැඟවෙන තැනක් කොට වාසය කළාහුය. වාසය කොට මුව වැද්දාගේ

තණකොටුවට ඇතුළු නොවී සිහි මුළා නොවී ආහාර අනුභව කළාහුය. සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණියාහුය. මත් නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු ඒ තණකොටුවෙහි මුව වැද්දාගේ කැමැත්තක් නොකළහැකි බවට පැමිණියහ.

"මහණෙනි, එහි මුව වැද්දාටද ඔහුගේ පිරිසටද මෙබඳු සිතක්විය. 'මේ තුන්වන මුව සමූහය කයිරාටිකය, කපටිය, මේ තුන්වන මුව සමූහයා ඍද්ධි ඇත්තවුන් වැනිය, යක්ෂයන් වැනිය. ඔව්හු තණකොටුවේ තණද අනුභව කරත්. ඔවුන්ගේ ඊම හෝ යාම හෝ නොදනිමු. අපි යම් හෙයකින් මේ තණ කොටුව හාත්පස දැලකින් වටකරන්නෙමු නම් ඉතා යෙහෙක. යම් තැනෙක ඔව්හු ලැගීමට යන්නාහුද මේ තුන්වන මුව සමූහයාගේ වාසස්ථානය දක්නෙමු නම් ඉතා යෙහෙක' (කියායි)

**10.** 'ඔව්හු මහත් දැලකින් තණකොටුව හාත්පස මහත් ප්‍රදෙශයක් වටකළාහුය.

"මහණෙනි, මුව වැද්දාද ඔහුගේ පිරිසද ඒ තුන්වන මුව සමූහය යම් තැනක ලගිද්ද ඒ තැන් දුටුවාහුය. මහණෙනි, ඒ තුන්වන මුව සමූහයද මෙසේ ඒ මුව වැද්දාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"යම් විධියකින් මුව වැද්දාද ඔහුගේ පිරිසද යම්තැනකට යා නොහැක්කේද අපි එබඳු තැනක් වාසස්ථාන කරන්නෙමු නම් එහි වාසය කොට මුව වැද්දාගේ තණකොටුවට නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කරන්නෙමු නම් නොවැද මුළානොවී ආහාර අනුභව කරන්නෙමු නම් මත්වීමට නොපැමිණෙන්නෙමු නම් මත් නොවූවෝම ප්‍රමාදයට නොපැමිණෙන්නෙමු නම් ප්‍රමාදයට නොපැමිණියෝම මේ තණ කොටුවෙහි මුව වැද්දාගේ කැමැත්තක් කළහැකි බවට නොපැමිණෙන්නෙමු නම් යහපත් යයි සිතූහ. යම් තැනකට මුවවැද්දාද ඔහුගේ පිරිසද නොයන්නේද ඒ ස්ථානය වාසස්ථාන කරගත්හ. එහි වාසය කරමින් මුවවැද්දාගේ තණ කොටුවට නොවැද සිහි මුළානොවී ආහාර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අනුභව කළහ. තණ කොටුවට නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණියාහුය. මත්වීමට නොපැමිණියාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු ඒ තණ කොටුවෙහි මුවවැද්දාගේ කැමැත්තක් නොකළහැකි බවට පැමිණියාහ.

11. "මහණෙනි, මුවවැද්දාටද ඔහුගේ පිරිසටද මෙසේ කල්පනා විය. 'මේ හතරවෙනි මුව සමූහයා කයිරාටිකය කපටිය. මේ හතරවැනි මුව සමූහයා ඍද්ධි ඇත්තවුන් වැනිය. යක්ෂයන් වැනිය. ඔව්හු තණකොටුවද අනුභවකරත්. ඔවුන්ගේ ඊම හෝ යාම හෝ නොදනිමු. අපි යම්හෙයකින් තණ කොටුව හාත්පස මහත් ප්‍රදෙශයක් මහත් දැලකින් වට කරන්නෙමු නම් ඉතා යෙහෙක. යම් තැනෙක ඔව්හු ලගිද්ද මේ හතරවෙනි මුව සමූහයාගේ වාසස්ථානය දක්නෙමු නම් ඉතා යෙහෙක' (කියායි) ඔව්හු ඒ තණකොටුව හාත්පස මහත් ප්‍රදේශයක් මහත් දැළකින් වටකළාහුය. මහණෙනි, මුවවැද්දාද ඔහුගේ පිරිසද ඒ මුව සමූහයාගේ වාසස්ථානය නුදුටුවාහුය.

12. "මහණෙනි, ඒ මුවවැද්දාටද ඔහුගේ පිරිසටද මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් අපි මේ සතරවැනි මුව සමූහයා කලබල කරන්නෙමු නම් කලබල කරනු ලැබූ ඔව්හු දුර සිටින අන්‍ය මුවන්ද කලබල කරන්නාහ. ඒ මුවෝද කලබල වූවාහු අන්‍යයන්ද කලබල කරන්නාහ. එසේ වූවිට මේ තණ කොටුව සම්පූර්ණයෙන් මුවන්ගෙන් හිස් වන්නේය. යම් හෙයකින් අපි සතරවෙනි මුව සමූහයා කෙරෙහි උපේක්ෂා වන්නෙමු නම් ඉතා යෙහෙකැයි' කියායි මහණෙනි, මුව වැද්දාද මුවවැද්දාගේ පිරිසද සතරවැනි මුව සමූහයා කෙරෙහි උපේක්ෂාවූහ, මහණෙනි, මෙසේ වනාහි ඒ සතරවැනි මුව සමූහයා මුවවැද්දාගේ උපක්‍රම බලයෙන් මිදුනාහ.

13. "මහණෙනි අර්ථය ඇඟවීමට මා විසින් මේ උපමාව දක්වන ලදී. මෙහි අර්ථය මෙසේය. මහණෙනි, තණ කොටුව යනු පංචකාම ගුණයට නමෙකි. මහණෙනි, මුවවැද්දා යනු පාපීවූ මාරයාට නමෙකි. මහණෙනි, ඔහුගේ පිරිස යනු මාර

පිරිසට නමෙකි. මහණෙනි, මුව සමූහයා යනු මහණ බමුණන්ට නමෙකි.

"මහණෙනි, පළමුවෙනි මහණ බමුණෝ මාරයා විසින් වවන ලද තණ කොටුව නමැති පංචකාමය සිහි මුළාවූවාහු අනුභව කළහ. ඔව්හු එහි සිහි මුළාව පස්කම් සැප අනුභව කිරීමෙන් මත්වීමට පැමිණියහ. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු පඤ්චකාමය නමැති තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියාහ.

"මහණෙනි, මෙසේ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. මහණෙනි, පළමුවෙනි මුව සමූහය යම්සේද, මහණෙනි මේ පළමුවෙනි මහණ බමුණන්ද එබඳුයයි කියමි.

14. "මහණෙනි, එහි දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ සිතූහ. යම් ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයා විසින් වවන ලද පඤ්චකාම තණ කොටුවට ඇතුල්ව සිහිමුළා වූවාහු ආහාර අනුභව කළාහුද ඔව්හු එහි සිහි මුළාව පඤ්චකාමය නමැති ආහාර අනුභව කළාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. මේ පඤ්චකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණිහ. මෙසේ ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්ණයෝ මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"යම් හේතුවකින් අපි සියලු ආකාරයෙන් පඤ්චකාමය නම්වූ තණ කොටු භෝජනයෙන් වළකින්නෙමු නම් භය සහිත භෝජනයෙන් වෙන්ව මහවනයට වැද වසන්නෙමු නම් ඉතා යෙහෙක. (කියායි) ඔව්හු සම්පූර්ණයෙන් පංචකාම භෝජනයෙන් වෙන් වූවාහුය. භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය. ඔව්හු එහි අමුකොළ බුදින්නෝද වූහ. බඩහමු (අමු) බුදින්නෝද වූහ, උෟරුහැල් අනුභව කරන්නෝද වූහ, සම් කසට අනුභව කරන්නෝද වූහ, ගස්මැලියම් අනුභව කරන්නෝද වූහ, කුඩු අනුභව කරන්නෝද වූහ, දඹු බත් අනුභව කරන්නෝද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වූහ, තණ කොළ අනුභව කරන්නෝද වූහ, ළපටි වස්සන්ගේ ගොම අනුභව කරන්නෝද වූහ, වැටුන ගෙඩි අනුභව කරන්නෝද වූහ, වන මුල් ඵල අනුභව කරමින්ද ජීවත් වූහ. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෙට්ටු විය. ඉතා කෙට්ටුවූ ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි සමාධියෙන් පිරිහුනාහ. සමාධියෙන් පිරිහුන හෙයින් මාරයා විසින් වවන ලද ඒ පංචකාම තණ කොටුවට නැවත පැමිණියහ. ඔව්හු එහි වැද සිහි මුළාවූවාහු පංචකාමය නමැති ආහාර අනුභව කළහ. ඔව්හු එහි වැද සිහිමුළාව පංචකාම ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාමය නමැති තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මහණෙනි, මෙසේ දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය. මහණෙනි, මම දෙවෙනි මුව සමූහය යම්සේද මේ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයන්ද මෙබඳු යයි කියමි.

15. "මහණෙනි, තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මෙසේ සිතූහ.' පළමුවෙනි මහණ බමුණෝ මාරයා විසින් වවන ලද ඒ පංචකාමය නමැති තණ කොටුවට වැද සිහිමුළා වූවාහු පංචකාම නම්වූ ආහාර අනුභව කළහ. ඔව්හු එහි සිහි මුළාව ආහාර අනුභව කළාහු මත්වීමට පැමිණියහ. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාම නමැති තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ ඒ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"යම් ඒ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මෙසේ සිතුවාහුද 'යම් ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා 'මාරයා විසින් වවන ලද පංචකාමය නමැති තණකොටුවට වැද සිහි මුළා වූවාහු පංචකාමය නමැති භොජනය අනුභව කළාහුද ඔව්හු එහි සිහිමුළාව ආහාර අනුභව කළාහු මත්වූවාහුය. මත්වූවාහු

ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

**16.** "යම් හේතුවකින් අපි සියලු ආකාරයෙන් පඤ්චකාම තණකොටු භෝජනයෙන් වළකින්නෙමු නම් භයසහිත භෝජනයෙන් වෙන්ව වනයට වැද වසන්නෙමුනම් ඉතා යෙහෙක. (කියායි) (මෙසේ) ඔව්හු සම්පූර්ණයෙන් පඤ්චකාමය නමැති තණකොටු භෝජනයෙන් වෙන් වූවාහුය. භය සහිත භෝජනයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය. ඔව්හු එහි අමු කොළ බුදින්නෝවූහ. බඩහමු (අමු) බුදින්නෝවූහ. උරුහැල් බුදින්නෝවූහ. සම් කසට බුදින්නෝවූහ. ගස් මැලියම් බුදින්නෝ වූහ. කුඩු බුදින්නෝ වූහ. දඹු බත් බුදින්නෝ වූහ. තණකොළ බුදින්නෝ වූහ. ළපටි වස්සන්ගේ ගොම බුදින්නෝ වූහ. වැටුන ගෙඩි අනුභව කරන්නෝ වූහ. වන මුල් ඵල අනුභව කරන්නාහු ජීවත්වූහ. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීර ඉතා කෙට්ටු විය. ඉතා කෙට්ටුවූ ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි සමාධිය පිරිහුනේය. සමාධිය පිරිහුන හෙයින් මාරයා විසින් වවන ලද එම පඤ්චකාම තණ කොටුවට නැවත පැමිණියහ. ඔව්හු එහි වැද සිහි මුළා වූවාහු පංචකාම තණ කොටුවල ආහාරය අනුභව කළහ, ඔව්හු එහි වැද සිහි මුළාව පඤ්චකාම ආහාර අනුභව කරන්නාහු මත්වූවාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාද වූවාහු මේ පඤ්චකාම තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ මේ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

**17.** "මේ මාරයා විසින් වවනලද පංචකාම නමැති තණ කොටුවට නුදුරුව සැඟවෙන තැනක්කොට (එහි නොවැද) වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙක. එහි වාසය කරමින් මාරයා විසින් වවනලද පඤ්චකාම තණකොටුවට නොවැද

සිහි මුළානොවී ආහාර අනුභව කරන්නෙමු එහි නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කරන්නමෝ මත්වීමට නොපැමිණෙන්නෙමු. මත්වීමට නොපැමිණෙන්නමෝ මේ පඤ්චකාම තණ කොටුහි මාරයාගේ කැමැත්තක් නොකළ හැකි බවට පැමිණෙන්නෙමු' (කියායි) ඔව්හු මාරයාගේ පඤ්චකාම තණකොටුවට නුදුරුව සැඟවෙන තැනක් කොට (එහි නොවැද) වාසය කළාහුය. එහි වාසය කරමින් මාරයා විසින් වවනලද පඤ්චකාම තණ කොටුවට නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කළාහුය. සිහි මුළානොවී ආහාර අනුභව කළාහු මත්වීමට නොපැමිණියහ. මත්නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු මේ පඤ්චකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් නොකළ හැකි බවට පැමිණියාහුය.

18. "එසේද වුවත් මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වූහ. ලෝකය සදාකාලිකය කියාද, ලෝකය සදාකාලික නොවේය කියාද, ලෝකය කෙළවර නැත්තේය කියාද ලෝකය කෙළවරක් ඇත්තේය කියාද, එයම ජීවිතය වෙයි. එයම ශරීරය වෙයි, කියාද, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියාද, සත්ත්වයා මරණින් මතු ඇත්තේය කියාද සත්ත්වයා මරණින් මතු නැත්තේය කියාද සත්ත්වයා මරණින් මතු ඇත්තෙත් නැත. නැත්තෙත් නැත කියාද සත්ත්වයා මරණින් මතු නොම ඇත්තේය නොම ඇත්තෙත් නොවන්නේය කියාද වෙති, මහණෙනි, මෙසේ ඒ තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝද මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

19. "මහණෙනි, තුන්වෙනි මුව සමූහය යම්සේද මේ තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයන් එබඳුයයි මම කියමි.

"මහණෙනි, එහි සතරවැනි මහණ බමුණෝ මෙසේ සිතූහ. 'පළමුවෙනි මහණ බමුණෝ සිහි මුළාව මාරයා විසින් වවනලද පඤ්චකාම නම්වූ ආහාර අනුභව කළාහු මත්වීමට පැමිණියහ. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු පංචකාම තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි

බවට පැමිණියාහුය. මෙසේ ඒ පළමු වැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.'

"යම් ඒ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ සිතුවාහුද යම් ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයා විසින් වවනලද පඤ්චකාම තණ කොටුවෙහි වැද සිහි මුළා වූවාහු පඤ්චකාමය අනුභව කළාහුද ඔව්හු එහි මුළාව ආහාර අනුභව කළාහු මත් වූවාහුය. මත් වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාම තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියාහුය. මෙසේ ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

"යම් හේතුවකින් අපි සියලු ආකාරයෙන් පංචකාම භොජනයෙන් වළකින්නෙමු නම් භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වසන්නෙමු නම් ඉතා යෙහෙක' (කියායි) (මෙසේ) ඔව්හු සම්පූර්ණයෙන් පංචකාම භෝජනයෙන් වෙන්වූවාහු භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය. ඔව්හු එහි අමු කොළ බුදින්නෝද වූහ. බඩහමු (අමු) බුදින්නෝද වූහ. උෟරුහැල් බුදින්නෝද වූහ. සම් කසට බුදින්නෝද වූහ. ගස්මැලියම් බුදින්නෝද වූහ. කුඩු බුදින්නෝද වූහ. දඹුබත් බුදින්නෝද වූහ. තණකොළ බුදින්නෝද වූහ. ළපටි වස්සන්ගේ ගොම බුදින්නෝද වූහ. වැටුන ගෙඩි අනුභව කරන්නෝද වූහ. වන මුල් පල අනුභව කරමින්ද ජීවත් වූහ. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගියකල්හි ඔවුන්ගේ ශරීර ඉතා කෙට්ටුවිය. ඉතා කෙට්ටුවූ ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි සමාධිය පිරිහුනේය. සමාධිය පිරිහුන හෙයින් මාරයා විසින් වවනලද පංචකාම කොටුවට නැවත පැමිණියහ. ඔව්හු එහි වැද සිහි මුළා වූවාහු ආහාර අනුභව කළහ. ඔව්හු එහි වැද සිහි මුළාව, ආහාර අනුභව කරන්නාහු. මත් වූවාහුය, මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදවූවාහු මේ පංචකාම තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියාහුය. මෙසේ මේ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

"අපි මේ මාරයා විසින් වචනලද පංචකාම තණකොටුවට නුදුරුව සැඟවී සිටින තැනක්කොට එහි නොවැද වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙක. එහි වාසය කරමින් මාරයා විසින් වචනලද පංචකාම තණ කොටුවට නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කරන්නෙමු නම් එහි නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කරන්නමෝ මත්වීමට නොපැමිණෙන්නෙමු නම් මත්වීමට නොපැමිණෙන්නමෝ ප්‍රමාදයට නොපැමිණෙන්නෙමු නම් ප්‍රමාදයට නොපැමිණෙන්නමෝ මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට නොපැමිණෙන්නෙමු නම් ඉතා යෙහෙක. (කියායි.) ඔව්හු මාරයා විසින් වචනලද පංචකාම තණ කොටුවට නොවැද එහි වාසය කළාහුය. එහි වාසය කරමින් මාරයාගේ පංචකාම තණකොටුවට නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කළාහුය. සිහි මුළා නොවී ආහාර අනුභව කළාහු මත්වීමට නොපැමිණියහ. මත් නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් නොකළ හැකි බවට පැමිණියාහුය.

එසේද වුවත් ඔව්හු මෙබඳු දෘෂ්ටි ඇත්තෝවූහ. ලෝකය සදාකාලිකය කියාද, ලොකය සදාකාලික නොවේය කියාද, ලොකය කෙළවර ඇත්තේය කියාද, ලෝකය කෙළවර නැත්තේය. එයම ජීවිතය වෙයි, එයම ශරීරය වෙයි කියාද ජීවිතය අනිකෙක ශරීරය අනිකෙක කියාද සත්ත්වයා මරණින් මතු ඇත්තේය කියාද සත්ත්වයා මරණින් මතු නැත්තේය කියාද සත්වයා මරණින් මතු ඇත්තේත් නැත. නැත්තේත් නැත කියාද සත්ත්වයා මරණින්මතු නොම ඇත්තේය. නොම ඇත්තේත් නොවන්නේය කියාද වෙති. මහණෙනි, මෙසේ ඒ තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. මහණෙනි, ඒ තුන්වැනි මුව සමූහය යම්සේද මම මේ තුන්වැනි මහණ බමුණු සමූහයත් එබඳුයයි කියමි.

**20.** "මහණෙනි, ඒ සතරවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ සිතූහ. පළමුවෙනි මහණ බමුණෝ මාරයා විසින් වචනලද

තණකොටුව නමැති පංචකාමය සිහි මුළාවූවාහු අනුභවකළහ. ඔව්හු එහි සිහිමුළාව පස්කම් සැප අනුභව කළාහු මත්වීමට පැමිණියහ. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු පංචකාමය නමැති තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියාහ. මෙසේ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය. එහි දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ සිතූහ. යම් ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයා විසින් වවනලද ඒ පංචකාම තණ කොටුවට ඇතුල්ව සිහි මුළාවූවාහු ආහාර අනුභව කළාහුද ඔව්හු එහි සිහිමුළාව පංචකාමය නමැති ආහාර අනුභවකළාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"යම් හේතුවකින් අපි සියලු ආකාරයෙන් පඤ්චකාමය නම්වූ තණ කොටු භෝජනයෙන් වළකින්නෙමු නම් භය සහිත භෝජනයෙන් වෙන්ව, මහ වනයට වැද වසන්නෙමු නම් ඉතා යෙහෙක' (කියායි) ඔව්හු සම්පූර්ණයෙන් පංචකාම භොජනයෙන් වෙන් වූවාහුය. භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය.

"ඔව්හු එහි අමුකොළ බුදින්නෝද වූහ. බඩහමු (අමු) බුදින්නෝද වූහ, ඌරුහැල් බුදින්නෝද වූහ, කුඩු බුදින්නෝද වූහ. දඹුබත් බුදින්නෝද වූහ, තණකොළ බුදින්නෝද වූහ, ළපටි වස්සන්ගේ ගොම බුදින්නෝද වූහ. වැටුන ගෙඩි අනුභව කරන්නෝද වූහ. වන මුල් ඵල අනුභව කරමින්ද ජීවිකාව කළාහ. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීර ඉතා කෙට්ටුවිය. ඉතා කෙට්ටුවූ ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හි සමාධියෙන් පිරිහුනාහ. සමාධියෙන් පිරිහුන හෙයින් මාරයා විසින් වවන ලද ඒ පංචකාම තෘණ කොටුවට නැවත පැමිණ එහි වැද සිහි මුළාවූවාහු පංචකාමය නමැති ආහාර අනුභව

කළහ. ඔව්හු එහි වැද සිහි මුළාව පංචකාම ආහාර අනුභව කරන්නාහු මත්වීමට පැමිණියාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාමය නමැති තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

21. "යම් ඒ තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මෙසේ සිතූහ. 'පළමුවෙනි මහණ බමුණෝ මාරයා විසින් වවන ලද ඒ පංචකාමය නමැති තණ කොටුවට වැද සිහි මුළා වූවාහු පංචකාම නම්වූ ආහාර අනුභව කළාහු මත්වීමට පැමිණියහ. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාමය නමැති තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

"යම් ඒ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මෙසේ සිතුවාහුද 'යම් ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මාරයා විසින් වවන ලද පංචකාමය නමැති තණ කොටුවට වැද සිහි මුළා වූවාහු පංචකාමය නමැති භොජනය අනුභව කළාහුද ඔව්හු එහි සිහි මුළාව ආහාර අනුභව කළාහු මත්වූවාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාදයට පැමිණියාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට පැමිණියහ. මෙසේ ඒ පළමුවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

"යම් හේතුවකින් අපි සියලු ආකාරයෙන් පංචකාම තණකොටු භොජනයෙන් වළකින්නෙමු නම් භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වසන්නෙමු නම් ඉතා යෙහෙක' (කියායි) (මෙසේ) ඔව්හු සම්පූර්ණයෙන් පංචකාමය නමැති තණකොටු භොජනයෙන් වෙන් වූවාහුය, භය සහිත භොජනයෙන් වෙන්ව වනයට වැද වාසය කළාහුය, ඔව්හු එහි අමු කොළ බුදින්නෝද වූහ, බඩහමු (අමු) බුදින්නෝද වූහ, උආරුහැල් බුදින්නෝද වූහ,

සම් කසට බුදින්නෝද වූහ, ගස් මැලියම් බුදින්නෝද වූහ. කුඩු බුදින්නෝද වූහ, දඹු බත් බුදින්නෝද වූහ, තණකොළ බුදින්නෝද වූහ, ළපටි වස්සන්ගේ ගොම බුදින්නෝද වූහ, වැටුන ගෙඩි අනුභව කරන්නෝද වූහ, වනමුල් ඵල අනුභව කරමින්ද ජීවත්වූහ. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි තණ හා ජලය අවසන්ව ගිය කල්හි ඔවුන්ගේ ශරීර ඉතා කෙට්ටු විය. ඉතා කෙට්ටුවූ ශරීර ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුනේය. ශක්තිය පිරිහුන කල්හිසමාධිය පිරිහුනේය. සමාධිය පිරිහුන හෙයින් මාරයා විසින් වවනලද එම පංචකාම තණ කොටුවට නැවත පැමිණියහ. ඔව්හු එහි වැද සිහි මුළා වූවාහු පංචකාම තණ කොටු ආහාරය අනුභව කළහ. ඔව්හු එහි වැද සිහි මුළාව, පංචකාම ආහාර අනුභව කරන්නාහු මත්වූවාහුය. මත්වූවාහු ප්‍රමාදයට පැමිණියාහුය. ප්‍රමාද වූවාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට පැමිණියහ. මෙසේ මේ දෙවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝද මාරයාගේ උපක්‍රමයෙන් නොමිදුනාහුය.

22. "මේ මාරයා විසින් වවනලද පංචකාමය නමැති තණ කොටුවට නුදුරු සැඟවෙන තැනක්කොට (එහි නොවැද) වාසය කරන්නෙමු නම් ඉතා යෙහෙක. එහි වාසය කරමින් මාරයා විසින් වවනලද පංචකාම තණ කොටුවෙහි නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නෙමු. එහි නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නමෝ මත්වීමට නොපැමිණෙන්නෙමු. ප්‍රමාදයට නොපැමිණෙන්නමෝ මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් නොකළ හැකි බවට පැමිණෙන්නෙමු' (කියායි) ඔව්හු මාරයාගේ පංචකාම තණ කොටුවට නුදුරු සැඟවෙන තැනක් කොට (එහි නොවැද) වාසය කළාහුය. එහි වාසය කරමින් මාරයා විසින් වවනලද පංචකාම තණ කොටුවට නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කළාහුය. සිහි මුළා නොවී ආහාර අනුභව කළාහු මත්වීමට නොපැමිණියහ. මත් නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු මේ පංචකාම තණ කොටුවෙහි මාරයාගේ කැමැත්තක් නොකළ හැකි බවට පැමිණියාහුය.

'එසේද වුවත් මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වූහ. ලොකය සදාකාලිකය කියාද, ලොකය සදාකාලික නොවේය කියාද, ලොකය කෙළවර නැත්තේය කියාද ලොකය කෙළවරක් ඇත්තේය කියාද, එයම ජීවිතය වෙයි, එයම ශරීරය වෙයි කියාද, ජීවිතය අනිකෙක ශරීරය අනිකෙක කියාද, සත්ත්වයා මරණින් මතු ඇත්තේය කියාද සත්වයා මරණින් මතු නැත්තේය කියාද සත්ත්වයා මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත කියාද, සත්ත්වයා මරණින් මතු නොම ඇත්තේය. නොම ඇත්තේත් නොවන්නේය කියාද වෙති. මෙසේ ඒ තුන්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද මාරයාගේ උපක්‍රම බලයෙන් නොමිදුනාහුය.

'මාරයාත් මාර පිරිසත් යම් තැනකට නොයන්නේද අපි එහි වාසයකරමින් මාරයා විසින් වවනලද පංචකාම තණකොටුවට නොවැද සිහි මුළානොවී ආහාර අනුභව කරන්නෙමු නම්, එහි නොවැද සිහි මුළා නොවී ආහාර අනුභව කරන්නමෝ නම්, මත්වීමට නොපැමිණෙන්නෙමු නම් මත් නොවන්නමෝ ප්‍රමාදයට නොපැමිණෙන්නෙමුනම් ප්‍රමාද නොවන්නමෝ මාරයාගේ කැමැත්තක් කළ හැකි බවට නොපැමිණෙන්නෙමු නම් ඉතා යෙහෙකැයි' (කියායි.)

"යම් තැනකට මාරයාද මාර පිරිසද නොපැමිණෙද්ද ඔව්හු එහි වාසයට ගියාහුය. එහි වාසය කරමින් මාරයාගේ පංචකාම තණකොටුවට නොවැද සිහි මුලානොවී ආහාර අනුභව කරන්නාහු මත්වීමට නොපැමිණියාහුය. මත් නොවූවාහු ප්‍රමාදයට නොපැමිණියාහුය. ප්‍රමාදයට නොපැමිණියාහු පංචකාම තණකොටුවෙහි මාරයාගේ කැමැත්තක් කළහැකි බවට නොපැමිණියහ. මහණෙනි, මෙසේ ඒ සතර වැනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහය මාරයාගේ උපක්‍රම බලයෙන් මිදුනාහුය. මහණෙනි සතරවෙනි මුව සමූහය යම්සේද, මේ සතරවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයද එබඳු යයි මම කියමි.

23. "මහණෙනි, මාරයාගේත් මාර පිරිසගේත් නොපැමිණීම නම් කෙසේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම

විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ මහණ තෙම මාරයාගේ ඇස අන්ධ කළේයයි ද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශ කොට නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති හිතේ එකඟ බව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ මහණ තෙම මාරයාගේ ඇස අන්ධ කෙළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයි ද කියනු ලැබේ.

'මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපේක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්යයෝ යම් ඒ තෘතීය ධ්‍යානයක් උපේක්ෂා ඇති සිහි ඇති සැප විහරණ ඇත්තේ යයි කියද්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසයකරයිද. මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධකෙළේයයිද පිහිටක් නැති සේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද, (ධ්‍යානය ලැබීමට) පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපේක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතර වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ මහණ තෙම මාරයාගේ ඇස අන්ධ කෙළේයයිද මාරයාගේ ඇස පිහිටක් නැතිසේ නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

**24.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥාවන් නැති කිරීමෙන් (නොයෙක්) සංඥාවන් සිහි නොකිරීමෙන්

ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධ කළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධ කළේයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධ කළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධ කළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරයිද මාර්ග ප්‍රඥාවෙන් දැක ඔහුගේ ආශ්‍රවයෝ (කෙලෙස්) නැතිකරන ලද්දාහු වෙත්ද, මහණෙනි, මේ මහණතෙම මාරයාගේ ඇස අන්ධ කළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා මාරයාගේ නොපෙනීමට ගියේයිද ලොකයෙහි ඇලෙන්නාවූ තෘෂ්ණාවෙන් එතරවූයේයයිද කියනු ලැබේ."

පටුන



භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

(පස්වෙනිවූ නිවාප සූත්‍රය නිමි.) (3-5)

---

## 26. අරියපරියෙසන සූත්‍රය.

1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කළහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ සිවුරු හා පාත්‍රය ගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩියහ. එකල්හි බොහෝ භික්ෂූහු ආනන්දස්ථවිරයන් වහන්සේ යම් තැනකද එහි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ. "ඇවැත්නි, ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම කථාවක් අසන්ට නොලැබී බොහෝ කල් ගතවිය. ඇවැත්නි, ආනන්දයෙනි, අපි භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම කථාවක් ඇසීමට ලබන්නෙමුනම් ඉතායෙහෙක" (කියායි) "ආයුෂ්මතුනි, එසේවී නම් රම්මක නම් බමුණාගේ ආශ්‍රමය යම් තැනෙක්හිද එතැනට පැමිණෙව්. ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම කථාවක් අසන්නට ලබන්නහුය"යි කීය. "ඇවැත්නි, එසේය." කියා ඒ භික්ෂූහු ආනන්ද ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිර බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුනේ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථා කළහ. "ආනන්දයෙනි, මිගාරමාතා ප්‍රාසාදනම්වූ පූර්වාරාම විහාරය යම් තැනෙක්හිද, දවල්කාලයේ වාසය සඳහා එහි යමු" යි (කීහ) ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'එසේය ස්වාමීනි,' කියා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමග මිගාර මාතා ප්‍රාසාද නම්වූ පූර්වාරාමය යම් තැනෙක්හිද එතැන්හි දවල් කාලයේ වාසය පිණිස වැඩියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගිට ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකොට ආනන්දය, ඇඟසෝදා ගනු සඳහා නැගෙනහිර නාන කොටුවට යමු'යි කීහ. 'එසේය ස්වාමීනි'යි ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේද සමග නැගෙනහිර නාන කොටුවට වැඩියහ. වැඩ, ඇඟ සෝදා ගොඩනැඟී ඇඟදිය සිඳුවමින් එකම හඳනා සිවුරෙන් යුක්තව වැඩසිටියහ.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි මේ රම්මක නම් බමුණාගේ ආශ්‍රමය සමීපයෙහි වේ. ස්වාමීනි, රම්මක නම් බමුණාගේ ආශ්‍රමය සිත් ගන්නේය. ස්වාමීනි, රම්මක බ්‍රාහ්මණයාගේ ආශ්‍රමය දුටුවන් පහදවන්නේය. ස්වාමීනි, රම්මක බමුණාගේ ආශ්‍රමය යම්තැනෙක්හිද අනුකම්පා කොට එහි වඩිනු මැනවි." භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රම්මක බමුණාගේ ආශ්‍රමය යම් තැනෙක්හිද එතැනට වැඩියහ. එකල්හි බොහෝ භික්ෂූහු රම්මක බමුණාගේ ආශ්‍රමයට වී දැහැමි කථාවෙන් යුක්තව උන්නාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ කථාවේ අවසානය බලාපොරොත්තු වෙමින් දොරටුවෙන් පිටත වැඩ සිටියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කථා කෙළවර දැන කාරා දොර අගුල සමීපයට තට්ටු කළහ. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දොර හැරියාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රම්මක බමුණාගේ ආශ්‍රමයට ඇතුල්ව පණවන ලද බුද්ධාසනයෙහි වැඩඋන්හ. වැඩහිඳ, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගෙන් මෙසේ ඇසූහ. "මහණෙනි, තෙපි දැන් කිනම් කථාවකින් යුක්තව සිටියහුද? තොපගේ කිනම් අතුරු කථාවක් අඩාල වීද?" (කියාය) "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේම අරභයා පැවති අපගේ දැහැමි කථාව අඩාල විය. එවිට, භාග්‍යවතුන් වහන්සේ වැඩිසේක්ය"යි (කීහ) "මහණෙනි, මැනවි, තොපි දැහැමි කථාවෙන් යුක්තව

හුන්නාහුය, යන මේ කාරණය ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ කුලපුත්‍රවූ තොපට සුදුසු මැයි. මහණෙනි රැස්වූ තොප විසින් දැහැමි කථාවක් පැවැත්වීම හෝ ආර්යවූ තුෂ්ණිම්භාවය හෝ යන දෙකින් එකක් කටයුතුයි.”

3. “මහණෙනි, මේ සෙවීම් දෙකකි. ආර්යයන් විසින් කටයුතු සෙවීමය. අනාර්යයන් (පෘථග්ජනයන්) විසින් කටයුතු සෙවීමය යන මේ දෙකයි. මහණෙනි, ආර්ය පර්යේෂණ (ආර්යයන් විසින් කටයුතු සෙවීම) යනු කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් තෙමේ ජාතිය ස්වභාව කෙට ඇත්තෙක්ව ජාතිය ස්වභාවකොට ඇතියක්ම සොයයි. ජරාව ස්වභාව කොට ඇත්තෙක්ව ජරාව ස්වභාව කොට ඇතියක්ම සොයයි. තෙමේ ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇත්තක්ම සොයයි. තෙමේ මරණය ස්වභාව කොට ඇත්තෙක්ව මරණය ස්වභාවකොට ඇත්තක්ම සොයයි. තෙමේ ශොකය ස්වභාව කොට ඇත්තෙක්ව ශොකය ස්වභාව කොට ඇතියක්ම සොයයි. තෙමේ කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තෙක්ව කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තක්ම සොයයි.

4. “මහණෙනි, කුමක් ජාතිය ස්වභාවකොට ඇත්තකැයි කියව්ද? මහණෙනි, අඹු දරුවන් ජාතිය ස්වභාව කොට ඇත්තකි. දාසි දාසයන් ජාතිය ස්වභාව කොට ඇත්තකි. එළු-බැටළුවන් ජාතිය ස්වභාව කොට ඇත්තකි. කුකුළන් ඌරන් ජාතිය ස්වභාව කොට ඇත්තකි. ඇත්, අස්, ගව, වෙළඹුන් ජාතිය ස්වභාව කොට ඇත්තකි. රන් රිදී ජාතිය ස්වභාවකොට ඇත්තකි. මහණෙනි, මේ ජාතිය ස්වභාවකොට ඇති ධර්මයෝ උපධීහු නම් වෙත්. මෙහි ගිලුනාවූ මූර්ඡාවූ බැසගත්තාවූ මේ සත්ත්ව තෙමේ තමා ජාතිය ස්වභාව කොට ඇත්තෙක්ව ජාතිය ස්වභාව කොට ඇත්තක්ම සොයයි.

“මහණෙනි, කුමක් ජරාව ස්වභාව කොට ඇත්තකැයි කියව්ද? අඹු දරුවන් ජරාව ස්වභාව කොට ඇත්තකි. දාසි දාසයන් ජරාව ස්වභාවකොට ඇත්තකි. එළු-බැටළුවන් ජරාව ස්වභාව කොට ඇත්තකි. කුකුළන්, ඌරන් ජරාව ස්වභාව කොට ඇත්තකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇත්, අස්, ගව, වෙළඹුන් ජරාව ස්වභාව කොට ඇත්තකි. රන් රිදී ජරාව ස්වභාව කොට ඇත්තකි. මහණෙනි, ජරාව ස්වභාව කොට ඇති ධර්මයෝ උපධීහු නම් වෙත්, මෙහි ගිලුණාවූ මූර්ඡාවූ බැසගත්තාවූ මේ සත්ත්ව තෙමේ තමා ජරාව ස්වභාව කොට ඇත්තෙක්ව ජරාව ස්වභාව කොට ඇත්තක්ම සොයයි.

"මහණෙනි, කුමක් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තකැයි කියව්ද? අඹු දරුවන් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තකි. දාසි දාසයන් ව්‍යාධිය ස්වභාවකොට ඇත්තකි. එළු-බැටළුවන් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තකි. කුකුළන්, ඌරන් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තකි. ඇත්, අස්, ගව, වෙළඹුන් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තකි. රන් රිදී ව්‍යාධි ස්වභාව කොට ඇත්තකි. මහණෙනි, ව්‍යාධි ස්වභාව කොට ඇති ධර්මයෝ උපධීහු නම් වෙත්, මෙහි ගිලුණාවූ මූර්ඡාවූ බැසගත්තාවූ මේ සත්ත්ව තෙමේ තමා ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇත්තක්ම සොයයි.

"මහණෙනි, කුමක් මරණය ස්වභාවකොට ඇත්තකැයි කියව්ද? අඹු දරුවන් මරණය ස්වභාවකොට ඇත්තකි. දාසි දාසයන් මරණය ස්වභාවකොට ඇත්තකි. එළු බැටළුවන් මරණය ස්වභාවකොට ඇත්තකි. කුකුළන්, ඌරන් මරණය ස්වභාවකොට ඇත්තකි. ඇත්, අස්, ගව, වෙළඹුන් මරණය ස්වභාවකොට ඇත්තකි. රන් රිදී මරණය ස්වභාව කොට ඇත්තකි. මහණෙනි මේ මරණය ස්වභාවකොට ඇති ධර්මයෝ උපධීහු නම් වෙත්. මෙහි වෙළුනාවූ මූර්ඡාවූ බැසගත්තාවූ සත්ත්වතෙම මරණය ස්වභාවකොට ඇත්තෙක්ව මරණය ස්වභාවකොට ඇත්තක්ම සොයයි.

"මහණෙනි කුමක් ශොකය ස්වභාව කොට ඇත්තකැයි කියව්ද? අඹුදරුවන් ශොකය ස්වභාවකොට ඇත්තකි. දාසි දාසයන් ශොකය ස්වභාවකොට ඇත්තකි. එළු-බැටළුවන් ශොකය ස්වභාවකොට ඇත්තකි. කුකුළන් ඌරන් ශොකය ස්වභාවකොට ඇත්තකි. ඇත්, අස්, ගව, වෙළඹුන් ශොකය ස්වභාව කොට ඇත්තකි. රන් රිදී ශොකය ස්වභාව කොට

ඇත්තකි. මේ ශොකය ස්වභාවකොට ඇති ධර්මයෝ 'උපධීහු නම්' වෙත්. මෙහි ගැළුණාවූ මූර්ඡාවූ බැසගත්තාවූ, සත්ව තෙමේ, ශොකය ස්වභාව කොට ඇත්තෙක්ව ශොකය ස්වභාවකොට ඇත්තක්ම සොයයි.

"මහණෙනි කුමක් කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තකැයි කියව්ද? අඹුදරුවන් කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තකි. දාසි දාසයන් කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තකි. එළු-බැටළුවන් කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තකි. කුකුළන් ඌරන් කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තකි. ඇත්, අස්, ගව, වෙළඹුන් කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තකි. රන් රිදී කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තකි. මේ කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇති ධර්මයෝ 'උපධීහු නම්' වෙත්. මෙහි ගැළුණාවූ මූර්ඡාවූ බැසගත්තාවූ, මේ සත්ව තෙමේ, කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තෙක්ව කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තක්ම සොයයි. මහණෙනි, මේ අනාර්ය (පෘථග්ජනයන්ගේ) සෙවීමයි.

**5.** "මහණෙනි, ආර්ය පර්යේෂණය (ආර්යයන්ගේ සෙවීම) කවරේද? මහණෙනි, 'මේ ලොකයෙහි ඇතැමෙක් ජාතිය ස්වභාව කොට ඇත්තෙක්ව ජාතිය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැන, ඉපදීමක් නැති, නිරුත්තරවූ, සතර යොගයෙන් මිදුනාවූ නිවණ සොයයි.

"තෙමේ ජරාව ස්වභාවකොට ඇත්තෙක්ව ජරාව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැන, ජරාවක් නැති, නිරුත්තරවූ, සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයයි.

"තෙමේ ව්‍යාධිය ස්වභාව කෙට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැන, ව්‍යාධියක් නැති, නිරුත්තරවූ, සතර යොගයෙන් මිදුනාවූ නිවණ සොයයි.

"තෙමේ මරණය ස්වභාව කොට ඇත්තෙක්ව මරණය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැන මරණයක් නැති, නිරුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"තෙමේ ශොකය ස්වභාව කොට ඇත්තෙක්ව ශොකය ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැන ශොකයක් නැති, නිරුත්තරවූ, සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයයි.

"තෙමේ කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තෙක්ව කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැන කෙලෙස් සහිත ස්වභාවයක් නැති. නිරුත්තරවූ, සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයයි. මහණෙනි, මේ ආර්යවූ සෙවීමයි.

**6.** "මහණෙනි, මමද බුදුවන්නට පෙර බුදුනොවූ බෝසත් වූයේම තෙමේ ජාතිය ස්වභාවකොට ඇත්තෙක්ව ජාතිය ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

"තෙමේ ජරාව ස්වභාවකොට ඇත්තෙක්ව ජරාව ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

තෙමේ ව්‍යාධිය ස්වභාවකොට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

"තෙමේ මරණය ස්වභාව කොට ඇත්තෙක්ව මරණය ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

"තෙමේ ශොකය ස්වභාව කොට ඇත්තෙක්ව ශොකය ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

"තෙමේ කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇත්තෙක්ව කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තක්ම සෙවීමි.

"මහණෙනි, ඒ මට මෙබඳු කල්පනාවක් විය. කුමක් හෙයින් මම ජාතිය ස්වභාවකොට ඇත්තෙක්ව ජාතිය ස්වභාව කොට ඇත්තක්ම සොයන්නෙම්ද? කුමක් හෙයින් ජරාව ස්වභාවකොට ඇත්තෙක්ව ජරාව ස්වභාවකොට ඇත්තක්ම සොයන්නෙම්ද? කුමක් හෙයින් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇත්තක්ම සොයන්නෙම්ද? කුමක් හෙයින් මරණය ස්වභාවකොට ඇත්තෙක්ව මරණය ස්වභාව කොට ඇත්තක්ම සොයන්නෙම්ද? කුමක් හෙයින් ශොකය ස්වභාව

කොට ඇත්තෙක්ව ශොකය ස්වභාව කොට ඇත්තක්ම සොයන්නෙම්ද? කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තෙක්ව කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තෙක්ම සොයන්නෙම්ද? යම් හෙයකින් ජාතිය ස්වභාව කොට ඇත්තාවූ මම ජාතිය ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැක ජාතියක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම්, ජරාව ස්වභාවකොට ඇත්තාවූ මම ජරාව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ජරාවක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම්, ව්‍යාධිය ස්වභාව කොට ඇත්තාවූ මම ව්‍යාධිය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ව්‍යාධියක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම්. මරණය ස්වභාව කොට ඇත්තාවූ මම මරණය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක මරණයක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම්, ශොකය ස්වභාව කොට ඇත්තාවූ මම ශොකය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ශොකයක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම්, කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇති මම කෙලෙස් සහිත බව ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැක කෙලෙස් සහිත ස්වභාවයක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ සොයන්නෙම් නම් හොඳය. (යනුවෙනි.)

7. "මහණෙනි, ඒ මම එයින් ටික කලකට පසු, තරුණ වයස් ඇත්තේම කළුවූ හිසකෙස් ඇත්තේම, පළමුවෙනි වයසෙහි යහපත් යෞවන භාවයෙන් යුක්තවූයේ, නොකැමැතිවූ මවුපියන් අඬද්දී, හිසකෙස් රැවුල් බා කහවත් හැඳගෙන ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදිවීමි. මෙසේ පැවිදිවූ මම කුසල් කුමක් දැයි සොයමින් නිරුත්තරවූ උතුම් නිර්වාණය සොයමින් කාලාම ගොත්‍ර ඇති ආළාර තවුස්තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි, ගොස්, කාලාම ගොත්‍ර ඇති ආළාර තාපසයාට මෙසේ කීයෙමි. "ඇවැත්නි කාලාමයෙනි, මම මේ සස්නෙහි උතුම් හැසිරීමෙහි පිළිපැදීමට කැමැත්තෙමි'යි (යනුයි) මහණෙනි, මෙසේ කී කල්හි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කාලාම නම්වූ ආළාර තෙම මට මෙසේ කීයේය." "යම් තැනක නුවණැත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් ස්වකීය ආචාර්යවරයාගේ ධර්මය දැන ප්‍රත්‍යක්ෂකොට වාසය කරන්නේද මේ ධර්මය තෙම එබඳුය. එහෙයින් ආයුෂ්මත් තෙම වාසය කෙරේවා"යි (යනුවෙනි.)

"මහණෙනි, ඒ මම නොබෝ කලකින් වහාම ඔවුන්ගේ ධර්මය අසා ඉගෙන ගත්තෙමි. මහණෙනි, ඒ මම ඔහු කියූ දෙයට පිළිතුරු දීමට තොල් සෙලවූ පමණින් පිළිතුරු දුන් පමණින් දැනීම ස්ථිරයයි යන වචනයද කියමි. දනිමි, දකිමියිද කියමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ ප්‍රකාශ කරති. මහණෙනි, ඒ මට ආළාරකාලාම තෙම මේ ධර්මය හුදෙක් ඇදහීම් පමණකින් තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට දැන වාසය කරමියි ප්‍රකාශ නොකරයි. ආළාරකාලාම තෙම ඒකාන්තයෙන් මේ ධර්මය දැන දැක වාසය කෙරේය යන අදහස පහළ විය. ඉක්බිති මහණෙනි, මම ආළාරකාලාමයන් වෙත ගොස් මෙසේ ඇසීමි. 'ඇවැත්නි, කාලාමයෙනි, කොපමණකින් තෙමේ මේ ධර්මය දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ ප්‍රකාශ කෙරේදැ'යි (කියාය) මහණෙනි මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම ආකිඤ්චඤ්ඤායතනය දක්වා කීයේය. මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. ආළාරකාලාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. ආළාරකාලාම හට පමණක් වීර්ය ඇත්තේ නොවෙයි. මටද වීර්ය ඇත්තේය. ආළාරකාලාම හට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත්තේය. ආළාරකාලාම හට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි. මටද සමාධිය ඇත්තේය. ආළාරකාලාම හට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි. මටද ප්‍රඥාව ඇත්තේය. ආළාරකාලාමයා යම් ධර්මයක් ප්‍රත්‍යක්ෂකොට දැන වාසය කරමියි කියයි නම් ඒ ධර්මය ප්‍රත්‍යක්ෂකොට දැනගන්නට වීර්ය කරන්නෙම් නම් හොඳය (කියායි.)

"මහණෙනි, ඒ මම නොබෝ කලකින් වහාම ඒ ධර්මය තමාම දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළෙමි. මහණෙනි,

ඉක්බිති මම ආළාරකාලාම තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි, ගොස්, ආළාරකාලාමගෙන් 'ඇවැත්නි, කාලාමයෙනි, මේ ධර්මය තමා ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ'යි ඇසීමි. ඇවැත්නි, මේ ධර්මය මා දැනගෙන ප්‍රකාශ කරන්නේ මෙපමණකින්ය'යි (හෙතෙම කීයේය) 'ඇවැත්නි, මමත් මේ ධර්මය මෙපමණකින් දැනගෙන වාසය කෙරෙමි'යි (කීයෙමි)

"ඇවැත්නි, යම් ඒ අපි ආයුෂ්මතුන් වැනිවූ සමාන බඹසර ඇත්තෙකු දක්නෙමුද ඒ අපට ලාභයෙකි. උතුම් ලාභයකි. මම යම් ධර්මයක් තෙමේම ප්‍රත්‍යක්ෂකොට දැන ඊට පැමිණ ප්‍රකාශකරන්නෙම්ද, ඒ ධර්මය ඔබද තෙමේම ප්‍රත්‍යක්ෂව දැන ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන වාසය කරන්නෙහි නම්, ඒ ධර්මය මමද ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන ප්‍රකාශකරමි. මෙසේ මම යම් ධර්මයක් දනිම් නම් ඔබද එය දන්නෙහිය, ඔබ යම් ධර්මයක් දන්නෙහි නම් මමද ඒ ධර්මය දනිමි. මෙසේ මම යම්බඳුද ඔබත් එබඳුය. ඔබ යම්බඳුද මාත් එබඳුය. ඇවැත්නි, එනු මැනව. දෙදෙනම එක්ව මේ ශිෂ්‍ය සමූහය පාලනය කරමු'යි (කීයේය.) "මහණෙනි, මෙසේ මාගේ ආචාර්යවූම ආළාරකාලාම තෙම අතවැසිවූ මා සම සම තන්හි තැබීය. උසස් පූජායෙන් පිදීය.

"මහණෙනි, ඒ මට මෙසේ සිත්විය. මේ ධර්මය තෙම කලකිරීම පිණිස, නොඇල්ම පිණිස, කෙලෙස් නැති කිරීම පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස, විශෙෂයෙන් දැනගැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි. ආකිඤ්චඤ්ඤායතන බඹලොව ඉපදීම පිණිස පමණක් පවතියි.

"මහණෙනි, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොවේයයි සලකා ඒ ධර්මයෙහි කලකිරීම ඉවත්ව ගියෙමි.

8. "මහණෙනි, ඒ මම කුසල් කුමක්දැයි සොයමින්, නිරුත්තරවූ උතුම් නිර්වාණය සොයමින් උද්දකරාම පුත්ත තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් උද්දකරාම පුත්ත

තාපසයාට මෙසේ කීයෙමි. "ඇවැත්නි, මම මේ ධර්මයෙහි හැසිරෙන්ට කැමැත්තෙමි'යි (කීයෙමි) "මහණෙනි, මෙසේ කී කල්හි උද්දකරාම පුත්ත තෙම මට මෙසේ කීයේය. 'යම් තැනක නුවණැත්තාවූ පුරුෂයෙක් තෙම නොබෝ කලකින් ස්වකීය ආචාර්යවරයාගේ ධර්මය තමාම දැන ප්‍රත්‍යක්ෂකොට වාසය කරන්නේද මේ ධර්මය තෙම එබඳුය එහෙයින් ආයුෂ්මත් තෙම වාසය කෙරේවායි (කියායි.)

"මහණෙනි, ඒ මම නොබෝ කලකින් වහාම ඔවුන්ගේ ධර්මය ඉගෙන ගත්තෙමි.

"මහණෙනි, ඒ මම ඔහුට උත්තර දීමට තොල් සෙලවූ පමණින් වචනයක් කියූ පමණින් දනිමි යන වචනයද දැනීම ස්ථිරය යන වචනයද ප්‍රකාශ කරමි. මම දනිමි. දකිමියි කියමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියතියි කියමි.

"මහණෙනි, ඒ මට මෙබඳු හිතක් විය. උද්දකරාම පුත්ත තෙම මේ ධර්මය හුදෙක් ඇදහීම් පමණකින් තෙමේම ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන වාසය කරමියි ප්‍රකාශ නොකරයි. උද්දකරාම පුත්තෙම ඒකාන්තයෙන් මේ ධර්මය දැන දැන වාසය කෙළේයයි (මට කල්පනා විය) ඉක්බිති මහණෙනි, මම උද්දකරාම පුත්ත යම් තැනකද එතැනට පැමිණියෙමි පැමිණ මෙසේ ඇසීමි.

"ඇවැත් රාමයෙනි, කොපමණකින් මේ ධර්මය තෙමේම ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ ප්‍රකාශ කෙරේදැ'යි (කියාය.) මහණෙනි, මෙසේ කී කල්හි උද්දකරාම පුත්ත තෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා කීයේය. මහණෙනි, ඒ මට මෙසේ සිත්විය. රාමහටම ශ්‍රද්ධා ඇත්තේ නොවෙයි. මට ද ශ්‍රද්ධා ඇත. රාමහටම වීර්ය ඇත්තේ නොවෙයි. මටද වීර්ය ඇත්තේය. රාම හටම සමාධිය ඇත්තේ නොවෙයි. මටද සමාධිය ඇත්තේය. රාමහටම ප්‍රඥාව ඇත්තේ නොවෙයි, මටද ප්‍රඥාව ඇත්තේය. රාම තෙමේ "යම් ධර්මයක් තමන්ම දැන ප්‍රත්‍යක්ෂ කොට වාසය කරමියි' කියයි නම් ඒ ධර්මය තමන්ම ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා වීර්ය කරන්නෙම් නම් යහපත්ය (කියාය)

"මහණෙනි, නොබෝ කලකින් වහාම ඒ ධර්මය මම ද ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළෙමි. 'මහණෙනි, ඉක්බිති මම උද්දකරාම පුත්ත තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් උද්දකරාම පුත්ත හට මෙසේ කීවෙමි. 'ඇවැත් රාමයෙනි, මෙපමණකින් මේ ධර්මය තෙමේම ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන ඊට පැමිණ ප්‍රකාශ කරන්නේදැයි රාම පුත්තගෙන් ඇසීමි. ඇවැත්නි, මේ ධර්මය රාම තෙමේ මෙතෙකින් තෙමේද ප්‍රත්‍යක්ෂකොට දැන ඊට පැමිණ ප්‍රකාශ කෙරේයයි (හෙතෙම කීයේය) ඇවැත්නි, මමත් මේ ධර්මය මෙපමණකින් තමාම ප්‍රත්‍යක්ෂව දැන ඊට පැමිණ වාසය කරමියි කීයෙමි.

"ඇවැත්නි, යම් ඒ අපි ආයුෂ්මතුන් වැනිවූ සමාන බඹසර ඇත්තෙකු දකිමුද ඒ අපට ලාභයෙකි. උතුම් ලාභයකි. මෙසේ යම් ධර්මයක් රාම තෙමේ තමාම ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන ඊට පැමිණ ප්‍රකාශ කෙළේද ඒ ධර්මය ඔබද තමාම ප්‍රත්‍යක්ෂකොට දැන ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කොට දැන ඊට පැමිණ වාසය කරන්නෙහිද, ඒ ධර්මය රාම තෙමේ ප්‍රත්‍යක්ෂ කොට දැනගෙන ඊට පැමිණ ප්‍රකාශ කෙළේය. මෙසේ රාම තෙමේ යම් ධර්මයක් දනියිද ඔබද එය දන්නෙහිය, ඔබ යම් ධර්මයක් දන්නෙහිද රාම තෙමේද ඒ ධර්මය දනියි. මෙසේ රාම යම්බඳුද ඔබත් එබඳුය. ඔබ යම්බඳු ද රාම තෙමේත් එබඳුය. ඇවැත්නි, එව දෙදෙනම එක්ව මේ ශිෂ්‍ය සමූහයා පාලනය කරමුයි (කීයේය.)

"මහණෙනි, මෙසේ එක්ව බඹසර වසන්නෙක්වූ උද්දක රාම පුත්ත තෙමේ මා ආචාර්ය තනතුරෙහි තැබීය. උතුම් පූජායෙන් පිදීය.

"මහණෙනි, ඒ මට මෙසේ සිත් විය. මේ ධර්මයතෙම කලකිරීම පිණිස, නො ඇල්ම පිණිස, කෙලෙස් නැති කිරීම පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස, දැනගැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස, නොපවතියි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන බඹලොව ඉපදීම පිණිස පමණක් පවතියි.

"මහණෙනි, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොකොට ඒ ධර්මයෙහි කලකිරී ඉවත්ව ගියෙමි.

**9.** "මහණෙනි, ඒ මම කුසල් කුමක්දැයි සොයමින් අනුත්තරවූ නිර්වාණය සොයමින් මගධරට පිළිවෙළින් සැරිසරා යන්නෙම් උරුවෙල් දනව්වෙහි සේනානි නම් නියම්ගම යම් තැනෙක්හිද එහි ගියෙමි. එහි ගලායන ගඟ ඇත්තාවූද සුදු වැලිතලා ඇත්තාවූද යහපත් තොටවල් ඇත්තාවූද හාත්පස ගොදුරුගම් ඇත්තාවූද ප්‍රසාදය එළවන්නාවූ සිත් සතුටුකරන්නාවූ වන ලැහැබක් ඇති බිම් පෙදෙසක් දිටිමි. මහණෙනි, ඒ මට මෙසේ සිත් විය. ඒකාන්තයෙන් බිම් පෙදෙස සිත්කලුය, වනලැහැබ ප්‍රසාදය එළවන්නේය, දිය ගලා බස්නා සුදු වැලිතලා ඇති මනා තොටු ඇති ගඟද සිත් කලුය. හාත්පස ගොදුරු ගමද වෙයි. වීර්ය කරන කුලපුත්‍රයෙකුට වීර්ය කිරීම පිණිස මේ ස්ථානය සුදුසුයයි (කියායි.)

"මහණෙනි, ඒ මම වීර්ය කිරීම පිණිස මේ තැන සුදුසු යයි සිතා වීර්යය වැඩීම පිණිස එහිම හිඳගත්තෙමි.

**10.** "මහණෙනි, ඒ මම, තෙමේ ජාතිය ස්වභාවකොට ඇත්තෙක්ව ජාතිය ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැන ජාතියක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිර්වාණය සොයන්නෙම් ජාතියක් නැති අනුත්තරවූ, සතර යොගයෙන් මිදුනාවූ නිවණ අවබොධ කරගතිමි.

"තෙමේ ජරාව ස්වභාවකොට ඇත්තෙක්ව ජරාව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ජරාවක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිර්වාණය සොයන්නෙම් ජරාවක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිවණ අවබොධ කරගතිමි.

"තෙමේ ව්‍යාධිය ස්වභාවකොට ඇත්තෙක්ව ව්‍යාධිය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ව්‍යාධියක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිර්වාණය සොයන්නෙම් ව්‍යාධියක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිවණ අවබොධ කරගතිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"තෙමේ මරණය ස්වභාවකොට ඇත්තෙක්ව මරණය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක මරණයක් නැති, අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිර්වාණය සොයන්නෙම් මරණයක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිවණ අවබොධ කර ගතිමි.

"තෙමේ ශොකය ස්වභාව කොට ඇත්තෙක්ව ශොකය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක ශෝකයක් නැති අනුත්තරවූ සතර යෝගයෙන් මිදුණාවූ නිර්වාණය සොයන්නෙම් ශොකයක් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුනාවූ නිවණ අවබොධ කර ගතිමි.

"තෙමේ කෙලෙස් සහිතබව ස්වභාව කොට ඇත්තෙක්ව කෙලෙස් සහිතබව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක කෙලෙස් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිර්වාණය සොයන්නෙම් කෙලෙස් නැති අනුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවණ අවබොධ කර ගතිමි.

මට සියල්ල දන්නා නුවණ පහළ විය, මාගේ අර්හත් ඵලය නැවත වෙනස් කළ නොහැකිය, මේ මගේ අන්තිම ජාතියය, නැවත ඉපදීමක් නැත යන දැනීම මට ඇතිවිය.

11. "මහණෙනි, ඒ මට මෙසේ අදහස් විය. මා විසින් අවබොධ කරගන්නා ලද මේ ධර්මය ගැඹුරුය, දැකීම දුෂ්කරය, අවබොධ කර ගැනීම අමාරුය, ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් බැසගත නොහැක, සියුම්ය, පණ්ඩිතයන් විසින් දතයුතුය. මේ සත්ව ප්‍රජාව පංචකාමයෙහි ඇලී සතුටු වන්නීය. පංචකාමයෙහි ආශා ඇත්තීය. පංචකාමයෙහි සතුටු වූවාය. පංචකාමයෙහි ඇලී සතුටු වන්නාවූ පඤ්ච කාමයට ආශා කරන්නාවූ පඤ්චකාමයෙන් සතුටුවන්නාවූ මේ සත්ත්ව සමූහයා විසින් මේ හේතුවෙන් මේ ඵලය ඇති වන්නේය යන පටිච්ච සමුප්පාදය දැක ගැනීම අපහසුය. සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට හේතුවූ සියලු උපධීන්ගෙන් මිදීමට හේතුවූ තෘෂ්ණාව නැතිවීමට හේතුවූ කෙලෙස් පහ කිරීමට හේතුවූද සියලු දුක් නැති කිරීමට හේතුවූ

යම් ඒ නිර්වාණයක් වේද යන මේ කාරණයද දැක ගැනීම අපහසුය.

"මමද ධර්මය දේශනා කරන්නෙම් නම් අන්‍යයෝද මාගෙන් අසා අවබොධ කර නොගන්නාහු නම් එය මට ක්ලාන්ත බවක් වෙහෙසක් වන්නේය. මහණෙනි, ඉක්බිති මට පෙර නොඇසූ විරූ ආශ්චර්යවූ මේ ගාථාවෝ වැටහුනාහුය.

"මා විසින් දුකසේ අවබොධ කරගන්නා ලද මේ ධර්මය දැන් ප්‍රකාශ කිරීමට සුදුසු නැත. රාගයෙන් හා ද්වේෂයෙන් මඩනා ලද්දාවුන් විසින් මේ ධර්මය පහසුවෙන් තේරුම් ගත නොහැකි වෙයි.

"ගඟ උඩු අතට ගැලීමක් වැනිවූ සියුම්වූ ගැඹුරුවූ අවබොධය අපහසුවූ අතිශයින් සියුම්වූ මේ ධර්මය රාගයෙන් රත්වූ මොහයෙන් වටවූ මේ සත්ත්වයෝ අවබොධ කර නොගන්නාහ."

12. "මහණෙනි, මෙසේ සලකන්නාවූ මාගේ සිත මන්දොත්සාහී බවට (හෙවත් දහම් නොදෙසනු කැමති බවට) නැමෙයි; දහම් දෙසීමට නොනැමෙයි. මහණෙනි, එකල්හි සහම්පතී නම් බ්‍රහ්මයාහට ඔහුගේ සිතින් මාගේ සිත දැනගෙන මෙසේ කල්පනා විය. යම් ලොවක සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ සිත මන්දොත්සාහී බවට නැමේද දහම් දෙසීමට නොනැමේද ඒ ලෝකය තෙම නැසෙන්නේය. ඒ ලෝකය තෙම විනාශ වන්නේය' (කියායි.)

"මහණෙනි, ඉක්බිති සහම්පතී බ්‍රහ්ම තෙම යම්සේ ශක්තිමත් පුරුෂයෙක් හකුලනලද අතක් දික් කරන්නේද දික් කරනලද අතක් හකුලන්නේද එපරිද්දෙන් ඇසිල්ලකින් බඹලොවින් අතුරුදහන්ව මාගේ ඉදිරියෙහි පහළ විය.

"මහණෙනි, ඉක්බිති සහම්පතී බ්‍රහ්ම තෙම උතුරු සළුව ඒකාංශකොට පොරවා මා යම් දිසාවෙක්හිද ඒ දිසාවට දොහොත් නමා මට මෙසේ කීයේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙසන සේක්වා. සුගතයන් වහන්සේ ධර්මය දෙසන සේක්වා, ස්වල්පවූ කෙලෙස් ඇති සත්ත්වයෝ ඇත්තාහ. ඔව්හු ධර්මය අසන්නට නැතිකමින් පිරිහෙති. ධර්මය දැනගන්නෝ ඇත්තාහුය.' (යනුවෙනි)

"මහණෙනි, සහම්පතී බ්‍රහ්ම තෙම මෙසේ කීයේය. මෙසේ කියා අනතුරුව මෙසේ කීය.

"පෙර මගධ රටෙහි රාගාදී මල සහිත ශාස්තෘන් විසින් සිතන ලද අපිරිසිදුවූ ධර්මයක් පහළ විය. මේ නිර්වාණයට දොරටුවූ ආර්ය මාර්ගය විවෘත කරනු මැනව. රාගාදී මල නැති සර්වඥයන් වහන්සේ විසින් අවබොධ කළාවූ ධර්මය අසත්වා.

"සමතැස් ඇති සර්වඥයන් වහන්ස, ශෛලමය පර්වතයක් මුදුනෙහි සිටියෙක් හාත්පස ජන සමූහය යම්සේ දකීද, එමෙන් පහවූ ශොක ඇති ඔබවහන්සේ ඒ පර්වතයට උපමා ඇති ධර්මය නමැති ප්‍රාසාදයට නැග,

"ජාතියෙන් හා ජරාවෙන් මඩනාලද ශොකයෙහි වැටී සිටින සත්ත්ව සමූහයා බලත්වා. දිනනලද පස්මරුන් ඇති, සත්ත්වයන් සසර කතරින් එතර කරන හෙයින් සාර්ථවාහකවූ කාමච්ඡන්දය නමැති ණය නැත්තාවූ වීරයන් වහන්ස, නැගිටිනු මැනව. ලොකයෙහි හැසුරුණ මැනව. භාග්‍යවතුන් වහන්ස, ධර්මය දෙසනසේක්වා, ඒ ධර්මය දැනගන්නෝ වන්නාහ.' (යනුවෙනි.)

13. "මහණෙනි, එකල්හි මම බඹහුගේද ආරාධනාව දැන සත්ත්වයන් කෙරෙහිද කරුණාවෙන් බුදු ඇසින් ලෝකය බැලීමි. මහණෙනි, බුදු ඇසින් ලොව බලන්නාවූ මම ස්වල්පවූ රාගාදී කෙලෙස් ඇත්තාවූද මහත්වූ රාගාදී කෙලෙස් ඇත්තාවූද තියුණුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ඇත්තාවූද මෘදුවූ ඉන්ද්‍රිය ඇත්තාවූද ශ්‍රද්ධාදී යහපත් ආකාර ඇත්තාවූද පහසුවෙන් ධර්මය අවබොධ කරවිය හැකිවූද, පරලොව හා වරදෙහි භය දකිමින් වාසය කරන්නාවූ සත්ත්වයන් දුටිමි.

"යම්සේ නම් උපුල් විලක හෝ හෙළ උපුල් විලක හෝ හෙළ පියුම් විලක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ හෙළ පියුම් හෝ දියෙහි හටගන්නාහු දියෙහි වැඩුනාහු දියෙන් මතු නොවී දිය ඇතුළේම පොෂ්‍ය වෙත්ද, ඇතැම් උපුල් හෝ පියුම් හෝ හෙළ පියුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සමව සිටියාහුද, ඇතැම් උපුල් හෝ පියුම් හෝ හෙළ පියුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුනාහු දියෙන් මතුවී දියෙහි නොවැදී සිටියාහුද, මහණෙනි, එපරිද්දෙන්ම මම බුදු ඇසින් ලෝකය බලන්නෙම් ස්වල්පවූ රාගාදී කෙලෙස් ඇත්තාවූද මහත්වූ කෙලෙස් ඇත්තාවූද තියුණුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ඇත්තාවූද, මෘදුවූ ඉන්ද්‍රිය ඇත්තාවූද, ශ්‍රද්ධාව ආදී යහපත් ආකාර ඇත්තාවූද පහසුවෙන් ධර්මය අවබෝධ කරවිය හැකිවූද, පරලොව හා වරදෙහි භය දකිමින් වාසය කරන්නාවූද සත්ත්වයන් දුටිමි.

"මහණෙනි, ඉක්බිති මම සහම්පතී බ්‍රහ්මයාට ගාථාවකින් පෙරළා මෙසේ කීමි.

> "බ්‍රහ්මය, වෙහෙස පිළිබඳ හැඟීම් ඇතිව ප්‍රගුණවූ උතුම් ධර්මය නොකීයෙමි, ඒ සත්ත්වයන්හට නිවණෙහි දොරටු හරින ලද යම් කෙනෙක් තුමූ කන් ඇත්තාවූද අසනු කැමැත්තාහුද ඔහු ශ්‍රද්ධාව එළවත්වා."

"මහණෙනි, ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම දෙශනාව පිණිස කරනලද අවකාශ ඇත්තේ වෙමියි මා වැඳ පැදකුණුකොට එහිම අතුරුදන් විය.

14. "මහණෙනි, ඒ මට මෙසේ සිත්විය. කවරෙකුට මම මේ ධර්මය පළමුවෙන් දෙශනා කරන්නෙම්ද? කවරෙක් මේ ධර්මය වහා අවබොධ කරගන්නේදැ'යි (කියාය.) මහණෙනි, ඒ මට මේ ආළාරකාලාම තෙම පණ්ඩිතය, නුවණැත්තේය. බොහෝ කලක් මුළුල්ලෙහි ස්වල්පවූ රාගාදී කෙලෙස් ඇත්තෙක. යම් හෙයකින් මම ආළාරකාලාමහට පළමුකොට ධර්මය දෙසන්නෙම් නම් හෙතෙම මේ ධර්මය වහාම අවබොධ කර ගන්නේයයි, සිත් විය. මහණෙනි, එකල්හි දෙවතාවෙක් මා කරා එළඹ ස්වාමීනි, ආළාරකාලාමතෙම මින් සත්දවසකට පෙර

කාලක්‍රියා කළේයයි' කීය මටද ආළාරකාලාම තෙම සත්දවසකට පෙර කාලක්‍රියා කෙළේය යන ඥානය පහළවිය.

"මහණෙනි, ඒ මට ආළාරකාලාමහට වූයේ මහත් පිරිහීමකි. ඉදින් හෙතෙම මේ ධර්මය ඇසූයේ නම් වහාම අවබොධකරගන්නේයයි සිත් විය.

"මහණෙනි, ඒ මට මම කවරෙකුට පළමුව ධර්ම දෙශනා කරන්නෙම්ද? කවරෙක් මේ ධර්මය වහා අවබොධ කරන්නේදැයි සිත් විය. මහණෙනි, ඉක්බිති මට මේ උද්දක රාමපුත්තතෙම පණ්ඩිතය, නුවණැත්තේය. බොහෝ කලක් මුළුල්ලෙහි ස්වල්පවූ රාගාදී කෙලෙස් ඇත්තෙක යම් හෙයකින් මම උද්දකරාම පුත්තහට පළමුකොට ධර්මය දෙසන්නෙම් නම් හෙතෙම මේ ධර්මය වහාම දැනගන්නේ යයි අදහස් විය. මහණෙනි, එකල්හි දෙවතාවෙක් මා කරා එළඹ ස්වාමීනි, උද්දකරාම පුත්ත තෙම ඊයේ රාත්‍රි කාලක්‍රියා කෙළේයයි කීය. උද්දකරාම පුත්ත ඊයේ රාත්‍රි කාලක්‍රියා කෙළේය යන ඥානය මටද පහළ විය. ඒ මට කවරෙකුට මම පළමුව ධර්මදෙශනා කරන්නෙම්ද? කවරෙක් මේ ධර්මය වහා අවබොධ කර ගන්නේදැයි අදහස් විය. මහණෙනි, ඒ මට මේ කල්පනාව ඇතිවිය. යම් කෙනෙක් මට ප්‍රධාන වීර්ය කරන කාලයෙහි උපස්ථාන කළාහුද ඒ පස්වග භික්ෂූහු මට බොහෝ උපකාරී වූහ. මම පළමුකොට පස්වග මහණුන්හට ධර්මදෙශනා කරන්නෙම් නම් යෙහෙකි (කියාය) මහණෙනි, ඒ මට දැන් පස්වග මහණහු කොතැන්හි වෙසෙත් දැයි අදහස් විය. මහණෙනි, මම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිවැසින් බරණැස් නුවර ඉසිපතනයෙහි මිගදාය නම් ස්ථානයෙහි වාසය කරන්නාවූ පස්වග භික්ෂූන් දුටුවෙමි.

**15.** "මහණෙනි, ඉක්බිති මම උරුවෙල් දනව්වෙහි කැමතිතාක් කල් වාසයකොට බරණැස යම් තැනෙක්හිද එතනට ගියෙමි. මහණෙනි, උපක නම් ආජීවකයෙක් ගයාවටත් බොධියටත් අතර දීර්ඝ මාර්ගයෙහි යන්නාවූ මා දුටුවේය. දැක මට මෙසේ කීයේය. 'ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රියයෝ ඉතාමත් පැහැපත්ය, ශරීර වර්ණය පිරිසිදුය, හාත්පසින් බබලන්නේය. ඇවැත්නි, ඔබ කවරෙකු

උදෙසා පැවිදි වූයෙහිද? ඔබගේ ගුරුවරයා කවරෙක් හෝ වේද? ඔබ කවරෙකුගේ ධර්මය රුචි කරන්නේද? මහණෙනි, මෙසේ කී කල්හි මම උපකනම් ආජීවකයාට ගාථාවලින් මෙසේ කීවෙමි.

"සියලු ත්‍රෛභූමක ධර්මයන් මැඩ පැවැත්වූ සියලු චාතුර් භූමක ධර්මයන් දැනගත්තාවූ සියලු ත්‍රෛභූමික ධර්මයන්හි නොඇලුණාවූ සියලු ත්‍රෛභූමික ධර්මයන් පහකළාවූ නිවන් අරමුණු කිරීමෙන් භවයෙන් මිදුණාවූ මම තෙමේම චතුස්සත්‍යය අවබොධකොට අනික් කවරෙකු ගුරුවරයා යයි දක්වන්නෙම්ද?

"මට ගුරුවරයෙක් නැත. මට සමාන වූවෙක්ද නැත. දෙවියන් සහිතවූ ලොකයෙහි මට සමාන පුද්ගලයෙක් නැත.

ලෝකයෙහි මම රහත් පුද්ගලයෙක් වෙමි. මම නිරුත්තරවූ ශාස්තෘ වෙමි. කෙලෙස් ගිනි නිවීමෙන් සිසිල්වූ එහෙයින්ම නිවුණාවූ අසහායවූ සම්මාසම්බුද්ධ වෙමි.

"අවිද්‍යාවෙන් අන්ධවූ ලෝකයෙහි අමෘත බෙරය ගසමින් ධර්මචක්‍රය පැවැත් වීම සඳහා කසීරට බරණැස් නුවර බලා යමි,

"ඇවැත්නි, ඔබ යම්සේ ප්‍රකාශ කෙරෙහිද එසේ නම් අනන්තජින නම් වන්නට සුදුසුය."

"උපකය, යම් කෙනෙක් තුමූ නිවණට පැමිණියාහුද ඒකාන්තයෙන් එබඳු මා වැන්නෝ ජිනනම් වෙත්. මා විසින් පාපධර්මයෝ දිනන ලදහ. එහෙයින් මම ජින නම් වෙමි'යි (කීයෙමි.)

"මහණෙනි මෙසේ කී කල්හි උපක නම් ආජීවකතෙම 'ඇවැත්නි, එසේත් විය හැකියයි' කියා හිස වනා අන් මඟකින් ගියේය.

**16.** "මහණෙනි, ඉක්බිති මම පිළිවෙලින් ගමන් කරනුයේ බරණැස් නුවර ඉසිපතනයෙහි මිගදාය නම් ස්ථානය යම් තැනෙක්හිද පස්වග මහණහු යම් තැනෙක්හිද, එතැනට

පැමිණියෙමි. මහණෙනි, පස්වග භික්ෂූහු එන්නාවූ මා දුරදීම දුටුවාහුය, දැක එකිනෙකා මෙසේ කථා කරගත්හ. ඇවැත්නි, මේ ශ්‍රමණ ගෞතමතෙම චීවරාදී ප්‍රත්‍ය බහුලකොට ඇති බවට පැමිණ වීර්ය කිරීමෙන් පිරිහී චීවරාදි ප්‍රත්‍ය බහුලභාවයට පෙරළී සිට එන්නේය. ඔහු නොවැඳිය යුතුය. ඔහුට පෙර ගමන් නොකළ යුතුය, ඔහුගේ පාත්‍ර සිවුරු නොපිළිගත යුතුය. එහෙත් අස්නක් පැනවිය යුතුය. කැමතිනම් වාඩිවන්නේය. (කියායි) "මහණෙනි, මා ළංවන්නට ළංවන්නට පස්වග මහණහු ස්වකීය කතිකාවෙහි සිටීමට අසමර්ථ වූහ. ඇතැම් කෙනෙක් මට පෙරගමන් කොට පාත්‍ර සිවුරු පිළිගත්තාහුය. ඇතැම් කෙනෙක් අසුන් පැනවූහ. ඇතැම් කෙනෙක් පා සෝදන දිය තැබූහ. එතකුදු වුවත් මට 'ගෞතම' යන නමින්ද 'ඇවැත්නියයි' ද කථාකරති. මහණෙනි, එසේ කී කල්හි මම පස්වග මහණුන්හට මෙසේ කීයෙමි. මහණෙනි, තථාගතයන් හට නම කියමිනුත් 'ඇවැත්නි, කියමිනුත් කථා නොකරව්.

මහණෙනි, තථාගත තෙම රහත්ය. සම්‍යක් සම්බුද්ධය. ධර්ම ශ්‍රවණයට කන් නමව්. නිර්වාණය අවබොධ කරන ලදී. මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනා කරමි. අනුශාසනය පරිදි පිළිපදින්නාවූ කුලපුත්‍රයෝ යම් නිර්වාණයක් පිණිස මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද මාර්ග බ්‍රහ්මචර්යාව අවසාන කොට ඇති නිරුත්තරවූ ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තුමූ නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරව්යයි' කීයෙමි.

මහණෙනි, මෙසේ කී කල්හි පස්වග භික්ෂූහු මට මෙසේ කීවාහුය. ඇවැත්නි ගෞතමයෙනි, ඔබ ඒ දුෂ්කර ඉරියව් පැවැත්වීමෙනුත් ඒ දුෂ්කර පිළිවෙත් පිරීමෙනුත් ඒ දුෂ්කර ක්‍රියාවෙනුත් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවය ඇති කිරීමට සමර්ථ නුවණක් නොලැබුයෙහිය. දැන් බොහෝ සිවුරු පිරිකර ඇතිව වීර්ය කිරීමෙන් පිරිහී සිවුරු ආදිය බහුල කොට ඇති බවට හැරී සිටිමින් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවය ඇති කිරීමට සමර්ථ නුවණක් ලබන්නෙහි දැයි, කීහ.

"මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්හට මෙසේ කීයෙමි. 'මහණෙනි, තථාගත තෙම චීවරාදිය බහුල කොට වීර්ය කිරීමෙන් පිරිහුනේ නොවේ, බාහුලික බවට වැටුනේ නොවේ. මහණෙනි, තථාගත තෙම රහත්ය. සම්‍යක් සම්බුද්ධය. ධර්ම ශ්‍රවණයට කන් නමව්. නිර්වාණය අවබොධ කරන ලදී. මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනාකරමි. අනුශාසනය පරිදි පිළිපදිමින් කුලපුත්‍රයෝ යම් නිර්වාණයක් පිණිස මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති නිරුත්තරවූ ඒ නිර්වාණය මේ ආත්මයෙහි තුමූ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරව්යයි' කීයෙමි.

දෙවනුවත් පස්වග මහණහු මට මෙසේ කීහ. ඇවැත්නි ගෞතමයෙනි, ඔබ ඒ දුෂ්කර ඉරියව් පැවැත්වීමෙනුත් ඒ දුෂ්කර පිළිවෙත් පිරීමෙනුත් මේ දුෂ්කර ක්‍රියාවෙනුත් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවය ඇතිකිරීමට සමර්ථ නුවණක් නොලැබූයෙහිය. දැන් බොහෝ සිවුරු පිරිකර ඇතිව, වීර්යය කිරීමෙන් පිරිහී, සිවුරු ආදිය බහුල කොට ඇති බවට හැරී සිටිමින් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවය ඇති කිරීමට සමර්ථ නුවණක් ලබන්නෙහි දැයි කීහ.

"මහණෙනි, මෙසේ කී කල්හි ම පස්වග මහණුන්ට මෙසේ කීයෙමි. මහණෙනි, 'තථාගත තෙම චීවරාදිය බහුල කොට ඇත්තෙක් නොවේ. වීර්ය කිරීමෙන් පිරිහුනේ නොවේ. බාහුලික බවට වැටුණේ නොවේ. මහණෙනි, තථාගත තෙම රහත්ය. සම්‍යක් සම්බුද්ධය. ධර්ම ශ්‍රවණයට කන් නමව්. නිර්වාණය අවබෝධකරනලදී. මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනා කරමි. අනුශාසනය පරිදි පිළිපදිමින් කුල පුත්‍රයෝ යම් නිර්වාණයක් පිණිස මැනවින් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද මාර්ග බ්‍රහ්ම චරියාව කෙළවර කොට ඇති නිරුත්තරවූ ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තුමූ නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරව්යයි කීයෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"තුන්වෙනුවද පස්වග භික්ෂූහු මට මෙසේකීහ. ඇවැත්නි, ගෞතමයෙනි, ඔබ ඒ දුෂ්කර ඉරියව් පැවැත් වීමෙනුත් ඒ දුෂ්කර පිළිවෙත් පිරීමෙනුත් ඒ දුෂ්කර ක්‍රියාවෙනුත් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවය ඇති කිරීමට සමර්ථ නුවණක් නොලැබූයෙහිය. දැන් බොහෝ සිවුරු ඇතිව, වීර්ය කිරීමෙන් පිරිහී, සිවුරු ආදිය බහුල කොට ඇති බවට හැරී සිටිමින් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවය ඇතිකිරීමට සමර්ථ නුවණක් ලබන්නෙහිදැ'යි කීහ.

"මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්හට මෙසේ කීයෙමි. 'මහණෙනි, තථාගත තෙම චීවරාදිය බහුල කොට ඇත්තෙක් නොවේ වීර්ය කිරීමෙන් පිරිහුනේ නොවේ. බාහුලික බවට වැටුණේ නොවේ. මහණෙනි, තථාගත තෙම රහත්ය. සම්‍යක් සම්බුද්ධය. ධර්ම ශ්‍රවණයට කන් නමව්, නිර්වාණය අවබෝධ කරන ලදී. මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනා කරමි. අනුශාසනය පරිදි පිළිපදිමින් කුලපුත්‍රයෝ යම් නිර්වාණයක් පිණිස මැනවින් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති නිරුත්තරවූ ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තුමූ නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණවාසය කරව්යයි' කීයෙමි.

"මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්ට මෙසේ කීයෙමි. මා විසින් මීට පෙර මෙබන්දක් කියන ලදැයි දන්නහුද නැත ස්වාමීනි, 'මහණෙනි, තථාගත තෙම චීවරාදිය බහුල කොට ඇත්තෙක් නොවේ. වීර්ය කිරීමෙන් පිරිහුනේ නොවේ. බාහුලික බවට වැටුනේ නොවේ. මහණෙනි, තථාගතතෙම රහත්ය, සම්‍යක් සම්බුද්ධය, ධර්ම ශ්‍රවණයට කන් නමව්, නිර්වාණය අවබෝධ කරන ලදී. මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනාකරමි. අනුශාසනය පරිදි පිළිපදිමින් කුල පුත්‍රයෝ යම් නිර්වාණයක් පිණිස ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති නිරුත්තරවූ ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තුමූ නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරව්යයි' කීයෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. 'මහණෙනි, මා බුදුවූ බව පස්වග මහණුන්හට අඟවන්නට මම සමර්ථ වීමි. මම භික්ෂූන් දෙනමකට අවවාද කරමි. භික්ෂූන් තුන් නමක් පිඬු පිණිස හැසිරෙත්. තුන් නම පිඬු පිණිස හැසිර යමක් ගෙනෙත්ද එයින් අපි සදෙන යැපෙමු. මහණෙනි, භික්ෂූන් තුන් නමකට අවවාද කරමි. භික්ෂූහු දෙනමක් පිඬු පිණිස හැසිරෙත්. භික්ෂූන් දෙනම පිඬු පිණිස හැසිර යමක් ගෙනෙත්ද එයින් අපි සදෙන යැපෙමු.

"මහණෙනි, ඉක්බිති මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාවූ අනුශාසනා කරනු ලබන්නාවූ පස්වග භික්ෂූහු ජාතිය ස්වභාවකොට ඇත්තාවූ ජාතිය ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැක, ජාතියක් නැති, අනුත්තරවූ සතරයෝගයන්ගෙන් මිදුනාවූ නිවණ සොයන්නාහු ජාතියක් නැති නිරුත්තරවූ සතර යොගයන් කෙරෙන් මිදුණාවූ නිවන් අවබොධ කළාහුය. තමන් ජරාව ස්වභාවකොට ඇත්තාහු ජරාව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක, ජරාවක් නැති අනුත්තරවූ සතරයොගයන්ගෙන් මිදුනාවූ නිවන් සොයන්නාහු ජරාවක් නැති නිරුත්තරවූ සතර යොගයන් කෙරෙන් මිදුණාවූ නිවන් අවබොධ කළාහුය. තමන් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තාහු ව්‍යාධිය ස්වාභාවකොට ඇති දෙයෙහි දොෂය දැක ව්‍යාධියක් නැති, අනුත්තරවූ සතර යොගයන්ගෙන් මිදුණාවූ නිවන් සොයන්නාහු ව්‍යාධියක් නැති නිරුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවන් අවබොධ කළාහුය. තමන් මරණය ස්වභාව කොට ඇත්තාහු මරණය ස්වභාවකොට ඇති දෙයෙහි දොෂය දැක, මරණයක් නැති, අනුත්තරවූ, සතර යොගයන්ගෙන් මිදුණාවූ නිවන් සොයන්නාහු මරණයක් නැති නිරුත්තරවූ සතර යොගයන් කෙරෙන් මිදුණාවූ නිවන් අවබොධ කළාහුය. තමන් ශොකය ස්වභාව කොට ඇත්තාහු ශොකය ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක, ශොකයක් නැති අනුත්තරවූ සතර යොගයන්ගෙන් මිදුණාවූ නිවන් සොයන්නාහු ශොකයක් නැති නිරුත්තරවූ සතර යොගයෙන් මිදුණාවූ නිවන් අවබොධ කළාහුය. තමන් කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇත්තාහු කෙලෙස් සහිත බව ස්වභාව කොට ඇති දෙයෙහි දොෂය දැක, කෙලෙස් නැති, අනුත්තරවූ,

සතර යොගයන් ගෙන් මිදුණාවූ නිවන් සොයන්නාහු කෙලෙස් නැති නිරුත්තරවූ සතර යොගයන්ගෙන් මිදුණාවූ නිවන් අවබෝධ කළාහුය. ඔවුන්ට අපගේ රහත් ඵලය නොසෙල්විය හැකිය. මේ අන්තිම ජාතියය, නැවත ඉපදීමක් නැත යන ඥාන දර්ශනය පහළ විය.

18. "මහණෙනි, මේ කාම ගුණ පසකි. කවර පසක්ද යත්? ඇසින් බලා දතයුතුවූ ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීමෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ යම් රූපයෝ වෙත්ද, කණින් අසා දත යුතුවූ ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීමෙන් යුක්ත වූ ඇලුම් කටයුතුවූ යම් ශබ්දයෝ වෙත්ද, නාසයෙන් විඳ දත යුතුවූ ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීමෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ යම් ගන්ධයො වෙත්ද, දිවෙන් දැනගත යුතුවූ ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ ඇලීමෙන් යුක්තවූ ඇලිය යුතුවූ යම් රසයෝ වෙත්ද, කයින් දතයුතුවූ ඉෂ්ටවූ කැමැති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීමෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ යම් ස්ප්‍රශ්ටව්‍යයෝ වෙත්ද මහණෙනි, මොහු වනාහි පඤ්චකාම ගුණයෝය.

19. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පංචකාමයෙහි බැඳුණාහු, මූර්ඡා වූවාහු, ගැළුණාහු, දොෂය නොදක්නාවූ, එයින් බැහැරවන කල්පනාව නැත්තාහු කාමයන් සේවනය කරත්ද, ඔව්හු විපත්තියට පැමිණියාහුය, විනාශයට පැමිණියාහුය, මාරයා විසින් කැමති පරිද්දක් කළ හැකි බවට පැමිණියාහුය, දතයුතුය. මහණෙනි, වනයෙහි මුවෙක් බඳනා ලද්දේ මළපුඩු මතුයෙහි වැතිර සිටීද, ඔහු විපත්තියට පැමිණියේය. විනාශයට පැමිණියේය, වැද්දා විසින් කැමති දෙයක් කළහැකිබවට පැමිණියේය. වැද්දා එන කල්හි කැමති තැනකට නොයාහැක්කේ යයි දත යුතුය.

"මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පංචකාමයෙහි බැඳුනාහු මූර්ඡා වූවාහු

ගැළුණාහු, දොෂය නොදක්නාහු, එයින් බැහැරවන කල්පනාව නැත්තාහු කාමයන් සේවනය කරත්ද, ඔව්හු විපත්තියට පැමිණියාහුය, විනාශයට පැමිණියාහුය. මාරයා විසින් කැමති පරිද්දක් කළහැකි බවට පැමිණියාහුයයි දතයුතුය.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පංචකාමයෙහි නොබැඳුනාහු, මූර්ඡා නොවූවාහු නොගැලුනාහු, වරද දක්නා සුලුවූවාහු, එයින් මිදෙන කැමැත්ත ඇත්තාහු මේ පස්කම් සැප අනුභව කරත්ද ඔව්හු විපත්තියට නොපැමිණියාහුය. විනාශයට නොපැමිණියාහුය, මාරයා විසින් කැමති පරිද්දක් නොකළ හැකි බවට පැමිණියාහුයයි දතයුතුය.

මහණෙනි, වනයෙහි වාසය කරන මුවෙක් නොබඳින ලද්දේ මළපුඩු මතුයෙහි වැතිර සිටීද ඔහු විපත්තියට නොපැමිණියේය. විනාශයට නොපැමිණියේය, වැද්දා කැමති පරිද්දක් කළහැකි බවට නොපැමිණියේය. වැද්දා එනවිට කැමති තැනකට යන්නේය යයි දත යුතුය.

"මහණෙනි, එසේම යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පංචකාමයෙහි නොබැඳුනාහු, මූර්ඡා නොවූවාහු නොගැලුනාහු, වරද දක්නාසුලු වූවාහු, එයින් මිදෙන කැමැත්ත ඇත්තාහු මේ පස්කම් සැප අනුභව කරත්ද ඔව්හු විපත්තියට පත්නොවූවාහුය. විනාශයට පත් නොවූවාහුය, මාරයා කැමති පරිද්දක් කළ නොහැකි බවට පැමිණියාහුයයි දත යුතුය.

"මහණෙනි, යම්සේ වනයෙහි හැසිරෙන මුවෙක් නිර්භයව යයි නම් නිර්භයව සිටියි නම්, නිර්භයට හිඳියි නම්, නිර්භයව නිදාගනියි නම්, ඊට හේතු කවරේද? මහණෙනි, වැද්දාට අසුනොවීමයි.

**20.** "මහණෙනි, එසේම මහණ තෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේයයිද මාරයාගේ ඇස පිහිටක් නැති සේ නසා පාපී මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණතෙම විතක්ක විචාර දෙක සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම ඇති කරන්නාවූ හිත පිළිබඳ එකඟ බව ඇති විතර්ක විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීති සැප ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි නම්, මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේ යයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නසා පාපී මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණතෙම ප්‍රීතියෙහි නොඇල්මෙන් උපෙක්ෂාව ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව උපේක්ෂාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ සැපයෙන් යුක්තව වාසය කරන්නේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි නම් මහණෙනි, මේ මහණ තෙම මාරයා අන්ධ කෙළේයයිද මාරයාගේ ඇස පිහිටක් නැතිසේ විනාශ කොට මාරයාගේ නොදැක්මට පැමිණියේද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණතෙමේ සැප දුරුකිරීමෙන්ද දුක් දුරුකිරීමෙන්ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙක නැතිකොට දුක්ද නොවූ, සැපද නොවූ උපේක්ෂාවෙන් හා සිහියෙන් පිරිසිදු සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි නම්, මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේ යයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස නිසා මාරයාගේ නොදැක්මට පැමිණියේ යයිද කියනු ලැබේ.

21. "මහණෙනි, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන්ම රූප සංඥාවන් ඉක්මවීමෙන් ගැටීම් සංඥා පහකිරීමෙන් විවිධ සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි නම් මහණෙනි මේ මහණ තෙම මාරයා අන්ධ කෙළේ යයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශ කොට මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි

විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි නම්, මහණෙනි, මේ මහණ තෙම මාරයා අන්ධ කෙළේයයිද, පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශ කොට මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි නම්, මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශකොට මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණ තෙම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි නම්, මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශ කොට මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"මහණෙනි, නැවතද මහණ තෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි නම්, විදර්ශනා නුවණින් දැක ඔහු විසින් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දාහු වෙත්ද, මහණෙනි, මේ මහණතෙම මාරයා අන්ධ කෙළේයයිද පිහිටක් නැතිසේ මාරයාගේ ඇස විනාශ කොට මාරයාගේ නොදැක්මට පැමිණියේයයිද කියනු ලැබේ.

"හෙතෙම ලොකයෙහි තෘෂ්ණාවෙන් එතෙර වූයේය. හෙතෙම සැක නැතිව යයි. සැක නැතිව සිටියි. සැක නැතිව හිඳියි. සැක නැතිව සයනය කරයි. ඊට හේතු කවරේද? මහණෙනි, මාරයාට අසු නොවීමයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශේෂයෙන් සතුටුවූහ.

(හයවෙනිවූ අරියපරියෙසන සූත්‍රය නිමි.) (3-6)

# 27. චූලහත්ථිපදොම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ජානුස්සොනි නම් බ්‍රහ්මණ තෙම වෙළඹුන් යෙදූ සියල්ල සුදුවූ රථයකින් මධ්‍යාහ්නයෙහි (මැදි දවල්) සැවැත් නුවර වීථීන්හි ගමන් කරයි.

ජානුස්සොනි බ්‍රාහ්මණ තෙම එන්නාවූ පිලොතික නම් පරිබ්‍රාජකයා දුරදීම දුටුවේය, දැක පිලොතික පරිබ්‍රාජකයාට මෙසේ කීයේය. "පින්වත, *වච්ඡායනතෙමේ මේ මැදි දවල් කොහි සිට එන්නෙහිද?"

"පින්වත, මම ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි සිට මේ දිශාවෙන් එමි"යි (කීය)

"පින්වත්, වච්ඡායන තෙම ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ දක්ෂ නුවණ ඇති බව ගැන කුමක් සිතන්නෙහිද? පණ්ඩිතයෙකැයි සිතන්නෙහිදැ?"යි (ඇසීය)

"පින්වත, මම කවරෙක්ද? ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥාවෙහි දක්ෂ බව දැන ගැනීමට තරම් මම කවරෙක්ද? යමෙක් ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥාවෙහි දක්ෂ බව දැන ගන්නේ නම් ඔහුත් උන්වහන්සේ හා සමාන කෙනෙකු විය යුතුය."

"පින්වත් වච්ඡායන තෙම ඉතා උසස් ප්‍රශංසාවෙන්ම ශ්‍රමණ ගෞතමයන්ට ප්‍රශංසා කෙරෙ"යි.

"පින්වත, මම කවරෙක්ද? කවරෙක්වූ මම ශ්‍රමණ ගෞතමයන්ට ප්‍රශංසා කරන්නෙම්ද? "ඒ පින්වත් ශ්‍රමණ ගෞතම තෙම ප්‍රශංසා කළ යුත්තන් (උසස් අය) විසින් දෙව් මිනිසුන්ට ශ්‍රේෂ්ඨයයි ප්‍රශංසා කරනලදී"

* වච්ඡායන නම් ගොත්‍ර ඇතිහෙයින් එසේ කීය.

"පින්වත් වච්ඡායන තෙම කුමන කාරණයක් දකිමින් ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මෙසේ ඉතා පැහැදුනේද?"

**2.** "පින්වත, යම්සේ ඇතුන් වසන වනයක හැසිරෙන දක්ෂ පුද්ගලයෙක් ඇතුන් වසන වනයට ඇතුල් වේද ඔහු ඇතුන් වසන වනයෙහි දිගින්ද දික්වූ පුළුළින්ද පුළුල්වූ, මහත්වූ ඇත්පියවරක් (අඩි සටහනක්) දකින්නේද, පින්වත, ඔහු ඒ මහා ඇතෙක් යයි තීරණයට පැමිණෙයි. පින්වත, එපරිද්දෙන් මමද යම්තැනක පටන් ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි ඥානපද සතරක් (නුවණ පියවර) දුටුයෙම්ද, එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම, අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මැනවින් දෙශනා කරන ලදී, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

"කවර ඤාණපද සතරක්ද යත්, පින්වත මේ ලෝකයෙහි සියුම් බුද්ධි ඇති අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති වාලවෙධීන් (විදුලි එලියෙන් අස්ලොමට විදීමට සමතුන්) වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත්යයි සලකන යම් ක්ෂත්‍රිය පණ්ඩිතයෙක් දක්නෙම් ද, ඔව්හු ශ්‍රමණ භවත් ගෞතමයන් අසුවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පැමිණෙතියි අසත්ද, අපි ශ්‍රමණ ගෞතමයින් කරා ගොස් මේ ප්‍රශ්න අසන්නෙමුයි ඔව්හු ප්‍රශ්න සූදානම් කරත්. "ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේ උන්වහන්සේට වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නේය. එවිට අපි මෙසේත් වාදය නගමු"යි (කියයි) අසුවල් නම් ගමට හෝ නියම්ගමට හෝ ශ්‍රමණ ගෞතමයින් පැමිණියහයි අසා ඔව්හු ශ්‍රමණ ගෞතමයන් යම් තැනකද එතැනට පැමිණෙත්. ශ්‍රමණ ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්, උත්සාහ කරවත්, සතුටු කරවත්. ඔව්හු ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු, උත්සාහ කරන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු ශ්‍රමණ ගෞතමයන්ගෙන් ප්‍රශ්නවත් නොඅසති,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උන්වහන්සේට කොයින් වාදාරොපනයක් කරද්ද (වාදය පිණිස කථා නොකරති) ඔව්හු ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේම ශ්‍රාවකයෝ වෙත්. පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ පළමුවන ඤාණපදය දුටුයෙම්ද, එතැන් සිට 'භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම අවබෝධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය හොඳින් දෙශනා කරන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

3. "නැවතද පින්වත, මේ ලෝකයෙහි සියුම් බුද්ධි ඇති අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති වාලවෙධීන් වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත් යයි සලකන යම් බ්‍රාහ්මණ පණ්ඩිතයෙක් මම දකිම්ද, ඔව්හු ශ්‍රමණ භවත් ගෞතමයන් අසවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පැමිණෙතියි අසත්ද, 'අපි ශ්‍රමණ ගෞතමයින් කරා ගොස් මෙසේ අසන්නෙමු'යි ඔව්හු ප්‍රශ්න සූදානම් කරත්. ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේ උන්වහන්සේට වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේත් වාදය නගහු"යි (කියාය.) ඔව්හු අසවල් නම් ගමට හෝ නියම්ගමට හෝ ශ්‍රමණ ගෞතමයන් පැමිණියහයි (අසා) ශ්‍රමණ ගෞතමයින් යම් තැනකද එතැනට පැමිණෙත් (එසේ පැමිණි කල්හි) ශ්‍රමණ ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්, උත්සාහ කරවත්, සතුටු කරවත්. ඔව්හු ශ්‍රමණ ගෞතමයින් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු, සමාදන් කරවන ලද්දාහු, උත්සාහ කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයින්ගෙන් ප්‍රශ්නවත් නොඅසති. උන්වහන්සේට කොයින් වාදාරොපනය කරත්ද? ඔව්හු ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේම ශ්‍රාවකයෝ වෙත්.

"පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ දෙවෙනි ඤාණ පදය දුටුයෙම්ද, එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම අවබෝධ කළහ. භාග්‍යවතුන්

වහන්සේ විසින් ධර්මය හොඳින් දෙශනා කරනලදී. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

4. "නැවතද පින්වත, මේ ලෝකයෙහි සියුම් බුද්ධි ඇති අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති, වාලවෙධීන් වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත්යයි සලකන යම් ගෘහපති පණ්ඩිතයන් මම දකිම්ද ඔව්හු ශ්‍රමණ භවත් ගෞතමයන් අසවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පැමිණෙත්යයි අසත්ද, 'අපි ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් මේ ප්‍රශ්න අසමුයි ඔව්හු ප්‍රශ්න සූදානම් කරති. ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේ උන්වහන්සේට වාදාරොපනය කරමු. 'ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නාහ. එවිට අපි මෙසේත් වාදය නගමුයි' (කියාය) ඔව්හු අසවල් නම් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණ ගෞතමයින් පැමිණියහයි (අසා) ශ්‍රමණ ගෞතමයින් යම් තැනකද එතැනට පැමිණෙත්, ශ්‍රමණ ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්, උත්සාහ කරවත්, සතුටු කරවත්, ඔව්හු ශ්‍රමණ ගෞතමයින් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු උත්සාහ කරවන ලද්දාහු සතුටු කරවන ලද්දාහු ශ්‍රමණ ගෞතමයින් ගෙන් ප්‍රශ්නවත් නොඅසති. උන්වහන්සේට කොයින් වාදාරොපනය කරද්ද? ඔව්හු ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයින්ගේ ශ්‍රාවකයෝ වෙත්. පින්වත, යම් කලෙක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ තුන්වෙනි ඥාණපදය දුටුයෙම්ද, එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම අවබෝධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය හොඳින් දෙශනා කරන ලදී, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

5. "නැවතද පින්වත, මේ ලොකයෙහි සියුම් බුද්ධි ඇති අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති, වාලවේධීන් වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍යදෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත් යයි සලකන යම් ශ්‍රමණ

පණ්ඩිතයන් මම දකිම්ද, ඔව්හු ශ්‍රමණ භවත් ගෞතමයන් අසවල් නම් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙතියි අසත්ද, ඔව්හු ‘අපි ශ්‍රමණ ගෞතමයින් කරා ගොස් මේ ප්‍රශ්න අසමු’යි ප්‍රශ්න සූදානම් කරති. ‘ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නාහ’ එවිට අපි උන්වහන්සේට මෙසේ වාදාරොපනය කරමු. අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නාහ. එවිට අපි මෙසේත් වාදය නගමු’යි (කියාය) අසවල් නම් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණභවත් ගෞතමයෝ පැමිණියහයි අසා, ඔව්හු ශ්‍රමණභවත් ගෞතමයින් යම් තැනකද එතැනට පැමිණෙත්. ශ්‍රමණභවත් ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්. උත්සාහ කරවත් සතුටු කරවත්. ඔව්හු ශ්‍රමණභවත් ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු, එහි සමාදන් කරවන ලද්දාහු, උත්සාහ කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු ශ්‍රමණ භවත් ගෞතමයන් ගෙන් ප්‍රශ්නවත් නො අසත්. උන්වහන්සේට කොයින් වාදාරොපනය කරත්ද, ඔව්හු ඒකාන්තයෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීම පිණිස ශ්‍රමණ ගෞතමයන්ගෙන් අවසර ඉල්වත්. ශ්‍රමණ ගෞතමයෝ ඔවුන් පැවිදි කරවති. උපසම්පදාද කරවති. ඔව්හු එහි පැවිදිවූවාහුම හුදකලා (තනි) වූවාහු, සමූහයෙන් වෙන්වූවාහු, අප්‍රමාද වූවාහු, කෙලෙස් තවන වීර්යය ඇත්තාහු සතර මාර්ගයෙහි යොදවනලද සිත් ඇත්තාහු වාසය කරන්නාහුය, කුල පුත්‍රයෝ යම් මාර්ගඵලයක් පිණිස ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණ වෙද්ද, නොබෝ කලකින් බ්‍රහ්මචරියාව කෙළවර කොට ඇති උතුම්වූ ඒ අර්හත් ඵලය මේ ආත්මයේදීම උසස් නුවණින් අවබෝධ කොට ඊට පැමිණ වාසය කරත්. ඔව්හු මෙසේ කියන්නාහ.

“පින්වත්නි, අපි තව ස්වල්පයකින් නැසුනෝ වන්නෙමු. තව ස්වල්පයකින් වැනසුනෝ වන්නෙමු. අපි වනාහි ශ්‍රමණයන් නොවීම ශ්‍රමණයෝ වෙමුයි කියාගතිමු. බ්‍රාහ්මණයන් නොවීම බ්‍රාහ්මණයෝ වෙමුයි කියාගතිමු. රහතුන් නොවීම රහත්හු වෙමුයි

කියාගතිමු. දැන් වනාහි අපි ශ්‍රමණයෝත් වෙමු. දැන් වනාහි බ්‍රාහ්මණයෝත් වෙමු. දැන් වනාහි රහත්වූවෝත් වෙමුයි (කියති.)

"පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ සතරවෙනි ඤාණපදය දුටුයෙම්ද, එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම අවබෝධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය යහපත් කොට දෙශනා කරනලදී. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිගන්නේය කියා තීරණයට පැමිණියෙමියි, (කීය)

**6.** "මෙසේ කී කල්හි ජාණුස්සෝනි බ්‍රාහ්මණ තෙම වෙළඹුන් යෙදූ සියල්ල සුදුවූ රථයෙන් බැස උතුරු සළුව ඒකාංශකොට (එක උරයකට) පොරවා දමාගෙන භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින දෙසට ඇඳිලි බැඳගෙන මේ ප්‍රීති වාක්‍යය තුන් වරක් කීයේය. "භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. භාග්‍යවත් වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, යම් දවසක කෙසේ හෝ ඒ භවත් ගෞතමයන් සමග අපි එක් වන්නෙමු නම් ඉතා යෙහෙක. එක්වී කිසියම් සතුටු සාමීචි කථාවක් වන්නේනම් ඉතා යෙහෙක' (කියායි)

ඉක්බිති ඒ ජාණුස්සෝනි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එක පැත්තක හිඳගත්තේය. එක පැත්තක හිඳගත්තාවූ ජාණුස්සෝනි බ්‍රාහ්මණ තෙම, පිලොතික පරිබ්‍රාජකයා සමග යම් කථාවක් වීද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ සමග කීයේය.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ජාණුස්සෝනි බ්‍රාහ්මණයා හට මෙසේ වදාළාහ. 'බ්‍රාහ්මණය, මෙපමණකින් හත්ථිපදොපමාව (ඇත් පා උපමාව) විස්තර වශයෙන් සම්පූර්ණ වූයේ නොවෙයි. බ්‍රාහ්මණය, යලිත් හත්ථිපදොපමාව යම් සේ විස්තර වශයෙන් සම්පූර්ණ වේද එය හොඳින් අසව, හොඳින්

සිත තබා ගනුවකියන්නෙමි"යි වදාළහ. "එසේය පින්වතුන් වහන්සැ"යි ජාණුස්සෝනි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

7. "බ්‍රාහ්මණය, යම්සේ ඇතුන්වසන වනයෙහි හැසිරෙන්නෙක් ඇතුන් වසන වනයට ඇතුල් වේද, හෙතෙම ඇතුන් වසන වනයෙහි දිගින් දික්වූද, පුළුලින් පුළුල්වූද මහත්වූ ඇත් අඩියක් දක්නේද, ඒ ඇත් වනයෙහි හැසිරෙන්නා (ඇත් ශිල්පයෙහි) දක්ෂයෙක් වේනම් (හෙතෙම) 'පින්වත මේ මහා ඇතෙක් ය'යි එයින් තීරණයට නොපැමිණෙයි.

"ඊට හේතු කවරේද? බ්‍රාහ්මණය ඇත් වනයෙහි මහත්වූ පාද ඇති "වාමනිකා" නම් ඇතින්නියෝ ඇත්තාහ. මේ ඇත් අඩිය ඔවුන්ගේ විය හැකියයි සිතා ඔහු ඒ අනුව යන්නේය. ඒ අනුව යන ඔහු ඇත් වනයෙහි දිගින් දික්වූ පළලින් පළල්වූ මහත් ඇත් අඩියක්ද ගස්වල උඩ අතු කැඩූතැන් හා ගැටුන තැන්ද දකියි. ඒ ඇත් වනයෙහි හැසිරෙන්නා දක්ෂයෙක් වේනම් (ඔහු) පින්වත, මේ මහාඇතෙකැයි' එයිනුදු තීරණයට නොපැමිණෙයි. ඊට හේතු කවරේද? බ්‍රාහ්මණය, ඇත් වනයෙහි මහත්වූ පාද ඇති "උච්චා කාළාරිකා" නම් ඇතින්නියෝ ඇත්තාහ. මේ ඔවුන්ගේ අඩියක් විය හැකියයි හෙතෙම ඒ අනුව යන්නේය. ඒ අනුව යන ඔහු ඇත් වනයෙහි දිගින් දික්වූ පළලින් පළල්වූ මහත් ඇත් අඩියක්ද ගස්වල උඩ අතු කැඩූ තැන්ද ගැටුන තැන්ද උඩ දළවලින් අනින ලද තැන්ද දකියි. ඒ ඇත් වනයෙහි හැසිරෙන්නා දක්ෂයෙක් වේනම් මේ මහා ඇතෙක්යයි තීරණයට නොපැමිණෙයි. ඊට හේතු කවරේද? බ්‍රාහ්මණය, ඇත් වනයෙහි 'උච්චා කණෙරුකා' නම් ඇතින්නියෝ ඇත්තාහ. මේ පාද ඔවුන්ගේ විය හැකියයි හෙතෙම ඒ අනුව යන්නේය. ඒ අනුව යන ඔහු ඇත් වනයෙහි දිගින් දික්වූ පළලින් පළල්වූ මහත් ඇත් අඩියක්ද, (ගස්වල) උඩ අතුකැඩූ තැන් හා ගැටුනු තැන්ද උඩ දළ වලින් අනිනලදතැන්ද, උඩ බිඳුන තැන්ද දකියි. රුක්මුලකට ගියාවූ හෝ හිස් අවකාශ ස්ථානයකට ගියාවූ හෝ යන්නාවූ හෝ සිටින්නාවූ හෝ නිදා සිටින්නාවූ හෝ ඒ මහා

ඇත් රාජයාත් දකියි. (එවිට) හෙතෙම මේ ඒ මහා ඇත් රාජයා යයි තීරණයට පැමිණෙයි.

8. "බ්‍රාහ්මණය, එසේම මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ යහපත් ගති ඇත්තාවූ සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්වූ, චතුස්සත්‍යය අවබෝධ කළාවූ තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ මහණ බමුණන් සහිතවූ, දෙව් මිනිසුන් සහිතවූ, මේ ලොකය ස්වකීය විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරයි. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ මැද යහපත්වූ අවසානය යහපත්වූ අර්ථ සහිතවූ, දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ, ශාසන බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරති.

9. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද ඔහු ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. ගිහිගෙයි විසීම් අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළි රැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි කියාය.

10. "ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් හැර, ස්වල්පවූ හෝ බොහෝ වූ නෑපිරිස් හැර, කෙස් දැළි රැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නේය. එසේ මහණවූ හෙතෙම භික්ෂු සීලයෙන් යුක්තවූයේ, ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ බහාතබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුධ ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි

හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමති වන්නේ, සොර නොවූ, පිරිසිදුවූ සිතින් යුක්ත වාසයකෙරේ. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරීවේ. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, සැබෑ වචන කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. පිසුනු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේ, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේ, මෙසේ භෙද වූවන් ගළපන්නේ සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ, සමගිය ඇති කරන වචන කියන්නේය. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, යම් වචනයක් නිදොස් වේද, කණට මිහිරිද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ වචනම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්තවූ විනයයෙන් යුක්තවූ වචන කියන්නේ සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

11. "හෙතෙම තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැළකුණේ වෙයි. එක් වේලක් වළඳන්නේ රාත්‍රි භොජනයෙන් හා විකාල භොජනයෙන් වැළකුණේ වෙයි. 'නැටීම් ගී කීම් බෙර ආදිය වැයීම්' විසුලු දැකීම් යන මෙයින් වැළකුණේ වෙයි. මල්, ගඳ, විලවුන් පැළඳීම ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළකුණේ වෙයි. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළකුණේ වෙයි. රන් රිදී මසු කහවණු

පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. ස්ත්‍රීන් තරුණියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. ඌරන්, කුකුළන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඇතුන්, ගවයින්, අසුන්, වෙළඹුන්, පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. කෙත්, වත්, පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් වැළකුණේ වෙයි. විකිණීම මිළට ගැනීම යන මෙයින් වැළකුණේ වෙයි. තරාදියෙන් හොර කිරීම, රන් නොරන් කිරීමාදියෙන් හොර කිරීම මැනීමෙන් හොර කිරීමාදියෙන් වැළකුණේ වෙයි. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළකුණේ වෙයි. කැපීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම් ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින් වැළකුණේ වෙයි.

"හෙතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වන්නේවේ. ඔහු යම් යම් තැනකට යේ නම් ඒ ඒ තැනට එය ගෙනයන්නේ වෙයි. යම්සේ පක්ෂියෙක් යම් තැනකට පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹායේද, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය වැසීමට ප්‍රමාණවූ සිවුරෙන්ද යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටුවන්නේවේ. ඔහු යම් තැනකට යා නම් ඒ ඒ තැන එය රැගෙනම යයි. හෙතෙමේ මේ උතුම් සීලයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි නිරවද්‍යවූ සැපය විඳින්නේය.

12. "හෙතෙමේ, ඇසින් රූපයක් දැක එහි මහත් සටහන් සිතට ගන්නේ නැත. කුඩා සටහන් සිතට ගන්නේ නැත. චක්ෂු ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හේතු කොට ගෙන ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එහි සංවරය පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ චක්ෂු ඉන්ද්‍රියය රකී, චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කනින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් ගන්නේ නොවේ. නැවත නැවත මතක්වනසේ අල්ලා ගන්නේ නොවේ. යමක් හේතු කොට ගෙන ශ්‍රොතෙන්ද්‍රිය (කන්) අසංවරව වසන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද ඒ ශ්‍රොතෙන්ද්‍රියෙහි සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොත ඉන්ද්‍රිය රකී. ශ්‍රොතෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ සිතට නොගනී. යමක් හේතු කොට ගෙන ඝානෙන්ද්‍රිය (නාසය) අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද එහි සංවරය පිණිස පිළිපදියි. ඝානෙන්ද්‍රිය රකියි. ඝානෙන්ද්‍රියාගේ සංවරයට පැමිණෙයි. දිවෙන් රසක් විඳ එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ නොගනී. යමක් හේතු කොට ගෙන, ජිව්හේන්ද්‍රිය සංවර නොකොට වාසය කරන්නාහට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද එහි සංවරය පිණිස පිළිපදියි ජිව්හෙන්ද්‍රිය (දිව) ආරක්ෂා කරයි. ජිව්හේන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"කයින් පහසක් ස්පර්ශ කොට නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතු කොට කායෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද ඒ කායෙන්ද්‍රිය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රිය ආරක්ෂාකරයි. කායෙන්ද්‍රියේ සංවරයට පැමිණෙයි. සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවතත් මතක්වනසේ සිතට නොගනී. යම් හෙයකින් සිත අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ මනින්ද්‍රිය (සිත) සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකී. මනින්ද්‍රිය සංවරයට පැමිණෙයි. හෙතෙමේ මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳින්නේය.

13. "හෙතෙමේ ඉදිරියට යාමෙහිද ආපසු යාමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද

නුවණින් යුක්තවූයේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගුකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. සඟළ සිවුර සහ පාත්‍රා සිවුරු දැරීමෙහි නුවණින් යුක්තවූයේ වෙයි.

අනුභව කිරීමය, පානය කිරීමය. රස විඳීමය යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද වීම් යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි.

"උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, පර්වතද, කඳුරැලිද, ගල්ගුහාද, සොහොන්ද, ඉතාදුරවූ කැලෑද, හිස්තැන්ද, පිදුරු ගොඩවල්ද යන මේ විවේක සෙනාසන භජනය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළකුණේ, පර්යංක බැඳ, ශරීරයේ කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි.

"ඔහු ස්කන්ධ ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලෙසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව වාසය කරයි. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි ක්‍රොධයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරු කොට කය සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. සැකය දුරු කොට, පහකළ සැක ඇත්තේ කුශල ධර්ම විෂයෙහි එසේද මෙසේදැයි සැක නැතිව විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

14. "මෙතෙම සිත කිලුටු කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංච නීවරණයන් දුරුකොට, කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ

විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද ස්ථානයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද, කියනු ලැබේ.

"මෙතෙකිනුදු ආර්ය ශ්‍රාවකතෙම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත් කොට දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේය, කියාද තීරණයට නොපැමිණෙයි.

"බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද ස්ථානයයි කියාද තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද, කියනු ලැබේ. මෙතෙකිනුත් ආර්ය ශ්‍රාවකතෙම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත්කොට දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේය කියාද තීරණයට නොපැමිණෙයි.

"බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපේක්ෂා ඇත්තේ වාසය කරයිද සිහියෙන් යුක්ත වූයේ, නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්යයෝ යම් ඒ ධ්‍යානයක් උපේක්ෂා ඇති, සැප විහරණය ඇත්තේයයි කියද්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද

ස්ථානයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද කියනු ලැබේ. මෙතෙකිනුදු ආර්ය ශ්‍රාවක තෙම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත් කොට දෙශනා කරන ලද්දේය කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේය කියාද තීරණයට නොපැමිණෙයි.

"බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද (ධ්‍යානය ලැබීමට) පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපේක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඤාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද ස්ථානයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද කියනු ලැබේ. මෙතෙකිනුදු ආර්ය ශ්‍රාවක තෙම, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත් කොට දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේය කියාද, තීරණයට නොපැමිණෙයි.

15. "හෙතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්, 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, දහස් ජාතියක්ද, සියක්දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ

හැදෙන කල්පයන්ද 'අසුවල් තැන වීමි. මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි, එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි මේ කෑම ඇත්තෙමි, මේ සැපදුක් වින්දෙමි, මේ ආයුෂකෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි. බ්‍රාහ්මණය මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද ස්ථානයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද කියනු ලැබේ. මෙතෙකිනුත් ආර්ය ශ්‍රාවක තෙම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත්ව දෙශනා කරන ලද්දේ යයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේයයි කියාද තීරණයට නොපැමිණෙයි.

**16.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, කෙලෙස් පහවගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත නමයි. හේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව උපදින්නාවූද නරක ලොව උපදින්නාවූද කර්මයට අනුව උපදින්නාවූ සත්ත්වයන් දකී. 'මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූහ, වාග් දුශ්චරිතයෙන් යුක්ත වූහ, ආර්යයන්ට ගරහන්නෝවූහ, මිථ්‍යාදෘෂ්ටිකයෝවූහ, මිථ්‍යා දෘෂ්ටි කර්ම සමාදන් වූහ. ඔව්හු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත් නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ, වාක් සුචරිතයෙන් යුක්ත වූහ, මනො සුචරිතයෙන්

යුක්ත වූහ, ආර්යයන්ට නොගරහන්නෝවූහ, සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන් වූහ. ඔව්හු මරණින් මතු යහපත් ස්වර්ග ලොකයට පැමිණියෝ”යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්මසිටියාවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද ධර්මය ලෙස පැමිණි සත්ත්වයන් දකී.

“බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ) පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනා ලද ස්ථානයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (නුවණ නැමති දළවලින්) අනින ලද ස්ථානයයි කියාද කියනු ලැබේ. මෙතෙකිනුදු ආර්ය ශ්‍රාවක තෙම, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත්ව දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේය කියාද තීරණයට නො පැමිණෙයි.

17. “ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගනී, මේ දුක් ඉපදීමේ හේතුවයයි තතු ලෙස දැනගනී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගනී. මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගනී. මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගනී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුවයයි තතු ලෙස දැනගනී. මේ ඒ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගනී. මේ ඒ කෙලෙස් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී.

“බ්‍රාහ්මණය, මෙයද තථාගතයන් වහන්සේගේ (ඥාණ)පදයයි කියාද, තථාගතයන් වහන්සේ විසින් (ප්‍රඥාවෙන්) ගටනාලද

ස්ථානයයි කියාද තථාගතයන් වහන්සේ විසින් (නුවණ නමැති දළවලින්) අනිනලද ස්ථානයයි කියාද කියනු ලැබේ. මෙතෙකිනුදු ආර්ය ශ්‍රාවක තෙම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත්ව දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම යහපත්ව පිළිපන්නේය කියාද තීරණයට නොපැමිණෙයි.

"මෙසේ දන්නා දක්නා ඔහුගේ සිත කාම ආශ්‍රවය කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවය කෙරෙන්ද සිත මිදේ, අවිද්‍යා ශ්‍රවය කෙරෙන්ද සිත මිදේ, මිදුනු කල්හි මිදුනේය යන ඥානය පහළ වෙයි. ඉපදීම නැති විය. උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරන ලදී. මින්පසු මේ සඳහා කළ යුත්තක් නැතැයි'ද දැනගනී.

"බ්‍රාහ්මණය, ආර්ය ශ්‍රාවක තෙම මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයයිද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යහපත් කොට දෙශනා කරන ලද්දේයයි කියාද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම යහපත්ව පිළිපන්නේයයි කියාද තීරණයට පැමිණෙයි. බ්‍රාහ්මණය, හස්තිපදය (ඇත් අඩිය) උපමා කොට ඇති ධර්මය මෙපමණින් සම්පූර්ණ වේය"යි වදාළහ.

මෙසේ වදාළකල්හි ජාණුස්සෝනි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය "භවත් ගෞතමයාණන් වහන්ස, ධර්ම දෙශනාව යහපති, ස්වාමිනි, ඉතාම යහපති ස්වාමීනි, (යමෙක්) යටිකුරු කරන ලද්දේ යම්සේ උඩුකුරු කරන්නේද වැසුමක් එලිදරව් කරන්නේද, මුළාවූවකුට මග කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, එලෙසින්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ස්වාමීනි, (ඒ ඇසූ) මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද සංඝයාද සරණ කොට ගනිමි. අද පටන් දිවිහිමි කොට සරණ ගිය උපාසකයෙකු කොට භාග්‍යවතුන් වහන්සේ මා සලකන සේක්වා."

(හත්වෙනිවූ චූල හත්ථි පදොපම සූත්‍රය නිමි.) (3-7)

---

## 28. මහා හත්ථිපදොපම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර, ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි මහණෙනියි" භික්ෂූන්ට කථා කළහ. "ඇවැත්නි"යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

"ඇවැත්නි, පොළොවෙහි හැසිරෙන්නාවූ (පා ඇති) ප්‍රාණීන්ගේ යම්කිසි පා සටහන් වෙත්ද, ඒ සියල්ල ඇත් පියවරෙහි ඇතුළත් වෙත්ද ඔවුන් අතුරෙන් ඇත් පියවර මහත් බැවින් අග්‍රයයි යම්සේ කියනු ලැබේද, එපරිද්දෙන්ම ඇවැත්නි, යම්කිසි කුසල ධර්මයෝ වෙත්ද, ඒ සියල්ල චතුරාර්ය සත්‍යයෙහි ඇතුළත් වෙත්. කවර සතරෙක්හිද යත්? දුක්ඛ ආර්ය සත්‍යයෙහි, දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙහි, දුක්ඛ නිරොධ ආර්ය සත්‍යයෙහි, දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා ආර්ය සත්‍යයෙහි යන මේ සතරෙහිය.

2. "ඇවැත්නි, දුක්ඛ ආර්ය සත්‍යය නම් කවරේද? ඉපදීමද දුකය, ජරාවද (මහලු වීම) දුකය, මරණයද දුකය, ශොකයද දුකය, (විලාප කියා) හැඬීමද දුකය, කායික දුකද දුකය, සිතේ දුකද දුකය, දැඩි වෙහෙසද දුකය, කැමති වන යමක් නොලබාද එයද දුකය, කොටින්ම පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයෝම දුක් වන්නාහ. ඇවැත්නි, පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයෝ නම්කවරහුද? ඒ මොව්හුය. රූප උපාදාන ස්කන්ධය, වෙදනා උපාදාන ස්කන්ධය, සංඥා උපාදාන ස්කන්ධය, සංස්කාර උපාදාන ස්කන්ධය, විඥ්ඥාණ උපාදාන ස්කන්ධය, (යන මේයි.)

"ඇවැත්නි, රූප උපාදාන ස්කන්ධය නම් කවරේද? මහා භූත රූප සතර හා සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝය.

"ඇවැත්නි, සතර මහා භූතයෝ කවරහුද? පඨවි ධාතුවද, (තද ගතිය) ආපෝ ධාතුවද, (බැඳීම් ගතිය) තෙජෝ ධාතුවද, (උෂ්ණ ගතිය) වායෝ ධාතුවද, (පිම්බෙන ගතිය) යන සතරයි.

"ඇවැත්නි, පෘථිවි ධාතුව කවරීද? ආධ්‍යාත්මිකවූ පෘථිවි ධාතුවක්ද වන්නීය, බාහිරවූ පෘථිවි ධාතුවක්ද වන්නීය, ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ පෘථිවි ධාතුව කවරීද? තමා තුළවූ කර්කසවූ, තදවූ, ජීවිතය සහිතවූ, යම් ද්‍රව්‍යයක් වේද, එනම් කෙස්ය, ලොමය, නියය, දත්ය, සමය, මස්ය, නහරය, ඇටය, ඇටමිදුලුය, වකුගඩුය, හෘදයමාංසයය, අක්මාවය, දලබුවය, බඩදිවය, පපුමසය, බඩවැලය, නොපැසුණු ආහාරය, පැසුණු ආහාරය, (මලය) යන මෙයද, මෙයින් අන්‍යවූ ආධ්‍යාත්මිකවූ, වෙන් වශයෙන්වූ, රළුවූ තදවූ, ජීවිතය සහිතවූ යම් කිසිවක් හෝ ඇද්ද, ඇවැත්නි, මේ සියල්ල ආධ්‍යාත්මික පෘථිවි ධාතුවයයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික පඨවි ධාතුවක් වේද? යම් බාහිර පඨවි ධාතුවක් වේද? මේ දෙකම පඨවි ධාතුවමැයි. ඒ මේ දෙයාකාර පඨවි ධාතුවම 'මගේ' නොවෙයි. 'මම' නොවෙමි. මේ මාගේ 'ආත්මය' නොවෙයි. 'මම' නොවෙමි. මෙය මාගේ 'ආත්මය' නොවේ යයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් (විදර්ශනා) නුවණින් දත යුතුයි. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් (විදර්ශනා) නුවණින් දැක, පෘථිවි ධාතුව කෙරෙහි කලකිරෙයි. පෘථිවි ධාතුව කෙරෙහි සිත නොඇලවයි.

3. "ඇවැත්නි, යම් හෙයකින් බාහිර ආපො ධාතුව (බැඳීම්ගතිය) කිපේද, එබඳු කාලයක් වේමැයි. එකල්හි බාහිර පෘථිවි ධාතුව අතුරුදහන්වෙයි. ඇවැත්නි, ඒ තරම් වැඩුණ ඒ බාහිර පෘථිවි ධාතුවගේ අනිත්‍ය බව පෙනෙන්නේය. නැතිවන ස්වභාව පෙනෙන්නේය. විනාශ වන ස්වභාව පෙනෙන්නේය. වෙනස් වන ස්වභාව පෙනෙන්නේය. ස්වල්ප කාලයක් පවතින්නාවූ, තණ්හාවෙන් අල්වා ගන්නා ලද්දාවූ, මේ ශරීරය ගැන 'මම'ය කියා හෝ 'මාගේය' කියා හෝ 'මම වෙමි'යි කියා ගැනීම කිමෙක වන්නේද? එසේ ඇති කල්හි මේ පෘථිවි ධාතු විෂයෙහි (එබඳු ගැන්මක්) ඔහුට නොවේමැයි.

"ඇවැත්නි, ඒ මහණහට අන්‍යයෝ ආක්‍රොෂ කෙරෙද්ද, අපහාස කෙරෙද්ද, කොප කරවද්ද, වෙහෙසද්ද, හෙතෙම මෙසේ දනියි (සොතද්වාරයෙහි) කනෙහි හටගත් ස්පර්ශයෙන් උපන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

දුක් වේදනාවක් මට උපන්නී වෙයි. ඒ වේදනාවද ප්‍රත්‍යයෙන් හටගත්තේයි ප්‍රත්‍යය රහිත නොවෙයි කුමක් ප්‍රත්‍යය කොටද? ස්පර්ශය ප්‍රත්‍යය කොටය, හෙතෙමේ ස්පර්ශය අනිත්‍යයයි දකියි, වේදනාව අනිත්‍යයයි දකියි, සංඥාව අනිත්‍යයයි දකියි, සංස්කාරයෝ අනිත්‍යයහයි දකියි, විඤ්ඤාණය අනිත්‍යයයි දකියි, ඔහුගේ සිත ධාතු අරමුණුකොටගෙනම පවතියි, එහිම පහදියි, එහිම සිටියි, ස්ථිර බවට පැමිණෙයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ප්‍රිය නොවූ කැමති නොවූ, සිත් නොගන්නාවූ දෙයින් එනම්, අතින් පහරදීමෙන්ද, කැට කැබළිතිවලින් පහර දීමෙන්ද දඬුවලින් පහර දීමෙන්ද හැසිරෙත්. (එකල්හි) හෙතෙම මෙසේ දකියි. යම්බඳු ස්වභාවක් ඇති ශරීරයෙහි අත් වදිද්ද, කැට කැබලිති වදිද්ද දඬු වදිද්ද, මේ ශරීරය එබඳු ස්වභාව ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කකචූපම (කියත් උපමා) අවවාදයෙහිදී මෙසේ වදාරණ ලදී.

"මහණෙනි, පහත් පැවතුම් ඇති සොරු දෙපස දඬු (මිටවල්) ඇති කියතකින් අඟ පසඟ කපද්ද ඒ සොරුන් කෙරෙහිද යමෙක් සිත නරක් කෙරේද, ඒ ඔහු මාගේ අනුශාසනාව කරන්නේ නොවේ"යයි වදාරණ ලදී. 'මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේය (මගේ) වීර්යය නොහැකුළුණේය සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළා නොවීය. කය සංසිඳුනේය. බර සැහැල්ලු විය. සිත සමාධියට පැමිණියේය එකඟ විය. කැමතිසේ මේ ශරීරයෙහි අත් වදිත්වා, කැට කැබිලිති වදිත්වා, දඬු වදිත්වා, කඩු වදිත්වා, මේ (මා විසින්) බුද්ධානුශාසනය කරනු ලැබේ' (කියායි.)

"ඇවැත්නි, මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ මෙසේ ධර්මය සිහිකරන්නාවූ,මෙසේ සංඝයා සිහිකරන්නාවූ ඒ භික්ෂුවහට විදර්ශනා උපෙක්ෂා කුසලය ඇති නොවෙයි. ඒ භික්ෂුව එය කරණකොටගෙන සංවේගයට පැමිණෙයි.

මෙසේ බුදුන්වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, යම්බඳුවූ, මට

විදර්ශනා උපෙක්ෂා කුසලය පහළ නොවේද, එය ඒකාන්තයෙන් මට ලාභයක් නොවෙයි. අලාභයෙකි. යහපත් ලැබීමක් නොවෙයි අයහපත් ලැබීමකි.' (කියායි)

"ඇවැත්නි, යම්සේ ලේලිය පුරුෂයාගේ පියා දැක (බය ලැජ්ජා ගතියකට) පැමිණෙයිද, ඇවැත්නි, එපරිද්දෙන්ම මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ, මෙසේ සංඝයා සිහිකරන්නාවූ, ඒ භික්ෂුවට විදර්ශනා කුසල උපේක්ෂාව නොපිහිටයිද, ඒ භික්ෂුව එයින් කලකිරෙයි. සංවේගයට පැමිණෙයි. මෙසේ බුදුන්වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ ඒ මට විදර්ශනා කුශල උපේක්ෂාව නොපිහිටයිද, එය මට ඒකාන්තයෙන් ලාභයෙක් නොවෙයි, අලාභයකි ඒකාන්තයෙන් යහපත් ලැබීමක් නොවෙයි. නොමනා ලැබීමකි, (කියායි) 'ඇවැත්නි, මෙසේ බුදුන්වහන්සේ සිහිකරන්නාවූ ඒ භික්ෂුවට ෂළඞ්ග උපෙක්ෂාව පහළ වෙයිද ඒ භික්ෂුව එයින් සතුටට පැමිණෙයි. ඇවැත්නි, මෙපමණකින්ද භික්ෂුව විසින් බොහෝවූ ගුණධර්ම සපයන ලද්දේ වෙයි.

4. "ඇවැත්නි, ආපො ධාතුව කවරීද? ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ ආපො ධාතුවක් වන්නීය, බාහිරවූ ආපො ධාතුවක් වන්නීය, ඇවැත්නි, ආධ්‍යාත්මික ආපො ධාතුව කවරීද? යමක් තමා තුළ පැවැත්තේද තමා නිසා පැවැත්තේද ජීවිතය හා එක්ව පවත්නාවූ දියගතිය ඇත්තාවූ, ආපො ධාතුවක් වේද, එනම් පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මේදයය, කඳුලුය, මස් තෙලය, කෙලය, සොටුය, සඳමිදුලුය, මුත්‍රය, මෙයින් අන්‍යවූ යමක් තමා තුළ පැවැත්තේද, තමා නිසා පැවැත්තේද ජීවිතය ඇත්තාවූ, දියගතිය ඇත්තාවූ යම් ආපො ධාතුවක් වේද මෙය ආධ්‍යාත්මික ආපො ධාතුවයි යම් ආධ්‍යාත්මික ආපොධාතුවක් වේද, යම් බාහිර ආපො ධාතුවක් වේද මේ දෙකම ආපො ධාතුවමැයි ඒ මේ ආපො ධාතුව 'මාගේ' නොවෙයි, මේ ආපො ධාතුව 'මම' නොවෙමි. මෙය මාගේ 'ආත්මය' නොවෙයි. මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් (විදර්ශනා) නුවණින් දතයුතුයි. මෙසේ

මෙය ඇතිසැටියෙන් යහපත් (විදර්ශනා) නුවණින් දැක ආපො ධාතුව කෙරෙහි සංවේගයට පැමිණෙයි. ආපො ධාතුව කෙරෙහි සිත නොඇලවයි.

5. "ඇවැත්නි, යම් කලක පිටතවූ ආපො ධාතුව විශෙෂයෙන් කිපුනේවේද, එබඳු කාලයක් වේමැයි. එකල්හි වනාහි (දිය වශයෙන් වැඩුනු) ඒ ආපො ධාතුව ගමත් යට කරගෙන ගලයි. නගරද යට කරයි, ජනපදද යට කරයි. ජනපද ප්‍රදෙශද යට කරයි. ඇවැත්නි, මහා සාගරයෙහි යොදුන් සියයක් පමණ තැන පැතිර සිටි ජලයද සිඳී බසියි. දෙසියයක් පමණ තැන පැතිරසිටි ජලයද සිඳී බසියි. යොදුන් තුන්සියයක් පමණ තැන පැතිරසිටි ජලයද සිඳී, බසියි. යොදුන් හාරසියයක් පමණ තැන පැතිර සිටි ජලයද සිඳී බසියි යොදුන් පන්සියයක් පමණ තැන පැතිර සිටි ජලයද සිඳී බසියි. යොදුන් හය සියයක් පමණ තැන පැතිර සිටි ජලයද සිඳී, බසියි. යොදුන් සත්සියයක් පමණ තැන පැතිර සිටි ජලයද සිඳී, බසියි.

"යම් කලක මහමුහුදෙහි ජලය සත් තලක් (තල්ගස් සතක්) පමණ සිටියිද, සයතලක් පමණ සිටියිද පස් තලක් පමණ සිටියිද, සිව් තලක් පමණ සිටියිද, තුන් තලක් පමණ සිටියිද, දෙතලක් පමණ සිටියිද, තලක් පමණ සිටියිද එබඳු කාලයක් මැයි.

"ඇවැත්නි යම් කලක මහමුහුදෙහි ජලය පුරුෂ ප්‍රමාණ (මිනිසෙකුගේ උස) සතක් සිටියිද, පුරුෂ ප්‍රමාණ සයක් ජලය සිටියිද, පුරුෂ ප්‍රමාණ පසක් ජලය සිටියිද, පුරුෂ ප්‍රමාණ සතරක් ජලය සිටියිද, පුරුෂ ප්‍රමාණ තුනක් ජලය සිටියිද, පුරුෂ ප්‍රමාණ දෙකක් ජලය ජලය සිටියිද, එක් පුරුෂ ප්‍රමාණයක් ජලය සිටියිද එබඳු කාලයක් වේමැයි.

"ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි පුරුෂ ප්‍රමාණයකින් අඩක් ජලය සිටියිද, ගොප්මස පමණට ජලය සිටියිද, ඇවැත්නි, යම් කලෙක මහමුහුදෙහි ජලය ඇඟිලි පුරුකක් තෙමෙන පමණකුත් නොවෙයිද එබඳු කාලයක් වේමැයි.

"එහෙයින් ඇවැත්නි, එපමණ මහත්වූ බාහිර ආපො ධාතුවෙහිද, අනිත්‍ය ස්වභාවය පෙනෙන්නේය. නැතිවන

ස්වභාවය පෙනෙන්නේය. විනාශ වන ස්වභාවය පෙනෙන්නේය. වෙනස් වන ස්වභාවය පෙනෙන්නේය. ස්වල්ප කාලයක් පවතින්නාවූ, තණ්හාවෙන් අල්වාගන්නා ලද්දාවූ, මේ ශරීරය ගැන 'මම'ය කියා හෝ, 'මාගේ'ය කියා හෝ 'මම වෙමි'යි කියා හෝ කිමෙක වන්නේද? එසේ ඇති කල්හි මේ ආපො ධාතුව විෂයෙහි (එබඳු ගැන්මක්) ඔහුට නොවේමැයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ආක්‍රෝෂ කෙරෙද්ද, අපහාස කෙරෙද්ද, (භික්ෂුව) කොප කරවද්ද, වෙහෙසවද්ද, හෙතෙම මෙසේ දනියි, සොතද්වාරයෙහි ඇතිවූ ස්පර්ශයෙන් උපන් දුක් වේදනාවක් උපන්නී වෙයි. ඒ වේදනාවද ප්‍රත්‍යය නිසා හටගත්තීය. ප්‍රත්‍ය රහිතව නොවෙයි. කුමක් ප්‍රත්‍යය කොටද? ස්පර්ශය ප්‍රත්‍යය කොටය. ඒ ස්පර්ශය අනිත්‍යයයි දකියි. ඒ වේදනාව අනිත්‍යයයි දකියි. සංඥාව අනිත්‍යය යයි දකියි. සංස්කාරයෝ අනිත්‍යයයි දකියි. විඥ්ඥාණය අනිත්‍යය යයි දකියි. ඔහුගේ සිත ධාතු අරමුණු කොටගෙනම පවතියි, එහිම පහදියි, එහිම සිටියි. ස්ථිර බවට පැමිණෙයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ප්‍රිය නොවූ, කැමති නොවූ, සිත් නොගන්නාවූ දෙයින් එනම් අතින් පහර දීමෙන්ද, කැට කැබිලිතිවලින් පහර දීමෙන්ද, දඬුවලින් පහර දීමෙන්ද, හැසිරෙත්. (එකල්හි) හෙතෙම මෙසේ දකියි. යම්බඳු ස්වභාවයක් ඇති මේ ශරීරයෙහි අත් වදිද්ද, කැට කැබලිති වදිද්ද, දඬු වදිද්ද, මේ ශරීරය එබඳු ස්වභාව ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කකචූපම අවවාදයෙහිදීද මෙසේ වදාරණ ලදී.

"මහණෙනි, පහත් පැවතුම් ඇති සොරු දෙපස දඬු ඇති කියතකින් අඟ පසඟ කපද්ද, ඒ සොරුන් කෙරෙහිද යමෙක් සිත නරක් කෙරේද, ඒ ඔහු මාගේ අනුශාසනාව කරන්නේ නොවෙයි, (කියාය.) "මා විසින් වීර්ය පටන්ගන්නා ලද්දේය. වීර්යය නොහැකුළුණේය. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළා නොවීය. කය සංසිඳුණේය. කයෙහි බර ඇරුනේය. බර සැහැල්ලු විය. සිත සමාධියට පැමිණියේය. එකඟය. කැමතිසේ මේ ශරීරයෙහි අත් වදිත්වා කැට කැබලිති වදිත්වා, දඬු වදිත්වා,

කඩු වදිත්වා මේ (මා විසින්) බුද්ධානුශාසනය කරනු ලැබේ”යි කියායි.

“ඇවැත්නි, මෙසේ බුදුන් වහන්සේ සිහිකරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ ඒ භික්ෂුවහට විදර්ශනා කුසල උපේක්ෂාව පහළ නොවෙයි. ඒ භික්ෂුව එය කරණ කොට ගෙන සංවේගයට පැමිණෙයි.

“මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, සම්බුදුවූ මට විදර්ශනා කුශල උපේක්ෂාව පහළ නොවේද, එය ඒකාන්තයෙන් මට ලාභයක් නොවේ, අලාභයෙකි. ඒකාන්තයෙන් මට යහපත් ලැබීමක් නොවේ, අයහපත් ලැබීමකි. (කියායි)

“ඇවැත්නි, යම්සේ ලේලිය පුරුෂයාගේ පියා දැක (බය ලැජ්ජා ගතියකට) පැමිණෙයිද, ඇවැත්නි, එපරිද්දෙන්ම මෙසේ බුදුන් වහන්සේ සිහිකරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ, සංඝයා සිහිකරන්නාවූ ඒ භික්ෂුවට විදර්ශනා කුශල උපෙක්ෂාව නොසිටියි. ඒ භික්ෂුව එයින් කලකිරෙයි සංවේගයට පැමිණෙයි.

“මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, යම් බඳුවූ මට විදර්ශනා කුශල උපෙක්ෂාව, පහළ නොවේද එය ඒකාන්තයෙන් ලාභයක් නොව අලාභයකි. ඒකාන්තයෙන් යහපත් ලැබීමක් නොව නොමනා ලැබීමකි.”

“මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ මෙසේ ධර්මය සිහිකරන්නාවූ මෙසේ සංඝයා සිහිකරන්නාවූ භික්ෂුවට ජලඩිග උපෙක්ෂාව පහළවෙයිද, එකල්හි ඒ භික්ෂුව එයින් සතුටට පැමිණෙයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝවූ ගුණ ධර්මයක් සපයන ලද්දේ වෙයි.

**6.** “ඇවැත්නි, තෙජො ධාතුව කවරීද? තෙජො ධාතුව ආධ්‍යාත්මික තෙජො ධාතුවක්ද වන්නීය. බාහිර තෙජො ධාතුවක්ද වන්නීය. ඇවැත්නි, ආධ්‍යාත්මික තෙජො ධාතුව කවරීද?

"යමක් තමා තුළ පැවැත්තේද, තමා නිසා පැවැත්තේද, ජීවිතය සමග පවත්නාවූ, උණුසුම් ස්වභාව ලක්ෂණවූ යම් තෙජො ධාතුවක් වේද, එනම් (කිපුනාවූ) යමකින් (උණ රොගාදියෙන්) තැවේද, යමකින් (මේ ශරීරය) දිරාද, යමකින් දැවේද, යමකින් අනුභව කරනලද බොනලද, කඩා කනලද රස විඳිනාලද දේ හොඳින් පැසවීමට යේද, මෙයින් අන්‍යවූද තමා තුළ පවත්නාවූ තමා නිසා පවත්නාවූ ජීවිතය සමග පවත්නාවූ, උණුගතිය ඇත්තාවූ යම් තෙජො ධාතුවක් වේද මෙය ආධ්‍යාත්මික තෙජෝ ධාතුවයි. යම් ආධ්‍යාත්මික තෙජෝ ධාතුවක් වේද, යම් බාහිර තෙජො ධාතුවක් වේද, (මේ දෙකම) තෙජො ධාතුවමය. ඒ මේ තෙජො ධාතුව 'මාගේ' නොවෙයි. 'මම' නොවෙයි. මෙය ආත්මය නොවෙයි. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් (විදර්ශනා) නුවණින් දත යුතුයි. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් නුවණින් දැක තෙජො ධාතුව කෙරෙහි සංවේගයට පැමිණෙයි. තෙජො ධාතුව කෙරෙහි සිත නො අලවයි.

7. "ඇවැත්නි, යම් හෙයකින් බාහිර තෙජො ධාතුව කිපේද එබඳු කාලයක් වේමය. (එකල) ඒ තෙජො ධාතුව ගමත් දවයි, නියම් ගමත් (විශාල ගම්) දවයි, නගරත් දවයි, ජනපදත් දවයි, ජනපද ප්‍රදෙශද දවයි, ඕතොම නිල්පාට තෙත් තණ (කොළ) වෙතට පැමිණ හෝ, පර්වතයක් ලඟට පැමිණ හෝ ජලය ලඟට පැමිණ හෝ විසිතුරු (කොළරොඩු ආදිය නැති) භූමි භාගයට පැමිණ හෝ ප්‍රත්‍ය රහිත වූවා (ඇවිලෙන්ට දෙයක් නැති නිසා) නිවෙයි. කුකුල් පිහාටුවලින්ද සම් වැරලියෙන්ද ගිනි සොයද්ද, එබඳු කාලයක් වේමැයි.

"එහෙයින් ඇවැත්නි, එපමණ මහත්වූ බාහිර තෙජො ධාතුවෙහි අනිත්‍ය ස්වභාවය පෙනෙන්නේය. නැතිවන ස්වභාවය පෙනෙන්නේය. විනාශවන ස්වභාවය පෙනෙන්නේය. වෙනස්වන ස්වභාවය පෙනෙන්නේය. ස්වල්ප කාලයක් පවතින්නාවූ, තණ්හාවෙන් අල්වාගන්නාවූ, මේ ශරීරය ගැන 'මම'ය කියා හෝ 'මාගේ'ය කියා හෝ 'මම වෙමියි' කියා ගැනීමක් කිමෙක වන්නේද, එසේ ඇති කල්හි මේ තෙජො ධාතු විෂයෙහි එබඳු ගැන්මක් ඔහුට නොවේමැයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ආක්‍රොෂ කෙරෙද්ද, අපහාස කෙරෙද්ද, (ඔහු) කොප කරවද්ද වෙහෙසද්ද, හෙතෙම මෙසේ දනියි, සොතද්වාරයේ ඇතිවූ ස්පර්ශයෙන් උපන් දුක් වේදනාවක් උපන්නී වෙයි. ඒ වේදනාවද ප්‍රත්‍යය නිසා හට ගත්තීය. ප්‍රත්‍යය රහිතව නොවෙයි. කුමක් ප්‍රත්‍යය කොටද, ස්පර්ශය ප්‍රත්‍යය කොටය. ඒ ස්පර්ශය අනිත්‍යයයි දකියි. ඒ වේදනාව අනිත්‍යයයි දකියි. සංඥාව අනිත්‍යයයි දකියි. සංස්කාරයෝ අනිත්‍යයහයි දකියි. විඤ්ඤාණය අනිත්‍යයයි යයි දකියි. ඔහුගේ සිත ධාතු අරමුණු කොටගෙන පවතියි. එහිම පහදියි එහිම සිටියි. ස්ථිර බවට පැමිණෙයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ප්‍රියනොවූ, කැමති නොවූ, සිත් නොගන්නාවූ දෙයින්, එනම් අතින් පහර දීමෙන්ද කැට කැබලිතිවලින් පහර දීමෙන්ද? දඬුවලින් පහර දීමෙන්ද හැසිරෙත්. (එකල්හි) හෙතෙම මෙසේ දකියි. යම්බඳු ස්වභාවයක් ඇති මේ ශරීරයෙහි අත් වදිද්ද කැට කැබිලිති වදිද්ද, දඬු වදිද්ද, මේ ශරීරය එබඳු ස්වභාව ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කකචූපම අවවාදයෙහිද මෙසේ වදාරණ ලදී.

"මහණෙනි, පහත් පැවතුම් ඇති සොරු දෙපස දඬු ඇති කියතකින් අඟ පසඟ කපද්ද, ඒ සොරුන් කෙරෙහිද යමෙක් සිත නරක් කෙරේද, ඒ ඔහු මාගේ අනුශාසනාව කරන්නේ නොවෙයි" (කියාය)

"මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේය, වීර්යය නො හැකුළුණේය. සිහිය එළඹ සිටියේය. (එහෙයින්ම) මුළා නොවීය. කය සංසිඳුණේය. බර සැහැල්ලුවිය. සිත සමාධියට පැමිණියේය. එකඟවිය. කැමතිසේ මේ ශරීරයෙහි අත් වදිත්වා, කැට කැබිලිති වදිත්වා මේ (මා විසින්) බුද්ධානුශාසනය කරනු ලැබේ" කියායි.

"ඇවැත්නි, මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ මෙසේ ධර්මය සිහි කරන්නාවූ මෙසේ සංඝයා සිහිකරන්නාවූ ඒ භික්ෂුවහට විදර්ශනා කුසල උපෙක්ෂාව එළඹ නොසිටී. ඒ භික්ෂුව ඒ කරණකොටගෙන සංවේගයට පැමිණෙයි. මෙසේ

බුදුන් වහන්සේ සිහිකරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ මෙසේ සංඝයා සිහිකරන්නාවූ, යම් බඳුවූ මට විදර්ශනා කුසල උපෙක්ෂාව එළඹ නොසිටියිද, එය ඒකාන්තයෙන් මට ලාභයක් නොවේ. අලාභයකි. ඒකාන්තයෙන් මට යහපත් ලැබීමක් නොවේ, අයහපත් ලැබීමකි කියායි.”

“ඇවැත්නි, යම්සේ ලේලිය පුරුෂයාගේ පියා දැක බය ලජ්ජාවට පැමිණෙයිද ඇවැත්නි, එපරිද්දෙන්ම මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහිකරන්නාවූ, ඒ භික්ෂුවට විදර්ශනා කුසල උපේක්ෂාව නොපිහිටයිද, ඒ භික්ෂුව එයින් කලකිරෙයි. සංවේගයට පැමිණෙයි.

“මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ යම්බඳුවූ මට ඒකාන්තයෙන් ලාභයක් නොව අලාභයකි, ඒකාන්තයෙන් යහපත් ලැබීමක් නොව අයහපත් ලැබීමකි.”

“මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, ඒ භික්ෂුවට ජළඞ්ග උපෙක්ෂාව පහළ වෙයිද (එකල්හි) ඒ භික්ෂුව එයින් සතුටට පැමිණෙයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝවූ ගුණ ධර්ම සපයන ලද්දේ වෙයි.

8. “ඇවැත්නි, වායොධාතුව කවරීද? ආධ්‍යාත්මික වායෝ ධාතුවක්ද වන්නීය. බාහිර වායෝධාතුවක්ද වන්නීය. ආධ්‍යාත්මික වායෝ ධාතුව කවරීද? යම් වායෝ ධාතුවක් තමා තුළ පවත්නේද ශරීරයෙහි පවත්නේද එනම් උඩට නගින වාතයද, පහළට බස්නා වාතයද බඩවැලින් පිටත පවත්නා වාතයද, බඩවැල ඇතුළත පවත්නා වාතයද, ශරීරයෙහි අවයව ක්‍රියාකරවන වාතයද, ආශ්වාස (නාසයෙන් ඇතුල් වන) වාතයද, ප්‍රශ්වාස (නාසයෙන් පිටවන) වාතයද යන මේ වාතයෝද මෙයින් අන්‍යවූ යම් වායුවක් තමා තුළ පවත්නේද ශරීරයෙහි පවත්නේද මේ ආධ්‍යාත්මික වායෝධාතු නමි. යම් ආධ්‍යාත්මික වායෝ ධාතුවක් වේද, යම්

බාහිර වායෝ ධාතුවක් වේද මේ දෙකම වායො ධාතුවමය. ඒ මේ වායෝ ධාතුව 'මාගේ' නොවෙයි. මෙය 'මම' නොවෙයි. මෙය 'ආත්මය' නොවෙයි මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් (විදර්ශනා) නුවණින් දතයුතුයි. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් නුවණින් දැක වායෝ ධාතුව කෙරෙහි සංවේගයට පැමිණෙයි. වායෝ ධාතුව කෙරෙහි සිත නොඇලවයි.

**9.** "ඇවැත්නි, යම් හෙයකින් බාහිර වායෝ ධාතුව කිපේද, එබඳු කාලයක් වේමය (එකල) ඒ වායෝධාතුව ගමද (විනාශ කර) ගෙන යයි නියම්ගමද (විනාශකර) ගෙන යයි. නගරයද (විනාශ කර) ගෙන යයි. ජනපදයද (විනාශ කර) ගෙන යයි. ජනපද ප්‍රදෙශද (විනාශ කර) ගෙන යයි. ඇවැත්නි, යම් හෙයකින් ග්‍රීෂ්ම කාලයෙහි අන්තිම මාසයෙහි තල් අත්තෙන්ද විජිනිපතින්ද, වායුව සොයද්ද, වහලෙහිවූ තණ අගද නොසෙල වෙද්ද එබඳු කාලයකුත් වේමය.

"එහෙයින් ඇවැත්නි, එපමණ මහත්වූ බාහිර වායෝ ධාතුවෙහි අනිත්‍ය ස්වභාවය පෙනෙන්නේය. නැතිවන ස්වභාවය පෙනෙන්නේය. වෙනස්වන ස්වභාවය පෙනෙන්නේය. ස්වල්ප කාලයක් පවතින්නාවූ තණ්හාවෙන් අල්වා ගන්නා ලද්දාවූ මේ ශරීරය ගැන 'මම'ය කියා හෝ 'මාගේ'ය කියා හෝ 'මම වෙමි' කියා හෝ කිමෙක ගන්නේද? එසේ ඇති කල්හි මේ වායෝධාතු විෂයෙහි (එබඳු ගැන්මක්) ඔහුට නොවේමය.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ආක්‍රොෂ කෙරෙද්ද අපහාස කෙරෙද්ද, (ඔහු) කොප කරවද්ද, වෙහෙසද්ද, (එකල්හි) හෙතෙම මෙසේ දකී මට සොතද්වාරයෙහි හටගත් ස්පර්ශයෙන් උපන් දුක් වේදනාවක් උපන්නීය. ඒ වෙදනාවද ප්‍රත්‍යය නිසා හටගත්තීය. ප්‍රත්‍යය රහිතව නොවෙයි. කුමක් ප්‍රත්‍යය කොටද? ස්පර්ශය ප්‍රත්‍යකොටය. ඒ ස්පර්ශයද අනිත්‍යයයි දකියි. ඒ වේදනාවද අනිත්‍යයයි දකියි. සංඥාවද අනිත්‍ය යයි දකියි. සංඛාරයෝද අනිත්‍යයයි දකියි. විඥ්ඥාණයද අනිත්‍යයයි දකියි. ඔහුගේ සිත ධාතු අරමුණක් ගෙන පවතියි. එහිම පහදියි. එහිම සිටියි. ස්ථිර බවට පැමිණෙයි.

"ඇවැත්නි, ඒ භික්ෂුවට අන්‍යයෝ ප්‍රිය නොවූ, කැමති නොවූ, සිත් නොගන්නාවූ දෙයින් එනම් අතින් පහරදීමෙන්ද කැට කැබලිතිවලින් පහර දීමෙන්ද හැසිරෙත්. (එකල්හි) හෙතෙම මෙසේ දකියි. යම්බඳු ස්වභාවයක් ඇති මේ ශරීරයෙහි අත් වදිද්ද, කැට කැබලිති වදිද්ද, දඬු වදිද්ද, මේ ශරීරය එබඳු ස්වභාවය ඇත්තේය, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කකචූපම අවවාදයෙහිදීද මෙසේ වදාරණ ලදී.

"මහණෙනි, පහත් පැවතුම් ඇති සොරු දෙපස දඬු ඇති කියතකින් අඟ පසඟ කපද්ද, ඒ සොරුන් කෙරෙහිද, යමෙක් සිත නරක් කෙරේද, ඒ ඔහු මාගේ අනුශාසනය කරන්නේ නොවෙයි." (කියායි)

"මා විසින් වීර්ය පටන්ගන්නා ලද්දේය. වීර්යය නොහැකුළුණේය. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළා නොවීය. කය සංසිඳුණේය. බර සැහැල්ලු විය. සිත සමාධියට පැමිණියේ එකඟවිය. කැමතිසේ මේ ශරීරයෙහි අත් වදිත්වා, කැට කැබලිති වදිත්වා, දඬු වදිත්වා, කඩු වදිත්වා. මේ (මා විසින්) බුද්ධානුශාසනය කරනු ලැබේ." කියායි.

"ඇවැත්නි, මෙසේ බුදුන් වහන්සේ සිහිකරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, ඒ භික්ෂුවට කුසල නිශ්‍රිතවූ විදර්ශනා උපෙක්ෂාව පහළ නොවෙයි ඒ භික්ෂුව ඒ කරණකොටගෙන සංවේගයට පැමිණෙයි.

"මෙසේ බුදුන් සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ, මෙසේ සංඝයා සිහිකරන්නාවූ, යම්බඳුවූ මට කුසල නිශ්‍රිතවූ විදර්ශනා උපෙක්ෂාව පහළ නොවෙයිද එය මට ඒකාන්තයෙන් ලාභයක් නොවේ, අලාභයකි. ඒකාන්තයෙන් මට යහපත් ලැබීමක් නොවේ. අයහපත් ලැබීමකි කියායි.

"ඇවැත්නි, යම්සේ ලේලිය පුරුෂයාගේ පියා දැක බය ලැජ්ජාවට පැමිණෙයිද, ඇවැත්නි, එපරිද්දෙන්ම මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ, ඒ භික්ෂුවට කුසල නිශ්‍රිතවූ උපෙක්ෂාව

නොපිහිටයිද ඒ භික්ෂුව එයින් කලකිරෙයි. සංවේගයට පැමිණෙයි.

"මෙසේ බුදුන් වහන්සේ සිහි කරන්නාවූ, මෙසේ ධර්මය සිහිකරන්නාවූ, මෙසේ සංඝයා සිහිකරන්නාවූ යම්බඳුවූ මට කුසල නිශ්‍රිතවූ විදර්ශනා උපෙක්ෂාව පහළ නොවේද එය ඒකාන්තයෙන් ලාභයක් නොව අලාභයකි. ඒකාන්තයෙන් යහපත් ලැබීමක් නොව අයහපත් ලැබීමකි.'

"මෙසේ බුදුන් වහන්සේ සිහිකරන්නාවූ, මෙසේ ධර්මය සිහි කරන්නාවූ, මෙසේ සංඝයා සිහි කරන්නාවූ ඒ භික්ෂුවට කුසල නිශ්‍රිත ෂළඞ්ග උපෙක්ෂාව පහළ වෙයිද (එකල්හි) ඒ භික්ෂුව එයින් සතුටට පැමිණෙයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝවූ ගුණධර්ම සපයන ලද්දේ වෙයි.

**10.** "ඇවැත්නි, යම්සේ (සිටුවන කණු ආදී) ලී හෙතු කොට ගෙනද, (බඳිනා) වැල් හේතු කොට ගෙනද, සෙවිලි කරන තෘණ හේතු කොට ගෙනද (ආලෙප කරන) මැටි හේතු කොට ගෙනද (යන මෙයින්) අහස වට කරන ලද්දේ ගෙයක් යන ව්‍යවහාරයට යයි. ඇවැත්නි, එපරිද්දෙන්ම ඇට නිසාද, නහර නිසාද, මස් නිසාද, සම නිසාද, අහස පිරිවරා සිටියේ රූපයක්යයි ව්‍යවහාරයට යයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ චක්ෂු ප්‍රසාදය නොබිඳුනේ වේද බාහිර රූප අරමුණු ඇස හමුවට නොපැමිණියේ වේද, ඊට අනුකූලවූ මෙනෙහි කිරීම නොවෙයිද ඒ තාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ චක්ෂුප්‍රසාදය නොබිඳුනේ වේද බාහිර රූපයෝ ඉදිරියට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මෙනෙහි කිරීම නැත්තේ වේද ඒ තාක් ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

**11.** "ඇවැත්නි, යම්හෙයකින් ආධ්‍යාත්මිකවූ ඇස නොබිඳුනේ වේද, චක්ෂුප්‍රසාදය නොබිඳුනේ වේද, බාහිරවූ රූපයෝ ඇස හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මෙනෙහිකිරීම නැත්තේ වේද

ඒතාක් ඊට අනුරූප වූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම වෙයි. ඒ චක්ෂුර්විඥානය සමග ඇතිවූ රූපයක් වේද, එය රූප උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ චක්ෂුර්විඥානය සමග ඇතිවූ යම් වේදනාවක් වේද, එය වෙදනා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ චක්ෂුර්විඥානය සමග ඇතිවූ යම් සංඥාවක් වේද, එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ චක්ෂුර්විඥානය සමග ඇතිවූ යම් සංස්කාරයෝ වෙද්ද ඔව්හු සංස්කාර උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙත්. ඒ චක්ෂුර්විඥානය සමග ඇතිවූ යම් විඥානයක් වේද, එය විඥාන උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි ඔහු මෙසේ දකියි. මෙසේ පඤ්ච උපාදාන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම රැස්වීම වෙයි (කියායි) භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.'

"යමෙක් පටිච්චසමුප්පාදය දකී නම් හෙතෙම ධර්මය දකියි. යමෙක් ධර්මය දකී නම් හෙතෙම පටිච්චසමුප්පාදය දකියි (යනුවෙනි.)

"මේ පස් වැදෑරුම් උපාදානස්කන්ධයෝ වෙද්ද ඔව්හු ප්‍රත්‍යයෙන් උපන්නාහු වෙති. මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේද යම් ඇලීමක් වේද, යම් අනුකූල බවක් වේද, යම් බලවත් ඇල්මක් වේද, එය දුක් ඉපදීමේ හේතුවයි.

"මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේද, තණ්හාවගේ යම් නැති කිරීමක් වේද, එය දුක් නැතිකිරීමයි ඇවැත්නි, මෙපමණකින්ද, භික්ෂුව විසින් බොහෝ සෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

**12.** "ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ ශ්‍රොතප්‍රසාදය නොබිඳුණේ වෙයිද බාහිර ශබ්ද අරමුණු කණ හමුවට නොපැමිණෙද්ද, ඊට අනුකූලවූ මෙනෙහිකිරීම නොවෙයිද, ඒතාක් ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ ශ්‍රොතප්‍රසාදය නොබිඳුණේ වෙයිද බාහිර ශබ්දයෝ (කණ) හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මෙනෙහිකිරීම නොවෙයි. ඒතාක් ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, යම් හෙයකින් ආධ්‍යාත්මිකවූ ශ්‍රොතප්‍රසාදය නොබිඳුණේ වෙයිද, බාහිරවූ ශබ්දයෝ (කණ) හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මනසිකාරය වෙයිද, එකල්හි ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම වෙයි. ඒ ශ්‍රොත විඥානය හා ඇතිවූ රූපයක් වේද, එය රූප උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ශ්‍රොත විඥානය හා ඇතිවූ යම් වේදනාවක් වේද, එය වේදනා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ශ්‍රොත විඥානය හා ඇතිවූ යම් සංඥාවක් වේද, එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ සොතවිඤ්ඤාණය සමග ඇතිවූ යම් සංස්කාරයෝ වෙද්ද, ඔව්හු සංස්කාරස්කන්ධයෙහි ඇතුළත් වෙත්. ඒ සොත විඤ්ඤාණය සමග ඇතිවූ යම් විඥානයක් වේද, එය විඥාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඔහු මෙසේ දනියි. 'මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම, රැස්වීම වෙයි, යනුවෙනි. භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.'

"යමෙක් පටිච්ච සමුප්පාදය දනීද, හෙතෙම ධර්මය දකියි. යමෙක් ධර්මය දකීද, හෙතෙම පටිච්ච සමුප්පාදය දකියි වදාළහ.

"යම් මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයෝ වෙද්ද මොහු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගන්නාහුමය. මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්හි යම් කැමැත්තෙක් වේද, යම් ඇලීමක් වේද, යම් අනුකූල බවක් වේද, යම් බලවත් ඇල්මක් වේද, එය දුක් ඇතිවීමේ හේතුවයි.

"මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේද, ඒ තණ්හාවගේ යම් නැති කිරීමක් වේද, එය දුක් නැති කිරීමයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝ සෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

13. "ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ ඝාන ප්‍රසාදය නොබිඳුණේ වේද, බාහිර ගඳ සුවඳ අරමුණු (නාසය) හමුවට නොපැමිණෙද්ද, ඊට අනුකූල මෙනෙහිකිරීම නොවෙයිද ඒතාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ ඝාන ප්‍රසාදය නොබිඳුණේ වේද, බාහිර ගඳ සුවඳ අරමුණු නාසය හමුවට පැමිණෙද්ද, ඊට අනුකූල මෙනෙහි කිරීම නොවෙයිද, ඒතාක් ඊට අනුරූපවූ විඤ්ඤාණ කොට්ඨාශය පහළ නොවෙයි.

"ඇවැත්නි, යම් හෙයකින් ආධ්‍යාත්මිකවූ නාසය නො බිඳුනේ වේද, බාහිරවූ ගඳ සුවඳ අරමුණු නාසය හමුවට පැමිණෙද්ද ඊට අනුකූල මෙනෙහි කිරීම වෙයිද මෙසේ ඊට අනුරූප ඝ්‍රාණ විඥාන කොට්ඨාශයාගේ පහළ වීම වෙයි. ඒ ඝාණවිඤ්ඤාණය සමග ඇතිවූ යම් රූප අරමුණක් වේද, එය රූප උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ඝාණවිඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ වේදනාවක් වේද, ඕතොම වේදනා උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ඝාණවිඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳුවූ සංඥාවක් වේද, එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ඝාණවිඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳුවූ සංස්කාරයෝ වෙද්ද, ඔව්හු සංස්කාර උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙත්. ඒ ඝාණවිඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ විඥානයක් වේද, එය විඥාන උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඔහු මෙසේ දකියි. "මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම, රැස්වීම වෙයි (කියාය) භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.

"යමෙක් පටිච්චසමුප්පාදය දකීද හෙතෙම ධර්මය දකියි. යමෙක් ධර්මය දකීද, හෙතෙම පටිච්චසමුප්පාදය දකියි, (වදාළහ)

"යම් මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයෝ වෙත්ද, ඔව්හු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගත්තාහුය. මේ පස් වැදෑරුම් උපාදන ස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේද, යම් ඇල්මක් වේද, යම් අනුකූල බවක් වේද, යම් බලවත් ඇල්මක් වේද එය දුක් ඇතිවීමේ හේතුවයි.

"මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේද, ඒ තණ්හාවගේ යම් නැති කිරීමක් (නිවණක්) වේද එය දුක නැති කිරීමය, ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝ සෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

14. "ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ දිව (ජිව්හා ප්‍රසාදය) නොබිඳුණේ වේද බාහිර රස අරමුණු දිව හමුවට නොපැමිණෙද්ද, ඊට අනුකූල මෙනෙහි කිරීම නොවෙයිද, ඒතාක් ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවේය.

"ඇවැත්නි, ආධයාත්මිකවූ දිව නොබිඳුණේ වේද, බාහිර රසයෝ දිව හමුවට පැමිණෙද්ද, ඊට අනුකූල මෙනෙහිකිරීම නොවෙයිද ඒතාක් ඊට අනුරූපවූ විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ දිව නොබිඳුනේ වේද, බාහිර රසයෝ දිව හමුවට පැමිණෙද්ද, ඊට අනුකූල මෙනෙහි කිරීම වෙයිද ඊට අනුරූපවූ විඥාන කොඨාශයාගේ පහළවීම වෙයි. ඒ ජිව්හාවිඤ්ඤාණය සමග ඇතිවූ යම් රූප අරමුණක් වේද, එය රූප උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ ජිව්හා විඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ වේදනාවක් වේද, එය වේදනා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත්වේ, ඒ ජිව්හාවිඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ සංඥාවක් වේද එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත්වේ. ඒ ජිව්හාවිඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ සංස්කාරයෝ වෙද්ද ඔව්හු සංස්කාර ස්කන්ධයෙහි ඇතුළත් වෙත්. ඒ ජිව්හා විඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳුවූ විඥානයක් වේද, එය විඥාන උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඔහු මෙසේ දකියි, මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම, රැස්වීම වෙයි (කියාය.) භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.'

"යමෙක් පටිච්චසමුප්පාදය දකීද හෙතෙම ධර්මය දකී, යමෙක් ධර්මය දකීද, හෙතෙම පටිච්චසමුප්පාදය දකීය'යි (වදාළහ.)

"යම් මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ වෙද්ද, මොහු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගත්තාහුය. මේ පස් වැදෑරුම් උපාදානස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේද, යම් ඇලීමක් වේද, යම් අනුකූල බවක් වේද, යම් බලවත් ඇල්මක් වේද එය දුක් ඇතිවීමේ හේතුවයි.

"මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරු කිරීමක් වේද, තණ්හාවගේ යම් නැති කිරීමක් (නිවණක්) වේද එය දුක් නැතිකිරීමයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝසෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

**15.** "ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ කය නොබිඳුණේ වේද බාහිර ස්පර්ශ අරමුණු කය හමුවට නොපැමිණේද්ද, ඊට අනුකූල මෙනෙහිකිරීම සිත නොවෙයිද, ඒතාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ කය (කායප්‍රසාදය) නොබිඳුණේ වේද, ස්පර්ශ අරමුණු කය හමුවට පැමිණේද්ද, ඊට අනුකූල මෙනෙහිකිරීම නොවෙයිද, ඒ තාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, යම් හෙයකින් ආධ්‍යාත්මිකවූ කය නොබිඳුනේවේද, බාහිර ස්පර්ශයෝ කය හමුවට පැමිණේද්ද, ඊට අනුකූල මෙනෙහිකිරීම වෙයිද, මෙසේ ඊට අනුරූප විඥාන කොඨාශයාගේ පහළවීම වෙයි. ඒ කායවිඤ්ඤාණයාගේ යම්බඳුවූ රූප අරමුණක් වේද, එය රූප උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ කායවිඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳුවූ වේදනාවක් වේද, එය වේදනා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ කාය විඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳුවූ සංඥාවක් වේද එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ කාය විඤ්ඤාණය සමග ඇතිවූ යම්බඳු සංස්කාරයෝ වෙද්ද, ඔව්හු සංස්කාර උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙති. ඒ කාය විඤ්ඤාණය සමග ඇතිවූ යම් බඳුවූ විඥානයක් වේද, එය

විඥාන උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඔහු මෙසේ දකී. මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම, රැස්වීම වෙයි' (කියාය.) භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.

"යමෙක් පටිච්චසමුප්පාදය දකීද, හෙතෙමේ ධර්මය දකී. යමෙක් ධර්මය දකීද හෙතෙමේ පටිච්චසමුප්පාදය දකීය"යි (වදාළහ)

"යම් මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ වෙද්ද, මොහු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගත්තාහුමය. මේ පස් වැදෑරුම් උපාදානස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේද, යම් ඇලීමක් වේද, යම් අනුකූලබවක් වේද එය දුක් ඇතිවීමේ හේතුවයි.

"මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරු කිරීමක් වේද, තණ්හාවගේ යම් නැති කිරීමක් වේද, එය දුක්නැතිකිරීමයි. ඇවැත්නි, මෙපමණින්ද මහණහු විසින් බොහෝසෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ මනොද්වාරය නොබිඳුණේ වේද, බාහිර ධර්ම අරමුණු සිත හමුවට නොපැමිණෙද්ද, ඊට අනුකූල මනසිකාරය නොවෙයිද ඒතාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ මනොද්වාරය නොබිඳුණේ වේද, බාහිර ධර්ම අරමුණු සිත හමුවට පැමිණෙද්ද, ඊට අනුකූල මනසිකාරය නොවෙයිද ඒතාක් ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ මනොද්වාරය නොනැසුණේ වේද, බාහිර ධර්ම අරමුණු සිත හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මනසිකාරය වෙයිද, එකල්හි ඊට අනුරූප විඥාන කොට්ඨාශයාගේ පහළවීම වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග

යම් රූපයක් වේද, එය රූප උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග යම් වේදනාවක් වේද එය වේදනා උපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග යම් සංඥාවක් වේද, එය සංඥා උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග යම් සංස්කාරයෝ වෙද්ද, ඔව්හු සංස්කාර උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙත්. ඒ මනොවිඤ්ඤාණය සමග යම් විඥානයක් වේද එය විඥාන උපාදාන ස්කන්ධයෙහි ඇතුළත් වෙයි ඔහු මෙසේ දනී. 'මේ පස්වැදෑරුම් උපාදන ස්කන්ධයන්ගේ සංග්‍රහය, එක්වීම, රැස්වීම වෙයි' (කියාය) භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙසේ වදාරණ ලද්දේමය.

"යමෙක් පටිච්චසමුප්පාදය දකී නම් හෙතෙමේ ධර්මය දකී. යමෙක් ධර්මය දකී නම් හෙතෙමේ පටිච්චසමුප්පාදය දකිය'යි (වදාළහ.)

"යම් මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ වෙද්ද, මොහු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගත්තාහුමය. මේ පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේද යම් ඇලීමක් වේද, යම් අනුකූල බවක් වේද, යම් බලවත් ඇල්මක් වේද එය දුක් ඉපදීමේ හෙතුවයි.

'මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයන් කෙරෙහිවූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේද තණ්හාවගේ යම් නැතිකිරීමක් වේද එය දුක් නැතිකිරීමයි. ඇවැත්නි, මෙපමණින්ද භික්ෂුව විසින් බොහෝ සෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි."

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව පිළිගත්හ.

අටවෙනිවූ මහාහත්ථිපදොපම සූත්‍රය නිමි. (3-8)

## 29. මහා සාරොපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙරුන් බැහැර ගිය නොබෝ කල්හි රජගහනුවර ගිජ්ජකූට පර්වතයෙහි වසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙරුන් අරබයා භික්ෂූන්ට කථා කළසේක.

"මහණෙනි, මෙහි ඇතැම් කුල පුත්‍රයෙක්, 'ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද, මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තියෙන් සම්පූර්ණවූ අදහස් ඇතිව සතුටු වෙයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට සිතයි. අනුන් පහත්කොට සිතයි.'මම ලාභ ඇත්තේ වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු ප්‍රසිද්ධ නැත. අල්පෙශාක්‍යය'යි සිතයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තියෙන් මත්වෙයි. විශෙෂයෙන් මත්වෙයි, ප්‍රමාදයට පැමිණෙයි මත්වූයේම දුකසේ වාසය කරයි.

2. "මහණෙනි, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා, (අත්හැර) එලය ඉක්මවා, සුඹුල (පොත්ත) ඉක්මවා, පතුරු ඉක්මවා, අරටුවයයි සිතා අතු හා දලු සිඳ ගෙනයන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය, 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය. එලය නොදත්තේය. පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය, අතු හා දලු නොදත්තේය. ඒ නිසා මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින්

හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා එලය ඉක්මවා පොත්ත ඉක්මවා, පතුරු ඉක්මවා අරටුවයි සිතා අතු හා දලු සිඳ ගෙන ගියේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඔහුගේ ඒ වැඩය සිදුනොවන්නේය.

"මහණෙනි, එමෙන්ම මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක්, ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද, මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම, ඒ ලාභ සත්කාර කීර්තියෙන් සම්පූර්ණවූ අදහස් ඇත්තේ සතුටු වෙයි හෙතෙම ඒ ලාභ සත්කාර කීර්ති නිසා තමන් උසස් කොට සිතයි. අනුන් පහත් කොට සිතයි. 'මම ලාභ සත්කාර කීර්ති ඇත්තේ වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු ප්‍රසිද්ධ නැත. අල්පෙශාක්‍යය'යි සිතයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තියෙන් මත් වෙයි. විශෙෂයෙන් මත්වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. මත්වූයේම දුකසේ වාසය කරයි. මහණෙනි, ඒ මහණතෙම මේ ශාසනබ්‍රහ්මචරියාවෙහි කොළඅතු ගත්තේයයිද එයින්ම කෙළවරට පැමිණියේයයිද කියනු ලැබේ.

3. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ඉපදීමෙන්ද, ජරාවෙන්ද මරණයෙන්ද ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි' (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහි ගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීම්ය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම ඒ ලාභසත්කාර කීර්තිය නිසා සතුටු නොවෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි.

හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමා උසස්කොට නොසලකයි. අනුන් පහත්කොට නොසලකයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නො පැමිණෙයි. ප්‍රමාද නොවූයේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීලසම්පත්තියෙන් සතුටු වෙයි, සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස් කොට සලකයි. අනුන් පහත් කොට සලකයි. 'මම යහපත් ගුණධර්ම ඇති සිල්වතෙක් වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු පවිටු ස්වභාව ඇති දුශ්ශීලයෝය' කියායි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් මත්වෙයි. විශෙෂයෙන් මත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි.

"මහණෙනි, යම්සේ (ගහක) අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූද, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා, (අත්හැර) එලය ඉක්මවා, සුඹුලු ඉක්මවා අරටුව යයි සිතා පතුරු සිඳ ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය. එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය. එහෙයින් මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා එලය ඉක්මවා පොත්ත ඉක්මවා, අරටුවයයි සිතා පතුරු සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඔහුගේ ඒ වැඩය නොසිද්ධ වන්නේය.

"මහණෙනි, එමෙන්ම මේලෝකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක්, ඉපදීමෙන්ද ජරාවෙන්ද, මරණයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේනම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ

වෙයි. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටු නොවෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමා උසස්කොට නොසලකයි. අනුන් පහත්කොට නොසලකයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාද නොවූයේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස්කොට සලකයි. අනුන් පහත්කොට සලකයි. 'මම යහපත් ගුණධර්ම ඇති සිල්වතෙක් වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු පවිටු ස්වභාව ඇති දුශ්ශීලයෝ'ය' කියාය. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් මත් වෙයි. විශෙෂයෙන් මත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි.

"මහණෙනි, මේ මහණතෙම ශාසන බ්‍රහ්මචර්යාවෙහි (මාර්ග ඵල නමැති අරටුව ඇති ගසෙහි) පතුරු ගත්තේ යයිද එයින්ම කෙළවරට පැමිණියේ යයිද කියනු ලැබේ.

4. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින්ද පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි' (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. ඔහු ඒ සීල

සම්පත්තියෙන් සතුටු සිත් ඇත්තේ වෙයි. (එහෙත්) හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි, අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සමාධි සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධි සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස් කොට සිතයි. අනුන් පහත් කොට සිතයි. 'මම සමාධි ගත වූයේ එකඟවූ සිත් ඇත්තේ වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු වනාහි සමාධිගත නුවූහ. කැළඹුණු සිත් ඇත්තාහ' කියායි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා මත් වෙයි. විශේෂයෙන් මත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි.

"මහණෙනි, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරට සොයමින් හැසිරෙන්නාවූ යම් පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා (අත්හැර) එලය ඉක්මවා අරටුවයි සිතා සුඹුල (පොත්ත) සිඳගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය. එලය නොදත්තේය. සුඹුල නොදත්තේය. පතුරු නොදත්තේය. අතු හා දලු නොදත්තේය. එහෙයින් මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) එහි අරටුව ඇති ගසක අරටුව ඉක්මවා එලය ඉක්මවා අරටුව යයි සිතා පොත්ත සිඳ ගෙන ගියේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඒ වැඩය නොසිදු වන්නේය' කියායි.

"මහණෙනි, එමෙන්ම මේ ලොකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක්, ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙයි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා

විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි' (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම, සිවුපසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස්කොට නොසිතයි අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ලාභසත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන්ම මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයි. (එහෙත්) ඒ සීලසම්පත්තිය නිසා සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සීලසම්පත්තිය නිසා තමන් උසස්කොට නොසලකයි. අනුන් පහත් කොට නොසලකයි. හෙතෙම ඒ සීලසම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධි සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස්කොට සිතයි. අනුන් පහත්කොට සිතයි. 'මම සමාධිගතවූයේ එකඟවූ සිත් ඇත්තේ වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු වනාහි සමාධිගත නුවූවාහු කැළඹුණු සිත් ඇත්තාහ, කියායි. හෙතෙම ඒ සමාධිසම්පත්තිය නිසා මත්වෙයි. විශෙෂයෙන් මත් වෙයිඃ ප්‍රමාදයට පැමිණෙයි. ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි මහණෙනි, මේ මහණතෙම ශාසන බ්‍රහ්මචර්යායෙහි පොත්ත ගත්තේයයිද එයින්ම කෙළවරට පැමිණියේයයිද කියනු ලැබේ.

5. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෙක්, ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නික්ම ශාසනයෙහි පැවිදිවූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන්ම මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීලසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීලසම්පත්තියෙන් සතුටට පත් වෙයි. (එහෙත්) හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සීලසම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. ඔහු ඒ සීල සම්පත්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවේ. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධිසම්පත්තිය නිසා සතුටට පැමිණෙයි. (එහෙත්) සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සමාධිසම්පත්තිය නිසා තමන් උසස්කොට නොසලකයි. අනුන් පහත්කොට නොසලකයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම ඥාන දර්ශනය (පංච අභිඥාව) උපදවයි. හෙතෙම ඒ ඥාන දර්ශනයෙන් (පංච අභිඥාවෙන්) සතුටුවෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තෙක් වෙයි. හෙතෙම ඒ ඥාන දර්ශනය (පංච අභිඥාව) නිසා මම දන්නෙක් වෙමි. දකින්නෙක් වෙමි'යි තමන් උසස්කොට සිතයි. අනුන් පහත්කොට සිතයි. 'මේ අන්‍යවූ භික්ෂූහු නොදන්නාහු නොදක්නාහුම වෙසෙත්'යි කියායි. හෙතෙම ඒ ඥාන දර්ශනයෙන් (පංච අභිඥාවෙන්) මත් වෙයි, විශෙෂයෙන් මත් වෙයි. ප්‍රමාදයට පැමිණෙයි, ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි.

"මහණෙනි, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ යම් පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා

(හැර) අරටුවයයි සිතා එලය කපා අරගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය, එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය, අතු හා දලු නොදත්තේය. එහෙයින් මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ. අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි අරටුව ඇති මහගසක අරටුව ඉක්මවා අරටුවයයි සිතා එලය සිඳ අරගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදුවන්නේය කියායි.

"මහණෙනි, එමෙන්ම මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් 'ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද, මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ වෙයි. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. හෙතෙම අනුන් පහත් කොට නොසිතයි. හෙතම ඒ සීල සම්පත්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි, ප්‍රමාදයට නොපැමිණියේම සමාධි සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම

ඒ සමාධි සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි, ප්‍රමාදයට නොපැමිණියේම ඥාන දර්ශනය (පංච අභිඥාව) උපදවයි. හෙතෙම ඒ ඥාන දර්ශනයෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. හෙතෙම ඒ ඥාන දර්ශනය නිසා 'මම දන්නෙක් වෙමි. දකින්නෙක් වෙමි'යි තමන් උසස් කොට සිතයි, අනුන් පහත්කොට සිතයි. මේ අන්‍යවූ භික්ෂූහු නොදන්නාහු, නොදක්නාහුම වෙසෙත්'යි කියායි. ඔහු ඒ ඥාන දර්ශනයෙන් මත් වෙයි. විශෙෂයෙන් මත්වෙයි. ප්‍රමාදයට පැමිණෙයි. ප්‍රමාදයට පැමිණියේම දුකසේ වාසය කරයි. මහණෙනි, මේ මහණතෙම ශාසන බ්‍රහ්මචර්යාවෙහි ඵලය ගත්තේ යයිද එයින්ම කෙළවරට පැමිණියේ යයිද කියනු ලැබේ.

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පෙලුනේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව් පසය ලැබීමය, සත්කාර ලැබීමය, කීර්තිය ලැබීමය යන මේවා උපදියි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටුවෙයි, සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි, විශෙෂයෙන් මත් නොවෙයි, ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සීල සම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා මත්නොවෙයි, විශේෂයෙන් මත් නොවෙයි, ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සමාධි සම්පත්තිය උපදවයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි, ප්‍රමාදයට නොපැමිණියේම ඥාන දර්ශනය (පංච අභිඥා) උපදවයි හෙතෙම ඒ ඥාන දර්ශනය (පංච අභිඥාව) නිසා සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ ඥාන දර්ශන සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. හෙතෙම ඒ ඥාන දර්ශන සම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම රහත් බව සම්පූර්ණ කරයි. මහණෙනි, යම් හෙයකින් ඒ භික්ෂුව ඒ රහත් බවෙන් පිරිහෙන්නේය යනු හේතු රහිතයි ප්‍රත්‍ය රහිතයි (හෙවත් ඒ රහත් බවෙන් පිරිහීමක් නොසිදු වෙයි.)

"මහණෙනි, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ යම් පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව යයි දැනගෙනම අරටුව සිඳගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව දත්තේය. එලය දත්තේය, පොත්ත දත්තේය, පතුර දත්තේය, අතු හා දළු දත්තේය. එහෙයින් මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි මහත්වූ ගසක අරටුවයයි දැනගෙනම අරටුව සිඳගෙන ගියේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඒ වැඩය හොඳින් සිදු වන්නේය' කියායි.

"මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුකින්ද, සිතේ දුකින්ද, බලවත් වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පෙළුනේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය කීර්තිය ලැබීමය යන මේවා උපදවයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටුවෙයි, සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයි, අනුන් පහත් කොට නොසිතයි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තිය නිසා මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සීල සම්පත්තියෙන් සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි, අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ සීලසම්පත්තිය නිසා මත්නොවෙයි. විශේෂයෙන් මත්නොවෙයි, ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම සමාධි සම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා සතුටට පැමිණෙයි, සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ සමාධි සම්පත්තිය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි, ප්‍රමාදයට නොපැමිණියේම ඥාන දර්ශනය (පංච අභිඥා) උපදවයි, හෙතෙම ඒ ඥාන දර්ශනය (පංච අභිඥා) නිසා සතුටට පැමිණෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. හෙතෙම ඒ ඥාන දර්ශනය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. හෙතෙම ඒ ඥාන දර්ශනය නිසා මත් නොවෙයි. විශේෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. ප්‍රමාදයට නොපැමිණියේම රහත් බව සම්පූර්ණ කරයි.

"මහණෙනි, යම් හෙයකින් ඒ භික්ෂුව ඒ රහත් බවෙන් පිරිහෙන්නේ නම්, එය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. (හෙවත් ඒ රහත් බවෙන් පිරිහීමක් නොසිදු වෙයි.)

7. "මහණෙනි, මෙසේ වනාහි මේ ශාසන බ්‍රහ්මචර්යාව ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පිණිස නොවෙයි. සීල සම්පත්තිය පිණිස නොවෙයි. සමාධි සම්පත්තිය පිණිස නොවෙයි. ඥාන දර්ශනය (පංච අභිඥාව) පිණිස නොවෙයි. මහණෙනි, යම් මේ රහත්බවෙක් වේද, මහණෙනි, මේ ශාසන බ්‍රහ්මචර්යාව මේ රහත් බව පිණිසමැයි.

"මේ රහත් බව ශාසන බ්‍රහ්මචර්යාවෙහි සාරයයි (හරයයි) මේ රහත් බව (ශාසන බ්‍රහ්මචර්යාවෙහි) කෙළවරයි. (අවසානයයි")

(නවවෙනිවූ මහා සාරෝපම සූත්‍රය නිමි.) (3-9)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk